වළලු ආදිය ගැටෙන නාදයෙන් මුසු, කියන ඇසෙන මිහිරි සර ඇති ගෙවැසි දනගේ හැසිරීම් ඇති විපුල ඉසුරු සැපතින් හොබවන මහගෙයකට සුවසේ පිවිසෙනු පිණිස රන් රිදී මුතු පබළු ආදි රුසින් බබළන සුපිහිටි විසල් දොරබා ඇති, මහදොරක් වැනි වූ අරුතින් අකුරින් පිරිපුන් බුදුරදුන්ගේ දෙසුම් නැණෙහි ගැඹුරු බව මොනවට හඟවන්නා වූ මේ මූල පරියාය සුතට සුවසේ බැස ගැනීම පිණිස කාල - දේශ - දේසක - පිරිවර යන කාරණාවන්ගෙන් සැදුම්ලත් යම් නිදානයක් වදාරණ ලද්දේ ද, ඒ නිදානයාගේ අරුත් වර්ණ නිමාවට පත් වූවාය.

## නිදාන වර්ණනාව නිමි.

## 1-1-1

සබ්බධම්ම මූලපරියාය යනාදි නයින් බුදුරදුන් විසින් තබන ලද සූත්‍රයාගේ වර්ණනාවට දැන් අවකාශ පැමිණියේය. ඒ මේ සූත්‍ර වර්ණනාව වනාහි යම් හෙයකින් සූත්‍ර නික්ඛෙප (=බැසගැනීම්) විමසා කියනු ලබන කල්හි එය පැහැදිලි වෙයි. එහෙයින් පළමුකොට සූත්‍ර නික්ඛෙපයන් විමසන්නෙමු. සූත්‍ර නික්ඛෙප හතරකි.

1. අත්තජ්ඣාසය 2. පරජ්ඣාසය 3. පුච්ඡාවසික 4. අට්ඨුප්පත්ති යනුයි.

1. ඔවුන් අතුරෙහි යම් සූත්‍ර කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන් විසින් ආරාධනා කරනු නොලැබ හුදු තමන් වහන්සේගේම අදහසින්ම වදාළ සේක් ද, (එවැනි සූත්‍රයෝ අත්තජ්ඣාසය නම් වේ.) අත්තජ්ඣාසය සූත්‍රයෝ නම්:- ආකඞ්ඛෙය්‍ය සුත්ත, වත්ථ සුත්ත, මහාසතිපට්ඨාන සුත්ත, මහාසළායතන විභංග සුත්ත, අරියවංස සුත්ත, සම්මප්පධාන සුත්තභාරකය, ඉද්ධිපාද, ඉද්ධිබල, බොජ්ඣංග, මග්ගඞ්ග සුත්තභාරක මේ ආදි සුත්තයෝය.

2. යම් සූත්‍ර කෙනෙක් "පරිපක්කා බො රාහුලස්ස විමුත්ති පරිපාචනීයා ධම්මා යන්නූනාහ. රාහුලං උත්තරිං ආසවානං ඛයෙ විනෙය්‍යං" මෙසේ අන්‍යයන්ගේ අදහස ද, කැමැත්ත ද, සිත ද, ප්‍රාර්ථනාව ද අවබෝධ කරන බව ද දැන පරජ්ඣාසය වසයෙන් වදාරණ ලද්දාහු ද එවැනි සූත්‍රයෝ පරජ්ඣාස නික්ඛෙපයෝ නම් වෙති. එවැනි පුත්‍රයෝ නම් චූලල

රාහුලොවාද සුතත, මහා රාහුලෝවාද සුතත, ධමම චකකපපවතතන සුතත, ධාතු විභංග සුතත, මේ ආදි සූත්‍රයෝ වෙති. එම සූත්‍රයෝ පරජ්ඣාසය නිකෙඛපයට අයත් වූවාහු වෙති.

3. බුදුරදුන් ඉදිරියට පැමිණි සිව්පිරිසය. චතුර් වර්ණයෝය. නාගයෝය. ගරුඩයෝ ගාන්ධර්වයෝය. අසුරයෝය. යක්ෂයෝය. සතරවරම් රජදරුවෝය. තාවතිංස ආදී දෙවියෝය. මහාබ්‍රහ්මය යන ආදීහු "බොජ්ඣංග බොජ්ඣංගා භනෙත වුච්චනති නීවරණා නීවරණාති භනෙත වුච්චනති ඉමෙ නුබො භනෙත පඤ්චුපාදානකඛනධා කිංසූධ විතතං පුරිසසස සෙට්ඨං" යනාදි ක්‍රමයෙන් ප්‍රශ්න විචාරති. මෙසේ අසනු ලැබූ ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ යම් බොජ්ඣංග සංයුත්ත ආදීහු වෙත් ද අන්‍ය වූත් දේවතා සංයුත්ත, මාර සංයුත්ත, බ්‍රහ්ම සංයුත්ත, සකකපඤ්හ, චූලවෙදලල, මහාවෙදලල, සාමඤ්ඤඵල, ආලවක, සුචිලෝම, සුතත ආදි යම් සූත්‍ර කෙනෙක් වෙත් ද ඔවුහු පුච්ඡාවසික සුතත නිකෙඛපයට අයත් වෙති. 4. යම් සූත්‍රයක් වනාහි උපන් කරුණක් නිමිතිකොට දෙසන ලද්දේ ද, ඔවුහු නම් ධම්මදායාද, චූලසීහනාද, වත්ථූපම, පුත්‍තමංසූපම, දාරුකඛනධූපම, අගගිකඛනධූපම, ඵෙණපිණ්ඩූපම, පාරිච්ඡත්තකූපම, යන මේ ආදී සුතතයෝය. ඔවුහු අත්ථුප්පත්ති නිකෙඛපයට අයත් වූවාහු වෙති. මෙම සූත්‍රය ද භාග්‍යවතුන් වහන්සේ අට්ඨුප්පත්තියක් නිසා දේශනා කරන ලදී.

කවර කාරණයක් නිසාද යත්, උගත්කම නිසා ඇතිකර ගත් මානයක් නිසාය. ත්‍රිවේදයේ පරතෙරට ගිය බ්‍රාහ්මණයන් පන්සිය දෙනෙක් පසුකලෙක බුදුරදුන්ගෙන් බණ අසා පස්කම් සැපතෙහි ආදිනව සහ පැවිද්දෙහි අනුසස් දක්වමින් - බුදුරදුන් වෙත පැවිදිව නොබෝ කලකින් සියලු බුදුවදන් ඉගෙන පර්යාප්තිය නිසා මානය ඉපදවූහ. යමක් යමක් භාග්‍යවතුන් වහන්සේ කියත්ද ඒ ඒ දෙය අපි වහා දනිමු. භාග්‍යවතුන් වහන්සේ වූ කලී ත්‍රිලිංගයෙන් චතුර්විධ පදයන් සප්ත විභත්තීන්ගෙන් අන්‍ය වූ කිසිවක් නො වදාරති. මෙසේ වදාළ කල්හි ද, අපට ගැටමුසු තැනක් නැත. මේ හේතුවෙන් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ගෞරවයක් නැත්තේ, එතැන්පටන් උපස්ථානයට ද ධර්මශ්‍රවණයට ද නිතර නොයති.

බුදුරජාණන් වහන්සේ මොවුන්ගේ සිත්හසර දැන මොවුන්ගේ මෙම මාන නමැති හුල උගුලුවා නොදමා මාර්ග ඵලයක් ලබාගැනීමේ

Scanned with CamScanner

අභව්‍යයෝ යයි දැන, ඔවුන්ගේ උගත්කම නිසා උපන් මානය අටයුප්පත්තිය කොට දේශනාවෙහි කුසල වූ තථාගතයන් වහන්සේ මන්බිඳුනු සඳහා "සබ්බ ධම්ම මූලපරියාය" යනුවෙන් දේශනාව පටන්ගත් සේක.

එහි "සබ්බ ධම්ම මූලපරියායං" යනු සියලු ධර්මයන්ට මුල් වූ අසාධාරණ හේතුව යන අර්ථයි. සබ්බෙසං යනු අනවශේෂ වූ යන අර්ථයයි. මේ සබ්බ ශබ්දය අනවශේෂ වාචක මැයි. එය යම් යම් පදයක් සමග සම්බන්ධයට පැමිණේ ද, ඒ ඒ ශබ්දයාගේ අනවශේෂත්වය ප්‍රකාශ කෙරේ. එය මෙසේය.

"සබ්බං රූපං අනිච්චං, සබ්බා වෙදනා අනිච්චා සබ්බ සක්කාය පරියාපන්නෙසු ධම්මෙසු" යන මෙහි සබ්බ ශබ්දය, පර්යාප්තිය, සත්‍යය, සමාධිය, ප්‍රඥාවය, ප්‍රකෘතිය ස්වභාවය ශූන්‍යතාවය, පුණ්‍යය, ආපත්තිය ඥෙය්‍යය යනාදී අර්ථයන්හි දක්නට ලැබේ.

ඉධ භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං යනාදි තන්හි ධම්ම ශබ්දය පර්යාප්ති අර්ථයෙහි වේ. දිට්ඨ ධම්මො, විදිතධම්මො, යනාදි තන්හි, සත්‍යය යන අර්ථයෙහි වේ.

යස්සෙ තෙ චතුරො ධම්මා වානරින්දතථා තව,
සච්චං ධම්මො ධිතී චාගො දිට්ඨං සො අති වත්තති

යනාදී තන්හි ප්‍රඥාව යන අර්ථයෙහි වේ. ජාති ධම්මා ජරා ධම්මා යනාදි තන්හි ප්‍රකෘති යන අර්ථයෙහි වේ. කුසලා ධම්මා යනාදි තන්හි ස්වභාව යන අර්ථයෙහිය. "තස්මිං ඛොපන සමයෙ ධම්මා හොන්ති" යනාදි තන්හි ශූන්‍යතා අර්ථයෙහි වේ. "ධම්මො සුචිණ්ණො සුඛමාවහාති යන තන්හි පුණ්‍යය යන අර්ථයෙහිය. "දෙව අනියතා ධම්මා" යනාදි තන්හි ආපත්තියෙහි වේ. සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති යනාදි තන්හි ඥෙය්‍ය (=දතයුත්ත) යන අර්ථයෙහි වේ. මෙහි වනාහි එය ස්වභාවයෙහිදු වැටෙයි. මේ එහි වචනාර්ථයි

ස්වකීය ලක්ෂණ ධරන්නුයි ධම්ම නම් වෙත්. මූලශබ්දය විස්තර කරන ලද්දේමය. මෙහි වනාහි මූල ශබ්දය අසාධාරණ හේතු යන අර්ථයෙහි දතයුතුයැ.

Scanned with CamScanner

පරියාය ශබ්දය තෙම "මධුපිණ්ඩික පරියායොති තං ධාරෙහි" යනාදි තන්හි දේශනාවෙහි වැටේ. "අත්ථිබ්‍රාහ්මණ පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය, අකිරිය වාදො සමණො ගොතමො" යනාදි තන්හි කාරණයෙහි වැටේ. "කස්ස නුඛො ආනන්ද අජ්ජ පරියායො භික්ඛුණියො ඔවදිතුං" යන මෙහි වාරය යන අර්ථයෙහි වේ. මෙම සූත්‍රයෙහි කාරණයෙහි ද දේශනාවෙහි ද වැටේ. එහෙයින් සබ්බ ධම්ම මූල පරියායං යන මෙහි සියලු ධර්මයන් අසාධාරණ හේතු නම් වූ කාරණය කියා හෝ සියලු ධර්මයන්ට කාරණය වූ මේ දේශනාව කියා හෝ සියලුම ධර්මයන්ට කාරණය වූ මේ දේශනාව කියා හෝ මෙසේ අර්ථය දතයුතුයි.

මෙම මූලපරියාය සූත්‍රය නෛර්යාර්ථ (පමුණුවා කිවයුතු අර්ථ) ඇති බැවින්ද, චාතුර්භූමක වූම ස්වභාවධර්මයෝ සර්වධර්මයෝ යයි නොදත යුතුයි. ස්වකාය පරියාපන්න වූ ත්‍රෛභූමක ස්වභාව ධර්මයෝම අනවශේෂ හෙයින් දතයුත්තාහුය. මේ මෙහි අදහසයි.

වො ශබ්දය

වො යනු මේ වො ශබ්දය පච්චත්ත උපයෝග කරණ සම්පදාන සාමි (=පඨමා - කම්ම - කරණ සම්පදාන සම්බන්ධ) යන වචනයන්හි සහ පද පූරණ අර්ථයෙහි දක්නට ලැබේ. "කච්චි පන වො අනුරුද්ධා සමග්ගා සම්මොද මානා" යනාදි තන්හි ප්‍රථමා විභක්තියෙහි දක්නට ලැබේ. "ගච්ඡථ භික්ඛවෙ, පණාමෙමි වො" යනාදි තන්හි කර්මයෙහි වේ. "න වො මම සන්තිකෙ වත්තබ්බං" යන තන්හි කරණාර්ථයෙහි යෙදේ. "වනපත්ථපරියායං වො භික්ඛවෙ, දෙසිස්සාමි" යනාදී තන්හි සම්ප්‍රදාන අර්ථයෙහි වේ. "දෙසිස්සාමි" යනාදී තන්හි සම්ප්‍රදාන අර්ථයෙහි වේ. "සබ්බෙසං වො සාරිපුත්ත සුභාසිතං" යනාදි තන්හි සම්බන්ධ අර්ථයෙහි යෙදේ. "යෙහි වො අරියා පරිසුද්ධ කාය කම්මන්තා" යනාදි තන්හි පදපූරණ මාත්‍රය වේ. මෙහි සම්ප්‍රදාන අර්ථය දතයුතු යැ.

භික්ඛවෙ, යනුවෙන් ප්‍රතිඥාවෙන් අභිමුඛ වූවන්ට නැවත ඇමතීමකි. "දෙසිස්සාමි" යනු දේශනාව ප්‍රතිඥා කිරීමයි. මෙය කියන ලද්දේ වෙයි. මහණෙනි, අනවශේෂ (ත්‍රෛභූමක) ධර්මයන්ට මුල්වූ අසාධාරණ හේතුව තොපට දේශනා කරන්නෙමියි දෙවෙනි ක්‍රමයෙන් කාරණ දේශනාව (හේතු වූ දේශනාව) තොපට දේශනා කරන්නෙමි. තං සුණාථ, මා විසින්

කියනු ලබන්නා වූ ඒ අර්ථය ඒ කාරණය ඒ දේශනාව ශ්‍රවණය කරව්. සාධුකං මනසි කරොථ යන මෙහි සාධුකං, සාධු යනු එකාර්ථයි.

සාධු ශබ්දය,

මෙම 'සාධු' ශබ්දයද, ආයාචන - සමපටිච්ඡන සන්පහන්සන සුන්දර දළ්හි කමම යන අර්ථයන්හි දක්නා ලැබේ. "සාධු මෙ භනෙතති බො තෙ භිකඛු භගවතො භාසිතං අභිනන්දිත්වා" ආදි තන්හි සමපටිච්ඡන පිළිගැනීම යන අර්ථයෙහි වේ. සාධු, සාධු, සාරිපුතත ආදි තන්හි සංපහන්සන (සතුටු වීම්) අර්ථයෙහි වේ.

සාධු ධමමරුචී රාජා සාධු පඤ්ඤාණවා නරො
සාධු මිතතාන මදුබෙහා පාපසසාකරණං සුඛං

(ධර්මය රුචි කරන්නා වූ රජ තෙමේ සුන්දර වෙයි. පැනවත් ජන තෙම සුන්දර වෙයි. මිතුරන්ට හතුරුකම් නොකරන්නා සුන්දර වෙයි. පව් නොකිරීම සැප වෙහි.)

යන ආදී තන්හි සුන්දරය යන අරුත්හි වේ. තෙනහි බ්‍රාහමණ සාධුකං සුණාහි, ආදි තන්හි සාධුක ශබ්දයම දළ්හි කමම අරුත්හි ද ආණතති අරුත්හි ද වේ යයි දතයුතුයි. සුන්දර යන අරුත් ගැනීම ද වටී. දළ්හිකමම අරුතින් මේ දහම් දැඩිකොට අසව්. මනාකොට ගන්නෝ වවු. අණතති අරුතින් ද මගේ අණින් අසව්. සුන්දර වූ භද්‍ර වූ මෙම ධර්මය අසව් යයි මෙසේ දක්වන ලද්දේ ද වෙයි. මනසිකරොථ යනු, ආවර්ජනා කරව්. රැස්කොට ගනිවු යන අර්ථයි. නො විසුරුණු සිත් ඇතිව අසව්. සිත්හි දරව් යනුවෙන් අදහස් කෙරේ.

දැන් මෙහි තං සුණාථ යනු සොත ඉන්‍ද්‍රියයාගේ විපිළිසර බැව් නැති කිරීමයි. සාධුකං මනසිකරොථ, යනු මෙනෙහි කිරීම දැඩිකිරීමෙන් මන ඉන්‍ද්‍රියයාගේ විපිළිසර වීම වැළකෙයි. (අරමුණේ සිත පිහිටයි.) මෙහි පූර්ව පදයෙන් ව්‍යඤ්ජන විපර්යාසය වැළකෙයි. පශ්චිම පදයෙන් අර්ථ විපර්යාසය වැළකෙයි. නැවත පළමු පදයෙන් බණ ඇසීමෙහි යොදවයි. පශ්චිම පදයෙන් ඇසූ ධර්මයන්ගේ ධාරණය නැවත නැවත පරීක්‍ෂා කිරීම ආදියෙහි යොදවයි.

Scanned with CamScanner

නැවත, පළමු වචනයෙන් මේ ධර්මය ව්‍යඤ්ජන සහිතය. එසේ හෙයින් ඇසිය යුතුයයි දක්වයි. පශ්චිම වචනයෙන් අරුත් සහිතය. එබැවින් මෙනෙහි කළයුතුයයි දක්වයි. සාධුක යන පදය හෝ පදද්වය සමග යොදා යම් හෙයකින් මෙම ධර්මය නිසා ගැඹුරුත් දේශනා අරුත් නිසාත් ගැඹුරුත් වේද, එහෙයින් මනාකොට ගැඹුරු ද අවබෝධ වශයෙන් ගැඹුරු ද, එහෙයින් මනාකොට අසව් යන මෙම යෙදීම දතයුත්තේය. භාසිස්සාමි, දේශනා කරන්නෙමි. තං සුණාථ යනුවෙන් මෙහි ප්‍රතිඥා කරන ලද දේශනාව සැකෙවින්ම නො දෙසන්නෙමි. යළිදු එය විස්තර වශයෙන්ම එය කියන්නෙමැයි කියන ලද්දේ වෙයි. කීයේ මැයි. වංගීස තෙරණුවෝ,

සංඛිත්තෙනපි දෙසෙති විත්ථාරෙ නපි භාසති
සාළිකායිව නිගෙඝාසො පටිභානං උදීරයි

(සැකෙවින්ද දේශනා කරයි විස්තර වශයෙන් ද කියයි. සාරිකා පක්ෂියාගේ මිහිරි අවියත් හඬ මෙන් වැටහීම පහළ කෙරෙයි.)

මෙසේ වදාළ කල්හි හටගත් උත්සාහ ඇත්තාහු එවං භනෙතහි ඛො තෙ භිකඛූ භගවතො පචචසෙසාසුං එසේය වහන්ස යයි කියා ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. බුදුරදුන්ගේ වචනයට සතුටු වූහ. පිළිගත්හයි කියන ලද්දේ වෙයි. ඉක්බිති භික්‍ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. දැන් කිවයුතු වූ "ඉධ භිකඛවෙ" ආදි සියලු සූත්‍රය වදාළ සේක.

ඉධ ශබ්දය, ඉධ යනු දේශය දැක්වීමෙහි නිපාත පදයකි. මෙය කිසිතැනක ලෝකය සඳහා කියනු ලැබේ. එබැවින් මෙසේ කියන ලදී. ඉධ තථාගතො ලොකෙ උපපජ්ජති කිසිතැනක ශාසනය කියනු ලැබේ. එහෙයින් කියන ලදී :- "ඉධ භිකඛවෙ සමණො ඉධ දුතියො සමණො" යනුයි. කිසිතැනක අවකාශය කියනු ලැබේ. එබැවින් මෙසේ කියන ලදී.

ඉධෙව තිට්ඨමානසස දෙවභූතසස මෙසතො
පුනරායුච මෙලද්ධො එවං ජානාහි මාරිය

යනුවෙන්,

(නිදුකාණෙනි, මේ අවකාශයෙහි සිටින්නා වූ දෙවියෙකු වූ මගේ නැවත ජීවිතයද, මා විසින් ලබන ලද්දේය. මෙසේ දැනගනු මැනව.

කිසිතැනක පදපූර මාත්‍රයම වෙයි. එය මෙසේ කියන ලද්දේ වෙයි. **ඉධාහං භික්ඛවෙ භූතතාවී අසසං පචාරිතො** යනුයි. මෙහි වනාහි 'ලෝකය' ගෙන වදාරණ ලදැයි දතයුතුය.

භික්ඛවෙ, ප්‍රතිඥා දුන් පරිදි දේශනාව කිරීම සඳහා නැවත භික්ෂූන්ට ආමන්ත්‍රණය කරන සේක. ශබ්ද දෙකින්ම මහණෙනි, මේ ලෝකයෙහි යන අරුත කියන ලද්දේ වෙයි. **අස්සුතවා පුථුජ්ජනො** යන මෙහි ආගම අධිගම රහිත හෙයින් ශ්‍රැය පුද්ගල තෙම අස්සුතවත් යයි දත යුතුයැ. එබැවින් යමෙකුට බන්ධ - ධාතු - ආයතන පච්චයාකාර සතිපට්ඨාන ආදියෙහි උග්ගහ පරිපුච්ඡා විනිච්ඡය රහිත බැවින් මෘඥදනා පටිසේධක වූ ආගම (දහම් දැනුම) නොමැත්තේ ද, පිළිවෙතින් පැමිණිය යුතු වූ අධිගමය නොකළ බැවින් අධිගමය නොමැත්තේ ද, ආගම - අධිගම රහිත ඒ ශ්‍රැය පුද්ගල තෙම අස්සුත නම් වේ. මෙම අස්සුතවත් පුද්ගල තෙමේ, මෙසේ දැක්වේ.)

**පුථූනං ජනතාදීහි කාරණෙහි පුථුජ්ජනො**
**පුථුජ්ජනනෙතාගධත්තා පුථුවායං ජනො ඉති** යනුවෙන්

(බොහෝ වූ කෙලෙසුන්ගේ ඉපදවීම් ආදිය හේතුකොටගෙන පුථුජ්ජන නම් වේ. බොහෝ වූ අනාර්ය ජනයන්ට ඇතුලත් බැවින් ද ඉහත සඳහන් ජනතෙම ආර්යයන්ගෙන් වෙන් වූයේ වෙයි.)

එබැවින් බොහෝ වූ නානාප්‍රකාර වූ කිලේසයන්ගේ ඉපද වීමාදි කරුණෙන් ද, පුථුජ්ජන නම් වේ. එබැවින් කීහ. බොහෝ වූ කෙලෙස් උපදවත්තුයි පුථුජ්ජන නම් වේ. බොහෝ වූ නොනසන ලද සක්කාය දෘෂ්ටිය ඇත්තේනුයි පුථුජ්ජන නම් වේ. බහුල වූ සියලු ගතිවලින් නොනැගිටන ලද්දාහු නුයි පුථුජ්ජන නම් වෙති. බොහෝ වූ විවිධ සංස්කාරයන් රැස් කෙරෙත්නුයි පුථුජ්ජන නම් වෙති. බොහෝ වූ කාමාදි විවිධ ඕඝයන්ගෙන් උල්පවත්නුයි සන්තාපයන්ගෙන් තැවෙත්නුයි පුථුජ්ජන නම් වෙති. බොහෝ වූ පඤ්චකාම ගුණයන්හි ඇලුනාහු ගිජු වූවාහු ගෙතුනාහු මුසපත් වූවාහු බැසගත්තාහු ලැගුනාහු නැවත නැවත ලැගුනාහු, එයින් උපදෘත වූවාහු පුථුජ්ජන නම් වෙති. බොහෝ වූ පඤ්ච නීවරණයන් විසින් ආවරණය කරන ලද්දාහු, නීවරණය කරන ලද්දාහු වැළඳ ගන්නා ලද්දාහු වසන ලද්දාහු ඡාදනය කරන ලද්දාහු, යටිමුව වූවානුයි පුථුජ්ජන නම් වෙති. බොහෝ වූ ගණන් කළ නොහැකි, ආර්ය ධර්මයන්ට විරුද්ධ

වූ පහත් ධර්මයන්හි හැසිරෙන ජනයන්ට ඇතුලත් වූවාහු වෙත්නුයි පුථුජ්ජන නම් වෙති. බොහෝ දෙනා ශීලය සුතය ආදී ගුණයෙන් හෙබි ආර්ය පුද්ගලයන් කෙරෙන් වෙන් වූවාහු යයි යන ගණනට වැටුන පහවූ ආර්ය පුද්ගල සංසර්ග ඇති ජනතෙම පුථුජ්ජන නම් වේ. මෙසේ මේ අසසුත වත් පුථුජ්ජන යන පද දෙකින් ගැනෙන යමෙක් වෙත් ද, ඔවුහුː-

දුවෙ පුථුජ්ජනාවුත්තා බුද්ධෙනාදිච්ච බන්ධුනා
අන්ධො පුථුජ්ජනො එකො කල්‍යාණෙකො පුථුජ්ජනො

(ආදිත්‍ය බන්ධු වූ බුදුරදුන් විසින් අන්ධ පුථුජ්ජන කල්‍යාණ පුථුජ්ජන යනුවෙන් පුථුජ්ජනයෝ දෙදෙනෙක් වදාරණ ලදී.) යනුවෙන් පුථුජ්ජනයෝ දෙදෙනෙක් කියන ලද්දාහු ද ඔවුන් අතුරෙහි මෙහි අන්ධ පුථුජ්ජන තෙම කියන ලද්දේ යයි දත යුත්තේ ය.

අරියානං අදසසාවි යනාදි තන්හි කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින් ද අනර්ථයෙහි නොපවත්නා හෙයින් ද අර්ථයෙහි පවත්නා හෙයින් ද, දෙවියන් සහිත ලෝකයා විසින් ප්‍රභානය කළ කෙලෙස් ඇති බැවින් බුදුවරයෝ ද පසේබුදුවරයෝ ද, බුදුසව්වෝ ද ආර්යයෝ යයි කියනු ලැබෙත්. මෙසේද වදාළහ. "සදෙවකෙ භික්ඛවෙ, ලොකෙ -පෙ- තථාගතො අරියොති වුච්චති" යනුවෙන්.

සප්පුරිසා යන මෙහි පසේ බුදුවරුද තථාගත ශ්‍රාවකයෝද සත්පුරුෂයෝ යයි දතයුත්තාහ. ඔවුහු වනාහි ලොව්තුරු ගුණ යෝගයෙන් ශෝභමාන වූ පුරුෂයෝ වෙත්නුයි සත්පුරුෂ නම් වෙති. සියල්ලන්ම මේ දෙඅයුරින් කියන ලද්දේ වෙයි. බුදුවරයෝ ද, ආර්යයෝ ද පසේ බුදුවරුද බුද්ධශ්‍රාවකයෝද සත්පුරුෂයෝ වෙති. එහෙයින් කියන ලදී. ː-

යො වෙ කතඤ්ඤූ කතවෙදි ධීරො
කල්‍යාණ මිත්තො දළ්හ භත්තීච හොති
දුක්ඛිතස්ස සක්කච්ච කරොති කිච්චං
තථා විධං සප්පුරිසං වදන්ති

(ඒකාන්තයෙන් යමෙක් කළගුණ දන්නේ ද එය ප්‍රකට වශයෙන් දන්නේ ද, කලණ මිතුරු වූයේ භක්තිය දැඩිව ඇත්තේද, දුකට පත් වූවහුට මනාලෙස කටයුතු කෙරේද ඔවුන් සත්පුරුෂයයි කියති.)

කල්‍යාණ මිත්තා දළ්භත්ති ච හොති යන මෙතෙකින්ම බුද්ධශ්‍රාවක තෙම කියන ලද්දේ වෙයි. කතඤ්ඤුතා ආදිය හේතුකොට පසේබුදු, බුදුවරයෝ කියන ලද්දාහු වෙති. දැන් යමෙක් එම ආර්යයන්ගේ නොදැකීම ස්වභාවකොට ඇත්තේ ද දැකීමෙහි සාධුකාරී නොවේ ද හෙතෙම ආර්යයන් නොදක්නේ යයි දතයුතුය. එම නොදැකීම, ඇසින් නොදැකීම නුවණින් නොදැකීම යයි දෙවැදෑරුම් වේ. එහි නුවණින් නොදැකීම මෙහි අදහස් කරන ලදී. දිවැසින් හෝ මසැසින් ආර්යයන් දක්නාහු නොදක්නාහුමය. ඒ ඇස්වලට වර්ණමාත්‍රය පමණක් ග්‍රහණය කරන හෙයින් ආර්ය භාවය ගෝචර නොවන බැවිනි. බලු සිවල් ආදීහුද ඇසින් ආර්යයන් දකිති. ඔවුහු ආර්යයන් නොදක්නාහු වෙති.

සිතුල්පව් වැසි මහලු තෙරුන්

ඒ පිළිබඳ මෙම කථා වස්තුව එයි. සිතුල්පව් වැසි රහතුන් වහන්සේ නමකගේ උපස්ථායක වූ මහලු පැවිදි කෙනෙක් වූහ. දිනක් රහතුන් වහන්සේ සමග පිඬුසිඟා යන්නේ උන්වහන්සේගේ පාත්‍ර සිවුරු ගෙන පසුපසින් එන්නේ, ස්වාමීනි, ස්වාමීනි, ආර්යයන් වහන්සේලා කෙබඳු දැයි තෙරුන් වහන්සේගෙන් ඇසීය. තෙරුන්වහන්සේ මෙසේ වදාළහ. "මෙලොව ඇතැම් මහල්ලෙක් ආර්යයන්ගේ පාසිවුරු ගෙන වත් පිළිවෙත් කොට, සමග හැසිරෙන්නේද, ආර්යයන් නොම දනී. ඇවැත්නි, ආර්යයෝ මෙසේ නොදත හැක්කාහුය." මෙසේ වදාළ කලද, හෙතෙම නොම දත්තේය.

එසේ හෙයින් ඇසින් ආර්යයන් දැක්ම දැකීමක් නොවෙයි. නුවණින් දැක්ම ආර්යයන් දැක්ම වේ. එහෙයින් වදාළහ. "කිං තෙ වක්කලී ඉමිනා පූතිකායෙන දිට්ඨෙන යො ඛො වක්කලී ධම්මං පස්සති සො මං පස්සති" යනුවෙන් වක්කලිය යමෙක් දහම් දකීනම් හෙතෙම මා දකීයයි එහෙයින් ඇසින් දකින්නේද නුවණින් ආර්යයන් විසින් දක්නා ලද අනිත්‍යාදි ලක්ෂණ නොදක්නේ ආර්යයන් අවබෝධ කළ ධර්මයට නොපැමිණෙන්නේ ආර්යභාව ඇතිකරන ධර්මයන් ද ආර්ය භාවයද නොදක්නා ලද බැවින් ආර්යයන් නොදක්නේ යයි දත යුත්තේය.

"අරියධම්මෙ අවිනීතො" යන මෙහි
දුවිධො විනයො නාම එකමෙකස්ථ පඤ්චවධා
අභාවතො තස්ස අයං අවිනීතොති වුච්චති

(විනය දෙවදෑරුම් වේ. මෙම එක එක විනයක් පස් පස් ආකාර වේ. ඒ විනයාගේ අභාවයෙන් අසසුතවත් පුථුජ්ජන තෙම අවිනීත යයි කියනු

ලැබේ. මෙහි සංවර විනය පහාන විනය යයි දෙවැදෑරුම් වේ. මෙම එක එක විනය පස් අයුරකින් ප්‍රභේදයට පැමිණේ. මෙහි සංවර විනය, සීල සංවරය, සති සංවරය, ඤාණ සංවරය, ඛන්ති සංවරය, විරිය සංවරය යනුවෙන් ප්‍රභේද පසකින් යුක්ත වේ. පහාන විනයද, තදංග පහාන විකඛමහන පහාන සමුචෙඡද පහන පටිපසසද්ධි පහාන නිසසරණ පහාන- යනුවෙන් පස් අයුරු වේ. ඔවුන් අතුරෙහි "ඉමිනා පාතිමොකඛ සංවරෙන උපෙතො හොති සමුපෙතො" යනු සීල සංවරයයි. රකඛති චකඛුන්‍ද්‍රියං චකඛුන්‍ද්‍රියෙ සංවරං ආපජ්ජති යන මේ සති සංවරයයි.

යානි සොතානි ලොකසමිං, (අජිතාති) භගවා
සති තෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑමි පඤ්ඤායෙතෙ පිථියරෙ

(ලෝකයෙහි යම් තෘෂ්ණා ආදි යම් ශ්‍රෝතස කෙනෙක් වෙත්නම් සතිය ඔවුනට ආවරණය වේ. එම සතිය ස්‍රොතසුන්ගේ සංවරයයි කියමි. මාර්ග ප්‍රඥාවෙන් තෙල ස්‍රොතස්හු වසනු ලැබෙත්.)

යන මෙය ඤාණ සංවරයයි.

"ඛමො හොති සීතසස, උණහසස" යන මෙහි ඛනති සංවරයෙහිය. "උපපනනං කාමවිතකකං නාධිවාසෙති පජහති" යන මෙහි විරිය සංවරයෙහිය. තව ද මෙම සියලු සංවරයෝ තම තමාට අයත් පරිදි සංවර කළයුතු වූ ද හික්මවිය යුතු වූ ද කාය දුෂ්චරිතාදීන් සංවරණය කළ යුතු හෙයින් විනය යයි ද කියනු ලැබෙත්.

අන්ධකාරයට ප්‍රතිවිරුද්ධ වූ පහන් එළියෙන් අන්ධකාරය ප්‍රහාණය වේද, ඒ ඒ විදසුන් නැණින් ඒ ඒ කෙලෙස් අංගයන්ගේ ප්‍රහාණය වේද, ඒ කෙසේද යත්, නාමරූප ව්‍යවස්ථානයෙන් (නාම රූප ධර්මයන් වෙන්කොට බැලීමෙන්) සක්කාය දිට්ඨිය ද, ප්‍රත්‍ය විමසා බැලීමෙන් අහේතු විෂම හේතු දෘෂ්ටින්ගේ ද ප්‍රත්‍ය පරිග්ගහයෙන් (ඒ ප්‍රත්‍යයන් විමසා බැලීමෙන්ම) අපර භාගයෙහි කඩබාවිතරණ ඤාණයෙන් සැකයන්ගේ ද නාමරූප ධර්මයන්ගේ කලාප සම්මර්ෂණයෙන් මමය මාගේය යන දෘෂ්ටින්ගේ ද, මාර්ග අමාර්ග වෙන්කර බැලීමෙන් අමාර්ගයෙහි මාර්ගය යන සංඥාවෙන් ද උදයානුපස්සනාවෙන් උච්ඡේද දෘෂ්ටියේ ද, වයානු

පස්සනාවෙන් ශාස්වත දෘෂ්ටියගේද, භයතු පට්ඨාන පස්සනාවෙන් භය සහිත වූ (උපාදාන ස්කන්ධයෙහි) අභය සංඥාවගේ ද නිබ්බිදානු පස්සනාවෙන් ඇලීමේ සංඥාවෙන්ද, මුඤ්චිතු කම්‍යතා ඤාණයෙන් උපෙක්ඛා ඤාණයෙන්, අනපෙක්ඛාවගේ ද අනුලෝම ඤාණයෙන් ධම්මට්ඨිතියෙහි හා නිවනෙහි ප්‍රතිලෝම භාවයාගේ ද, ගෝත්‍රභූ ඤාණයෙන් සංස්කාර නිමිති ගැනීමේ ද ප්‍රහානය වේ. මේ තදංග ප්‍රහාණය නම් වේ.

යම් ඒ උපචාර අප්පනා භේදගත සමාධිය හේතුවෙන් පවත්නා නීවරණ ධර්මයන් කෙරෙන් කළයේ පහරින් දිය මතුපිට සෙවල මෙන් ඒ ඒ නීවරණ ධර්මයන්ගේ ප්‍රහාණය වේ. මෙය විෂ්කම්භන ප්‍රහාණ නම් වේ.

සතර ආර්ය මාර්ග වැඩූ බැවින් මාර්ගවත් වූ තම සන්තානයෙහි දිට්ඨීනගතානං පහානාය, යනාදී නයින් වදාළ සමුදය පක්‍ෂයෙහි වූ කෙලෙස් සමූහයාගේ නැවත හට නොගන්නා වූ ස්වරූපයෙන් යම් ප්‍රහානයෙක් වේද එය සමුච්ඡේද ප්‍රහාණ නම් වේ.

ඵල ක්‍ෂණයෙහි කෙලෙසුන්ගේ යම් සංසිඳෙන බවක් වේද, එය පටිපස්සද්ධි පහාණ නම් වේ. සියලු සංඛත ධර්මයන්ගෙන් බැහැර වූ බැවින් ප්‍රහීණ වූ සියලු සංස්කාරයන් ඇති යම් නිවනක් වේද, මෙය නිස්සරණ ප්‍රහාණ නම් වේ.

මේ සියලු ප්‍රහාණයෝ ත්‍යාගාර්ථයෙන් ප්‍රහාණද, හික්මීම් අරුතින් විනය ද වේ. එහෙයින් ප්‍රහාණ විනය යයි කියනු ලැබේ. නැතහොත් ඒ ඒ ප්‍රහාණ ඇත්තහු ඒ ඒ විනයාගේ සම්භවය ඇතිවන බැවින් මෙය ප්‍රහාණ විනයයි ද කියනු ලැබේ. එසේම මේ ප්‍රහාණ විනය ද පස් අයුරකින් ප්‍රභේද ඇත්තේ වේ.

මෙය සැකෙවින් ද්විධ වේ. විස්තර වශයෙන් දශවිධ වූද විනය භින්න සංවර ඇති හෙයින් ද ප්‍රහීණ කළයුත්ත ප්‍රහීණ නොකළ හෙයින්ද යම්හෙයකින් මේ අශ්‍රැතවත් පුථුජ්ජනයාට නැත්තේ ද එහෙයින් "අභාවතො තසස අයං අවිනීතොති වුච්චති" යනුවෙන් කියන ලදී. "සප්පුරිසානං අදස්සාවී සප්පුරිස ධම්මසස අකොවිදො සප්පුරිය ධම්මෙ අවිනීතො" යන

මෙහිද මේ ක්‍රමය මැයි. මෙහි අර්ථ වශයෙන් නානා බවක් නැත්තේය. එහෙයින් කියන ලදී.

මෙහි ආර්යයෝ යමෙක්හු වෙත් ද, ඒ සත්පුරුෂයෝත් ඔවුහුමය. ඒ සත්පුරුෂයෝ යමෙක්හු වෙත්ද, ඒ ආර්යයෝත් ඔවුහුම වෙත්. යමක් එම ආර්යයන්ගේ ධර්මය වේ ද, සත්පුරුෂයන්ගේ ධර්මයත් එයමයි. යමක් සත්පුරුෂයන්ගේ ධර්මය වේද, ආර්යයන්ගේ ධර්මයත් එයමය.

යම් ආර්ය විනයෝ වෙත්ද, සත්පුරුෂ විනයෝත් ඔවුහුමය. යම් ඒ සත්පුරුෂ විනයෝ වෙත්ද, ආර්ය විනයෝත් ඔවුහුම වෙත්. ආ්රයයෝ යයිද, සත්පුරුෂයෝ යයිද, ආර්ය ධර්මයයි ද, සත්පුරුෂ ධර්මයයි ද ආර්ය විනය යයිද සත්පුරුෂ විනය යයි ද ඒකාංගයෙහි වූ එක් වූ ඒකාර්ථ වූ සම වූ සමභාග වූ එයින් හටගත්තේ හෝ එයින් අන්‍ය වූයේ හෝ වෙයි.

කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ "සබ්බ මූල පරියායං වො භික්ඛවෙ දෙසෙස්සාමි" යනුවෙන් වදාරා එය දේශනා නොකොටම, "ඉධ භික්ඛවේ අස්සුත වා පුථුජ්ජනො අරියානං අදස්සාවී" යයි මෙසේ පුථුජ්ජනයා දැක්වූ සේක් ද, පුද්ගල අධිෂ්ඨාන ධර්ම දේශනාවෙන් එම අරුත ප්‍රකට කරනු පිණිස යැ.

චතුර්විධ දේශනාවෝ:

භාග්‍යවතුන් වහන්සේගේ ධම්ම අධිට්ඨාන ධම්මදේශනා, ධම්ම අධිට්ඨාන පුග්ගල දේශනාය, පුග්ගල අධිට්ඨාන පුග්ගල දේශනාය, පුග්ගල අධිට්ඨාන ධර්ම දේශනා යයි ධම්ම පුග්ගල වශයෙන් දේශනාවෝ චතුර්විධ වෙති.

එහි "තිස්සො ඉමා භික්ඛවෙ, වෙදනා, කතමා තිස්සො, සුඛා වෙදනා, දුක්ඛාවෙදනා, අදුක්ඛමසුඛා වෙදනා ඉමා ඛො භික්ඛවෙ තිස්සො වෙදනා" මෙබඳු දෙසුම් ධම්මාධිට්ඨාන දේශනා යයි දතයුතුයි.

"ඡද්ධාතුරො අයං භික්ඛු පුරිසො ඡ ඵස්සායතනො අට්ඨාරස මනො පවිචාරො චතුරාධිට්ඨානො" මෙබඳු දේශනා ධම්මාධිට්ඨාන පුග්ගල දේශනා නම් වේ.

තයො මෙ භික්ඛවෙ පුගගලාසනෙතා සංවිජ්ජමානො ලොකස්මිං කතමෙ තයො අන්‍ධො එකචක්ඛු ද්විචක්ඛු කතමොච භික්ඛවෙ පුගගලො අන්‍ධො යන මෙබඳු දේශනා පුගගලාධිට්ඨාග පුග්ගල දේශනා නම් වේ.

කතමඤ්ච භික්ඛවෙ දුගගති භයං ඉධ භික්ඛවෙ, එකචෙචා ඉති පටිපඤ්චික්ඛති කායදුච්චරිතසස ඛො පාපකො විපාකො අභියමපනරායං -පෙ- සුද්ධ මත්තානං පරිහරති ඉදං වුච්චති භික්ඛවෙ දුගගතිභයං මේ පුගගලාධිට්ඨාග ධර්මදේශනා නම් වේ.

පුහුදුන් ජනතෙම යම් හෙයකින් මෙහි අපරිඤ්ඤාත (මනාසේ අවබෝධ නොකළ) වස්තු ඇත්තේද මෙහි අදහස් කළ සියලු ධර්මයන්ට මුල් වූ මඤ්ඤනා අපරිඤ්ඤාතය මුල්කොට ඇත්තෝ ද එහෙයින් පුහුදුන් මනුෂ්‍යයා දක්වාම පුගගලාධිට්ඨාන දේශනාව පිළිබඳ එම අර්ථය පහළ කරනු පිණිස "ඉධ භික්ඛවෙ, අසසුතවා පුථුජ්ජනො අරියානං අදසසාවී" යනුවෙන් පුහුදුන් ජනයා දැක්වූ සේකැයි දතයුතුය.

මේ ආකාරයෙන් පුථුජ්ජනයා දක්වා දැන් ඔහුගේ පෘථුවි ආදි වස්තුන්ගෙන් සක්කාය ධර්මයෙන් උපන් මඤ්ඤනා (වැරදි හැඟීම්) දක්වන්නේ, පඨවිං, පඨවිතො ආදිය වදාළහ.

චතුර්විධ පඨවි

එහි ලක්ඛණ පඨවි, සසමහාර පඨවි, ආරමමණ පඨවි, සමමුති පඨවි යයි චිතුර්විධ වේ.

ඔවුන් අතුරෙහි "කතමා ච ආවුසො අජ්ඣත්තිකා පඨවි ධාතු යං අජ්ඣත්තං පච්චත්තං ඛක්කලං ඛරිගතං" යනාදි තන්හි දක්වා ඇත්තේ ලක්ඛණ පඨවියයි.

"පඨවිං ඛණෙයා වා ඛණාපෙයා වා" යනාදි තන්හි ප්‍රකාශ වන්නේ සසමහාර (පරිවාර දේවල් සහිත) පඨවියයි.

අජ්ඣත්තික වූ යම් කේස ආදි විසි කොටසක් වේ ද, බාහිර වූ අයෝ ලෝහාදියක් වෙත්ද, පඨවි ධාතුව වර්ණ ආදි සම්භාරයෙන් සමග යුක්ත වූයේ සසම්භාර පඨවි නම් වේ.

CS Scanned with CamScanner

"පඨවි කසිණ මෙකො සඤ්ජානාති" යනාදි තන්හි ආරම්මණ පඨවිය යෙදී ඇත. මෙයට නිමිත්ත පඨවිය යයි ද කියනු ලැබේ. පඨවි කසිණ ධ්‍යාන ලාභීව දෙව්ලොව උපන්නේ පඨවි දේවතා යයි නම් ලබයි. මෝ සම්මුති පඨවි යයි දතයුත්තීය. චතුර්විධ පඨවියම මෙහි ලැබෙයි. ඔවුන් අතුරෙන් යම් කිසි පඨවියක් පුහුදුන් ජනමෙම "පඨවිතො සඤ්ජානාති" පඨවිය යයි හඳුනයි. පඨවි භාවයෙන් හඳුනයි. ලෝ වහර ගෙන සඤ්ඤා විපල්ලාසයෙන් හඳුනයි. පඨවි යනු මේ පඨවි භාවය නොහරින්නේම හෝ මේ සත්ත්වයා කියා හෝ මෙය සත්ත්වයාගේ කියා හෝ මේ ආදි අයුරින් හඳුනයි. කුමක් හෙයින් මෙසේ හඳුනා ගනී යයි නොකිය යුතුය. පුහුදුන් ජනතෙම උම්මත්තකයෙකු වැනිවෙයි. හෙතෙම යම්කිසිවක් යම්කිසි ආකාරයකින් ගනීද, ආර්යයන්ගේ නොදක්නා බව යනාදි භේදයට හෝ මෙයට කරුණු වේ. යමක් හෝ මත්තෙහි අපරිඤ්ඤාතං තසස යයි වදාරණ බුදුරදුන් විසින්ම වදාරණ ලදද, (එයම මෙයට කරුණු වේ.)

පඨවිං පඨවිතො ඤත්වා යනු හෙතෙම ඒ පඨවිය මෙසේ ඒ විපරීත වූ සඤ්ඤාවෙන් හැඳින සඤ්ඤා නිදානාහි පපඤ්ච සංඛා යයි වදාළ හෙයින් අපර භාගයෙහි, බලවත් බවට පැමිණි මඤ්ඤනා තණ්හා දිට්ඨි-මාන පපඤ්චයන් හේතු කොටගෙන කල්පනා කරයි. විශේෂයෙන් කල්පනා කරයි. නානාප්‍රකාර වූ අන්‍යථාවන් ග්‍රහණය කෙරෙයි. පඨවිං මඤ්ඤති යනුවෙන් එහෙයින් වදාරණ ලදී.

මෙසේ සිතන ඔහුගේ ඒ මඤ්ඤනා ඕලාරික නයින් දක්වන්නට, යම් මේ කේසා ලෝමා ආදි ක්‍රමයෙන් විසිවැදෑරුම් අධ්‍යාත්මික පඨවිය කියන ලද්දේය. යම් ඒ පඨවිය විභංගයෙහි "තත්‍ථ කතමා බාහිරා පඨවීධාතු යං බාහිරං කක්ඛලං ඛරිගතං කක්ඛළත්තං කක්ඛලභාවො බහිද්ධා අනුපදිණ්ණං සෙය්‍යථීදං අයො ලොහං, තිපු සීසං සජ්ඣු මුත්තා මණි වෙළුරියං සංඛො සිලා පවාලං රජතං ජාතරූපං ලොහිතංකො, මසාරගල්ලං තිණං කට්ඨං සක්ඛරං කඨලා භූමිපාසාණො පබ්බතො" යන මෙයින් බාහිර පඨවි ධාතුව වදාරණ ලද්දේ වෙයි.

අධ්‍යාත්මික අරමුණු තුනෙහි යම් නිමිත්ත පඨවියක් වේද එයද ගෙන මෙහි අරුත් පවසනු ලැබේ. පඨවිං මඤ්ඤති, ත්‍රිවිධ මඤ්ඤනාවෙන්ම මම 'පඨවිය' වෙමියි සිතයි. මගේ පඨවියයි සිතයි. අනුන්ගේ පඨවි යයි සිතයි. පරාගේ පඨවියයි සිතයි. නැතහොත්

අධ්‍යාත්මික පඨවිය තණ්හා මඤ්ඤනාවෙන් සිතයි. මාන මඤ්ඤනාවෙන් සිතයි. දෘෂ්ටි මඤ්ඤනාවෙන් සිතයි. ඒ කෙසේද යත්,

මෙතෙම කේසාදීන් කෙරෙහි ඡන්දරාගය උපදවයි. කේශයන් ආශ්වාදනය කෙරෙයි. සතුටු වෙයි. සතුටුවන වචන කියයි. තෘෂ්ණාවෙන් ඇතුළත්ව සිටියි. ලෝම-නිය-දත්-සිවි හෝ වෙනත් ඇලුම් කටයුතු වස්තුවක් හෝ ආශ්වාදනය කෙරෙයි. මෙසේ අජ්ඣත්තික පඨවිය තණ්හා මඤ්ඤනාවෙන් සිතයි. මෙසේ මාගේ කේශයෝ අනාගත කාලයෙහි වන්නාහු නම්, මෙසේ රෝමයෝ වන්නාහු නම් යනාදි ක්‍රමයෙන් හෝ එහි තණ්හාව පිහිටුවයි. මම සීලයෙන් හෝ -පෙ- බ්‍රහ්ම චර්යාවෙන් හෝ මෙසේ සිනිඳු මුදු සියුම් කෙස්කළඹක් ඇත්තෙක් වන්නෙමියි යනාදී ක්‍රමයෙන් හෝ නොලැබූ කේශයන්ගේ ලැබීම පිණිස සිත පිහිටුවයි. මෙසේ අජ්ඣත්තික පඨවිය මාන මඤ්ඤනාවෙන් සිතයි. එසේම තමාගේ කේශාදීන්ගේ සම්පත්තිය හෝ විපත්තිය නිසා මම ශ්‍රේෂ්ඨයෙක් වෙමියි හෝ මම සමානයෙක් වෙමියි හෝ මම හීනයෙක් වෙමියි හෝ මානය උදපදවයි. මෙසේ අජ්ඣත්තික පඨවිය ගැන මාන මඤ්ඤනාවෙන් සිතයි.

"තං ජීවං තංසරීරං" මෙහි ආවා වූ ක්‍රමයට කෙස් ජීවයයි ගනියි. ලෝමාදීන් පිළිබඳවද මේ ක්‍රමය මැයි. මෙසේ අජ්ඣත්තික පඨවිය දෘෂ්ටි මඤ්ඤනාවෙන් සිතයි.

නැතහොත් "යා චෙව ඛො පන අජ්ඣත්තිකා පඨවි ධාතු යාච බාහිරා පඨවිධාතු පඨවිධාතුරෙවෙසා තං නෙතං මම" (යම් අජ්ඣත්තික පඨවි ධාතුවක් වේද, යම් බාහිර පඨවි ධාතුවක් වේ ද, මෝ තොමෝ පඨවි ධාතුව වන්නීය. ඒ පඨවි ධාතුව මගේ නොවෙයි.)

යන මේ පැවැත්මට විරුද්ධ අර්ථයෙන් කේසාදි ක්‍රමයෙන් ප්‍රභේදගත වූ අජ්ඣත්තික පඨවි ධාතුව මෙය මගේය මේ තෙම මම වෙමි මේ තෙම මගේ ආත්මය යයි දැඩිව ගනියි. මේ අයුරින් අජ්ඣත්තික පඨවිය දිට්ඨි මඤ්ඤනාවෙන් සිතයි. මෙසේ පළමුකොට අජ්ඣත්තික පඨවිය ත්‍රිවිධ මඤ්ඤනාවෙන් සිතයි. අජ්ඣත්තික පඨවිය යම් සේ ද එසේම බාහිර පඨවිය ගැනද සිතයි. ඒ කෙසේද යත්,

මෙතෙම අයස් ලෝහ ආදීන් විෂයෙහි ඡන්දරාගය උපදවයි. අයස්-

ලෝභ ආදිය ආශ්වාදනය කෙරෙයි. සතුටු වෙයි. එහි දියුණුව පිණිස කථා කරයි. තණ්හාවෙන් ඒවා ගැන සලකමින් සිටියි. මගේ යකඩය, මගේ ලෝහය යනාදි ක්‍රමයෙන් යකඩ ආදිය මමායනය කෙරෙයි. ආරක්ෂා කරයි. ගෝපනය කරයි. මෙසේ බාහිර පඨවිය තණ්හා මඤ්ඤනාවෙන් ගනී. මෙසේ මගේ යකඩ ලෝහ ආදීහු අනාගත කාලයෙහි වන්නාහු නම් හොඳය. මෙසේ මේ යකඩ ලෝහ ආදියෙහි තණ්හාව මනා ලෙස පිහිටුවයි. මම මේ සීලයෙන් ව්‍රතයෙන් තපසින් බ්‍රහ්ම චර්යාවෙන් සමෘද්ධ වූ යකඩ ලෝහ ආදි උපකරණ ඇත්තෙක් වන්නෙමි. හෝ නොලත් යකඩ ලෝහ ආදී උපකරණ ලබාගැනීම පිළිබඳවද සිත පිහිටුවයි. මෙසේ බාහිර පඨවිය තණ්හා මඤ්ඤනාවෙන් ගනියි. එසේම තමාගේ යකඩ ලෝහාදි උපකරණයන්ගේ සම්පත්තිය හෝ විපත්තිය හෝ නිසා මානය උපදවයි.

මම මේ හේතුවෙන් ශ්‍රේෂ්ඨ වෙමි යයි ද සමානයෙක් වෙමි යයි ද මෙසේ බාහිර පඨවි මාන මඤ්ඤනාවෙන් සිතයි. යකඩයෙහි ජීවයයි සඤ්ඤා ඇතිව මෙය ජීවයයි දැඩිව සිතයි. මෙසේ බාහිර පඨවිය දෘෂ්ටි මඤ්ඤනාවෙන් සිතයි. නැතහොත් **"ඉධෙ කච්චො පඨවිකසිණං අත්තනො සමනුපස්සති යං පඨවි කසිණං සො අහං, යො අහං තං පඨවි කසිණං"** (මේ ලෝකයෙහි කිසිවෙක් පඨවි කසිණය ආත්ම වශයෙන් දකියි. යම් පඨවි කසිණයක් වේද, හේ මම වෙමි. මම යමෙක් ද පඨවි කසිණය එයයි. මෙහි පඨවි කසිණය ද, ආත්මය ද එකක් වශයෙන් සලකා ඇත යනුවෙන් පටිසම්භිදා මග්ගයෙහි වදාළ නයින්ම පඨවි නිමිත්තම ආත්ම වශයෙන් සලකා ඇත. මෙසේ ද බාහිර පඨවිය දෘෂ්ටි මඤ්ඤනාවෙන් ගනියි. මෙසේ බාහිර පඨවිය ත්‍රිවිධ මඤ්ඤනාවන්ගෙන්ම ග්‍රහණය කර ඇත. මෙසේ හෙයින් **"පඨවිං මඤ්ඤති"** යන මෙහි මේ අයුරින් ත්‍රිවිධ මඤ්ඤනාවෝම දත යුත්තාහුය. මින් මතු සැකෙවින්ම කියන්නෙමි.

**පඨවියා මඤ්ඤති** යන මෙහි පඨවියා භුමම (=ආධාර) වචනයකි. එබැවින් මම පඨවියෙහි සිටියෙමියි සිතයි. මගේ කිඤ්චන (කෙලෙස්) නම් වූ පලිබෝධය පඨවි ධාතුවෙහි වූයේ යයි සිතයි. අන්‍යයෝ පඨවි ධාතුවෙහි වූහයි සිතති. අනුන් පිළිබඳ කිඤ්චන නම් වූ පලිබෝධ පඨවි ධාතුවෙහි වූයේයයි සිතයි. මෙසේ මේ කියන ලද්දේ පඨවියා මඤ්ඤති යන මෙහි අර්ථයයි. නැතහොත් **කථං රූපස්මිං අත්තානං සමනුපස්සති, ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සංඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති**

**අයං ඛො පන මෙ අත්තා සො ඛො පන මෙ අත්තා ඉමස්මිං රූපෙති එවං රූපස්මිං වා අත්තානං සමනු පස්සති.**

(රූපයෙහි ආත්මය කෙසේ දකීද යත්, මෙලොව කිසිවෙක් වේදනාවද, සඤ්ඤාව ද, සංඛාරය ද, විඤ්ඤාණය ද මේ මාගේ ආත්මය යයි ආත්ම වශයෙන් දකී. ඒ මගේ ආත්මය වූ කලී රූපයෙහි පිහිටියේ යයි මෙසේ රූපයෙහි ආත්මය දකී.)

මෙම දේශනාවේ යම් අරුත් ක්‍රමයක් වේද, එය වදාරණ ලද්දේය. මේ අයුරින්ම වේදනාදි ධර්ම ආත්ම වශයෙන් ගෙන නැවත අජ්ඣත්තික බාහිර පඨවිධාතු අතුරෙන් යම්කිසි පඨවි ධාතුවක් ඊට අවකාශ වශයෙන් සලකා ඒ මේ මගේ ආත්මය වූ කලී මේ පඨවියෙහිම වූයේ යයි සිතන්නේ පඨවියෙහි ආත්මය පිහිටියේ යයි සිතයි. මේ ඔහුගේ දෘෂ්ටි මඤ්ඤතාවයි. ඒ පඨවිගත ආත්මයෙහිම ආදරයද, එය වස්තුකොට ඇති මානයද උපදවන්නා වූ ඔහුගේ තණ්හා මාන මඤ්ඤනාවෝ ද දතයුත්තාහුය. යම්විටක ඒ අයුරින්ම හෙතෙම ඒ ආත්ම තෙම පඨවියෙහි වූයේයයි සිතාද එවිට දෘෂ්ටි මඤ්ඤනාවම යෙදෙයි. අනිත් මඤ්ඤතාවෝත් කැමති වෙත්.

**පඨවිතො මඤ්ඤති** යන මෙහි පඨවි ශබ්දය නිස්සක්ක (පංචමී) වචනයි. එබැවින් උපකරණ සහිත වූ තමාගේ හෝ මෙරමාගේ හෝ ඉහත දැක්වූ පරිදි ප්‍රභේද ඇති පඨවියෙහි ඉපදීම හෝ නික්මීම හෝ පඨවිය කෙරෙන් අන්‍ය වූ ආත්මයක් හෝ වේයයි සිතන්නේ පඨවි ධාතුව කෙරෙන් අනිකක් ආත්මය වේයයි සිතයි. මෙසේ දතයුතුයැ. මේ ඔහුගේ දෘෂ්ටි මඤ්ඤනාවයි.

දිට්ඨි මඤ්ඤනාවෙන් මඤ්ඤනය කරනු ලැබූ ඒ වස්තුවෙහි සෙනහය ද මානය ද උපදවන්නා වූ ඔහුගේ තණ්හා-මාන-මඤ්ඤනාවෝ ද දතයුත්තාහුය. (අපරෙ) අන්‍ය ආචාර්ය කෙනෙක් මෙසේ කියති. පඨවි කසිණය ස්වල්පයක් වඩා එයිනිදු අන්‍ය වූ අප්‍රමාණ ආත්මය ගෙන පඨවි ධාතුවෙන් පිටතද මගේ ආත්මය වේයයි හඟින්නේ යන අරුත් වේ.

**පඨවිං මෙති මඤ්ඤති** යනුවෙන් මෙහි හුදෙක් මහා පඨවියම තණ්හා වශයෙන් මමායනය කෙරේයයි මේ අයුරින් පවත්නා යම්

තණ්හාවක් වේද, එය තණ්හා මඤ්ඤනා වශයෙන් ලැබේයයි දතයුතුය. ඒ තණ්හා මඤ්ඤනාව මගේ කෙස්ය. මගේ ලොමය. මගේ යකඩය, මගේ ලෝහය කියා මෙසේ ඉහත සඳහන් ප්‍රභේදගත සියලු අජ්ඣත්තික බාහිර පඨවි ධාතුව සමග යෙදිය යුතුයයි දතයුතුය. පඨවිං අභිනන්‍දති යනුවෙන් ඉහත දක්වන ලද්දා වූම පඨවි ධාතුව තණ්හා දිට්ඨි හේතුකොට ගෙන සතුටු වෙයි. ආශ්වාදනය කෙරෙයි. පරාමර්ශනය කෙරේ යයි වදාරණ ලද්දේ ද වෙයි.

පඨවිං මඤ්ඤති (පඨවිය තණ්හා මඤ්ඤනාදි වශයෙන් හඟියි) යනුවෙන් මෙයින්ම මෙහි කාර්ය සිද්ධිය වී ඇති බැවින් කුමක්හෙයින් මෙසේ කියන ලද්දේ ද මේ කරුණ පොරාණයන් විසිනුදු විචාරණය නොකරන ලද්දේය. මේ වනාහි මගේ අතතනොමතියයි දේශනාවගේ විශාලත්වය හෝ ආදීනව දර්ශනය හෝ නිසා මෙසේ වදාරණ ලදී. යම් ධම්ම ධාතුවක් මනාකොට ප්‍රතිවේධ කරන ලද බැවින් නානා නය විචිත්‍ර දේශනා විලාශයෙන් යුක්ත වූයේ වේද, මේ ධම්ම ධාතුව බුදුරදුන් විසින් මොනවට ප්‍රතිවේධ කරන ලද්දේ ද, එබැවින් පළමුකොට මඤ්ඤනා වශයෙන් කෙලෙසුන්ගේ උපත දක්වා අනතුරුව අභිනන්දනය වශයෙන් දැක්වීම දේශනා විලාස බැවින් මෙසේ වදාළහ. නැතහොත්,

යමෙක් පඨවි ධාතුව (තණ්හා - දිට්ඨි - මාන) වශයෙන් හඟීද (ගනීද) පඨවියෙහි ආත්මය ඇතැයි සිතා ද පඨවියෙන් පිටත ආත්මය ඇතැයි සිතාද පඨවි ධාතුව මගේ යයි සිතාද හෙතෙම යම් හෙයකින් පඨවිය ඇසුරු කළ තණ්හාව හෝ දිට්ඨිය අත්හරින්ට අසමර්ථ වේද එහෙයින් පඨවි ධාතුවට සතුටු වෙයි. යමෙක් පඨවි ධාතුවට සතුටු වෙයි ද හෙතෙම දුකට සතුටු වෙයි. දුකද ආදීනවයකැයි ආදීනව දක්නා බැවින් ද මෙය වදාළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාරණ ලද්දේද වෙයි.

**"යො භික්ඛවෙ පඨවි ධාතුං අභිනන්‍දති දුක්ඛං සො අභිනන්‍දති, යො දුක්ඛං අභිනන්‍දති අපරිමුත්තො දුක්ඛස්මාති වදාමි"**

(මහණෙනි, යමෙක් පඨවි ධාතුවට සතුටු වේද, හේ දුකට සතුටු වෙයි. යමෙක් දුකට සතුටු වේද, හෙතෙම දුකින් නොමිදුනේ යයි ප්‍රකාශ කරමි.)

මෙසේ පඨවි වත්‍ථුක වූ මඤ්ඤනාවෙන් සතුටුවීම ප්‍රකාශකොට, දැන් යම් කරුණකින් හෙතෙම හඟීද, සතුටුවේද, එම කරුණ ප්‍රකට කරනසේක්, තං කිසස හෙතු අපරිඤ්ඤාතං තසසාති වදාමි යනුවෙන් වදාළහ. යම් හෙයකින් ඔහු විසින් වස්තුව පිරිසිඳ නොදක්නා ලදද ඒ නිසායයි වදාරණ ලද්දේ වෙයි.

ත්‍රිවිධ පරිඤ්ඤා

යමෙක් පඨවි පිරිසිඳ දනීද, හෙතෙම ඤාත පරිඤ්ඤාවෙන් ද, තීරණ පරිඤ්ඤාවෙන් ද, පහාණ පරිඤ්ඤාවෙන් ද යන ත්‍රිවිධ පරිඤ්ඤාවෙන් පිරිසිඳ දනී.

ඔවුන් අතුරෙහි ඤාත පරිඤ්ඤාව කවරේද යත්, මේ අජ්ඣත්තික පඨවි ධාතුවය, මේ බාහිර පඨවි ධාතුවය, මේ එහි ලක්‍ෂණය, මොවුහු එහි රස පච්චුපට්ඨාන පදට්ඨානයෝ යයි පඨවි ධාතුවා පිරිසිඳ දනී. මේ ඤාත පරිඤ්ඤාවයි.

තීරණ පරිඤ්ඤාව කවරේද යත්, මෙසේ ඤාත පරිඤ්ඤාවෙන් දක්නා ලද, පඨවි ධාතුව අනිච්ච-දුක්ඛ-රෝග ආදි සතලිස් අයුරකින් තීරණය කෙරේද, එය තීරණ පරිඤ්ඤා නම් වේ. පහාණ පරිඤ්ඤා කවරේද යත්, මෙසේ තීරණ පරිඤ්ඤාවෙන් තීරණය කොට අගමගින් පඨවි ධාතුවෙහි ඡන්දරාගය දුරුකෙරේද, මේ පහාණ පරිඤ්ඤා නම් වේ. ආර්ය මාර්ග ඥානය තොමෝ පහාණ පරිඤ්ඤා නම් වන්නීය.

යමෙක් පඨවි ධාතුව පිරිසිඳ දනීද, හෙතෙම ත්‍රිවිධ පරිඤ්ඤාවෙන් පිරිසිඳ දනී. පුහුදුන්හට මේ පරිඤ්ඤාවෝ නැත. එහෙයින් පිරිසිඳ නොදත් බැවින් පඨවිය මඤ්ඤනා වශයෙන් හඟියි. එහි අභිනන්දනය ඇතිකර ගනියි. එබැවින් බුදුරදහු මෙසේ වදාළහ.

**ඉධ භිකඛවෙ, අසසුතවා පුථුජ්ජනො -පෙ- පඨවිං මඤ්ඤති, පඨවියා මඤ්ඤති පඨවිං මෙති මඤ්ඤති පඨවිං අභිනන්දති, තං කිසස හේතු අපරිඤ්ඤාතං තසසාති වදාමි යනුවෙන්,**

(මහණෙනි, මේ ලෝකයෙහි අශ්‍රුතවත් පෘථග්ජනතෙම පඨවිය පඨවි වශයෙන් (තණ්හා, දිට්ඨි, මාන මඤ්ඤනාවෙන් සංඥා විපර්යාස වශයෙන්) හඳුනයි. මම පෘථුවියෙන් බැහැර වෙමියි හඟියි. පෘථුවිය

අභිනන්‍දනය කෙරෙයි. කවර හෙයින්ද යත් ඔහුගේ පෘථුවිය පිළිබඳ පිරිසිඳ නොදැනීම නිසා යයි කියමි.

පඨවි වාරය නිමි.

සිවු වැදෑරුම් ආප් ධාතු (ආපෝ ධාතුව)

ආපං ආපතො, යන මෙහි ද, ලක්‍ඛණ සසම්භාර, ආරම්මණ, සම්මුති යනුවෙන් ආප් ධාතුව සිව්වැදෑරුම් වේ.

ඔවුන් අතුරෙහි, තත්‍ථ කතමා අජ්ඣත්තිකා ආපො ධාතු, යං අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං සිනෙහො සිනෙහගතං බන්‍ධනත්තං රූපස්ස අජ්ඣත්තං උපාදිණ්ණං යනාදි තන්හි වදාරණ ලදුයේ ලක්ඛණ ආපයයි.

ආපො කසිණං උග්ගණ්හන්තො ආපස්මිං නිමිත්තං ගණ්හාති යනාදි තන්හි වදාරණ ලද්දේ සසම්භාර ආපයයි. සෙසු සියල්ල පඨවි වාරයෙහි කියන ලද්දට සමාන වේ ම ය. හුදෙක් යෝජිත ක්‍රමයෙහි පිත්තං සෙම්හං යනාදි ක්‍රමයෙන් දක්වන ලද දොළොස් කොටසකින් යුක්ත වූයේ අධ්‍යාත්මික ආප් ධාතුවයි.

"තත්‍ථ කතමා බාහිරා ආපොධාතු යං බාහිරං ආපො ආපොගතං සිනෙහො සිනෙහගතං බන්‍ධත්තං රූපස්ස බහිද්ධා අනුපාදින්නං සෙය්‍යථීදං මූලරසො ඛන්‍ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො ඛීරං දධි. සප්පි නවනීතං තෙලං මධුඵාණිතං භුම්මානි වා උදකානි, අන්තලික්ඛානි වා" යනාදි තන්හි වදාරණ ලද්දේ බාහිර ආපෝධාතුව යයි දතයුතු යැ.

චතුර්විධ තේජෝ ධාතුව :-

තෙජං තෙජතො, යන තේජෝවාරයෙහි, කලින් කී නියායෙන්ම දතයුත්තේය. මෙම යෝජනා ක්‍රමයෙහි "යෙනච සන්තප්පති යෙනච ජරීයති, යෙනච පරිඩය්හති යෙන ච අසිත පීත ඛායිත සායිත සම්මා පරිණාමං ගච්ඡති" යනුවෙන් මෙසේ වදාරණ ලද චතුර්විධ ප්‍රභේදයෙන් යුතු වූයේ අජ්ඣත්තික තේජෝ ධාතුවයි. "තත්‍ථ කතමා බාහිරා තෙජො ධාතු, යං බාහිරං තෙජො තෙජො ගතං උස්මා උස්මාගතං උසුමං උසුම

ගතං බහිද්ධා අනුපාදින්නං සෙය්‍යථීදං, කට්ඨග්ගි, සකලිකග්ගි, තිණග්ගි ගොමයග්ගි ථුසග්ගි, සංඛාරග්ගි, ඉන්දග්ගි, අග්ගි සන්තාපො, සූරියසන්තාපො, කට්ඨසන්නිචය සන්තාපො, තිණ සන්නිචය සන්තාපො, ධඤ්ඤ සන්නිචය සන්තාපො, භණ්ඩ සන්තාපො", යයි මෙසේ වදාරණ ලද්දේ බාහිර වූ තේජෝ ධාතුව යයි දතයුත්තේය.

වායෝ ධාතුව

වායං වායතො යන මේ වායුවාරයෙහි යෝජනා නය වනාහි උද්ධං ගමා වාතා, අධොගමාවාතා, කුච්ඡිසයා වාතා, කොට්ඨසයා වාතා, අංගමංගානු සාරිනො වාතා, සත්ථකාවාතා, ඛුරකා වාතා, උප්පලකා වාතා, අස්සායො පස්සායො යනුවෙන් මෙසේ වදාරණ ලද්දේ අජ්ඣත්තික වායො ධාතුව නම් වේ.

කතමා කතමා බාහිරා වායො ධාතු යං බාහිරං වායො වායොගතං ථම්භිතත්තං රූපස්ස බහිද්ධා අනුපාදින්නං සෙය්‍යථීදං, පුරත්ථිමා වාතා, පච්ඡිමාවාතා උත්තරා වාතා දක්ඛිණා වාතා සරජා වාතා, අරජා වාති, සීතාවාතා උණ්හා වාතා පරිත්තා වාතා අධිමත්තා වාතා කාලා වාතා වෙරම්බ වාතා පක්ඛවාතා තාලවණ්ට වාතා විධූපන වාතා යනුවෙන් මෙසේ වදාරණ ලද්දේ බාහිර වායෝ ධාතුව යයි ද දතයුත්තීය. සෙස්ස කී නයමැයි. මෙතෙකින් යම් මේ (නය ක්‍රමයක් වේ.)

> වුත්තම්හි එකධම්මෙ යෙ ධම්මා එකලක්ඛණාතෙන
> වුත්තා භවන්ති සබ්බෙ ඉති වුත්තො ලක්ඛණො හාරො

(එක් ධර්මයක් කී කල්හි, ඒ ධර්මය හේතුකොටගෙන සමාන ලක්‍ෂණ ඇති යම් ධර්ම කෙනෙක් වෙත්ද, ඒ සියලු ධර්මයෝ කියන ලද්දාහු වෙති. ලක්‍ෂණහාරය තෙම මෙසේ කියන ලද්දේය.)

මෙසේ නෙත්තිප්‍රකරණයෙහි ලක්ඛණ නම් හාර කියන ලද්දේ වෙයි. එහි දැක්වෙන පරිදි සතරමහා භූතයන් ගත් කල්හි උපාදාය රූපයන් ගන්නා ලද්දේම විය. රූප ලක්‍ෂණය නොඉක්ම වූ හෙයිනි. එහෙයින් අශ්‍රැතවත් පුහුදුන් ජනතෙම පඨවි ධාතුව, ආපෝ ධාතුාව, තේජෝ ධාතුව, වායෝ ධාතුව (තණ්හා වශයෙන්) මඤ්ඤනය කෙරේයයි (හඟීයයි) වදාරණ බුදුරදුන් විසින් අර්ථ වශයෙන් රූපය ආත්ම වශයෙන් දකීයයි

වදාරණ ලද්දේ වෙයි. පඨවි ධාතුවෙහි, ආපෝ ධාතුවෙහි, තේජෝ වායෝ ධාතුවෙහි නිත්‍ය ආත්මයක් වෙයි කියා හඟීයයි වදාරන්නහු විසින් රූපයෙහි ආත්මයක් ඇතැයි දකීයයිද, වදාරණ ලද්දේ වෙයි. පඨවි ධාතුවෙන් ආපෝ ධාතුවේ තේජෝ ධාතුවෙන් වායෝ ධාතුවෙන් පිටත එය ඇසුරුකොට මගේ ආත්මය ඇතැයි කියා හඟීයයි වදාරණ ලද්දාහු විසින් රූපයෙන් අන්‍ය වූවක් ආත්මය යයි සිද්ධ හෙයින් ආත්මය රූපවත් යයි හෝ ආත්මයෙහි රූපය වෙයි හෝ දකී යයිද වදාරණ ලද්දේ වෙයි. මෙසේ දැක්වූ මොවුහු සිව්දෙන රූපවත්ථුක සක්කාය දිට්ඨි මඤ්ඤනාවෝ වෙති.

ඔවුන් අතුරෙන් එකක් උච්ඡෙද දිට්ඨි නම්. තුනක් සස්සත දිට්ඨි නම් වේ. දෘෂ්ටීහු දෙකක්ම වෙත්නුයි මෙහි විශේෂය දතයුත්තේය. මෙසේ රූපද්වාරයෙන් සංඛාර වත්ථුකි මඤ්ඤනාව කියා දැන් යම් සංඛාර කෙනෙක් උපාදානය කොට සත්ව කෙනෙක් පනවනු ලබත්ද, ඒ සත්ත්වයන් අතුරෙහිද පුහුදුන් ජනතෙම තණ්හා වශයෙන් මඤ්ඤණය කෙරේද එහෙයින් එම සත්ත්වයන් නිර්දේශ කරනසේක් "භූතෙ, භූතතො සඤ්ජානාති".

භූත ශබ්දය

එහි භූත ශබ්දය, පඤ්චස්කන්ධය, අමනුෂ්‍ය, ධාතුය, විද්‍යමානය, ක්ෂීණාශ්‍රව, සත්ව, වෘක්ෂ යනාදි අර්ථයන්හි වේ.

"භූත මිදන්ති භික්ඛවෙ, සමනුපස්සථ" යනාදි තන්හි භූත ශබ්දය "පඤ්චස්කන්ධය" යන අර්ථයෙහි වේ.

"යානීධ භූතානි සමාගතානි" මෙහි අමනුෂ්‍ය යන අරුත්හි යෙදී ඇත.

"චත්තාරො ඛො භික්ඛු මහාභූතා හෙතු" යන මෙහි ධාතු යන අර්ථයෙහි යෙදී ඇත.

"භූතස්මිං පාචිත්තියං" යනාදීන්හි විද්‍යමාන යන අර්ථයෙහිය.

"යොච කාලඝසො භූතො" යන මෙහි ඛීණාසව යන අර්ථයෙහි වේ.

"සබෙබව නිකඛිපසසනති භූතා ලොකෙ සමුසසයං" යන මෙහි සත්ත්වයන් යන අරුතෙහිය.

"භූතගම පාතවය තාය" යන මෙහි වෘක්ෂ යන අරුතෙහි යෙදී ඇත. මෙය මෙහි සත්ත්වයන් කෙරෙහිදු වැටෙයි. එහෙත් අවිශේෂයෙන් නොවේ. චාතුර්මහාරාජිකයන්ගෙන් යට භාගයෙහි සත්වයෝම මෙහි භූත යන්නෙන් අදහස් කරන ලද්දාහු වෙති.

එහි භූතෙ භූතතො සඤ්ජානාති යනාදියද කියන ලද නයින්ම දතයුත්තේය. "භූතෙ මඤ්ඤති" යනාදියෙහි ත්‍රිවිධ මඤ්ඤනාවෝම දතයුත්තාහුය. කෙසේද යත්, "සො පසසිති ගහපතිං වා ගහපති පුතතං වා පඤ්චහි කාමගුණෙහි සමමපිතං සමංගි භූතං" (හෙතෙම පස්කම් ගුණෙහි බැඳුණු ගැහැවියෙක් හෝ ගැහැවි පුත්‍රයෙක් හෝ දකීයයි වදාළ නයින්, භූතයන් සුභයෝය. සුඛිතයෝ යයි ගෙන ඇලෙයි දැකද, අසාද ආඝ්‍රාණය කොට ද රස විඳගෙන ද ස්පර්ශ කොටද දැනද ඇලෙයි. මෙසේ භූතයන් තණ්හා මඤ්ඤනාවෙන් සිතයි. "මම ඛත්තිය මහාසාරයන් හා එක්වීමට පටිසන්ධි වශයෙන් පැමිණෙන්නේ නම් ඉතා මැනව"යි යනාදි ක්‍රමයෙන් හෝ නොලත් සම්පත් ලැබීම පිණිස සිත පිහිටුවාද මෙසේ ඒ භූතයන් තණ්හා මඤ්ඤනාවෙන් සිතයි. තමන්ගේ ද භූතයන්ගේ ද සැපත ද විපත ද නිසා තමා හෝ ශ්‍රේෂ්ඨ කොට පිහිටුවයි. භූතයන් අතුරෙන් යම්කිසි භූතයෙකු පහත්කොට සලකයි. තමා පහත්කොට භූතයකු උසස්කොට සලකයි. භූතයා හා තමා සමානකොට සලකයි වදාළේ මැයි. "ඉධෙකචෙචා ජාතියා වා අඤ්ඤතරඤ්ඤතරෙන වත්ථුනා පුබබකාලං පරෙහි සදිසං අතතානං දහති අපරකාලං අතතානං සෙය්‍යං දහති පරෙ හීනෙ දහති සො එව රූපො නාමානො -පෙ- අයං වුචචති මානාතිමානො" මෙසේ භූතයන් ගැන මාන මඤ්ඤනාවෙන් සිතයි. භූතයෝ වනාහි නිත්‍යයෝය. සැමදා පවත්නෝය. වෙනස් නොවන ධර්මතා ඇත්තෝය. සියලු සත්ත්වයෝ සියලු ප්‍රාණීහු සියලු භූතයෝ සියලු ජීවයෝද වසඟෙහි නො පවත්නෝය. බලයක් නැත්තෝය. වීර්ය නැත්තෝය. නියත වශයෙන් අභිජාති (නැවත නැවත ඉපදීම්) හයක් ඒ ඒ තන්හි ගමනින් ද ස්වභාවයෙන් ද නානාප්‍රකාර බවට පමුණුවනු ලද්දාහු අභිජාති සයෙහිම (ඇතැම් දෘෂ්ටිකයන් සිතන මැරී මැරී උපදින ආත්ම භාව සයෙහිම) සිට සුවදුක් විඳිත්යයි හෝ හඟින්නේ දිට්ඨි මඤ්ඤනාවෙන් යුතුව සිතයි. මෙසේ භූතයන් පිළිබඳ ත්‍රිවිධ මඤ්ඤනාවෙන් යුතුව සිතයි.

"භූතෙසු මඤ්ඤති" යනාදි තන්හි ඒ භූතයන් කෙරෙහි, තමාගේ උපත හෝ සැපතට පැමිණීම හෝ කැමති වෙයි. මෙසේ පළමුකොට තණ්හා මඤ්ඤනාවෙන් යුතුව භූතයන් පිළිබඳව සිතයි. භූතයන් වෙත උපත කැමති වන්නේ දන් දෙයි. සිල් රකියි. උපෝසථ කර්ම කරයි. මෙසේද භූතයන් කෙරෙහි තණ්හා මඤ්ඤනාවෙන් යුතුව සිතයි. භූතයන් වනාහි සමූහ වශයෙන් ගෙන ඔවුන් අතුරෙහි ඇතැම් භූතයෙකු ශ්‍රේෂ්ඨ වශයෙන් පිළිගනියි. ඇතැම් භූතයෙකු සමාන වශයෙන් පිළිගනියි. ඇතැම් භූතයෙකු හීන වශයෙන් පිළිගනියි. මෙසේ භූතයින් විෂයෙහි මාන මඤ්ඤනාවෙන් යුතුව සිතයි.

එසේම ඇතැමෙක් ඇතැම් භූතයන් නිත්‍යයෝය. සදාකාලිකයෝ යයි සිතයි. කිසිවෙක් භූතයෝ අනිත්‍යයෝ ය. තාවකාලිකයෝ ය යනුවෙන් සිතයි. මම ද භූතයන් අතුරෙහි එක්තරා කෙනෙක් වෙමියි හෝ සිතයි. මෙසේ භූතයන් කෙරෙහි දිට්ඨි මඤ්ඤනාවෙන් යුතුව සිතයි. භූතතො මඤ්ඤති යන මෙහි උපකරණ සහිත වූ තමාගේ හෝ අනුන්ගේ හෝ උපත යම්කිසි භූතයෙකු කෙරෙන් වියයි සිතන්නේ භූතයන් කෙරෙන් පිටත නිත්‍ය ආත්මයක් ඇතැයි පිළිගනීයයි දතයුතුයි. මේ ඔහුගේ දිට්ඨි මඤ්ඤනාවයි. දිට්ඨි මඤ්ඤනාවෙන් සිතන ලද ඒ වස්තුවෙහිම ආදරයද මානයද උපදවන්නා වූ ඔහුගේ තණ්හා මාන මඤ්ඤනාවෝ ද දතයුත්තාහුය. භූතෙ මෙති මඤ්ඤති යන මෙහි හුදෙක් තණ්හා මඤ්ඤනාවම ලැබෙයි. මේ මගේ පුතාය. මේ මගේ දුවය. මගේ එළු තිරළුවෝය කුකුළු හූරෝය. ඇත් ගව අස්හුය මේ අයුරින් මමත්වය කරන්නහුට තණ්හා මඤ්ඤනාව පවතීයයි දතයුතුයැ.

භූතෙ අභිනන්දති යන මෙහි කී නයමැයි. "අපරිඤ්ඤාතං තස්ස" යන මෙහි යම් සංඛාර කෙනෙකුන් නිසා (උපාදාය) භූත පඤ්ඤත්තියක් වීද, ඒ සංඛාරයන් අපරිඤ්ඤාත බැවින් භූතයෝ ද අපරිඤ්ඤාත වූවාහු වෙත් යයි දතයුත්තාහුය. යෙදීම වනාහි කී අයුරින්ම කළයුතු වන්නීය.

මෙසේ සැකෙවින් සංඛාර වශයෙන් ද, සත්ත්ව වශයෙන් ද, මඤ්ඤනා වස්තූන් දන්වා අනතුරුව භූමි විශේෂතා ආදි භේදයෙන්, විස්තර වශයෙන් එය දක්වන්නේ 'දෙවෙ, දෙවතො' යනාදිය වදාළහ. එය දේශනාවෙහි පඤ්චකාම ගුණයන් හේතුකොට හෝ තමාගේ ඉද්ධියෙන් හෝ ක්‍රීඩා කෙරෙත්නුයි දේව නම් වේ. බබලත්නුයි දේව නම් වේ.

එම දෙවියෝ සම්මුති දෙවියෝය. උත්පත්ති දෙවියෝය. විසුද්ධි දෙවියෝ යයි ත්‍රිවිධ වෙති. රජවරුද, දෙවිවරුද, කුමාරවරුද, සම්මුති දේව නම් වෙති. සිව්මහ රජයෙහි දෙවියන් ආදිකොට ඉන් උඩ දෙවියෝ උත්පත්ති දේව නම් වෙති. රහතුන් වහන්සේ විසුද්ධිදේව නම් වෙති. මෙහි අදහස් කරන්නේ උත්පත්ති දෙවියන් බව දතයුතුය. සියල්ලෝම නොද වෙති.

පරනිර්මිත වසවර්ති දිව්‍යලෝකයේ පිරිස් සහිත මාරයා හැර සෙසු කාමාවචර දේවලෝක හයෙහි දෙවිවරු මෙහි දෙවියන් වශයෙන් අදහස් කරන ලද්දාහු වෙති. එහි සියලු අර්ථ වර්ණනා භූත වාරයෙහි කී අයුරින් දතයුත්තේය.

"පජාපතී" මෙහි මාරතෙම පජාපති යයි දතයුත්තේය. කිසිවෙක් ඒ ඒ දෙවිවරුන්ගේ අධිපතීන්ට මේ නමකැයි කියති. දේව ග්‍රහණයෙන්ම ඔවුන් ගත් බැවින් එය අයුතුයයි මහා අට්ඨකථාවෙහි එය ප්‍රතික්ෂේප කරන ලදි. මාරතෙම සත්ත්ව නමැති ප්‍රජාවට අධිපති බැවින් ප්‍රජාපති යයි අදහස් කරන ලදී. කොහි වාසය කෙරේ ද පරනිම්මිත වසවත්ති දෙව්ලොවයැ එහි වසවත්ති රජ රාජ්‍ය කරවයි. මාරතෙම එක් පෙදෙසක තම පිරිසට ඉසුරු බව පවත්වමින් රාජ්‍යයක ප්‍රත්‍යන්ත පෙදෙසෙක්හි, දාමරික දිව්‍ය පුත්‍රයෙකු මෙන් වාසයකෙරේ යයි කියති. මෙහිදී මාරයාගේ ගැනීමෙන් මාර පිරිසගේද ගැනීම දතයුතුය.

මෙහි දී පජාපතී තෙම දීර්ඝායුෂ්ක වූ වර්ණවත් වූ සැප බහුල වූ කෙනෙකු බව දැන අසා එහි ඇලෙන්නේ තණ්හා මඤ්ඤනාවෙන් යුතුව සිතයි. මේ මාරයාගේ සහභාවයට පැමිණෙන්නේ නම් ඉතා යෙහෙකැයි ආදි නයින් හෝ නොලත් සැපතෙහි ලැබීම පිණිස සිත පිහිටුවන්නේ ද, මාර දෙව්පුත් තණ්හා මඤ්ඤනාවෙන් සිතයි. මාරතෙම මාර භාවයට පැමිණියේ වෙයි. මම මාරභාවයට පැමිණ ඊශ්වර වෙමියි අධිපති වෙමියි මාන මඤ්ඤනාවෙන් යුතුව සිතයි.

'පජාපතී' තෙම නිත්‍යය, සදාකාලිකය කියා හෝ උච්ඡේදයට පැමිණියේය. විනාශ වන්නේ යයි කියා හිතන්නේ, පජාපතීහු දෘෂ්ටි මඤ්ඤනාවෙන් යුතුව සිතන්නේ මෙය යයි දතයුත්තේය.

පජාපතිසම්ං යන මෙහි එකම දිට්ඨි මඤ්ඤනාව යෙදෙයි යයි එම දෘෂ්ටි මඤ්ඤනාවගේ පැවැත්ම මෙසේ දතයුතුය. මෙහි ඇතමෙක් මරදෙව් පුත් කෙරෙහි, යම් ධර්ම කෙනෙක් විද්‍යමාන වෙත් ද ඒ සියල්ල නිත්‍යය සදාකාලිකය. ශාස්වතය, වෙනස් නොවන ධර්මයකැයි හඟියි. නැතහොත් පජාපතී කෙරෙහි පාපයක් නැත. ඔහු කෙරෙහි පාපකර්මයෝ නොගැල්වෙතියි සිතයි. පජාපතිතො යන මෙහි තෙවදෑරුම් මඤ්ඤනාවෝම ලැබෙති. කෙසේද යත් මේ ලෝකයෙහි කෙනෙක් උපකරණ සහිත වූ තමාගේ හෝ මෙරමාගේ හෝ ප්‍රජාපතී කෙරෙන් උපත හෝ නික්මීම හඟියි. මේ ඔහුගේ දිට්ඨි මඤ්ඤනාවයි. දිට්ඨි මඤ්ඤනාවෙන් සිතන ලද එම වස්තුවෙහිම සෙනෙහස ද මානය ද උපදවන්නා වූ ඔහුගේම තෘෂ්ණා මාන මඤ්ඤනාවෝ ද දතයුත්තාහුය.

පජාපතිං මෙ යන මෙහි එකම තණ්හා මඤ්ඤනාව ලැබෙයි. එය ද මේ ප්‍රජාපතී මගේ ශාස්තෘවරයාය. මගේ ස්වාමියාය, යනාදි ක්‍රමයෙන් මමත්වය කරන්නහුට පවතීයයි දතයුතුය. සෙස්ස කී අයුරින්ම දතයුත්තේය.

බ්‍රහමං බ්‍රහමතො යන මෙහි ඒ ඒ ගුණ විශේෂයෙන් වඩන ලද්දේනුයි බ්‍රහ්ම නම් වේ.

බ්‍රහම ශබ්දය :-

මෙයින් බ්‍රහ්ම ද, මව්පිය දෙදෙන ද, ශ්‍රේෂ්ඨ වූවහු ද, බ්‍රහ්ම ශබ්දයෙන් කියනු ලැබේ. "සහසසා බ්‍රහමා දවිසහසසා බ්‍රහමා" යනාදි තන්හි මහාබ්‍රහ්ම තෙම බ්‍රහ්මයයි කියනු ලැබේ. බ්‍රහමාති භිකඛවෙ තථාගතසෙසතං අධිවචනං යන මෙයින් තථාගත තෙමේ කියනු ලැබේ.

තමොනුදො බුදධො සමනත චකඛු
ලොකනතගූ සබබ භවාති වතෙතා
අනාසවො සබබ දුකඛපපහීනො
සචචවහයො බ්‍රහෙම උපාසිතොමෙ

යන මෙහි බ්‍රාහ්මණ තෙමේය.

"බ්‍රහමාති මාතාපිතරො පුබබාචරියාති වුචචරෙ" යන මෙහි මව්පිය දෙදෙනා ගැනේ.

"බ්‍රහම චකකං පවතතති" යන මෙහි ශ්‍රේෂ්ඨ යන අරුතෙහිය. මෙයින් වනාහි පළමුකොට උපන් කල්පයක් ආයු ඇති. බ්‍රහ්ම තෙම අදහස් කෙරේ. ඔහුගේ ගැනීමෙන්ම බ්‍රහ්ම පුරෝහිත, බ්‍රහ්ම පාරිසජ්ජ වැසියන්ද ගන්නා ලද බව දතයුතු. මෙහි අර්ථ වර්ණනාව ප්‍රජාපති වාරයෙහි කී අයුරින් දතයුත්තේය.

ආභසසරං, ආභසසර වාරයෙහි පන්දමකින් ගිනිසිල මෙන් මොවුන්ගේ සිරුරෙන් කාන්තිය සිඳී සිඳී වැටෙන්නක් මෙන් නික්මෙයි. එහෙයින් ආභස්සර නම් වෙති. මොවුන්ගේ ගැනීමෙන් සියලුම ද්විතීයධ්‍යාන භූමිය ගන්නා ලද්දේ වෙයි. පරිත්තාභ, අප්පමානාභ ආභසසර යන මොවුහු සියල්ලෝම ඒකතල වාසීහු වෙති.

සුභකිණ්ණ - සුභකිණ්ණ වාරයෙහි සුභයෙන් (ශුභ ලක්‍ෂණයන්ගෙන් ගැවසී ගත් විසුරුණු මනා ශරීර කාන්ති වර්ණයෙන්, ඒකඝන වූ රුවන් බඳුනක තැබූ දිලියෙන කසුන් පිඩක් මෙන් සශ්‍රීක වූ බැවින් සුභකිණ්ණ නම් වෙති. ඔවුන්ගේ ගැනීමෙන් සියලුම තෘතීයධ්‍යාන භූමි ගන්නා ල්දදේ වෙයි. පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්ණ යන මොහු සිය්ලලෝම එකතලයෙක්හිම වසන්නාහු යයි දතයුත්තාහුය.

වෙහප්ඵල - වෙහප්ඵල වාරයෙහි මහත් වූ ඵල ඇත්තේනුයි වෙහප්ඵල නම් වේ. සතරවන ධ්‍යාන භූමියට අයත් බ්‍රහ්මයෝ මෙයින් කියනු ලැබෙත්. ආභස්සර - සුභකිණ්ණ වෙහප්ඵල මේ වාරත්‍රයෙහි අරුත් යෙදීම භූත වාරයේ කී නයින් දතයුත්තේය.

අභිභූ - අභිභූ වාරයෙහි මැඩපැවැත්වීම කෙළේනුයි අභිභූ නම් වේ. කිමෙක් මැඩපැවැත්වීද, සතර අරූප ස්කන්ධයෝය. අභිභූ යනු අසංඥ භවයට නමකි. අසංඥ සත්ත්ව දෙවියෝ වෙහප්ඵලයන් සමග එකතල වූවාහුමය. එක් අවකාශයක යම් ඉරියව්වකින් උපන්නාහුද ඒ ඉරියව්වෙන්ම ආයු ඇති තෙක් සිත්තම් රුවක් මෙන් සිටිති. මෙහි ඔහු සියල්ලෝම අභිභූ යන වචනයෙන් ගන්නා ලද්දාහු වෙති. කිසිවෙක් අභිභූ නම් සහස්ස බ්‍රහ්ම යයි යනාදි නයින් ඒ ඒ තන්හි අධිපති බ්‍රහ්මයා වර්ණනා කෙරෙත්. බ්‍රහ්ම ග්‍රහණයෙන්ම ඔවුහු ගත් බැවින් මෙය අයුතු යයි දතයුතුය. මෙහි යෙදී ඇති ක්‍රමයද අභිභූ (අසඤ්ඤ සත්ත්ව) තෙම වර්ණවත්ය. දීර්ඝායුෂ්කයයි අසා එහි ඡන්දරාගය උපදවන්නේ අසඥ සත්ව දෙවියා

තණ්හා මඤ්ඤනාවෙන් යුතුව සිතයි. අභිභූ තෙම නිත්‍යය, සදාකාලිකය යනාදි ක්‍රමයෙන් පරාමර්ශනය කරන්නේ අසඤ්ඤසත්ත දෙවියා දිට්ඨි මඤ්ඤනාවෙන් යුතුව සිතයි යයි දතයුත්තේය. සෙස්ස ප්‍රජාපති වාරයෙහි කී අයුරින් දතයුතුයැ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පිළිවෙලින් දිව්‍යලෝක දක්වා අභිභූ යන වචනයෙන අසඤ්ඤ භවය දක්වා යම් හෙයකින් මේ වට්ට කථා වන්නීද ශුද්ධාවාසයෙහි විවට්ට පක්ෂයෙහි සිටියාහුය. එසේම එම දෙවිවරු අනාගාමී ක්ෂීණාශ්‍රවයෝම වෙති. මොවුහු කල්ප ගණනක් ආයු ඇත්තාහු බුද්ධෝත්පාද කාලයෙහිම වෙත්. බුදුවරු වූ කලී අසංඛ්‍ය කල්පයෙහිදු නොඋපදිති. අබුද්ධෝත්පාද කාලවල ශුද්ධාවාස භූමිහු ශූන්‍ය වූවාහු වෙති. බුදුවරුන්ට ශුද්ධාවාස භවය රජුගේ කඳවුරු ස්ථානයක් මෙන් වෙති.

මේ කරුණින් ශුද්ධාවාස විඤ්ඤාණට්ඨිති වශයෙන් ද සත්තාවාස වශයෙන් ද නොගන්නා ලදී. මෙම මඤ්ඤනාවෝ සර්වකාලීන නිසා හැමදා විද්‍යමාන භූමි දක්වන්නේ ශුද්ධාවාසයන් අතහැර ආකාසානඤ්චායතන ආදිය දැක්වූහ.

ආකාසානඤ්චායතනය

ආකාසානඤ්චායතනං යනු සතර කුසල විපාක, ක්‍රියා ස්කන්ධයෝය. මෙම කුසල-විපාක, ක්‍රියා ස්කන්ධයෝද, භාවනා පරිච්ඡේද කථා මෙයයි කොට එහි උපන්නහු පිළිබඳවම යයි දතයුත්තාහුය. විඤ්ඤාණඤ්චායතනාදියෙහිද මෙම ක්‍රමයම වේ. මෙම සතර වාරයෙහි අර්ථ යෝජනා, අභිභූවාරයෙහි කී අයුරින්ම දතයුත්තාහුය. මාන මඤ්ඤනා ද පජාපති වාරයෙහි කී අයුරින් යෙදේ.

මෙසේ භූමි විශේෂ ආදි භේදයෙන් විස්තර කරන ලද්දේ නමුදු, මඤ්ඤනා වස්තු දක්වා දැන් සියලු මඤ්ඤනාවන්ට වස්තුභූත වූ සක්කාය පරියාපන්න වූ තෙභූමක ධර්මභේදයන් වූ දිට්ඨි ආදි සතර සංග්‍රහ කොට දක්වන්නේ දිට්ඨං දිට්ඨතො ආදිය දැක්වූහ. එහි දිට්ඨං යු මසැසින් දක්නා ලද දෙයට ද, දිවැසට ද රූපායතනයට ද නමකි. එහි දිට්ඨං මඤ්ඤති යනු දක්නා ලද්ද ත්‍රිවිධ මඤ්ඤනාවන්ගෙන් සිතයි. කෙසේද යත්, රූපායතනය ශුභය යන සංඥාවෙන් ද, සැප යන සංඥාවෙන් ද දක්තේ එහි ඡන්දරාගය

උපදවයි එය ආශ්වාදනය කෙරෙයි එයට සතුටු වෙයි. මෙසේ වදාරණ ලද්දේ වෙයි.

**ඉත්ථිරූපෙ භික්ඛවෙ, සත්තා ගිද්ධා - ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා තෙ දීඝරත්තං සොචන්ති ඉත්ථිරූපවසානුගා**

(මහණෙනි, යම් සත්ත්ව කෙනෙක් ඉත්ථි රූපයෙහි රාග වශයෙන් ඇළුණාහු ගිජුවූවාහු ගෙතුනාහු මුසපත් වූවාහු බැසගත්තාහු වෙත්ද, ඉත්ථි රූපයෙහි වසඟ වූ ඔවුහු බොහෝකලක් ශෝක කෙරෙති. මෙසේ රූපායතන තණ්හා මඤ්ඤනාවෙන් සිතයි.)

**ඉති මෙ රූපං සියා අනාගත මද්ධානන්ති වා පනෙත්ථ නන්දිං සමන්නානෙති රූපසම්පදං වා ආකංඛමානො දානං දෙති.**

(මෙසේ මාගේ රූපය අනාගත කාලයෙහි වන්නේයයි කියා හෝ තණ්හාව පිහිටුවයි. රූප සම්පත්තිය කැමති වෙමින් දන් දෙයි.) මෙසේ රූප මඤ්ඤනාවෙන් යුතුව සිතයි. තමන්ගේ හෝ අනුන්ගේ හෝ රූප සම්පත්තිය හා විපත්තිය ඇසුරුකොට මානය උපදවයි. මෙයින් මම සෙට වෙමි. සමාන වෙමි. හීන වෙමි යයි, දිට්ඨිය මාන මඤ්ඤනාවෙන් යුතුව සිතයි. රූපායතන වනාහි නිත්‍යය. සදාකාලිකය. සස්සතය යනුවෙන් සිතයි. ආත්මය ආත්මීය යයි සිතයි. මංගල අමංගල යයි සිතයි. මෙසේ රූපායතනය දෘෂ්ටි මඤ්ඤනාවෙන් යුතුව සිතයි. මෙසේ රූපායතනය ත්‍රිවිධ මඤ්ඤනාවෙන් යුතුව සිතයි.

දිට්ඨං මඤ්ඤති යනු කෙසේද, රූපයෙහි ආත්මය ඇතැයි යනුවෙන් රූපායතනයෙහි ආත්මය ඇතැයි සිතයි. නැතහොත් තනයෙහි තනකිරි යම්සේ ද, එසේ රූපයෙහි රාගාදීහු වෙතැයි සිතන්නේ ද රූපායතනයෙහි ආත්මය ඇතැයි සිතයි. මේ ඔහුගේ දිට්ඨි මඤ්ඤනාව වේ. දිට්ඨි මඤ්ඤනාවෙන් සිතන ලද එම වස්තුවෙහිම ආදරය ද මානය ද උපදවන්නා වූ ඔහුගේ තණ්හා මාන මඤ්ඤනාවෝද දතයුත්තාහුය. මෙසේ දිට්ඨි වශයෙන් රූපයෙහි ආත්මය ඇතැයි සිතයි. සෙස්ස පඨවි වාරයෙහි කී අයුරින් දත යුත්තේය.

සුතං යනු කණින් අසන ලද්ද, දිව්කණින් අසන ලද්ද ද ගැනේ. මේ ශබ්දායතනයට ද නමකි. මුතං යනු පැමිණ ද දැනගන්නා ලද්ද. ගැටී,

එළඹ යන අර්ථයි. ඉන්ද්‍රියයන්ගේ ද ආලම්බනයන්ගේ ද, අන්‍යොන්‍ය එක් වීමෙහි දී දන්නා ලද්දේ යයි කියන ලද්දේ වෙයි. මෙහි මුතං යනු ගන්ධ, රස, ඵස්ස ආයතනයන්ට නමකි.

විඤ්ඤාතං යනු සිතින් දන්නා ලද්ද, සෙසු සත්වැදෑරුම් ආයතනයන්ටද නමකි. ධම්මාරම්මණයට හෝ නමකි. මේවා වූ කලී සක්කාය පරියාපන්න වූ කල්හිම ලැබෙයි. මෙහි විස්තර කථාව දිට්ඨ වාරයෙහි කී නියායෙන් දත යුතු වේ.

මෙසේ සියලු සක්කාය භේදය (දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත) යන සතර සමග දක්වා, එයම සමාපන්නක, (පැමිණි, ඇතුළත්) අසමාපන්නක යනුවෙන් දෙපරිද්දකින් දක්වන සේක් එකත්තං නානත්තං යයි වදාළහ. එකත්තං යන මෙයින් සමාපන්නවාරය දක්වන සේක්, නානත්තං යන මෙයින් අසමාපන්නවාරය දක්වති. ඔවුන්ගේ වචනාර්ථය නම් ඒකභාවය එකත්ත කියාද ද්විභාවය නානත්ත කියා ද වේ. මෙම යෙදීම වනාහි සමාපන්නවාරය සතර ස්කන්ධයන්ගේද, අසමාපන්න වාරය පංච ස්කන්ධයන්ගෙන්ද වෙන්කොට-

"රූපං අත්තතො සමනුපස්සති" යන මේ ආදිය ශාසනික නයින් පඨවි මාර ආදියෙහි කී අයුරින් ද අට්ඨකථා නය වශයෙන් ද සුදුසු පරිදි විමසා දතයුතුයැ. සමහරෙක් එකත්ත යනුවෙන් එකත්ත නයක් කියති. නානත්තං යනුවෙන් නානත්ත නයක් ද කියති. "එකත්ත සඤ්ඤී අත්තා හොති අරොගො පරම්මරණා නානත්ත සඤ්ඤී අත්තා හොති" යනුවෙන් මෙසේ දෘෂ්ටීන්ගේ බැසගැනීම පෙන්වති. ඒ සියල්ල මෙහි බලාපොරොත්තු නො වේ. සුදුසු ද නොවේ.

මෙසේ සක්කාය (පඤ්චස්කන්ධය) දෙඅයුරකින් දක්වා දැන් එයම එක් අයුරකින් සම්පිණ්ඩනය කොට දක්වන්නේ සබ්බං සබ්බතො යනාදිය වදාළහ. මෙහි යෝජනා ක්‍රමය ආශ්වාදනය කරන්නේ, සියල්ල තණ්හා මඤ්ඤනාවෙන් යුතුව සිතයි. මා විසින් මේ සත්ත්වයන් මවන ලද්දේයයි ආදි නයින් මවිසින් සත්ත්වයන මවන ලදැයි සිතන්නේ සියල්ල මාන මඤ්ඤනාවෙන් යුතුව සිතයි. සියල්ල පෙරකළ කම් බලයෙන් වෙයි. සියල්ල ඊශ්වර නිර්මාණ හේතුවෙන් වෙයි. සියල්ල අහේතු අප්පච්චය වශයෙන් වෙයි. සියල්ල ඇත. සියල්ල නැත. මේ ආදි ක්‍රමයන්ගෙන් සිතන්නේ සියල්ල දිට්ඨි මඤ්ඤනාවෙන් යුතුව සිතයි.

"කථං සබ්බස්මිං මඤ්ඤති" යනු කෙසේද යත් මෙහි ඇතැමෙක් මගේ ආත්මය විශාලයයි දිට්ඨී ඇත්තේ වෙයි. හෙතෙම මුලු ලෝක සන්නිවාසය ඔහුගේ අවකාශ භාවයෙන් සිතා ඒ මේ මගේ ආත්මය සියලුම රූපා රූප ධර්මයෙහි පිහිටියේ යයි සිතයි. මේ ඔහුගේ දෘෂ්ටි මඤ්ඤනාවයි. ඒ සියල්ල ඇසුරු කළ ආත්මයෙහිම සෙනේහයද එය වස්තුකොට ඇති මානයද උපදවන්නා වූ බඹුගේ තණ්හා මඤ්ඤනාවෝද දතයුත්තාහුය. සෙසු සියල්ල පඨවි වාරයෙහි කී අයුරින්ම දතයුතුය.

නිබ්බාන

ඉහත දැක්වූ සියලුම සක්කාය එක් පරිද්දකින් දක්වා අනතුරුව අන් ක්‍රමයකින්ද දක්වන්නාහු නිබ්බානං නිබ්බානතො යනාදිය වදාළහ. එහි නිබ්බානං යනු **යතො බො හො අයං අත්තා පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමංගිභූතො පරිචාරෙති එත්තාවතා බො හො අයං අත්තා පරම දිට්ඨධම්ම නිබ්බානං පත්තො හොති.**

(පින්වත, යම්තැනක පටන් මේ ආත්මය පඤ්චකාම ගුණයන්හි කැමති පරිද්දෙන් ඉන්ද්‍රියයන් හසුරුවාද, පින්වත මෙතෙකින් මේ ආත්මය පරම දිට්ඨධම්ම නිබ්බානයට හෙවත් උත්තම වූ ඉහාත්මයෙහි දුක් සංසිඳුවීමට පැමිණියේ වෙයි.)

මේ ආදි නයින් පස් ආකාරයකින් එන ලද්දේ පරම දිට්ඨධම්ම නිබ්බානයයි දතයුතුය. එහි දිට්ඨධම්ම නිබ්බානය ආස්වාදනය කරන්නේ තණ්හා මඤ්ඤනාවෙන් යුතුව සිතයි. ඒ නිබ්බානයෙන් මම නිවනට පැමිණියේ යයි මානය උපදවන්නේ මාන මඤ්ඤනාවෙන් යුතුව බලයි. නිබ්බාන නොවූම එය නිබ්බාන වශයෙන් ද නිත්‍ය වශයෙන් ද ග්‍රහණය කරන්නේ දිට්ඨී මඤ්ඤනාවෙන් යුතුව සිතයි යයි දතයුතුය. නිවන කෙරෙන් අන්‍ය වූ ආත්මයක් ගෙන මේ නිවන යයි ද මේ ආත්ම යයි ද හේ මගෙ ආත්මය නිවනෙහි වී යයි සිතන්නේ නිබ්බානස්මිං මඤ්ඤති යනු වේ.

මේ ඔහුගේ දිට්ඨී මඤ්ඤනාවයි. ඒ ආත්මයෙහිම ස්නේහයද එය වස්තුකොට මානයද උපදවන්නා වූ ඔහුගේ තණ්හා මාන මඤ්ඤනාවෝද දතයුත්තාහුය. මෙම ක්‍රමය නිවනින් පිටත එය ඇසුරුකොට ආත්මය පිහිටියේ යයි සිතීමෙහිද වෙයි. නිවනින් අන්‍ය වූවක් ආත්මය වශයෙන් ගෙන මේ නිවනයැ මේ ආත්මය යැ ඒ මේ මගේ ආත්මය මෙම

නිවනින් අන්‍ය වූයේ යැයි සිතන්නේ නිබ්බානතො මඤ්ඤති (නිවන ඇසුරුකොට ඉන් පිටත ආත්මය පිහිටියේ යයි සිතයි) යනුවෙන් දැක්වේ. මේ ඔහුගේ දිට්ඨි මඤ්ඤනාවයි. (නිවනින් පිටත පිහිටි) ආත්මයෙහිම ඇල්මද, එය වස්තුකොට මානයද උපදවන්නාහුය. මේ ඔහුගේ තණ්හා-මාන-මඤ්ඤනාවෝ යයි දතයුත්තාහුය. මගේ නිවන අහෝ සැපතකි. හඟින්නහු නිබ්බානං මෙති මඤ්ඤති (මගේ නිවනයයි සිතයි) යනුවෙන් දතයුත්තාහුය. මේ වූ කලී එහි අනුගීතියයි.

1. යාදිසො එස සක්කායො - තථානං අවිජානතො
පුථුජ්ජනස්ස සක්කායෙ, ජායන්ති සබ්බ මඤ්ඤනා

2. ජෙගුච්ඡො හිදූරො වායං දුක්ඛො අපරිණායකො
තං පච්චනීකතො බාලො ගණ්හං වඩ්ඪති මඤ්ඤනා

3. සුභතො සුඛතො චෙව, සක්කායං අනුපස්සතො
සලභස්සෙව අග්ගිම්හි, හොති තණ්හාය මඤ්ඤනා

4. නිච්චසඤ්ඤං අධිට්ඨාය සම්පත්තිං තස්ස පස්සතො
ගූථාදීසාව ගූථස්මිං හොති මානෙන මඤ්ඤනා

5. අත්තා අත්තනියො චෙති පස්සතො නං අබුද්ධිනො
ආදාසෙ විය මන්දස්ස දිට්ඨියා හොති මඤ්ඤනා

6. මඤ්ඤනාති ච නාමෙතං සුඛුමං මාරබන්ධනං
සිථිලං දුප්පමුඤ්චඤ්ච යෙන බද්ධො පුථුජ්ජනො

7. බහුං විප්ඵන්දමානොපි සක්කායං නාතිවත්තති
සමුස්සිතං දළ්හථම්භං සාව ගද්දූල බන්ධනො

8. සෙසො සක්කාය මල්ලීනො ජාතියා ච ජරායච
රොගාදීහිච දුක්ඛෙහි නිච්චං හඤ්ඤති බාලිසො

9. තං වො වදාමි භද්දං වො සක්කායං අනුපස්සථ
අසාරතො අසුභතො භෙදතොථ අනත්තතො

10. එසො සභාවො හෙතසස, පසසං එවම්මං බුධො
පහාය මඤ්ඤනා සබබා සබබදුකඛා පමුචචති

1. මේ පඤ්ච උපාදානස්කන්ධය තෙම යම්බඳු වේද, එපරිද්දෙන් එය නොදන්නා වූ පුහුදුන් ජනයාට පඤ්චස්කන්ධයෙහි තණ්හා ආදි සියලු මඤ්ඤනාවෝ උපදිත්.

2. මේ පඤ්චස්කන්ධය පිළිකුල් කටයුතු වූයේ ද මොහොතින් මොහොත බිඳෙනසුළු වූයේද දුක්වූයේ ද පරිනායකයෙකු රහිත වූයේ ද වෙයි. එය අනිත්‍ය ආදි ස්වභාවයට විරුද්ධ වශයෙන් ගන්නා වූ බාලතෙම මඤ්ඤනාවන් වඩයි.

3. පඤ්චස්කන්ධය සුභ වශයෙන් ද, සුඛ වශයෙන් ද බලන්නහුට ගින්නෙහි පළඟැටියාට මෙන් තණ්හාවෙන් මඤ්ඤනාව වෙයි.

4. සක්කායෙහි නිත්‍ය සංඥාව එළවා ඒ සක්කායයාගේ සම්පත්තිය දක්නහුට මල බුදිනසුලු සුනඛයෙක් ගුථයෙහි මෙන් මානයෙන් මඤ්ඤනාව වෙයි.

5. ඒ සක්කාය ආත්මයයි ද, ආත්මායත්ත යයි ද දක්නා වූ බුද්ධි රහිතයා හට කැඩපතෙහි බාලයෙකුට මෙන් දිට්ඨි මඤ්ඤනාව උපදියි.

6. මඤ්ඤනායන නමක් ඇත්තා වූ ද, සියුම් වූ මාර බන්ධනය ලිහිල් වූයේ ද, මිදීමට දුෂ්කර වූයේ ද වෙයි. යම් මාර බන්ධනයකින් බඳින ලද පුහුදුන් ජනතෙම

7. බොහෝකොට සැලෙන්නේ නමුත් බන්ධනයෙන් බඳින ලද සුනඛයෙක් ඔසවන ලද දැඩිවූ ටැඹක් මෙන් සකකාය නොඉක්මවාද, එබඳු වූ මාර බන්ධනයකි.

8. සකකාය වැළඳගත්තා වූ ඒ මේ බාලතෙම ජාති දුකින්ද ජරා දුකින්ද රෝගාදි දුක්වලින් ද සියලු කල්හි පීඩා කරනු ලබයි.

9. එසේ හෙයින් තොපට කියමි. තොපට යහපතක් වේවා. සක්කාය නොසුව වශයෙන් ද, නොශුභ වශයෙන් ද බිඳීම් වශයෙන් ද, නැවත අනාත්ම වශයෙන් ද යන අනුපස්සනාවන්ගෙන් බලව්.

10. මේ තෙම මේ සක්කායයාගේ ස්වභාවයමැයි මෙ පරිද්දෙන් දක්නා වූ පණ්ඩිත තෙම සියලු මඤ්ඤනාවන් දුරුකොට සියලු සසර දුකින් මිදේය.

පුථුජ්ජනයාගේ වශයෙන් සූවිසි පර්වයක් ඇති
ප්‍රථම නයකථාව නිමි.

2. සෙඛ

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පඨවි ආදි වස්තූන්හි සියලු සක්කාය ධර්මයන්ට මුල්වූ පුහුදුන් ජනයාගේ පුවත් දක්වා, දැන් එම වස්තූන්හි සේඛයාගේ පුවත් දක්වන සේක් "යොපි සො භික්ඛවෙ භික්ඛු සෙඛො" යනාදිය වදාළහ. එහි යො යනු උද්දෙස වචනයයි. (=මාතෘකාව කෙටියෙන් ඉදිරිපත් කිරීම) සො යනු නිද්දෙස වචනයයි. (=විස්තර කිරීම) පි යනු සම්පිණ්ඩනාර්ථයෙහිය. අයම්පි ධම්මො අනියතො යන ආදි තන්හි මෙනි. එය ද ආරම්මණ සභාගයෙන් පුද්ගලයා සම්පිණ්ඩනය කෙරෙයි. පුද්ගල සභාගයෙන් නොවෙයි. (සභාග යනු සමාන පැවතුම් ඇති යනුයි) කලින් දේශනාවෙහි පුද්ගලයෝ දිට්ඨි විපන්නයෝ වෙති. (පෙරලුනු දෘෂ්ටි ඇත්තෝ වෙති) මෙහි දිට්ඨි සම්පන්නයෝ වෙති. ඔවුන්ගේ සභාගබවක් නැත. පඨවි ආදි ආරම්මණ කලින් දැක්වූ පුද්ගලයන්ට ද මොවුන්ට ද එකමය. එහෙයින් කියන ලදී. ආරම්මණ සභාගයෙන් පුද්ගලයන් සම්පිණ්ඩනය කෙරේය කියා පුද්ගල සභාගයෙක් නොවේ. යො පි සො යන මේ සියලු වචනයෙන් දැන් කිවයුතු 'සෙඛයා' දක්වන සේක් යයි දතයුතුයැ.

භික්ඛවෙ භික්ඛු මෙය කී අයුරුමැයි. සෙඛො කිනම් අරුතකින් සෙඛ වේද, සෙඛ ධර්මයන් ලබා ඇති බැවින් සෙඛනම් වේ. මෙසේ පසන ලදී.

"කිත්තාවතා නුඛො භන්තෙ සෙඛො හොතීති ඉධ භික්ඛවෙ භික්ඛු

සෙඛාය සම්මාදිට්ඨියා සමන්නාගතො හොති -පෙ- සෙඛෙන සම්මා සමාධිනා සමන්නාගතො හොති එත්තාවතා ඛො භික්ඛු සෙඛො හොති" යනුවෙන්,

තවද හික්මේනුයි සෙඛ නම් වේ. මෙසේ වදාරණ ලදී. සික්ඛති සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙඛොති වුච්චති කිඤ්ච සික්ඛති, අධි සීලම්පි සික්ඛති, අධිචිත්තම්පි සික්ඛති අධිපඤ්ඤම්පි සික්ඛති, සික්ඛති සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙඛොති වුච්චති යනුවෙන්.

යම් කල්‍යාණ පෘථග්ජන කෙනෙක් අනුලෝම ප්‍රතිපදාව සම්පූර්ණ කෙරෙනුයේ සීලයෙන් සම්පූර්ණ වූයේ චක්ඛු ආදි ඉන්ද්‍රියන්ගේ වසන ලද දොර ඇත්තේ, භෝජනයෙහි පමණ දන්නේ, නිදි දුරුකිරීමෙහි යෙදුනේ, පූර්ව රාත්‍රී අපර රාත්‍රීවල, බෝධිපාක්ෂික ධර්ම භාවනාවෙහි යෙදුනේ අද හෝ හෙට එක්තරා සාමඤ්ඤඵලයකට පැමිණෙන්නෙමැයි වාසය කෙරේ ද, ඒ කල්‍යාණ පෘථග්ජන තෙම හික්මේනුයි 'සෙඛ' නමයි කියනු ලැබේ. මෙහි වූ කලී ප්‍රතිවේධයට පත්වූවෙක්ම (රහත්ඵලය හැර) සෙඛ නමයි අදහස් කෙරේ. පෘථග්ජන තෙමේ සෙඛ නොවේ.

"මානස ශබ්දය"

නොපැමිණියා වූ රහත්බව ඇත්තේ මොහු විසිනුයි අප්පත්ත මානසො නම් වේ. මානසං, යනුවෙන් මෙහි රාගය ද, සිත ද රහත්බව ද, කියනු ලැබේ. අන්තලික්ඛ චරො පාසො ස්වායං චරති මානසො යන මෙහි රාගය මානස නම් වේ.

චිත්තං මනො මානසං මෙහි මානස ශබ්දයෙන් සිත අදහස් කෙරේ.

"අප්පත්ත මානසො සෙඛො කාලං කයිරා ජනෙ සුතා" යන මෙහි රහත් යන අරුතෙහි යෙදී ඇත. මෙහිදු රහත් බවම අදහස් කරන ලද්දේ වෙයි. එයින් නොපැමිණි රහත් බව ඇත්තේ යයි කියන ලද්දේ වෙයි.

අනුත්තරං යනු ශ්‍රේෂ්ඨය, අසදෘශය යන අරුත්හි වේ. සතර යෝගයන්ගෙන් නිර්භය වූ උවදුරු නැති වූ අරුතින් යෝගක්ඛෙම නම් වේ. රහත්බවම අදහස් කරන ලදී. පත්ථයමානො යනු පැතුම් දෙකකි. තණ්හා පැතුම සහ ඡන්ද පැතුමයි. පත්ථයමානස්සහි ජප්පිතානි පවෙධිතං චාපි පකප්පිතෙසු යන මෙහි ඇත්තේ තණ්හා පැතුමයි.

ඛීනනං පාපිමතොසොතං විද්ධසතං විනළීකතං
පාමුජ්ජ බහුලාහොථ ඛෙමං පත්ථෙථ භික්ඛවො

(මාරයාගේ ශ්‍රෝතස සිඳින ලද්දේය. විසුරුවා හැරීම කරන ලද්දේය. පහවූ බන්ධන ඇතිකරන ලද්දේය. මහණෙනි, ප්‍රමුදිත භාවය බහුලකොට ඇත්තෝ වවු. නිවන කත්තුකම්‍යතා කුසලච්ඡන්දයෙන් පතව්)

මෙහි කත්තු කම්‍යතා කුසලච්ඡන්ද ප්‍රාර්ථනාවයි. මෙයම පත්ථයමානො යන මෙයින් අදහස් කෙරේ. එබැවින් පත්ථයමානො යනු ඒ යොගක්ෂෙමය කරනු කැමතිව එයට පැමිණෙනු කැමතිව ඊට නැමුනේ ඊට අවනත වූයේ ඊට හාත්පසින්ම අවනත වූයේ යයි දතයුතුයෑ. එක් ඉරියව් දුකක් අන් ඉරියව්වකින් සිඳ කය වැටෙන්න නොදී පවත්වයි නොහොත් "සබ්බෙ සංඛාරා අනිච්චාති අධිමුච්චනෙතා සද්ධාය විහරති" යනාදියෙහි නිර්දේශ කළ අයුරින් මෙහි අර්ථය දතයුතුය.

පඨවිං පඨවිතො අභිජානාති පඨවි ධාතුව පඨවි ධාතුව වශයෙන් මනාව දැනගනී. පුහුදුන් ජනයා මෙන් සර්වප්‍රකාරයෙන් විපරීත හැඟීමෙන් හැඳින නොගනී. නමුත් අති විශිෂ්ඨ ඥාණයෙන් දැනගනී. පඨවිං යනුවෙන් පඨවි භාගය අත් නොහරින්නේ එය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියා විශේෂයෙන් දැනගනී. මෙසේ එය විශේෂයෙන් දැන, පඨවිං මා මඤ්ඤති යනුවෙන් කුමක් කියන ලද්දේ වේද, සිතානුයි මඤ්ඤිදී නම් වේ. මෙතෙම සිතන්නේ යයි ද නොසිතන්නේ යයි ද නොකිය යුත්තේ ය. මෙහි අදහස කුමක්දැයි කියනු ලැබේ.

පුහුදුන් ජනතෙම සියලු මඤ්ඤනාවන් ප්‍රහීණ නොකළ බැවින් මඤ්ඤති යනුවෙන් වදාරණ ලද්දේය. ඛීණාසව තෙම එය ප්‍රහීණ කළ බැවින් "න මඤ්ඤති" යනුවෙන් වදාරණ ලද්දේය. සේඛයාගේ දිට්ඨි මඤ්ඤනා ප්‍රහීණ වූවායි අන්‍යයෝ තුනීබවට ගියාහුය. එහෙයින් හෙතෙම පුහුදුන් ජනයා මෙන් සිතයි කියා නොකිව යුත්තේය. ඛීණාසව මෙන් සිතයි කියාද නොකිය යුත්තේය. ඛීණාසව මෙන් නොසිතයි කියාද නොකිය යුත්තේය.

**පරිඤ්ඤෙය්‍යං තස්ස** යනු සෙඛයා විසින් ඒ මඤ්ඤනා වස්තුවට බැසගැනීමේ නියාමතාවයක් ඇති බැවින් ද, සම්බොධි පරායණ වූ බැවින්ද,

ත්‍රිවිධ පරිඤ්ඤාවෙන් පිරිසිඳ දත්තේය යන අරුත් වේ. පුහුදුන් මෙන් පිරිසිඳ නොදත් බවද පිරිසිඳ නොදන්නා ලදද නොවෙයි. ඛීණාසව මෙන් නොද පිරිසිඳ දන්නා ලද්දේද වෙයි. සෙස්ස සියලුතැන කී නියායෙන් දතයුතු වන්නේය.

'සෙඛ' වශයෙන් දෙවන නයකථා නිමි.

3. ඛීණාසවඃ-

මෙසේ පඨවි ආදි වස්තු විෂයෙහි සේඛ පුද්ගලයාගේ තතු දක්වා දැන් ඛීණාසවයන් වහන්සේගේ තතු දක්වමින් "යොපි සො භික්ඛවෙ, භික්ඛු අරහං" යනාදිය වදාළහ. එහි යො පි යනු සම්පිණ්ඩණාර්ථයෙහිය. මෙහි උභය සභාගත්‍වය ලබයි. සෙඛ අරිය පුග්ගල බැවින් ඛීණාසවයන් වහන්සේ සමග සභාග වෙයි. එහෙයින් පුද්ගලයන්ගේ සමාන බව ලැබෙයි. ආරම්මණ සභාගතාවය කී අයුරුම වේ.

අරහං යනු වෙන්වූ කෙලෙස් ඇත්තේ දුරුවූ කෙලෙස් ඇත්තේ, ප්‍රහීණ වූ කෙලෙස් ඇත්තේ යන අර්ථයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. "කථඤ්ච භික්ඛවෙ භික්ඛු අරහං හොති, ආරකාසස හොනති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයති ජාති ජරා මරණීයා එවං ඛො භික්ඛවෙ භික්ඛු අරහං හොති" යනුවෙන්

(මහණෙනි, කෙසේනම් මහණතෙම අරහං වේද, කිලුට ඇති කරන්නා වූ දුක්සහිත වූ දුක්විපාක සහිත වූ මත්තෙහි ජාති ජරා මරණ පිණිස පවත්නා වූ ලාමක අකුසල ධර්මයෝ දුරුවූවාහු වෙත් ද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම අරහං නම් වේ.

ඛීණාසවො යන්නෙහි ආසවයෝ සතර දෙනෙකි. කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව යනුයි. රහත්හු විසින් මේ සතර ආසවයෝ ක්‍ෂය කරන ලද්දාහුය. ප්‍රහීණ කරන ලද්දාහුය. සහමුලින් සිඳින ලද්දාහුය. සංසිඳවන ලද්දාහුය. උපතට නොසුදුසු කරන ලද්දාහුය. එහෙයින් ඛීණාසව යයි කියනු ලැබේ.

වුසිතවා, ගුරු සංවාසයෙහි වාසය කළේය. හාත්පසින් වාසය

කළේය. වැස නිමවන ලද (බඹසර) ඇත්තේය. හාත්පසින් වැස නිමවන ලද්දේය. හෙතෙම වැස නිමවන ලද ගුරුසංවාස ඇත්තේ පුරුදු කරන ලද චරණ ඇත්තේනුයි වුසිතවා නම් වේ.

"කතකරණීයො" යනු කල්‍යාණ පෘථජ්ජනයාගේ පටන් සත්වැදෑරුම් සෙඛයෝ සතර මගින් කළයුත්ත කෙරෙත් නම් වේ. ඛීණාසවයන් වහන්සේගේ කළයුතු සියල්ල කරන ලද්දාහු වෙති. අවසන් කරන ලද්දාහුය. ඔහුට මත්තෙහි රහත්ඵලය පිළිබඳ කළයුතු දෙයක් නොමැති හෙයින් කතකරණීය නම් වේ. මෙසේද වදාරණ ලද්දේය.

**තසස සමමා විමුත්තසස සනතචිත්තසස භිකඛුනො**
**කතසස පතිචයො නත්‍ථි කරණීයං නවිජජති** යනුවෙන්

(මනාකොට කෙලෙසුන් කෙරෙන් මිදුන, සංසිඳුනු සිත් ඇති, ඒ භික්ෂුව හට කරන ලද්දහුගේ නැවත රැස්කිරීමක් නැත. සිවු මගින් කළයුතු දෙයක් ඇත්තේ නොවේ.)

"ඔහිත භාරො" යනුවෙන්, භාරයෝ තිදෙනෙක් වෙති. ඛන්ධභාර-කිලෙසභාර, අභිසංඛාර කියා. එම ඛීණියව තෙම මෙම ත්‍රිවිධ භාරයන් හරන ලද්දේය. බහාතබන ලද්දේය. හෙලන ලද්දේය. එබැවින් ඔහිතභාර යයි කියනු ලැබේ.

"අනුපපතත සදතෙතා" පැමිණි ස්වාර්ථය ඇත්තේ යයි කියන ලද්දේ වේ. මෙහි "ක"කාරයට "ද" කාරය කරන ලද්දේ වෙයි. (සකතත > සදතත) සකතත යයි ද කියන ලද්දේ වෙයි. මෙහි සදතත යනුවෙන් රහත්බව දතයුතුයැ. එම රහත්බව තමා කෙරෙහි උපනිබන්ධන (=ළංවූ සම්බන්ධය) යන අර්ථයෙන් ද තමා අත් නොහරින අර්ථයෙන් ද තමාගේ උත්තමාර්ථය යන අරුතින් ද, තමාගේ අර්ථය බැවින් සකත්‍ථ යයි කියනු ලැබේ.

**පරික්ඛීණ භව සංයොජනා** යනුවෙන් මෙහි සංයෝජනයෝ නම් දසදෙනෙක් වෙති. කාමරාග, පටිඝ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත, පරාමාස, භවරාග, ඉස්සා, මච්ඡරිය, අවිජ්ජා යනුයි.* මොවුහු චනාහි සත්ත්වයින් භවයන්හි

*** වෙනත් බොහෝ දේශනාවල එනුයේ මෙසේය. සක්කාදිට්ඨි - විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, ව්‍යාපාද, රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යනුවෙනි.**

සංයෝජනය කෙරෙත් භවය හෝ ළංකොට බන්ධනය කෙරෙත්. භවය සමග සංයෝග කෙරෙත් නුයි, එහෙයින් භව සංයෝජනයෝ යයි කියනු ලැබෙත්. මේ භව සංයෝජනයෝ රහත්හු විසින් ප්‍රහීණ කරන ලද්දාහුය. ඥාන නැමැති ගින්නෙන් දවන ලද්දාහුය. එහෙයින් **පරික්ඛීණ භව සංයොජනො** යනුවෙන් කියනු ලැබේ.

**සම්මදඤ්ඤා විමුත්තො** (සම්මා+අඤ්ඤාය) මෙහි **සම්මදඤ්ඤා** යන්නෙන් මනාව දැනයයි කුමක් කියන ඛන්ධයන්ගේ රාසි අරුත, ආයතනයන්ගේ ආයතන අරුත, ධාතුන්ගේ ධාතු අරුත, දුක්ඛයාගේ පීඩන අරුත, සමුදයාගේ උප්පාදක අරුත, නිරෝධයාගේ ශාන්ත අරුත, මග්ගයාගේ දස්සන අරුත, සියලු සංඛාරයෝ අනිත්‍යයෝය, යන මේ ආදි භේද හෝ මනාකොට තත්වූ පරිද්දෙන් අවබෝධකොට දැන තීරණයකොට තුලනය කොට විභාවනය කොට විභූතකොට යන අරුත් වේ. **විමුත්තො.** විමුත්ති දෙකකි. චිත්ත විමුත්තිය සහ නිවනයි. රහත්තෙම සියලු කෙලෙසුන්ගෙන් මිදුනු සිත් ඇති බැවින් චිත්ත විමුත්තියෙන් ද මිදුනේය. නිවනෙහි ඇලුනු බැවින් නිවනෙහි ද විමුත්ත හෙයින් **සම්මදඤ්ඤා විමුත්තො** යයි කියනු ලැබේ.

**පරිඤ්ඤාතං තස්ස,** රහතුන් වහන්සේ ඒ පරිඤ්ඤා වස්තූන් ත්‍රිවිධ පරිඤ්ඤාවෙන් පිරිසිඳ දන්නා ලදී. එහෙයින් හෙතෙම ඒ පරිඤ්ඤා වස්තූන් තණ්හා ආදි පරිඤ්ඤාවෙන් නොසිතයි. ඒ මඤ්ඤනාවන් මඤ්ඤනා නොකරත් යයි කියන ලද්දේ වෙයි. සෙස්ස කී අයුරින් දතයුතුය. නිබ්බාන වාරයෙහි ඛයා රාගස්ස යනු තුන්වාරයක් කියන ලද්දේ වෙයි. මේ පරිඤ්ඤාත වාරයන් නිබ්බාන වාරයෙහි විස්තර කළයුත්තේය.

විස්තර කරන්නහු විසින්ද, **පරිඤ්ඤාතං තස්ස** යනු සියලු පදයන් සමග යොදා නැවත. ඛයාරාගස්ස වීතරාගත්තා යනුවෙන් දෝස මෝහයන්හිද මේ ක්‍රමය මැයි. සෙස්සෙහි ද මේ ක්‍රමයමැයි. දේශනාව වනාහි එක්තැනක කියන ලද්ද සියලු තන්හිම කියන ලද්දේ වෙයි යි කෙටි කරන ලද්දේ වෙයි.

**ඛයා රාගස්ස වීතරාගත්තා** යනුවෙන් මෙහි යම්හෙයකින් ශාසනයෙන් බැහැර වූ වීතරාගී තෙම රාගයාගේ ක්ෂය කිරීමෙන් වීතරාග නොවූයේ ද රහත්හු වනාහි රාගය නැතිකිරීමෙන්ම වීතරාග වූවහුද,

එහෙයින් වදාරණ ලදී. බයාරාගසස වීතරාගතතා යනුවෙන්. දෝස-මෝහයන්හි ද මේ ක්‍රමය මැයි.

යම්හෙයකින් පරිඤ්ඤාතං තසසාති වදාමි යයි කී කල්හිද, පිරිසිඳ දත්හෙයින් හෙතෙම ඒ වස්තූන් හෝ ඒ මඤ්ඤනා හෝ නොසිතයි යන අර්ථය වේද, එපරිද්දෙන් මෙහි ද පහ වූ රාග ඇති බැවින් ඒ රහත් තෙම ඒ වස්තුව හෝ ඒ මඤ්ඤනාව හෝ නොසිතා යයි දත යුතුයැ.

මෙහිද, පරිඤ්ඤාතං තසස යන මේ වාරය මාර්ග භාවනාවේ පිරිපුන් බව දැක්වීම පිණිස දේශනා කරන ලද්දේ වෙයි. අන්‍යවාර, ඵල පසක් කිරීම පිළිබඳ සම්පූර්ණ බව දැක්වීම පිණිස වදාරණ ලද්දේ යයි දතයුත්තේය. නැතහොත් කරුණු දෙකකින් රහතුන් වහන්සේ මඤ්ඤනා වශයෙන් නොසිතයි. පඨවි ආදි වස්තු පිරිසිඳ දත් බැවින් ද අකුසල මූලයන් මුල්සිඳ ලූ බැවින් ද යන මේ කරුණු දෙක නිසාය. එහෙයින් පරිඤ්ඤාත වාරයෙන් ඔහුගේ වස්තු පරිඤ්ඤානය දක්වයි. සෙසු වරයන්ගෙන් අකුසල් මුල් සිඳීම දක්වාලයි. ඒ වාරයන් අතුරෙන් පශ්චිම වාර තුනෙහි මේ විශේෂතා දතයුතුය.

තෙවැදෑරුම් දෝෂයන් අතුරෙන් රාගයෙහි ආදීනව දැක දුක්ඛානුපස්සීව වාසය කරන්නේ අප්‍රණිහිත විමෝක්ෂයෙන් කෙලෙසුන් කෙරෙන් මිදුනේ රාගයාගේ ප්‍රහාණයෙන් වීතරාග වේද,

ද්වේෂයාගේ ආදිනව දැක අනිච්චානුපසසීව වාසය කරන්නේ අනිමිත්ත විමෝක්ෂයෙන් මිදුනේ ද්වේෂයාගේ ප්‍රහාණයෙන් වීත දෝෂ වේ ද,

මෝහයෙහි ආදිනව දැක අනතතානුපසසීව වාසය කරන්නේ ශූන්‍යතා විමොක්ෂයෙන් විමුක්ත වූයේ මෝහයාගේ ප්‍රහාණයෙන් වීතමෝහ වේද,

මෙසේ ඇතිකල්හි එකෙක් විමෝක්ෂ තුනින් නොමිදෙයි කියා දෙවරක් නොකිය යුතු වන්නාහුද එසේ කිවයුතු නොවේ. කුමක් හෙයින් ද නියම නොකළ හෙයිනි. ඒ සැබව. යොපි සො භික්ඛවෙ අරහං යයි අනියමින් කියන ලදී. අපපිණිහිත විමොක්ෂයෙන් විමුතත යයි හෝ අන්‍ය විමෝක්ෂයකින් විමුත්ත යයි හෝ නොකියන ලදද, එහෙයින් යමෙක්

රහත් බව යෙදේද ඒ සියල්ල කිවයුතු යයි අවිශේෂයෙන් හෝ යම්කිසිවෙක් රහත් වූයේම රාගාදීන්ගේ ප්‍රහාණය කිරීමේදී විපරිණාම දුක්ඛය පිරිසිඳ දත් හෙයින් රාගයාගේ ප්‍රහාණයෙන් වීතරාග යයි දත් හෙයින් රාගයාගේ ප්‍රහාණයෙන් වීතරාග යයි කියනු ලැබේ ද දුඃඛ දුඃඛය පිරිසිඳ දත් හෙයින් ද්වේෂයාගේ ක්‍ෂය කිරීමෙන් වීත දෝස යයි ද, සංඛාර දුක්ඛය පිරිසිඳ දත් හෙයින් මෝහයාගේ ප්‍රහාණයෙන් වීතමෝහ යයි කියනු ලැබේ ද නැතහොත් ඉෂ්ටාරම්මණය පරිඥ්ඥාත හෙයින් රාගය ප්‍රහානය වීමෙන් වීත රාගයයිද, අනිෂ්ටාරම්මණය පරිඥ්ඥාත බැවින් මෝහය ප්‍රහාණය කිරීමෙන් වීත මෝහයයි ද නැතහොත් සුඛ වේදනාවෙහි රාගානුසය සමුච්ඡේද කළ හෙයින් රාගයාගේ ප්‍රහාණයෙන් වීතරාග යයිද, අනිකුත් වේදනාවන්හි ප්‍රතිඝ මෝහානුසයන්ගේ සමුච්ඡේදය කළ බැවින් වීතදෝස, වීතමෝහ යයි ද කියනු ලැබේ ද, එබැවින් එම විශේෂය දක්වන සේක්, "ඛයා රාගස්ස වීතරාගත්තා වීත දොසත්තා, වීත මොහත්තා" යයි වදාළහ.

**ඛීණාසවයන් වහන්සේගේ වශයෙන් තෙවන, සිව්වන, පස්වන සයවන නයකථා නිමි.**

### 7. තථාගත

මෙසේ පඨවි ආදි වස්තු විෂයෙහි ඛීණාසවයන් වහන්සේගේ පුවත් දක්වා දැන් තමන් පිළිබඳ පුවත් දක්වන සේක්, තථාගතොපි භික්ඛවෙ ආදිය වදාළහ. එහි තථාගතො යනු කරුණු අටකින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වන සේක. (1) තථා ආගත එපරිද්දෙන් ආයේනුයි තථාගත නම් වූහ. (2) තථාගතො, එපරිද්දෙන් ගියේනුයි තථාගත නම් වූහ. (3) තථ ලක්ඛණං ආගතො තථ ලක්‍ෂණයට පැමිණියේ නුයි තථාගත නම් වූහ. (4) තථ ධර්මයන් තත් වූ පරිද්දෙන් අවබෝධ කළේ නුයි තථාගත නම් වූහ. (5) තථ දස්සීභාවයෙන් තථාගත නම් වූහ. (6) තථවාදී බැවින් තථාගත නම් වූහ. (7) තථ කාරී බැවින් තථාගත නම් වූහ. (8) අභිභවනාර්ථයෙන් තථාගත නම් වූහ. (1) කෙසේ නම් භාග්‍යවත් තෙම තථා ආගතනුයි තථාගත වීද යත්, මුළු ලොවට හිත පිණිස උත්සාහවත් වූ පූර්ව බුදුවරයෝ යම්සේ ආවාහු ද, විපස්සි බුදුරජාණෝ යම්සේ ආවාහුද සිඛී බුදුරජාණන් වහන්සේ යම්සේ ආවාහුද වෙස්සභූ බුදුරජාණන් වහන්සේ යම්සේ ආවාහුද කකුසඳ බුදුරජාණන් වහන්සේ යම්සේ ආවාහුද කොණාගමන බුදුරජාණන් වහන්සේ යම්සේ ආවාහුද, කස්සප බුදුරජාණන් වහන්සේ යම්සේ ආවාහුද (එපරිද්දෙන් ආවාහුය.)

මෙයින් කුමක් කියන ලද්දේ වේද යත් මේ සම්මා සම්බුද්ධයන් වහන්සේ යම් අභිනීහාරයකින් පැමිණි සේක් ද ඒ අභිනීහාරයෙන්ම (පැතුමෙන්ම) අප භාග්‍යවතුන් වහන්සේද පැමිණි සේක. නැතහොත් යම්සේ විපස්සි බුදුරජාණන් වහන්සේ -පෙ- කාශ්‍යප බුදුරජාණන් වහන්සේ, දාන-සීල-නෙක්ඛම්ම-පඤ්ඤා-විරිය-ඛන්ති-සච්ච-අධිට්ඨාන-මෙත්තා-උපෙක්ඛා යන දස පාරමිතා ද දස උපපාරමිතා ද, දසපරමත්ථ පාරමිතා ද යන සමතිස් පෙරුදම් පුරා, අංග, නයන, ධන, රාජ්‍ය, පුත්තදාර යන පඤ්චමහා පරිත්‍යාගයක් කොට පුබ්බයෝග, පුබ්බචරියා, ධම්මකථා, ඤාතත්ථ චරියා යනාදිය සම්පූර්ණකොට බුද්ධි චරියාවගේ කෙළවරට පැමිණ ආසේක් ද එපරිද්දෙන් අප භාග්‍යවතුන් වහන්සේ ද ආ සේක.

යළිදු යම්සේ විපස්සි බුදුරජාණන් වහන්සේ -පෙ- කාශ්‍යප බුදුරජාණන් වහ්සේද සතර සතිපට්ඨානයන්ද, සතර සම්මප්පධාන, සතර ඉද්ධිපාද, පඤ්චඉන්ද්‍රිය, පඤ්චබලය, සත්තබොජ්ඣංග, අරිය අට්ඨංගික මග්ග (යන මේ ධර්ම) උපදවා වඩා ආ සේක් ද, එපරිද්දෙන් අප භාග්‍යවතුන් වහන්සේ ද ආ සේක. මෙසේ තමා ආගත නුයි තථාගත නම් වන සේක.

යථෙව ලොකම්හි විපස්සි ආදයො
සබ්බඤ්ඤු භාවං මුනයො ඉධාගතා
තථා අයං සක්‍ය මුනීපි ආගතො
තථාගතො වුච්චති තෙන චක්ඛුමා

(යම් පරිද්දකින් මේ ලෝකයෙහි විපස්සි ආදි වූ බුදුවරු බුදුබවට පැමිණියාහු ද එපරිද්දෙන් මේ ශාක්‍යමුනි තෙමේද බුදුබවට පැමිණියේය. ඒ කරුණින් පසැස් ඇති භාග්‍යවත් තෙම තථාගත යයි කියනු ලැබේ.) මෙසේ එපරිද්දෙන් ආයේනුයි තථාගත නම් වේ.

(2) කෙසේ තථාගත තෙම එසේ ගියේනුයි තථාගත නම් වූයේද? නැතහොත් විපස්සි භාග්‍යවතුන් වහන්සේ -පෙ- කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ එසේම අප ශාක්‍යමුනි භාග්‍යවතුන් වහන්සේ ද වැඩි සේක.

උන්වහන්සේ කෙසේ ගියසේක් ද? මෙසේ දතයුතුයැ. ඒ කාශ්‍යප මුනීන්ද්‍රයන් වහන්සේ උපන් ඇසිල්ලෙහි සම පාදයෙන් පොළොවෙහි පිහිටා උතුරු දෙසට අභිමුඛව සත්පියවරක් වැඩිසේක් ද, යම්සේ වදාළ සේක් ද,

"සම්පති ජාතො ආනන්ද, බොධිසත්තො සමෙහි පාදෙහි පතිට්ඨහිත්වා උත්තරෙන මුඛො සත්තපද වීතිහාරෙ ගච්ඡති සෙතම්හි ඡත්තෙ අනුහීරමානෙ සබ්බාච දිසා අනුවිලොකෙති ආසභිඤ්ච වාචං භාසති අග්ගො හමස්මි ලොකස්ස ජෙට්ඨො හමස්මි ලොකස්ස සෙට්ඨො හමස්මි ලොකස්ස අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවො" යනුවෙන් වදාළහ.

(ආනන්දය, එකෙනෙහි උපන් බෝසත් තෙම සම පයින් පොළොවෙහි පිහිටා උතුරු දෙසට අභිමුඛ වූයේ දිව්‍යමය සේසත් ධරනු ලබන කල්හි සත් පියවරක් වඩියි. දසදිගුන් ද අනුවිලෝකනය කෙරෙයි. අභීත වචන කියන්නේ, මම ලොවට අග්‍ර වෙමි. මම ලොවට දෙටු වෙමි. මම ලොවට සෙට වෙමි. මේ අන්තිම ජාතිය වන්නීය. යළි පුනර්භවයක් නැත. යනුවෙන් වදාළහ.)

බෝසතාණන්ගේ එම ගමනද නොයෙක් විශේෂ ගුණයන්ගේ අවබෝධයට පෙරනිමිති බැවින් සත්‍ය වූයේ ද වෙයි. නිබොරු වූයේ ද වෙයි. ඒ බෝසතුන්ගේ උපන් ඇසිල්ලෙහි පා දෙක සමව පොළොවෙහි පිහිටීම යන යමක් ඇද්ද මේ කරුණ ඔහුගේ සතර ඍද්ධිපාද ප්‍රතිලාභයට පෙරනිමිති වෙයි. උතුරුදෙසට අභිමුඛ බව මුළු ලොවටම උතුම් බවට පෙරනිමිති වේ. සත්පියවරක් ගමන් කිරීම සත්ත බොජ්ඣංග ප්‍රතිලාභයට පෙරනිමිති වේ.

සුවණ්ණ දණ්ඩා වීතිපතන්ති චාමරා යන මෙහි චාමර එසවීම වූකලී සියළු තීර්ථකයන් මැඩීම දක්වන පෙරනිමිතිය. සේසත් දැරීම, රහත්ඵල විමුත්ති නමැති උතුම් නිර්මල සේසතක් හුගේ ප්‍රතිලාභයට පෙරනිමිති වේ. සියලු දිසා විලෝකනය සර්වඥතා ඥානය හා අනාවරණ ඥාන ප්‍රතිලාභයට පෙරනිමිති වෙයි. අභීත නාද පැවැත්වීම කලින් කිසිවෙක් නොපැවැත්වූ උතුම් දම්සක් පැවැත්වීමට පෙරනිමිති වේ. එපරිද්දෙන් මේ භාග්‍යවත් තෙමේ ද වැඩි සේක. ඒ ගමන විශේෂ අධිගමයන්ට පෙරනිමිති බැවින් මෙය සත්‍ය විය. නිබොරු විය. එයින් කීහු පෝරාණයෝ,

**මුහුත්ත ජාතොව ගවම්පතී යථා, සමෙහිපාදෙහි ඵුසී වසුන්ධරං**
**සො වික්කමී සත්තපදානි ගොතමො, සෙතඤ්ච ඡත්තං අනුධාරයුං මරූ**

**ගන්ත්වාන සො සත්ත පදානි ගොතමො, දිසා විලොකෙසි සමා සමන්තතො අට්ඨංගුපෙතං ගිරමබ්භුදීරයි, සීහො යථා පබ්බතමුද්ධනිට්ඨිතො** යනුවෙන්

(ඒ ගෞතම බෝසත් තෙම උපත් මොහොතක් ඇත්තේ ම වෘෂභ රාජයෙකු මෙන් සම වූ පාද යුග්මයෙන් පෘථුවිය ස්පර්ශ කළේය. සත් පියවරක් ගියේය. දෙවියෝ සුදු කුඩයක්ද දැරූහ.)

(ඒ ගෞතමයන් වහන්සේ සත්පියවරක් ගොස් හාත්පස සමාන වූ සියලු දිගුන් බැලූහ. පර්වත මුදුනෙහි සිටි සිංහයෙකු මෙන් අංග අටකින් යුක්ත වූ තෙපුල් ප්‍රකාශ කළහ.)

මෙසේ තථාගතනුයි තථාගත නම් වේ. නැතහොත් යම්සේ විපස්සි බුදුරජාණන් වහන්සේ -පෙ- යම් සේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ වැඩිසේක් ද, එසේම මේ භාග්‍යවතුන් වහන්සේ ද නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය ප්‍රහාණය කොට ගිය සේක. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයද, ආලෝක සඤ්ඤාවෙන් ථීණමිද්ධය ද, නොවිසුරුණු බැවින් උද්ධච්ච කුක්කුච්චය ද ධර්ම ව්‍යවස්ථානයෙන් විචිකිච්ඡාව ද ප්‍රහාණය කොට වැඩි සේක. ඥානයෙන් අවිද්‍යාව ප්‍රදාලනය කොට වැඩි සේක. ප්‍රමෝදයෙන් අරතිය දුරුකොට ප්‍රථම ධ්‍යානයෙන් නීවරණ කවාටය උදුරා දෙවන ධ්‍යානයෙන්, විතක්ක, විචාර නමැති ධූමය උපසමනය කොට තුන්වන ධ්‍යානයෙන් ප්‍රීතිය දුරුකොට හතරවන ධ්‍යානයෙන් සුවදුක් පහකොට-

ආකාසානඤ්චායතන සමාපත්තියෙන්, රූප සංඥා, ප්‍රතිඝ සංඥා, නානත්ව සංඥාවන් ඉක්මවා, විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් ආකාසානඤ්චායතන සංඥාවද, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සංඥාවද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥාව ඉක්මවා ගියහ.

අනිච්චානු පස්සනාවෙන් නිත්‍ය සංඥාව දුරුකොට. දුක්ඛානු පස්සනාවෙන් සුඛ සංඥාවද, අනත්තානුපස්සනාවෙන් අත්ත සංඥාවද, නිබ්බිදානු පස්සනාවෙන් නන්දියද, විරාගානු පස්සනාවෙන් රාගයද නිරෝධානු පස්සනාවෙන් සමුදයද, පටිනිස්සග්ගානු පස්සනාවෙන් ආදානය ද, ඛයානු පස්සනාවෙන් ඝන සංඥාවද, වයානු පස්සනාවෙන් ආයූහනයද විපරිණාමානු පස්සනාවෙන් ධ්‍රැව සංඥාවද, අනිමිත්තානු පස්සනාවෙන් නිමිත්ත සංඥාව ද අප්පණිහිතානු පස්සනාවෙන් රාගාදි ප්‍රණිධිය ද, සුඤ්ඤතානු පස්සනාවෙන් අභිනිවෙසය ද, ආත්ම දෘෂ්ටිය ද, අධිප්‍රඥා ධර්ම විදර්ශනාවෙන් අසාර දැයෙහි සාරයයි ගන්නා විපර්යාසය ද

යථාභූත ඤාණදසසන යෙන් සම්මෝහයට බැසගැනීමද ආදිනවානු පස්සනාවෙන් ආලයාභිනිවේසය ද, පටිසංඛානු පස්සනාවෙන් අප්‍රති සංඛාවද (මෙනෙහි නොකිරීම) විවට්ටානු පසසනාවෙන් සංයෝග, අභිනිවේසයද ප්‍රහාණය කොට සොතාපත්ති මාර්ගයෙන් දිට්ඨි ආදි ක්ලේශයන් බිඳ සකදාගාමි මාර්ගයෙන් ඖදාරික කෙලෙස් ගති සිඳ අනාගාමි මාර්ගයෙන් අනු සහගත (=කුඩාව පැවැති) කෙලෙස් මුල්සිඳ රහත් මගින් සියලු කෙලෙස් සමුච්ඡෙද ප්‍රහාණයෙන් නසා ගිය සේක. මෙසේත් තථාගතො යන අරුතින් තථාගත නම් වූ සේක.

(3) කෙසේ නම් තථ ලක්‍ෂණයට පැමිණියේ නුයි තථාගත වේද යත්?

පඨවි ධාතුවේ තද බව නම් වූ ලක්‍ෂණය තථයකි. (=සත්‍ය වූවකි) නිබොරු වූවකි.

ආප් ධාතුවේ වැගිරීම් ලක්‍ෂණය -පෙ- තෙජො ධාතුවේ උණුසුම් ලක්‍ෂණය, වායො ධාතුවෙ පිම්බෙන ලක්‍ෂණ, ආකාස ධාතුවේ ස්පර්ශ රහිත ලක්‍ෂණය, විඤ්ඤාණ ධාතුවේ විජානන ලක්‍ෂණය, රූපයාගේ රුප්පන ලක්‍ෂණය, වෙදනාවෙ වෙදයිත ලක්‍ෂණය, සඤ්ඤාවගේ හැඳිනීම් ලක්‍ෂණය, සංඛාර යන්ගේ සකස් කිරීමේ ලක්‍ෂණය, විඤ්ඤාණයාගේ විජානන ලක්‍ෂණය, විතර්කයාගේ අරමුණට නැගීමේ ලක්‍ෂණය, විචාරයාගේ අරමුණේ හැසිරවීම පිරිමැදීමේ ලක්‍ෂණය, ප්‍රීතියේ පැතිරීමේ ලක්‍ෂණය, සුඛයාගේ සාත ලක්‍ෂණය (=මිහිරි බව) චිත්ත එකග්ගතාවේ, නොවිසුරුණු ලක්‍ෂණය, ඵසසයාගේ ඵසස ලක්‍ෂණය, සද්ධා ඉන්‍ද්‍රියයාගේ දැඩිකොට ගැනීමේ ලක්‍ෂණය, සති ඉන්‍ද්‍රියයාගේ උපට්ඨාන (=ළඟට පැමිණීමේ) ලක්‍ෂණය, පඤ්ඤා ඉන්‍ද්‍රියේ පජානන ලක්‍ෂණය, සද්ධා බලයේ අශ්‍රද්ධා හේතුවෙන් කම්පා නොවීමේ ලක්‍ෂණය, විරිය බලයාගේ කුසීත බැව් නැතිකිරීමේ ලක්‍ෂණය, සති බලය සිහි මුලා බැව් කම්පා නොවන ලක්‍ෂණය, සමාධි උද්ධච්ච හේතුවෙන් කම්පා නොවීමේ ලක්‍ෂණය, පඤ්ඤා බලයාගේ අවිද්‍යාව හේතුකොටගෙන කම්පා නොවීමේ ලක්‍ෂණය,

සති සම්බොජ්ඣඞ්ගයාගේ උපට්ඨාන ලක්‍ෂණය, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගයාගේ පවිචය (=වෙසෙසින් පරීක්‍ෂා කිරීමේ) ලක්‍ෂණය, විරිය සම්බොජ්ඣඞ්ගයාගේ ප්‍රග්‍රහ ලක්‍ෂණය. පීති සම්බොජ්ඣඞ්ගයාගේ

පැතිරීමේ ලක්ෂණය, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගයාගේ උපසම ලක්ෂණය, සමාධි සම්බොජ්ඣඞ්ගයාගේ අවික්ෂෙප ලක්ෂණය, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගයාගේ මධ්‍යස්ථ වීමේ ලක්ෂණය, සම්මාදිට්ඨි දස්සන ලක්ෂණය, සම්මාසඞ්කප්පයේ අභිනිරෝපන (සිත අරමුණට යොමු කිරීමේ) ලක්ෂණය, සම්මා වාචා මෙහි පරිග්‍රහ (=අල්ලා ගැනීම්) ලක්ෂණය, සම්මා කම්මන්තයේ සමුට්ඨාන (=හටගැනීම්) ලක්ෂණය, සම්මා ආජීවයාගේ වොදාන ලක්ෂණය, සම්මා වායාමයාගේ ප්‍රග්‍රහ ලක්ෂණය, සම්මා සතියේ උපට්ඨාන ලක්ෂණය, සම්මා සමාධියේ අවික්ෂෙප ලක්ෂණය.

අවිද්‍යාවගේ අඥාන ලක්ෂණය, සංඛාරයන්ගේ චේතනා ලක්ෂණය, විඤ්ඤාණයාගේ විජානන ලක්ෂණය, නාමයාගේ (අරමුණට) නැමීමේ ලක්ෂණය, රූපයාගේ රුප්පන ලක්ෂණය, සළායතනයන්ගේ (චිත්ත චෛතසිකයන්ගේ පැවැත්ම යයි කියන ලද) ආයතන ලක්ෂණය, ඵස්සයාගේ ස්පර්ශ කිරීමේ ලක්ෂණය, වෙදනාවගේ වෙදයිත ලක්ෂණය, තණ්හාවගේ සමුදය ලක්ෂණය, උපාදානයාගේ ගැනීම් ලක්ෂණය, භවයාගේ ආයූහන ලක්ෂණය, ජාතියේ නිබ්බත්ති ලක්ෂණය, ජරාවගේ දිරීම් ලක්ෂණය, මරණයාගේ ච්‍යුති ලක්ෂණය,

ධාතුන්ගේ සුඤ්ඤතා ලක්ෂණය, ආයතනයන්ගේ ආයතන ලක්ෂණය, සතිපට්ඨායන්ගේ උපට්ඨාන ලක්ෂණය, සම්මප්පධානයන්ගේ පදහන (උත්සාහ කිරීමේ) ලක්ෂණය, ඉද්ධිපාදයන්ගේ ඉජ්ඣන (ඉටුවීම්) ලක්ෂණය, ඉන්ද්‍රියන්ගේ අධිපති ලක්ෂණය, බලයන්ගේ කම්පානොවන ලක්ෂණය, බොජ්ඣඞ්ග ධර්මයන්ගේ නිය්‍යානික ලක්ෂණය,

මාර්ගයාගේ හේතු ලක්ෂණය, සත්‍යයන්ගේ තථ ලක්ෂණය, සමථයාගේ අවික්ෂෙප ලක්ෂණය, විපස්සනාවේ අනුපස්සනා ලක්ෂණය, සමථ විපස්සනාවන්ගේ එකරස ලක්ෂණය, සමථ විපස්සනා නම් එකට වෙළී පවත්නා (යුගනද්ධ ධර්මයන්ගේ අනතිවත්තන ලක්ෂණය.

සීල විසුද්ධියේ සංවර ලක්ෂණය, චිත්ත විසුද්ධියේ අවික්ෂෙප ලක්ෂණය, දිට්ඨි විසුද්ධියේ දස්සන ලක්ෂණය, ඛයෙඥාණයේ, සමුච්ඡේද ලක්ෂණය, අනුත්පාද ඥාණයේ පස්සද්ධි ලක්ෂණය, ඡන්දයාගේ මූල ලක්ෂණය, මනසිකාරයාගේ සමුට්ඨාන ලක්ෂණය, ඵස්සයාගේ සමොධාන ලක්ෂණය ද, සමාධියේ පමුඛ ලක්ෂණය ද, සතියේ අධිපති ලක්ෂණය ද,

ප්‍රඥාවේ තතුත්තරී ලක්‍ෂණය, විමුත්තියේ සාර ලක්‍ෂණය, අමතොගධ නිබ්බානයේ, පරියොසාන ලක්‍ෂණය, තථ වෙයි. (=සත්‍ය වෙයි. නිබොරු වෙයි.) මෙසේ අවිපරීත ලක්‍ෂණයට ඤාණ ගමනින් ආවාහු, නොවරදවා පැමිණියාහුය. අනුප්‍රාප්ත වූහ. තථාගත නම් වූහ. මෙසේ තථ ලක්‍ෂණයට පැමිණියාහු වෙත්නුයි තථාගත නම් වන සේක.

4.කෙසේනම් තථ ධර්මයන් තත් වූ පරිදි අවබෝධ කළ හෙයින් තථාගත නම් වන සේක් ද? තථ ධර්මයෝ නම් සතර ආර්ය සත්‍යයෝය. එහෙයින් වදාළහ. "චත්තාරිමානි භික්ඛවෙ, තථානි, අවිතථානි, අනඤ්ඤථානි කතමානි චත්තාරි ඉදං දුක්ඛන්ති භික්ඛවෙ, තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථ මෙතං", යනුවෙන් විස්තර වේ. බුදුරජාණන් වහන්සේ ඒ තථ ධර්මයන්ද අවබෝධ කළහ. ඒ තථ ධර්මයන් අභිසම්බුද්ධ බැවින් තථාගත යයි කියනු ලැබේ. මෙහි ගත ශබ්දය අභිසම්බුද්ධ යන අර්ථයෙහි මැයි. තවද ජරාමරණයාගේ ජාති ප්‍රත්‍යයෙන් සම්භූත හා සමුදාගත අර්ථය සත්‍ය වේ. නිබොරු වේ. අන්‍යාකාර රහිත වේ. -පෙ- සංඛාරයන්ගේ අවිජ්ජා ප්‍රත්‍යයෙන් සම්භූත අර්ථය සමුදාගත අර්ථය සත්‍ය වේ. නිබොරු වේ. එසේම අන්‍යාකාර නොවේ. එසේම අවිද්‍යාවගේ සංඛාරයන්ට ප්‍රත්‍යාර්ථය, සංඛාරයන්ගේ විඤ්ඤාණයට ප්‍රත්‍යාර්ථය, -පෙ- ජාතියගේ ජරාමරණයට ප්‍රත්‍යාර්ථය සත්‍ය වේ. බොරු නොවේ. අන් පරිද්දකින් නොවේ. ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළ සේක. මෙසේ තථ ධර්මයන් අවබෝධ කළ හෙයින් තථාගත නම් වන සේක.

5.කෙසේ නම් තථ දසසී බැවින් තථාගත නම් වූයේ ද යත්? භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- දෙවියන් සහිත මිනිසුන්ට, අප්‍රමාණ ලෝකධාතුවල අප්‍රමාණ සත්ත්වයන්ගේ චක්ඛු ද්වාරයෙහි ආපාතගත වන්නා වූ යම් රූපාරම්මණයක් ඇද්ද, එය සර්වාකාරයෙන් දනිති. දකිති. මෙසේ දන්නා වූද, දක්නා වූ ද ඒ භාග්‍යවතුන් වහන්සේ එය ඉටු අනිටු වශයෙන් හෝ දිට්ඨ - සුත - මුත - විඤ්ඤාතයන් අතුරෙහි ලැබෙන්නා වූ පදයන්ගේ වශයෙන් හෝ "කතමං තං රූපං රූපායතනං යං රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභං සනිදස්සනං සප්පටිඝං නීලං පීතකං" යනාදි නයින් අනේක නාමයන්ගෙන් තෙතිස් වාරයෙක්හි, දෙපනස් නයකින් විභාග කරනු ලබන්නේ සත්‍ය වෙයි. බොරු නොවෙයි. සෝත ද්වාරයෙහි ආපාථයට පැමිණෙන්නා වූ

ශබ්ද ආදියෙහිද මේ නයමැයි. මෙය වදාරණ ලද්දේමැයි. භාග්‍යවත් බුදුරදහු විසින්, "යං භික්ඛවෙ, සදෙවකස්ස ලොකස්ස -පෙ- සදෙව මනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං, පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තමහං ජානාමි, තමහං අබ්භඤ්ඤාසිං තං තථාගතස්ස විදිතං තං තථාගතොන න උපට්ඨාසි" යනුවෙන් මෙසේ තථය දක්නා බැවින් තථාගත නම් වූහ. මෙහි තථදස්සී යන අරුතෙහි තථාගතයයි පද සම්භවය දතයුතුය.

6. කෙසේනම් තථවාදී බැවින් තථාගත නම් වූයේ ද යත්? යම් රාත්‍රියෙක්හි භාග්‍යවත් බුදුරදහු බෝමැඩ අපරාජිත පලඟකයෙහි වැඩසිට තුන්මරුන් (කිලේස - අභිසංඛාර දේවපුත්ත) මැඩ නිරුත්තර වූ සම්මා සම්බෝධියට පැමිණි සේක් ද, යම් රාත්‍රියක යමක සාල අතර අනුපදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවි සේක් ද, මේ අතර පන්සාලිස් වසක් කාලයෙහි ප්‍රථම බෝධියෙහි ද මධ්‍යම බෝධියෙහි ද පශ්චිම බෝධියෙහි ද භාග්‍යවත්හු විසින් වදාරණ ලද යම් සුත්ත - ගෙය්‍ය - පෙ- වෙදල්ලං යන නවාංග ධර්මයක් වේ ද, ඒ හැම අරුත් වශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන් ද නිවැරදි, අඩුවැඩි නැති සර්වාකාරයෙන් පරිපූර්ණ වූ රාග මදය නිමමද කරන්නා වූ ද්වෙෂ, මෝහ මදයන් නිමමද කරන්නා වූ එහි වලගක් පමණකුදු (ස්වල්ප මාත්‍රයකුදු) වැරදි යෙදුමක් නොමැත. ඒ සියලු ධර්මයන් එක් මුද්‍රාවකින් මුද්‍රා තබන ලද්දක් මෙන් ද එක් නැලියකින් මනින ලද්දක් මෙන් ද වෙයි. එහෙයින් වදාළහ.

"යං චුන්ද, රත්තිං තථාගතො අනුත්තරං සම්බොධිං අභිසම්බුජ්ඣති, යඤ්ච රත්තිං අනුපාදිසෙසාය නිබ්බාන ධාතුයා පරිනිබ්බායති, යං එතස්මිං අන්තරෙ භාසති ලපෙති, නිද්දිසති සබ්බං තං තථෙව හොති නො අඤ්ඤථා තස්මා තථාගතොති වුච්චති" යනුවෙන් මෙහි ගත ශබ්දය ගදාර්ථයෙහි (=කථා කිරීම් අර්ථයෙහි) මැයි. මෙසේ තථාවාදි බැවින් තථාගත නම් වූහ. තවද 'කීම' අගද නම් වේ. (වචනය) යන අර්ථයි. තථ්‍ය වූ විපරීත නොවූ අගද (වචනය) යන අර්ථයි. තථ්‍ය වූ විපරීත නොවූ අගද (වචනය) මොහුගේය යන අරුත්හි 'ද' කාරයට 'ත' කාරය කොට තථාගත යයි මෙසේ මේ අර්ථයෙහි පදසිද්ධිය වේයයි දතයුතුය.

7. කෙසේනම් තථා කාරිත්වයෙන් තථාගත වූ සේක් ද යත්? යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ වචනයට කය අනුලොම් වේද, කයට

වචනයට අනුලොම් වේද, කයට ද වචනය අනුලොම් වේද, එබැවින් යම්සේ කියන සුළු වේද, එපරිද්දෙන්ම කරනසුලු වේ. මෙසේ කරනසුලුද එසේම කියනසුලුය. මේ ආකාර වූ උන්වහන්සේගේ වචනය යම්සේ ද කයත් එසේම ගියේය. පැවතුනේය යන අර්ථයයි. කය යම්සේ පවතී ද වචනයත් එසේ ගියේනුයි තථාගත නම් වෙති. එහෙයින් වදාළහ. "යථාවාදී භික්ඛවෙ, තථාගතො තථාකාරී යථාකාරී තථාවාදී ඉති යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී තස්මා තථාගතොති වුච්චති" මෙසේ තථාකාරී බැවින් තථාගත නම් වූ සේක.

8.කෙසේ නම් අභිභවනාර්ථයෙන් තථාගත නම් වන සේක්ද යත් උඩින් භවාග්‍රයත් යටින් අවීචියත් පරියන්ත කොට සරස අපමණ ලෝකධාතුන්හි සියලු සත්ත්වයන් අභිභවනය කරන සේක. සීලයෙන් ද, ප්‍රඥාවෙන් ද, විමුක්තියෙන් ද උන්වහන්සේට සමාන වූවෙක් හෝ ප්‍රමාණ වූවෙක් හෝ නැත්තේය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ අතුල්‍ය වූ සේක. අප්‍රමෙය්‍ය වූ සේක. අනුත්තර වූ සේක. රාජ රාජ වූ සේක. දෙවියන්ට දෙව් වූ සේක. ශක්‍රයන්ට ශක්‍ර වූ සේක. බ්‍රහ්මයන්ට අධිබ්‍රහ්ම වූ සේක. එහෙයින් වදාළහ.

**"සදෙවකෙ භික්ඛවෙ, ලොකෙ -පෙ- සදෙව මනුස්සාය තථාගතො අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්ති තස්මා තථාගතොති වුච්චති"** යනුවෙන්, එහි මෙසේ පදසිද්ධිය දතයුතුයි. අගද වැනිනුයි අගද නම් වේ. හේ කවරේද යත්, දේශනා විලාසයද, පුණ්‍යයාගේ අධික බවද වෙයි. එය එසේමැයි. භාග්‍යවතුන් වහන්සේ මහත් ආනුභාව ඇති වෙදෙක්, දිව්‍යමය වූ බෙහෙතකින් සර්පයන් මෙන් සියලු පරවාදීන්ද දෙවියන් සහිත ලෝකයා ද අභිභවනය කරන සේක. මෙසේ සියලු ලෝකයා මැඩපැවැත්වීමෙහි, තථ්‍ය වූ අවිපරීත වූ දේශනා විලාසමය වූ ද පුණ්‍යයාගේ අධික බව නම් වූ ද අගදය මොහුගේය යන අර්ථයෙහි දකාරයට තකාරය කොට තථාගතො යනුවෙන් දතයුත්තේය. මෙසේ අභිභනාර්ථයෙන් තථාගත නම් වූහ.

තවද 'තථ' භාවයෙන් ගියේනුයි පැමිණියේ නුයි තථාගත නම් වේ. ඉක්මවා ගියේය. ඉක්මවූයේය. පැමිණියේය. පිළිපන්නේය යන අර්ථයි. එහි සියලු ලෝකය (=දුක්ඛ සත්‍යය) තීරණ ප්‍රඥාවෙන් තථභාවයෙන් ගියේ නුයි, ඉක්මවූයේ නුයි තථාගත නම් වේ. ලෝක නිරෝධය පසක්

කිරීමෙන් තථ්‍යයට ගියේනුයි පැමිණියේ නුයි තථාගත නම් වේ. ලෝක නිරෝධ ගාමිනී ප්‍රතිපදාව තථ්‍යයට ගියේනුයි, පිළිපන්නේ නුයි තථාගත නම් වේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී.

ලොකො භිකඛවෙ, තථාගතෙන අභිසමබුදෙධා ලොකසමා තථාගතො විපපයුතෙතා, ලොක සමුදයො භිකඛවෙ තථාගතෙන අභිසමබුදෙධා ලොකසමුදයො තථාගතසස පහීනො, ලොකනිරොධො භිකඛවෙ තථාගතෙන අභිසමබුදෙධා ලොකනිරොධො තථාගතසස සචඡිකතො ලොකනිරොධගාමිනී පටිපදා භිකඛවෙ තථාගතෙන අභිසමබුදෙධා ලොකනිරොධ ගාමිනී පටිපදා තථාගතසස භාවිතා, යං භිකඛවෙ, සදෙවකසස ලොකසස -පෙ- සබබං තං තථාගතෙන අභිසමබුදධං තසමා තථාගතොති වුචචති යනුයි.

(මහණෙනි, දුක්ඛ සත්‍යය තථාගතයන් වහන්සේ විසින් ප්‍රත්‍යක්‍ෂ කරන ලද්දේය. තථාගත තෙම දුක්ඛ සත්‍යයෙන් විසං යුත්තය. දුක්ඛ සමුදය සත්‍යය තථාගතයන් වහන්සේ විසින් ප්‍රත්‍යක්‍ෂ කරන ලද්දේය. තථාගතයන් විසින් දුක්ඛ සමුදය සත්‍ය ප්‍රහීණ වූයේය. මහණෙනි, දුක්ඛ නිරෝධ සත්‍යය තථාගතයන් විසින් අවබෝධ කරන ලද්දේය. දුක්ඛ නිරොධ සත්‍යය තථාගතයන් විසින් ප්‍රත්‍යක්‍ෂ කරන ලද්දේය. දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදා ආර්ය සත්‍යය තථාගතයි විසින් ප්‍රත්‍යෂ කරන ලද්දේය. දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදා යම් සත්‍යය තථාගතයන් විසින් වඩන ලද්දීය. මහණෙනි, යම්බඳු වූ දෙවියන් සහිත ලෝකයා විසින් -පෙ- ඒ සියල්ල තථාගතයන් විසින් දක්නා ලද්දේය. එහෙයින් තථාගත යයි කියනු ලැබේ.)

මෙසේත් එම තථාගත ශබ්දයාගේ අර්ථය දතයුතුයැ. මෙයද තථාගතයන්ගේ තථාගතභාවය දැක්වීමෙහි (මුඛමතත මෙව) වචන මාත්‍රයක් පමණි. සර්වප්‍රකාරයෙන් තථාගත කෙනෙක්ම තථාගත භාවය වර්ණනා කරන්නේය.

"අරහං සමමා සමබුදෙධා" මෙම පද දෙකින්, කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින් ද කෙලෙස් සතුරන් හා සංසාර චක්‍රයෙහි අර නැසූ හෙයින් ද ප්‍රත්‍යයන් ලැබීමට සුදුසු හෙයින් ද, පව් කිරීමේ රහසක් නැති බැවින් ද පළමුකොට මෙම කරුණුවලින් අරහං යයි දතයුතුය. මනාකොට තෙමේ ම

සියලු ධර්මයන් අවබෝධ කළ බැවින් සම්මා සම්බුද්ධ නම් වේ. මෙය මෙහි සැකෙවින් විස්තර වශයෙන් මෙම පද දෙක විසුද්ධි මග්ගයේ බුද්ධානුස්සති වර්ණනාවෙහි ප්‍රකාශ කරන ලදී.

"පරිඤ්ඤාතං තං තථාගතස්ස" මෙහි මඤ්ඤනා වස්තුව තථාගතයන් විසින් පරිඤ්ඤාත අන්තය ඇත්තේ යයිද තථාගතයන් විසින් පිරිසිඳ දත්තේ යයි ද අරුත් දතයුතුය. පරිඤ්ඤාත අන්තය නම් පරිඤ්ඤාතයාගේ පාරය (පරතෙර) ඇත්තේය. පිරිසිඳ දත් අවසානය ඇත්තේය. ඉතිරි නොකොට පිරිසිඳ දත්තේ යයි කියන ලද්දේ වෙයි. ඒ එසේමැයි. ශ්‍රාවකයන් හා බුදුවරයන්ගේ ඒ ඒ මගින් කෙලෙස් ප්‍රහාණයෙහි විශේෂයක් නොමැත. පරිඤ්ඤාවෙහි විශේෂ ඇත. ශ්‍රාවකයෝ සතර ධාතුන්ගේ එකදේශයක් සම්මර්ෂණය කොට නිවනට පැමිණෙති. බුදුවරයන්ට වූ කලී අල්පප්‍රමාණ වූ නුවණින් නොදක්නා ලද තුලනය නොකරන ලද සංඛාර ගතයෙක් නැත්තේය.

නන්දි දුක්ඛස්ස මූලං ආදි තන්හි නන්දි යනු (පුරිම) කලින් වූ තණ්හාවයි. දුක්ඛං යනු පංචස්කන්ධයයි. මූලන්ති ඉති විදිත්වා, ඒ පුරිම තණ්හාව මේ පංචස්කන්ධයට මූලයයි. දැන, භවාඃ (කර්ම) භවයෙන් ජාති යනු විපාක ස්කන්ධයෝය. ඔවුන් හේතුකොට ගෙන යම් හෙයකින් උපදිත් ද, එහෙයින් ජාති යයි කියන ලදී. ජාති ශීර්ෂයෙන් මෙම දේශනාව වන්නීය. මෙයද ඉති විදිත්වා යන පදය සමග යෙදිය යුතුය. මේ මෙහි අර්ථයයි. කම්ම භවවයෙන් උත්පත්ති භවය වෙයි. මෙයද දැනගෙනයි භූතස්ස සත්ත්වයා හට ජරා මරණං ජරාවද මරණයද කියන ලද්දේ.

ඒ උත්පත්ති භවය හේතුකොට හටගත් සත්ත්වයා පිළිබඳ ස්කන්ධයන්ගේ දිරීමද මැරීමද වේයයි යන මෙය දැන, බෝධිවෘක්ෂ මූලයෙහි අපරාජිත පර්යංකයෙහි වැඩසිට යමක් සම්මර්ශනය කොට සර්වඥ බවට පැමිණිසේක් ද, ඒ ප්‍රතීත්‍ය සමුත්පාදයාගේ ප්‍රතිවේධයෙන් මඤ්ඤනාවන්ගේ අභාවය දක්වන සේක්, චතුසංඛෙප තිසන්ධි, තිඅද්ධ, වීසති ආකාර ඇති පටිච්ච සමුප්පාදය දැක්වූ සේක.

කෙසේනම් මෙතෙකින් ඒ සියල්ල දක්වන සේක් ද යත්, මෙහි නන්දි යනු මේ එක් සංඛෙපයකි. දුක්ඛස්ස යන වචනයෙන් දෙවන සංඛෙපයද, භවා ජාති යන්නෙහි භව යනු තුන්වන සංඛෙපයද ජාති-

ජරා-මරණං යනු හතරවන සංඛෙපයයි මෙසේ පළමුකොට සතර සංඛෙපයෝ දතයුත්තාහුය. කොටඨාස යන අර්ථයි. තණ්හාව දුක්ඛයන්ගේ අතර දුක්ඛයාගේ ද භවයාගේ ද අතර දෙවන සන්ධියයි. භවයාගේ ද, ජාතියේ ද අතර තුන්වන සන්ධියයි. ඇඟිලි හතර අතර මෙන් මෙම හතර සංඛෙපයන් අතර සන්ධි තුන දත යුත්තාහුය. එහි තණ්හාව අතීතකාලය වෙයි. ජාති-ජරා-මරණ අනාගත කාලය වේ. දුක හා භවය වර්තමාන කාලයයි. මෙසේ කාල තුන දතයුත්තේය.

අතීතයෙහි පංචආකාර වූ (අවිජ්ජා-සංඛාර-තණ්හා-උපාදාන-භව) යන මොවුන් අතුරෙන් නන්දි යන වචනයෙන් එකලා තණ්හාව ආයේය. එම තණ්හාව හේතුවෙන් අනාගත වූ ද අවිජ්ජා සංඛාර උපාදාන භව ය මොවුහු ප්‍රත්‍ය ලක්ෂණයෙන් ගන්නා ලද්දාහුම වෙති.

ජරා මරණ යන වචනයෙන් යම් ස්කන්ධ කෙනෙකුන්ට ඒ, ජාති ජරා මරණ වේද, ඔවුහු කියන ලද්දාහුමය. මෙසේ කොට මත්තෙහි විඤ්ඤාණ - නාමරූප - සළායතන - ඵස්ස - වෙදනා ගන්නා ලද්දාහුම වෙති.

මොවුන් අතුරෙහි පූර්වභවයෙහි මෝහය අවිජ්ජාවයි. ආයූහනය සංඛාරයෝය. නිකාන්තිය තණ්හාවයි. උපගමනය උපාදානයයි. චේතනාව භවයයි. මේ අයුරින් මෙම පස්ආකාර ධර්මයෝ පූර්වකර්ම භවයට අයත් මෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍ය වූහ.

මෙම භවයේ ප්‍රතිසන්ධිය වූ කලී විඤ්ඤාණයයි. මව්කුසට බැසගැනීම (=අවක්කන්ති) නාමරූපයයි. චක්ඛු ආදි ප්‍රසාද රූපයෝ ආයතනයයි. අරමුණු ගැටීමෙන් ඇතිවන්නේ ඵස්සයයි. අරමුණු රස විඳින්නේ වෙදනාවයි. මෙසේ මේ පංච ධර්මයෝ මෙම උප්පත්ති භවයෙහි පූර්වභවයෙහි කරන ලද කර්මයට ප්‍රත්‍ය වූහ.

මේ භවයේ ආයතනයන් මෝරාගිය බැවින් මෝහය අවිද්‍යාවයි. ආයූහනය (රැස්කිරීම) සංඛාරයෝය. නිකාන්තිය (=අරමුණෙහි පවත්නා වූ අභිරතිය) තණ්හාවයි. උපගමනය (=අරමුණු අල්ලා ගැනීම) උපාදානයයි. චේතනාව භවයයි. මේ පංචධර්ම මෙම කම්ම භවය ඇති කල්හි, මත්තෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍ය වෙයි.

මතු භවයෙහි ප්‍රතිසන්ධිය විඤ්ඤාණයයි. අවක්කන්ති මව්කුසට බැසගැනීම නාමරූපයයි. පසාදරූප ආයතනයි. අරමුණ ස්පර්ශ කිරීම ඵස්සයයි. අරමුණ රසවිඳීම වේදනාවයි. මේ අයුරින් මේ පංච ධර්මයෝ මත්තෙහි උත්පත්ති භවය ඇතිකල්හි. මේ භවයෙහි කළ කර්මයට ප්‍රත්‍ය වන්නාහුය. මේ දක්වන ලද ආකාර ඇති පටිච්ච සමුප්පාදයේ විසිආකාරයෝ දතයුත්තාහුය.

මෙසේ, නන්දි, දුක්ඛස්ස මූලන්ති ඉති විදිත්වා ජාති භූතස්ස ජරාමරණං යයි මෙතෙකින් සියලු චතුසංඛෙප, තිසන්ධි, තියද්ධ, විසති ආකාර පටිච්ච සමුප්පාදය දක්වන ලද්දේ යයි දතයුතුය. "තස්මාතිහ භික්ඛවෙ, -පෙ- අභිසම්බුද්ධොති වදාමි" යන මෙහි පිළිවෙලින් පද වර්ණනා කොට පද යෝජනාවෙහි අර්ථ නිගමනය කරන්නෙමු. තස්මාතිහ, යනු, එහෙයින් යන අරුතට කියන ලදී. තිකාර හකාරයෝ නිපාතයෝය. සබ්බසො යනු අනවශේෂ යන අරුත් ගෙනදෙන වචනයකි. තණ්හාණං නන්දියයි මෙසේ කියන ලද සියලු තණ්හාවගේ, ඛයා යනු ලොව්තුරු මගින් අත්‍යන්තයෙන් ප්‍රහීණ කරන ලද, විරාගා යනාදිය ඛය ශබ්දයාගේම සමාන අර්ථ ඇති වචනයකි. යම් තණ්හාවක් ඛය වූවාහු නො ඇලුනාහු, ඔවුහු නිරුද්ධ වූවාහු ද හරින ලද්දාහු ද ඇලුනාහු, ඔවුහු නිරුද්ධ වූවාහු ද හරින ලද්දාහු ද දුරුකරන ලද්දාහුද වෙති. නැතහොත් ඛයා යනු සතර මාර්ගයන්ගේ කෘත්‍යයනට සාධාරණ වූ වචනයකි. එහෙයින් ප්‍රථම මාර්ගයෙන් නො ඇලුනාහු ද්විතීය මාර්ගයෙන් නිරුද්ධ වූවාහු වෙති. තෘතීය මාර්ගයෙන් ත්‍යාග කළාහු චතුර්ථ මාර්ගයෙන් දුරුකළාහු වෙති යයි යෙදිය යුතුය.

යම්බඳු තණ්හාවක් නිසා පඨවිය පඨවි භාවයෙන් හැඳින ගන්නේ හෝ වේද, ඔහුගේ (ඒ තණ්හාවගේ) අභාවයෙන් යම් තෘෂ්ණාවකින් පඨවිය ආත්මය යයි සිතන්නේ ද, ඔවුන්ගේ නො ඇල්මෙන්, යම් තෘෂ්ණාවකින් ආත්මය පඨවි ධාතුවෙහි පිහිටියේ යයි සිතන්නේ ද ඔවුන්ගේ නිරෝධයෙන් යම් තෘෂ්ණාවකින් පෘථුවියෙන් පිටත නිත්‍ය ආත්මය පිහිටියේ යයි සිතන්නේ ද, ඔවුන්ගේ ත්‍යාගයෙන් යම් තෘෂ්ණාවකින් පෘථුවිය ආත්මය යයි සිතන්නේ ද එය දුරලීමෙන් -පෙ- යම් තණ්හාවකින් පොළොව ඇසුරු කළ ආත්මයට සතුටු වන්නේ ද, ඔවුන්ගේ දුරලීමෙන් යයි මෙසේ මෙහි යෙදීම දතයුත්තේය. කිසිවක් විරුද්ධ නොවේ. දක්වන ලද්දෙහි කිසිදු විරුද්ධ අර්ථයක් නොවේ යන අදහසයි.

අනුත්තරං, අනුත්තර වූ සර්ව ශ්‍රේෂ්ඨ වූ සම්මා සම්බෝධිං යනු මනාකොට තමා විසින් සම්මා සම්බෝධියට නැතහොත් ප්‍රශස්ත වූද සුන්දර වූ ද බෝධිය. බොධි යනු බෝධි වෘක්ෂය ද මාර්ගයද සර්වඥතා ඥානය ද නිවන ද (යන අරුත් ඇත්තේය.) බොධිරුක්ඛමූලෙ පඨමාභි සම්බුද්ධො යනුද අන්තරාච බොධිං අන්තරාච ගයං යන තැන්වල වෘක්ෂයට බෝධි යයි කියනු ලැබේ. බොධි වුච්චති, චතූසු මග්ගෙසු ඤාණං යන තන්හි මාර්ගයයි.

පප්පොති බොධිං වරභූරි මෙධසො, සර්වඥතා ඥානයයි. පත්වාන බොධිං අමතං අසංඛතං යන තන්හි නිවනයි. මෙහි වූ කලී බුදුරදුන්ගේ රහත්මග නැණ අදහස් කරන ලදී. (අපරෙ) කිසිවෙක් සර්වඥතා ඥානයයිද කියති.

බුදු සව්වනට රහත්මග අනුත්තර බෝධිය වේද? නොවේද? නොවේ. කුමක් හෙයින්ද, සියලු ගුණදායක නොවන බැවිනි. ඔවුන් අතුරෙන් කිසිවෙකුට රහත්මග රහත් ඵලයම දෙයි. කිසිවෙකුට ත්‍රිවිද්‍යාවද, කිසිවෙකුට ෂට් අභිඥා ද, කිසිවෙකුට සිව්පිළිසිඹියා ද, කිසිවෙකුට ශ්‍රාවක පාරමී ඤාණයද දෙයි. පසේ බුදුවරයන්ට පච්චෙක බෝධි ඤාණයම දෙයි. බුදුවරයන්ට සියලු ගුණ සම්පත්තිය ගෙන දෙයි. අභිෂේකය රජුට සියලු ලොව ඉසුරු බව මෙනි. එබැවින් අන් කිසිවෙකුට අනුත්තර වූ බෝධිය නොවේ යනුයි.

අභිසම්බුද්ධො යනු මනාව දැනගත්තේය. ප්‍රතිවෙධ කළේය. පැමිණියේය. අධිගමනය කළේයයි කියන ලද්දේ වෙයි. ඉතිවදාමි යනු මෙසේ කියමි. දේශනා කරමි. පනවමි. පිහිටුවමි. විවරණය කරමි. බෙදා දක්වමි. නොගැඹුරු කරමි. මේ එහි යෙදීම වේ. "තථාගතොපි භික්ඛවෙ, -පෙ- පඨවිං න මඤ්ඤති, පඨවිං නාභි නන්දති තං කිස්ස හෙතු නන්දි දුක්ඛස්ස මූලං,

භවා ජාති, භූතස්ස ජරාමරණන්ති ඉති විදිත්වා යන එහි ඉති විදිත්වා යන්නෙහි 'ඉති' යන්න කාරණා අර්ථය ගෙන දේ. මේ පටිච්ච සමුප්පාදය දත් බැවින් ප්‍රතිවෙධ කළ බැවිනැයි කියන ලද වෙයි. වැඩිපුර පැවසීමෙන් කිම? යම්හෙයකින් මෙසේ මම පටිච්ච සමුප්පාදය දැන තථාගතයන් වහන්සේ සම්බන්ධ යම් නන්දි යයි කියන ලද තණ්හාවක් වීද එය

සර්වප්‍රකාරයෙන්ම ප්‍රහීණය. තථාගත තෙම සර්වප්‍රකාරයෙන්ම තණ්හාවගේ ක්ෂය කිරීමෙන් -පෙ- අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කරන ලද්දේය. එහෙයින් පඨවිය ආත්මයයි නො සිතයි. -පෙ- පඨවිය ඇසුරු කළ ආත්මයකට සතුටු නො වෙයි. වදාම් යනු මෙසේ අභිසම්බුද්ධ හෙයින් පඨවිය ආත්ම යයි නො සිතයි. සතුටු නො වේ යයි කියම්යි කියන ලද්දේ වෙයි. නැතහොත්,

යම් හෙයකින් නන්දි දුක්ඛසස මූලං ආදී නයින් පටිච්ච සමුප්පාදය දැන, සම්පූර්ණයෙන් තණ්හාවගේ ක්ෂය භාවයට ගියේ -පෙ- අභිසම්බුද්ධ යයි කියම්. හෙතෙම මෙසේ අභිසම්බුද්ධ බැවින් පඨවිය ආත්මයයි නො සිතයි. පඨවිය ඇසුරු කළ ආත්මයට සතුටු නො වේ යයි. යම් තැනෙක්හි යසමා යයි නොකියා තසමා යයි කියයි. ඒ ඒ තන්හි, යසමා යනු පමුණුවා යෙදිය යුතුයි. මේ ශාසන නියමයයි. හැමතැන මේ ක්‍රමය මැයි.

ඉදමවොච භගවා යන මෙය නිදාන අවසානය පටන් අභිසම්බුදෙධාති වදාම් යනු අවසන්කොට සියලු සූත්‍රාන්තය භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන්ගේ ප්‍රඥාවට නොලැබිය හැකි. පිහිට ඇති අතිශයින් ගැඹුරු වූ සර්වඥභාවය දක්වන සේක් (මේ මූලපරියා සූත්‍ර දේශනාව වූ කලී)

"එක් පුථුජ්ජන වාරයකින්ද, එක් සෙඛ වාරයකින් ද ඛීණාසව වාර හතරකින්ද, තථාගත වාර දෙකකින් දැයි මහාවාර අටකින් ද එකෙක් වාරයෙහිත් පඨවි ආදි සූවිසි අතුරු වාරයකින්ද යුක්තකොට දෙබණවරක් පමණ වූ පාළියෙන් වදාළ සේක."

මෙසේ විසිතුරු වූ දෙසුම් නයින් හා දෙසුම් විලාසිතාවන්ගෙන් සැදුම්ලත් මේ මූලපරියාය සූත්‍ර දේශනාව කරවීක නාදය මෙන් මනහර වූ සවන පිනවන පණ්ඩිත ජන හදමැදුරට අමා අභිෂේකයක් වැනි වූ බ්‍රහ්ම ස්වරයෙන් වදාරන්නා වූ ද භාග්‍යවතුන් වහන්සේගේ මෙම දෙසුමට න තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්‍දුනති,

එම පන්සියයක් පමණ වූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ මෙම දෙසුමට සතුටු නොවූහ. කුමක් හෙයින් යත්, තේරුම්ගැනීමට නොහැකි

වූ බැවිනි. ඔවුහු මෙම සූත්‍රයාගේ අර්ථය නොදන්නා බැවින් සතුටු නොවූහ. එසමයෙහි එම භික්ෂූන්ට විසිතුරු නය දෙසුම් විලාසයන්ගෙන් හෙබි මෙම දෙසුම, ඝන වූ පළල් වූ රෙදිපටකින් මුඛ බන්ධනය කොට ඉදිරියෙහි තැබූ මනහර බොදුනක් මෙන් විය.

කල්ප ලක්ෂයක් අධිකකොට ඇති චතුරාසංඛ්‍ය කල්පයක් පෙරුම් පුරා බුදුබවට පැමිණියේ අන්‍යයන්ට දහම් අවබෝධ කරවනු පිණිසය. එවන් බුදුරජාණන් වහන්සේ උන්වහන්සේලාට නොතේරෙන නඅන්දමට දහම් දේශනා කළේ සූත්‍ර නික්ෂෙපයෙහි දැක්වූ අන්දමට, මානභඤ්ජනත්‍ථං "සබ්බ ධම්ම මූල පරියායන්හි දෙසනං ආරභි" යනුවෙන් එම භික්ෂූන්ගේ මානය දුරුකිරීමට යයි දක්වා ඇත. එබැවින් යළි මෙහි කිවයුත්තක් නොමැත. මෙසේ මන්බිඳුනු සඳහා දෙසූ දෙසුම අසා ඒ භික්ෂූහු එම පඨවිය දෘෂ්ටිගතිකව දනීයයි ද, සේඛ තෙමේ ද රහත් තෙමේ ද තථාගත තෙමේ ද විශිෂ්ඨ ඥානයෙන් දනී යයි ද පැවසේ. මේ කුමක්ද? මෙය කෙසේදැයි සිතන්නා වූ ඒ භික්ෂූහු, පෙර අපි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද දෙය වහාම දැනගනිමු. දැන්වූ කලී මේ මූල පරියාය දේශනාවගේ අන්තය හෝ කෙළවර නො දනිමු. පුදුමයකි. බුදුවරයෝ ම අනුපමේයහ. අතුලයහයි උපුල දළ ඇති සපුන් මෙන් මද රහිතව බුද්ධොපස්ථානයට ද ධර්මශ්‍රවණයට ද සැලකිලිමත්ව ගියාහුය.

එසමයෙහි දම්සභා මණ්ඩපයෙහි රැස්ව සිටි භික්ෂූන් වහන්සේ මේ කථාව ඉපදවූ සේක. බුදුවරයන්ගේ ආනුභාව පුදුම සහගතය. එසේ මානමදයෙන් මත් වූ බ්‍රාහ්මණ පැවිද්දෝ භාග්‍යවතුන් වහන්සේ විසින් නිහතමානි වූවාහු කරන ලද්දාහුයි එකල්හි එම භික්ෂූහු අතුරුකථාව නො නිමවූවාය. බුදුරජාණන් වහන්සේ ගඳකිලියෙන් නික්ම අවස්ථාවට සුදුසු වූ ප්‍රාතිහාර්යයකින් යුතුව දම්සභායෙහි පැනවූ අස්නෙහි වැඩහිඳ ඒ භික්ෂූන්ට මෙසේ වදාළහ. මහණෙනි, දැන් කිනම් අතුරු කථාවකින් යුක්ත වූවාහු ද, භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට එම කරුණ දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. මහණෙනි, දැන් පමණක් නොවෙයි. පෙර ද මම මෙසේ මානය දැඩිකොට ගෙන හැසුරුණ මොවුන් නැසූ මන් ඇත්තවුන් කළෙමි. අනතුරුව මෙම අර්ථෝත්පත්තියෙහි මේ අතීත කථාව ගෙනහැර දැක්වූ සේක.

## මූල පරියාය ජාතකය

මහණෙනි, යටගිය දවස බරණැස් නුවර දිසාපාමොක් ඇදුරුව එක්තරා බමුණු කෙනෙක් වෙසෙති. ත්‍රිවේදයන්ගේ පරතෙරට ගියා වූ -පෙ- *නොඅඩු පරිපූරකාරි බවක් ඇති, ඒ බමුණුතෙම පන්සියක් පමණ මාණවක පිරිසකට මන්ත්‍ර හදාරවති. පණ්ඩිත වූ මාණවකයෝ බොහෝ කොට ද වහ වහාද ඉගෙන ගනිති. මනාව ධාරණය කරගනිති. ඔවුන් විසින් උගත් දෙයද නො නැසෙයි. ඒ බමුණු තෙමේ ද ආචාර්ය මුෂ්ටියක් නොතබා, කළයෙහි ජලය වත්කරන්නාක් මෙන් සියලු ශිල්පය උගන්වා ඒ බමුණු තරුණයන්ට මෙසේ කීය. දිට්ඨධම්ම සම්පරාය (මෙලොව පරලොවට) හිත වූ මේ ශිල්පය මෙපමණ යයි ඒ බමුණු මාණවකයෝ ද අපගේ ඇදුරාණෝ යමක් දනිත්ද අපිදූ එය දනුම්හ. අපිදූ මෙවිට ආචාර්යයෝම යයි මත් උපදවා එතැන් පටන් ආචාර්යයන් කෙරෙහි ගෞරව රහිත වූවාහුය. බහා තැබූ වත්පිළිවෙත් ඇතිව විසූහ. ආචාර්ය තෙම එය දැන ඔවුන්ගේ මානයට නිග්‍රහ කරන්නෙමැයි සිතා දිනක් හෙතෙම උපස්ථානයට පැමිණ වැඳ හුන්නා වූ ඒ මාණවකයන්ට මෙසේ කීය. දරුවෙනි, ප්‍රශ්නයක් අසමි. කිම එය විසඳන්ට සමර්ථ වහුද? ආචාර්යතුමනි, විචාරනු මැනවි, ආචාර්යතුමනි විචාරනු මැනවි යයි එකවරටම උගත් මදයෙන් මත්වූවෝ යම්සේ ද එසේම කීවාහුය. ඇදුරුතෙම මෙසේ කීය.

**කාලො ඝසති භූතානි - සබ්බානෙව සහත්තනා**
**යොච කාලඝසො භූතො, ස භූත පචනිං පචි**

(පෙරබත් ආදි කාලය තෙම (එකකුදු නොහැර) සියලුම සත්ත්වයන් තමා සමග කා දමයි. මත්තෙහි ප්‍රතිසන්ධිකාල ක්ෂය කළා වූ යම් ක්ෂීණාශ්‍රව කෙනෙකු වෙත් ද, සතර අපායයන්හි සත්ත්වයන් පත්වන්නා වූ යම් තණ්හාවක් වේද, එය ඥාන නමැති ගින්නෙන් දැවි.) යනුයි.

දරුවෙනි, මේ ප්‍රශ්නය විසඳන්න. ඔවුහු සිතාබලා නොදන්නේ නිශ්ශබ්ද වූහ. දරුවෙනි, කම් නැත. අද යන්න. සෙට කියාදෙන්නෙමි යයි ඔවුන් පිටත්කර යැව්වේය. ඔවුන් දසදෙන, විසිදෙන එකතුව බලන්නේ

---

***නිඝණ්ඩු කෙටුභ ශාස්ත්‍රයන් සහිත වූ අථර්වන්වේදය සතරවන කොට ඇති පුරා කථා සංඛ්‍යාත ඉතිහාසය පස්වන කොට ඇති. ඍග්-යජුර්-සාමන් යන වේදත්‍රයාගේ පරතෙරට ගියා වූ පදක නම් වූ වෛයාකරණ වූ ලොකායත ශාස්ත්‍රයෙහි හා මහාපුරුෂ ලක්ෂණයෙහි.**

ප්‍රශ්නයාගේ ආදිය නොදුටුවාහුය. අන්තය නොදුටුවහ. නැවත පෙරලා ගොස් මේ ප්‍රශ්නයෙහි අර්ථය නොදනිවුයයි ආචාර්යවරයාට දැන්වූහ. ආචාර්යතෙම ඔවුනට නිගාකරනු වස් මේ ගාථාව කීය.

"බහුනි නරසීසානි, ලොමසානි බ්‍රහානිච
ගීවාසු පටිමුක්කානි, කොච්දෙවෙත්ථ කණ්ණවා"

(බොහෝ වූ මිනිස් හිස්හු දක්නා ලැබෙති. රෝම සහිත වූවාහුද, මහත් වූවාහුද වෙති. ග්‍රීවයන්හි පිහිටියාහුය. මෙහි ප්‍රඥා ඇත්තේ කිසිවෙක්ම වෙයි.)

ගාථාවේ අර්ථය මෙසේ දතයුතුයි. බොහෝ වූ මනුෂ්‍ය ශීර්ෂයෝ දක්නා ලැබෙති. ඒ සියලු ශීර්ෂයෝම රෝම සහිතයෝය. ඒ සියල්ලෝ මහත් වූවාහුද වෙති. ග්‍රීවායෙහි පිහිටියාහුය. තල් පලයක් මෙන් අතින් නොගත්තාහුය. ඒ ශීර්ෂියන්ගේත් මේ ධර්මයන්ගේත් නානත්වයක් නැත්තේය. මෙහි වනාහි කිසිවෙක්ම කන් ඇත්තේ වේයයි තමන් සඳහා කීය. කණ්ණවා යනු නුවණැත්තේ යන අර්ථයි. කන් සිදුර කිසිවෙකුට නැත්තේ නොවේ. මෙය අසා ඒ මාණවකයෝ හැකුළුණු මුහුණු ඇත්තාහු, නැමුනු කඳ ඇත්තාහු, යට බැලූ මුහුණු ඇත්තාහු ඇඟිල්ලෙන් බිම ඉරි අඳිමින් නිශ්ශබ්ද වූහ. ඉක්බිති ආචාර්යතෙම ඔවුන්ගේ ලැජ්ජා සහිත භාවය දැක දරුවෙනි, ප්‍රශ්නය උගනිව් යයි ප්‍රශ්නය විසඳී.

කාලො පෙරබත් කාලය, පසුබත් කාලය ආදියයි. භූතානි, මේ සත්වයනට නමකි. කාලය තෙම සත්ත්වයන්ගේ සම් මස් ආදිය නොකයි. වැලිදු වනාහි, ආයු, වර්ණ බලයන් ක්ෂය කරමින්, යොවුන් බව මඩිමින් නිරෝගි බව නසමින් කයි. භක්ෂණය කෙරේයයි කියනු ලැබේ. 'සබ්බානෙව සහත්තනා' මෙසේ කන්නේද කිසිවෙකු නො හරියි. සියල්ලන්ම කයි. හුදු භූතයන්ව නො වෙයි. තව ද තමා සමග තමා ද කයි. පෙරබත් කාලය පසුබත් කාලයට නොපැමිණෙයි. පසුපත් කාලාදියෙහිද මේ ක්‍රමයමැයි. යොච කාල සඝසො භූතො රහතුන් වහන්සේට මේ නමකි. ඒ රහත් තෙම මතු ප්‍රතිසන්ධි කාලය ක්ෂය කොට කා සිටි හෙයින් කාලඝසො යයි කියනු ලැබේ. සභූත පචනං පචි යනුවෙන් ඒ රහත් තෙම යම් මේ තණ්හාවක් අපායයන්හි සත්ත්වයන් පසවාද, ඒ තණ්හාව ඥාන නමැති ගින්නෙන් දැවිය. හලුකළේය. එහෙයින් භූත පචනිං පචී යයි කියනු ලැබේ.

ඉක්බිති ඒ මානවකයෝ පහන් දහසක ආලෝකයෙන් රාත්‍රි කාලයෙහිදු සම විසම බැව් දකින්නාක් මෙන් ආචාර්යයන්ගේ විසඳීමෙන් ප්‍රශ්නයාගේ අර්ථය ප්‍රකටව දැක මෙතැන් සිට අපි දිවි ඇති තෙක් වසන්නෙමු. බහුශ්‍රැතයෝ යයි මානය උපදවා සිටි අපි සිව්පද ගාථාවකගේ අර්ථය නො දකුම්හ. එබැවින් මේ ආචාර්ය නම් මහත් වූවාහුය. මෙසේ නිහතමානී වූවාහු පෙර මෙන්ම ආචාර්යයන්ට වත්පිළිවෙත් කොට ස්වර්ග පරායණ වූහ.

මහණෙනි, මම එසමයෙහි ආචාර්ය වීමි. මේ භික්ෂූහු මේ මානවකයෝ වූහ. මෙසේ පෙරද මම මොවුන් මෙපරිද්දෙන් මානය දැඩිකොට ගත් හිස් ඇතිව හැසිරෙන්නවුන් නැසූ මාන ඇත්තවුන් කෙළෙමි යයි මේ ජාතකයද අසා ඒ භික්ෂූහු පෙරද මානයෙන් නටුම්හයි බොහෝ සෙයින් නිහතමානී වී තමහට උපකාර වූ කමටහන් පිහිටකොට ඇත්තෝ වූහ.

නැවත භාග්‍යවතුන් වහන්සේ එක්කලෙක ජනපද චාරිකාවෙහි හැසිරෙන සේක්, විශාලා මහනුවරට පැමිණ ගෝතමක නම් චෛත්‍යයෙහි වාසය කරන්නා වූ මේ භික්ෂූන්ගේ නුවණ මුහුකුරා ගිය බව දැන මේ ගෝතමක නම් සූත්‍රය වදාළ සේක.

ගොතමක සූත්‍රය

**"අභිඤ්ඤායාහං භික්ඛවෙ, ධම්මං දෙසෙමි. නො අනභිඤ්ඤාය, සනිදානාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි නො අනිදානං සප්පාටිහාරියාහං නො අප්පාටි හාරියං තස්ස මය්හං භික්ඛවෙ අභිඤ්ඤාය ධම්මං දෙසයතො -පෙ- නො අප්පාටිහාරියං කරණීයො ඔවාදො, කරණීයො අනුසාසනි අලඤ්ච පන වො භික්ඛවෙ තුට්ඨියා අලං අත්තමනතාය, අලං සොමනස්සාය, සම්මා සම්බුද්ධො භගවා ස්වාක්ඛාතො ධම්මො සුපටිපන්නො සංඝොති, ඉදමවොච භගවා ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සහස්සී ලොකධාතු අකම්පිත්ථ**

මෙම සූත්‍ර දේශනාව අසා ඒ පන්සියයක් භික්ෂූහු ඒ අස්නෙහිම සිව්පිළිසිඹියා සමග රහත් බවට පැමිණියාහුය. මෙසේ මෙම දේශනා තොමෝ මත්තෙහි නිමාවට පැමිණියහයි දත යුත්තේය.

**මූලපරියාය සූත්‍ර වර්ණනාව නිමි.**

## 1-1-2

සැවැත්නුවර,

එවං මෙසුතං සාවත්‍ථියං, යනු සබ්බාසව සූත්‍රයයි. මේ එහි අනුපූර්ව පද වර්ණනාවයි. සාවත්‍ථියං යනු සවත්‍ථ නම් ඍෂිහුගේ වාසස්ථානය වූ නගරයයි. කාකන්දි මාකන්දි යන නාමයන් යම්සේ ද එමෙනි. මෙසේ පළමුකොට අක්‍ෂර චින්තකයෝ ද අට්ඨකථාචාර්යවරයෝ ද කියති. මිනිසුන්ගේ යම්කිසි උපභෝග පරිභෝග සම්පත් වීද ඒ සියල්ල මෙහි ඇත්නුයි සාවත්‍ථි නම් වේ. නැතහොත් වෙළඳ සමූහයා රැස්වූ කල්හි කිනම් භාණ්ඩයක් ඇත්දැයි විචාළ විට ඒ සියල්ල ඇත යන වචනය ගෙන සාවත්‍ථි නම් වේ යයි-

1. සබ්බදා සබ්බූපකරණං සාවත්‍ථියං සමොහිතං
තස්මා සබ්බමුපාදාය සාවත්‍ථීති පවුච්චති

2. කොසලානං පුරං රම්මං දස්සනෙය්‍යං මනොරමං
දසහි සද්දෙහි අවිවිත්තං අන්නපාන සමායුතං

3. වුද්ධිං වෙපුල්ලතං පත්තං ඉද්ධං ඵීත මනොරමං
ආලකමන්දාව දෙවානං සාවත්‍ථිපුර මුත්තමං

1. සැවැත් නුවර සියලු කල්හි සියලු උපකරණ යම් හෙයකින් මොනවට රැස්වූයේද, එහෙයින් සබ්බං යනුගෙන සාවත්‍ථි යයි කියනු ලැබේ.

2. කොසොල්රට වාසීන්ගේ රම්‍ය වූ දර්ශනීය වූ සිත්කලු වූ සාවත්‍ථිපුරය දසවිධ ශබ්දයන්ගෙන් නොසිස්වන ආහාරපානයන්ගෙන් සැදුම් ලද්දේය.

3. සමෘද්ධ වූ පිනාගියා වූ සිත්කලු වූ උතුම් වූ සැවැත්පුරය දෙවියන්ගේ ආලකමන්දාව නම් රාජධානිය මෙන් දියුණුවටත් විපුල බවටත්, පැමිණියේ විය.

**ජේතවනය :-**

ඒ ශ්‍රාවස්ති නගරයෙහි යන අර්ථයි. ජේතවනෙ යන මෙහි තම පසමිතුරන් දිනුවේනුයි ජේතනම් වේ. නැතහොත් රජු විසින් හෝ සතුරු

ජනයා දිනූ කල්හි උපන්නේ නුයි ජේතනම් වේ. මංගල කැමැති බැවින් හෝ ඕහට මෙසේ නාමය කරන ලදැයි හෝ ජේත නම් වේ. ජේත නම් අයගේ වනය නම් වූ බැවින් ද ජේතනම් වේ. යම් හෙයකින් ඒ දෙව්රම ජේතනම් කුමරා විසින් රෝපනය කරන ලද්දේ වර්ධනය කරන ලද්දේ පරිපාලනය කරන ලද්දේ වීද හෙතෙම ඒ ජේතවනයාගේ ස්වාමීත් වීද එහෙයින් ජේතවන යයි කියනු ලැබේ. ඒ ජේතවනයෙහි,

අනේපිඩු සිටුතුමා

අනාථ පිණ්ඩිකසස ආරාමෙ යන මෙහි ඒ ගෘහපති තෙම මව්පියන් විසින් කළ නමින් සුදත්ත නම් වේ. සියලු සැපතින් සමෘද්ධ බැවින් ද, පහ වූ මසුරු බව ඇති බැවින් ද කරුණාදි ගුණයෙන් යුත් බැවින් ද, සියලු කාලයෙහි අනාථයන්ට පිණ්ඩදානය කළේය. එබැවින්ද අනාථපිණ්ඩික යැයි ප්‍රසිද්ධියට පැමිණියේය.

මෙහි ප්‍රාණීහු විශේෂයෙන් පැවිද්දෝ සිත් අලවා වෙසෙත්නුයි ආරාම නම් වේ. ඒ ආරාමයාගේ මල්ඵල ආදි ශෝභාවෙන් ද ඉතා නොදුරු නොළං බැව් ආදී වූ පස්වැදෑරුම් සෙනසුම් සම්පත්තියෙන් ද, ඒ ඒ දිසාවන්ගෙන් අවුත් රමණය කෙරෙති. අභිරමණය කෙරෙති. උකටලී නොකොට වාසය කෙරෙති යන අර්ථයි. නැතහොත් ඉහත සඳහන් සම්පත්ති හේතුවෙන් ඒ ඒ තැන ගියවුන් ද, තම ඇසුරට පමුණුවා රමණය කරවානුයි ආරාම නම් වේ. යම්හෙයකින් ඒ ආරාමය තෙම අනාථපිණ්ඩික ගෘහපතීහු විසින් ජේතවන නම් රාජ කුමාරයා අතින් දහඅට කෝටියක් රන්කාසි වියදම්කොට මිලට ගෙන, දහඅට කෝටියක් වියදම්කොට සෙනසුන් කරවා දහඅට කෝටියක් වියදම්කොට විහාර පූජා උත්සවය කොට, මෙසේ පනස්හතර කෝටියක් රන්කාසි පරිත්‍යාගයෙන් බුදුපාමොක් මහසඟනට පාවා දුන්නේද එහෙයින් අනේපිඩු සිටුතුමාගේ ආරාමයයි කියනු ලැබේ. ඒ අනේපිඩු සිටුතුමාගේ ආරාමයෙහි.

මෙසේ ජේතවනෙ යන්නෙන් මුල් ස්වාමියා ප්‍රකාශ කිරීමයි. අනාථ පිණ්ඩිකසස ආරාමෙ යනුවෙන් පශ්චිම ස්වාමියා ප්‍රකාශ කිරීමයි. මෙවන් ප්‍රකාශයන්ගෙන් ඇති ප්‍රයෝජනය කවරේද? පින් කැමැත්තවුන්ගේ දුටු දෙය අනුව යාම සිදුවීම පිණිසය. එහි වනාහි, දොරටු ප්‍රාසාද නිර්මාණ කිරීමෙහි බිම විකිණීමෙන් ලැබූ අටලොස් කෝටියක් රන්ද නොයෙක් කෝටිගණන් වටිනා වෘක්ෂයෝ ද, ජේත කුමාරයාගේ පරිත්‍යාගයෝය.

සූපතස් කෙලක් අනේපිඩු සිටුහුගේ පරිත්‍යාග වෙයි. මෙසේ ඔවුන් දැක්වීමෙන් මෙසේ පින් කැමැත්තෝ පින් කරන්නේ යයි දක්වන්නා වූ ආයුෂ්මත් අනඳ තෙරණුවෝ අන්‍ය පුණ්‍යකාමීන් ද ඔවුන් අනුව යාමට පැමිණවීමෙහි යොදවත්.

සබ්බාසව සංවර පරියායං වො භික්ඛවෙ යනුවෙන් කුමක් හෙයින් මෙම සූත්‍රයෙහි වදාළ සේක්ද? ඒ භික්ෂූන්ගේ උපක්කිලේශ විශෝධන ආදිකොට ආශ්‍රවයන් ක්‍ෂය කිරීමේ ප්‍රතිපත්තිය දැක්වීම පිණිසය. ඒ දේශනාවෙහි සබ්බාසව සංවර පරියායං යනු සියලු ආශ්‍රවයන්ගේ සංවරයට කාරණය සංවර වූ කාරණය, යම් කරුණකින් ඔවුහු සංවර කරන ලදුව වසන ලදුව අනුත්පාද නිරෝධ නම් වූ ක්‍ෂය වීමට යෙත්ද ප්‍රහීණ වෙත් ද, නොපවතිත් ද ඒ කාරණය යන අර්ථයි.

ආශ්‍රවයෝ :-

එහි පහල වෙත්නුයි ආශ්‍රව නම් වෙති. ඇසින්ද -පෙ- සිතින් ද පහල වෙත්. පවතිත් යයි කියන ලද වෙයි. ධර්ම වශයෙන් ගෝත්‍රභූ සිත තෙක් ද, අවකාශ වශයෙන් භවාග්‍රය තෙක් ද, පහල වෙත්නුයි ආශ්‍රව නම් වෙති. මේ ධර්මයන් ද මේ අවකාශය ද ඇතුළත් කොට පවතිත් යනු මෙහි අර්ථයි. මේ ආකාරය තෙම ඇතුළත් කිරීම් අර්ථයෙහි මැයි. බොහෝ කලක් විසීම අර්ථයෙන් සුරා ආදිය ආශ්‍රව වැනි නුයි. ආශ්‍රව නම් වෙති. එය එසේමැයි. ලෝකයෙහි චිර පරිවාසිකාර්ථයෙන් (=බොහෝ කල් තිබීමේ අර්ථයෙන්) සුරා ආදියට ආසව යයි කියනු ලැබෙත්. ඉදින් බොහෝ කල් විසීම් අර්ථයෙන් ආශ්‍රවයෝ නම් මොවුහුම වන්නට සුදුසු වෙති. වදාරණ ලදී.

**පුරිමා භික්ඛවො කොටි න පඤ්ඤායති අවිජ්ජාය ඉතො පුබ්බෙ අවිජ්ජා නාහොසි** යනාදියෙහි දීර්ඝ වූ සංසාර දුක්ඛය උපදවත් ප්‍රශ්‍රව කෙරෙත්නුයි ආශ්‍රව නම් වෙත්. මෙහි පළමු දැක්වූ නිර්වචනයෙන් යම්තැනක ක්ලේශයෝ ආශ්‍රවයෝ යයි එත්ද, එහි යෙදෙත්. පසුව කී නිර්වචනය කර්මයෙහි යෙදෙයි. හුදු කර්ම ක්ලේශයෝම ආශ්‍රවයෝ නොවෙති. නානාප්‍රකාර වූ උපද්‍රවයෝ ද ආශ්‍රව නම් වෙති.

**සූත්‍රයන්හි :- නාහං චුන්ද දිට්ඨධම්මිකානං යෙව ආසවානං සංවරාය ධම්මං දෙසෙමි,** යන මෙහි විවාදයන්ට මුල් වූ ආශ්‍රවයෝ ආවාහුය.

යෙන දෙවූපපත්‍යාස්ස ගන්ධබ්බො වා විහංගමො
යක්ඛත්තං යෙන ගච්ඡෙය්‍යං මනුස්සත්තඤ්ච අබ්බජෙ
තෙ මය්හං ආසවා ඛීණා විද්ධස්තා විනලීකතා

(යම් ආශ්‍රවයක් හේතුකොටගෙන දෙව්ලොව පටිසන්ධියක් මට වන්නේ ද ආකාශචාරී ගාන්ධර්වයෙක් හෝ වන්නේ ද යම් ආශ්‍රවයක් හේතුකොට ගෙන යක්‍ෂ බවට මම යන්නෙම් ද මිනිස්ලොවට ගියාහු පෙරලා එන්නේද, මා විසින් ඒ ආශ්‍රවයෝ ක්‍ෂය කරන ලද්දාහුය. වෙසෙසින් පහකරන ලද්දාහුය. සිඳින ලද්දාහුය.)

යන මෙහි ත්‍රෛභූමික කර්මයද, අවශේෂ අකුසල කර්ම ද ආශ්‍රව නම් වෙති. දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකං ආසවානං පටිඝාතාය, යන මෙහි පරෝපවාද, පසුතැවිලි වදබන්ධන ආදියද, අපාය දුක්ඛ ආදි නානාප්‍රකාර උපද්‍රවයෝ (ආශ්‍රවයෝ නම් වෙති) ඒ මේ ආශ්‍රව ධර්මයෝ යම්තැනක යම්පරිද්දෙන් ආවාහුද එහි එපරිද්දෙන් දතයුත්තාහුය.

මේ ආශ්‍රවයෝ පළමුකොට විනයෙහි, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය සම්පිරායිකානං ආසවානං පටිඝාතාය මෙහි දෙපරිද්දකින් ආවාහුය. සළායතන සූත්‍රයෙහි තයො මෙ ආවුසො ආසවා කාමාසවො, භවාසවො අවිජ්ජාසවො යයි තුන් පරිද්දකින් ආවාහුය. අන්‍ය සූත්‍රයන්හිද අභිධර්මයෙහි ද ඔවුහුම දිට්ඨාසවයත් සමග සතර පරිද්දකින් ආවාහුය. නිබ්බේධික පරියායෙහි අත්ථි භික්ඛවෙ ආසවා නිරයගාමිනියා අත්ථි ආසවා තිරච්ඡානයොහි ගාමිණියා අත්ථි ආසවා පෙත්තිවිසය ගාමිණියා අත්ථි ආසවා මනුස්සලොකගාමිනියා අත්ථි දෙවලොක ගාමිනියා යනුවෙන් පස් ආකාරයක් ආවාහුය. ඡක්ක නිපාතයෙහි අත්ථි ආසවා සංවරා පහාතබ්බා යනාදි නයින් සය ආකාරයකින් ආවාහුය. මේ සූත්‍රයෙහි ඔවුහුම දස්සනා පහාතබ්බ ආසවයත් සමග සත් පරිද්දකින් ආවාහුය. මේ වූ කලී ආසව ශබ්දයේ වචනාර්ථ හා ප්‍රභේද වෙති.

**සංවර ශබ්දය :**

සංවර යන පදයෙහි සංවරණය කෙරේනුයි සංවර නම් වේ. සංවර නම්, වසයි වළකයි, පවත්වන්නට නොදෙයි, යන අර්ථයි. එබැවින්,

අනුජානාමි භික්ඛවෙ, දිවා පතිසල්ලීයනෙතන ද්වාරං සංවරිත්වා පතිසල්ලියිතුං යන තන්හිද, සොතානං සංවරං බ්‍රෑමි පඤ්ඤායෙතෙ පිථීයරෙ යන ආදි තන්හි ද, පිධාන (=වැසීම) අර්ථයෙන් සංවර යයි වදාළහ.

**පස් ආකාර සංවරය :**

මේ සංවරය වූ කලී පස්ආකාර වෙයි. සීල සංවරය, සති සංවරය, ඤාණ සංවරය, ඛන්ති සංවරය, විරිය සංවරය යනුවෙනි. ඔවුන් අතුරෙහි ඉමිනා පාතිමොක්ඛ සංවරෙන උපෙතො යන මෙය සීල සංවර නම් වේ. ප්‍රාතිමෝක්‍ෂ සීලය මෙහි සංවර යයි කියන ලදී.

චක්ඛුන්‍ද්‍රියෙ සංවරමාපජ්ජති යනාදි තන්හි සති සංවරයයි. 'සිහියම' මෙහි සංවරයයි කියන ලදී.

සොතානං සංවරං බ්‍රෑමි, පඤ්ඤායෙතෙ පිථීයරෙ
යන මෙහි ඤාණ සංවර යයි. මෙහි ඤාණයම 'පිථීයරෙ' යන මේ පිධානාර්ථයෙන් සංවර යයි කියන ලදී.

ඛමො හොති සීතස්ස, උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති යනාදි නයින් මෙම සූත්‍රයෙහිම ඛන්ති විරිය සංවරයෝ ආවාහුය.

සබ්බාසව සංවර පරියායං යන මේ උද්දේශයෙන් සංග්‍රහ කළ බැවින් ඔවුන්ගේ ද සංවර භාවය දතයුත්තේය. තවද මේ පස්ආකාර වූ සංවරය මෙහි ආවේමය. ඔවුන් අතුරෙන් ඛන්ති විරිය සංවරයෝ පළමුකොටම කියන ලද්දාහුය.

සො තඤ්ච අනාසනං තඤ්ච අගොචරං යන මෙහි සීල සංවරයයි.

පටිසංඛායොනිසො චක්ඛුන්‍ද්‍රිය සංවර සංවුතො යන මෙහි සති සංවරයයි. සියලු තන්හි පටිසංඛා යනු ඤාණ සංවරයයි. අගහිත ගහන නය අනුව, දස්සන, පටිසේවන භාවනා යන මොවුහු ඤාණ සංවර නම් වේ. ධර්මයෝ මේ කරණකොටගෙන වෙසෙසින් යෙත්නුයි පරියාය නම් වේ. උත්පත්තියට හෝ නිරෝධයට හෝ යෙත්යයි කියන ලද්දේ වෙයි. මෙතෙකින් 'සබ්බාසව සංවර පරියායං' යන මෙහි යමක් කිවයුතුද එය කියන ලද්දේ වෙයි.

මේ පැමිණි අවසරයෙහි ජානතො අහං යනාදියෙහි ජානතො, දන්නහුගේ පස්සතො දක්නහුගේ, දෙපදයම ඒකාර්ථය ව්‍යඤ්ජනයම ඇති වෙනසයි. මෙසේ ඇති කල්හි ද, ජානතො යන ඤාණ ලක්‍ෂණය ගෙන

පුද්ගලයා දක්වයි. ඤාණයි දැනීම ලකුණුකොට ඇත්තේය. පසසතො යන ඤාණය ප්‍රභවකොට ඇති බව ගෙන පුද්ගලයා දක්වයි. ඤාණය දැකීම උත්පත්තිකොට ඇත්තේය. ඤාණය ඇති පුද්ගල තෙම ඇස් ඇති තැනැත්තේ ඇසින් රූපයන් මේ නුවණින් විමසන්නට ධර්මයන් දකියි. යළිදු උපාය මනසිකාරය උපදවන්ට දන්නහුගේ අනුපාය මනසිකාරය යම්සේ නූපදීද, එපරිද්දෙන් දක්නහුගේ යයි මේ මෙහි සාරයයි. කිසියම් ආචාර්ය කෙනෙක් බොහෝ විස්තර බෙණෙති. එම විස්තරයන් මෙම අර්ථයෙහි නොයෙදෙත්.

ආසවක්ඛය

ආසවානං ඛයං යනු ආශ්‍රවයන්ගේ ප්‍රහානය ආශ්‍රවයන්ගේ අත්‍යන්ත ක්‍ෂය සමුප්පාදය. ක්‍ෂය වූ ආකාරය නැති බව යන අර්ථයි. මෙයම මෙම සූත්‍රයෙහි ද ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං යනාදියෙහිද ආශ්‍රවයන් ක්‍ෂය කිරීම යන අර්ථයයි. පිටත් තන්හි මාර්ගඵල නිර්වාණයද ආසවක්ඛය යයි කියනු ලබත්. එබැවින් -

සෙඛසස සිකඛමානසස උජුමගගානුසාරිනො
ඛයසමිං පඨමං ඤාණං තතො අඤඤා අනනතරා

(ත්‍රිවිධ ශික්‍ෂාවෙහි හික්මෙන්නා වූ ඍජු මාර්ගයයි කියන ලද ආර්ය මාර්ගයට පිළිපන්නා වූ සේඛයා හට පළමුකොට මාර්ග ඥානය උපදී. අනතුරුව රහත් ඵලය උපදී.)

යනුවෙන් ආදියෙහි මාර්ගය ආසවක්ඛය යයි කියන ලදී. ආසවානං ඛයා සමණො හොති යනාදියෙහි ඵලය කියන ලදී.

පරවජජානු පසසිසස නිචචං උජඣාන සඤඤිනො
ආසවා තසස වඩඪනති ආරා සො ආසවකඛයා

(අනුන්ගේ වරද දක්නා වූ නිතර අනුන්ගේ වැරදි සොයන බැවින් උජ්ඣාන සංඥී වූ ඒ මහණ හට කාමාදි ආශ්‍රවයෝ වැඩෙත්. ඒ මහණතෙම ආසවක්ඛය නම් වූ රහත් ඵලයෙන් දුරුවූයේ වෙයි.)

ආදි තන්හි නිර්වාණය ආසවක්ඛය නම් වේ.

නො අජානතො නො අපස්සතො යනු යමෙක් නොදනී ද නොදකී ද ඔහුට ආසවක්ඛය නොකියමි යන අර්ථයි. යමෙක් නොදන්නහුට නොදක්නහුට සංවර ආදි ශුද්ධියක් කියත් ද ඒ ප්‍රතික්ෂේප කරන ලද්දාහු වෙත්. නැතහොත් පළමු පද දෙකින් උපාය කියන ලද්දේය. මෙයින් අනුපාය ප්‍රතිෂේධය කියන ලද්දේය. සැකෙවින් මෙහි ඥානය ආසව සංවර පරියාය යයි දක්වන ලද්දේ වෙයි.

දැන් යමක් දන්නහුගේ ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වේද, එය දක්වනු කැමැත්තේ කිංසු ච භික්ඛවෙ ජානතො යනුවෙන් විමසීමක් පටන් ගත්හ. එහි දැනීම් තොමෝ විවිධ වන්නීය. නුවණැති යම්කිසි මහණ කෙනෙක් කුඩයක් සෑදීමට දනීද, කිසිවෙක් සිවුරු ආදී අන්දෙයක් කිරීමට දනීද, ඔහුගේ මෙවන් කර්මාන්ත කළයුතු වතක් යයි යන හැඟීමෙන් යුතුව කරන්නහුට ඒ දැනුම් තොමෝ මාර්ග ඵලයන්ට ආසන්න කාරණයක් නොවේයයි නොකිව යුත්තේය. යමෙක් වනාහි සසුනෙහි පැවිදිව වෙදකම් ආදිය කරන්ට දනී ද එසේ දන්නහුගේ ආසවයෝ වැඩෙන්නාහුම වෙත්.

යොනිසො මනසිකාරය

යමක් දන්නහුට ද දක්නහුට ද ආසව ක්ෂය වේයයි යන්න දක්වමින් මෙසේ කීහ. යොනිසො ච මනසිකාරං, අයොනිසො ච මනසිකාරං යනුවෙන් එහි යොනිසො මනසිකාරය නම් උපාය මනසිකාරයයි පථමනසිකාරයයි. අනිත්‍යාදියෙහි අනිත්‍ය යනාදි නයින්ම හෝ සත්‍යානුලෝම ඥානයෙන් හෝ චිත්තයාගේ ආවට්ටනා (=පෙරළීමක්) අන්වාවට්ටනාවක් (=අනුව පෙරළීමක් ආභොගයක් (=මෙනෙහි කිරීමක්) සමන්නාහාරයක් (=යොමුවීමක්) වේද, මෙය යොනිසො මනසිකාරයයි කියනු ලැබේ.

අයොනිසො මනසිකාරො

යනු අනුපාය මනසිකාරයයි. උප්පථ මනසිකාරය යන අර්ථයි. අනිත්‍ය නිත්‍ය යයි ද දුක සැප යයි ද අනාත්මය ආත්ම යයි ද අශුභයෙහි ශුභයයි ද අයොනිසො මනසිකාරයත් උත්පථ මසිකාරයත් සත්‍යයට විරුද්ධ වූ හෝ චිත්තයාගේ වැටීමක් අනුව වැටීමක් හෝ මෙනෙහි කිරීමක් හෝ, යොමුවීමක් අනුව වැටීමක් හෝ මෙනෙහි කිරීමක් හෝ, යොමු වීමක් හෝ වේද, මෙය අයොනිසො මනසිකාරයයි කියනු ලැබේ.

මේ අයුරින් යෝනිසො මනසිකාරය උපදවන්ට දන්නහුට අයෝනිසො මනසිකාර යම්සේ නොම උපදීද, එපරිද්දෙන් දක්නහුට ආසවයන්ගේ නැතිවීම වෙයි. මෙවිට මෙම අර්ථයාගේ යුක්ති දක්වන සේක් 'යොනිසො භිකඛවෙ -පෙ- පහීයනති යයි වදාළහ. එයින් කුමක් කියන ලද්දේ වේද යත්, යම්හෙයින් නුවණින් මෙනෙහි නොකරන්නහුට ආශ්‍රවයෝ උපදිත් ද, නුවණින් මෙනෙහි කරන්නහුට ප්‍රහීණ වෙත් ද, එහෙයින් යෝනිසො මනසිකාරය උපදවන්ට දන්නහුට අයෝනිසො මනසිකාරය යම්සේ නොම උපදීද එපරිද්දෙන් දක්නහුට ආසවයන්ගේ ක්‍ෂය වීම වේයයි දතයුතුය. මෝ මෙහි කෙටි වැනුමයි. මේ විස්තර වැනුමයි.

එහි යෝනිසො අයෝනිසො පද දෙකෙන් මත්තෙහි මුලු සූත්‍රය සම්බන්ධ වෙයි. වට්ට විවට්ට වශයෙන් මත්තෙහි මුළු සූත්‍රය වදාරණ ලදී. අයොනිසො මනසිකාරය වට්ටයට (සසරට) මුල් වේ. යොනිසො මසිකාරය විවට්ටයට (=නිවනට) මුල්වේ. අයොනිසො මනසිකාරය වැඩෙන්නේ ධර්ම දෙකක් සම්පූර්ණ කෙරේ. අවිජ්ජාව සහ භව තණ්හාවයි. අවිජ්ජාව ඇතිකල්හි අවිජ්ජා පචචයා සංඛාරා -පෙ- දුකඛකඛනධසය සමුදයො හොති, මෙසේ අවිද්‍යාව ඇතිකල්හි අවිද්‍යාව ප්‍රත්‍යකොට සංඛාරයෝ වෙති. -පෙ- දුක් ගොඩෙහි ඇතිවීම වේයයි ද එසේම තණ්හා ඇතිකල්හි තණ්හාව ප්‍රත්‍යකොට උපාදානය වෙයි. -පෙ- දුක්ගොඩෙහි ඇතිවීම (සමුදය) වේයයි යනුවෙන් අයොනිසො මනසිකාරය සසර දුකට මුල්වන බව දක්වා ඇත.

මේ අයුරින් අයොනිසො මනසිකාර බහුලකොට ඇති පුද්ගල තෙම වාත වේගයට අසුවීමෙන් විනාශ වූ නැවක් මෙන් ද, ගංගාවෙහි දිය සුලියකට අසුවූ ගවරැලක් මෙන් ද චක්‍ර යන්ත්‍රයක ගවයෙකු මෙන් ද නැවත නැවත, භව-යෝනි-ගති-විඤ්ඤාණට්ඨිති සත්තාවාසයන්හි ආවර්තනය පරිවර්තනය කෙරෙයි මෙසේ පළමුකොට අයෝනිසෝ මනසිකාර මූලික වූ වට්ටය වෙයි.

යොනිසො මනසිකාරය වැඩෙන්නේ, **යොනිසො මනසිකාර සමපනනසෙසතං භිකඛවෙ, භිකඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨංගිකං මගගං භාවෙසසති. අරියං අට්ඨංගිකං මගගං බහුලී කරිසසති** යනුවෙන් වදාළ හෙයින් සමමාදිට්ඨි ප්‍රධානකොට ඇති, අරිඅටඟි මඟ සපුරාලයි. යම් සමමා දිට්ඨියක් වේද ඕ තොමෝ විද්‍යාව යයි ද විද්‍යාවගේ ඉපදීමෙන් අවිද්‍යාවගේ නිරෝධයෙන් සංඛාර නිරෝධය වෙයි. -පෙ- මෙසේ මේ

කේවල දුක් ගොඩේ නිරෝධය වේයයි මෙසේ යොනිසො මනසිකාරය මුල්වූ විවට්ටය දතයුතුයි.

මෙසේ මෙම පද දෙකෙන් මත්තෙහි මෙම සූත්‍රය එකට බැඳුනේ වෙයි. මෙසේ බැඳුනු කල්හි මෙහි යම්හෙයකින් පළමුකොට ආශ්‍රවයන්ගේ ප්‍රහාණය දක්වා පසුව උත්පත්තිය කීම නොයෙදෙයි. එහි ප්‍රහීණ වූවහු යලි නොඋපදිත්. උපන්නහුගේ වූ කලී ප්‍රහාණය යෙදෙයි. එහෙයින් උද්දේසය ප්‍රතිලෝම වශයෙන්ම දක්වන්නේ අයොනිසො භික්ඛවෙ, මනසි කරොතො, යනාදිය වදාළහ. එහි අයෝනිසො මනසි කරොතො උක්ත ප්‍රකාර වූ අයෝනිසො මනසිකාරය උපදවන්නහුට අනුප්පන්නා චෙව ආසවා උප්පජ්ජන්ති යන මෙහි පෙර නොලත් චීරු චීවර ආදි ප්‍රත්‍යයක් හෝ උපස්ථායක සද්ධිවිහාරික අන්තෙවාසිකයන් අතුරෙන් එක්තරා මනෝඥ වස්තුවක් හෝ ලැබ එය සුභය සුඛය යයි නුවණින් මෙනෙහි නොකරන්නහුට, අන්‍යතර වූ පෙර නොලත් චීරු අරමුණක් හෝ යම් ඒ ආකාරයකින් නුවණින් මෙනෙහි නොකරන්නහුට ද යම් ආශ්‍රව කෙනෙක් උපදිත් ද ඔවුහු නූපන්නාහු උපදිත් යයි දත යුත්තාහුය.

අන් පරිද්දකින් දක්වතොත් නොදත් කෙළවර ඇති (=අනමතග්ග) සංසාරයෙහි නූපන් ආශ්‍රව කෙනෙක් නම් නැත්තේය. පෙර අනුභව කළා වූද වස්තුවෙහි හෝ අරමුණෙහි හෝ යමෙකුට ප්‍රකෘති ශුද්ධියක් හෝ උද්දේස, පරිපුච්ඡා, පරියත්ති, නවකම්ම, යොනිසො මනසිකාරයන් අතුරෙන් එක්තරා එකක්හුගේ වශයෙන් හෝ පෙර නොඉපිද පසුව එබඳු වූම ප්‍රත්‍යයක් කරණ කොටගෙන යම් ආශ්‍රව කෙනෙක් වහා උපදින්නාහු වෙත් ද, මොවුහු ද නූපන්නාහු උපදිත් යයි දත යුත්තාහුය. ඒ වස්තු ආරම්මණයන්හි, නැවත නැවත උපදින්නාහු උපන් ආශ්‍රවයෝ වැඩෙත් යයි කියනු ලැබෙත් මෙයින් පළමු උපන්නහුගේ වැඩීමෙක් නම් නැත. ඒ වස්තු ආරම්මණයන්හිම නැවත නැවත උපදින්නා වූම ආශ්‍රවයෝ වැඩෙත් යයි කියනු ලැබෙත්. මෙයින් අන් පරිද්දකින් නම් පළමු උපන්නහුගේ වැඩීමක් නම් නැත.

යොනිසොච ඛො භික්ඛවෙ යන මෙහි යමෙකුට ආයුෂ්මත් මහා කාශ්‍යපයන්ගේ ද, භද්‍ර කපිලානියගේද යම්සේ ද එසේම ප්‍රකෘති ශුද්ධියක් හෝ උද්දේශ පරිපුච්ඡා ආදි කාරණයන්ගෙන් හෝ ආශ්‍රවයෝ නොම උපදිත්ද, හෙතෙම මගේ ආශ්‍රවයෝ මාර්ගයෙන් නැසීමට නොගියාහු

යයි දැනගනී. ඒකාන්තයෙන් ඔවුන්ගේ සහමුලින් නැසීම පිණිස පිළිපදිමියි අනතුරුව මාර්ග භාවනාවෙන් සියලු ආශ්‍රවයන් සහමුලින් නැසීම කෙරෙයි. ඔහුට ඒ ආශ්‍රවයෝ නූපන්නාහු නූපදිත් යයි කියනු ලැබෙත්. කාරක වූ යමෙකුට සිහිමුලා වීමෙන් වහා ආශ්‍රවයෝ උපදිත් ද ඉක්බිති සංවේගයට පැමිණ නුවණින් වීර්ය කරන්නේ ඒ ආශ්‍රවයන් සමුච්ඡේද කෙරේද, ඕහට උපන්නාහු ප්‍රහීණ වෙත් යයි කියනු ලැබෙත්.

**මණ්ඩලාරාමවාසී මහාතිස්සභූති තෙර**

මණ්ඩලාරාම වාසී තිසසභූති තෙරුන් මෙනි. හෙතෙම එම වෙහෙරෙහිම ඉගෙනීම කෙරෙයි. ගමෙහි පිඬු පිණිස හැසිරෙන ඕහට විසභාග අරමුණෙක්හි කෙලෙස් උපනි. හෙතෙම එය විදර්ශනාවෙන් විෂ්කම්භණය කොට විහාරයට ගියේය. ඕහට සිහිනෙන් ද එම අරමුණ එළඹ සිටියේ ය. හෙතෙම මේ කෙලෙස් ඇතිවීමෙන් අපායේ ඉපදීම පිණිස වන්නේ යයි සංවේග උපදවා ආර්යයන් විචාරා වෙහෙරින් නික්ම මහා සංඝරක්ඛිත තෙරුන් සමීපයෙහි රාගයට ප්‍රතිපක්ෂ වූ අසුභ කමටහනක් ගෙන වනලැහැබ් මැද්දට ගොස් පාංශුකුල චීවරය අතුරා හිඳ අනාගාමී මාර්ගයෙන් පංචකාම ගුණ රාගය මැඩ නැගිට ආචාර්යයන් වැඳ දෙවන දින උද්දේශ මාර්ගයට පැමිණියේය.

යම් ආශ්‍රව කෙනෙක් වර්තමානයෙහි නූපන්නාහු ද ඔවුන්ගේ ප්‍රතිපත්තියෙන් නම් ප්‍රහාණයක් නැත්තේය. මේ අවසරයෙහි උප්පන්නාච ආසවා පහීයන්ති යන මේ පදයම ගෙන යම් ආශ්‍රව කෙනෙක් ප්‍රහීණ වෙත්ද ඔවුන්ගේ නානාප්‍රකාර වශයෙන් අතිකුදු ප්‍රභාග කාරණයක් පහල කරන්ට දේශනාව විස්තර කරනුයේ **අත්ථි භික්ඛවෙ ආසවා දස්සනා පහාතබ්බා** ආදිය දේශනා ප්‍රභේදයෙහි දක්ෂ වූ ධම්මරාජ තෙම වදාළහ.

එහි **දස්සනා පහාතබ්බා** යනු දස්සනයෙන් පහකළ යුත්තාහුය. සියලු තන්හි මේ ක්‍රමය මැයි. එබැවින් ඒ පදයන් පිළිවෙලින් ප්‍රකාශ කරනු කැමැත්තාහු **කතමෙ භික්ඛවෙ ආසවා දස්සනා පහාතබ්බා** යනුවෙන් ප්‍රශ්නකොට මූල පරියාය වර්ණනාවෙහිම කී ක්‍රමයෙන්ම **ඉධ භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො** යනුවෙන් පුද්ගලාධිෂ්ඨාන දේශනාව ආරම්භ කළ සේක.

**එහි මනසිකරණියෙ ධම්මෙ නප්පජානාති** යනු, ආවර්ජනා කළයුතු,

සිත්හි එලවිය යුතු ධර්මයන් නො දනියි. අමනසි කරණියෙ ඊට විපරීත වූ සෙසු පදයන්හි ද මේ ක්‍රමයමයි. යම් හෙයකින් මේ ධර්මයෝ මෙනෙහි කළ යුත්තෝය. මොවුහු නොමෙනෙහි කළ යුත්තෝ යයි ධර්ම වශයෙන් නියමයක් නැත්ද, ආකාර වශයෙන් නියමයක් ඇත්ද, යම් ආකාරයකින් මෙනෙහි කරනු ලබන කල්හි අකුසලයන්ගේ හටගැනීමට හේතු වෙත්ද, ඒ අයුරින් මෙනෙහි නොකළ යුත්තාහුය. යම් ආකාරයකින් කුසල් ඉපදවීමට හේතු වෙත්නම් එපරිද්දෙන් මෙනෙහි කළ යුත්තාහුය. එහෙයින් 'යසස භික්ඛවෙ, ධම්මෙ මනසිකරොතො අනුප්පන්නො වා කාමාසවො' යනාදිය වදාළහ.

එහි, යසස යම් ධර්ම කෙනෙක් මෙනෙහි කරන්නා වූ ඒ අශ්‍රැතවත් පුථුජ්ජනයාට මනසි කරොතො ආවර්ජනා කරන්නහුට සිත්හි මනාව එලවන්නහුට,

සමුච්චයාර්ථ වා ශබ්දය,

අනුප්පන්නා වා කාමාසවා යන මෙහි වා ශබ්දය සමුච්චය අර්ථයෙහිය. විකල්පාර්ථයෙහි නොවේ. එහෙයින් 'යාවතා භික්ඛවෙ සත්තා අපදා වා දිවිපදා වා -පෙ- තථාගතො තෙසං අග්ගමක්ඛායති යයි කී කල්හි අපාදයෝ ද ද්විපාදයෝ ද යන අර්ථයයි. භූතානං වා සත්තානං වා ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය යයි කී කල්හි, භූතයන්ට ද උපන් සත්ත්වයන්ටද උපදිමින් සිටි සත්ත්වයන්ටද යන අර්ථයි. අග්ගිතො වා උදකතොවා මිථුභෙදතො වා යයි කී කල්හි, ගින්නෙන් ද ජලයෙන් ද, මිථු භේදියෙන් ද (=අන්‍යොන්‍ය භේදයෙන් ද) යන අර්ථයි. එපරිද්දෙන් මෙහි ද නූපන් කාමාසවයද උපදී. උපන් කාමාසවයද වැඩෙයි යන අර්ථය දතයුතුයි. සෙසු තන්හිදු මෙසේමැයි. මෙහි කාමාසවා යනු පඤ්චකාමගුණික රාගයයි. භවාසවො යනු රූප අරූප භවයන්හි ඡන්දරාගයයි. ධ්‍යාන නිකාන්තියද ශාස්වත, උච්ඡෙද යන දෘෂ්ටි ද භවාශ්‍රවයෙහිම සංග්‍රහයට යෙයි.

අවිජ්ජාසවො යනු චතුරාර්ය සත්‍ය පිළිබඳ නොදැනීමයි. එහි කාමගුණයන් අස්සා ද වශයෙන් මෙනෙහි කරන්නහුට නූපන් කාමාසව උපදී. උපන් කාමාසව වැඩෙයි. මහත්ගත ධර්මයන් අසසා ද වශයෙන් මෙනෙහි කරන්නහුට නූපන් භවාශ්‍රවය ද උපදී. උපන් භවාශ්‍රවය වැඩෙයි.

භූමිත්‍රයෙහි ධර්මයන් සතර විපර්යාසයන්ට පදස්ථාන භාවයේ මෙනෙහි කරන්නහුට නූපන් අවිජ්ජාසව උපදිත්. උපන් අවිජ්ජාසව වැඩෙත් යයි දතයුතුයි. කී ක්‍රමයට විරුද්ධ වශයෙන් කුසල පක්‍ෂය පිළිබඳ විස්තර කළයුතුය.

කුමක් හෙයින් ආශ්‍රවයෝ තිදෙනෙක් මෙහි කියන ලද්දාහුද, විමොක්‍ෂයන්ට ප්‍රතිපක්‍ෂ බැවිනි. කාමාසවය අප්පණිහිත විමොක්ඛයට ප්‍රතිපක්‍ෂ වේ. අන්‍යයෝ අපණිහිත අනිමිත්ත, සුඤ්ඤත විමොක්ඛයනට ප්‍රතිපක්‍ෂ වෙති. එහෙයින් මෙම ආසව ධර්ම තුන උපදවන්නාහු ත්‍රිවිධ විමොක්‍ෂයන්ට විරුද්ධ වෙති. ආසව නොඋපදවන්නාහු අවිරුද්ධ වෙතැයි මේ අර්ථය දක්වන්නහු විසින් තිදෙනෙක් දක්වන ලද්දාහු යයි දතයුත්තාහුය. දිට්ඨි ආසවයද වදාරණ ලද්දේම යයි මෙහි වර්ණනා කරන ලද්දේය.

**තසස අමනසිකරණීයානං ධමමානං මනසිකාරා** යනාදි මෙනෙහි කිරීම් හේතුකොටගෙන යම් ඒ ධර්මයක් මෙනෙහි කෙරේ ද, එහෙයින් කියන ලද වෙයි. දෙවෙනි පදයෙහි ද මේ ක්‍රමයි මැයි. අනුප්පනනාචෙව ආසවා උප්පජ්ජනති උප්පනනාච ආසවා පවඩ්ඪති යනු යට කියන ලද ආසවයන්ගේම මේ අභේදයෙන් දැක්වීමකි.

මෙතෙකින් පුද්ගලාධිෂ්ඨාන දේශනාවෙන් පහ කළයුතු ආශ්‍රවයන් දක්වන්ට යම් මේ අශ්‍රැතවත් පෘථජ්ජනයෙක් කියන ලද්දේද? හෙතෙම යම්හෙයකින් අයොනිසො භිකඛවෙ, මනසි කරොතො අනුප්පනනා චෙව ආසවා උප්පජ්ජනති යයි මෙසේ සාමාන්‍යයෙන් කියන ලද, නුවණින් මෙනෙහි නොකිරීම, ප්‍රත්‍යකොට ඇති, කාමාසවාදීන්ගේ අධිෂ්ඨානය වේද, එහෙයින් එම ආසවයන් ද ඒ පුද්ගලයා සමග දක්වා දැන් දසසනා පහාතබබ ආසවයන් දක්වන සේක් සො එවං අයොනිසො මනසිකරොති අහොසිං නුඛො අහං යනාදිය වදාළහ. නොහොත් විචිකිච්ඡා ශීර්ෂයෙන් මෙහි දිට්ඨි ආසවය ද දක්වනු පිණිස මේ දේශනාව පටන් ගත් සේක.

මේ පදයාගේ අර්ථය නම්, යමෙකුට මේ කියන අයුරින් මේ ආසවයෝ උපදිත්ද, හෙතෙම පෘථජ්ජන නම් වේ. යම් පෘථජ්ජනයෙක් අස්සුතවා, යනාදි නයින් කියන ලද්දේ ද, ඒ පෘථජ්ජන තෙම මෙසේ අනුවණින් අනුපායෙන් නොමගින් මෙනෙහි කෙරෙයි. ඒ කෙසේද? අහොසිනුඛො -පෙ- සො කුහිං ගාමී භවිසසති යන මෙයින් කියන ලද්දේ

වේද යත් ඕහට යම්සේ අහොසි නුඛො යනාදී ක්‍රමයෙන් කියන ලද සොළොස් ආකාර විචිකිච්ඡා තෙමේ උපදීද, හෙතෙම එපරිද්දෙන් අනුවණින් මෙනෙහි කරයි. එහි අහොසි නුඛො නනුඛො යන ශාස්වත ආකාරයද, අධිච්ච සමුප්පන්න (=හේතුවක් නොමැතිව හටගත්) ආකාරයද, නිසා අතීතයේ තමාගේ විද්‍යමාන බවද අවිද්‍යමාන බවද, සැක කරයි. කරුණු කිමෙකැයි නොකිය යුතුය. පුහුදුන් තෙම උමතුවෙකු මේ යම් ඒ ආකාරයකින් පවතියි. තවද අයෝනිසෝ මනසිකාරය මෙයට කරුණුය. මෙසේ අයොනිසො මනසිකාරයට කරුණු කිමද යත්, ඒ පෘථග්ජන භවයම හෝ ආර්යයන්ගේ නොදැක්මාදිය හෝයි පෘථජ්ජන තෙම නුවණින් මෙනෙහි කරන්නේ නොවේදැයි නොමෙනෙහි කෙරේයයි කවරෙක් හෝ මෙය කියාද, එහි පෘථජ්ජන භාවය කරුණු නොවෙයි. සද්ධර්ම ශ්‍රවණය කල්‍යාණමිත්‍ර භවාදිය, එහි කරුණු වෙති. මස් මාලු ආදිහු තමාගේ ප්‍රකෘතියෙන් නොම සුවඳ වෙති. සකස් කිරීම හේතුකොටගෙන සුවඳවත් වෙති.

කිං නුඛො අහොසිං ජාතිය, ලිංගය, ඉපදීම නිසා ක්‍ෂත්‍රියයෙක් හෝ වීමද, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර, ගෘහස්ත ප්‍රවෘජ්ජිත, දිව්‍ය, මනුෂ්‍ය අතුරෙන් එක්තරා එකෙක් හෝ වීම් දැයි සැක කරයි.

කථං නුඛො, රූප සටහන් ආකාරය නිසා දීර්ඝ හෝ වීම ද හ්‍රස්ව හෝ වීමද සුදු කළු ප්‍රමාණික අප්‍රමාණිකාදීන්ගේ අතුරෙන් එක්තරා එකෙක් හෝ වීම්දැයි සැක කෙරෙයි. කිසිවෙක් ඊශ්වර නිර්මාණ ආදිය නිසා යැයිද කිනම් කාරණයෙකින් වූයෙම්දැයි හේතුවෙහි සැක කෙරේයයි කියති.

කිං හුත්වා කිං අහොසිං ජාති ආදිය නිසා ක්‍ෂත්‍රියයෙක් වී හෝ බ්‍රාහ්මණයෙක් වීම්ද, -පෙ- දෙවියෙක් වී හෝ මිනිසෙක් වීම්දැයි තමාගේ පරම්පරාව සැක කරයි. සියලු තන්හිම අද්ධානං යනු කාලයට නමකි. භවිස්සාමි නුඛො නනුඛො ශාස්වත ආකාරය ද උච්ඡෙද ආකාරයද නිසා අනාගතයෙහි තමාගේ විද්‍යමාන බවද අවිද්‍යමාන බවද සැක කරයි. සෙස්සෙහි කී අයුරුමැයි.

එතරහි වා පච්චුප්පන්නං අද්ධානං යනු දැන් හෝ පටිසන්ධිය ආදිකොට චුතිය අවසන්කොට ඇති සියලුම වර්තමාන කාලය ගෙන

අජ්ඣත්තං කථං කථී හොති යනු තමාගේ ස්කන්ධයන්හි විචිකිච්ඡා ඇත්තේ වෙයි. අහං නු බොසම් තමාගේ විද්‍යමාන බව සැක කෙරෙයි. මේ (තමාගේ විද්‍යමාන බව සැක කිරීම) යෝග්‍ය වේද, යත් යෝග්‍ය වෙයි. අයුතුයයි මෙහිලා සිතීම කිම. යලිදු මෙහි මේ වස්තුව ගෙනහැර දක්වති.

සුළු මවගේ පුතා හිස මුඩුකර ඇත. මහ මවගේ පුතුගේ හිස මුඩුකර නැත. ඒ පුත්‍රයා නිදන කල හිස මුඩු කළේය. හෙතෙම නැගිට මම සුලු මවගේ පුතු වෙම්දෝ හෝයි සිතීය. මම වෙම්දෝ හෝයි යන සැකය ද මෙබඳු වෙයි.

තමා නැති බව සැක කිරීම

නොනු බො සම් යනුවෙන් තමාගේ නැති බව (අවිද්‍යමාන බව) සැක කෙරෙයි. එහිදු මෙම වස්තුව එයි. එක් මසුන් අල්ලන්නෙක් දියෙහි බොහෝ වේලාවක් සිටි බැවින් සීතල වූ තම කලවට මසෙකැයි සිතා ගැසීය. අනෙකෙක් සොහොනක් සමීපයේ කෙතක් රකින්නේ බියපත්ව හැකිලී නිදාගත්තේය. හෙතෙම පිබිද තමාගේ දෙදන යකුන් දෙදෙනෙකැයි සිතා ඊට පහර දුනි. මම නොවෙම්දෝ හෝයි යන සැකය මෙබඳුය.

කිං නු බො, ක්‍ෂත්‍රියයෙක්ම තම ක්‍ෂත්‍රිය බව සැක කෙරෙයි. සෙස්සෙහි ද මේ ක්‍රමයමැයි. දෙවි වූයේ දෙවි බව නොදක්නෙක් නම් නැති. එසේ වුවත් මම රූපී දෙවියෙක් දෝ හෝ අරූපී දෙවියෙක් දෝ හෝ යනාදි ක්‍රමයෙන් සැක කෙරෙයි.

ක්‍ෂත්‍රිය ආදීහු කුමක් හෙයින් නොදනීද යත් ඔවුන් එම කුලයෙහි ඉපදීම ප්‍රත්‍යක්‍ෂ නො වන්නීය. ගිහියෝද, පෙතලි රූ ආදිය ප්‍රව්‍රජිතයෙමී යන සංඥා ඇති වෙති. පැවිද්දෝ ද මගේ කර්මය කෝප්‍ය වීදෝහෝයි ආදි නයින් ගෘහස්ත සංඥා ඇත්තාහු වෙත්. මිනිස්සුද රජවරුන් මෙන් තමා කෙරෙහි දෙවියා යන සංඥා ඇත්තාහු වෙති.

කථං නු බොසම් යනු කී නයමැයි. හුදෙක් මෙහි අභ්‍යන්තරයෙහි ජීවයක් ඇතැයි ගෙන ඒ ජීවයාගේ පිහිටීම ආකාරය ඇසුරුකොට දිගු වෙම්ද, කෙටි වෙම්ද, හතරැස්, සයස්, අටැස්, සොළොසැස් ආදීන් අතුරෙන් එක්තරා ආකාරයකින් වෙම්දෝ හෝයි, සැක කෙරේයයි දතයුතුයි. දැන් පවත්නා සිරුරෙහි ආකාරය නොදක්නෙක් නම් නැත්තේමය.

කුතො ආගතො සොකුහිං ගාමි භවිස්සති යනු ආත්ම භාවයාගේ එන, යන ස්ථානය සැක කරයි. මෙසේ සොලොස් වැදෑරුම් විචිකිච්ඡාව දක්වා මෙසේ මේ විචිකිච්ඡා ශීර්ෂයෙන් යම් දිට්ඨි ආශ්‍රවයක් දක්වන්නට මෙම දේශනාව පටන් ගන්නා ලද්දේ ද, එය දක්වන සේක්, තස්ස එවං අයොනිසො මසිකරොතො ජනනං දිට්ඨීනං යනාදිය වදාළහ. ඒ පුද්ගලයාට යම්සේ විචිකිච්ඡාව උපදීද, ඒ අයුරින්ම නුවණින් මෙනෙහි කරන්නහුට විචිකිච්ඡාව සහිත ඒ අයෝනිසො මනසිකාරයම දැඩි බවට ගිය හෙයින් සවැදෑරුම් දිට්ඨීන් අතුරෙන් එක්තරා දිට්ඨියක් උපදීයයි කියන ලද්දේ වෙයි.

එහි සියලු පදයන්හි වා ශබ්දය තෙම විකල්පාර්ථයි. මෙසේ හෝ දෘෂ්ටිය උපදීයයි කියන ලද්දේ වෙයි.

ආත්ම දෘෂ්ටි

අත්‍ථි මෙ අත්‍තා මෙහිදී සියලු කල්හි සස්සත දිට්ඨිය තමා තුළ හැමකල් ඇති බව පිළිගනියි. සච්චතො, ථෙතතො, සත්‍ය වශයෙන්, ස්ථිර වශයෙන්, මෙය සත්‍යයයි දැඩි ලෙස කියන ලද්දේ වෙයි.

නත්‍ථි මෙ අත්‍තා මේ උච්ඡේද දෘෂ්ටියයි. විද්‍යමාන සත්ත්වයාගේ ඒ ඒ තන්හි විභව තණ්හාවෙන් ගැනීම සිදුවන හෙයිනි. නැතහොත් පළමු දක්වන ලද්ද තුන්කල්හිම ඇතැයි ගන්නහුට ශාස්වත දිට්ඨිය වේ. වර්තමාන කාලය පමණක් ඇතැයි ගන්නහුට උචෙඡද දිට්ඨිය ඇති වේ. පසුව දක්වන ලද්ද අතීත අනාගත කාලයන්හි නැතැයි ගන්නහුට 'අලුකෙළවරකොට අග්නීහු වෙත් යයි' දෘෂ්ටි ගත්තවුන්ට මෙන් උච්ඡේද දෘෂ්ටිය ඇතිවේ. අතීතයෙහි නැතැයි ගන්නා කල්හි අධිච්ච සමුප්පන්න දෘෂ්ටිකයාට මෙන් සස්සත දිට්ඨිය වේ.

අත්‍තනාව අත්‍තානං සඤ්ජානාමි සඤ්ඤා ඛන්ධායාගේ ප්‍රධානත්වයෙන් ඛන්ධයන් ආත්මයයි ගෙන සඤ්ඤා ඛන්ධයෙන් අවශේෂ ඛන්ධයන් දැනගන්නහුට මේ ආත්මයෙන්, මේ ආත්මය, දනිමියි යන දෘෂ්ටිය ඇතිවේ. අත්‍තාව අනත්‍තානං සඤ්ඤා ඛන්ධ ආත්මයයි ගෙන ඉතිරි සතරම අනාත්මයයි ගෙන සඤ්ඤාවෙන් ඔවුන් දැනගන්නහුට මෙවැනි දෘෂ්ටියක් ඇතිවෙයි.

අනත්තනාව අත්තානං සඤ්ජානාති යනාදියෙහි ද ඉතිරි සතර බන්ධයන් ආත්ම යයි ගෙන සඤ්ඤාවෙන් ඒ බන්ධයන් දැනගන්නහුට මෙබඳු දිට්ඨියක් වෙයි. මේ සියල්ලෝම ශාස්වත උච්ඡේද දෘෂ්ටීහු වෙති.

වදො වෙදෙය්‍ය යනාදියද ශාස්වත දිට්ඨියාගේම බැසගැනීම් ආකාරයෝය. එහි කියාතුයි වදො යනු වේ. වාක් කර්මය කරන ලද්දේ යයි කියන ලද්දේ වෙයි. විඳීනුයි වෙදෙය්‍ය නම් වේ. දනීයයිද අනුභව කෙරේ යයි ද කියන ලද්දේ වෙයි. කුමක් විඳීද යත් ඒ ඒ තන්හි කුසලාකුසල කර්මයන්ගේ විපාක විඳියි. තත්‍ර තත්‍ර යනු ඒ ඒ යෝනි-ගති-ඨිති-නිවාස-නිකාය යන්හි නොහොත් අරමුණුවල. නිච්චො, ඉපදීම් විනාශවීම් රහිත වූයේ. ධුවො ථිර වූයේ, සාර වූයේ. සස්සතො සියලු කල්හි පවත්නේ. සස්සතො යනු සර්වකාලිකයි. අවිපරිණාම ධම්මො යනු තමාගේ ප්‍රකෘති භාවය අත්නොහරින, ස්වභාව ඇත්තේ බොහොඩෙකු (කටුස්සෙකු) මෙන් නානාප්‍රකාර බවට නො පැමිණේ යනුයි. සස්සති සමං යනු චන්‍ද-සූරිය-සමුද්ද-මහාපඨවි පර්වතයෝ ලෝකව්‍යවහාර වශයෙන් සස්සතයෝ යයි කියනු ලබත්. සස්සතිකයන් හා සමාන වූයේ සස්සති සම නම් වේ. සස්සතිකයෝ යම්තාක් වෙත්ද, ඒතාක් එසේම සිටියයි ගන්නහුට මෙපරිද්දෙන් දෘෂ්ටීහු වෙති.

ඉදං වුච්චති භික්ඛවෙ දිට්ඨිගතං යනාදී තන්හි ඉදං යනු දැන් කිය යුත්තහුගේ ප්‍රත්‍යක්‍ෂයෙන් දැක්වීමයි. දිට්ඨිගතයන් සම්බන්ධයෙන් මේ කියන ලදී. දිට්ඨි සම්බන්ධයෙන් නොකියන ලදී. මෙහි දෘෂ්ටියම දෘෂ්ටිගත නම්.

ගූථගතං යනු මෙහි නැතහොත් දෘෂ්ටීන්හි ගියා වූ මේ දර්ශනය දෙසැට දෘෂ්ටියෙහි ඇතුලත් වන බැවින්ද දෘෂ්ටිගත නම් වෙයි.

මේ වනාහි අත්ථි මෙ අත්තා යනාදී වූ මෙය දිට්ඨියට ගමන් මාත්‍රයක්ම වෙයි. මෙහි ආත්ම වූ හෝ නිත්‍ය වූ හෝ කිසිවක් නැතැයි කියන ලද වෙයි.

මෙම දෘෂ්ටි තොමෝ දුකසේ නික්ම යා යුතුය යන අරුතින් දිට්ඨි ගහන නම් වේ. දුකසේ ඉක්මවිය යුතුය යන අරුතින් ද ප්‍රතිභය සහිත යන අරුතින් ද දිට්ඨි කන්තාර නම් වේ. දුබ්භික්ඛ කන්තාරවාළ කන්තාර

ආදිය මෙනි. සම්‍යග් දෘෂ්ටිය විනිවිද යන අරුතින් ද ඊට විරුද්ධ වූ අරුතින් ද දිට්ඨි විසූක නම් වේ. කලෙක උච්ඡෙද දිට්ඨි ගැනීමෙන් ද කලෙක ශාස්වත දිට්ඨි ගැනීමෙන් ද ප්‍රතිවිරුද්ධ කම්පනයක් ඇත්තේනුයි. දිට්ඨි විප්ඵන්දිත නම් වේ. බන්ධනාර්ථයෙන් (මෙම දිට්ඨීහු) සංයෝජන නම් වේ. එබැවින් වදාළහ. දිට්ඨි ගහනං දිට්ඨි සංයෝජනං යනුවෙන්.

දැන් මෙම දෘෂ්ටීන්ගේ බන්ධනාර්ථය දක්වන සේක. දිට්ඨි සංයෝජන සංයුත්තො යනාදිය වදාළහ. ඒ දේශනාවගේ මේ කෙටි අදහසයි. දිට්ඨි සංයෝජනයෙන් බැඳුනු පුහුදුන් තෙමේ ජාති ආදීන්ගෙන් නොමිදුනේ වෙයි. බොහෝ කීමෙන් කිම, සියලු සසර දුකින්ම නොමිදුනේ වෙයි.

මෙසේ සවැදෑරුම් දිට්ඨි ආසව දක්වා යම් හෙයකින් සීලබ්බත පරාමාසය කාමාසව වශයෙන් දක්වන ලද්දේ වෙයි ද, කම්සැපය පිණිස භව සැපයද භව විසුද්ධිය පිණිස අවිද්‍යාවෙන් මඩනා ලද, මේ ශාසනයෙන් බාහිර වූ මහණ බමුණෝ ශීලව්‍රතයනුත් පරාමර්ශනය කෙරෙත් ද, එහෙයින් එය නොදක්වා දෘෂ්ටි ග්‍රහණයෙන් හෝ සීලබ්බත පරාමාසය නොදක්වාම, යම් පුද්ගලයෙක් දස්සනයෙන් දුරුකළ යුතු ආසවයන් ප්‍රහාණය කෙරේ ද, ඒ පුද්ගලයා දක්වා එම ආශ්‍රවයන්ගේ ප්‍රහාණය දක්වන්ට හෝ, පළමුකොට අයෝනිසෝ මනසිකාරයෙන් යුක්ත වූ පුහුදුන් පුද්ගලයාට ඔවුන්ගේ උත්පත්තිය දක්වා දැන් එයින් විපරීත වූවහුට ප්‍රහාණය දක්වන්ට හෝ සුතවා ච බො භික්ඛවෙ යනාදිය වදාළහ. එහි අර්ථය නම් යම්තාක් හෙතෙම මේ දුකයයි පැමිණේ ද, ඒ තාක් යට කියන ලද නයින් ද, කියන ලද්දට විරුද්ධ නයින් ද දතයුතුය. විරුද්ධ ක්‍රමයෙන් ද, සියලු ආකාරයෙන් ද ආර්ය ධර්මයෙහි අකෝවිද, අවිනීත විරුද්ධ යන ලක්ෂණයන්ගෙන් මේ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක තෙමේ ආර්ය ධර්මයෙහි දක්ෂ වූයේ ද, ආර්ය ධර්මයෙහි සුවිනීත වූයේ ද වේ යයි දතයුතුයි.

යලිඳු ශිඛාප්‍රාප්ත වූ විදර්ශනාවෙහි පටන් ගොත්‍රභූ චිත්තය යම්තාක් ද ඒතාක් ඊට අනුරූප වූ අර්ථයෙන් මේ ආර්යශ්‍රාවක තෙම දතයුතුයි. සො ඉදං දුක්ඛන්ති යොනිසො මනසි කරොති යන ආදියෙහි මේ අර්ථ විස්තරයයි.

**චතුසච්ච කම්මට්ඨානික ආර්ය ශ්‍රාවක තෙම**

මේ චතුසච්ච කම්මට්ඨානික ආර්යශ්‍රාවක තෙම තණ්හාව තොරකොට ඇති, ත්‍රෛභූමක බන්ධයෝ දුකයැ. තණ්හාව දුක්ඛ සමුදයයැ.

ඒ දෙදෙනාගේ නොපැවැත්ම නිරෝධයයැ නිරෝධයට පමුණුවන්නේ මාර්ගයයැ. මෙසේ පළමුකොට ඇදුරන් සමීපයේ උගන්නා ලද, චතුසච්ච කම්මට්ඨාන ඇත්තේ පසුකලෙක විදර්ශනා මගට බැසගන්නා ලද්දේ, මේ ත්‍රෛභූමක ඛන්ධයන් මේ දුකයයි නුවණින් මෙනෙහි කරයි. උපාය මාර්ගයන් සිත්හි එලවීමද කෙරෙයි. ඒ එසේමැයි. මෙහි සෝවාන් මාර්ගය යම්තාක් ද ඒතාක් මනසිකාර ශීර්ෂයෙන් විදර්ශනා කියන ලද්දීය. එහි දුකම උපදවන්නා වූ, පහළ කරන්නා වූ යම් තණ්හා කෙනෙක් සමුදය මෙයයි නුවණින් මෙනෙහි කරයි. නිරෝධයට පමුණුවන්නා වූ අරිඅටඟි මග දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව යයි නුවණින් මෙනෙහි කරයි. උපායයෙන් මාර්ගයෙන් සිත්හි එලවීමද කෙරෙයි. විදර්ශනාත් කෙරෙයි. එහි මේ උපාය යයි අභිනිවෙසය නම් සසරෙහි වේ. නිවනෙහි නොමැත.

එබැවින් හෙතෙම මේ ශරීරයෙහි පඨවි ධාතුව ඇත. ආපෝ ධාතුව ඇත යනාදි ක්‍රමයෙන් තම සිරුරෙහි සතර මහාභූතයන් ද ඒ අනුසාරයෙන් උපාදා රූපයන් ද පරිග්‍රහණය කොට මේ රූපස්කන්ධය යයි නිශ්චය කෙරෙයි. එය නිශ්චය කරන්නහුට උපන් තදාලම්බන චිත්ත චෛතසික ධර්මයන් මොවුහු සතර අරූප ස්කන්ධයෝ යයි නිශ්චය කෙරෙයි. අනතුරුව මෙම පඤ්චස්කන්ධය දුක යයි නිශ්චය කෙරෙයි. ඔවුහු වනාහි සැකෙවින් නාමයද රූපයදැයි දෙකොටසක්ම වෙති. මේ නාමරූපයද කරුණු සහිත වූ ප්‍රත්‍ය සහිතව උපදියි.

ඒ නාමරූපයට මේ කරුණුයැ. මේ ප්‍රත්‍යයැයි, අවිජ්ජා-භවතණ්හා-කම්ම-ආහාර ආදි වූ හේතු ප්‍රත්‍යය ව්‍යවස්ථා කෙරෙයි. අනතුරුව ඒ ප්‍රත්‍යයන්ගේද ප්‍රත්‍ය නිසා හටගත් ධර්මයන්ගේද තමාගේද අවිපරීත වූ තමාගේ ස්වභාව ලක්ෂණය පිරිසිඳ දැන, මේ ධර්මයෝ පෙර නොවී, වර්තමානයෙහි වෙත්යයි අනිත්‍ය ලක්ෂණයට ආරෝපණය කෙරෙයි. ඉපදීම, නැසීම දෙකින් පීඩිත වූ හෙයින් දුක්ඛයයි දුක්ඛ ලක්ෂණයට ආරෝපනය කෙරේ. තමාගේ වශයෙහි නොපවත්නා හෙයින් අනාත්ම යයි අනාත්ම ලක්ෂණයට ආරෝපනය කරයි. මෙසේ ත්‍රිලක්ෂණයන්ට ආරෝපනය කොට පිළිවෙලින් විදර්ශනා වඩන්නේ සෝවාන් මගට පැමිණෙයි.

එකෙණෙහිම චතුරාර්ය සත්‍යයන් එක ප්‍රතිවේධයෙන්ම ප්‍රතිවේධ කෙරෙයි. එක අභිසමයෙන්ම අභිසමය (අවබෝධ) කෙරෙයි. දුක්ඛ සත්‍යය

පරිඥඥාත ප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කෙරෙයි. සමුදය සත්‍යය ප්‍රහාණ ප්‍රතිවේධයෙන්ද, නිරෝධ සත්‍යය සාක්‍ෂාත් ක්‍රියා ප්‍රතිවේධයෙන් ද, මාර්ග සත්‍යය භාවනා ප්‍රතිවේධයෙන් ද ප්‍රතිවේධ කරයි.

නැවත දුක්ඛ සත්‍යය පරිඥා අභිසමයෙන් අභිසමය කෙරෙයි. -පෙ- මාර්ග සත්‍යය භාවනා අභිසමයෙන් අභිසමය කෙරෙයි. එතකුදු වුවත් අන්‍යෝන්‍ය ඥානයෙන් අභිසමය නොකෙරෙයි. මෙය එක ඥානයෙන්ම නිරෝධය ආරම්මණ වශයෙන් ද සෙසු සත්‍යයන් කෘත්‍ය වශයෙන් ද ප්‍රතිවෙධ කෙරෙයි. අභිසමය කෙරෙයි. ඔහුට එසමයෙහි මෙබඳු හිතක් නොවේමැයි. මම දුක්ඛ සත්‍යය දනිමියි කියා හෝ -පෙ- මාර්ග සත්‍යය වඩමියි කියා හෝයි. නමුත් එක් කරුණක් ඇත. අරමුණුකොට ප්‍රතිවේධ වශයෙන් නිර්වාණ පසක් කරන්නා වූ ම ඔහුට ඒ ප්‍රතිවේධ ඤාණය, දුක්ඛයාගේ පරිඥ්ඥාණ කෘත්‍යය ද සමුදයාගේ ප්‍රහාණ කෘත්‍යය ද මාර්ගයාගේ භාවනා කෘත්‍ය ද කෙරේමැයි. මෙසේ උපායයෙන් නුවණින් මෙනෙහි කරන්නා වූ ඔහුගේ විංසති වත්ථුක සක්කාය දිට්ඨියද, අට්ඨාදස වත්ථුක විචිකිච්ඡාවද, සීලයෙන් ශුද්ධිය වේයයි ව්‍රතයෙන් ශුද්ධිය වේයයි සීල ව්‍රතයන් පරාමර්ශනය කරන්නා වූ සීලබ්බත පරාමාසය ද යන සංයෝජන තුන ප්‍රහීණ වෙත්යයි කිවයුතුයි.

එහි සතර ආශ්‍රවයින් අතුරෙන්, සක්කාය දිට්ඨි සීලබ්බත පරාමාසයෙන් දිට්ඨි ආශ්‍රවයෙහි සංග්‍රහ කළ හෙයින් ආශ්‍රවයෝ සංයෝජනයෝද වෙති. විචිකිච්ඡාව සංයෝජනම වේ. ආසව නොවෙයි. නැවත, දස්සනා පහාතබ්බ ආසවා යන මෙහි ඇතුළත් බැවින් ආසව වෙත් යයි ද කිවයුතු වේ. ඉමෙ වුච්චති දස්සනා පහාතබ්බා යනුවෙන් සක්කාය දිට්ඨි ආදිහු දස්සනා පහාතබ්බ ආසවයෝ වෙත්යයි දක්වමින් වදාළහ. නැතහොත් ඡන්නං දිට්ඨීනං අඤ්ඤතරා දිට්ඨි උප්පජ්ජන්ති මෙසේ ස්වරූපයෙන්ම සක්කාය දිට්ඨිය විභාග කරන ලද්දේ ද, ඒ සඳහා වදාළහ. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ යනුවෙන්, එයද යම්හෙයකින් සහජාත ප්‍රහාණ කාර්යයන් සමග ප්‍රහීණ වන්නී ද දිට්ඨි ආසව ප්‍රහීණ වන කල්හි ඊට සහජාත වූ හෝ සතර දිට්ඨි සම්පයුත්ත චිත්තයන්හි කාමාසවයද, අවිජ්ජාසවයද ප්‍රහීණ වේද,

පහාණ ඒකාර්ථ වූ සතර චිත්තවිප්පයුත්ත චිත්තයන්හි නාග සුපර්නාදි සමෘද්ධිය ප්‍රාර්ථනා කිරීම් වශයෙන් උපදනා වූ භවාසවයද ඒ

භාම සම්ප්‍රයුක්ත වූ අවිජ්ජාසවයද, දොම්නස් දෙසිත්හි ප්‍රාණාතිපාතය ඇතිකරවන්නා වූ අවිජ්ජාසවයදැයි මෙසේ සර්වප්‍රකාරයෙන්ම අවශේෂ ආශ්‍රව තුනම ප්‍රහීණ වෙත්ද, එහෙයින් බහුවචන නිර්දේශය කරන ලදැයි මෙසේද මෙහි අර්ථය දතයුතු. පොරාණයන්ගේ අදහසකි මෙය.

දසසනා පහාතබබා යන මෙහි දස්සන නම් සෝතාපත්ති මාර්ගයයි. එමගින් පහකළයුතු යන අර්ථයි. කුමක් හෙයින් සෝවාන්මග දස්සන නම් වේද යත්, පළමුකොට නිවන් දක්නා හෙයිනි. ගෝත්‍රභූ සිත පළමුකොට නිවන් දකින්නේ නොවේද, නොදකින්නේ නොවෙයි. දැක කළයුතු කිස නොකරයි. සංයෝජන ප්‍රහීණ නොවූ හෙයිනි. එහෙයින් පසසති යයි නොකිය යුතුයි. යම්කිසි තැනක රජු දැකද පඬුරු දී කාර්ය සිද්ධිය නොවූ හෙයින් අදත් රජු නොදක්මියි කියන ගම්වැසි පුරුෂතෙම මෙහි නිදසුන් වෙයි. මෙසේ දස්සනයෙන් පහාතබබ ආශ්‍රවයන් දක්වා දැන් එයින් අනතුරුව උද්දේස කළ සංවරයෙන් ප්‍රහීණ කළයුතු ආසවයන් දක්වන්ට කතමෙ ච භිකඛවෙ ආසවා සංවරා පහාතබබා යි වදාළහ. මෙසේ සියලු තන්හි සම්බන්ධය දතයුතුය.

මින් මත්තෙහි අර්ථ මාත්‍රයක් පමණක් වර්ණනා කරන්නෙමු. දර්ශනයෙන්ය, භාවනායෙන් ය යන මේ දෙකින් ප්‍රහීණ නොකළ යුතු ආශ්‍රව කෙනෙක් නැත්තේ නොවේද, නැවත කුමක් හෙයින් වෙන්කොට සංවර ආදිය විසින් ප්‍රහීණ කළයුත්තක් දක්වත්ද යත්? සංවර ආදිය විසින් පූර්ව භාගයෙහි විෂ්කම්භනය කරන ලද ආශ්‍රවයෝ සිව්මගින් මුල් සිඳීමට යෙත්ද එහෙයින් ඒ මාර්ගයන්ට පූර්ව භාගයෙහි මේ පස් අයුරින් විෂ්කම්භන ප්‍රහානය දක්වන සේක මෙසේ වදාළහ. එහෙයින් යම් මේ කියන ලද ප්‍රථම මාර්ගයකුත් වේද, එය දර්ශන මාර්ගයමැයි. මෙවිට භාවනා නාමයෙන් තුන්මග කියනු ලබන්නාහුය. ඒ සියලු මාර්ගයන්ට මෝතොමෝ පූර්වභාග ප්‍රතිපදාව යයි දතයුතුයැ.

සංඛා ශබ්දය

එහි ඉධ යනු මේ ශාසනයෙහි පටිසංඛා යනු නුවණින් දැන, එහි මේ සංඛා ශබ්දය, ඤාණ කොට්ඨාස, පඤ්ඤත්ති, ගණන යන අර්ථයන්හි දක්නට ලැබේ.

ඒ මෙසේය.

සංඛායෙකං පටිසේවති යනාදීන්හි ඤාණයෙහි වේ. පපඤ්ච සඤ්ඤා

සංඛා සමුදාචරනති යනාදීන්හි කොටඨාස යන අර්ථයෙහි වේ. න සුකරං සංඛාතුං යනාදීන්හි ගණනෙහිය. මෙහි චනාහි ඤාණයෙහි දතයුතුය. පටිසංඛායොනිසො යන මෙහි උපායෙන් මාර්ගයෙන් ඤාණයෙන් දැන, ප්‍රත්‍යවෙක්ෂා කොට යන අර්ථයි. මෙහිද අසංවරයෙහි ආදීනව දැනීම යොනිසො පටිසංඛා යයි දතයුතුයැ. මෙහි දැක්වෙන නුවණින් මෙනෙහි කිරීම වරං භික්ඛවෙ තත්තාය අයො සලාකාය ආදිත්තා සම්පජ්ජලිතාය සජොතිභූතාය චක්ඛුන්‍ද්‍රියං සම්පලිමට්ඨං නත්වේව චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තගාහො යනාදි ආදිත්ත පරියාය නයින් දතයුතුය. චක්ඛුන්ද්‍රිය සංවර සංවුතො විහරති මෙහි චක්ඛුවම ඉන්ද්‍රිය වූයේ චක්ඛුන්ද්‍රිය නම් වේ. සංවරණය කරන හෙයින් සංවර නම් වේ. වසන හෙයින් අසුරන හෙයින් මෙසේ කියන ලද වෙයි. මෙය 'සතියට' නමකි. චක්ඛුඉන්ද්‍රිය සංවර වූයේ චක්ඛුඉන්ද්‍රිය සංවර නම් වේ. තිත්ථකාක ආවාට කච්ඡප, වනමහිස යනාදීන් මෙනි. නමුත් එහි කිසිවක් ඇත. චක්ඛුඉන්ද්‍රියයේ සංවරයක් හෝ අසංවරයක් හෝ නැත. චක්ඛුප්පසාද රූපය නිසා සිහියක් හෝ මුලා සිහිය හෝ නොම උපදියි.

ඉදින් යම්විටක රූපාරම්මණයක් ඇස හමුවට පැමිණේද එවිට භවාංග සිත දෙවරක් ඉපිද නිරුද්ධ වූ කල්හි ක්‍රියා මනෝධාතුව ආවර්ජන කෘත්‍යය කරමින් ඉපිද නිරුද්ධ වෙයි.

ඉක්බිති, චක්ඛුවිඤ්ඤාණය දර්ශන කෘත්‍යයද නැවත මනෝධාතුව සම්පටිච්ඡන කෘත්‍යද ඉක්බිති විපාක අහේතුක මනෝ විඤ්ඤාණධාතුව සන්තීරණ කෘත්‍යයද සිද්ධ කරමින් ඉපදී නිරුද්ධ වෙයි. ඊට අනතුරුව ජවනයෝ දිවෙති. ඔවුන් අතුරෙහි සංවරයක් හෝ අසංවරයක් හෝ භවාංග සමයෙහි නොමැත. ආවර්ජනාදීන් අතුරෙන් එක්තරා එකක් වන කල්හිද නැත. ජවන මොහොතෙහි ඉදින් දුස්සීල බව හෝ මුලා සිහිය හෝ අඥානය හෝ අක්ෂාන්තිය හෝ කුසීත බව හෝ උපදීද, එවිට අසංවරය වෙයි. මෙසේ ජවන මොහොතෙහි වන අසංවරය චක්ඛුන්ද්‍රියයෙහි අසංවරය යයි කියනු ලැබේ. කුමක් හෙයින් ද යත් යම්හෙයකින් එම අසංවරය ඇතිකල්හි ද්වාරය අගුප්ත වේද, භවාංගයත් ආවර්ජන ආදි වීථි චිත්තයෝත් අගුප්ත වෙත් ද, එහෙයිනි. කුමක් මෙන්ද යත්,

යම්සේ නගරයෙහි දොරටු සතර වැසූ කල්හි කිසිසේත් ඇතුළත ගෙවල් නොවැසුවද සියලු බඩු සුරක්ෂිත සුගෝපිත වූවාහු වෙති. නගර ද්වාරයන් වැසූකල්හි සොරුන් ඇතුල්වීමක් නොමැති බැවිනි.

එපරිද්දෙන් ජවන් සිත්වල සීලාදිය උපන් කල්හි ද්වාරයද වසන ලද වෙයි. භවාංගය ද ආවර්ජන ආදි වීථි චිත්තයෝ ද වසන ලද වෙති. එහෙයින් ජවන ක්‍ෂණයෙහි උපදින චක්‍ඛුඉන්‍ද්‍රිය සංවරයයි කියන ලදී. මෙහි ද සති සංවරය අදහස් කරන ලදැයි දතයුතුය.

චක්‍ඛු ඉන්‍ද්‍රිය සංවරයෙන් සංවර වූයේ චක්‍ඛු ඉන්‍ද්‍රිය සංවර සංවුත නම් වේ. චක්‍ඛු ඉන්‍ද්‍රියාගේ සංවරයට පැමිණියේ යයි කියන ලද්දේ වෙයි. **පාතිමොක්ඛ සංවර සංවුතො** යන මේ පදයට විභංගයෙහි **ඉමිනා පාතිමොක්ඛ සංවර සංවරෙන උපෙතො හොති -පෙ- සමන්නාගතො** යයි වදාරණ ලදී.

එය එක්තැන්කොට චක්‍ඛු ඉන්‍ද්‍රියයාගේ සංවරයෙන් සංවර වූයේ චක්‍ඛුන්‍ද්‍රිය සංවර සංවුත නමැයි මෙසේ අර්ථ දතයුතු වේ. නැතහොත් සංවර කළේනුයි සංවුත නම්. වැසුනේ යයි ද ඇහුරුනේ යයි ද කියන ලද්දේ වෙයි. මෙහි දූ මෙම අර්ථයම අතිශයින් සුන්දර වූයේ වෙයි. එය එසේමැයි. **චක්‍ඛුඉන්‍ද්‍රිය සංවර අසංවුතස්ස විහරතො සංවුතස්ස විහරතො** යන මේ පදයන්හි මේ අර්ථයම දක්නා ලැබේ.

**විහරති** යනු මෙසේ චක්‍ඛු ඉන්‍ද්‍රිය සංවරයෙන් සංවර වූයේ යම්කිසි ඉරියාපථ විහරණයකින් වාසය කෙරෙයි. **යං හිස්ස** යන ආදියෙහි යම් චක්ඛු ඉන්‍ද්‍රිය සංවරයෙන් අසංවර වූයේ, නොවසා නොපියා වාසය කරන්නා වූ ඒ මහණහට යයි මෙසේ අරුත් දතයුතු වේ. නැතහොත් යෙ කාරයට යං ආදේශයයි. හි කාරය පද පූරණ අර්ථයෙහිය. යෙ අස්ස යම් ආශ්‍රවයෙක් තුමූ වන්නීද, ඕහට යන අර්ථයි. **උප්පජ්ජෙය්‍යුං** උපදින්නාහු නම් **ආසවා විඝාත පරිළාහා** යනු සතර ආකාර ආශ්‍රවයෝ ද අන්‍ය වූ විවිධ වූ පීඩාකාරී වූ කෙලෙස් පරිදාහයෝ ද නොහොත් විපාක පරිදාහයෝ ද උපදින්නාහුය.

චක්‍ඛුද්වාරයෙහි අපාථයට පැමිණියා වූ ඉටු අරමුණු කාමාස්වාද වශයෙන් ආස්වාද කරන්නහුට සතුටු වන්නාහුට කාමාසව උපදී. මෙවැනි ඉටු අරමුණ අන්‍ය වූ සුගති භවයක් ලබන්නෙමියි භව ප්‍රාර්ථනාවෙන් එය ආස්වාද කරන්නහුට භවාශ්‍රව උපදියි.

සත්ත්වයා කියා හෝ සත්ත්වයාගේ කියා හෝ ගන්නහුට දිට්ඨි

ආශ්‍රව උපදී. සියල්ලන් සමගම සහජාත වූ නොදැනීම අවිජ්ජාසමයයි. මෙසේ සතරවැදෑරුම් ආශ්‍රවයෝම උපදිත්. ඔවුන් හා සම්පයුත්ත වූ අන්‍ය ක්ලේශයෝ විඝාත පරිලාහ නැතහොත් මත්තෙහි ඔවුන්ගේ විපාකයෝ ද විඝාත පරිලාහ නම් වෙති. ඔවුහුද අසංවරවර වාසය කරන්නහුටම උපදින්නාහු යයි කියනු ලැබෙති.

එවං සතො, යනු එවං අසස තෙ මෙසේ ඕ හට ඒ ආසවයෝ, මෙසේ මේ උපායෙන් නොවෙති. අන් පරිද්දෙකින්ද නොවේ යයි කියන ලද්දේ වෙයි.

**පටිසංඛායොනිසො සොතින්‍ද්‍රිය සංවර සංවුතො** යනාදීන්හිද මේ ක්‍රමයමැයි.

ඉමෙ වුච්චති ආසවා සංවරා පහාතබ්බා මේ සදොරෙහි එකක හතර හතර බැගින් ඇතිවන්නා වූ සූවිසි ආශ්‍රව ධර්මයෝ සංවරයෙන් පහාතබ්බයෝ වෙති. මේ සියලු තන්හිම සති සංවරයම සංවරයයි දතයුතුයැ. **පටිසංඛායොනිසො චීවරං** ආදි තන්හි යමක් කිවයුතු ද ඒ සියල්ල විසුද්ධි මාර්ගයෙහි සීලකථාවෙහි කියන ලද්දේ වෙයි. **යං හිසස** යනු යම් චීවරයක් හෝ පිණ්ඩපාතාදීන් අතුරෙන් එක් ප්‍රත්‍යයක් හෝ සේවනය කරන්නහුට අපපටිසේවතො, මෙසේ නුවණින් සේවනය නොකරන්නහුට සෙස්ස කී අයුරුමැයි. හුදෙක් මෙහි නොලත් චීවර ආදිය ප්‍රාර්ථනා කරන්නහුටද ලත් චීවර ආශ්වාදනය කරන්නහුට ද කාමාසවයාගේ හටගැනීම දතයුතුයැ.

මෙබඳු ආය වූ (තමා ඇලුනු) භවයෙහි, සුගති භවයෙහි ලබන්නෙමැයි භව ප්‍රාර්ථනාවගේ ආස්වාද වශයෙන් භවාසවයාගේ ද, ඇතිවීම දතයුතුයි. මම ලබම්යි කියා හෝ නොලබම්යි කියා හෝ, මේ මගේ යයි කියා හෝ ආත්ම සංඥාව අත්නොහරින්නා වූ දිට්ඨි ආශ්‍රවයාගේ උපත දතයුතුයි. සියල්ලන් හා සමග සහජාත වූයේ අවිජ්ජා ආශ්‍රවයයි. මේ සතර ආශ්‍රවයන්ගේ උත්පත්ති විපාක පරිලාහයෝ ද නව වේදනෝත්පාදයෙන්ම දතයුත්තාහුය. **ඉමෙ වුච්චනති භික්ඛවෙ ආසවා පටිසෙවනා පහාතබ්බා** යනු එක එක ප්‍රත්‍යයෙහි සතරක් කොට මේ සොළොස් ආශ්‍රවයෝ ඥාණසංවර නම් වූ ප්‍රත්‍යවේක්‍ෂා පටිසේවනයෙන් පහකළ යුත්තාහු යයි කියනු ලබති.

**පටිසංඛා යොනිසො ඛමො හොති, සීතසස** යන උපාය මාර්ගයෙන් ප්‍රත්‍යවේක්‍ෂා කොට සීත ඉවසයි. අවීර පුරුෂයෙකු (වීර ගතියෙක් නොමැති)

මෙන් මද පමණ වූ ද සීතෙන් නොසැලෙයි. කම්පා නොවෙයි. කමටහන් මෙනෙහි කෙරෙයි.

## ලෝමසනාග තෙරුන් වහන්සේ

ලෝමසනාග තෙරුන් වහන්සේ මෙන් අනල්ප වූ සීතලෙන් පහස ලද්දේ නොසැලෙයි. කම්පා නොවෙයි. කමටහනම මෙනෙහි කරයි. තෙරුන් වහන්සේ චනාහි සෑගිරියෙහි පූවගු ගුහාවෙහි පධන් වීර්යය කරන්නේ අනතරට්ඨකෙ හිමපාත සමයෙහි, (නවම් මැදින් දෙමස අතර අටදවස, හිමවැටෙන සමය) මේ කාලය තුළ ලෝකාන්තරික නරකයෙහි සීතල ප්‍රත්‍යවෙක්ෂා කොට කමටහන නොහරිමින්ම එළිමහනේ කල්යැවූ සේක. උෂ්ණ කාලය පිළිබඳවද අරුත් යෙදීම දතයුතුය.

යම් මහණ කෙනෙක් වැඩිතරම් වූත් උණුසුම ඉවසාද ඒ ලෝමස නාග තෙරුන් මෙන්ම මේ මහණ තෙමේද උණුසුම ඉවසන්නේ, යයි දතයුතුයැ. තෙරුන් වහන්සේ ග්‍රීෂ්ම කාලයෙහි එසේම පසුබත් කාලයෙහි, බාහිර සක්මනක කමටහන් කරමින් හුන්හ. උන්වහන්සේගේ දෙකිසිල්ලෙන් ඩහදිය මිදෙත්. එවිට උන්වහන්සේගේ අතවැසි තෙමේ මෙසේ කීය. ස්වාමීනි, මෙහි හුන මැනවි. මේ අවකාශය සිසිලය.

තෙරුන් වහන්සේ ඇවැත්නි, උණුසුම් බියෙන්ම මෙහි හුන්නේ නොවෙමි. අවීචිමහ නරකය ප්‍රත්‍යවෙක්ෂා කරමින් හුන්නාහු මිස උණහං යන මෙහිද වහ්නි සන්තාපයම දතයුතුය. සූර්ය සන්තාපයාගේ වශයෙන් මේ වස්තුව කියන ලදී.

යමෙක් දෙතුන්වාරයක් ආහාරපාන නොලබන්නේ ද නොදත් කෙළවර ඇති සසරෙහි තමාගේ තම ප්‍රේත විෂයෙහි උපත ප්‍රත්‍යවෙක්ෂා කොට කම්පා නොවී කමටහන අත්නොහරින්නේමය. අධික වැසි, මැසි මදුරු වාත අව් පහසින් පහස ලබන්නේ ද තමාගේ තිරිසන් යෝනියෙහි උපත් ප්‍රත්‍යවෙක්ෂා කොට කම්පා නොවී කර්මස්ථානය අත් නොහරින්නේමය. සර්ප ජාතින්ගේ පහස ලදුයේ ද නොදත් කෙළවර ඇති සසරෙහි සිංහ ව්‍යාඝ්‍රයන්ගේ මුඛයෙහි නොයෙක් වර පෙර වැටුනු විරූ බව ප්‍රත්‍යවෙක්ෂා කොට නොවෙව්ලමින් කමටහන නොහරනේම වේද, පධානිය තෙරුන් මෙන් මේ මහණ තෙම බඩසාදුක -පෙ- සර්ප ජාතීන්ගේ ස්පර්ශය යන මේවා ඉවසන්නේ මෙයයි දතයුතුයැ.

පධානිය තෙරුන් වහන්සේ

බණ්ඩසේල වෙහෙරෙහි කණිකාර ප්‍රධාන ඝරයෙහි අරියවංස සූත්‍රය ශ්‍රවණය කරන්නා වූ තෙරුන්ව ඝෝර විෂ ඇති සර්පයෙක් දෂ්ට කළේය. තෙරුන් වහන්සේ එය දැනද පහන් සිත් ඇතිව ධර්මයම අසති. තෙරුන් වහන්සේ උපසම්පදා මණ්ඩලය ආදිකොට (උපසම්පදා අවස්ථාවේ සිට සීලය ප්‍රත්‍යවෙක්‍ෂා කොට පිරිසිදු සිල් ඇත්තෙක් වෙමි යයි, ප්‍රීතිය ඉපදවූහ. ප්‍රීතිය ඉපදීම සමගම විෂ නැවතී පෘථුවියට පිවිසියේය. තෙරුන් වහන්සේ එහිදීම සිතෙහි එකඟ බව ලැබ විදසුන් වඩා රහත් බවට පැමිණි සේක.

යමෙක් ආක්‍රෝශ වශයෙන් නපුරුකොට කියන ලද බැවින්ම නපුරු බවට පැමිණියා වූ අන්තිම වස්තුවෙන් කරනු ලබන චෝදනාත් අසා ක්‍ෂාන්ති ගුණයම ප්‍රත්‍යවෙක්‍ෂා කොට කම්පා නොවේ ද දීඝභාණක අභය තෙරුන් මෙන් මේ තෙමේ නපුරුකොට කියන ලද්දා වූ, එහෙයින්ම නපුරු බවට පැමිණියා වූ වචනයන් ඉවසන්නේ වේයයි දතයුතුයැ.

දීඝභාණක අභයතෙරුන් වහන්සේ

මෙම තෙරුන්වහන්සේ වූ කලී ප්‍රත්‍ය සන්තෝෂයෙහි ද භාවනාවෙහි ද ඇලුණු බැවින් මහා අරියවංස ප්‍රතිපදාව වදාළහ. මාගම සියලු ජනතෙම පැමිණියේය. තෙරුන් වහන්සේට මහත් සත්කාර උපනි. එක්තරා මහතෙර කෙනෙක් මෙය ඉවසන්ට නොහැකිව දීඝභාණක තෙමේ අරියවංසය කියන්නේමැයි මුළු රාත්‍රියෙහිම කෝළාහල කෙරෙයි යනාදීන් ආක්‍රෝෂ කළේය. නැවත දෙදෙනා වහන්සේම තම තමන්ගේ විහාරවලට යන්නාහු ගව්වක් පමණ එක මගින්ම ගියාහුය. මුළු ගව්ව තුළම හෙතෙම දීඝභාණක තෙරුන්ට ආක්‍රෝෂ කළේමය. යම් තැනකදී විහාර ද්වාරයට යන්නා වූ මාර්ගය බෙදේ ද එහි සිට දීඝභාණ ස්ථවිරයන් වහන්සේ ඒ මහලු තෙරුන් වැඳ මේ ඔබගේ මාර්ගයයි කීහ. හෙතෙම නොඇසුණාක් මෙන් ගියේය. තෙරුන් වහන්සේ ද විහාරයට ගොස් පා සෝදා වැඩ හුන්හ. එසේ වැඩහුන් තෙරුන් වහන්සේට අතවැසිතෙම කිම ස්වාමීනි, මුළු ගව්වක් තැන් පරිභව කරන්නහුට කිසිවක් නොකීවාහුද? තෙරුන් වහන්සේ, ඇවැත්නි ඉවසීම මට බරෙක් නොවේ. එක් පියවරෙක්හිදු කමටහනින් වෙන් වීමක් නොදකිමියි කීහ. මෙහි වචනයම වචනපථය යයි දතයුතු ය.

ඉවසීමට දුෂ්කර අර්ථයෙන්, දුක් වූ බහලාර්ථයෙන්, තියුණු වූ පරුෂාර්ථයෙන්, කෲර වූ තියුණු අර්ථයෙන්, කටුක වූ අස්සාද විරහිත

අර්ථයෙන් මධුර නොවූ කැමැත්තක් නොමැති හෙයින් අමනාප වූ. ප්‍රාණහරණාර්ථයෙන් ප්‍රාණහර වූ උපන්නා වූ ශාරීරික වේදනාවන් ඉවසන්නේම වේද, කම්පා නොවේද, චිත්තල පබ්බත වාසී පධානිය තෙර මෙබඳු ස්වභාව ඇත්තේ වේ. මෙතෙම චිත්තල පබ්බතවාසි පධානිය තෙර මෙන් උපන්නා වූ -පෙ- ඉවසන ස්වභාව ඇත්තේ යයි දතයුත්තේය.

**සිතුල් පව්වැසි පධානිය තෙර**

රාත්‍රී කාලයේ පධන් වීර්යයෙන් කල්යවා සිටි තෙරුන් වහන්සේට උදරාබාධයක් හටගත්තේය. උන්වහන්සේට එය ඉවසිය නොහැක්කේ එහාට මෙහාට පෙරලෙති. එසේ පෙරලෙන්නා වූ උන්වහන්සේට සක්මන්පස සිටියා වූ පිණ්ඩපාතිය ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ. ඇවැත්ති, ප්‍රව්‍රජ්ජිත නම් ඉවසනසුළු වේයයි. මැනව වහන්සයි නිශ්චලව සයනය කළහ. වාතය තෙම නැබ පටන් ලය තෙක් පැලීය. වේදනාව විෂ්කම්භනය කොට විදර්ශනා වඩන්නාහු මොහොතකින් අනාගාමීව පිරිනිවන්පෑ සේක. යං හිසස යනු සීතාදීන් අතුරෙන් යම්කිසි එක ධර්මයකුදු ඕහට අනධිවාසයතො අධිවාසනය නොකරන්නහුට, නොඉවසන්නහුට, සෙස්ස කී නය මැයි.

මෙහි දී ආශ්‍රවයන්ගේ උපත මෙසේ දතයුතුයැ. සීත ස්පර්ශ වූවහුට උෂ්ණය පතන්නේ කාමාසවය උපදී. සියලු තන්හි මෙසේය. අපට සම්පත්ති භවයෙහි, සුගති භවයෙහි සීත හෝ උෂ්ණය නැතැයි භවය පතන්නහුට භවාසවය උපදී. මගේ සීතය උණුසුමයයි ගන්නහුට දිට්ඨි ආශ්‍රවය ඇතිවෙයි. සියල්ලන් හා සම්ප්‍රයුක්ත අවිජ්ජාසවය ද උපදී යයි ඉමෙ වුච්චනති -පෙ- අධිවාසනා පහාතබ්බා යනු මේ ශීතාදීන් අතුරෙන් එකක හතර බැගින් වූ නොයෙක් ආශ්‍රවයෝ බනති සංවර නම් වූ අධිවාසනයෙන් දුරු කටයුත්තේ යයි කියනු ලැබෙත් යයි යන අර්ථයි.

මෙසේ මේ බනති තොමෝ 'සීත' ආදී ධර්මයන් ඉවසා ද, තමා මතුවෙහි ආරෝපණය කොට වාසය කරන්නේම වේද, නොඉවසන්නේ, ආසවාද නොකරන්නේ වේද, එහෙයින් අධිවාසනා යයි කියනු ලබන බව දත යුතුයැ.

පටිසංඛා යොනිසො චණ්ඩං හත්ථිං පරිවජ්ජෙති යනු මම පැවිද්දෙක් වෙමි. නපුරු වූ ඇතුන් සමීපයෙහි නොසිටිය යුතුයි. ඒ හේතුවෙන්

මරණයත් මරණයට සමාන දුකකුත් වන්නේ ද, මෙසේ උපායෙන් මාර්ගයෙන් ප්‍රත්‍යවේක්ෂා කොට නපුරු වූ ඇතාගෙන් වෙන්වේද, නික්ම යේද, සියලු තන්හි මෙම ක්‍රමය මැයි. චණ්ඩං නපුරු නොහික්මුණු යයි කියන ලද්දේ වෙයි. ඛාණු යනු කිහිරි කණු ආදිය. කණ්ටකාධානං කටු පිහිටි තැන්, යම්තැනක කටු පිහිටියේ වෙයිද ඒ අවකාශයයි කියන ලද වෙයි. සොබ්භං යනු හැම පසින්ම ඉවුරු බිඳී ඇති, පපාතං යනු එක පසකින් බුන් ඉවුරු ඇති. චන්දනිකං, ඉඳුල් වතුර ගැබ්මල ආදිය දමන තැන. ඔලිගල්ලං ඒ මඩ ආදියම ගලාබස්නා තැන. එහි දනක් පමණ අශුචියෙන් පිරුනේ වෙයි. මේ දෙතැනම අමනුෂ්‍යයන්ගෙන් දූෂිත වූවාහු වෙති. අනාසන මෙහි නොසුදුසු අසුන අනාසන නම් වෙති. එය අර්ථ වශයෙන් අනියත ආපත්තියට වස්තු වූ රහසිගත වැසුනු ආයතනයයි දත යුතුයැ. අගොචරො, මෙහි නොසුදුසු ගෝචරය අගෝචර නම් වේ. එය 'වෙසිය' ආදී භේද වශයේ පස්ආකාර වේ. පාපකෙ මිත්තෙ යනු ලාමක වූ දුශ්ශීල වූ මිත්‍ර ප්‍රතිරූපක වූ අමිත්‍රයෝයි. භජන්තං සේවනය කරන්නහු. විඤ්ඤූ බ්‍රහමචාරී පණ්ඩිත වූ බුද්ධිසම්පන්න වූ සබ්‍රහ්මචාරීහුය. මේ භික්ෂූන්ට විශිෂ්ට නමකි. ඒ භික්ෂූහු එකකර්මය, එකුද්දේසය සමානව හැසිරෙත්නුයි සබ්‍රහ්මචාරීයයි කියනු ලැබෙත්. පාපකෙ ඨානෙසු ලාමක තැන්වල, ඔකප්පෙය්‍යුං යනු ඒකාන්තයෙන් මේ ආයුෂ්මත් තෙම කළේයයි හෝ කරන්නේ යයි හෝ අදහන්නාහු ද, නිගමනයකට පැමිණෙන්නාහුද වෙති. යං භිසස යනු හස්ති ආදීන් අතුරෙන් යම්කිසි එකෙකු වේද, ඕහට, සෙස්ස කීනය මැයි. මෙහි ආසවයන්ගේ උපත මෙසේ දතයුත්තේය. හස්ති ආදීන් හේතුකොට දුකින් පෙලුනහුගේ සැප ප්‍රාර්ථනා කරන්නේ කාමාසව උපදී. අපට සම්පත්ති භවයෙහි සුගති භවයෙහි මෙබඳු දුකක් නැතැයි භවය ප්‍රාර්ථනා කරන්නහුට භවාසවයද, මා ඇතෙක් මඩී, මා ඇතෙක් මඩී යයි ගැනීම දිට්ඨි ආසවයයි. සියල්ලන් සමග සම්ප්‍රයුක්ත වූයේ අවිජ්ජාසව වේයයි ඉමෙ වුච්චන්ති -පෙ- පරිවජ්ජනා පහාතබ්බා යන මේ ඇත් ආදීන් අතුරෙන් එකක් එකක් පාසා සතර සතර බැගින් නොයෙක් ආසවයෝ මේ සීල සංවර නම් වූ පරිවජ්ජනයෙන් පහකළ යුත්තාහු යයි කියන ලද්දාහු වෙත් යයි දතයුත්තේය.

පටිසංඛායොනිසො උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති මේ කරුණින් ද මේ විතර්කය අකුසලය. මේ කරුණින් දුක්ඛ විපාකය. එය වනාහි තමහට දුක් පිණිස පවතී යයි මේ ක්‍රමයෙන් නුවණින් කාම විතක්කයෝ ආදීනව ප්‍රත්‍යවේක්ෂා කොට ඒ ඒ අරමුණෙහි උපන් හටගත්

පහළ වූ කාම විතක්කය නො ඉවසයි. සිතට නංවාගෙන වාසය නො කරවයි. අභ්‍යන්තරයෙහි හෝ වාසය නො කරවයි යන අර්ථයි.

නො ඉවසන්නේ කුමක් කෙරේද? දුරුකරයි හැරදමයි. කුඩයකින් කසල ඉවත් කරන්නාක් මෙන් නොවේ. සංසිඳුවයි. පෙළයි. විදියි. බැහැර කරයි. කෙවිටකින් ගවයෙකු මෙන් නොවේ. නමුත් ඒ විතර්කය විනාශ කරයි. පහවූ අන්තය ඇත්තක් කරයි. යම්සේ ඇතුළතද යටත් පිරිසෙන් ඔහුගේ භවාංග මාත්‍රයකුදු ඉතුරු නොවේ ද එය එපරිද්දෙන් කෙරෙයි. කෙසේනම් එය එසේ කෙරේ ද යත්, අනභාවං ගමෙති යනු අනුක්‍රමයෙන් අභාවයට පමුණුවයි. විකඛම්භන ප්‍රහාණයෙන් මනාව වික්ඛම්භනය කෙරේද, එපරිද්දෙන් කරන ලද්දේ යයි කියන ලද්දේය. ව්‍යාපාද, විහිංසා විතර්කයන්හිද මේ ක්‍රමයමැයි. මෙහිදු කාම විතර්කය යනු **යො කාමපටිසංයුතෙතා තකෙකා විතකෙකා මිචඡා සංකපෙපා** යයි විභංගයෙහි වදාරණ ලද්දේය. අනෙක් තන්හිද මේ විධි ක්‍රමයමැයි.

**උපපනනුපපනෙන** යනු උපන් උපන් ඇසිල්ලක් ඇත්තවුන්ම කියන ලද්දේ වෙයි. නැතහොත් වරක් උපන් විතර්කයන් දුරුකොට දෙවන වාරයේ දී මධ්‍යස්ථ වන්නේ නොවෙයි. සියවරක් වුව ද උපනුපන් විතර්ක දුරු කෙරේමය. **පාපකෙ අකුසලෙ** යනු ලාමක අරුතින් පාපක වූ, මෝහයෙන් මුලා වූ අරුතින් අකුසල වූ **ධමෙම** යනු ඒ කාම විතර්ක ආදියම නැතහොත් සියලුම නවමහා විතර්කයෝ.

නවමහා විතර්ක මොවුන් අතුරෙන් තිදෙනෙක් කියන ලද්දාහුමය. සෙස්සෝ, **ඤාති විතකක, ජනපද විතකක, අමර විතකක, පරානුද්දයතා පටිසංයුතත විතකක, ලාභ සකකාර පටිසංයුතත විතකක, අවඤ්ඤතති පටිසංයුතත විතකක** යන මේ සය දෙන වෙති.

**යං හිසස** යන මේ විතර්කයන් අතුරෙන් කිසිවක් ඔහුට වේ. සෙස්ස කී ක්‍රමයෙන්ම සිදුවේ. මෙහි කාම විතර්කය නම් කාමාසවයයි. එයින් විශේෂ වූයේ භවාසවයයි. එහි සම්පයුත්ත වූයේ දිට්ඨි ආසවයයි. සියලු විතර්කයන්හි අවිජ්ජාව අවිජ්ජාසව නම් වේ. මෙසේ ආසවයන්ගේ උපත දතයුතුයැ. **ඉමෙ වුචචනති -පෙ- විනොදනා පහාතබබා** යන මේ කාම විතක්ක ආදීන්ගේ වශයෙන් කියන ලද ආශ්‍රවයෝ ඒ ඒ විතර්කයෙහි ආදීනව ප්‍රත්‍යවේක්ෂා කිරීම් සහිත වූ මේ 'විරිය' සංවර නම් වූ විනෝදනයෙන් පහකට යුත්තාහු යයි දතයුත්තාහුය.

Scanned with CamScanner

පටිසංඛා යොනිසො සති සම්බොජ්ඣංගං භාවෙති යනුවෙන් භාවනා නොකිරීමේ ආදීනව ද භාවනාවගේ ආනිශංස ද, උපායෙන් මාර්ගයෙන් ප්‍රත්‍යවේක්ෂා කොට සති සම්බොජ්ඣංගය වඩයි. සියලු තන්හි මෙම ක්‍රමය මැයි. ඉදින් මෙහි මතු මාර්ග තුන ලැබෙන සමයෙහි උපන්නා වූ ලෝකෝත්තර බොජ්ඣංගයෝම අදහස් කරන ලද්දාහුය. එතකුදු වුවත් ආදි කම්මිකයන්ගේ බොජ්ඣංග විෂයෙහි මුලා නොවීම පිණිස ලෞකික ලෝකෝත්තර මිශ්‍ර වූ නයින් ඔවුන්ගේ අර්ථ වර්ණනාව කරන්නෙමි. මෙහි වනාහි ලෞකික නය හැර, ලෝකෝත්තර නයම ගතයුත්තේය. සති සම්බොජ්ඣංගං යනාදි ක්‍රමයෙන් වදාරණ ලද්දා වූ මුල් පදයන් සත්දෙනාගෙන් පළමුකොට

බොජ්ඣංග වණ්ණනා

අත්ථතො ලක්ඛණ දීහි කමතොච විනිච්ඡයො
අනූනාධි කතො චෙව විඤ්ඤාතබ්බො විභාවිනො

(නැණවතුන් විසින් අරුත් වශයෙන් ද ලක්ෂණාදීන්ගේ වශයෙන් ද අනූනාධික වශයෙන් ද විනිශ්චය දතයුතුය.)

සති සම්බොජ්ඣංගය

එහි පළමුකොට සති සම්බොජ්ඣංගයෙහි සිහි කිරීම් අර්ථයෙන් සති නම් වේ. සතිය තොමෝ එළඹ සිටීම ලක්ෂණකොට ඇත්තේය. අපිලාපනය (මතුකර පෙන්වීම) ලක්ෂණකොට ඇත්තේ හෝ වෙයි. මෙසේ කියන ලද්දේ වෙයි. යථා මහාරාජ, රඤ්ඤො භාණ්ඩාගාරිකො රඤ්ඤො සාපතෙය්‍යං, අපිලාපෙති, එත්තකං මහාරාජ හිරඤ්ඤං එත්තකං සුවණ්ණං එත්තකං සාපතෙය්‍යනති, එව මෙව ඛො මහාරාජ සති උප්පජ්ජමානා කුසලා කුසල සාවජ්ජානවජ්ජ හීනප්පණීත, කණ්හ සුක්ක සප්පටිභාගෙ ධම්මෙ අපිලාපෙති ඉමෙ චත්තාරො සතිපට්ඨානාති

(මහරජ, රජුගේ භාණ්ඩාගාරික තෙමේ රජුගේ සම්පත්තිය යම්සේ සිහි කරවා ද, මහරජ, අමුරන් මෙපමණය රත්තරන් මෙපමණය. සෙසු ධනය මෙපමණ යයි එපරිද්දෙන් මහරජ, සතිය තොමෝ උපදවන්නී, කුසලා කුසල සාවද්‍ය අනවද්‍ය හීන ප්‍රණීත කණ්හ සුක්ක සප්පටිභාග ධර්මයන් සිහිකරවයි. මොවුහු සතර සතිපට්ඨානයෝයි.) යනු විස්තරයයි. අපිලාපන රසයයි. කෘත්‍ය වශයෙන්ම මේ සතියගේ අපිලාපන ලක්ෂණයයි. තෙරුන් විසින් කියන ලද්දේය. මුලා නොවීම රසයයි. ගෝචරයෙහි අභිමුඛ බව පච්චුපට්ඨාන යයි. (වැහෙන ආකාරයයි) සතියම බොජ්ඣංග වූයේ සති සම්බොජ්ඣංග නම් වේ. බෝධිය පිණිස පවත්නා ධර්ම

සමූහයාගේ හෝ බෝධිය නම් වූ ආර්ය ශ්‍රාවකයාගේ අංගනුයි. බොජ්ඣංග නම් වේ.

මෙහි කුමක් කියන ලද්දේ ද යත්? ලෞකික ලෝකෝත්තර, මාර්ගක්‍ෂණයෙහි උපදින්නා වූ ලීන-උද්ධච්ච-පතිට්ඨාන-ආයූහන-කාමසුඛ අත්තකිලමථානුයෝග-උච්ඡෙද-සස්සත දිට්ඨි යන මොවුන්ට ඇතුලත්වීම් ආදි වූ නොයෙක් උපද්‍රවයන්ට ප්‍රතිපක්‍ෂ වූ, යම් මේ ධර්ම සමූහයක් වේද, සති-ධම්මවිචය-විරිය-පීති-පස්සද්ධි-සමාධි-උපෙක්ඛා නම් වූ යම් ධර්ම සමූහයක එකතුවකින් ධර්මාවබෝධය වන නිසා මෙයට බොධි යයි කියනු ලැබේ.

බුජ්ඣතී යන්නෙන් කිලෙස සන්තාන නිද්‍රාවෙන් නැගී සිටියි. චතුරාර්ය සත්‍ය හෝ ප්‍රතිවේධ කෙරෙයි. නිර්වාණය හෝ සාක්‍ෂාත් කෙරේ යයි කියන ලද්දේ වෙයි. මෙසේ වදාළහ.

සත්ත බොජ්ඣංගෙ භාවෙත්වා අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධො යනුවෙන් ඒ ධර්මයන්ගේ එකතුව නම් වූ බෝධියගේ එකතුව වේනුයි බොජ්ඣංග නම් වේ. සේනාංග රථංග යනාදීන් මෙනි. එහෙයින් අර්ථකථාචාර්යවරයෝ කීහ. බුජ්ඣනස්ස, පුග්ගලස්ස අංගාති වා බොජ්ඣංගා යනුවෙන් (අවබෝධ කරන පුද්ගලයාගේ අංගනුයි බොජ්ඣංග නම් වෙති.)

තව ද බොජ්ඣගාති කෙනට්ඨෙන බොජ්ඣංගා බොධාය සංවත්තන්තීති බොජ්ඣංගා, බුජ්ඣන්තීති බොජ්ඣංග අනුබුජ්ඣන්තීති බොජ්ඣංගා පටි බුජ්ඣන්තීති බොජ්ඣංගා

(බොජ්ඣංග යනු කවර අර්ථයකින් බොජ්ඣංග නම් වෙත්ද? අවබෝධය පිණිස පවතිත් නුයි බොජ්ඣංග නම් වේ. අවබෝධ කෙරෙත්නුයි බොජ්ඣංග නම් වේ. අනුබෝධ කෙරෙත්නුයි බොජ්ඣංග නම් වේ. ප්‍රතිබෝධ කෙරෙත්නුයි බොජ්ඣංග නම් වේ. මනාකොට අවබෝධ කෙරෙත්නුයි බොජ්ඣංග නම් වේ. යනාදී වූ පටිසම්භිදා මග්ග නයින් ද බොජ්ඣංගාර්ථය දතයුතුය.

ප්‍රශස්ත වූ සුන්දර වූ බොජ්ඣංගය සම්බොජ්ඣංග නම් වේ. මෙසේ සතියම බොජ්ඣංග වූයේ සති සම්බොජ්ඣංග නම් වේ. ඒ සති

සම්බොජ්ඣංගයයි, මෙසේ පළමුකොට මෙසේ එක් එක් ආදි පදයක්හුගේ අරුත් වශයෙන් ලක්‍ෂණාදීන්ගේ වශයෙන් ද විනිශ්චය දතයුත්තේය.

දෙවන බොජ්ඣංග ධර්මයෙහි චතුරාර්ය සත්‍ය ධර්මයන් පරීක්‍ෂා කෙරේනුයි ධම්මවිචය නම් වේ. එය විශේෂ එකතුව 'පවිචය' ලක්‍ෂණ කොට ඇත්තේය. ඔභාසනය (=විෂය බබුලුවීම) රසයකොට ඇත්තේය.

වීරයාගේ ස්වභාවය හෙයින් ද, විධි වූ පරිද්දෙන් පැවැත්විය යුතු හෙයින් ද විරිය නම් වේ. එය දැඩිකොට ගැනීම ලක්‍ෂණකොට ඇත්තේය. නොපසුබැසීම පච්චුපට්ඨාන කොට ඇත්තේය.

පිනවානුයි පීතිනම් වේ. ඕතොමෝ ඵරණය (පැතිරීම) ලක්‍ෂණ කොට ඇත්තීය. සතුටුවීම ලක්‍ෂණකොට ඇත්තිද වන්නීය. කාය චිත්ත පිනවීම රසයකොට ඇත්තීය. ඔවුන්ගේම ඔදවැඩි බව පච්චුපට්ඨාන කොට ඇත්තීය.

කාය චිත්ත දරථයන් සංසිඳුවන හෙයින් පස්සද්ධි නම් වේ. ඕතොමෝ උපසමය (=සංසුන්කම) ලක්‍ෂණකොට ඇත්තීය. කාය චිත්තයන්ගේ නොසෙල්වීම වූ සිහිල්භාවය පච්චුපට්ඨානය කොට ඇත්තීය.

මනාකොට සිත පිහිටවන හෙයින් සමාධි නම් වේ. එය නොවිසුරුණු බව ලක්‍ෂණකොට ඇත්තේය. එකග්‍රබව ලක්‍ෂණකොට ඇත්තේ හෝ වෙයි. චිත්ත චෛතසිකයන්ගේ සම්පිණ්ඩනය එහි රසයයි. චිත්තයාගේ ස්ථිතිභාවය එහි පච්චුපට්ඨානයයි.

මධ්‍යස්ථව බලනහෙයින් උපෙක්ඛා නම් වෙයි. ඕ තොමෝ පටිසංඛානය (මැදහත් බැව්හි සිත පිහිටවීම) ලක්‍ෂණකොට ඇත්තීය. සමවාහිත (එක් වූ) ලක්‍ෂණ ඇත්තී හෝ වෙයි. ඌනාධික ධර්මයන්ගේ නිවාරණය රසය කොට ඇත්තීය. පක්‍ෂපාත බව සිඳීම් සංඛ්‍යාත රසය හෝ වන්නීය. මැදහත්බව පච්චුපට්ඨාන නම් වන්නීය. සෙස්ස කී අයුරුම වන්නීය. මෙසේ සෙසු පදයන්ගේ ද අර්ථ වශයෙන් ද ලක්‍ෂණාදීන්ගේ වශයෙන් ද විනිශ්චය දතයුත්තීය.

ක්‍රම වශයෙන් මෙහිද සතිඤ්ච ඛ්වාහං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමි යයි වදාළ බැවින් ඒ අනුව සෙසු සියලු බොජ්ඣංග ධර්මයන්ට සතිය උපකාර බැවින් සතිසම්බොජ්ඣංග ධර්මයන්ට සතිය උපකාර බැවින්

සතිසමෙබාජ්ඣගය පළමුව කියන ලදී. එයින් මත්තෙහි තථා සතො විහරනෙතා තං ධමමං පඤ්ඤාය පවිචිනති යනාදී නයින් සෙසු බොජ්ඣංග ධර්මයන්ගේ ද පෙරපසුකොට කීමෙහි ප්‍රයෝජනය සූත්‍රයෙහිම වදාරණ ලදී. මෙසේ මෙහි දේශනා ක්‍රම වශයෙන් ද විනිශ්චය දතයුතුය.

අඩු වැඩි නැතිව භාග්‍යවතුන් වහන්සේ කුමක් හෙයින් බොජ්ඣංග ධර්ම හතක්ම වදාරණ ලද්දාහුද? ලීන හා උද්ධච්චයට ප්‍රතිපක්ෂ බැවින් හතක්ම වදාරණ ලදී. ඒ මෙසේය. මෙහි බොජ්ඣංගයෝ කී දෙනෙක් ලීනයට ප්‍රතිවිරුද්ධ වෙත්ද? එබැවින් වදාළහ. **යසමිඤ්ච බො භිකඛවෙ සමයෙ ලීනං චිතතං හොති. කාලො තසමිං සමයෙ ධමම විචය බොජ්ඣංගසස භාවනාය, කාලො විරිය බොජ්ඣංගසස භාවනාය කාලො පීති බොජ්ඣංගසස භාවනාය**

(මහණෙනි, යම්කලෙක කුසීත බැවින් හැකිළුණු සිතක් වේද, එසමයෙහි ධම්මවිචය බොජ්ඣංගය වැඩීමට සුදුසු වෙයි. විරිය සමෙබාජ්ඣංගය වැඩීමට සුදුසු වෙයි. විරිය සමෙබාජ්ඣංය වැඩීමට කල්වෙයි. පීති සමෙබාජ්ඣංගය වැඩීමට කල්වෙයි.)

තිදෙනෙක් උද්ධච්චයට ප්‍රතිපක්ෂ වෙති. එහෙයින් වදාළහ. **යසමිඤ්ච බො භිකඛවෙ සමයෙ උද්ධතං චිතතං හොති කාලො තසමිං සමයෙ පසසද්ධි සමෙබාජ්ඣංගසස භාවනාය කාලො සමාධි සමෙබාජ්ඣංගසස භාවනාය කාලො උපෙකඛා සමෙබාජ්ඣංගසස භාවනාය**

(මහණෙනි, යම්කලෙක උද්ධත වූ සිත වේද, එසමයෙහි සමාධි සමෙබාජ්ඣංගය වැඩීමට කාලය වෙයි. උපෙකඛා සමෙබාජ්ඣංගය වැඩීමට කාලය වෙයි.)

එක් බොජ්ඣංග ධර්මයක් මෙහි සබ්බත්ථික වේ. එය මෙසේ වදාළහ. **සතිඤ්ච ඛවාහං භිකඛවෙ සබ්බත්ථිකං වදාමි** මෙහි සබ්බත්ථක යයි ද පාඨයකි. දෙතැන්හිම සියලු තන්හි කැමතිවිය යුතුය යන අරුතම ලැබෙයි. මෙසේ හෙයින් ලීන උද්ධච්ච දෙකට ප්‍රතිපක්ෂ හෙයින්ද සතිය සබ්බත්ථික හෙයින් බොජ්ඣංග සතක්ම අඩුවැඩි නැතිව වදාරණ ලද බව දතයුතුය.

මෙසේ පළමුකොට සති සමෙබාජ්ඣංග යනාදි නයින් කියන ලද සත්ත පදයන්ගේම අර්ථ වර්ණනාව දැන, දැන් භාවෙති විවෙක නිසසිතං

යනාදියෙහි අර්ථ වර්ණනාව මෙසේ දතයුත්තීය. භාවෙති, වඩයි. තමාගේ චිත්ත සන්තානයෙහි නැවත නැවත උපදවයි පහළ කරවයි යන අර්ථයයි. විවේකය ඇසුරු කෙළේනුයි විවේක නිසසත නම් වේ. විවෙකය යනු වෙන් වූ බවයි. එම විවේකය තදංග විවේකය විකඛමහන විවේකය සමුචෙඡද විවේකය, පටිපපසසදධි විවේකය, නිසසරණ විවේකය යයි පස්අයුරු වේ. ඔවුන්ගේ නානත්වය අරිය ධමෙම අවිනීතො යන මෙහි කී නියායෙන්ම දතයුතුයැ.

එසේම එම විවේකයම එහි විනය යයි වදාරණ ලද්දේය. මෙසේ මේ පංචවිධ විවේකයෙහි විවෙක නිසසිතං යනු තදංග විවෙක නිසසිත වූ ද, සමුචෙඡද විවෙක නිසසිත වූ ද, නිසසරණ විවෙක නිසසිත වූ ද, සති සමෙබාජඣංගය වඩයි යන මේ අර්ථය දතයුතුය.

එසේම මෙම බොජ්ඣංග භාවනාවෙහි යෙදුන යෝගී තෙම විදර්ශනා මොහොතෙහි කෘත්‍ය වශයෙන් තදංග විවේක නිසසිත වූ ද, අධ්‍යාසය වශයෙන් සමුචෙඡද විවේක නිසසිත වූ ද ආලම්බන වශයෙන් නිසසරණ විවෙක නිසසිත වූ ද සති සමෙබාජඣංගය වඩයි.

පංචවිධ විවේක නිසසිත වූහ යයි කිසියම් ආචාර්ය කෙනෙක් කියති. ඔවුහු හුදු බලවත් විදර්ශනා මාර්ග-ඵල ක්‍ෂණයෙහිම බොජ්ඣංගයන් උද්ධරණය නොකෙරෙත්. විදර්ශනා පාදක, කසිණ-ධ්‍යාන, අනාපාන-අශුභ-බ්‍රහ්මවිහාර ධ්‍යානයන්හිම උද්ධිරණය කෙරෙත්. අර්ථකථාචාර්යයන් විසින් නොද වලකන ලදහ. එහෙයින් ඔවුන්ගේ මතයෙහි මෙම ධ්‍යානයන්ගේ ප්‍රවෘත්ති ක්‍ෂණයෙහි කෘත්‍ය වශයෙන්ම විෂ්කම්භන විවේක නිස්සිත වෙයි.

වොසසගග දවිධ වෙයි. පරිච්චාග වොසසගගය පකඛනදන වොසසගගය යනුවෙනි. ඔවුන් අතුරෙහි පරිච්චාග වොසසංගය යනු තදංග වශයෙන් විදර්ශනා මොහොතෙහි ද සමුචෙඡද වශයෙන් මාර්ග අවස්ථාවෙහි ද ක්ලේශයන්ගේ ප්‍රහාණයයි. පකඛනදන වොසසගගය යනු විදර්ශනා අවස්ථාවෙහි එයට නැමුනු බැවින් ද මාර්ග අවස්ථාවෙහි අරමුණු කිරීමෙන් ද 'නිවන' පකඛනදනයයි ඒ දෙකම ලෞකික ලෝකෝත්තර මිශ්‍ර අරුත් වැනුම් ක්‍රමයකට සුදුසුය. එබැවින් මේ සති සමෙබොජ්ඣංගයම උක්තිප්‍රකාරයෙන් ක්ලේශයන් පරිත්‍යාග කෙරෙයි.

දුරලයි. නිවනට පනියි. වොසසගග පරිනාමිං ය මේ සියලු වචනයෙන්ම නිවන පිණිස පිරිනමන්නා වූ පිරිනමන ලද්දා වූද යන අර්ථයෙන් කියන ලදී. මුහුකුරා යන්නා වූ ද මුහුකුරා ගියා වූ ද යන මෙය කියන ලද්දේ වෙයි. කරුණු එසේ හෙයින් මේ බොජ්ඣංග භාවනාවෙහි යෙදුනා වූ මහණතෙම යම්සේ සති සම්බොජ්ඣංගය, කෙලෙස් පරිත්‍යාගය වොසසගය පිණිසත් නිබබාන පකඛන්දන වොසසගය පිණිසත් මෝරා යේද, යම්සේ මුහුකුරුවන ලද්දේ වේද, එසේ එය වඩාලයි. සෙසු බොජ්ඣංග ධර්මයන්ද මේ ක්‍රමයමැයි.

මෙහි වූ කලී නිර්වාණය සියලු සංඛත ධර්මයන්ගෙන් වෙන් වූ බැවින් විවෙක නම්. සියල්ලන්ගෙන් විරාග බැවින් විරාග නම් වේ. නිරොධ බැවින් නිරොධ නම් වේ යයි කියන ලදී. මාර්ගයම වොසසගග පරිණාම නම් වේ. එහෙයින් විවේකය අරමුණුකොට පැවැත්මෙන් විවෙක නිසසිත වූ එසේම විරාගය හා නිරොධ නිසසිත වූ සති සමෙබාජඣංගය වඩයි. එය වනාහි ආර්ය මාර්ග මොහොතෙහි පැවතුනා වූ ක්ලේශයන්ගේ සමුචෙඡද වශයෙන් පරිත්‍යාග භාවයෙන් ද නිවන පකඛඤන භාවයෙන්ද පිරිනමන ලද මුහුකුරුවන ලද යන මේ අර්ථයම දතයුතුය. සෙසු බොජ්ඣංග ධර්ම පිළිබඳවද මෙම ක්‍රමයම වේ.

යං හිසස මෙම බොජඣංගයන් අතුරෙන් කිසිවක් ඕ හට යන අර්ථයයි. සෙස්ස කී අයුරින්ම වේ ආසවයන්ගේ උපතෙහි මෙහි මතු තුන්වන හා සම්ප්‍රයුක්ත වූ බොජ්ඣංගයන් නොවැඩූ බැවින්, කාමාසව, භවාසව, අවිජ්ජාසව යන මේ ආසවයෝ තිදෙනෙක් උපදනාහුද බොජ්ඣංග භාවනාව වඩන්නා වූ ඕහට මෙසේ ඒ ආසවයෝ නොවෙත් යන මේ ක්‍රමය දතයුතු වේ. ඉමෙ වුචචනති -පෙ- භාවනා පහාතබබා යනුවෙන් මෙම ආසවයෝ තිදෙන තුන්මග සම්පයුක්ත වූ මේ බොජ්ඣංග භාවනාවෙන් පහකට යුත්තාහු යයි කියනු ලබන බව දතයුත්තාහුය.

දැන් මේ සත් අයුරකින් දුරුකළ ආසව ඇති භික්‍ෂුවට ස්තුති කරන්නේ, ආසව නැති කිරීමෙහි ආනිශංස දක්වන්නේ මේ කරුණින්ම සත්ත්වයන් ආසව දුරුකිරීමෙහි යොදවන්නේ යතො බො භිකඛවෙ -පෙ- අනතමකාසි දුකඛසස යයි වදාළහ.

එහි යතො බො යනු සාමි වචනයෙහි තො කාරයයි. යසස බො යමෙකුගේ වනාහි යයි කියන ලද්දේ වෙයි. පොරාණයෝ වනාහි යමහි

කාලෙ යම් කලෙක යයි වර්ණනා කෙරෙත්. යො ආසවා දස්සනා යනු යම් ආශ්‍රව කෙනෙක් දර්ශනයෙන්, පහකටයුත්තාහු ද ඔවුහු දර්ශනයෙන්ම ප්‍රහීණ වූවාහු වෙත් ද, ප්‍රහීණ නොවූ කල්හිම ප්‍රහීණ වූයේ යන සංඥා ඇත්තේ නොවේ ද සියලු තන්හි විස්තරය මෙසේය.

සබ්බාසව සංවර සංවුතො යනු සියලු ආසවයන් පියනකින් වසන ලද්දේ නැතහොත් සියලු ආසව පියනින් වසන ලද්දේ, අච්ඡෙච්ඡි තණ්හං යනු සියලු තණ්හාව සින්දේය. හොඳටම සින්දේය. මුල් සහිතව සින්දේය. වාවත්තයි සංයෝජනං යනු දසවිධ සංයෝජනය් පරිවර්තනය කළේය. මුල් රහිත කළේය. සම්මා හේතුවෙන් කාරණයෙන් මානාභි සමයා දස්සනාභි සමයෙන් ද, පහානාභි සමයෙන් ද, රහත්මග කෘත්‍ය වශයෙන් මානය දකී. මේ ඔහුගේ දස්සනාභි සමයයි. දිට්ඨ විසෙන් දිට්ඨ සත්ත්වයෙකුගේ ජීවිතය මෙන් ප්‍රහීණ වෙයි. මේ ඔහුගේ ප්‍රහීණාභි සමයයි. අන්තමකාසි දුක්ඛස්ස යනු රහත් මගින් මානය දුටු හෙයින් ද ප්‍රහීණ වූ හෙයින් ද, කාය බන්ධනස්ස අන්තො ජීරති හරිත්තතං වා යයි මෙසේ කියන ලද අන්තිම මරියාදාන්තය ද, අන්ත මිදං භික්ඛවෙ ජීවිතානං යයි මෙසේ කියන ලද ලාමක අන්තය ද, සක්කායො එකො අන්තො යයි මෙසේ කියන ලද කොට්ඨාස අන්තයද එසෙවන්තො දුක්ඛස්ස සබ්බ පච්චය සංඛයා යයි මෙසේ කියන ලද අන්තයද යන මේ සතර අන්ත කෙනෙක් වෙත්ද, ඔවුන් අතුරෙන් සියලුම වට්ට දුක්ඛයාගේ සතරවන කෙළවර නම් වූ අන්තය දුරු කළේය. පරිච්ඡේදය හාත්පසින් වට කළේය. දුක්ඛයේ අන්තිම ශරීරය පමණක් අවශේෂ කොට ඇතිවූවක් කළේ යයි කියන ලද්දේ වෙයි.

අත්ත මනා තෙ භික්ඛු යනු සතුටට පත් ප්‍රීතියෙන් හා සොම්නසින් යුක්ත වූ සිත් ඇති ඒ භික්ෂූහු භගවතො භාසිතං අභිනන්දුං යනු මේ දුක් කෙළවර කිරීම් අන්තකොට ඇති. භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය මනාව කියන ලද්දකි. මනාව දේශනා කරන ලද්දකි. භාග්‍යවතුන් වහන්ස, එය එසේමය. සුගතයන් වහන්ස, එය එසේම යයි මුදුනින් පිළිගනිමින් අනුමෝදන් වූහ. මෙහි අවශේෂ යමක් නොකියන ලද්දේ ද එය කලින් නොකියන ලදී. එබැවින් සියල්ල කී අනුසාරයෙන් පදයක් පාසා සිහි කටයුතුයැ.

සබ්බාසව සූත්‍ර වර්ණනාව නිමි.

## 1-1-3

එවමෙම සුතං, යනු ධම්මදායාද සූත්‍රයයි. යම් හෙයකින් මෙම සූත්‍ර ධර්මයාගේ අට්ඨුප්පත්තික නම් වූ සුත්ත නික්ඛේපයක් (බැසගැනීමක්) වේද, එහෙයින් එම අට්ඨුප්පත්තිය දක්වා ම මෙම සූත්‍රයාගේ අනුපූර්ව පද වර්ණනාව කරන්නෙමු. කිනම් අට්ඨුප්පත්තියෙක්හි (කරුණෙක්හි) මෙම සූත්‍රය දේශනාකර වදාළේද යත්, ලාභ සත්කාරයෙහිය.

භාග්‍යවතුන් වහන්සේට මහත් වූ ලාභ සත්කාරයෝ උපන්හ. සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලේ පිරූ දාන පාරමී සමූහයාගේ ආනිසංස යම්සේ ද, එමෙනි. සියලු දිසාවන්හි යමාමහ වැස්සක් නැගී මහ ගං වතුරක් මෙන්, සියලු පාරමී ධර්මයෝ එක් අත්බවෙක විපාක දෙන්නෙමු යයි එක්රැස් වූවාක් මෙනි. ලාභසත්කාර නමැති මහා ඕසයක් ඉපදවූහ. ඒ ඒ දිසාභාගවලින් බත් පැන් යහන් වත් මල්ගඳ විලවුන් ආදිය ගත් අත් ඇති රජ-බමුණු ආදීහු අවුත්, බුදුරදහු කොහිද? භාග්‍යවත්හු කොහිද? දේවාතිදේව වූ නරදෙවු වූ පුරුෂසිංහයාණෝ කොහිදැයි, භවත් ගෞතමයන් වහන්සේව සොයති. ගැල් සිය ගණනින් සිවුපසය ගෙනවුත් අවකාශ නොලැබ, ඉන් හාත්පස ගව්වක් පමණද, ගැලින් ගැල හැපී සිටිති. අන්ධක වින්ද බ්‍රාහ්මණාදීන් මේ ලුහුබැඳීම කෙරෙත්. සියල්ල ඛන්ධකයෙහිද ඒ ඒ සූත්‍රයන්හි ද ආ අයුරින් දතයුතුයැ. භාග්‍යවතුන් වහන්සේට යම්සේ ද එපරිද්දෙන් භික්ෂූන්ටද (ලාභ සත්කාර) උපනි. මෙසේ වදාරණ ලද්දේය.

**තෙන ඛො පන සමයෙන භගවා සක්කතො හොති ගරුකතො මානිතො පූජිතො අපචිතො ලාභී චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරානං භික්ඛුසංඝොපි ඛො සක්කතො හොති -පෙ- පරික්ඛාරානන්ති**

එසමයෙහි වනාහි භාග්‍යවත් තෙම සත්කාර කරන ලදුයේ ගරුකාර කරන ලදුයේ සිතින් බුහුමන් කරන ලදුයේ පුදන ලදුයේ චීවර-පිණ්ඩපාත-සේනාසන-ගිලානපච්චය භේසජ්ජ පරිෂ්කාරලාභී වූයේ වෙයි. භික්ඛු සංඝ තෙමේ ද සත්කාර කරන ලද්දේ වෙයි. -පෙ- පිරිකරලාභී වූයේ වේයයි. එසේම,

යාවතා ඛො චුන්ද, එතරහි සංඝාවා ගණා වා ලොකෙ උප්පන්නා නාහං චුන්ද, අඤ්ඤං එකසංඝම්පි සමනුපස්සාමි, එවං ලාභග්ග, යසග්ග පත්තං යථරිව චුන්ද භික්ඛු සංඝොති

(චුන්දය, මෙකල යම්පමණ සංඝයා හෝ ගණයා හෝ ලෝකයෙහි පහළ වූවාහු ද, චුන්දය, භික්ෂු සංඝ තෙමේ යම්සේද, එපරිද්දෙන් ලාභයෙන් අගපත් යසසින් අගපත් අන්‍ය එක සංඝ කෙනෙකුදු චුන්දය, මම නොදකිමි.)

බුදුරදුනට ද භික්සඟට ද, උපන්නා වූ ඒ මේ ලාභ සත්කාරය තෙම එක්ව ගෙන මහා ගංගා දෙකක්හුගේ ජලය මෙන් පමණ කළ නොහැක්කේ විය.

භික්ෂූහු ක්‍රමයෙන් ප්‍රත්‍යගරුක වූවාහු ප්‍රත්‍යයෙහි ගිජුවූවාහු ප්‍රත්‍ය පිළිබඳ බහුල පැවතුම් ඇත්තාහු වූහ. පසුබත් කාලයෙහි තෙල්-මී-උක්සකුරු ආදිය එළවූ කල්හි ගෙඩිය ගසා අපගේ ආචාර්යයන්ට දෙව් අපගේ උපාධ්‍යායයන්ට දෙවු උස්හඬින් ශබ්ද කෙරෙති. ඒ ඔවුන්ගේ පැවැත්මද බුදුරදුනට ප්‍රකට වුවද, ඉක්බිති බුදුරදහු එය ඔවුනට නොසුදුසුයයි දහම් සංවේග උපදවා මෙසේ සිතූහ.

ප්‍රත්‍යය අකැපයයි ශික්ෂාපද පැනවිය නොහැක. කුලපුත්‍රයන්ගේ මහණකම ප්‍රත්‍යය සම්බන්ධ වූවක්මය. ඉදින් මම ධම්මදායාද පටිපදාව දේශනා කරන්නේ නම්, ඕතොමෝ හික්මෙන්නා වූ කුලපුත්‍රයන්ට ශික්ෂාපද ප්‍රඥප්තියක් මෙන් වන්නේය. එය නගර ද්වාරයේ තබන ලද හැමගේ හැඩරුව දැකිය හැකි කැඩපතක් වැනි වෙයි. යම්සේ නුවර දොර හැමගේම රූ බැලිය හැකි කැඩපත් තැබූ කල්හි චතුර්වර්ණයෝම ස්වකීය ඡායාව දැක යම්සේ වරද හැර නිදොස් වෙත්ද, එපරිද්දෙන්ම ශික්ෂාකාමී කුලපුත්‍රයෝ ශික්ෂා-යෝග මණ්ඩනයෙන් තමන් මණ්ඩනය කරනු කැමැත්තාහු, සර්වකායික කැඩපතක් බඳු වූ දේශනාව ආවර්ජනා කොට, ආමිෂ දායාද ප්‍රතිපදාව දුරලා ධර්ම දායාද ප්‍රතිපදාව පුරන්නාහු වහාම ජාති-ජරා-මරණ කෙළවර කරන්නාහු යයි මෙම අර්ථෝත්පත්තියෙහි සිට මෙම සූත්‍රය වදාළ සේක.

**ආමිසය හා ධර්මය**

එහි ධම්මාදායාදා මෙ භික්ඛවෙ භවථ මා ආමිස දායාදා යනු මහණෙනි, මගේ ධර්මයට දායාද වවු. ආමිසයට දායාද නොවවු. මගේ

යම් ධර්මයක් වේද, එය පිළිගන්නාහු වවු. මගේ යම් ආමිසයක් වේද එය පිළිගන්නාහු නොවවු යයි කියන ලද වෙයි. එහි ධර්මය ද දෙවැදෑරුම් වෙයි. නිප්පරියාය ධම්ම, පරියාය ධම්ම යනුවෙනි. ආමිසයද ද්විධ වේ. නිප්පරියාය ආමිස, පරියාය ආමිස යනුවෙනි. කෙසේද මෙසේ දතයුතුයි. මග්ග-ඵල-නිබ්බාන භේද වූ නවවිධ වූ ලෝකෝත්තර ධර්මය, නිප්පරියාය ධම්ම නම් වේ. විවට්ට ධර්මයම වෙයි. කිසියම් පරියායකින් කාරණයකින් හෝ ලේසයකින් හෝ ධර්ම වූයේ නොවෙයි. යම් මේ විවට්ටගාමිනී කුසලයක් වේද ඒ කවරේද යත්,

මෙලොව කිසිවෙක් නිවන් ප්‍රාර්ථනා කරමින් දන් දෙයි. සිල් සමාදන් වෙයි. උපෝසථ කර්මය කරයි. සුවඳ මල් ආදියෙන් පූජනීය වස්තූන් පුදයි. බණ අසයි. දෙසයි. ධ්‍යාන සමාපත්ති උපදවයි. මෙසේ කරන්නේ පිළිවෙලින් නිප්පරියාය දහම වූ අමාමහ නිවන ලබයි. මේ පරියාය ධර්මයයි. එසේම සිවුරු ආදි සිවුපසය නිප්පරියාය ආමිසයමැයි. අන්‍ය පරියායකින් හෝ ක්ලේශයකින් හෝ ආමිස වූයේ නොවෙයි. යම් මේ වට්ටගාමිනී කුසලයක් වේද, ඒ කවර යත්, මෙලොවැ කිසිවෙක් භවය ප්‍රාර්ථනා කරමින් සම්පත්ති භවය කැමති වෙමින් දන් දෙයි. -පෙ- සමවත් නිපදවයි. මෙසේ කරමින් පිළිවෙලින් දිව්‍ය මනුෂ්‍ය සම්පත් ලබයි. මේ පරියාය ආමිස නම් වේ.

එහි නිප්පරියාය ධර්මය ද භාග්‍යවත්හු සන්තකමැයි. භාග්‍යවත්හු වදාළ බැවින් භික්ෂූහු මාර්ගඵල නිර්වාණ අධිගමය කෙරෙති. භාග්‍යවතුන් වහන්සේ විසින්ම වදාරණ ලදමැයි. සොහි බ්‍රාහමණං භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා -පෙ- මග්ගානුගාච පන එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතාතිච

ඒ එසේමය. (බමුණ, ඒ භාග්‍යවතුන් වහන්සේ තම සන්තානයෙහි පෙර නූපන් ෂට් අසාධාරණ ඥාණයට හේතු වූ ආර්ය මාර්ගය උපදවන්නාහුය. වෛනෙය්‍ය සන්තානයෙහි පෙර නූපන් විරූ ශ්‍රාවක පාරමී ඥානයට හේතු වූ ආර්ය මාර්ගය උපදවන්නාහුය. -පෙ- එබැවින් භාග්‍යවතුන් වහන්සේ ගිය මග අනුව යන්නා වූ භාග්‍යවතුන් වහන්සේට පසුව පැමිණි සීලාදි ගුණයෙන් සමන්විත වූ ශ්‍රාවකයෝ මෙකල්හි වෙසෙති යයිද)

**සො භාවුසො, භගවා ජානං ජානාති පස්සං පස්සති චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතොති**

(ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ දතයුතු දෙය දනියි. දැක්කයුතු දෙය දකියි. චක්ඛුභූතය, ඇසක් මෙන් වූහ. ඤාණ භූතයැ ධම්ම භූතයැ. ශ්‍රේෂ්ඨාර්ථයෙන් බ්‍රහ්ම භූතයහ. පවත්වන හෙයින් වත්තාය, නානාප්‍රකාරයෙන් වදාරණ හෙයින් හෝ පවත්මග හෙයින් පවත්තාය. අර්ථය දක්වමින් පමුණුවන සේක. අමෘතදායක වූ සේක. ධර්මස්වාමී වූහ. තථා ආගතවාදී කාරණයෙන් තථාගත වූහයි ද)

පර්යාය ධර්මයද භාග්‍යවතුන් වහන්සේ සන්තක වෙයි. යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ වදාළ බැවින්ම වූයේ ද එහෙයින් නිවන පතා දන් දෙන්නේ -පෙ- සමවත් උපදවන්නේ පිළිවෙලින් අමාමහ නිවන් ලබා යයි.

නිප්පරියාය ආමිසයද, භාග්‍යවත්හුට අයත් වෙයි. ඒ එසේමැයි. භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදත් බැවින්ම, භික්ෂූන් විසින් ජීවක වස්තුව ආදිය නිසා ප්‍රණීත වූ සිවුරු ලද්දේය. එහෙයින් වදාළහ.

**අනුජානාමි භික්ඛවෙ, ගහපති චීවරං, යො ඉච්ඡති පංසුකූලිකොහොතු යො ඉච්ඡති ගහපති චීවරං සාදියතු ඉතරීතරෙනපාහං භික්ඛවෙ, සන්තුට්ඨියෙව වණ්ණෙමීති**

(මහණෙනි, ගහපති චීවරය අනුදනිමි යමෙක් කැමති වීනම්, හෙතෙම පාංශුකූලික වේවා යමෙක් කැමති වීනම් ගහපති චීවරය පිළිගනීවා. එතකුදු වුවත් මහණෙනි, මම ඉතිරීතර ප්‍රත්‍යයෙන් (ප්‍රණීත අප්‍රණීත කොයි එකෙන් වුවත් සතුටුවීම වර්ණනා කරමි යයි.)

කලින් භික්ෂූහු ප්‍රණීත වූ පිණ්ඩ ආහාරයක් නොලැබුවාහුය. ගෙපිළිවෙලින් පිඬුසිඟා වැඩීමෙන් ලද භෝජනයෝම වූහ. රජගහ නුවර වාසය කරන්නා වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් **අනුජානාමි භික්ඛවෙ, සංඝභත්තං, උද්දෙස භත්තං, නිමන්තන භත්තං, සලාකං, පක්ඛිකං, උපොසථිකං, පාටිපදිකන්ති** මෙසේ අනුදැන වදාළ හෙයින් ම ඔවුන් විසින් ප්‍රණීත භෝජන ලබන ලද්දේය. එසේ සේනාසනද ලබන ලද්දේය. කලින් භික්ෂූහු

Scanned with CamScanner

ස්වාභාවික (=අකට) පබ්භාර (පර්වත බෑවුම්) වෘක්ෂමූල ආදි සේනාසනයෝම භික්ෂූන්ට වූහ. ඔව්හු, 'අනුජානාමි භික්ඛවෙ, පඤ්ච ලෙනානි' මෙසේ අනුදැන වදාළ හෙයින් විහාර-අඩ්ඪයෝග, පාසාද, හම්මි ගුහා යන මේ සේනාසනයෝ ලැබුවාහුයි. පෙර මුත්තහරීටක (ගොමුත්‍රයෙහි පල්කළ අරළු) මෙම බෙහෙතින්ම බෙහෙත් කළාහුය.

**අනුජානාමි භික්ඛවෙ, පඤ්ච භෙසජ්ජානි සෙය්‍යථිදං සප්පි නවනීතං තෙලං මධු, ඵාණිතං** මේ ක්‍රමයෙන් අනුදැන වදාළ බැවින් නොයෙක් වර්ගවලට අයත් බෙහෙත් ලැබූහ.

පරියාය ආමිසයද, භාග්‍යවතුන් වහන්සේටම අයත් වේ. යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදැන වදාරණ ලද්දේ ද, එබැවින්ම උපන් හෙයිනි.

සම්පත්ති භවය පතමින් දන් දී සිල්රැක -පෙ- සමවත් උපදවා පිළිවෙලින් පරියාය ආමිසය මනුෂ්‍ය සම්පත් දිව්‍ය සම්පත් ලබයි.

යම් හෙයකින් ඒ නිප්පරියාය ධර්මයද පරියාය ධර්මය ද නිප්පරියාය ආමිසයද පරියාය ආමිසය ද භාග්‍යවතුන් වහන්සේටම අයත්ය. එහෙයින් එහි තමා ස්වාමි භාවය දක්වමින් මෙසේ වදාළහ. **ධම්ම දායාදා මෙ භික්ඛවෙ භවථ, මා ආමිස දායාදා.**

**ආමිස දායාදය හා ධම්මදායාදය** යනුවෙන් මහණෙනි, මගේ ධර්මයට දායාද වවු. ආමිෂයට දායාද නොවව්. මා සතු වූ යම් දෙවැදෑරුම් ධර්ම කෙනෙක් වේද, ඒ ධර්මයම දායාද වවු. තවද මා සතු වූ යම් ආමිසයක් වේද, ඒ ආමිසයට දායාද වූවෝ වවු. ධර්ම කොට්ඨාසයටම හිමි වූවෝ වවු.

යමෙක් බුදුසසුනෙහි පැවිදිව ප්‍රත්‍යය පරමකොට සතර වැදෑරුම් තණ්හා ඇතිවීම පෙනෙන කල්හිදු ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙහි බහා තැබූ වීර්යය ඇතිව මෙසේ ද මේ ආමිස දායාද කොට ඇත්තේ වෙයි. එබඳු වූවාහු නොවවු. අනුදැන වදාළ ප්‍රත්‍යයන්හි අල්පේච්ඡ භවාදියම නිසා නුවණින් සලකා සේවනය කරමින් ප්‍රතිපත්තිය උතුම්කොට ඇතිව චතුර්විධ ආර්යවංශය පෙනෙමින් මෙසේ ද, මේ තෙම ධර්ම දායාදකොට ඇත්තේ නම් වෙයි. එබඳු වූවෝ වවු යයි කියන ලද්දේ වෙයි.

CS Scanned with CamScanner

එවිට යම්කෙනෙකුට මෙම දේශනාව කෙරෙහි මෙබඳු අදහසක් ඇතිවිය හැක.

කිම භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයින්ට අලාභයක් කැමැත්තේ මෙසේ වදාළහයි කියා.

මම ඔවුන්ට අති ප්‍රණීත ලාභය කැමැත්තෙන් මෙසේ කියමියි දක්වනු පිණිස මෙසේ වදාළහ. **අත්‍ථි මෙ තුම්හෙ සු -පෙ- නො ආමිසදායාදා** යනුවෙන් මේ ඒ දේශනාවගේ අර්ථයයි. තොප කෙරෙහි මගේ අනුකම්පාවක් දයාවක් හිතවත් බවක් ඇත. කිනම් කාරණයකින් කවර උපායකින් මගේ ශ්‍රාවකයෝ ධර්මය දායාදකොට ඇත්තාහු ධර්ම කොට්ඨාශයට ඇතුලත් වූවාහු වන්නාහුද, ආමිසය දායාදකොට ඇත්තාහු නොවන්නාහුදැයි මෙය වූ කලී එහි අදහසයි.

භාග්‍යවතුන් වහන්සේ ආමිසගරුක වූ ආමිසයෙහි ගැටුනාහු (භික්ෂූන් අතුරෙන්) අතීත කාලයෙහි වනාහි කපිල නම් භික්ෂුවගේ ද, 'සංඝාටිපි ආදිත්තාහොති' යනාදි නයින් ආවා වූ ලාමක භික්ෂු භික්ෂුණී ශික්ෂමානා ආදි වූ අනෙක ශතයන්ගේ ද තමන්ගේ ශාසනයෙහි පැවිදි වූ දේවදත්ත ආදීන්ගේ ද අපාය පරිපූරක භාවයද, ධම්මගරුක වූ සැරියුත් මුගලන් මහාකාශ්‍යප ආදීන්ගේ අභිඥා පටිසම්භිදා දී ගුණ ප්‍රතිලාභය ද දන්නා සේක. එහෙයින් ඔවුන්ගේ අපායෙන් මිදීමද, සියලු ගුණයන්ට පැමිණීමද කැමතිවන සේක් **අත්‍ථි මෙ තුම්හෙසු අනුකම්පා කින්ති මෙ සාවකා ධම්මදායාදා භවෙය්‍යුං නො ආමිස දායාදා** යි වදාළහ.

සිවුපසය ගරුකරන තැනැත්තේ සිව්පිරිස අතුරෙහි හොර කහවනුවක් මෙන් නිවුනු අඟුරක් මෙන් තෙද රහිත වූයේ ද, ප්‍රභා රහිත වූයේ ද වෙයි. එයින් නැවතුන සිත් ඇති ධම්මගරුක තැනැත්තේ තෙද ඇති සිහරදෙකු මෙන් (සියල්ල) මැඩ හැසිරෙන සුළුවූයේ වෙයි. එම කරුණින් ද, මෙසේ වදාළහ. **අත්‍ථි මෙ -පෙ- නො ආමිස දායාදාති** යනුවෙන්.

**ධම්මදායාදා මෙ භික්ඛවෙ, භවථ මා ආමිස දායාදා** යන මෙය අනුකම්පාවෙන් ප්‍රණීතතර ලාභයක් කැමැත්තහු විසින් වදාරණ ලදී. අලාභයක් කැමැත්තහු විසින් නොවේ යයි. සාධක කොට, මෙවිට මෙම අවවාදය නොකිරීමෙහි ආදීනව දක්වන සේක්, **තුම්හෙ ච මෙ භික්ඛවෙ -පෙ- නො ධම්මදායාදා** යි වදාළහ. එහි **තුම්හෙපි, තෙන ආදිස්සා**

භවෙය්‍යාථ යනු තෙපිදු ඒ ආමිෂ දායාද භාවයේ ධර්ම දායාද කොට නැති බැවින් ගැරහිය යුත්තෝ වන්නාහුය. වෙන්කොට දැක්විය යුත්තාහු, වෙන් කටයුත්තාහු, ව්‍යවස්ථා කටයුත්තාහු, නුවණැත්තන් විසින් ගැරහිය යුත්තාහු වන්නාහු යයි කියන ලද්දේ වෙයි. කිනති ආමිස දායාදා සත්‍ථුසාවකා විහරනති නො ධම්ම දායාදායි. අහමපි තෙන ආදිසෙසා භවෙය්‍යං මම ද, තොපගේ ආමිස දායාද බව නිසා ධර්මය දායාද කොට නැති බැවින් මම ද ගැරහිය යුතු බවට පත්කරන ලද්දේ වෙමි.

කිනති ආමිස -පෙ- දායාදා යන මෙය බුදුරදහු ඔවුන් ඉතා මුදු භාවයට පත්කිරීම පිණිස වදාළහ. මේ වනාහි මෙහි අදහසයි. මහණෙනි, ඉදින් තෙපි ආමිසයෙහි ලොල්ව වසන්නහු නම්, එම කරුණෙහිලා පඬිවරු මා ගරහන්නාහුය. කෙසේනම් සර්වඥ වූයේම තම සව්වන්, ධම්මදායාද වූවන් ආමිස දායාද නොවූවන් කරන්ට නොහැකි වේදැයි කියා යි. ආකල්ප සංකල්ප නොවූ භික්ෂූන් දැක, මොවුහු කාගේ සද්ධි විහාරිකයෝද? කාගේ අතවැසියෝ දැයි ආචාර්ය උපාධ්‍යායයන්ට යම්සේ ගරහත් ද, තවද සිල්වත් බැවින් තොර ලාමක හැසිරීම් ඇති කුලකුමරුන් හෝ කුල කුමරියන් දැක මොවුහු කවර කෙනෙකුන්ගේ පුත්‍රයෝ ද, කවරෙකුගේ දූවරුදැයි යම්සේ මව්පියන්ට ගරහත්ද, එපරිද්දෙන්ම මා පණ්ඩිතයෝ ගරහන්නාහුය. කෙසේනම් සර්වඥ වූයේ තමාගේ ශ්‍රාවකයන් ධම්මදායාද වූවන් ආමිස දායාද නොවූවන් කරන්ට නොහැකි වේදැයි කියායි.

මෙසේ මේ අවවාදය පිළිගෙන ක්‍රියාත්මක නොකිරීමේ ආදීනවද පිළිගෙන ක්‍රියා කිරීමේ අනුසස් ද දක්වන සේක් තුමෙහ ච මෙ යනාදිය වදාළහ. එහි අහමපි තෙන න ආදිසෙසා භවෙය්‍යං යනු වත් පුරන්නා වූ තරුණ භික්ෂූන් උදෙසා - පරිපුච්ඡා සම්පූර්ණ වූවත් වස් සියයක් සපිරි තෙරවරුන් මෙන් ආකල්ප සම්පත් වූවන් දැක කාගේ සද්ධි විහාරිකයෝ ද කාගේ අතවැසියෝ දැයි විචාරා අසවලාගේ යයි දැන තෙරුන් වහන්සේට සුදුසුය. ඒකාන්තයෙන් අවවාද අනුශාසනා කරන්ට ප්‍රතිබලය ආචාර්ය උපාධ්‍යායවරු වෙන්කොට නොදැක්විය යුත්තාහු නොගැරහිය යුත්තාහුද වෙති. එපරිද්දෙන්ම මම ද තොපගේ ඒ ධම්මදායාද භවයෙන් ආමිෂ දායාද නොවූ බැවින් කවරෙකුගේ ශ්‍රාවකයෝ, නාලක පටිපදාවට, තුවටක පටිපදාව, චන්‍දොපම පටිපදාවට, රථවිනීත පටිපදාවට, මහාගොසිංගසාල පටිපදාවට, මහා සුඤ්ඤත පටිපදාවට පිළිපන්නාහු චතුපච්චයසන්තෝස,

භාවනාරාමය, අරියවංසයන්හි සාක්ෂියක් වැනි වූ සිවුපසය පිළිබඳ තණ්හාවෙන් මිදුන වලාකුලින් මිදුන චන්ද්‍රයා වැනි වූවාහු වාසය කරත් යයි විචාරා ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ යැයි කී කල්හි, ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේ සර්වඥයහ. ඒකාන්තයෙන් ශ්‍රාවකයන් ආමිස දායාද ප්‍රතිපදාවෙන් මුදවා ධම්මදායාද පටිපදාව පුරන්නවුන් කරන්ට හැකි වූහයි නුවණැත්තන් විසින් (ගැරහිය යුතු පුද්ගලයා අසවලා යයි) වෙන්කොට දැක්විය යුත්තෙක් ගැරහිය යුත්තෙක් නොවන්නාහුයැ.

මෙසේ මේ පදයෙහි අදහස දැන සෙස්ස, අකුසල පක්ෂයෙහි කී ක්‍රමයට විරුද්ධ පසින් දතයුතුයැ. මෙසේ මේ අවවාදය පිළිපැදීමේ අනුසස් දක්වා දැන් එම අවවාදය පවරණ සේක් මෙසේ වදාළහ. තසමා තිහ මෙ භික්ඛවෙ, -පෙ- නො ආමිසදායාදා යයි වදාළහ. මෙසේ මෙම අවවාදය පවරා දැන් ඒ ධම්මදායාද ප්‍රතිපත්තිය සම්පූර්ණ කරන්නහුට ස්තුති කරනු පිණිස ඉධාහං භික්ඛවෙ යනාදිය වදාළහ. ඒ එසේමැයි. භාග්‍යවතුන් වහන්සේගේ ස්තුතිය අසා ඒ පිළිබඳව පිළිපදින්නාහු වෙත්මයැ. එහි ඉධ යනු නිපාත පදයකි. භුත්තාවි යනු වැළඳූයේ කළ බත්කිස ඇත්තේ යයි කියන ලද්දේ වෙයි.

පවාරිතො යනු යාවදත්ථ පවාරණයෙන් පැවරුයේ යැපෙන පමණ වළඳ ප්‍රතික්ෂෙප කළ බොජුන් ඇත්තේ, තෘප්තියට පැමිණියේ යයි ද කියන ලද්දේ වෙයි.

චතුර්විධ පවාරණය

පවාරණය වූ කලී චතුර්විධ වන්නීය. වස්කාලය නිමවීමෙන් කරනු ලබන පවාරණය, ප්‍රත්‍යය පවාරණය, අනතිරිත්ත පවාරණය, යාවදත්ථ පවාරණය යනුයි. අනුජානාමි භික්ඛවෙ, වස්සං වුත්ථානං භික්ඛූනං තීහි ඨානෙහි යනු වස්වැස නිමවීමෙන් කරනු ලබන පවාරණයයි.

ඉච්ඡාමහං භන්තෙ සංඝං චතුමාසං භෙසජ්ජේහි පවාරෙතුං යයි ද, අඤ්ඤත්‍ර පුනපවාරණාය අඤ්ඤං නිච්චපවාරණාය යයි ද, මෝ තොමෝ පච්චය පවාරණ නම් වන්නීය. පවාරිතො නාම ආසනං පඤ්ඤායති, භොජනං පඤ්ඤායති හත්ථ පසෙස ඨිතො අභිහරති, පටික්ඛෙපො පඤ්ඤායති එසො පවාරිතො නාම යනු අනතිරිත්ත පවාරණයයි. පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි යනු

යාව දත්ථ පවාරණයයි. මෙය මෙහි අදහස් කරන ලද්දීය. එහෙයින් කියන ලදී. **පවාරිතො** යනු යාවදත්ථ පවාරණයෙන් පැවරුයේය.

**පරිපුණ්ණො** යනු භෝජනයෙන් පරිපූර්ණ වූයේ.

**පරියොසිතො** යනු, අවසන් කළ බොජුන් ඇත්තේ.

මෙහි උත්තරපද ලෝපය දතයුතුයි. යම්තාක් කෑයුතු වේ ද, ඒ තාක් කන ලද්දේ වෙයි. මගේ භෝජන කෘත්‍යය අවසන් වූයේය යන අර්ථයි. **සුහිතො** යනු තෘප්තියට පැමිණියේ, සාදුක් නැති බැවින් හෝ සුඛිත වූයේ යයි කියන ලද්දේ වෙයි. **යාවදත්ථො** යනු යම් පමණ භෝජනයකින් මට ප්‍රයෝජනයක් වේද, ඒ සියල්ල ලැබුනේය. මෙහි ද මුල්පද තුනට පසුව කීවාහු සාධක වෙති. ඒ එසේමැයි. යමෙක් අවසන් කළේද, හෙතෙම අනුභවකොට අවසන් වූයේ වෙයි.

යමෙක් සුහිත වූයේ ද, හෙතෙම යාවදත්ථ පවාරණයෙන් පවරණ ලද්දේ වෙයි. යමෙක් යාවදත්ථද හෙතෙම පරිපුණ්ණ යයි නොහොත් පූර්වයෙහි දැක්වූවෝ පසුව දැක්වූවන්ට සාධක වෙති. ඒ එසේමැයි. යම්හෙයකින් භුත්තාවී වූයේ ද එහෙයින් අවසන් වූයේ වෙයි. යම් හෙයකින් පවරණ ලද්දේ ද, එහෙයින් සුහිත වේ. යම් හෙයකින් පිරිපුන් ද එහෙයින් යාවදත්ථ නම් වේ. මේ සියල්ල කල්පනාකොට කියන ලද්දේ යයි දතයුතුය.

**සියා** යනු ඒකාන්ත අර්ථයෙහිදු, විකලප්ප අර්ථයෙහිදු වෙයි. **සියා අජ්ඣත්තිකා සියා බාහිරා** යනු ඒකාන්ත අර්ථයෙහිය. **සියා අඤ්ඤතරස්ස භික්ඛුනො ආපත්ති වීතික්කමො** යනු විකල්පාර්ථයෙහිය. මෙහි උභය අර්ථයම වෙයි.

**අතිරේක** වූයේම **අතිරෙක ධම්ම** නම් වේ. එසේම **ඡඩ්ඩිය ධම්මො** යනුද එසේමැයි. අධික වූයේ හළ යුත්තේ ද වෙයි. අන් කිසිවක් නොකළ යුත්තේය යන අර්ථය. **අථ** යනු එකල්හි.

**ජිගච්ඡා දුබ්බල්‍ය පරෙතා** බඩසයින් ද, දුබල බැවින් ද, පීඩිත වූවාහු යුක්ත වූවාහු ද යන අර්ථයි. අටදිනක් ද දස දිනක් ද එහි කිසිවෙක් බඩසය ඇත්තාහු දූර්වල නොවෙති යයි දක්වන්නට පද දෙකක් වදාළහ. **ත්‍යාහං** යනු තෙ+අහං (ඔවුන්ට, මම) **සචෙ ආකංඛථ** යනු ඉදින් කැමැත්තහු නම්, **අප්ප හරිතෙ** යනු හට නොගත් තණ ඇති තන්හි, යම්තැනක පිණ්ඩ

ආහාර දැමීමෙන් විනාශවන සුලුවූ තණ නැද්ද එහි යන අර්ථයි. එයින් තණ නැති තැනද මහාතණ ලැහැබද, යම්තැනක ගැලිනුදු පිණ්ඩපාතය දැමූ කල තණ නොනැසෙත් ද, එතැනද ගන්නා ලද්දේ වෙයි. සැබව මෙය භූතගාම ශික්‍ෂාපදය විරුද්ධ නොවන සේ කියන ලද්දේ වෙයි.

අප්පාණකෙ යනු ප්‍රාණීන් නොමැති, පිණ්ඩපාතය දැමීමෙන් මැරෙන සතුන් නොමැති විශාල ජලයක, ටිකක් දිය ඇති ජලාසයක ආහාර දැමූ කල්හි ජලය කැලඹීමෙන් කුඩා ප්‍රාණීන් මැරෙත් ද මහා තඩාග ආදියෙහි නොමැරෙත් ද, එහෙයින් ප්‍රාණීන් රැකීම පිණිසම මෙසේ වදාරණ ලදී.

ඔපිලාපෙස්සාමි පා කරවන්නෙමි. තත්‍රෙකස්ස ඔවුන් දෙදෙනා අතුරෙන් එකෙකුට, යමෙක් මේ ධර්ම දේශනාව මනාකොට ඇසුවේ වේද, නැවත නැවත සිහි කෙරේද ඔවුහු සඳහා වදාළහ. වුත්තං ඛො පනෙතං යනුයි.

වුත්ත ශබ්දය :-

මේ 'වුත්ත' ශබ්දය කෙස් ඉවත් කිරීමෙහි දක්නට ලැබේ. කාපටිකො මාණවො දහරො වුත්තසිරො යනාදී තන්හිය. රෝපිතයෙහි (වැවීමෙහි)ද දක්නා ලැබේ. යථා සාරදිකං බීජං ඛෙත්තෙ වුත්තං විරූහති යනාදී තන්හිය. කී දෙය දැක්වීමෙහි වුත්තමිදං භගවතා වුත්තමරහාතා යනාදී තන්හිය. මෙහි වූ කලී කථිතයෙහි දතයුතුයැ. මෙය කියන ලද්දේය. මේ එහි අර්ථයයි.

ආමිසඤ්ඤතරං සිවුපසය අතුරෙන් එක්තරා එකක් යන අරුතයි. යදිදං යනු නිපාතයකි. සියලු ලිංග විභත්ති - වචනයන්හි එබඳු මැයි. ඒ ඒ තන්හි අරුත් වශයෙන් පෙරලාගත යුතුයි. මෙහි වනාහි මේ පදයාගේ යො එසො (යම් මේ) යන අර්ථයි. යම් මේ පිණ්ඩපාතයක් වේ ද, එය එක්තරා ආමිෂයකැයි කියන ලද්දේ විය. යන්නූනාහං යනු ඉතා යෙහෙක මම (යන අර්ථයි) එවං යනු යම්සේ දැන් මේ මොහොත ඉක්මවන්නෙම්ද, එපරිද්දෙන් රෑදාවලද වීතිනාමෙය්‍ය යනු ගෙවන්නෙමි ඉක්මවන්නෙමි.

සො තං පිණ්ඩපාතං යනු හෙතෙම ඒ දෙවියන් සහිත ලෝකයා විසින් මුදුනින් පිළිගතයුතු වූ සුගතයන් වහන්සේ විසින් ඉතිරි කරන ලද පිණ්ඩපාතය නොවළඳ ධම්මදායාදය කැමති වන්නේ ආදිත්ත ශීර්ෂ උපමාව

ප්‍රත්‍යවේක්ෂා කරමින් බඩසා දුබල බැවින් යුක්තවම මෙසේ රෑ දාවල් ඉක්මවන්නේය.

අථ දුතියසස යන මේ වාරයෙහි මේ සංක්ෂෙපයයි ඉදින් මහණ, යනනූනාහං -පෙ- වීතිනාමෙය්‍ය යයි සිතන්නේ මෙසේත් සිතන්නේය. පැවිද්දහු විසින් දරුණු සතුන්ගෙන් ගැවසී ගත්, වනයෙහි බෙහෙතක් මෙන් පඤ්චකාම ගුණ නමැති, දරුණු සතුන් ගැවසීගත් ගමෙහි පිණ්ඩපාත සොයන්ට දුෂ්කර වෙයි. මෙම පිණ්ඩපාත්‍ය වූ කලී සෙවීම් ආදිනවයෙන් මිදුනේ ද, සුගතයන් වහන්සේ විසින් ඉතිරි කරන ලද හෙයින් උභතො සුජාත ක්ෂත්‍රිය කුමාරයෙක් මෙන් වෙයි.

කරුණු පසකින් පිණ්ඩපාතය නොවැළඳිය යුතු වේද?

ඒ කවරහු යත්? අලජ්ජි පුද්ගලයා සතුයයි, පුද්ගලයා ගරහා නොවැළඳිය යුත්තේ වෙයි.

භික්ෂුණිය විසින් සකස් කරන ලද්දෙහි, නොසුදුසු සම්භාවනාවකින් උපන් අපිරිසුද්ධ උත්පත්ති ඇති බැවින් නොවැළඳිය යුතු වෙයි.

පිණ්ඩපාතය හිමි මහණ බඩසයින් යුක්ත වූයේ යයි ස්වාමියා කෙරෙන් අනුකම්පාවෙන් නොවැළඳිය යුත්තේ වෙයි.

අතවැසියන් හෝ ඔවුන් පිළිබඳ අන්‍යයන් හෝ බඩසයින් යුක්තහයි හෙතෙම පිණාගියේ නමුදු ඔහුගේම අතවැසි ආදීන් කෙරෙහි අනුකම්පාවෙන් නොවැළඳිය යුත්තේය. පිණ්ඩපාතය හිමි භික්ෂු තෙම නොඇදහිය යුත්තේ යයි ඒ අතවැසි ආදීහු ද යැපුනාහු සුඛිත වූවාහු වෙත් ද එතකුදු වුවත් නො ඇදහිය යුතු බැවින් නො වැළඳිය යුත්තේ වෙයි.

ඒ කරුණු පසින් ද මෙම පිණ්ඩපාතය මිදුනේය. ඒ එසේ මැයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි ලජ්ජීන් අතුරෙන් අග්‍රය. පිණ්ඩපාතය ද පිරිසිදු ලද දෙයකි. භාග්‍යවතුන් වහන්සේ වනාහි යැපුනාහු සුඛිත වූවාහු වෙති. කැමති වන්නාහු අන්‍ය පුද්ගලයෙකුදු නැති යමෙක් ලොවැ ඇදහිය යුත්තාහු වෙත්ද, භාග්‍යවත්හු ඔවුන් අතුරෙන් අග්‍ර වෙතියි මෙසේ සිතා හෙතෙම පිණ්ඩපාතය වළඳ -පෙ- ඉක්මවන්නේය. මෙතෙකින් යමෙකුත් නොවළඳ මහණදම් කෙරේද, හෙතෙමේ ද වැළඳිය යුතු වූ ම පිණ්ඩපාතය

නොවැළඳූයේ වෙයි. යමෙක් වළඳ මහණදම් කෙරේ ද, හෙතෙමේ ද වැළඳිය යුතු වූම පිණ්ඩපාතය වැළඳූයේ වෙයි. පිණ්ඩපාතයෙහි විශේෂයක් නැත. පුද්ගලයා කෙරෙහි විශේෂයක් ඇත. එහෙයින් ඒ දක්වන සේක්. කිඤ්චාපි සො යනාදිය වදාළහ.

එහි කිඤ්චාපි යනු අනුජානන පසංසනාර්ථයෙහි නිපාත පදයකි. කුමක් අනුදනීද යත් ඒ භික්ෂූහුගේ ඒ නිවැරදි පරිභෝගයයි. කුමක් පසසාද යත්, වළඳ මහණදම් කිරීමයි. මේ කියන ලද්දේ වෙයි. ඉදින් ඒ මහණ, මෙසේ වැළඳිය යුතු වූ පිණ්ඩපාතයම වළඳ කළයුතු මහණ දමම කරන්නේ නම් අථ බො අසුයෙව මෙ පුරිමො භික්ඛු, යම් ඒ පළමු කී මහණ පිණ්ඩපාතය ප්‍රතික්ෂෙප කොට මහණදම් කෙරේද, අසුයෙව මෙ හෙතෙමේම මා විසින් ශූරයන් දෙදෙනෙකු අතුරෙන් අතිශයින් ශූරයා මේද පඬිවරුන් දෙදෙනකුන් අතුරෙන් අතිශයින් පණ්ඩිතයා මෙන් ද, අතිශයින් පිදිය යුත්තේ ද අතිශයින් ප්‍රශංසා කළයුත්තේ ද වෙයි. දෙවන භික්ෂුවට වඩා අතිරේක වශයෙන් පිදිය යුතුද පැසසිය යුතුද වේයයි කියන ලද්දේ වෙයි. දැන් එම අරුත කාරණයෙන් සාධනය කරනුයේ තං කිසස හෙතු යනාදිය වදාළහ.

එහි අර්ථය කවරේද යත්? මේ කරුණහෙි ලා තොපට මෙබඳු සිතක් වන්නේය. කුමකින් ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් අතිශයින් පිදිය යුතුද? අතිශයින් ප්‍රශංසා කළ යුතුදැයි ඒ එසේමය. යම්හෙයකින් ඔහුගේ ඒ පිණ්ඩපාතය ප්‍රතික්ෂෙප කිරීමක් වේද? එය ඒ මහණ හට බොහෝකලක් අල්පෙච්ඡ බව පිණිස -පෙ- විරියාරම්භය පිණිස පවත්නේද, එහෙයිනි. කෙසේද යත්, ඕ හට පසුකලකෙ ප්‍රත්‍යයන් විෂයෙහි අතිච්ඡතාව හෝ පාපිච්ඡතාව හෝ මහිච්ඡතාව හෝ උපදින්නේ නම්, නැවත එම තෘෂ්ණාව මේ පිණ්ඩපාත ප්‍රතික්ෂෙප කිරීම නමැති අංකුසය හේතුකොට ගෙන එම්බා තෝ සුගතයන් විසින් ඉතිරි කළ පිණ්ඩපාතය ප්‍රතික්ෂෙප කොට මෙබඳු තෘෂ්ණාවක් ඉපිද වූයෙහිය. මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරමින් එයින් වළකින්නේය. උපන්නා වූ අසන්තුට්ඨියගේද අසල්ලෙඛයාගේ ද වැලකීම මේ ක්‍රමයමැයි. මෙසේ මෙය ඔහුගේ අල්පේච්ඡ බව පිණිස සන්තුට්ඨිය පිණිස ද, සල්ලෙඛය පිණිස ද පවත්නේය.

සුභරතායා මෙහි මෝ වර්ණනා තොමෝ වන්නීය. මේ ශාසනයෙහි යම්කිසිවෙක් තමන් විසින්ද අනුන් විසින්ද (අසීරුවෙන් පෝෂණය කළයුත්තේ දුභර වේ. දුප්පොස වේ. කෙනෙක් තමන් විසින් ද

උපස්ථායකයන් විසින් ද සුභර වෙයි. පහසුවෙන් පෝෂණය කළ හැකි වෙයි. ඒ කෙසේද යත්, යමෙක් ඇඹුල් ආදිය ලැබ නොඇඹුල් ආදිය සොයා ද එකෙකුගේ ගෙදරකින් ලද දෙය අනිකෙකුගේ ගෙදර දමමින් සියලු ගම හැසිර හිස් පාත්‍රය ඇත්තේම විහාරයට පිවිස නිදාද? මේ තමා විසින් ද පෝෂණය කළ නොහැකි වෙයි. දුභර වේ.

යමෙක් හැල් - මස් බත් ආදියෙන් පාත්‍රය පුරා දුන් කල්හි ද දුර්මුඛව නොසතුටු බව දක්වා ද, නැතහොත් ඔවුන් ඉදිරිපිටම තොප විසින් දෙන ලද්දේ කුමක්දැයි එම පිණ්ඩපාතයට නින්දා කරමින් සාමණේර ගෘහස්ථ ආදීන්ට බෙදාදේ ද, මේ තෙම උපස්ථායකයන් විසින් පෝෂණය කිරීමට දුෂ්කර වෙයි. (දුභර වෙයි). මේ මහණ දැක මිනිස්සු ඔහුගෙන් ඈත් වෙති. මේ භික්ෂුව පෝෂණය කිරීම අපහසු යයි කියා යමෙක් ප්‍රණීත වූ හෝ අප්‍රණීත වූ හෝ යමක් ලැබ තුටු සිත් ඇත්තේම වළඳ විහාරයට ගොස් තමාගේ කටයුතු කෙරේ ද, මේතෙම තමා විසින් සුභර වෙයි. යමෙක් අන්‍යයන්ගේ ස්වල්ප වූ හෝ බොහෝ වූ හෝ රළු වූ හෝ ප්‍රණීත වූ හෝ දානය පිළිකුල් නොකොට සතුටු සිත් ඇත්තේ වෙසෙසින් පහන් මුහුණු ඇතිව ඔවුන් හමුවෙහි දීම වැළඳුයේ ද, මේ තෙම උපස්ථායකයන් විසින් සුභර වෙයි. මේ මහණ දැක මිනිස්සු අතිශයින්ම විශ්වාස වූවාහු වෙති. අපගේ පින්වතුන් වහන්සේ සුභරයහ. සුළු දෙයකිනුදු සතුටු වෙති. අපිම උන්වහන්සේව පෝෂණය කරන්නෙමුයි ප්‍රතිඥා දී පෝෂණය කෙරෙති.

ඉදින් එහි අපරසමයෙක්හි තමන්ගේ හෝ උපස්ථායකයන්ගේ හෝ දුභරතා නයින් සිතක් උපනහොත් එවිට මෙම පිණ්ඩපාත ප්‍රතික්ෂෙප කිරීම නැමැති අංකුසයෙන් එය නිවාරණය කරන්නේය. අරේ එම්බා තෝ සුගතයන් වහන්සේ ඉතිරිකළ පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කොට මෙවන් සිතක් ඉපදවූවෙහිදැයි මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරමින් සුභරතාවයට පරිවර්තනය වන්නේය. ඉදින් ඔහුට කුසීත බව උපදින්නේ නම් එයද මේ අංකුසයෙන් නිවාරණය කරන්නේය. 'එම්බා, තෝ වනාහි එකල සුගතයන් වහන්සේ විසින් ඉතිරිකළ පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කොට එසේ බඩසයින් සහ දුබල බැවින් පෙළුනේද, මහණදම් කොට අද කුසීත බැවින් පෙලෙන්නෙහි දැයි මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරන්නේ මෙවන් විරිය ආරම්භයකට පත්වන්නේය. මෙසේ ඔහුට මෙම පිණ්ඩපාත ප්‍රතික්ෂේපය බොහෝ කලක් අප්පෙච්ඡතාවය පිණිස -පෙ- විරියාරම්භය පිණිස පවතින්නේය.

දසකථා වස්තු

මෙසේ ඔහුට මේ පංචගුණයෙන් පිරෙන්නාහු ද (එවිට) දසකථා වස්තූන් සම්පූර්ණ කෙරෙත්. මෙහි වනාහි පාලියෙහිම අප්පිච්ඡතා - සන්තුට්ඨිතා - විරියාරම්භ වශයෙන් තුන්දෙනෙක් ආවාහු වෙති. සෙස්සෝ සල්ලෙඛ නාමයෙන් සංග්‍රහ කරන ලද්දාහුය. යම් මේ සල්ලෙඛ යන නමක් වේද, මේ වනාහි සියලුම දසකථා වස්තූන්ටම නමක් මැයි. එහෙයින් වදාළහ.

සාච ඛො අයං ආනන්ද, කථා අභිසල්ලෙඛිකා චෙතො විවරණ සප්පායා එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය, සංවත්තති සෙය්‍යථීදං අප්පිච්ඡකථාති

(ආනන්දය, මේ කථා තොමෝද අතිශයින් ක්ලේශ සංලිඛනය කරන්නී, චිත්ත විවරණ සංඛ්‍යාත වූ සමථ විදර්ශනාවන්ට උපකාර වූවා, ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිස, නිරෝධය පිණිස, ක්ලේශ ව්‍යසමය පිණිස විශිෂ්ට ඤාණය පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස, පවත්නීය. ඕ කවරීද, අල්පෙච්ඡ කථායයි යන විස්තරයයි. මෙසේ මේ පංච ගුණයෝ පිරුණාහු දසකථා වස්තු සම්පූර්ණ වන්නාහුය.

මෙසේ මේ පඤ්ච ගුණයෝ සම්පූර්ණ වූවාහු දසකථා වස්තූන් සම්පූර්ණ කරන්නාහු වෙත්. දසකථා වස්තූන් සම්පූර්ණ කිරීමෙන් ත්‍රිවිධ ශික්ෂාවන් සම්පූර්ණ කරන්නාහු වෙත් කෙසේද යත්, ඔවුන් අතුරෙන් අප්පිච්ඡකථා සන්තොස කථා, අසංසග්ග කථා සීලකථා මේ සතර කථාවෝ අධිශීල ශික්ෂායෙහි සංග්‍රහ වූවාහුමය. පවිවෙක කථා විරියාරම්භ කථා සමාධි කථා යන මේ තිදෙන අධිචිත්ත ශික්ෂායෙහි සංග්‍රහ වූවාහු වෙත්. පඤ්ඤාකථා විමුත්ති කථා විමුත්ති ඤාණදස්සන කථා යන මේ තිදෙන අධිප්‍රඥා ශික්ෂායෙහි සංගෘහිත වූවාහු වෙත් යයි.

මෙසේ දසකථා වස්තූන් සම්පූර්ණ වූවාහු ත්‍රිවිධ ශික්ෂාවන් සම්පූර්ණ කෙරෙත්. ත්‍රිවිධ ශික්ෂාවන් සම්පූර්ණ කරන්නාහු පඤ්ච අසෙඛ ධර්ම සමූහය පරිපූරණය කරන්නාහුය. කෙසේද යත්,

පරිපූර්ණ වූ අධිසීල ශික්ෂාව වනාහි අසේඛ සීලක්ඛන්ධයම වෙයි. අධිචිත්ත ශික්ෂාව අසෙඛ සමාධික්ඛන්ධය වේ. අධි ප්‍රඥා ශික්ෂාව, අසේඛ

වූ පඤ්ඤා විමුත්ති විමුත්ති ඤාණදස්සන ඛන්ධයෝම වෙතැයි මෙසේ ශික්ෂා ත්‍රය පිරුණාහු පඤ්ච අසේඛ ධර්මස්කන්ධයන් පරිපූරණය කරන්නාහුය. යම්සේ පර්වත මුදුනෙක්හි වර්ෂා සෘතුවෙහි වූ මහා මේඝයක් මොනවට වැසි ඇතිවූයේ පබ්බත - කන්දර පදර - සාඛා පුරවාද පිරුණා වූ ඔවුහු කුඩා විල් ද, කුඩාවිල් මහවිල්ද, මහවිල් කුඩා නදීන් ද කුඩා නදීහු මහනදීන් ද, මහනදීහු සාගරය පුරවත් ද,

එපරිද්දෙන්ම ඒ මහණ හට මේ ගුණපස පිරුණාහු දශකථා වස්තූන් ආදිකොට අමෘතමහා නිර්වාණය තෙක් පරිපූරණය වන්නාහුය. මෙසේ මේ මහණතෙම ධම්මදායාද පටිපදාවට පිළිපන්නේ පරම ධම්ම දායාදය ලබන්නේ යයි යන මේ අර්ථය දුටු භාග්‍යවත්හු **තං කිසස හෙතු? තංහි තසස භිකඛවෙ, භිකඛුනො** යනාදිය වදාළහ.

මෙසේ එම භික්‍ෂුවගේ පූජ්‍යතර භාවයද, පසංසාතර භාවය ද සහේතුකව දක්වා දැන් එම භික්‍ෂූන් ධම්මදායාද බැව්හි යොදවන්නේ **තසමාතිහ මෙ භිකඛවෙ** යනාදිය වදාළහ.

කුමක් වදාරණ ලද්දේද යත්, යම් හෙයකින් යම් භික්‍ෂුවක් එම පිණ්ඩපාතය වළඳ මහණදම් කරන්නේ නම් හෙතෙම මේ මූල ගුණපහෙන් බාහිර වන්නේය. යම් භික්‍ෂුවක් වනාහි නොවළඳ මහණදම් කරන්නේද, හෙතෙම (මේ ධම්මදායාදයෙහි) කොටස්කරුවෙකු වන්නේය. **තසමා තිහ මෙ භිකඛවෙ** යනාදිය වදාළහ.

එහෙයින් මහණෙනි මෙහිලා -පෙ- මාගේ ආමිෂය දායාදකොට ඇත්තේ නොවෙමුයි **ඉදමවොච භගවා** යන නිදාන පර්යාවසානයෙහි පටන් නො ආමිසදායාද යන්න අවසන්කොට ඇති මේ සූත්‍ර ප්‍රදේශය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. **ඉදං වතවා සුගතො** මෙම සූත්‍ර ප්‍රදේශය වදාරාම ශෝභන ප්‍රතිපදාවෙන් ගියහෙයින් සුගත නම් වූ භාග්‍යවත්හු **උටඨායාසනා විහාරං පාවිසි** පනවන ලද උතුම් බුද්ධාසනයෙන් නැගිට පිරිස නොබිඳුණු කල්හිම, විහාරයට තමන් වහන්සේගේ ගඳකිළියට ඇතුල් වූ සේක. කුමක් හෙයින්ද යත්, ධර්මයට ප්‍රශංසා කරනු පිණිසය.

භාග්‍යවතුන් වහන්සේලා වනාහි නොනිමි දම්දෙසුම් ඇත්තේ, වෙහෙරට පිවිසෙන්නාහුද කරුණු දෙකක් මුල්කොට එසේ කරන සේක. ධර්මයට ගරුකිරීම හෝ පුද්ගලයන්ට ගරුකිරීම සඳහාය.

පිවිසෙන්නේ මෙසේ සිතයි. මවිසින් සැකෙවින් දක්වන ලද්ද, විස්තර වශයෙන් විභාග නොකරන ලද්දා වූ මේ උද්දේශය (මාතෘකාව) ධර්මය පිළිගන්නා වූ භික්ෂූහු ඉගෙන අනඳ තෙරුන් වහන්සේ වෙත හෝ කච්චායන තෙරුන් වහන්සේ වෙත හෝ එළඹ විචාරන්නාහුය. අනතුරුව ධර්ම ප්‍රතිග්‍රාහකයෝ පෙරලා මා විචාරන්නාහුය. ඔවුනට මම ආනන්දයන් විසින් මනාව කියන ලද්දේය. කච්චායනයන් විසින් මනාව කියන ලද්දේය. ඉදින් තෙපි මේ කාරණය මගෙන් විචාරන්නාහු නම්, මම ද මෙම කාරණය මෙපරිදිම ප්‍රකාශ කරන්නෙමියි (වදාළහ.) ඉක්බිති ඔවුන් කෙරෙහි ගෞරවයෙන් ඔවුන් වෙත එළඹෙන්නාහුය. ඔවුහුද භික්ෂූන් අර්ථයෙහි ද ධර්මයෙහි ද යොදවන්නාහුනය.

ඒ භික්ෂූහු ඔවුන් විසින් (අර්ථ ධර්ම දෙක්හි) යොදවන ලද්දාහු ත්‍රිවිධ ශික්ෂාව සපුරාලන්නාහු දුක්ඛය කෙළවර කරන්නාහු යයි ධර්මයට ප්‍රශංසා කිරීම පිණිස විහාරයට පිවිසි සේක්, මෙහිදී යම්සේ සිතූ සේක් ද එපරිද්දෙන්ම සිතන සේක. මා විහාරයට පිවිසි කල්හි මේ පිරිස්හිම හුන් ශාරිපුත්‍ර තෙම එම ආමිෂ දායාදයට ගරහමින් ද ධර්ම දායාදයට පසසමින්ද දහම් දෙසන්නාහුය. මෙසේ අප දෙදෙනාගේම එක් අදහස් ඇතිව එක් මතයෙන්ම දෙසන ලද මේ දේශනා තොමෝ ගල් කුඩයක් මෙන් ප්‍රධානද ගරුද වන්නීය.

චතුරෝඝයන් තරණය කිරීමේ අර්ථයෙන් තොටක නවතා තිබූ නැවක් මෙන් ද, ස්වර්ග ගමනාර්ථයෙන් ආජානීයයන් සතරදෙනෙකු යෙදූ රථයක් මෙන්ද වන්නේය. මෙසේ කරන්නහුට මෙපමණ දඩයයි පිරිස් මැද ආඥාව තබා හුනස්නෙන් නැගිට රජ ප්‍රාසාදයට නැගී ගියකල්හි එහිම හුං සෙනෙවිතෙම ඒ රජු විසින් තැබූ ආඥාව යම්සේ පවත්වා ද, මෙසේත් මා විසින් තැබූ දේශනාව මේ පිරිසෙහිම හුන් ශාරිපුත්‍ර තෙම ප්‍රශංසා කොට දේශනා කරන්නේය. මෙසේ අප දෙදෙනාගේම අදහස් පරිදි දේශිත මෙම දෙසුම අතිශයින්ම බලවත්ය. මධ්‍යාහ්නයේ හිරු මෙන් බබලන්නේ යයි, මෙසේ මෙහි ධර්මයට පැසසීම පිණිස හුනස්නෙන් නැගිට විහාරයට ප්‍රවිෂ්ට වූ සේක.

මෙබඳු තැන්වලදී භාග්‍යවත්හුගේ හුනස්නෙන් නැගිට වැඩමවීම, අතුරුදහන් වීම චිත්තගමනින් විහාරයට ප්‍රවේශ වෙත්යයි දතයුත්තේය. ඒ එසේමැයි. කාය ගතියෙන් වඩින්නේ නම් සියලු පිරිස භාග්‍යවතුන්

වහන්සේ පිරිවරා යන්නේය. එක්වරක් බිඳුනු පිරිස යලි රැස්කිරීම දුෂ්කර වන්නේය. එබැවින් භාග්‍යවතුන් වහන්සේ චිත්ත ගතියෙන්ම වැඩි සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ වැඩිකල්හි භාග්‍යවතුන් වහන්සේගේ අදහසට අනුරූපව එම දහම්මග දෙසනු කැමැත්තේ **තත්‍ර ඛො ආයසමා සාරිපුතෙතා -පෙ- එතදවොච.**

එහි, **ආයසමා** යනු මෙය ප්‍රිය වචනයකි. **සාරිපුතෙතා** යනු එම තෙරුන් වහන්සේගේ නාමයයි. එය වූ කලී මව් පසිනි. පියපසින් නොවේ. හේ රූපසාරි නම් බැමිණියගේ පුත්‍ර තෙමේය. එබැවින් සාරිපුත්ත යයි කියනු ලැබේ. **අචිරපකකනතසස** යනු නික්ම ගොස් නොබෝ වෙලාවකින් **ආවුසො භිකඛවෙ** යනු මෙහි වනාහි භාග්‍යවත් බුදුවරයෝ, ශ්‍රාවකයන් අමතන්නේ භිකඛවෙ යයි ආමන්ත්‍රණය කෙරෙති. ශ්‍රාවකයෝ වනාහි බුදුවරයන් හා සමාන නොවිය යුතුයයි, ආවුසො යනුවෙන් පළමු කියා පසුව භිකඛවෙ යයි කියති. බුදුරදුන් විසින් අමතනු ලැබූ භික්ෂු සංඝතෙම භදනෙත යනුවෙන් ප්‍රතිවචන දෙයි. ශ්‍රාවකයන් විසින් අමතනු ලැබුවේ අවුසො යයි ප්‍රතිවචන දෙයි.

**කිතතාවතා නුඛො ආවුසො** යන මෙහි **කිතතාවතා** යනු පරිච්ඡේද වචනයයි. කොපමණකින්දැයි කියන ලද්දේ වෙයි. නු යන ප්‍රශ්නාර්ථයෙහියැ. ඛො කාරය නිපාත මාත්‍රයකි. **සඣු පවිවිතතසස විහරතො** යනු කාය-චිත්ත-උපධි-විවෙක යන ත්‍රිවිධ විවේකයන්ගෙන් යුක්තව වාසය කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ. **විවෙකං නානු සිකඛනති** යනු ත්‍රිවිධ විවේකයන් අතුරෙන් එකකුදු අනුව නොහික්මෙත්ද, ආමිසදායාදො හොනති යනුවෙන් මෙම අර්ථය ආයුෂ්මත් සාරිපුත්‍ර තෙමේ භික්ෂූන් විචාළේය. කුසල පක්ෂයෙහිදු මෙම ක්‍රමය මැයි. මෙසේ කී කල්හි එහි අර්ථය අසනු කැමැති භික්ෂූහු දූරතොපි ඛො යන ආදිය කීවාහුය.

**තත්‍ර** එහි **දූරතොපි** යනු පිටරටින් ද පිට ජනපදයෙන් ද නොයෙක් යොදුන් ගණනක සිට යයිද කියන ලද්දේ වෙයි. **සනතිකෙ** යනු සමීපයෙහි, **අඤඤාතුං** යනු දැනගන්ට අවබෝධ කරන්ට, **ආයසමනතංයෙව සාරිපුතතං පටිභාතු** ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේගේම භාගය (කොටස්) වේවා. ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙම තමන්ගේ කොටස වශයෙන් ගෙන විස්තර කරන සේක්වායි කියන ලද්දේ වෙයි. ඒ එසේමැයි. යම් ඒ අරුත් පැවසීමක් වේද, එය ආයුෂ්මත්හුගේ භාගයයි. ඇසීම වූ කල අපගේ භාගයයි. මේ

මෙහි අදහසයි. මෙසේ ශබ්ද ලක්‍ෂණ වශයෙන් සම වෙයි. කිසිවෙක් පටිභාතු යනු දක්නා ලැබේවායි කියති. අනිකෙක් වැටහෙත්වායි කියති. ධාරෙස්සන්ති යන උද්ග්‍රහණය කරන්නාහුය. ප්‍රගුණ කරන්නාහුය.

ඉක්බිති ඔවුන්ට කියනු කැමැති තෙරුන් වහන්සේ තෙනහි ආදිය කීහ. එහි තෙන යනු කාරණ (අරුතෙහි) වචනයකි. හි කාරය නිපාතයකි. යම්හෙයකින් අසනු කැමති වහුද, යම්හෙයකින් මා වෙත භාරය ආරෝපණය කළහුද, එහෙයින් ශ්‍රවණය කරමු යයි කියන ලද්දේ වෙයි. ඒ භික්‍ෂූහු ද තෙරුන්ගේ වචනය පිළිගත්තාහුය. එයින් කීහ. එව මාවුසො -පෙ- පච්චස්සොසුං යයි.

ඉක්බිති ඔවුන්ගේ ආමිෂ දායාදයට ගරහන භාග්‍යවතුන් වහන්සේ විසින් තුම්හෙපි තෙන ආදිස්සා භවෙය්‍යාථ යනුවෙන් එකම ආකාරයෙන් පවසන ලද අර්ථය තුන් ආකාරයකින් දක්වන්නා වූ ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ මෙසේ වදාළහ. ඉධාවුසො සත්‍ථු පවිවිත්තස්ස විහරතො -පෙ- එත්තාවතා බො ආවුසො සත්‍ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකං නානුසික්ඛන්ති මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ ආමිසදායාද පටිපදාවට නින්දා කරන්නේ තුම්හෙපි තෙන ආදිස්සා භවෙය්‍යාථ තෙපිද එයින් නින්දා ලබන්නෝ වන්නාහු යයි යමක් වදාළ සේක්ද? තමන් වහන්සේ කිත්තාවතා නුබො -පෙ- නානුසික්ඛන්ති යයි යම් ප්‍රශ්නයකුත් විචාලාහුද, ඒ දේශනාවේ විස්තර හෙයින් අර්ථය මොනවට විභාග කරන ලද්දේ වෙයි. එය භාග්‍යවතුන් වහන්සේගේ ආදිස්සභාවය (නින්දා ලැබිය යුතු බව) සිහිනොකොට, ඒ එසේමැයි. ශ්‍රාවකයන් අනුව ගන්නාවිට භාග්‍යවතුන් වහන්සේ විසින්ම අහම්පි තෙන ආදිස්සො භවිස්සාමි යනුවෙන් (මමද එයින් නින්දා ලැබිය යුත්තෙක් වන්නෙමි.) යයි කියන්ට යෝග්‍ය වෙයි. ශ්‍රාවකයන් විසින් කියන්ට යෝග්‍ය නොවෙයි. කුසල පක්‍ෂයෙහි ද මෙම ක්‍රමයමැයි. මෙහි පළමුකොට කියන ලද්ද මෙහි අනුසන්ධි ක්‍රම යෝජනා නම් වේ. පසුව කියනු ලබන්න අර්ථ වර්ණනා නම් වේ.

ඉධ යනු මේ ශාසනයෙහි. සත්‍ථුපවිවිත්තස්ස යනු ත්‍රිවිධ විවේකයෙන් අතිශයින් විවේකයට පත් ශාස්තෘන් වහන්සේගේ විවෙකං නානු සික්ඛන්ති යනු කාය විවේකයට අනුව නොහික්මෙති. සම්පූර්ණ නොකරන ලද්දේ යයි කියන ලද්දේ වෙයි. ඉදින් ත්‍රිවිධ විවේකය සඳහාම කියන්නේ නම්, ප්‍රශ්නයාගේ විශේෂයක් නොම වන්නේය. මේ කියන ලදුයේ ව්‍යාකරණ

පක්ෂයයි. ඉමිනා යනු එහෙයින් මේ පදයෙන් කාය විවේකය ද, යෙසඤ්ච ධම්මානං යනාදියෙන් චිත්ත විවේකයද, බාහුලිකා යනාදියෙන් උපධි විවේකය ද දක්වයි. මෙසේ මෙහි සංක්‍ෂෙප අර්ථය දතයුත්තේය.

යෙසඤ්ච ධම්මානං යනු ලෝභාදීන් සඳහා කීහ. යමෙක් මත්තෙහි, තත්‍රාවුසො ලොභො ච පාපකො යනාදි නයින් කියන්නේද, (ඔවුන් සඳහාය. නපපජහනති දුරුනොකෙරෙත්. චිත්ත විවේකය දුරු නොකෙරෙත් යයි කියන ලද්දේ වෙයි. බාහුලිකා චීවර ආදීන්ගේ බහුලභාවයට පැමිණියේ සසුන ලිහිල්කොට ගතිත්තුයි සාථලිකා නම් වෙති. ඔක්කමනෙ පුබ්බංගමා මෙහි අවගමනාර්ථයෙන් පංච නීවරණයෝ ඔක්කමන යයි කියනු ලැබේ. එහෙයින් පංච නීවරණයන් පිරීමෙහි පුබ්බංගම වීයයි කියන ලද්දේ වෙයි. පවිවෙකෙ යනු උපධි විවේකයෙහි නිර්වාණයෙහි. නික්ඛිත්තධුරා බහා තබන ලද වෙර ඇත්තාහු එය අවබෝධ සඳහා ආරම්භක උත්සාහය කුඩු නොකරන්නාහු යයි. මෙතෙකින් උපධි විවේකය නො පුරත් යයි කියන ලද වෙයි. මෙතෙකින් අනියමයෙන් කියා අනතුරුව දේශනා නියමයෙන් වදාරණ සේක් තත්‍රාවුසො ආදිය කීහ.

කුමක් හෙයින්ද යත්, ශ්‍රාවකයෝ කරුණු තුනකින් යයි, යම්හෙයකින් අනියමෙන් කියනු ලබන කල්හි කවරෙකුට නමුත් කියායයි හඟිමු. අපට නොවේයයි උදාසීන බවට පත්වෙති. ස්ථවිරයෝයි මධ්‍යමයෝය නවකයෝ යයි මෙසේ නියමකොට කියනු ලබන කල්හි අපට කියත් යයි ආදරය කරති. යම්සේ ඇමතිය් විසින් නුවර වීථිහු ශුද්ධ කටයුත්තාහු යන රජු විසින් කී කල්හිදු, කවරෙකු විසින් ශුද්ධ කටයුතුදැයි සිතමින් ශුද්ධ නොකෙරෙත් ද, තම තමන්ගේ ගෘහද්වාරය ශුද්ධ කළයුතුයයි බෙර නිකුත් කළ කල්හි සියල්ලෝම මොහොතකින් ශුද්ධ කෙරෙත් ද, අලංකාර කෙරෙත්ද, මෙසේ කාරණය දත යුත්තේය.

එහි තත්‍ර යනු ඒ ශ්‍රාවකයන් අතුරෙහි ථෙරා යනු දසවස් ඇත්තවුන් පටන් කියනු ලැබෙත්. තීහි ඨානෙහි යන කරුණු තුනකින්, එය එසේමැයි. මෙහි ඨාන ශබ්දය තෙම ඉස්සරිය, ඨිති, ඛණ, කාරණ යන අර්ථවල පෙනේ.

කිං පනායස්මා දෙවානමින්දො කම්මං කත්වා ඉමං ඨානං පත්තො? යාදි තන්හි ඉස්සරිය යන අරුත්හි දක්නා ලැබේ.

ඨාන කුසලො හොති අකබන වෙදි යනාදි තන්හි ඨිතියෙහිය.

ඨාන සො චෙතං තථාගතං පටිභාති යනාදි තන්හි ඛණ (ක්‍ෂණය) යන අරුත්හිය.

ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යාදි තන්හි කාරණයෙහිය. මෙහිද්‍ද කාරණ අරුතෙහිම වේ. ඒ එසේමැයි. කාරණය තෙම එයට අයත් පැවතුම් ඇති බැවින් එහි ඵලය (රඳ) සිටීද, එහෙයින් ඨාන යයි කියනු ලැබේ.

ඉමිනා පඨමෙන ඨානෙන ථෙරා භික්ඛු ගාරය්හා යන මෙහි ගාරයහා ගැරහිය යුත්තාහුය. ථෙර නම් වූවාහු, ආරණ්‍ය සේනාසනයන්ද, වනයෙහි දුර සෙනසුන් ද, වනයෙහි ඉතා දුර සෙනසුන් ද, කරා නොඑළඹෙති. ග්‍රාමාසන්න සෙනසුන් නොහරිති. සමූහයා මැද විසීම (සංගණිකාරාමතාව) වඩමින් වාසය කරති. කාය විවේකය ද නොපුරත්. නවක, මධ්‍යම කාලයෙහි කෙබඳු වූවාහුදැයි මෙසේ නින්දා කළයුත්තාහු වෙති. ඇවැත්නි, මේ නින්දාව ලබත් යයි දක්වයි. දුතියෙන ඨානෙන යන මෙහිද්‍ද, මොවුහු වනාහි ස්ථවිර වූවාහුම, යම් ධර්මයක්හුගේ ප්‍රහාණයක් බුදුරදහු වදාළ සේක්ද, ඒ ලෝභාදි ධර්මයන් දුරු නොකෙරෙත්. අසුරුසනක් ගසන කාලයකුදු එකත්පසක සිට චිත්ත එකඟතාවක් නොලබත් ද, නවක මධ්‍යම කාලයන්හි කෙබඳු වූවාහුදැයි මෙසේ නින්දා කටයුත්තාහු වෙත්. ඇවැත්නි, මේ නින්දාව ලබත් යයි දක්වයි යයි මෙසේ යෙදීම කටයුත්තේය.

තතියෙන යන මෙහි ද ඇවැත්නි, මොවුහු ස්ථවිර වූවාහු ඉතිරිතර (ලද දෙයින්) ප්‍රත්‍යයන් නොයැපෙති. චීවර - ලදසෙනසුන් - කුණුකය සැරසීමෙහි යෙදුනාහු වාසය කෙරෙති. උපධි විවේකය නොපුරමින් නවක මධ්‍යම කාලයෙහි කෙබඳු වූවාහුදැයි මෙසේ නින්දා කළයුත්තාහු වෙති. ඇවැත්නි, මේ නින්දාව ලබත් යයි දක්වතියි මෙසේ යෙදීම් කළයුතුයැ. මජ්ඣිම, නවක වාරයන්හිද මේ ක්‍රමය මැයි. මේ කියනු ලබන්නේ විශේෂයයි.

මජ්ඣිමා යනු වස් පසේ සිට නව වස දක්වා වූවහු කියනු ලබත්. නවා යනුවෙන් ඌන වූ පස්වස් වූවෝ කියනු ලබති.

නව, මධ්‍යම කාලයෙහි කෙබන්දෝ වූවාහුදැයි කියන ලද්දේ ද, එපරිද්දෙන් මෙහි නවක කාලයෙහි කෙබඳු වූවාහු ද, ස්ථවිර කාලයෙහි කෙබඳු වන්නාහුදැයි මධ්‍යම ස්ථවිර කාලයෙහි කෙබඳු වන්නාහුදැයි කියා යෙදිය යුතුයැ. මේ අකුසල පක්‍ෂයෙහි කියන ලද්දට විරුද්ධ පරිදි කුසල පක්‍ෂයෙහි අරුත් දතයුත්තේය. මේ වනාහි මෙහි සාපේක්‍ෂයයි.

මොවුහු ඒකාන්තයෙන් ස්ථවිර වූවාහුද, යොදුන් පිළිවෙලින් ආරණ්‍ය සේනාසන ද, වනමැද සෙනසුන් ද වනයේ ඉතා දුර සෙනසුන් දි සේවනය කෙරෙති. ග්‍රාමාසන්න සෙනසුනකට පැමිණිය යුතු කල්හිද නොඑළඹෙත්. මෙසේ ජීර්ණ වූ ශරීර ඇත්තේ ද, ආරබ්ධ වීර්ය ඇත්තාහු ප්‍රත්‍ය දායකයන්ගේ ප්‍රසාදය උපදවත්. නවක මධ්‍යම කාලයෙහි කෙබඳු වූවාහුදැයි මේ පළමුවන කරුණින් ස්ථවිර භික්‍ෂූහු පැසසිය යුත්තාහු වෙති. පැසසුම් ලබති. ලෝභ ආදිය දුරුකොට චිත්ත විවේකය පුරති. මේ මහා ස්ථවිරද, සද්ධිවිහාරික, අන්තේවාසිකයන් විසින් පිරිවරන ලදුව වාසය කරන්ට සුදුසු කාලයෙහිද මෙවන් වාසයට පත්ව වසන කාලයෙහිද, බත්කිස කොට, ප්‍රවිෂ්ට වූයේ සවස නික්මෙයි. සවස ප්‍රවිෂ්ට වූයේ උදෑසන නික්මෙයි. කසින පරිකර්ම ආදිය කෙරෙයි. සමවත් උපදවයි. මාර්ගඵලයන්ට පැමිණෙයි. සර්වප්‍රකාරයෙන් චිත්ත විවේකය පුරයි.

මේ දෙවෙනි කාරණයෙනුදු ස්ථවිර භික්‍ෂූහු පැසසිය යුත්තෝ වෙති. ප්‍රශංසා ලබත්. යම්කලෙක තෙරුන්ට පට දුහුල් කෝසෙය්‍යාදි, සුව පහස් ඇති සැහැල්ලු සිවුරු යෝග්‍ය වෙත් ද, ඒ කාලයෙහිත් මේ මහා ස්ථවිර තෙම පාංශුකූල චීවරය දරයි. සසුන ලිහිල්කොට නොගෙන දුරුකරන ලද නීවරණ ඇත්තේ ඵල සමවත් වඩා උපධි විවේකය සම්පූර්ණ කරමින් වාසය කෙරෙයි. නවක, මධ්‍යම කාලයේ කෙබඳු වූවාහු දැයි මේ තෙවෙනි කාරණයෙන්ද ස්ථවිර භික්‍ෂූහු ප්‍රශංසා කටයුත්තාහු යැයි ප්‍රශංසා ලබති. මජ්ඣිම - නවක වාරවලද මේ ක්‍රමය මැයි.

**තත්‍රාවුසො** යනු, අනුසන්ධි කවරේද? මෙසේ නව ආකාර වූ ආමිෂ දායාද, පටිපදාවට නින්දා කරන්නේ නව ආකාර වූ ධම්මදායාද පටිපදාවට පසසන්නේ, අටලොස් අයුරකින් දේශනාව නිමාවට පත්කොට යම් ඒ ධර්ම කෙනෙක් **යෙසඤ්ච ධම්මානං සත්ථා පහානමාහ, තෙච ධම්මෙ නප්පජහන්ති** යයි මෙසේ ප්‍රහාණය කළයුතු ධර්මයෝ දක්වන ලද්දාහුද, ඔවුන්ගේ ස්වරූප දක්වන්ට මේ **තත්‍රාවුසො** ලොභොච යනාදිය කීහ. මේ

අනුසන්ධියයි. තවද යට පරියායෙන්ම ධර්මය කියන ලද්දේය. ආමිෂය වනාහි පරියායෙන් ද නිප්පරියායෙන් ද කියන ලදී. දැන් නිෂ්පර්යාය ධර්මය වූ ලෝකෝත්තර මාර්ගය දක්වන්ට මෙය කීහ. මේ මෙහි අනුසන්ධියයි.

එහි තත්‍ර යනු අතීත දේශනාව දැක්වීමයි. **සත්‍ථු පවිවිත්තස්ස විහරතො සාවකා විවෙකං නානු - සික්ඛන්ති** යනාදි නයින් වදාළ දේශනාවෙහි යයි කියන ලද්දේ වෙයි. **ලොභොච පාපකො දොසොච පාපකො** යනුවෙන් ධර්මයෝ දෙදෙන පාපකයෝය. ලාමකයෝය. මේ ප්‍රහාණය කළ යුත්තාහු යයි දක්වන ලද්දාහු වෙති. එහි ලුබ්භනය (ඇලීම) ලක්‍ෂණකොට ඇත්තේ ලෝභය නම් වේ. දුස්සන (දූෂ්‍යවීම) ලක්‍ෂණකොට ඇත්තේ දෝස නම් වේ. ඔවුන් අතුරෙහි ලෝභය ආමිෂ දායාද කොට ඇත්තහුට ප්‍රත්‍යයන්ගේ ලැබීමෙහි දී වෙයි. ද්වේෂය ප්‍රත්‍යයන්ගේ නොලැබීමෙහි දී වෙයි. ලෝභය හේතුවෙන් නොලත් දෙය පතයි. ද්වේෂය හේතුවෙන්, නොලබන්නේ වෛරය ඇති වේ. ලෝභය දෙය්‍ය ධර්මයෙහි වෙයි. ද්වේෂය නොදෙන්නහු කෙරෙහි හෝ නොමනා දෙය දෙන්නහු කෙරෙහි හෝ වෙයි. ලෝභයෙන් නවවැදෑරුම් තණ්හා මූලක ධර්මයන් සම්පූර්ණ කෙරෙයි. ද්වේෂයෙන් පස්ආකාර මසුරුභාවයන් සම්පූර්ණ කෙරෙයි. මෙවිට ඔවුන්ගේ ප්‍රහාණ උපාය දක්වන **සේක් ලොභස්ස ච පහානාය** යනාදිය කීහ.

එහි අර්ථය නම්, ඒ ලාමක වූ ලෝභයාගේ ද්වේෂයාගේ ද ප්‍රහාණය පිණිස මධ්‍යම ප්‍රතිපදා තොමෝ ඇතැයි මාර්ගය සඳහා කියන ලදී. යම් හෙයකින් මාර්ගය තෙම ලෝභය එක් අන්තයකැයිද ද්වේෂය එක් අන්තයකැයිද, මේ අන්ත දෙකට නොඑළඹේද, නොපැමිණේ ද, මේ අන්ත දෙකින් විශේෂයෙන් මිදුනේද එහෙයින් **මජ්ඣිම පටිපදා** යයි කියනු ලැබේ. මොවුන්ගේ මධ්‍යයෙහි වූ හෙයින් මජ්ඣිමා නම්ද පිළිපැදිය යුතු හෙයින් පටිපදා නම් ද වේ. එසේම කාමසුඛල්ලිකානු යෝගය එක් අන්තයෙක. අත්තකිලමථානුයෝගය එක් අන්තයක. ශාස්වත දෘෂ්ටිය එක් අන්තයක. උච්ඡෙද දෘෂ්ටිය එක් අන්තයෙකැයි පළමු නයින්ම විස්තර කළයුතුය. **චක්ඛුකරණී** යනාදියෙන් එම ප්‍රතිපදාව පසසයි. ඒ එසේ මැයි. මෝ පටිපදා තොමෝ දර්ශනයෙහි පරිණායක (අධිපති) අර්ථයෙන් සත්‍යයාගේ දර්ශනය පිණිස පවතීනුයි **චක්ඛුකරණී** නම් වේ. විදිත (ප්‍රකට) කරන අර්ථයෙන් **ඤාණකරණී** නම් වේ. රාගාදීන්ගේ සංසිඳීම පිණිස

උපසමය පිණිස පවත්නා හෙයින් (උපසමය සංවත්තති) යනු වේ. චතුරාර්ය සත්‍යය විශිෂ්ට ඥාණයෙන් දතයුතු බව දක්වන හෙයින් අභිඤ්ඤාය සංවත්තති (සත්‍ය ඥාණය පිණිස පවත්නීය.) සම්බොධ නම් මාර්ගයයි. ඒ මාර්ගය පිණිස පවත්නා හෙයින් සම්බොධාය සංවත්තති (සම්බෝධිය පිණිස පවත්නීය) ඒ එසේමැයි මාර්ගයට මාර්ගය පිණිස පවත්නේය. මාර්ගයෙන් කළයුතු කිස කරන හෙයිනි. නිබ්බානයාගේ සාක්ෂාත් කිරීම පිණිස ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නා හෙයින් නිබ්බානාය සංවත්තති (නිවන් පිණිස පවතීයයි) කියනු ලැබේ. මේ මෙහි සාරයයි.

මජ්ඣිමා පටිපදා

මෙයින් අත්‍යාකාර වූ වර්ණනාවන් ප්‍රපඤ්ච (විස්තර)යන් වන්නේය. මේ වනවිට ඒවා මජ්ඣිම පටිපදාවට අයත්කොට දක්වනු කැමැත්තේ කතමා ච සා යනුවෙන් විචාරා අයමෙව යනාදි නයින් විසදයි. එහි අයමෙව යනු අවධාරණ වචනයි. අන්‍ය මාර්ග ප්‍රතිශේධය පිණිස ද, බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ - බුද්ධ ශ්‍රාවකයන්ට සාධාරණ බැව් දැක්වීම පිණිසද වෙයි. මෙසේ කියන ලද්දේද වෙයි. එසොව මග්ගො නත්ථඤ්ඤො දස්සනස්ස විසුද්ධියා යනුවෙන් ඒ මේ මාර්ගය තෙම කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින් ද අරිය නම් වේ. කෙලෙස් සතුරන් දුරුකළ හෙයින් ආර්ය වූ බුදුරදුන් විසින් දේශිත හෙයින් ද ආර්යභාවය පිණිස පවතීනුයි ආර්ය නම් වේ. අංග අටකින් යුක්ත බැවින් අට්ඨංගික නම් වේ. පඤ්චාංගික තූර්ය මෙන් අංග විනිර්මුක්ත වූයේ නොවෙයි. කෙලෙසුන් නසමින් යේනුයි හෝ නිර්වාණ මාර්ග ගවේෂණය කෙරෙනුයි හෝ නිවන් කැමැත්තන් පයින් යනු ලැබේනුයි හෝ ඔවුන් විසින් පිළිපදිනු. ලැබේනුයි හෝ මගග නම් වේ.

සෙය්‍යථීදං යනු නිපාතයකි. හේ කවරේද, යනු ඒ නිපාතයාගේ අර්ථයයි. නැතහොත් ඒ ඒ අෂ්ඨාංගයෝ හෝ කවරහුද? එක එක අංගය මග්ග නම් වේ. එහෙයින් වදාළහ.

සම්මා දිට්ඨි මග්ගො චෙව හෙතුච යයි පෝරාණයෝ කියති. දස්සන මග්ගො සම්මා දිට්ඨි, අභිනිරොපන මග්ගො සම්මා සංකප්පො - පෙ- අවික්ඛෙප මග්ගො සම්මා සමාධි යනුවෙන්.

සම්මා දස්සන ලක්ඛණො සම්මා දිට්ඨි = මනාකොට දැකීම ලක්ෂණකොට ඇත්තේ, සම්මා දිට්ඨි නම් වේ.

සම්මා අභිනිරොපන ලක්ඛණො සම්මා සංකප්පො, මනාකොට අරමුණට නැගීම ලකුණුකොට ඇත්තේ සම්මා සංකප්ප නම් වේ.

සම්මා පරිග්ගහ ලක්ඛණ සම්මා වාචා - මනාකොට ගැනීම ලකුණු කොට ඇත්තේ සම්මා වාචා නම්.

සම්මා සමුට්ඨාපන ලක්ඛණො සම්මා කම්මන්තො මනාකොට සමුට්ඨාපන (හටගැන්වීම) ලකුණුකොට ඇත්තේ සම්මා කම්මන්ත නම් වේ.

සම්මා වොදාන ලක්ඛණො සම්මා ආජීවො මනාකොට වෝදානය (පිරිසිදු කිරීම) ලකුණුකොට ඇත්තේ සම්මා ආජීව නම් වේ.

සම්මා පග්ගහ ලක්ඛණො සම්මා වායාමො මනාකොට පග්ගහය (උත්සාහය) ලක්ෂණකොට ඇත්තේ සම්මා වායාම නම් වේ.

සම්මා උපට්ඨාන ලක්ඛණා සම්මා සති, මනාකොට උපට්ඨානය (වැටහීම) ලකුණුකොට ඇත්තේ සම්මා සති නම් වේ.

සම්මා සමාධාන ලක්ඛණො සම්මා සමාධි මනාකොට සමාධානය (එකඟ කිරීම) ලකුණුකොට ඇත්තේ සම්මා සමාධි නම් වේ. ඔවුන්ගේ නිර්වචනයන් මනාකොට දකින්නුයි සම්මා දිට්ඨී නම් වේ. මේ නයින්ම දතයුත්තේයැ.

ඔවුනතුරෙහි සම්මා දිට්ඨී තොමෝ උපදින්නී මිච්ඡා දිට්ඨීය ද, ඒ සම්මා දිට්ඨීයද විරුද්ධ වූ කෙලෙස් ද අවිජ්ජාව ද දුරුකෙරෙයි. නිවන ද අරමුණු කෙරෙයි. ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන් ද දකියි. ඔවුහු ද නොමුලා බැවිනි. අරමුණු හෙයින් නොවේ. එහෙයින් සම්මා දිට්ඨී යයි කියනු ලැබේ.

සම්මා සංකප්පය තෙම, මිථ්‍යා සංකප්ප ද (සම්මා සංකප්පයට) විරුද්ධ කෙලෙස් ද දුරු කෙරෙයි. නිවන ද අරමුණු කෙරෙයි. ඒ හා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් ද මනාකොට අරමුණට නගයි. එහෙයින් සම්මා සංකප්ප යයි කියනු ලැබේ.

සම්මා වාචා වෙත් මිච්ඡා වාචාවන්ද (සම්මා වාචාවට) විරුද්ධ කෙලෙස් ද දුරුකෙරෙයි. නිර්වාණයද අරමුණු කෙරෙයි. ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන් ද මනාකොට පරිග්‍රහණය කෙරෙයි. එහෙයින් සම්මා වාචා යයි කියනු ලැබේ.

සම්මා කම්මන්තය තෙම මිච්ඡා කම්මන්තයද (සම්මා කම්මන්තයට) විරුද්ධ කෙලෙස් ද, දුරු කෙරෙයි. නිවන ද අරමුණ කෙරෙයි. ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන් ද මනාකොට උපදවයි. එහෙයින් සම්මා කම්මන්ත යයි කියනු ලැබේ.

සම්මා ආජීවය තෙම මිච්ඡා ආජීවයද (සම්මා ආජීවයට) විරුද්ධ කෙලෙස් ද දුරුකෙරෙයි. නිවන ද අරමුණු කෙරෙයි. සම්ප්‍රයුක්ත ධර්මයන්ද මනාකොට පිරිසිදු කෙරෙයි. එහෙයින් සම්මා ආජීව යයි කියනු ලැබේ.

සම්මා වායාම තෙම මිච්ඡා වායාමයද සම්මා වායාමයට විරුද්ධ කෙලෙස්ද කුසීත බවද දුරුකරයි. නිවන අරමුණු කෙරෙයි. සම්ප්‍රයුක්ත ධර්මයන් ද මනාකොට අනුබල දෙයි. එහෙයින් සම්මා වායාම යයි කියනු ලැබේ.

සම්මා සතිය තොමෝ මිච්ඡා සතිය ද (සම්මා සතියට) විරුද්ධ කෙලෙස් ද දුරුකෙරෙයි. නිවන අරමුණු කෙරෙයි. සම්ප්‍රයුක්ත ධර්මයන්ද මනාකොට එළවයි. එහෙයින් සම්මා සතියයි කියනු ලැබේ.

සම්මා සමාධිය තෙම මිච්ඡා සමාධිය ද (සම්මා සමාධියට) විරුද්ධ කෙලෙස් ද දුරුකෙරෙයි. නිවන ද අරමුණු කෙරෙයි. සම්ප්‍රයුක්ත ධර්මයන්ද මොනවට පිහිටුවයි. එහෙයින් සම්මා සමාධියයි කියනු ලැබේ.

දැන් අයං ඛො සා ආවුසො යනුවෙන් එම ප්‍රතිපදාවම නිගමන කරමින් වදාළහ. ඒ දේශනාවගේ අර්ථය නම්? සතර ලෝකෝත්තර මාර්ගයන්ම එක්කොට කියන ලද යම් මේ අෂ්ටාංගික මාර්ගයක් වේ ද, ඇවැත්නි, ඕ තොමෝ -පෙ- නිවන පිණිස පවතින්නී යයි, මෙසේ පහකටයුතු ධර්මයන් අතුරෙන් ලෝභය හා ද්වේෂයද, ඔවුන් ප්‍රහාණය කිරීමේ උපායද දක්වා දැන් අනිකුදු දුරුකළ යුතු ධර්මද ඔවුන්ගේ දුරුකරන උපායන් ද දක්වන්නේ, තත්‍රාවුසො කොධොච යනුවෙන් මේ ආදිය කීහ.

ඔවුන් අතුරෙහි ක්‍රෝධය තෙම, කිපීම ලක්‍ෂණකොට ඇත්තේය. නපුරු බව ලකුණුකොට ඇත්තේද හෝ වෙයි. වෛරය කෘත්‍ය කොට ඇත්තේය. දූෂණය වැටහීම කොට ඇත්තේය.

උපනාහය තෙම බැඳගෙන පැවැත්ම ලක්‍ෂණයයි. වෛර අත් නොහැරීම රසයයි. (කෘත්‍යයයි.) ක්‍රෝධය ලුහුබඳනා බව වැටහීමයි. (පච්චුපට්ඨානයයි) මෙසේ කියන ලද්දේ වෙයි. පුබ්බකාලෙ කොධො අපරකලෙ උපනාහො යනුයි.

මක්ඛො = මකුබව = අනුන්ගේ ගුණ මැකීම ලක්‍ෂණයයි. ඒ ගුණයන් නැසීම කෘත්‍යයයි. එය වැසී වැටහීමයි. (පච්චුපට්ඨානයයි)

පළාස - යුගග්‍රාහය (තමා ගුණ නැතිව ගුණවතුන් හා සමාන කොට සිතීම) ලක්‍ෂණයකි. අනුන්ගේ ගුණයන් තමන්ගේ ගුණයන් සමාන කිරීම කෘත්‍යයයි. රසයයි. මෙරමාගේ ගුණ පමණින් වැටහීම පච්චුපට්ඨානයයි. වැටහීමයි.

ඉස්සා තොමෝ අනුන්ගේ සැපතට නුගුණ කීම එහි ලක්‍ෂණයයි. අනුන් සැප නොඉවසීම ලක්‍ෂණකොට ඇත්තේ හෝ වෙයි. එහි නොඇලීම කෘත්‍යයයි. එයින් විමුඛ බව වැටහීමයි. (පච්චුපට්ඨානයයි).

මච්ඡරී මසුරු බව, තම සම්පත් සැඟවීම ලක්‍ෂණයයි. තමාගේ සම්පත් හා අනුන් හා සාධාරණ බව සැපයක් නොවන බව සිතීම කෘත්‍යයයි. හැකිලීම වැටහෙන ආකාරයයි.

මායා මෝ තොමෝ කළ පව් වැසීම ලක්‍ෂණය කොට ඇත්තීය. පාපය සැඟවීම එහි කෘත්‍යයයි. එය ආවරණය කිරීම පච්චුපට්ඨානයයි, වැටහෙන ආකාරයයි.

සාඨෙය්‍යං (කපටි බව) තමා තුළ නැති ගුණ පහළ කිරීම ලක්‍ෂණයයි. ඒ ගුණයන් ව්‍යවහාර කිරීම කෘත්‍යයයි. ශරීරයෙන් ඉඟිවලින් එය ප්‍රකට කිරීම පච්චුපට්ඨානයයි.

ථම්භො සිතේ තදගතිය චිත්තයාගේ ඉදිමුණ බව ලක්‍ෂණයයි. යටහත් පැවැත්මක් නැති බව කෘත්‍යයයි. නොමුදු බව පච්චුපට්ඨානයයි.

සාරම්භො (එකට එක කිරීම) කළාට වැඩියක් කිරීම ලක්‍ෂණයයි. අහංකාරකම කෘත්‍යයයි. විරුද්ධ බව කෘත්‍යයයි. අගෞරවය පච්චුපට්ඨානයයි.

මානො උණ්ණතිය (උසස්යැයි හැඟුම) ලක්‍ෂණයයි. අහංකාරය කෘත්‍යයයි. උද්ධුමාත භාවය පච්චුපට්ඨානයයි.

අධිමානො අතිශයින් උණ්ණතිභාවය ලක්‍ෂණයයි. අතිශයින් අහංකාරය කෘත්‍යයයි. අතිශයින් ඉදුමුණු බව පච්චුපට්ඨාන යයි.

මදො මදය තෙම, මත්වූ බව ලක්‍ෂණයයි. මද ගැන්වීම කෘත්‍යයයි. උන්මාදය පච්චුපට්ඨාන නම් වේ.

පමාදො ප්‍රමාදය තෙම, පංචකාම ගුණයන්හි සිත බැසගැනීම ලක්‍ෂණයයි. (වොසසග්ගානුපපදානය) පරිත්‍යාගයෙන් තොරවීම කෘත්‍යයයි. සිහිමුලාවීම පච්චුපට්ඨානයයි. මෙසේ මේ ධර්මයන්ගේ ලක්‍ෂණාදිය දතයුත්තාහුය. මේ මෙහි සාරාංශයයි. විස්තර වනාහි තත්‍ථ කතමො කොධො යනාදීන් විභංගයෙහි කී න්‍යායෙන් දතයුත්තේය.

විශේෂ වශයෙන් මෙහි තමා ආමිෂ දායාදය නොලබන්නේ එය ලබන්නා වූ අනිකෙකුට කීවේය. ඔහුට වරක් උපන්නේ ක්‍රෝධ නම් වේ. මත්තෙහි උපන් ක්‍රෝධය උපනාහ නම් වේ. හේ මෙසේ කිපියේ ක්‍රෝධ බැඳගෙන පවත්වන්නේ ලාභි වූ අනිකෙකුගේ විද්‍යමාන ගුණය මකයි. මමත් එබඳු යයි යුගග්‍රාහය ගනියි. මේ ඔහුගේ මකුබවද පළාසය ද වෙයි. හෙතෙම මෙසේ මකුවූයේ පළාසී වූයේ ඔහුගේ ලාභසත්කාර ආදිය මොහුට මෙයින් කිමැයි ඊර්ෂ්‍යා කෙරෙයි. දෘෂ්‍ය වෙයි. මෝ ඔහුගේ ඊර්ෂ්‍යාවයි. ඉදින් ඕහට යම් සැපතක් වන්නේ ද ඒ සැපතගේ ඔහු හා සාධාරණ බව නොඉක්මවයි. මේ මොහුගේ මසුරුබවයි. ලාභ හේතුවෙන් තමාගේ විද්‍යමාන දෝෂයන් වසන් කරයි. මේ ඔහුගේ මායාවයි. නැති ගුණයන් ප්‍රකට කරයි. මේ ඔහුගේ ශට බවයි. හෙතෙම මෙසේ කටයුතු කරන්නේ අදහස් වූ පරිදි ලාභය ලබයි ද එයින් තද්ධ වූයේ වෙයි.

නොමුදු සිත් ඇත්තේ වෙයි. මෙය මේ වූ පරිදි නොකළ යුතුය. අවවාද කරන්ට නොහැකි වූයේ වෙයි. මේ ඔහුගේ ථමහ භාවයයි. ඉදින් ඔහුට කිසිවෙක් කිසිවක් කියා ද, මේ මෙසේ නොකට යුතුයයි කියයි. කෝප සහිත සිත් ඇත්තේ හකුළුවන ලද මුහුණු ඇත්තේ වෙයි. නුඹ මගේ කවරෙක්දැයි බලහත්කාරයෙන් කියන්නේ වෙයි. මේ ඔහුගේ සාරම්භයයි. නැවත සිත දැඩි බැවින් මම උතුම්යයි තමා ගැන සිතන්නේ මාන ඇත්තේ වෙයි. සාරම්භය හේතුවෙන් මොවුහු කවරහුදැයි මෙරමා ඉක්මවා සිතන්නේ අතිමානි වෙයි. මේ ඔහුගේ මානය ද අතිමානයද වෙයි. හෙතෙම එම මානාති මානයෙන් ජාතිමදාදී අනේක වූ මදයන් උපදවයි. මත්වූයේ ම කාම ගුණාදි භේද වූ වස්තු විෂයෙහි ප්‍රමාද වෙයි. මේ ඔහුගේ මදය සහ ප්‍රමාදය වෙයි.

මෙසේ ආමිෂ දායාදයෙන් නොමිදුනේ වෙයි. මේ පාපක ධර්මයන්ගෙන් ද අන්‍ය වූ මෙවන් පාපී ධර්මයන්ගෙන් ද මෙසේ පළමුකොට එහි දුරු කළයුතු ධර්ම දතයුත්තාහුය. ප්‍රහාණ උපාය වනාහි පාඨ වශයෙන් ද අර්ථ වශයෙන් ද සියලු තන්හි විශේෂයක් නැත්තේ මයි. ඥාන පරිචයාගේ දක්ෂ බව පිණිස මෙහි භේදයද, ක්‍රමයද භාවනා නයද දතයුත්තේය.

පළමුකොට එහි භේදය කියනු ලැබේ. මෙම මධ්‍යම ප්‍රතිපදාව, කිසිකලෙක ආර්ය අෂ්ටාංගික මාර්ගය වෙයි. කිසිකලෙක සප්තාංගික වෙයි. ඒ එසේමැය. මේ මාර්ගය තෙම ලෝකෝත්තර ප්‍රථමධ්‍යාන වශයෙන් උපදින්නේ අෂ්ටාංගික වෙයි. සෙසු ධ්‍යානයන්ගේ වශයෙන් සප්තාංගික වෙයි. උත්කෘෂ්ට නිර්දේශ වශයෙන් මෙහි අට්ඨංගික කියන ලද්දේ වෙයි. මෙයින් මත්තෙහි මාර්ග අංගයෙක් නැති. මෙසේ පළමුකොට මෙහි භේදය දතයුත්තේය. යම්හෙයකින් සියලු කුසලයන්ට සම්මා දිට්ඨිය ශ්‍රේෂ්ඨ වන්නේ ද එහෙයින් වදාළහ. **පඤ්ඤාහි සෙට්ඨා කුසලා වදන්ති** යනුවෙන් කුසල වාරයන්හිත් පූර්වංගම වන්නීද, වදාළේ මැනො. **කථඤ්ච භික්ඛවෙ, සම්මා දිට්ඨී පුබ්බංගමා හොති, සම්මා දිට්ඨිං සම්මා දිට්ඨීති පජාහාති මිච්ඡා දිට්ඨිං මිච්ඡා දිට්ඨීති පජානාති** යනු විස්තරයයි. මෙයත් වදාළහ. **විජ්ජාච ඛො භික්ඛවෙ, පුබ්බංගමා කුසලානං ධම්මානං සමාපත්තියා** යනුවෙන් සෙසු අංගයෝ තත් ප්‍රභවයෙන් පහළ වූවාහුද, එයින් වදාළහ. **සම්මා දිට්ඨිස්ස සම්මා සංකප්පො පහොති -පෙ- සම්මා සතිස්ස සම්මා සමාධි පහොති** යනුයි මේ ක්‍රමයෙන් මේ අංගයෝ කියන ලද්දාහු යයි මෙසේ මෙහි මෙම ක්‍රමය දතයුත්තේය.

භාවනා නය යනු කිසිවෙක් සමථ පුබ්බංගම විපසසනාව වඩයි. කිසිවෙක් විපසසනා පුබ්බංගම සමථය වඩයි. කෙසේ මෙම සසුනෙහි ඇතැමෙක් පළමුකොට උපචාර සමාධිය හෝ අප්පණා සමාධිය උපදවයිද මේ සමථයයි. හෙතෙම එම සමථයද ඒ හා යෙදුන ධර්මයන් ද අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කරයි. මේ විදස්සනාවයි. මෙසේ පළමුකොට සමථයද පසුව විපස්සනාවද වෙයි. එයින් කියනු ලැබේ. සමථ පුබ්බංගමං විපසසනං භාවෙති යනුවෙන්, ඒ සමථ පුබ්බංගම වූ විපස්සනාව වඩන්නහුට මාර්ගය උපදියි. හෙතෙම ඒ මාර්ගය ආසේවන කෙරෙයි. භාවනා කරයි. බහුල වශයෙන් කරයි. ඒ මාර්ගය සේවනය කරන්නා වූ භාවනාව වඩන්නා වූ බහුල වශයෙන් කරන්නා වූ ඔහුගේ සංයෝජන ධර්මයෝ ප්‍රහාණය වෙති. අනුසය ධර්මයෝ අවසන් වෙති. මෙසේ සමථ පුබ්බංගම වූ විපස්සනාව වඩයි. මේ ශාසනයෙහි ඇතැම් කෙනෙක් ඉහත සඳහන් සමථය නො උපදවාම පංච උපදානකබන්ධයන් අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කෙරෙයි.

මෝ තොමෝ විපස්සනා භාවනා නම් වන්නීය. ඔහුට විපස්සනාව සම්පූර්ණ වීමෙන් එහි හටගත් ධර්මයන්ගේ නිවන් අරමුණුකොට චිත්තයාගේ එකඟ බවක් ඇතිවේ. එය සමථ නම් වේ. මෙසේ පළමුව විපස්සනාවද පසු සමථයද වේ. එයින් කියනු ලැබේ. විපසසනා පුබ්බංගමං සමථං භාවෙති කියා.

මෙසේ විපස්සනා පුබ්බගම වූ සමථය වඩන්නා වූ ඔහුට මාර්ගය උපදියි. හෙතෙම ඒ මාර්ගය ආසේවනය කෙරෙයි. -පෙ- බහුල වශයෙන් කෙරෙයි. එම මාර්ගය සේවය කළහුට -පෙ- අනුශය ධර්මයෝ විනාශයට පැමිණෙති. මෙසේ විපස්සනා පුබ්බංගම සමථය වඩයි. සමථ පුබ්බංගම විපස්සනාව වඩන්නහුටද විපස්සනා පුබ්බංගම සමථය වඩන්නහුටද ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි සමථ විපස්සනා යුගල වූවාහුම වෙත්. මෙසේ මේ භාවනා නය දතයුත්තේය.

ධම්මදායාද සූත්‍ර වර්ණනාව නිමි.

## 1-1-4

එවං මෙසුතං යනු භයභේරව සූත්‍රයයි. මේ එහි අනුපූර්ව පද වර්ණනාවයි. අථ යනු අවිච්ඡේදාර්ථයෙහි (නොසිඳී පැවැත්ම) නිපාතයකි. ඛො යනු අවධාරණාර්ථයෙහිය. භාග්‍යවතුන් වහන්සේගේ සැවැත්නුවර වාසය නොනිමි කල්හි යයි කියන ලද්දේ වෙයි.

ජාණුසෙසාණි යනු මේ ඔහුගේ මව්පියන් විසින් කළ නාමයක් නොවේ. කෙසේද යත් තනතුරු නිසා ලබන ලද්දකි. මේ ජාණුසෙසාණි තනතුර නම් පුරෝහිත තනතුරයි. එය ඔහුට රජු විසින් දෙන ලදී. එබැවින් ජාණුසෙසාණි යයි කියනු ලැබෙත්. බ්‍රහමං අණති වේදය හදාරත්නුයි බ්‍රාහ්මණ නම් වේ. මන්ත්‍ර සජ්ඣායනය කෙරේනුයි යන අර්ථයයි. මෙයම උපතින් බ්‍රාහ්මණ වූවන්ට නිරුත්ති වචනයකි. ආර්යයෝ වනාහි දුරුකළ පව් ඇති බැවින් බ්‍රාහ්මණ නම් වෙති යයි කියනු ලබත්. යෙන භගවා තෙනුපසංඛමි යන මෙහි යෙන යනු ආධාරාර්ථයෙහි කරණ වචනයයි. එහෙයින් යම් තැනෙක්හි භාග්‍යවතුන් වහන්සේ වෙසේද එහි එළඹියේ යයි අර්ථය දතයුතුය. යම් කරුණකින් භාග්‍යවතුන් වහන්සේ දෙව් මිනිසුන් විසින් එළඹිය යුත්තේ ද ඒ කාරණයෙන් එළඹියේ යයි මෙසේත් මෙහි අරුත් දත යුත්තේය. කිනම් කරුණකින් භාග්‍යවතුන් වහන්සේ එළඹිය යුත්තේ ද යත්, නානාප්‍රකාර ගුණ විශේෂයන්ට පැමිණීමේ බලාපොරොත්තුවෙන්, මිහිරිඵල අනුභව කිරීමේ අදහසින් පක්ෂි සමූහයා විසින් සදා එලිත මහරුකක් වෙත එන්නාක් මෙනි.

උපසංඛමි යනු ගියේ යයි කියන ලද වෙයි. උපසංඛමිත්වා යනු එළඹීමෙහි අවසන් දැක්වීමහි නොහොත් මෙසේ ගියේ, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ ආසන්නතර ස්ථානයකම ගියේ යයි ද කියන ලද්දේ වෙයි. භගවතා සද්ධිං සමෙමොදි බමණිය ආදි (පිළිසඳර කථා ක්‍රමයෙන්) විචාරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ ඔහු සමග යම්සේ ද, එසේම හෙතෙමේත් බුදුරදුන් සමග සමානව පැවති සතුටුවීම් ඇත්තේ විය. උණුදිය සමග සිසිල් දිය මෙන් සමුදිත බවට ඒකීය බවට ගියේය.

භවත් ගෞතමයන් වහන්ස, ඔබට ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? භවත් ගෞතමයන් වහන්සේට ද ගෞතම ශ්‍රාවකයන් වහන්සේලාටද ස්වල්ප වූ ආබාධ ඇත්තේ ද ස්වල්ප වූ රෝග ඇත්තේ ද

සිරුරේ සැහැල්ලු බව ඇත්තේ ද, කාය බල ඇත්තේ ද? පහසු විහරණ ඇත්තේ ද යනාදී වූ යම් කථාවකින් සතුටු වූයේ ද, ඒ කථාව ප්‍රීතිය-ප්‍රමෝදය-සතුට උපදවන බැවින් ද සමෙමොදනීය නම් වේ.

අර්ථ ව්‍යඤ්ජන මධුර භාවයෙන් ද, ඉතා දිගුකලක් සිහිකරන්ට නිතර පවත්වන්ට සුදුසු බැවින් ද, සිහි කළයුතු බැවින් ද, සාරාණිය නම් වේ. සූය මාන සුබය ඇති බැවින් ද, සමෙමොදනීය නම් වේ. සිහිකළ යුතු සැපය ඇති බැවින් ද සාරාණීය නම් වේ. එසේම ව්‍යඤ්ජන පරිසුද්ධතාවය නිසා සමෙමොදනීය නම් වේ. අර්ථයාගේ පිරිසිදු බව නිසා සාරාණීය නම් වේයයි (දතයුතුයෑ)

මෙසේ අනේක පරියාය කථාවෙන්, සතුටුවිය යුතු සිහිකටයුතු කථාකොට නිමවා, (සමෙමොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා) අවසන්කොට, නිමකොට යම් කරුණකින් ආයේද, එය විචාරනු කැමැත්තේ එකත්පසෙක හුන්නේය. එකමන්තං යනු භාව නපුංසක නිර්දේශයයි. විසමං චන්දිම සූරියා පරිවත්තනති යනාදියෙහි මෙනි.

එකත්පසෙක සිටීම

එහෙයින් යම්සේ හුන්නේ එකත්පසෙක සිටියේ ද යත්, එපරිද්දෙන් හුන්නේ යයි මෙසේ මෙහි අර්ථය දතයුත්තේය. නැතහොත් මේ සත්තමී අර්ථයෙහි ද්‍රුතියා වචනයයි. නිසිදි යනු හිඳගත්තේය. ඒ එසේමැයි. පණ්ඩිත පුරුෂයෝ වනාහි, ගරුකළ යුත්තෙකු වෙත එළඹ හිඳගැනීමේ දක්‍ෂභාවයක් ඇති බැවින් එකත්පසක හිඳිත්. මේ තෙමේ ද ඔවුන් අතුරෙන් කෙනෙකි. එහෙයින් එකත්පසක හිඳගත්තේය. කෙසේනම් හුන් කෙනෙක් එකත්පසෙක සිටියේ ද යත්, හිඳගැනීමේ දෝස භය අතහැර ඔවුහු කවරහුද? ඉතා දුරය. ඉතා ළඟය. උඩුසුළඟය. උස් පෙදෙසය. ඉතා ඉදිරිපිට, ඉතා පිටිපස යන මොවුහුයැ. ඒ එසේමැයි. ඉතා දුරින් හුන්නේ ඉදින් කථා කරන්නේ නම් ඉතා උස්හඬින් කථාකළයුතු වේ. ඉතා ළඟින් සිටියේ ගැටීම් ඇති වේ. උඩුසුළඟ පසින් සිටියහොත් සිරුරේ ගඳින් පීඩා ඇතිවේ. උස් පෙදෙසක හුන්නේ අගෞරවය ප්‍රකාශ වේ. ඉතා සම්මබව සිටිවිට බලනවිට ඇසෙන් ඇස ගැටෙයයි දතයුතුයැ. ඉතා පිටිපසින් සිටියේ ඉදින් දකිනු කැමැත්තේ බෙල්ල හරවා බැලිය යුතු වේ.

එහෙයින් මෙතෙම මේ දෝස භය වර්ජනය කොට හුන්නේය. එහෙයින් කියන ලදී. එකමන්තං නිසීදි කියා යෙමෙ යනු යෙ ඉමෙ යම්

මේ කුලපුතෙතා යනු ජාතිකුලපුතතා යයිද ආචාර කුලපුත්තා යයි කුලපුත්‍රයෝ ද්විධ වෙති. එහි තෙන ඛො පන සමයෙන රට්ඨපාලො නාම කුලපුතෙතා තසමිං යෙව ථුල්ලකොට්ඨිතො අගග කුලිකසස පුතෙතා යනුවෙන් මෙසේ ආවාහු උසස් කුලයක උපන් හෙයින් ජාති කුලපුත්‍රයෝ නම් වෙති.

යෙ තෙ කුලපුතතා සද්ධා අගාරසමා අනගාරියං පබ්බජිතා යනුවෙන් මෙසේ ආවාහු වනාහි යම්කිසි කුලයක උපන්නේ නමුදු ආචාර සම්පන්න වූවාහු ආචාර සම්පන්න කුලපුත්‍රයෝ නම් වෙති. මෙහි වූ කලී දෙකරුණින්ම කුලපුත්‍ර නම් වූවාහු වෙති.

සද්ධා ශ්‍රද්ධාවෙන්, අගාරසමා ගිහිගෙයින්, අනගාරියං, පැවිදි බවට භික්ෂු භාවයට ඒ එසේමැයි. ප්‍රව්‍රජ්‍යා තොමෝ ගිහියන් සතු වැඩ එහි නැති බැවින් අනගාරිය නම් වේ. ගිහියනට හිතවත් වූ කෘෂි කර්මාන්ත ගව කර්මාන්ත නැත්තේය යන අර්ථයි. මහණ තෙමේද අගාර කම් නැති බැවින් අනගාර නම් වේ. අනගාරිය භාවය අනගාරිය නම් වේ. පබ්බජිතා එළඹියාහු, මෙසේ සර්වප්‍රකාරයෙනුදු අනගාරිය නම් වූ පැවිද්දට ද භික්ඛු භාවයට ද, එළඹියේ යයි කියන ලද්දේ වෙයි.

පුබ්බංගමො යනු ඉදිරියෙන් යන්නා වූ නායක නම් වේ. බහුකාරො හිතවත් කටයුතු කිරීමෙන් බොහෝ උපකාර ඇත්තේ. භවං තෙසං ගොතමො සමාදපෙතා යනු භවත් ගෞතම තෙමේ ඒ කුලපුත්‍රයන් අධිසීලාදියෙහි යොදවන්නේ, හික්මවන්නේ, සා ජනතා ඒ ජනසමූහය තෙම. දිට්ඨානුගතිං ආපජ්ජති දැකීමෙන් අනුගමනයට පැමිණේ. පින්වත් ගෞතම තෙම යම් දෘෂ්ටියක් ඇත්තේද යම් ඉවසීමක් වේද, යම් රුචි කිරීමක් වේද, ඔවුහුද එම දෘෂ්ටිය ඇත්තෝ වෙති. එම ඉවසීම ඇත්තෝ වෙති. එම රුචිකිරීම ඇත්තෝ වෙති යයි (එහි) තේරුමයි. කුමක් හෙයින් මේ තෙම මෙසේ කීයේද යත්, මෙතෙම වනාහි පෙර නොයෙක් කුලපුත්‍රයන්, ගිහිගෙයි වසන්නවුන් දිව්‍යපුත්‍රයන් මෙන් පස්කම් ගුණයෙන් සේවය කරනු ලබන්නවුන් ඇතුලතද පිටතද මොනවට කරන ලද ආරක්ෂා ඇත්තවුන් දැක, ඔවුහු පසුකලෙක භාග්‍යවතුන් වහන්සේගේ මධුර හඬින් යුත් දම් දෙසුම් අසා, සැදැහැයෙන් ගිහිගෙයින් නික්ම පැවිදිව කෑම හැදීම උසස් ලෙස ඇති බැවින් සතුටු වූවත් අරණ්‍ය සේනාසනයන්හි කිසිවෙකු විසින් ආරක්ෂා නොකරන කල්හිදු ආසංඛා පරිසංඛා රහිතව

(නිසැකව) අතිශයින් සතුටු වූ අතිශයින් ඔදවැඩී ගියා වූ සිත් ඇත්තවුන් දුටුවේය. දැක ද මේ කුලපුත්‍රයන්ගේ සුබ විහරණය කවරෙකුන් නිසාදැයි සිතන්නේ, භවත් ගෞතමයන් නිසා යයි භාග්‍යවතුන් කෙරෙහි පැහැදීම ලැබුවේය. හෙතෙම එම සතුට ප්‍රකාශ කරන්ට භාග්‍යවතුන් වහන්සේ සමීපයට පැමිණියේය. එහෙයින් මෙසේ කීහ.

ඉක්බිති භාග්‍යවත් තෙම ඔහුගේ වචනය පිළිගනිමින් හා අනුමෝදන් වෙමින් ද, එව මෙතං බ්‍රාහමණ යනාදිය වදාළහ. මෙහි මේ එවං යන නිපාතය තෙම වචනය පිළිගැනීම් හා සතුටුවීම් අරුතෙහි මැයි. මමං උද්දිසස මා උදෙසා, සද්ධා ශ්‍රද්ධාවෙන්ම, න ඉණට්ඨා න භයට්ඨා (ණය අරුතින් භය අරුතින් නොවේ) යනාදිය මේ සඳහා කියන ලදී. මෙබඳු වූවන්ට භාග්‍යවත්හුම පූර්වංගම වෙති. අන්‍යයන්ට නොවෙති. දූරහි සමහවානි හි යනු ලබන්ට අමාරු වෙති. ඉවසිය නොහැකි වෙති. අල්පේශාඛ්‍යයන් විසින් බැසගන්ට නොහැකි යයි කියන ලද්දේ වෙයි.

අරඤ්ඤ වන පත්ථානි යනු අරණ්‍ය සේනාසන ද වනයෙහි දූරසෙනසුන්ද ඒ අරණ්‍ය සෙනසුන් අතුරෙහි කිසිවෙක් අභිධර්මයෙහි නිප්පරියාය වශයෙන්, නික්ඛමිත්වා බහි ඉන්දඛීලා සබ්බමෙතං අරඤ්ඤං යයි කියන ලදද, එතකුදු වුවත් පඤ්ච ධනු සතිකං පච්ඡිමං යයි අරඤ්ඤකාංගිකයන් ඉදිරිපත් කළ සෙනසුන කියන ලද්දේ වෙයි. එයම අදහස් කරන ලද්දේ යයි දතයුත්තේ යැ.

වනපත්ථං යනු ගමෙහි සීමාව ඉක්මවා යම් තැනෙක් සාතු නොලැබේ. වපුරණු නොලැබේ ද එබඳු වූ මිනිසුන් නොහැසිරෙන තැනය. මෙසේ කියන ලද වෙයි. වනපත්ථනති දූරානමෙතං සෙනාසනං අධිවචනං, වනපත්ථනති වනසණ්ඩාන මෙතං සෙනාසනං -පෙ- වනපත්ථනති භිංසනකාන මෙතං වනපත්ථනති, සලොමහංසානමෙතං - වනපත්ථනති පරියන්තානමෙතං - වන පත්ථනති න මනුස්සූපචාරානමෙතං සෙනාසනං අධිවචනං යනුවෙන් මෙහි දැක්වූ පරියන්තානං යන පරියාය හැර අනිත් පරියායන්ගෙන් වනපත්ථ සේනාසනයෝ දතයුත්තාහුය. පන්තානි කෙළවරෙහි වූ, ඉතා දුර වූ, දුක්කරං පවිවෙකං කාය විවේකය දුෂ්කර වෙයි. දූරභිරමං සිත් අලවන්ට පහසු නොවෙයි. එකත්තෙ යනු එකඟ බැව්හි මින් කුමක් දක්වයිද? කාය විවේකය කළ කල්හිදු එහි සිත අලවන්නට දුෂ්කර වෙයි. යම් හෙයකින් මේ ලෝවැසි තෙම ද්වයං ද්වයාරාම

දෙපසෙක්හි සිත් අලවන්නේ ද එහෙයිනි. හරනතිමඤ්ඤෙ පැහැර ගන්නාක් මෙනි. අනුභව කරන්නාක් මෙනි. මනො මනස, සමාධිං අලභමානසස උපචාර සමාධිය හෝ අප්පණා සමාධිය නොලබන්නහුගේ කුමක් දක්වයිද, තණපත් ආදීන්ගේ ශබ්දයන්ගෙන් ද, විවිධ වූ භය අරමුණුවලින් ද වනයෝ මෙබඳු භික්ෂුවගේ සිත කලඹවන්නාක් මෙනි යයි සියල්ල බමුණු තෙම සැදැහැයෙන් පැවිදි වූ කුලපුත්‍රයන්ගේ අරණ්‍ය වාසයෙන් විශ්මයට පත්ව කීය.

ඉක්බිති බුදුරදහු පළමු නයින්ම, එවමෙතං බ්‍රාහ්මණ යනාදි වශයෙන් ඔහුගේ වචනය පිළිගෙන අනුමෝදන් වී, යම් හෙයකින් සොලොස් තැනෙක්හි අරමුණු ගැනීම නැත්තහුට එබඳු සෙනසුන් ලබන්ට දුෂ්කර වෙත් ද, ඒ සොලොස් තැන්හි අරමුණු ගත්තහුට එසේ නොවේ යයි, තමන් වහන්සේත් බෝසත් අවදියෙහි එබඳු විය. එහෙයින් තමන් වහන්සේට එබඳු සේනාසනයන්ගේ දුරභි සම්භවත්වය දක්වන්ට මය්හම්පි බො යනාදිය වදාළහ.

එහි පුබ්බෙව සම්බොධො යනු සම්බුද්ධත්වයට පෙරම අරිය මගට පත්වීමට පෙරම කියන ලද්දේ වෙයි. අනභි සම්බුද්ධසස යනු ප්‍රතිවෙධ නොකළ සිවුසස් ඇත්තහුට.

බොධිසත්‍ව තෙම

බොධිසත්තසෙසව සතො යනු, (සම්‍යග් සම්බෝධිය) අවබෝධ කරන්නා වූම, සම්‍යග් සම්බෝධියට පැමිණෙන්ට සුදුසු වූම. නොහොත් බෝධියෙහි ඇලුනා වූ ලග්න වූම, යම් හෙයකින් දීපංකර බුදුරදුන්ගේ පාමුලදී අටවැදෑරුම් ධර්මයන්ගේ එකතුවෙන් අභිනීහාරයාගේ සමෘද්ධියෙහි පටන් තථාගත තෙම බෝධියෙහි ඇලුනේ, මා විසින් මෙයට පැමිණිය යුතුයයි, ඊට පැමිණීම පිණිස උත්සාහය නොහරිමින් ආයේ ද, එහෙයින් බෝධිසත්ත්ව යයි කියනු ලැබේ.

කසස මය්හං යනු, මෙසේ බෝසත් වූම මට යෙ බො කෙචි සමණා වා බ්‍රහමණාවා යම්කිසි පැවිද්දට පැමිණියවුන් හෝ භෝවාදීන් හෝ අපරිසුද්ධ කායකම්මනතා අපිරිසිදු වූ ප්‍රාණඝාත ආදි කාය කම්මයන්ගෙන් යුක්ත වූ, අපරිසුද්ධ කාය කම්මනත සදොස හේතු අපිරිසිදු වූ කාය කම්ම සංඛ්‍යාත තම දෝසයාගේ හේතුවෙන්, අපිරිසිදු කායකම්ම

කාරණයෙන් යයි කියන ලද්දේ වෙයි. හවෙ යනු ඒකාන්ත වචනයෙහි නිපාතයි. අකුසලං වැරදි සහිත, ආරක්‍ෂා රහිත, භයභෙරව භයද, භය උපදවන අරමුණු ද, චිත්තයාගේ තැති ගැනීම ද භයානක අරමුණට මේ නමකි. භය වැරදි සහිත අරුතින් අකුසල නම් වේ. භය අරමුණ, ආරක්ෂා රහිත අරුතින් අකුසලයයි ද දතයුතුයැ. අවහයනනි කැඳවත්. කෙසේද? ඔවුහු ප්‍රාණඝාතාදි අකුසල කොට අපි අයුත්තක් කළෙමු යයි, යම් කෙනෙකුට අපරාධ කෙළෙම් ද ඉදින් ඔවුහු අප දන්නාහු නම්, මෙවිට (අප) ලුහුබැඳ විපතක් පමුණුවන්නාහු යයි ගස් අතර හෝ පඳුරු අතර හෝ හිඳිත්. ඔවුහු මඳ පමණ වූද තණ ශබ්දයක් හෝ පත්‍ර ශබ්දයක් හෝ අසා මෙවිට නටුම්හයි බිය වෙති. විශේෂයෙන් තැති ගනිති. අවුත් අන්‍යයන් විසින් වටකරන ලද්දවුන් මෙන් බඳින ලද්දවුන් මෙන් නසන ලද්දවුන් මෙන් ද වෙති. මෙසේ භයභේරවයන් තමා කෙරෙහි මනාව ආරෝපණය කරන අරුතින් ආහ්වානය, කෙරෙත් කැඳවත්.

න ඛො පනාහං -පෙ- පටිසෙවාමි මම වනාහි අපිරිසිදු කායකම්ම ඇත්තෙක්ව වන සෙනසුන්ද දුරසෙනසුන් ද වන කෙළවර සෙනසුන් ද සේවනය නොකරමි. යෙහි වො යන මෙහි වො යනු නිපාත මාත්‍රයකි. අරියා බුදුවරයෝ ද බුද්ධශ්‍රාවකයෝ ද අරියා යයි කියනු ලබත්. පරිසුද්ධ කාය කම්මන්තා මෙබන්දෝ වී, අහං තෙසං අඤ්ඤතමො ඔවුන් අතුරෙන් මම ද කෙනෙක් වෙමි. අන්‍යතරයෙක්මි. ඒ එසේ ඇත්තේම වේ. භියො යනු අතිරේක අර්ථයෙහි නිපාතයි. පල්ලොමං යනු පතිත ලෝම ඇති බවට භය රහිත බවට ස්වස්ති භාවයට යන අර්ථයි. ආපාදිං පැමිණියෙමි. වැඩිපුර යහපත් බවට වැඩි වශයෙන් යහපත්භාවයට පැමිණෙත් යයි කියන ලද්දේ වෙයි. අරඤ්ඤෙ විහාරාය අරණ්‍යයෙහි වාසය කිරීම පිණිස.

**කාය කම්මන්ත වාරකථා නිමි.**

සියලු තන්හි මෙම ක්‍රමයමයි. මෙහි කියනු ලබන්නේ විශේෂ වූවක් පමණි. පළමුකොට වචීකම්ම වාරයෙහි අපරිසුද්ධ වචීකම්මන්තා අපිරිසිදු වූ මුසාවාද ආදී වූ වචී කර්මයන්ගෙන් යුක්ත වූවාහු. ඔවුහු කෙසේ භය හා භයානක අරමුණු කැඳවත් ද යත්? ඔවුහු බොරුවෙන් අනුන්ගේ දියුණුව නසා පිසුණු වචනයෙන් මිත්‍රභේදය කොට පරුෂ වචනයෙන් පිරිස මැද මෙරමාගේ මර්මස්ථාන බිඳ පෙළා නිරර්ථක වචනයෙන්

අනුන්ගේ කර්මාන්තයන් නසා, අපි නොසුදුසු දෙයක් කළාහු වෙමු. යම් කෙනෙකුට අපරාධ කළාහු වෙමුද, ඉදින් ඔවුහු අප දන්නාහු නම්, මේ වනවිට ඔවුහු අප ලුහුබැඳ අනර්ථයකට හා විනාශයකට පමුණුවන්නාහුය. වනයට පිවිස, ගස් අතර හෝ පඳුරු අතර හෝ හිඳිත්. ඔවුහු ස්වල්පමාත්‍ර වූ ද තෘණ ශබ්දයක් හෝ පත්‍ර ශබ්දයක් හෝ අසා දැන් අපි නටුවෝ වෙමු යයි, තැති ගනිත්. විශේෂයෙන් තැති ගනිත්. අවුත්, අන්‍යයන් විසින් වධකරන ලද්දවුන් මෙන් ද, බඳින ලද්දවුන් මෙන් ද, නසන ලද්දවුන් මෙන් ද වෙති. මෙසේ ඒ භයභෙරවයන් තමා කෙරෙහි සමාරෝපණය කිරීම් අර්ථයෙන් අඬගසත්, කැඳවත්.

මනොකම්මනත වාරයෙහි අපරිසුද්ධ මනොකම්මන්තා අපිරිසිදු වූ අභිජ්ඣා ආදි මනෝ කර්මයන්ගෙන් සමන්නාගත වූවාහු ඔවුහු කෙසේනම් භයභේරවයන් කැඳවත් ද යත්? ඔවුහු අනුන් විසින් රක්ෂිත - ගෝපිත භාණ්ඩ විෂයෙහි අභිජ්ඣා නම් වූ විසම ලෝභය උපදවා අනුන්ට කිපී අන් සත්ත්වයන් මිථ්‍යාදිට්ඨි ගන්වා අපි අයුක්තක් කළාහු වෙමු යයි,-පෙ- තමා කෙරෙහි සමාරෝපන කරන අර්ථයෙන් අඬගසත් කැඳවත්.

ආජීව වාරයෙහි අපරිසුද්ධාජීවා, අපිරිසිදු වූ වෙදකම් දූතකම් පොළියට දීම් ආදි එක්විසි ප්‍රභේදගත සෙවීම්වලින් සමන්විත ආජීවයෙන් යුක්තවූවාහු, ඔවුහු කෙසේනම් භයභේරවයන් කැඳවත්ද යත්?

ඔවුහු මෙසේ ජීවිකාව කොට ශාසන ශෝධක වූ ත්‍රිපිටකධර භික්‍ෂූහු ශාසන ශෝධනය පිණිස නික්මුනාහුය. අද හෝ හෙට මෙහි පැමිණෙන්නාහු යයි (අසති) අරණ්‍යයට පිවිස ගස් අතර හෝ -පෙ- (වෙත් යයි) තැති ගනිත්, විශේෂයෙන් තැති ගනිත්. ඔවුන් විසින් අවුත් පිරිවරා ගන්නවුන් මෙන් ද, සුදුවත් හඳවන ලද්දවුන් මෙන් ද, වෙත් යයි, සෙස්ස එවැනිම වේ.

මින් මතු අභිජ්ඣාලූ යන මෙහි අභිජ්ඣා ව්‍යාපාද, මනෝකම්ම සංග්‍රහ වූවාහු ද, එසේ වුවත් නීවරණයන්ගේ වශයෙන් යලි කියන ලද්දාහු යයි දතයුත්තාහුය. එහි අභිජ්ඣාලූ යනු අනුන්ගේ භාණ්ඩයන් පිළිබඳව දැඩි ලෝභයෙන් සිතනසුලු වූවාහු, කාමෙසු තිබ්බරාගා වස්තු කාමයන්හි ඝන බහල කෙලෙස් රාග ඇත්තාහු. ඔවුහු කෙසේනම් භයභේරවයන් කැඳවත්ද යත්? ඔවුහු (අච්චන්‍තීත-ආරම්මණ) සීමා රහිත අරමුණු ඇත්තාහු

වෙති. සීමාවක් නොමැති අරමුණු ඇතිව වනයෙහි වසන්නාහු ඔවුනට දවල් දක්නා ලද්ද, රාත්‍රියෙහි භයභේරවයක්ම වැටහෙයි. අකුසල් සිත් ඇත්තා වූ ඔවුහු සුලු දෙයකිනුදු තැති ගනිති. රැහැනක් හෝ වැලක් දැක සර්පයෙක් යන සංඥා ඇත්තාහු වෙති. කණුවක් දැක යක්‍ෂයෙක යන සංඥා ඇත්තාහු වෙති. බිම්කඩක් හෝ පර්වතයක් දැක ඇතෙකු යන සංඥා ඇත්තාහු වෙති. සර්පාදීන් විසින් කරදරයකට විනාශයකට පමුණුවනු ලද්දවුන් මෙන් වෙත් යයි. සෙස්ස එබඳුමැයි.

**ඛ්‍යාපනන චිත්තා**, ප්‍රකෘති භාවය නැතිවීමෙන් විපන්න (සදොස්) වූ සිත් ඇත්තේ කෙලෙස් අනුගත වූ සිත ප්‍රකෘතිභාවය අත්හලේ වෙයි. පරණ වූ බත ව්‍යඤ්ජන මෙන් පිළුනුවූයේ වෙයි. **පදුටඨ මන සංකපපා** යනු ඉතා නපුරු වූ චිත්ත සංකල්ප ඇත්තාහු, යහපත් නොවූ මෙරමාට අනර්ථ උපදවන්නා වූ චිත්ත සංකල්පයන්ගෙන් යුක්ත යයි කියන ලද්දේ වෙයි. ඔවුහු කෙසේනම් භයභේරවයන් කැඳවත් ද යත්? භයභේරවයන් කැඳවීම මෙතැන් පටන් අභිජ්ඣාලු වාරයෙහි කී අයුරින් දතයුතුයැ. යම්තැනෙක්හි විශේෂත්වයක් වන්නේ ද, එහිදී පවසමු. **න බො පනාහං ඛ්‍යාපනන චිතෙතා** යනු මෙහි මම වනාහි මෙත් සිත් ඇත්තෙම්, හිතවත් වූ සිත් ඇත්තෙම් යයි දක්වයි. ඒ එසේමැයි. බෝසත්වරු මෙබඳු ගුණ ඇත්තෝ වෙත් යයි. මෙසේ සියලු තන්හි කියන ලද දෝෂයන්ට ප්‍රතිපක්‍ෂ වශයෙන් බෝසත්ගුණ වර්ණනා කළයුත්තාහු වෙත්. **ථීන මිද්ධ පරියුටඨිතා** යනු චිත්තයාගේ ගිලන් බව නම් වූ ථීනයෙන් ද, සෙසු නාමකයෝ ගිලන් බව නම් වූ මිද්ධයෙන් ද, වළඳන ලද්දාහු මඩින ලද්දාහු ගන්නා ලද්දාහු යයි කියන ලද්දේ වෙයි. ඔවුහු නින්ද බහුලකොට ඇත්තෝ වෙති. **උද්ධතා** උද්ධච්චය (සිතේ නොසන්සුන්කම) ප්‍රකෘතිය වූවාහු, සැලෙන සිත් ඇත්තාහු ඒ එසේමැයි. උද්ධච්චයෙන් එක් අරමුණෙක්හි වූ සිත වාතයෙන් කොඩි කණුවෙහි කොඩියක් මෙන් සැලෙයි. **අවූපසනන චිතෙතා** යනු නො නිවුන සිත් ඇත්තාහු. මෙහි දී කුක්කුච්චය ගැනීම වටී.

**කංඛී වෙචිකිච්ඡී** යනු, මෙහි එකක්ම වූ පස්වන නීවරණයයි. මේ කිමෙක්ද? අරමුණ සැක කරන හෙයින් කංඛා නම් වේ. මෙයම මේ යයි තීරණය කරන්ට අසමත් බැවින් විචිකිච්ඡා යයි කියනු ලැබේ. එයින් යුක්ත වූ ශ්‍රමණ-බ්‍රාහ්මණයෝ කංඛී විචිකිච්ඡී යයි කියන ලද්දාහු වෙති.

**අතතුක්කංසකා පරවමහී** යනු, යමෙක් තෙම තමා උසස් කෙරෙත් ද ඔසවා තබත් ද උසස් තන්හි තබත් ද අන්‍යයන් පහත් කෙරෙත් ද

ගරහත් ද නිග්‍රහ කෙරෙත් ද පහත් තත්හි තබත් ද, මේ ඔවුනට නමකි. ඔවුහු කෙසේනම් භයභෙරවයන් කැඳවත්ද, යත්? ඔවුහු අන්‍යයන් විසින් අසවලා ද අසවලා ද උසස් ලෙස වර්ණනා කෙරෙති. අප ගරහති. දාසයන් මෙන් කෙරෙත්ල. ඔවුන් ගනිව් යයි ලුහුබඳිනා ලද්දාහු පලාගොස් වනයට පිවිස ගස් අතුරෙහි හෝ යයි කායකමම මෙන් විස්තර කළ යුතුය. ඡම්භි කය තදකරන, ලොමුදැහැ ගැනීම් කරන තැතිගැනීම්වලින් යුක්ත වූවාහු.

භීරුක ජාතිකා යනු භය ප්‍රකෘතිය කොට ඇත්තාහු ගම්දරුවන් මෙන් භය බහුලකොට ඇත්තාහු ශූර නොවූවාහු දීන වූවාහු යයි කියන ලද්දේ වෙයි. ලාභ සක්කාර සිලොකං යන මෙහි ලබ්භතීති ලාභො, ලබාතුයි ලාභ නම් වේ. සිවුපසයට මේ නමකි. සක්කාර නම් සුන්දර වූ සත්කාරයයි. ප්‍රත්‍යයෝම අතිශයින් ප්‍රණීත වූවාහු අතිශයින් සුන්දර වූවාහු සකස්කොට කරන ලද්දාහු සත්කාරයයි කියනු ලැබෙත්. අනුන් විසින් තමන්ට යම් ගෞරව කිරීමක් වේ ද, මල් ආදියෙන් හෝ පිදීමක් වේද, (එයද සත්කාර නම් වේ) සිලොක නම් ගුණ කීමයි. මේ ලාභය ද, සත්කාරය ද සිලෝකය ද ලාභ සක්කාර සිලොක නම් වේ. නිකාමය මානා ප්‍රාර්ථනා කරන්නාහු භයභේරව කැඳවීම අභිජ්ඣාලු වාරයට සමානමැයි. මෙහි එම අර්ථය දක්වනු පිණිස පියගාමික වස්තුව කියත්.

**පියගාමික වස්තුව**

පියගාමික නම් මහණ තෙම සමාදන් වූ ධූතාංග ඇති භික්ෂූන්ගේ ලාභය දැක, මම ද ධූතාංග සමාදන්ව ලාභ උපදවම්යි සිතා සෝසානිකාංගය සමාදන්ව සොහොනෙහි වෙසෙයි. ඉක්බිති එක්දිනක් කර්මාන්තයෙන් මුදන ලද මහළු ගොනෙක් දහවල් කාලයෙහි ආහාර පිණිස ඇවිද රාත්‍රී කාලයෙහි එම සොහොනෙහි මල් පඳුරෙක හිස තබා වමාරා කමින් සිටියේය. ප්‍රියගාමික භික්ෂු තෙම රාත්‍රී කාලයෙහි සක්මනින් නික්මුනේ ගොනාගේ හනු ශබ්දය අසා 'මේ තෙම ලාභයෙහි ගිජු වූයේ, සොහොනෙහි වෙසේ යයි දැන, ඒකාන්තයෙන්ම සක්දෙව්රජ මා වෙහෙසනු පිණිස ආයේ වත්දයි සිතා, හෙතෙම මහලු ගොනාගේ ඉදිරිපිට ඇදිලි බැඳගෙන, සත්පුරුෂ වූ දිව්‍යරාජය, මට අද එක් රැයක් ඉවසනු මැනවි. හෙට පටන් මෙසේ නොකරන්නෙමියි නමස්කාර කරමින් මුළු රැය මුලුල්ලේ අයදමින් සිටියේය. ඉක්බිති හිරු නැගි කල්හි, ඒ ගවයා දැක, සැරයටියෙන් පහර දී සියලු රැය මා භය කළේ යයි පළවා හැරියේය.

කුසීතා, කුසීත භාවයෙන් යුක්ත වූවාහු හීනවිරියා යනු හීන වූ වීර්යයෙන් තොර වූ වෙන් වූ වීර්ය රහිත වූවෝ වෙත් යයි කියන ලද්දේ වෙයි. එහි කුසීතයෝ කායික වීර්යාරම්භ රහිතයෝ වෙති. ඔවුහු අරමුණු වවත්ථාන (වෙන්කර ගැනීම්) මාත්‍රයකුදු කරන්ට අසමත් වෙති. ඒ ආරම්මණ ව්‍යවස්ථා රහිතයන්ට යයි, සියල්ල පෙර කියන ලද්දට සමාන මැයි. **මුට්ඨස්සති** - නටුවා වූ සිත් ඇත්තෝ. අසම්පජානා යනු ප්‍රඥා රහිත වූ මීට විරුද්ධ පක්ෂයෙහි උපට්ඨිත සති භවසම් යයි වදාළ හෙයින් මේ සති භාජනීයමැයි. මෙහි ප්‍රඥාව සතියේ දුබලකම දැක්වීම පිණිස වදාරණ ලද්දීය. ඒ එසේමැයි. සති තොමෝ විවිධ වන්නීය. පඤ්ඤා සම්පයුත්තද විප්පයුත්තද කියායි. ඔවුන් අතුරෙහි පඤ්ඤා සම්පයුත්ත වූවා බලවත් වන්නීය. විප්පයුත්ත වූවා දුර්වල වේ. එහෙයින් යම්කලෙක ඔවුන්ගේ සතිය වේද, එකල්හිදු ඔවුහු සම්මා පඤ්ඤා රහිත හෙයින් මුලා සිහි ඇත්තාහුම වෙති. ඒ දුර්වල වූ සතියෙන් සති කිච්ච අභාව හේතුවෙන් එම අරුත දක්වන්ට අසම්පජානා යයි කියන ලදී. ඔවුහු මෙසේ නටුවා වූ සිහි ඇත්තාහු පඤ්ඤා රහිත වූවාහු අරමුණු වෙන්කිරීම් මාත්‍රයකුදු කරන්ට නොහැකි වෙත්. සියල්ල පෙර මෙනි. අසමාහිතා උපචාර අප්පනා සමාධි රහිත වූවහු **විබ්භන්ත චිත්තා** විශේෂයෙන් භ්‍රාන්ත සිත් ඇත්තාහු සමාධි රහිත වූ කල්හි ලද අවකාශ ඇති, උද්ධච්චය නිසා ඔවුන්ගේ සමාධි විරහිත බැවින් සිත නොයෙක් අරමුණුවල භ්‍රමණය වෙති. වන ශාඛාවන්හි වන වඳුරෙකු මෙනි. උඩඟු බව නිසා එක අරමුණෙහිද සිත විශේෂයෙන් සැලෙයි. පෙර කී අයුරින්ම ඔවුහු මෙසේ එකඟ නොවූ සිත් ඇත්තාහු නානා අරමුණෙහි හැසිරෙන සිත් ඇත්තාහු අරමුණ පිළිබඳව වෙන්කිරීම් මාත්‍රයකුදු කරන්ට නොහැකි වෙත්. සියල්ල පෙර මෙනි.

**දුප්පඤ්ඤා** යනු නුවණ නැත්තහුට මේ නමකි. ප්‍රඥාවට දුෂ්ටයෙක් නොමැති. එලමුගා එලමුඛා නම් වේ. කෙළතොළු වූවාහු, ඛ කාරයට ග කාරය කරන ලද්දේ වෙයි. ලාල මුඛා යයි ද කියන ලද වෙයි. ඒ එසේමැයි. නුවණනැත්තවුන් කථාකරන කල්හි මුඛයෙන් කෙළ ගලයි. කෙළද ඒලා යයි කියනු ලැබේ. එහෙයින් කියන ලදී. **පසෙසලමුගං උරගං දුජ්ජිවහං** යනුවෙන්, එහෙයින් ඔවුහු එලමුගා යයි කියනු ලැබෙත්. එලමූගා යයි ද පාඨයි. එලමුතා යයි අනෙකෙක් එලමුඛා යයි ද කියති. සියලු තන්හි එලමුඛාති අර්ථයි.

ඔවුහු කෙසේනම් භයභේරවයන් කැඳවත්ද යත්? ප්‍රඥා රහිත වූවහු. කෙළතොළු වූවහු ආරම්මණ ව්‍යවස්ථා මාත්‍රයකුදු කරන්ට නොහැකි

වෙති. නියමිත අරමුණක් නොමැතිව වනයෙහි වසන ඔවුන්ට දහවල් දක්නා ලද දෙය රාත්‍රියෙහි භයභේරවයක් වී වැටහෙයි. අකුසල් ඇත්තාහු ඔවුහු ඉතා ස්වල්ප දෙයකිනුදු තැති ගනිති. රැහැනක් හෝ වැලක් හෝ දැක සර්පයෙකැයි යන සංඥා ඇත්තෝ වෙති. කණුවක් දැක යකෙක යන සංඥා ඇත්තාහු වෙති. ගොඩැල්ලක් හෝ පර්වතයක් දැක ඇතෙක යන සංඥා ඇත්තාහු වෙති. සර්පාදීන් විසින් අභාවයට විනාශයට පමුණුවන ලද්දවුන් මෙන් වෙති. මෙසේ භයභේරවයන් තමා කෙරෙහි ආරෝපනය කරන අරුතින් ආහ්වානය කෙරෙති. කැඳවති. පඤ්ඤාසම්පන්නො හමස්මි යන මෙහි පඤ්ඤා සම්පන්නො ප්‍රඥාවෙන් සම්පූර්ණ වූයෙම් සමන්විත වූයෙම් විදර්ශනා ප්‍රඥාවද නොද වෙති. මාර්ග ප්‍රඥාවෙන් ද නොවෙයි. නමුත් මේ සොලොස් තන්හි ආරම්මණ වවත්ථාන ප්‍රඥාවෙන් යන අර්ථයි. සෙස්ස සියලු තන්හි කියන ලද න්‍යායෙනි.

**සොළසට්ඨාන ආරම්මණ පරිග්ගහ නිමි.**

**තස්ස මය්හං** යන්නෙහි අනුසන්ධි කවරේද? බෝසත් තෙම මේ සොලොස් අරමුණු පරීක්ෂා කරන්නේ භයභේරවයක් නොදැක, භයභේරව නම් මෙවන් රාත්‍රිවල මෙබඳු සෙනසුන්වල පෙනෙයි. එහිදු එය නිශ්චය වශයෙන්ම සොයමි යයි. භයභේරව ගවේෂණය කළේය. මේ අදහස බ්‍රාහ්මණයා හට දක්වන භාග්‍යවතුන් වහන්සේ **තස්ස මය්හං** ආදිය වදාළහ. එහි **යා තා** යන මේ පද දෙක රාත්‍රීන්ගේම උද්දෙස, නිද්දෙස වචනයි. **අභිඤ්ඤාතා** යන මෙහි අභි යනු ලක්ෂණ අර්ථයෙහි උපසර්ගයකි. එහෙයින් අභිඤ්ඤාතා යනු සඳ පිරීමෙන් ද සඳ ගෙවීමෙන් ද යන මේ ආදි ලක්ෂණයන්ගෙන් ප්‍රසිද්ධ වූ යයි දතයුත්තාහුය. **අභිලක්ඛිතා** යන මෙහි උපසර්ග මාත්‍රමැයි. එහෙයින් අභිලක්ඛිත ලකුණු කටයුතු වූ යන අර්ථයි. පෙහෙවස් සමාදානය, බණ ඇසීම, පූජාසත්කාර ආදිය කිරීම පිණිස ලකුණු කටයුතු වූ සැලකිය යුතු වූ උපලක්ෂණ කටයුතු වූ යයි කියන ලද්දේ වෙයි. **චතුද්දසී** යනු පක්ෂයෙහි පළමුදින සිට තුදුස්වන දිනය සපුරන රාත්‍රියෙහි. **පඤ්චදසී** - **අට්ඨමී** යනුද මෙසේයි. පක්ඛස්ස පූර පක්ෂයාගේ ද අවපක්ෂයාගේ ද මොවුහු තුනක් තුනක් බැගින් රාත්‍රීහු සයක් වෙති. එහෙයින් සියලු තන්හි **පක්ඛ** යන වචනය යෙදිය යුතුය.

පක්ෂය පිළිබඳ තුදුස්වක පක්ෂය පිළිබඳවද පසළොස්වක, පක්ෂය පිළිබඳ අටවක යයි කියායි. ඉක්බිති පඤ්චදසී (විසේනිය) කුමක් හෙයින්

නොගන්නා ලද්දේද යත්? සබ්බකාලික නොවන හෙයිනි. භාග්‍යවතුන් වහන්සේ හුපත් කල්හිද, ඉපිද නොපිරිනිවි කල්හිද පඤ්චමී (විසේනිය) ලකුණු නොකරන ලද්දේමැයි. පිරිනිවි කල්හි වනාහි ධර්ම සංග්‍රාහක තෙරුන් වහන්සේලා බණ ඇසීම කලකින් වේයයි සිතූහ. අනතුරුව පංචමී යයි සම්මතකොට බණ ඇසීමේ දිනයක් වශයෙන් තැබූහ.

එතැන් පටන් හෝ විසේනිය ලකුණු කරන ලද්දේ විය. එහෙත් අසබ්බකාලික හෙයින් මෙහි නොගන්නා ලද්දී යයි දතයුතු.

තථාරූපාසු, එබඳු වූ, අරාම චෙතියානි පුෂ්පාරාම, ඵලාරාම ආදී ආරාමයෝම ආරාමචෙතිය නම් වෙති. (චිත්ති කතවෙය්‍ය) විසිතුරු කරන ලද්දේය යන අරුතින් චෙතිය යයි කියනු ලබත්. පූජනීය අර්ථයෙන් ද එසේ කියන ලද වෙයි. වනචෙතියානි බලිහරණය කරන වනලැහැබ්, සුභගවන, දේවශාලවනාදීහු වනයෝම වන චෙතියයෝ වෙති. රුක්ඛචෙතියානි ගම් නියම්ගම්වල ද්වාරයන්හි වූ පිදිය යුතු වෘක්ෂයෝම 'රුක්ඛචෙතිය' නම් වෙති. ලෝවැසියෝ දෙවියන් විසින් අරක් ගන්නා ලද්දාහු යයි සිතමින් හෝ ඒ ආරාමාදීන් කෙරෙහිම දෙවියනැයි යන සංඥා ඇතිව ආරාම වන, වෘක්ෂයන්, සලකති. පුදති. එහෙයින් ඒ සියල්ලෝම 'චෙතිය' යයි කියනු ලැබෙත්. භිංසනකානි යනු භය උපදවන්නා වූ දැකීමෙන් ද ඇසීමෙන් ද භය උපදවත්. සලොමහංසානි යනුවෙන් පිවිසෙන කල්හිම රොමෝද්ගමය උපදවන හෙයින්, රෝමෝද්ගමය සමග පවතිත්.

අප්පෙව නාම පසෙසය්‍යං එම භය හා භයානක අරමුණු දක්නේ නම් ඉතා මැනවයි. අපරෙන සමයෙන 'එතදහොසි යනන්‍නූනාහං' යයි සිතන කාලයෙන් අන්‍ය කාලයෙක්හි. තත්‍ථ ච මෙ බ්‍රාහමණ විහරතො යනු එවැනි සෙනසුන්වල (කෙබඳු සෙනසුන්ද යත්) යම් යම් තැනක් මිනිසුන්ගේ යැදීම්වල පුදකිරීම්වලට යෝග්‍ය වූ යක්ෂ අධිගෘහිත ස්ථානයක් වේද, මල් දුම්, මස්, ලේ, චුරුණුතෙල්, මේද බඩදිව, පපු ආදියෙන් (ඒවා) විසුරුවීමෙන් තෙත් වූ පොලෝ ඇත්තේ ද, යක්ෂ-රාක්ෂස පිසාච ආදීන්ගේ අසභාය පැන්හලක් මෙන් වූයේ ද, යම්තැනක් දවල් කාලයෙහිදු දක්නවුන්ගේ ළය පලන්නාක් මෙන් වේද, ඒ ස්ථාන සඳහා කීහ. තත්‍ථ ච මෙ බ්‍රාහමණ විහරතො, යයි ද, මගො වා ආගච්ඡති අං හෝ කුර හප්පවමින්, ගෝණ, කඟවේණ, දිවි, හුරු ආදි ප්‍රභේදයන්ට අයත් මෘගයෙක්

හෝ එයි. සියලු සිවුපාවුන්ටම මෙහි මග යනු නමකි. කිසිතැනක කාණසිගාලද (මග යයි) කියනු ලැබේ. එහෙයින් කියන ලදී.

උසභසෙසව තෙ ඛන්‍ධො - සීහසෙසව විජම්භිතං
මිගරාජ නමොත්‍යත්‍ථු අපිකිඤ්චි ලභාමසෙ

(ඔබගේ ස්කන්ධය, වෘෂභයෙකුගේ මෙනි. නාදකිරීම සිංහයෙකුගේ මෙනි. මෘගරාජය, ඔබට නමස්කාර වේවා. කිසිවක් ලබන්නෙමු නම් මැනවි.)

මොරොවා කට්ඨං පාතෙති මොණරෙක් හෝ වියලි දරකඩක් ගසකින් හෙලයි. මෝර ශබ්දය ගැනීමෙන් මෙහි සියලුම පක්ෂීන් ගැනීම අදහස් කරන ලදී. එයින් යම්කිසි පක්ෂියෙකැයි කියන ලද්දේ වෙයි. නැතහොත් මොරො වා යන මෙහි වා ශබ්දයෙන් අන්කිසි පක්ෂියෙක් හෝ යයි කියන ලදී. මෙම ක්‍රමයමැයි. කලින් මග ශබ්දයාගේ ද ගැනීමෙන්, වාතොවා පණ්ණසමං එරෙති. වාතය හෝ (වියලි) පරඬලා හප්පවයි. එතං නූන තං භයභෙරවං ආගච්ඡති යනුවෙන් මේ යමක් පැමිණේ ද, ඒකාන්ත වශයෙන් එය භයානක අරමුණකි. මෙතැන් පටන් ද අරමුණම 'භයභෙරව' යයි දතයුතුයි. ස්වල්ප වූ ද විශාල වූ ද භයම අරමුණු වන හෙයිනි. සැප අරමුණු කොට ඇති රූපය සැපය මෙනි.

කිනනු ඛො අහං අඤ්ඤදත්‍ථු භය පාටිකංඛී විහරාමි කුමක් නිසා මම ඒකාන්තයෙන් භය කැමැත්තෙම් වාසය කෙරෙම්ද? යථභූත යථාභූතසස යම් යම් ඉරියව්වෙන් යුක්ත වූයේ පවත්වන්නෙම්, සමන්විත වූයෙම් හෝ යන අර්ථයි. මෙ යනු මා සමීපයේ තථාභූත තථාභූතොව යනු ඒ ඒ ඉරියව්වෙන්ම සිටියෙම් පවත්වන්නෙම් සමන්විත වූයෙම් හෝ යන අර්ථයි.

සො ඛො අහං -පෙ- පටිවිනෙමි යනු සක්මන් කරන්නා වූ බෝසත් හට, එහි මුවන්ගේ අංකුර ආදීන්ගේ ශබ්ද භේද ඇති භය අරමුණු පැමිණි කල්හි බෝසත් තෙම නොම සිටියි. නොම හිඳියි. නොහිඳයි. සක්මන් කරමින්ම හාත්පසින් විමසන්නේ හාත්පසින් සොයන්නේ භයභේරවයන් නොද දකී. එය මුවන්ගේ අංකුර ශබ්දාදීන්ගේ අරමුණු මාත්‍රයක්ම වෙයි. හෙතෙම ඒ දැන තෙල මෙය නම් භය අරමුණක් නොවේයයි අනතුරුව සිටියි හෝ හිඳියි හෝ ශයනය හෝ කෙරෙයි. මේ අර්ථය දක්වන්නාහු

යො බො අහං යනාදිය වදාළහ. සියලු තන්හිද පෙය්‍යාල මගින් දැක්වූ තැන්වල ද මෙම ක්‍රමයමැයි.

මින් මත්තෙහි ඉරියව්-පිළිවෙලින් නොකියා ආසන්න පටිපාටියෙන් ඉරියව් කියන ලද්දාහු යයි දත යුතුයැ. ඒ එසේමැයි සක්මන් කරන්නහුට භයභේරව පැමිණි කල්හි, නොසිටියේ නොහුන්නේ නොනිදා ගත්තේ මෙසේ සිටියහුට ද සක්මන් නොකළේ යයි මෙසේ ඒ ඒ ඉරියව්වට ආසන්න පරිපාටියෙන් කියන ලද්දාහු යයි මෙසේ භයජනක වූ ද ස්ථානයන්හි තමනට භය හා භයානක අරමුණු නැති බව දක්වා අනතුරුව ධ්‍යානලාභීන් මුලාවට පත්වූ කල්හිදු තමන් වහන්සේගේ නොමුලා විහරණ දක්වනට සනති බො පන බ්‍රාහමණා යන ආදිය වදාළහ. එහි සනති යනු ඇත්තාහුය. විද්‍යමාන වෙත්. ලැබෙත්. රත්තිං යෙව සමානං රාත්‍රී කාලයම ඇත්තේ, දිවාති සඤ්ජානනති. මේ දවාල යයි හඳුනත්. දිවායෙව සමානං දිවා කාලයම ඇත්තේ රත්තීති සඤ්ජානනති රාත්‍රිය යයි හඳුනත්, කුමක් හෙයින් මොවුහු මෙබඳු සංඥා ඇත්තාහු වෙත්ද, යත් කුමක් හෙයින් මොහු මෙබඳු සංඥා ඇත්තාහු වෙත් ද යත්, උට්ඨාන කෞශල්‍යය නොමැති බැවින් හෝ පක්ෂීන්ගේ නාදයෙන් හෝ යි.

කෙසේද? මෙලොව කෙනෙක් ඕදාත කසිණ ලාභී වූයේ දවල් කාලයෙහි පරිකර්ම භාවනාකොට දවල්ම කසිණ සමවතට නැගුනේ, දවල්ම එයින් නැගිටිමි යන සිත ඉපිදවිය. එතකුදු වුවත් කල් පිරිසිඳ දැනීමෙහි හොඳ දක්ෂ විය. හෙතෙම දවල් කාලය ඉක්මවා රාත්‍රී කාලයෙහි නැගී සිටියි. එසේ වුවත් ඔදාත කසිණයාගේ පැතිරීම ඔහුට නිර්මලව ප්‍රකට වෙයි. අතිශයින් ප්‍රකට වෙයි. හෙතෙම දවල නැගිටිමියි උපදවන ලද මනස්කාර ඇති බැවින්ද, ඔදාත කසිණය පැතිරීම නිසා නිර්මලව ප්‍රකට වූ බැවින් ද, රාත්‍රියම දහවල් යයි දැනගනී.

මෙලොව කෙනෙක් නීල කසිණ ලාභි වූයේ රාත්‍රියෙහි පිරියම්කොට රාත්‍රියෙහි සමවතට සමවැදුනේ රාත්‍රියෙහි නැගී සිටිමියි සිතිවිලි උපදවයි. එතකුදු වුවත් හේ කාලපරිච්ඡේද දැනීමෙහි දක්ෂ නොවූයේය. හෙතමේ රාත්‍රිය ඉක්මවා දවල් කාලයෙහිම නැගී සිටියි. එසේ වුවත් ඔහුට නීල කසිණයාගේ පැතිරීම නිසා ඕහට පැහැදිලි නොවෙයි. අප්‍රකට වෙයි. හෙතෙම රාත්‍රියෙහි නැගිටිමියි, උපදවන ලද සිතිවිලි ඇති බැවින් ද නීල කසිණයාගේ ඵරණය (පැතිරීම) නිසා පැහැදිලි නොවූ, අප්‍රකට වූ බැවින් ද දහවල්ම රාත්‍රිය යයි දැනගනී.

මෙසේ පළමුකොට ධ්‍යානයන් පිළිබඳ උට්ඨාන කුසලතාව නැති බැවින් මෙවන් සංඥා ඇත්තෝ වෙති. පක්ෂි නාදයෙන් ද ඇතැම් කෙනෙක් මෙහි සෙනසුන ඇතුළත සිටියේම (මෙවන් වැරදි සංඥා ඇතිවේ. දිවා කාලයෙහි නාද කරන කපුටු ආදි පක්ෂීහු චන්ද්‍රාලෝකය හේතුවෙන් රාත්‍රිය දවල් යයි හඟිමින් රාත්‍රී කාලයේ නාද කරති. වෙනත් හේතුන් නිසාද නාද කරති. හෙතෙම මෙම ශබ්ද අසා රාත්‍රී කාලය වූයේම දිවාකාලය යයි දැනගනිති. මෙහි ඇතැම් කෙනෙක් ගල් පර්වත අතරෙහි ඝන වනයෙන් වැසුනු ගල්ගුහාවෙක්හි සත්තාහවද්දලිකා හත් දා වැසි පවත්නා කල්හි අතුරුදහන් වූ හිරුඑළිය ඇතිකල්හි හුන්නේ වෙයි. එකල්හි රාත්‍රී කාලයෙහි හඬන මහමුහුණු ආදි පක්ෂීහු මධ්‍යාහ්න කාලයෙහි ද, ඒ ඒ තන්හි සම වූ අන්ධකාරයෙහි සැඟවුනාහු රාත්‍රී සංඥාවෙන් හෝ අන් කරුණුවලින් හෝ හඬත්. හෙතෙම ඔවුන්ගේ ශබ්ද අසා දවල් කාලයම වූයේ රාත්‍රිය යයි දැන ගනී. මෙසේ පක්ෂීන්ගේ නාදයෙන් මෙබඳු සංඥා ඇත්තාහු වෙත් යයි.

ඉදමහං (ඉදං+අහං) මේ මම මෙසේ දැන ගැනීම සම්මෝහ විහාරසම්ං වදාමි යනු මේ ඒ මහණ බමුණන්ගේ මුලා වී විසීමකැයි මම කියමි. අහං ඛො පන බ්‍රාහමණ -පෙ- සඤ්ජානාමි යනු බෝධිසත්ත්වයන් වහන්සේට රෑ දවල පිරිසිඳ දැනගැනීම ප්‍රකටය.

සත්තාහ වද්දලිකා (හත්-දා-වැසි) ඇති කල්හිදු සඳ හිරු නොපෙනෙන කල්හිදු මෙතෙක් පෙරබත් කාලය පසුවී ගියේය. මෙතෙක් මැදියම් කාලය ගියේය. මෙතෙක් පසුබත් කාලය ගියේ යයි දැනගැනීමයි. එසේ හෙයින් මෙසේ වදාළහ. පුරන ලද පෙරුම් ඇති බෝසත් තෙම මෙසේ දැනගනී යන යමක් ඇද්ද, මෙය පුදුමයට කරුණක් නොවෙයි. යම් හෙයකින් ප්‍රදේශ ඥාණයෙහි පිහිටි ශ්‍රාවකයන්ටද දිවා රාත්‍රී දෙක වෙන්කොට දැනීම ප්‍රකට වූ හෙයිනි.

### ගෝදත්ත තෙර වත

කැළණි මහවෙහෙර විසූ ගෝදත්ත තෙර හිරමුදුන් වීමට අගල් දෙකක් තිබියදී පිණ්ඩපාතය පිළිගෙන හිරමුදුන් වීමට අගලක් තිබියදී වළඳයි. හිරු නොපෙනෙන දවස්වලද, උදෑසනින්ම සෙනසුනට පිවිස එම වේලාවටම පිඬු පිණිස නික්ම යති. එක් දිනක් ආරාමිකයෝ හෙට තෙරුන් වහන්සේ නික්මෙන වේලාව බලන්නෙමු යයි බත් සපයා වේලාව බලාගන්නා වූ (කාලත්ථම්භ මූලෙ) කණුව මුල හුන්නාහුය. එතැන් පටන්

හිරු නොපෙනෙන දවස්හිදු තෙරුන් වහන්සේගේ නික්මීම නිමිතිකොට කාලය දනවන බෙරය ගැසූහ.

කාළදේව තෙර වත

වජගරගිරි වෙහෙර වැසි කාළදේව තෙර වස්කාලය තුළ යාමගණ්ඩිකය. ගසන සේක. මෙය තෙරුන් වහන්සේ පුරුදු කරන ලද්දේය. යාමත්‍රය නාලිකාව (යාමය දැන ගන්නා පා තැටිය) නොම යොදති. අන්‍ය භික්ෂූහු යොදති. එකල පෙරයම නික්මුණු කල්හි තෙරුන් මුගුරක් ගෙන සිටි කල්හිම, හෝ එක්වරක් දෙවරක් ගසන කල්හිම යාම යන්ත්‍රය වැටෙයි. මෙසේ තුන් යාමෙහි මහණදම් කොට තෙරණුවෝ උදෑසනම ගමට පිවිස පිණ්ඩපාතය ගෙන වෙහෙරට අවුත් භෝජන ශාලාවෙහි පාත්‍රය තබා දිවා විහරණය කරන තැනට ගොස් මහණදම් කරති. භික්ෂූහු කාලස්ථම්භය දැක තෙරුන් කැඳවීම පිණිස කෙනෙකු යවති. ඒ ගිය මහණ තෙම එම තෙරුන් එම වාසය කළ තැනින් නික්මෙන්නාහු හෝ අතරමග හෝ දකී. මෙසේ ප්‍රදේශ ඤාණයෙන් යුතු ශ්‍රාවකයෝ පවා රෑ දවල් පිරිසිඳ දැනීම ප්‍රකටව සිටියාහු වෙති. බෝසතුන් පිළිබඳ කියනුම කවරේද?

යං ඛො තං -පෙ- වදෙය්‍ය යන මෙහි බමුණ, යමෙක් උදෙසා අසමෙමාහ ධමෙමා සතෙතා ලොකෙ උපපනෙනා -පෙ- සුඛාය දෙවමනුසසානං යන වචනය කියන්නා වූ, කිසිවෙක් මනාකොට කියන්නේ නම් මනාකොට කියන්නේ වේද, බොරු නොකියන සුලුවූයේ වේදැයි, මෙසේ පද සම්බන්ධය දතයුතු වන්නේය. එහි අසමෙමාහ ධමෙමා, නොමුලාවන ස්වභාව ඇත්තේ, ලොකෙ මිනිස් ලොවැ බහුජනහිතාය, ප්‍රඥා සම්පත්තියෙන් දිට්ඨධම්මික - සම්පරායික - හිතෝපදේශක වශයෙන් බොහෝ දෙනාට හිත පිණිස, බහුජනසුඛාය, ත්‍යාග සම්පත්තියෙන් උපකරණ, සුඛ දෙන්නේනුයි, බොහෝ දෙනාට සැප පිණිස වූ. අත්ථාය හිතාය සුඛාය, දෙවමනුසසානං යන මෙහි දෙව මනුසස ග්‍රහණයෙන් භව්‍ය පුද්ගලයන් වූ වෛනෙය්‍ය සත්ත්වයන්ම ගෙන ඔවුන්ගේ නිවන්මග ඵලාධිගමය පිණිස තමන් වහන්සේගේ උත්පත්තිය දක්වන සේකැයි දතයුතුයැ. හිතාය යයි කී කල්හි ඊට පමුණුවන මාර්ගය පිණිස යයි කියන ලද්දේ වෙයි. නිවනට පමුණුවන මාර්ගයෙන් මත්තෙහි සැපයක් හිතයන් නැද්ද, එහෙයින් කියන ලද සුඛාය, යනුවෙන් කී කල්හි ඵල සමවත් සැප පිණිස යයි කියන ලද්දේ විය. ඉන් මත්තෙහි සැපයක් නැති බැවින්

මෙසේ කියන ලදී. අයං සමාධි පච්චුප්පන්න. සුඛො චෙව, ආයතිඤ්ච සුඛවිපාකො යයි මෙසේ බුදුරදහු බුදුගුණ ප්‍රතිලාභය අවසන්කොට, තමන් වහන්සේගේ නොමුලා විහරණය බමුණා හට දක්වා, මෙවිට යම් ප්‍රතිපදාවකින් ඒ කෙළවරට පත්වූ අසම්මෝහ විහරණයට පැමිණියේ ද එම ප්‍රතිපදාවෙහි පූර්වභාගය පටන් දක්වන්නට ආරද්ධං ඛො පන මෙ බ්‍රාහමණ යනාදිය වදාළහ. (කෙච්පනාහු) කිසිවෙක් වනාහි මෙසේ කියති. මෙම නොමුලා විහරණය අසා බමුණාට මෙබඳු සිතක් උපන්නේය. කිනම් ප්‍රතිපදාවකින් මෙයට පැමිණියේ දැයි කියා ඔහුගේ එම සිත දැන, මම මෙම පටිපදාවෙන් මේ උතුම් වූ නොමුලා වූ සිහි ඇති බවට පැමිණියෙමියි දක්වන්නේ මෙසේ වදාළහ යි.

තස්ස ආරද්ධං ඛො පන මෙ බ්‍රාහමණ විරියං අහොසි යනුවෙන්, බමුණ මම මේ අසම්මෝහ විහරණය තෙම, කුසීත වූ මුලා වූ සිහි ඇති, කාලදරථ ඇති විසුරුණු සිත් ඇති හෝ මා විසින් නො ලබන ලද්දේ ය. නමුත් මා විසින් එයට පැමිණීම පිණිස, පටන් ගන්නා ලද වෙර ඇත්තේ විය. බෝමැඩ සමීපයෙහි හුන් මා විසින් චතුරංග වීර්ය පටන්ගන්නා ලද්දේ, දැඩිකොට ගන්නා ලද්දේ නොලිහිල්ව පවත්වන ලද්දේ වූයේ යයි කියන ලද්දේ විය. මවිසින් එම වීර්ය, ආරබ්ධ බැවින් නොසැඟවූනේ විය.

උපට්ඨිතා සති අසම්මුට්ඨා යනුවෙන් හුදෙක් වීර්ය පමණක් නොව මගේ සිහියද, අරමුණට අභිමුඛ එළඹ සිටියේ විය. එළඹ සිටි බැවින්ම නොමුළා වූවා විය. පස්සද්ධො කායො අසාරද්ධො යනුවෙන්, කාය චිත්ත දෙදෙනාගේ පස්සද්ධි භාවයෙන් මගේ කායද සැහැල්ලු විය. එහි යම් හෙයකින් නාම කය සැහැල්ලු වූ කල්හි, රූප කයද සැහැල්ලු විය. එබැවින් නාම කායයාගේ ද රූප කායයාගේ ද විශේෂත්වයක් නොමැතිව පස්සද්ධො කායො යනුවෙන් කියන ලද්දේ විය. අසාරද්ධො, පස්සද්ධිය නිසාම පහවූ දරථ භාවමය ඇත්තේ යයි කියන ලද්දේ විය.

සමාහිතං චිත්තං එකග්ගං මගේ සිතද මනාකොට පිහිටියේය. මොනවට තබන ලද්දේය. අප්පණාවට පමුණුවනු ලැබූවක් මෙන් විය. මනාකොට පිහිටුවන ලද බැවින්ම එකඟ වූයේය. අචල වූයේය. සැලීම් රහිත වූයේය. මෙතෙකින් ධ්‍යානයාගේ පූර්වභාග පටිපදාව කියන ලද්දේ විය. මෙවිට මෙම ධ්‍යානයෙන් යුක්ත වූයේ, ප්‍රථමධ්‍යානය ආදිකොට ත්‍රිවිද්‍යාව අවසන්කොට ඇති විශේෂත්වය දක්වන සේක්.

ධ්‍යාන ධර්මයෝ

සො බො අහං යනාදිය වදාළහ. එහි විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහාසිං පළමුකොට මෙහි යමක් කිවයුතුද ඒ සියල්ල විසුද්ධි මග්ගයෙහි පඨවි කසිණ කථාවේ දී කියන ලදී. හුදෙක් එහි උපසම්පජ්ජ විහරති යනුවෙන් ආයේය. මෙහි විහාසිං යනුවෙන් ආවේය. එපමණි වෙනස.

භාග්‍යවතුන් වහන්සේ කුමක්කොට මෙම ධ්‍යානයට පැමිණි සේක්ද යත්, කම්මට්ඨාන භාවනා කොටය. කවර කම්මට්ඨාන භාවනාවක්ද යත්, ආනාපානසති කම්මට්ඨානයයි.

මෙම සතර ධ්‍යානයෝ කෙනෙකුට චිත්ත ඒකාග්‍රතාව පිණිස වෙති. කිසිවෙකුට විදර්ශනා පාදක වෙති. කිසිවෙකුට අභිඥා පාදක වෙති. කිසිවෙකුට නිරෝධ පාදක වෙති. කිසිවෙකුට භවයෙහි ඇවිදීම පිණිස වෙති. ඔවුන් අතුරෙන් රහතුන් වහන්සේට චිත්තෙකග්ගිතාව පිණිස වෙති. ඒ එසේමැයි.

ඔවුහු සමවැද එකඟ සිත් ඇත්තාහු සැපසේ දවස ගත කරන්නෙමු යයි මෙසේ කසිණ පිරියම් කොට අට සමවත් නිපදවත්. සේඛයන්ට සහ පුහුදුන්ට සමවතින් නැගී සිට එකඟ වූ සිතින් විදර්ශනා භාවනා කරන්නෙමුයි නිපදවන්නවුනට විදර්ශනා පාදක වෙති. යමෙක් අටසමවත් නිපදවා අභිඥා පාදක ධ්‍යානයට සමවැද සමවතින් නැගීසිට එකොපි හුත්වා බහුධා හොති යයි කියන ලද නය ඇති අභිඥාවන් පතන්නාහු (ඒවා) නිපදවති. ඔවුනට අභිඥා පාදක වෙති. යම් කෙනෙක් අට සමවත් උපදවා නිරෝධ සමාපත්තියට සමවැද සතියක් අචිත්තකව සිට දිට්ඨ ධම්ම නිරොධ නම් වූ නිවනට පැමිණ සුවසේ වාසය කරන්නෙමුයි නිපදවත්ද, ඔවුනට නිරෝධ පාදක වූවාහු වෙති.

යම්කෙනෙක් අට සමවත් නොපිරිහුනු ධ්‍යාන ඇත්තෝව බඹලොව උපදින්නෙමුයි නිපදවත් ද ඔවුනට භවයෙහි ඇවිදීම පිණිස වෙති.

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙම හතරවන ධ්‍යානය බෝරුක් මුලදී නිපදවන ලදී. එය උන්වහන්සේට විදර්ශනා පාදක විය. අභිඥා පාදකද සර්ව කෘත්‍ය සාධක ද විය. සියලු ලොවී ලොවිතුරා ගුණදායක

වූයේදැයි දතයුතුය. යම් ගුණ කෙනෙකුන් ලබාදුන්නේ වේද, ඔවුන් අතුරෙන් ඒකදේශයක් දක්වන සේක්, සො එවං සමාහිතෙ චිතෙත යනාදිය වදාළහ.

ත්‍රිවිද්‍යා ධර්මයෝ

එහි (පුබ්බෙනිවාස-දිබ්බචක්ඛු) ද්විධ විද්‍යාවන්ගේ පදානු වර්ණනාවද, භාවනා නයද විසුද්ධි මග්ගයෙහි විස්තර වශයෙන් දක්වන ලදී. හුදෙක් එහි, සො එවං සමාහිතෙ චිතෙත -පෙ- අභිනිනනාමෙති යයි කියන ලදී. මෙහි අභිනිනනාමෙසිං යයි කියන ලදී.

අයං ඛො, මෙ බ්‍රාහමණ යන මේ අර්පණා වාරයද එහි නොම ආයේය. මෙයම එහි විශේෂයි. එහි සො යනු ඒ මම අභිනිනනාමෙසිං, එලවීමි. අභිනිනනාමෙසිං යන වචනයෙන් ද, සො යන මෙහි ඒ මම යයි මෙසේ අර්ථය දතයුත්තේය. තව ද යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ වශයෙන් මේ පූර්වේනිවාසානුස්මෘති ඥානය ආයේ ද, එහෙයින් සො තතො චුතො ඉධූපපනෙනා යයි මෙහි මෙසේ යෝජනා දත යුත්තීය. යම් හෙයකින් මෙහි සො තතො චුතො යනු පෙරලා නවත්තන්නහුගේ ප්‍රත්‍යවේක්ෂාව වේද එහෙයින් ඉධූපපනෙනා යනු මේ මෙහි උත්පත්තියට අනතුරුව (යන අර්ථයි) අමුත්‍ර උදපාදිං යනු තුෂිත භවනය සඳහා වදාළහයි දතයුතුයැ.

තත්‍රාපාසිං එවං නාමො ඒ තුෂිත දෙව්ලොව 'සේතකේතු නම් දිව්‍යපුත්‍රයා වීමි. එවං ගොතෙතා, ඒ දේවතාවුන් සමග සමාන ගෝත්‍ර ඇත්තෙමි, එවං වණෙණා ස්වර්ණ වර්ණ වූයෙමි, එවමාහාරො දිව්‍යමය සුධාහාර ඇත්තෙමි, එවං සුඛ දුක්ඛ පටිසංවෙදී, මෙසේ දිව්‍යමය සැප විඳිනසුළු වූයෙමි. දුක වනාහි සංස්කාරයන්ගේ දුඃඛමාත්‍රය මැයි. මෙසේ සත් පනස් කෙල ලක්‍ෂයක් අවුරුදු ආයු ඇත්තෙමි වීමි. සො තතො චුතො ඒ මම තුෂිත දෙව්ලොවින් චුත වූයෙමි, ඉධූපපනෙනා මෙහි මායා දේවියගේ කුසෙහි උපන්නේ වීමි.

අයං ඛො මෙ බ්‍රාහමණ, ආදි තන්හි මෙ මා විසින් විජ්ජා යනු විදිතකරණාර්ථයෙන් (=අවබෝධ) විජ්ජා නම් කුමක් විදිත කෙරේද? පෙර විසූ ආත්ම භාවයෝය. අවිජ්ජා යනු අවිදිත (අනවබෝධ) අර්ථයෙන් අවිජ්ජා නම් වේ. එම අවබෝධ නැණ වසන මෝහයයි කියනු ලැබේ.

ආලොකො යනු ඕ විද්‍යා තොමෝම ආලෝකමත් කරන අර්ථයෙන් ආලෝකය යයි කියනු ලැබේ. මෙහි වනාහි එම විද්‍යාව අවබෝධ කළේය යන මේ අර්ථයයි. සෙස්ස ප්‍රශංසා කිරීම සඳහාය. මෙහි මෙම යෙදීම්හු වෙති. මා විසින් මේ විද්‍යාතොමෝ අවබෝධ කරන ලද්දීය. අධිගත විජ්ජා ඇති මගේ අවිජ්ජා තොමෝ පහව ගියාය. නැසුනාහ යන අර්ථයි. කුමක් හෙයින් ද, යම් හෙයකින් විද්‍යාව පහළ වූවා ද, මේ නයමැයි ඉතිරි පද දෙක පිළිබඳවද,

යථාතං යනු මෙහි යථා යනු උපමා අර්ථයෙහිය. තං යනු නිපාතයි. සතියගේ අවිප්පවාසයෙන් අප්පමත්තසස ප්‍රාමාද වූවහුට වීර්ය නමැති අව්වෙන්, ආතාපිනො තැවෙන්නහුට කයෙහි ද, ජීවිතයෙහි ද අපේක්‍ෂා රහිත බැවින් පහිතත්තසස, නිවනට මෙහෙයවන ලද සිත් ඇත්තහුට, අත්හරින ලද සිත් ඇත්තහුට යන අර්ථයි. මෙයින් කියන ලද්දේ වෙයි. අප්‍රමාදීව කෙලෙස් තවන වෙර ඇතිව මුදාහළ සිත් ඇතිව, වාසය කරන්නෙකු විසින්, යම්සේ අවිද්‍යාව නසන ලද්දී ද, විද්‍යා තොමෝ උපදවනු ලබන්නී ද, අන්‍ධකාරය නසන ලද්දී ද, ආලෝකය උපදවන්නී ද, එපරිද්දෙන් මවිසින් අවිද්‍යාව නසන ලද්දීය. විද්‍යාව උපදවන ලද්දීය. තමස (අඳුර) නසන ලද්දීය. ආලෝකය උපන්නේය. එපරිද්දෙන් මා විසින් වීර්යයට අනුරූප වූ ප්‍රතිඵලය ලබන ලද්දේය.

**පූර්වෙනිවාස කථා නිමි.**

**චුතූපපාත කථා**

චුතූපපාත කථාවෙහි මෙහි භාග්‍යවතුන් වහන්සේගේ වශයෙන් පාලියෙහි ආවේ වෙයි. එහෙයින් පසසාමි පජානාමි යයි කියන ලද්දීය. විශේෂත්වයකට ඇත්තේ මෙයයි. සෙස්ස විසුද්ධිමග්ගයෙහි දැක්වූ පරිදිම වෙයි. මෙහි වනාහි විජ්ජා යනු දිබ්බචක්ඛුඤාණ විද්‍යාවයි. අවිජ්ජා යනු සත්ත්වයන් චුතිය හා පටිසන්ධිය වසන අවිජ්ජාවයි. සෙස්ස කී පරිදිමැයි.

යම් හෙයකින් පිරූ පාරමී දම් ඇති මහාසත්ත්වයන් වහන්සේට පරිකර්ම කෘත්‍යයක් නම් නැත. ඔහු විසින් සිත ඒ සඳහා නැමූ කල්හිම අනෙකාකාර වූ පූර්වෙ නිවාස සිහිකරන, දිවැසින් සතුන් බලත්, යමෙක් මෙහි පරිකර්මය ආදිකොට භාවනා ක්‍රමය කියන ලද්දේ වෙයි. එයින් මෙහි ප්‍රයෝජනයෙක් නැත.

ආසවක්ඛය ඤාණය

තුන්වන විද්‍යාවෙහි සො එවං සමාහිතෙ චිතෙත යයි විපසසනා පාදක හතරවන ධ්‍යානය දතයුතුයැ. ආසවානං ඛයෙ ඤාණාය රහත් මග නැණ පිණිස, ඒ එසේමැයි. රහත්මග වනාහි ආසවයන් නසන හෙයින් (ආසවානං ඛයො ඉති) ආසවක්ඛය යයි කියනු ලැබේ. ඒ ආසවයන් නැතිකිරීමෙහි ද මේ ඤාණය වෙයි. එහි ඇතුළත් වූ හෙයිනි. චිත්තං අභිනින්නාමෙසිං විදර්ශනා චිත්තය එළවීමි. සො ඉදං දුක්ඛං යන මේ ආදි තන්හි මෙතෙක් දුකය, මෙයින් වැඩියක් නැතැයි සියලුම දුක්ඛ සත්‍යය රස ලක්‍ෂණ සහිත ප්‍රතිවෙධයන් යථා භූතං තත් වූ යථාභූතං අබ්භඤ්ඤාසිං තත් වූ පරිද්දෙන් විශේෂයෙන් අවබෝධ කෙළෙමි. දැනගතිමි. ප්‍රතිවෙධ කළෙමි. ඒ දුක්ඛයාගේ ඉපදවීමේ තෘෂ්ණාව අයං දුක්ඛ සමුදයො යනුයි. දුක, දුකට හේතුව යන දෙකම යම් තැනකට පැමිණ නිරුද්ධ වේද, ඒ ඔවුන්ගේ නොපැවැත්ම නම් වූ නිවන අයං දුක්ඛ නිරොධො යනුයි. ඒ නිවනට පමුණුවන්නා වූ ආර්ය මාර්ගය අයං දුක්ඛ නිරොධ ගාමිනි පටිපදා යනුයි. රස සහිත ලක්‍ෂණ ප්‍රතිවේධයෙන් තත් වූ පරිද්දෙන් විශේෂයෙන් අවබෝධ කළෙමි. දැනගතිමි. ප්‍රතිවේධ කළෙමියි මෙසේ අර්ථය දතයුත්තේය. මෙසේ ස්වරූප වශයෙන් සත්‍යයන් දක්වා දැන් කෙලෙස් වශයෙන් පරියාය වශයෙන් දක්වන සේක් ඉමෙ ආසවා යනාදිය වදාළහ.

ප්‍රත්‍යවේක්‍ෂා ඥානය

තසස මෙ එවං ජානතො එවං පසසතො යනුවෙන්, මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ ඒ මගේ විපසසනා ඤාණය සමග කෙළවරට පැමිණි මාර්ගය වදාරති. කාම ආසවයෙන් විමුච්චිත්ථ යන මෙහි ඵලක්‍ෂණය දක්වයි. මාර්ග ක්‍ෂණයෙහි සිත මිදෙයි. ඵල ක්‍ෂණයෙහි මිදුනේ වෙයි. විමුත්තසමිං විමුත්ත මිති ඤාණං යන මෙයින් ප්‍රත්‍යවේක්‍ෂා ඥානය දක්වයි. ඛීණා ජාති යන මෙයින් ප්‍රත්‍යවේක්‍ෂා ඥානයාගේ භූමිය වදාරති. ඒ ඥානයෙන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ ඛීණා ජාති යනාදිය දැනගත් සේක. භාග්‍යවතුන් වහන්සේගේ කවර ජාතියක් ඛීණ වූවා ද, එය කෙසේ දැනගත් සේක් ද යත් උන්වහන්සේගේ ඉක්මුණු ජාති තොමෝ ක්‍ෂය නොවූවා වෙයි. පෙරම ක්‍ෂය වූ හෙයිනි. අනාගතයද නොවෙයි. අනාගතයෙහි උත්සාහයක් නැති හෙයිනි. පවත්නා ජාතියද නොවෙයි. විද්‍යමාන හෙයිනි.

මාර්ගය නොවැඩූ බැවින් ඒක-චතු-පංච වොකාර භවයන්හි ඒක-චතු-පංච ස්කන්ධයන්ගෙන් යුත් යම් ජාතියක උපදින්නී ද ඕ තොමෝ මාර්ගය වැඩූ බැවින් නූපදනා ස්වභාව ඇති බවට පැමිණීමෙන් ක්‍ෂය වූ ඒ භාග්‍යවත්හු මාර්ග භාවනාවෙන් ප්‍රහීණ ක්ලේශයන් ප්‍රත්‍යවේක්‍ෂා කොට කෙලෙසුන් නැති කල්හි විද්‍යමාන වූ ද එම කර්මය මත්තෙහි පිළිසිඳ නොදෙන්නේ වේදැයි දන්නාහු දැනගත් සේක. වුසිතං යනු වැස නිමවන ලද්දේය. හාත්පසින් වැස නිමවන ලද්දේය. කරන ලද්දේය. හැසිරෙන ලද්දේය. නිමවන ලද්දේය යන අර්ථයි. බ්‍රහමචරියං මාර්ග බ්‍රහ්ම චර්යාව, කල්‍යාණ පෘථජ්ජනයා සමග සත්ත සේඛයෝ බඹසර වසන්නාහු නම් වෙති. ඛීණාසව තෙමෙ වැස නිමකරන ලද බඹසර ඇත්තේය. එබැවින් භාග්‍යවතුන් වහන්සේ වුසිතං බ්‍රහම චරියං යයි දැනගත් සේක. කතං කරණීයං සිවුසස්හි සතර මාර්ගයන්ගෙන් පරිඤ්ඤා-සච්ඡිකිරියා-භාවනා වශයෙන් සොළසාකාර කෘත්‍ය නිමවන ලද්දේය යන අර්ථයි.

කල්‍යාණ පෘථජ්ජන ආදිහු වනාහි එම කෘත්‍යය කරත්, ඛීණාසව තෙමේ කත කරණීය නම් වේ. එබැවින් භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ කළයුතු දෙය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ කතං කරණීයං යයි දැනගත්තේය. නාපරං ඉත්ථත්තාය යනු මෙවිට යළි මෙබඳු බව පිණිස මෙසේ සොළොස් ආකාර කෘත්‍යයාගේ අභාවයෙන්, කෙලෙස් ප්‍රහාණ්‍ය පිණිස හෝ මාර්ග භාවනා කෘත්‍යයක් මට නැතැයි දැනගත්තේය. නැතහොත් ඉත්ථත්තාය මෙබඳු භාවයෙන් මෙබඳු ප්‍රාකාරයෙන් දැන් පවත්නා ස්කන්ධ සන්තතියෙන් අන්‍ය වූ ස්කන්ධ පරම්පරාවක් මට නැත. මේ පංච ස්කන්ධයෝ වනාහි පරිඤ්ඤාත වූවාහු මුල් සිඳපු ගස් මෙන් සිටිති. ඔවුහු චරිමක විඤ්ඤාණයාගේ නිරෝධයෙන් දර රහිත ගින්නක් මෙන් නිවෙන්නාහු යයි දැනගත් සේක. දැන් මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා ඥානයෙන් පරිගෘහිත වූ එම ආසවක්ඛය ඤාණය බමුණාට දන්වන සේක්, අයං ඛො මෙ බ්‍රාහමණ යන ආදිය වදාළහ. එහි විජ්ජා යනු රහත්මග ඥාන නම් විද්‍යාවයි. අවිජ්ජා යනු සිවුසස් මුවහ කරන අවිද්‍යාවයි. සෙස්ස කී නයින් දතයුතුයැ.

මෙතෙකින් පුබ්බෙ නිවාස ඤාණයෙන් අතීත ඤාණයද, දිබ්බ චක්ඛු ඤාණයෙන්, වර්තමාන හා අනාගත ඤාණයද, ආසවක්ඛය ඤාණයෙන් සියලු ලෝකෝත්තර ගුණයදැයි මෙසේ ත්‍රිවිද්‍යාවන්ගෙන් සියළු සර්වඥ ගුණයන් සංග්‍රහකොට ප්‍රකාශකරන සේක්, තමන් වහන්සේගේ නොමුළා විහරණය - බ්‍රාහ්මණයා හට දැක්වූ සේක. මෙසේ කී කල්හි

බ්‍රාහ්මණ තෙම මෙසේ සිතී. ශ්‍රමණ භවත් ගෞතම තෙම සර්වඥ බව ප්‍රතිඥා කරයි. අද දක්වාත් අරණ්‍යවාසය අත් නොහරියි. ඔහු විසින් කළයුතු අන් කිසිවක් ඇද්දැයි, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ අදහස දැන මෙම අජ්ඣාසයානු සන්ධියෙහි (පිහිටා) සියා ඛො පන තෙ යනාදිය වදාළහ.

සියා ඛො පන තෙ බ්‍රාහමණ එවමසස යනුවෙන් බ්‍රාහ්මණය, ඔබට කිසිවිටෙක මෙබඳු සිතක් වන්නේය. න ඛො පනෙතං බ්‍රාහමණ, එවං දට්ඨබ්බං බමුණ, ඔබ විසින් මේ මාගේ පත්ත සේනාසන ඇසුරු කිරීම වනාහි පහනොකළ රාගාදිය ඇති බැවිනැයි, මෙසේ නොදතයුතුය. මෙසේ පත්ත සේනාසන පටිසේවනය හේතුරහිත බව ප්‍රතික්ෂේප කොට කරුණු දක්වන සේක්, දෙව ඛො අහං ආදිය වදාළහ. එහි අර්ථයම අත්වස නම් වේ. එහෙයින්, දෙව ඛො අහං බ්‍රහමණ අත්වසෙ යනුවෙන් බ්‍රාහ්මණය, මම වනාහි අර්ථ දෙකක් කාරණා දෙකක් දක්නෙමි. කියන ලද්දේ වෙයි. අත්තනොච දිට්ඨධම්ම සුඛවිහාරං යන මෙහි දිට්ඨධම්ම නම් පෙනෙන්නා වූ මේ ආත්මභාවයයි. ඵාසුවිහාර නම් සතර ඉරියව්වල පහසුතාවයයි. යම් හෙයකින් වනයෙහි හුදකලා වූවහුට යටත් පිරිසෙන් වනයෙහි උච්චාර - පසසාව කර්මයෙහි සිට සියලු ඉරියාපථයෝ පහසු වෙති. එහෙයින් දිට්ඨධම්ම සුඛ විහාරං යන ඉහාත්ම සැප විහරණයම දිට්ඨධම්ම සුඛ විහාර වශයෙන් දතයුතුයැ.

පච්ඡිමඤ්ච ජනතං අනුකම්පමානො යනු, කෙසේනම් අරණ්‍යවාසයෙන් පශ්චිම ජනතා තොමෝ අනුකම්පා ලැබුවා වේද? සැදැහැයෙන් සසුන් වන් කුලපුත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේගේ අරණ්‍යවාසය දැක, භාග්‍යවතුන් වහන්සේ පවා අරණ්‍ය සේනාසන අත් නොහරිති. ඒ භාග්‍යවතුන් වහන්සේට පරිඥ්ඥාත ධර්මයෙක් නොම ඇත. පහාතබ්බ ධර්මයෙක් නොම ඇත. භාවෙතබ්බ ධර්මයෙක්ද නොම ඇත. සච්ඡිකාබ්බ ධර්මයක්ද නොම ඇත. අප වැන්නවුන් ගැන කියනුම කවරේදැයි, සිතා එහි (ආරණ්‍යයෙහි වාසය කළ යුතුම යයි හඟිත්.) මෙසේ වහා දුක් කෙළවර කරන්නාහු වන්නාහු යයි. මෙසේ පශ්චිම ජනතා තොමෝ අනුකම්පා ලබන්නාහු වන්නී යයි කියනි ලද්දී වෙයි.

මෙම අරුත දක්වමින් මෙසේ වදාළහ. පච්ඡිමඤ්ච ජනතං අනුකම්පමානො යනුවෙන් මෙය අසා සතුටට පත් බමුණු තෙම, අනුකම්පිතරූපා යනාදිය කීහ. එහි අනුකම්පිත රූපා යනු අනුකම්පිත

ජාතිකා අනුකම්පා කළ ස්වභාව ඇති. ජනතා යනු ජන සමූහ තෙම, යථා තං අරහතා සම්මා සම්බුද්ධෙන යනුවෙන් යම්සේ එම සම්මා සම්බුද්ධ තෙම අනුකම්පා කරන්නේ ද එසේම අනුකම්පා කළ ස්වභාව ඇත්තාහු යයි. මෙසේ කියා යළිත් බුදුරදුන්ගේ එම දේශනාව අනුමෝදන් වෙමින් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. අභික්කන්තං භො ගොතම අභික්කන්තං භොගොතම යන මෙහි අභික්කන්ත ශබ්දය ඛය - සුන්දර, අභිරූප අබ්භනු මොදනා (=අනුමෝදන් වීම) යන අර්ථයන්හි දක්නට ලැබේ. අභික්කන්තො භන්තෙ රත්ති නික්ඛන්තො පඨමො යාමො චිරනිසින්නො භික්ඛු සංඝො යනාදි තන්හි ක්‍ෂයවීම යන අර්ථයෙහි වේ. අයං ඉමෙසං චතුන්නං පුග්ගලානං අභික්කන්ත තරොච පණීත තරො ච යන ආදි තන්හි සුන්දර යන අර්ථයෙහි වේ.

කොමෙ වන්දති පාදානි, ඉද්ධියා යසසාජලං
අභික්කන්තෙන වණ්ණෙන සබ්බා ඔභාසයං දිසා

(ඉද්ධියෙන් ද යසසින් ද දිලිසෙමින් අභිරූප වූ වර්ණයෙන් සියලු දිගුන් බබලවමින් කවරෙක් මාගේ පාදයන් වඳිත්ද)
යනාදී තන්හි අභිරූප යන අර්ථයෙහි වේ.

අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ යනාදි තන්හි අනුමෝදනා අර්ථයෙහි දක්නට ලැබේ. මෙහිද අනුමොදනා අර්ථයෙහි වේ. එහෙයින් මැනව. පින්වත් ගෞතමයෙනි, මැනව පින්වත් ගෞතමයෙනි යයි කියන ලද්දේ වේයයි දතයුත්තේය.

භයෙ කොධෙ පසංසායං තුරිතෙ කොතුහලච්ඡරෙ
හා සෙ සොකෙ පසාදෙච කරෙ ආමෙණ්ඩිතං බුධො,

(භයෙහිද ක්‍රෝධයෙහිද පසංසාවෙහිද සීඝ්‍රයෙහිද කුහුල් බැව්හිද පුදුම වීමෙහිද සිනහවෙහිද සෝකයෙහිද ප්‍රසාදයෙහිද බුද්ධිමත් තෙම ආම්‍රේඩිතය (එක ශබ්දය දෙවරක් ප්‍රයෝග කිරීම කරන්නේය)

මේ ආම්‍රේඩිත අර්ථයෙන් ද, මෙහි ප්‍රසාද වශයෙන් ද මේ අභික්කන්ත ශබ්දය දෙවරක් යොදන ලද්දේ යයි දතයුතුය. නැතහොත් අභික්කන්තං යනු ඉතා කාන්තය. ඉතා හොඳය. ඉතා මනාපය. ඉතා සුන්දර යයි කියන ලද්දේ වෙයි. එහි එකම අභික්කන්ත ශබ්දයෙන්

දේශනාවට ස්තුති කෙරේ. එක් අතකින් තමාගේ පැහැදීම ප්‍රකාශ කරයි. මේ චූකලී මෙහි අදහසයි.

භගවත් ගෞතමයන් වහන්ස, දේශනාව අතිශයින් කාන්තය. භවත් ගෞතමයන් වහන්ස, අතිශයින් ඉෂ්ටය. මේ දේශනාව අසා මගේ පැහැදී භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ද, දේශනාව කෙරෙහිදැයි මේ දෙඅරුත සඳහාම ස්තුති කෙරේ. භාග්‍යවතුන් වහන්සේගේ වචනය ඉතා මනහරය. දොස් නසන හෙයිනි. භාග්‍යවතුන් වහන්සේගේ වචනය ඉතා මැනවි. උතුම් වූ ගුණයට පමුණුවන හෙයිනි. එසේම ශ්‍රද්ධාව උපදවන හෙයින්ද ප්‍රඥාව උපදවන හෙයින් ද මැනව.

එසේම අර්ථ සහිත බැවින්ද ව්‍යඤ්ජන සහිත බැවින්ද මැනව. නොගැඹුරු පද ඇති හෙයින්ද මැනව. කනට මිහිරි හෙයින්ද මැනව. හෘදයංගම හෙයින්ද මැනවි. තමා උසස්කොට දැක්වීමක් අනුන් පහත්කොට සැලකීමක් නැති බැවින්ද මැනවි. කරුණාවෙන් සිහිල් හෙයින්ද, ප්‍රඥාවෙන් නිර්මල හෙයින්ද මැනවි. විනාශය ඉවසන හෙයින්ද මැනවි. ඇසීමෙන් සුව එලවන හෙයින්ද විමසීමෙන් හිත එලවන හෙයින්ද යන මේ ආදීන් ගෙන යෙදිය යුතු හෙයින්, එයින් මත්තෙහි උපමා සතරකින් දේශනාවට පසසයි.

එහි නිකකුජ්ජිතං, අධෝමුඛ කොට තබන ලද මුව යටිහුරු වූ හෝයි. උක්කුජ්ජෙය්‍ය මුව උඩුහුරු කරන්නේය. පටිච්ඡන්නං තණපත් ආදියෙන් වසන ලද්දක්, විවරෙය්‍ය, විවෘත කරන්නේය. මූළ්හස්ස දිශා මුළා වූවහුට මග්ගං ආචික්ඛෙය්‍ය අත ගෙන මේ මගයයි කියන්නේය. අන්ධකාරෙ කාළ පක්ෂය, චාතුද්දසියා මධ්‍යම රාත්‍රිය ඝන වනය, මේඝ පටලය යන අංග සතරින් යුක්ත වූ, පළමුකොට දක්වන ලද්දේ නො ගැඹුරු වූ පදාර්ථය. (මේ මතු කියනු ලබන්නේ) අභිප්‍රාය අර්ථ යෝජනාවයි. යමෙක් මුව යටිකුරු කොට තබන ලද්දක් යම්සේ උඩුමුව කරන්නේ ද, මෙසේ අසත් ධර්මයෙහි පතිත වූ මා අසද් ධර්මයෙන් සද්ධර්ම මුඛයට නගා සිටුවන්නා වූ, යම් සේ පටිච්ඡන්න වූවක් විවෘත කරන්නේ ද එසේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ ශාසන අන්තර්ධානයේ පටන් මිසදිටු ගැන්මෙන් වැසුන සසුන විවෘත කරන්නා වූ, යම්සේ මුළා වූවෙකුට මග කියන්නේ ද, එසේම වැරදිමගට මිථ්‍යා මගට පිළිපන්නා වූ මට සඟමොක් ප්‍රකාශ කරන්නා වූ, අන්ධකාරයෙහි තෙල් පහනක් දල්වන්නේ ද මෙසේ

මෝහාන්ධකාරයෙහි නිමග්න වූ බුද්ධාදි රතන රූපයන් නොදක්නා වූ මට ඒ (තුණුරුවන්) ප්‍රතිච්ඡාදක වූ මොහඳුර දුරුකරන දෙසුම් නමැති පහන් දැරීමෙන් භවත් ගෞතමයන් විසින් මට මෙවන් ක්‍රමවලින් ප්‍රකාශ කළ හෙයින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේ විය.

මෙසේ දහම් දෙසුමට තුතිකොට මෙම දෙසුමෙන් තුණුරුවන් කෙරෙහි පහන් සිත් ඇත්තේ පහන් බව දක්වන්නේ **එසාහං** ආදිය කීහ. එහි **එසාහං** යනු ඒ එම යනුයි. **භවන්තං ගොතමං සරණං ගච්ඡාමි** යනුවෙන්, මට පින්වත් ගෞතමයන් වහන්සේගේ සරණය. පිහිටය. දුක් නසන්නේ ද හිතවත් දෙය සලසන්නේ ද වෙති යන මේ අදහසින් භවත් ගෞතමයන් වහන්සේ සරණකොට යමි. භජනය කරමි. සේවනය කරමි. පයුරුපාසනය කරමි. නැතහොත් මෙසේ දනිමි. අවබෝධ කරමියි යන අර්ථයි. යම් ධාතු කෙනෙකුන් ගමනාර්ථය වේද බුද්ධියක් එහි අර්ථයක් වේද, එබැවින් ගච්ඡාමි යනු මේ පදයාගේ අරුත දනිමි. අවබෝධ කරමියි යන මේ අර්ථය කියන ලද්දේ විය.

**ධම්මඤ්ච භික්ඛු සංඝඤ්ච** මෙහි වනාහි අවබෝධ කළ මග ඇත්තේ, සච්ඡිකත නිරෝධය ඇත්තේ අනුශාසනා පරිදි පිළිපදින්නවුන් අපායෙහි නොවැටෙන්නවුන් කොට ධරානුයි ධම්ම නම් වේ. ඒ ධර්මය තෙම ආර්ය මාර්ගයද නිර්වාණයද වේ. එහෙයින් කියන ලදී. **යාවතා භික්ඛවෙ ධම්මා සංඛතා අරියො අට්ඨංගිකො මග්ගො තෙසං අග්ග මක්ඛායති** (මහණෙනි, යම්තාක් සංඛත ධර්මයෝ වෙත් ද ඔවුන් අතුරෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය අග්‍ර යයි කියනු ලැබේ.) යන විස්තරයෙහි හුදෙක් ආර්ය මාර්ගය ද නිර්වාණය ද පමණක් නොවේ. යළිදු ආර්ය ඵලයන් සමග පර්යාප්ති ධර්මයද වෙයි. **ඡත්ත** මානවක විමාන වස්තුවෙහි මෙසේ කියන ලදී.

**රාගවිරාග මනෙජමසොකං, ධම්මමසංඛතමප්පටිකූලං**
**මධුරමිමං පගුණං සුවිභත්තං ධම්මමිමං සරණත්ථමුපෙහි**

(රාගය දුරු වූ තණ්හා රහිත වූ සෝක රහිත වූ අසංඛත වූ මේ නව ලොව්තුරු දහම පිළිකුල් නොවූ මිහිරි වූ ප්‍රගුණ කටයුතු වූ මනාව බෙදන ලද්දා වූ මේ පර්යාප්ති ධර්මයද සරණ පිණිස පැමිණෙමි.)

මෙහි රාග විරාග යනුවෙන් මාර්ගය කියන ලද්දේය. අනෙජ මසොකං යනුවෙන් ඵලය කියන ලද්දේය. ධම්මමසංඛත යනුවෙන් නිර්වාණය කියන ලදි.

අප්පටිකූලං මධුරම්මං පගුණං සුවිභත්තං පිටකත්‍රයෙහි විභාග කරන ලද සියලු ස්කන්ධයෝ කියන ලද්දාහුය. වැරදි සීල, දිට්ඨී සමූහය නසන ලද්දාහුය යන අරුතින් සංඝනම් වේ. එය අර්ථ වශයෙන් අට්ඨ අරිය පුග්ගල සමූහය කියන ලද්දේ වෙයි. එය එම විමාන වස්තුවෙහිම මෙසේ කියන ලදී.

යත්ථච දින්න මහප්ඵලමාහු, චතූසු සුචීසු පුරිසයුගෙසු
අට්ඨච පුග්ගල ධම්මදසාතෙ සංඝම්මං සරණත්ථ මුපෙමි

(පිවිතුරු පුරුෂ යුග වශයෙන් සතරක් වූ ආර්ය සංඝරත්නය විෂයෙහි දෙන ලද දානය මහත්ඵලයයි කියත්ද, ඔවුහු අෂ්ට ආර්ය පුද්ගලයෝද වෙති. ධර්මය අවබෝධ කළ මේ සංඝරත්නය සරණ පිණිස පැමිණෙමි.) භික්ඛූනං සමූහො භික්ඛු සංඝො භික්ෂූන්ගේ සමූහය භික්ෂු සංඝ නම් වේ. මෙපමණකින් බමුණු තෙමේ තෙරුවන් සරණ අවබෝධ කළේය.

සරණය, සරණාගමනය, සරණගතයා මේ වනවිට එම සරණාගමනයන් විෂයෙහි, දක්ෂ බව පිණිස සරණය සරණාගමනය යමෙක් සරණ යේද, හෙතෙම සරණාගමන ප්‍රභේදය සරණගමන ඵලය, සරණාගමනය කිලුටුවීම යන මේ දතයුත්තේය. සෙය්‍යථීදං ඒ කවරේද පදාර්ථ වශයෙන් හිංසා කෙරේනුය සරණ නම් වේ. එම සරණාගමනයෙන් සරණාගතයන්ගේ භය, තැතිගැනීම් දුක්, දුගති, පරික්ලේශ නැතිකරයි. විනාශ කෙරේය යන අර්ථයි. සරණ යනු තුණුරුවන්ට නමකි. නැතහොත් හිතවත් බැව්හි පැවැත්මෙන් අහිතයන් වැලක්වීමෙන් ද සත්ත්වයන්ගේ භයට හිංසා කෙරේනුයි භගවත් තෙම භව කතරින් එතර කිරීමෙන් හා අස්වැසිලි දීමෙන් ධර්මයද ස්වල්ප වූ සත්කාරයකින් මහත් වූ ප්‍රතිඵල හේතුවෙන් සංඝ තෙම 'සරණ' නම් වෙයි. එහෙයින් මෙම ක්‍රමයෙන්ද, රතනත්‍රය සරණ නම් වෙයි. තප්පාසාද තග්ගරුතා යන මෙයින් වෙසෙසින් නසන ලද කෙලෙස් ඇති තත්පරායණාකාරයෙන් පැවැත්තා වූ චිත්තෝද්පාදය තෙම සරණගමණ නම් වෙයි.

එයින් යුත් පුද්ගල තෙම සරණ ගියේ වෙයි. උක්තප්‍රකාර චිත්තෝද්පාදයෙන් යුත් මට මේ තෙරුවන් සරණය. තෙරුවන් පිහිටයයි (පරායනයයි) මෙසේ එළඹියේය යන අරුති. මෙසේ පළමුකොට සරණය සරණයාමය යමෙක් සරණයේද හෙතෙමේ ද යන මේ තුන් කරුණු දතයුතුයැ.

**සරණාගමන ප්‍රභේද**

සරණාගමන ප්‍රභේද දුවිධ වේ. ලෝකෝත්තර සරණාගමනයද, ලෞකික සරණාගමනයද යනුවෙනි. ඔවුනතුරෙන් ලෝකෝත්තර සරණාගමනය නම් මග නැණින් දත් සිවුසස් ඇත්තහුට මහ නැණ පහළ වන මොහොතෙහි සරණාගමනය පිළිබඳ උප ක්ලේශයන්ගේ සමුච්ඡේද ප්‍රහාණයෙන් අරමුණු වන හෙයින් නිවන අරමුණුව කිස සපුරමින් රත්නත්‍රය සම්පූර්ණ වීමයි.

ලෞකික සරණාගමනය පුහුදුන් හට සරණාගමන උප ක්ලේශයන්ගේ විෂ්කම්භනයෙන් අරමුණු වන හෙයින්, බුද්ධාදි ගුණයන් අරමුණු වීමෙන් සමෘද්ධ වෙයි. එය අර්ථ වශයෙන් බුද්ධාදී වස්තුන්හි ශ්‍රද්ධා ප්‍රතිලාභයයි. ශ්‍රද්ධාව මුල්කොට ඇත්තා වූ සම්මා දිට්ඨිය දශපුණ්‍ය ක්‍රියා විෂයෙහි දිට්ඨුජ්ජු කම්ම යයි කියනු ලැබේ.

ඒ මේ ලෞකික සරණාගමනය සිව් ආකාරයකින් පවතී. අත්ත සන්නීයාතන, තත්පරායනතා, සිස්සභාවූපගමන, පණිපාත යනුවෙනි. ඔවුන් අතුරෙහි අත්තසන්නීයාතන සරණාගමන නම්, මම අද පටන් මගේ ආත්මභාවය බුදුරදුන්ටද, ධර්මයටද, සංඝයාටද පාවා දෙමියි මෙසේ බුද්ධාදීන්ට ආත්ම පරිත්‍යාග යයි.

තත්පරායනතා සරණාගමනය නම් මම අද පටන් කොට බුදුරදුන් පිහිටකොට ඇත්තේ වෙමි. ධර්මය පිහිටකොට ඇත්තේ වෙමි. සංඝයා පිහිටකොට ඇත්තේ වෙමියි මා දැරුව මැනවයි (සරණ යාම) තත්පරායතනතා සරණාගමනයයි.

සිසස භාමූපගමන සරණාගමනය නම්, මම අද පටන් බුදුරදුන්ගේ අතවැසියෙක් වෙමි. ධර්මයේ අතවැසියෙක් වෙමි. සංඝයාගේ අතවැසියෙක් වෙමියි මා දැරුව මැනවයි මෙසේ ශිෂ්‍යභාවයට පැමිණීමයි.

පණිපාත සරණාගමනය නම්, මම අද පටන් අභිවාදන - පච්චුපට්ඨාන - අඤ්ජලිකම්ම, සාමීචිකම්ම බුද්ධාදි තුණුරුවන්ට කරමි යයි මා දැරුව මැනවයි මෙසේ බුද්ධාදීන් කෙරෙහි අතිශයින් පහත් (නිහතමානි) පැවතුම් ඇති ආකාරයයි.

මේ සතර ආකාරයන් අතුරෙන් එක්තරා ආකාරයකින් කරන්නහු විසින් සරණාගමනය ගන්නා ලද්දේම වෙයි.

තව ද භාග්‍යවතුන් වහන්සේට ආත්මභාවය පරිත්‍යාග කරමි. ධර්මයට ද, සංඝයාට ද ආත්මභාවය පරිත්‍යාග කරමි. ජීවිතය පරිත්‍යාග කරමි. මා විසින් ආත්මභාවය පරිත්‍යාග කරන ලද්දේමය. මා විසින් ජීවිතය පරිත්‍යාග කරන ලද්දේමය. ජීවිතය අන්තකොට බුදුන් සරණ යමි. මට බුදුසරණයි, නිලීනස්ථාන යයි ආරක්ෂා ස්ථානයයි මෙසේත් අත්ත සන්නීයාතන සරණාගමනය දතයුතුයි.

**සත්ථාරඤ්ච වතාහං පස්සෙය්‍යං භගවන්තමෙව පස්සෙය්‍යං, සුගතඤ්ච වතාහං පස්සෙය්‍යං භගවන්ත මෙම පස්සෙය්‍යං, සම්මා සම්බුද්ධඤ්ච වතාහං පස්සෙය්‍යං භගවන්තමෙව පස්සෙය්‍ය** යනුවෙන් මෙසේත් මහා කාශ්‍යප තෙරුන් බුදුන් සරණ යාම මෙන් භාවූපගමන සරණාගමනය දතයුතුයැ.

**සො අහං විචරිස්සාමි ගාමගාමං පුරාපුරං**
**නමස්සමානො සම්බුද්ධං ධම්මස්සච සුධම්මතං**

(ආලවක නම් වූ) මම සම්බුද්ධයන් වහන්සේට නමස්කාර කරමින් ධර්මයාගේද සුධර්මභාවය ප්‍රකාශ කරමින් ගමින් ගම නගරයෙන් නගරය හැසිරෙන්නෙමි.)

මෙසේ වූ ආලවක ආදීන්ගේ සරණාගමන මෙන් තත්පරායනතා සරණාගමනය දතයුත්තේය. **අථ ඛො බ්‍රහමායු බ්‍රාහමණො උට්ඨායාසනා එකංසං උත්තරාසංග කරිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙනච පරිචුම්බති පාණිහිච පරිසම්භාහති නාමඤ්ච සාවෙති. බ්‍රහමායු අහං භොගොතම බ්‍රහමායු බ්‍රාහමණො අහං භොගොතම බ්‍රාහමණො.**

(ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙම, හුනස්නෙන් නැගී සිට උතුරු සළුව එකස්කොට භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් මුහුණින් ද සිඹියි. අතුල්වලින් ද පිරිමදී. නමද අස්වයි. භවත් ගෞතමයන් වහන්ස, මම බ්‍රහ්මායු බ්‍රාහ්මණයා වෙමි. භවත් ගෞතමයන් වහන්ස, මම බ්‍රහ්මායු බ්‍රාහ්මණයා වෙමි.)

යනුවෙන් මෙසේත් ප්‍රණිපාත සරණාගමනය දතයුතුයි. ඒ මේ ප්‍රණිපාත සරණාගමනය, ඥාති - භය - ආචරිය දක්ඛිණෙය්‍ය වශයෙන් සිව්වැදෑරුම් වේ. එහි දක්ඛිණෙය්‍ය සරණාගමනයම සරණාගමන වෙයි. අන්‍යයන්ගෙන් සරණාගමනය නොවෙයි. ශ්‍රේෂ්ඨ වශයෙන් සරණය ගනු ලැබේ. ශ්‍රේෂ්ඨ වශයෙන්ම සරණාගමනයෙහි බිඳීමද වෙයි. යම් ශාක්‍ය වංශිකයෙක් හෝ කෝලිය වංශිකයෙක් හෝ බුදුරජ අපගේ නෑයෙකැයි වඳී ද, සරණයෙහි නොපිහිටියේ වෙයි. යමෙක් භවත් ගෞතමයන් වහන්සේ රාජපූජිතය. මහත් ආනුභාව සම්පන්නය. නොවැන්දොත් අනර්ථයක් කරන්නේ යයි බයින් වඳීද, සරණයෙහි නොපිහිටියේම වෙයි. යම් කෙනෙක් බෝධිසත්ත්ව කාලයෙහි භාග්‍යවතුන් හමුවේදී කිසිවක් උගත්තේ යයි සිහිකොට බුද්ධ කාලයෙහි හෝ

එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය ද්වීහිකම්මං පයොජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය ආපදාසු භවිස්සති

(භෝගයන්ගෙන් එක් කොටසක් පරිභෝග කරන්නේය. කොටස් දෙකක් කර්මාන්තයෙහි යොදන්නේය. සතරවැනි කොටස විපතක් ආපදාවකදී ගැනීමට තැන්පත් කරන්නේය.)

මෙබඳු වූ අනුශාසනයක් ඉගෙන හෝ මගේ ආචාර්ය මගේ ආචාර්යවරයෙකැයි වඳීද, සරණ නොපිහිටියේම වෙයි.

යමෙක් මෙතෙම ලෝකයෙහි අග්ග දක්ඛිණෙය්‍යො වේයයි වඳීද, එයින් හෙතෙම සරණයෙහි පිහිටියේ වෙයි. මෙසේ පිහිටි සරණ ඇති උපාසකයාගේ හෝ උපාසිකාවගේ හෝ අන්‍ය තීර්ථකයන් කෙරෙහි පැවිදි වූ නෑයෙකු මේ තෙම මගේ නෑයෙකැයි වඳින්නහුගේ සරණාගමනය නොබිඳෙයි. පැවිදි නොවූවකු ගැන කියනුම කවරේද?

භය වශයෙන් රජෙකු වඳින්නහුගේද එසේමැයි. යම් හෙයකින් හෙතෙම රටවැසියා විසින් පුදන ලද බැවින් නොවැඳීම නිසා අනර්ථ නමුදු කරන්නේය. එබැවින් එසේම යම්කිසි ශිල්පයක් උගන්වන්නා වූ තීර්ථකයෙකු පවා මගේ ආචාර්යවරයෙකැයි වඳින්නහුගේ සරණය නොබිඳේ. මෙසේ සරණාගමනයෙහි ප්‍රභේද දතයුත්තේය.

මෙහිද සතර සාමඤ්ඤඵලයෝ ලෝකෝත්තර සරණාගමනයාගේ විපාක ඵලයයි. සියලු දුක් නැති කිරීම ආනිශංස ඵලයයි. එහෙයින් කියන ලදී.

යොච බුද්ධඤ්ච ධම්මඤ්ච සංඝඤ්ච සරණං ගතො
චත්තාරි අරිය සච්චානි සම්මප්පඤ්ඤාය පස්සති

(යමෙක් බුදුන් දහම් සඟුන් සරණකොට ගියේද හෙතෙම චතුරාර්ය සත්‍ය ධර්මයන් සම්‍යග් ප්‍රඥාවෙන් දකී.)

දුක්ඛං දුක්ඛ සමුප්පාදං දුක්ඛස්සච අතික්කමං
අරියඤ්චට්ඨංගිකං මග්ගං දුක්ඛූප සම ගාමිනං
එතං ඛො සරණං ඛෙමං එතං සරණ මුත්තමං
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති

(දුක්ඛ සත්‍යය ද සමුදය සත්‍යය ද දුක ඉක්මවූ නිරෝධ සත්‍යය ද දුක් සංසිඳුවීමට පමුණුවන්නා වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයද සම්‍යග් ප්‍රඥාවෙන් දකී.) මේ ලෝකෝත්තර සරණාගමනය වනාහි ක්ෂේමය උතුම් සරණයද වේ. ලෝකෝත්තර සරණාගමනයට පැමිණ සියලු සසර දුකින් මිදෙයි.

තවද නිත්‍ය වශයෙන් ද අනුපගමනාදි වශයෙන් ද මේ ලෝකෝත්තර සරණාගමනයාගේ ආනිශංස ඵලය දතයුතුය. මෙසේ වදාරණ ලද්දේමය.

අට්ඨාන මෙතං භික්ඛවේ අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි සංඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය සුඛතො උපගච්ඡෙය්‍ය කඤ්චි ධම්මං අත්තනො උපගච්ඡෙය්‍ය මාතරං ජීවිතා වොරොපෙය්‍ය පිතරං ජීවිතා වොරොපෙය්‍ය අරහන්තං ජීවිතා වොරෙපය්‍ය දුට්ඨ චිත්තො

තථාගතසස ලොහිතං උපපාදෙයා, සංඝං භිඥෙයා අඤ්ඤං සත්ථාරං උද්දිසෙයා, නෙතං ඨානං විජ්ජති

(මහණෙනි, යම්හෙයකින් දිට්ඨි සම්පන්න පුග්ගල තෙම සංස්කාරයන් අතුරෙන් කිසිදු එක් සංස්කාරයක් නිත්‍ය වශයෙන් ගන්නේ ද, යන මේ කාරණය හේතු රහිතය. ප්‍රත්‍ය රහිතය. සැප වශයෙන් ගන්නේ ද, මව ජීවිතයෙන් තොර කරන්නේ ද පියා ජීවිතයෙන් තොර කරන්නේද රහතුන් වහන්සේගේ ජීවිතය තොර කරන්නේද, දුෂ්ට වූ සිතින් තථාගතයන් වහන්සේගේ ශරීරයෙන් ලේ උපදවන්නේ ද, සංඝභේදය කරන්නේද අන්‍ය ශාස්තෘවරයෙක් අදහන්නේ ද යන මේ කාරණා නොවන්නේමය.) ලෞකික සරණාගමනයාගේ භව සම්පත් ද භෝග සම්පත් ද ඵලයම වේ. එහෙයින් කියන ලදී.

යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ නතෙ ගමිසසනති අපායං
පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙසසනති

(යම් කිසිවෙක් බුදුරදුන් සරණ ගියාහුද, ඔවුහු සතර අපායට නොයන්නාහුය. මිනිස් සිරුර හැර දේවකාය පූරණය කරන්නාහුය.)
අනිකකුදු කියන ලදී.

අථ ඛො සකෙකාදෙවානමිඥො අසීතියා දෙවතා සහසෙසහි සද්ධිං යෙනායසමා මහාමොගගල්ලානො තෙනුපසංකමි -පෙ- එකමනතං ඨිතං ඛො සකකං දෙවානමිඥං ආයසමා මහා මොගගලලානො එතදවොච සාධු ඛො දෙවානමිඥ බුද්ධං සරණාගමනං හොති. බුද්ධං සරණං ගමන හෙතු ඛො දෙවා නමිඥ එවමිධෙ කචෙච සතතා කායසස භෙදා පරමමරණා සුගතිං සගගං ලොකං උපපජ්ජනති තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධි ගණහනති. දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන සුඛෙන යසෙන ආධිපතෙයොන දිබ්බහි රූපෙහි සද්දෙහි ගනෙධහි රසෙහි පොට්ඨබ්බෙහීති.

(ඉක්බිති සක්දෙව් රජ අසූදහසක් දේවතාවන් සමග ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වෙත එළඹියේය. -පෙ- එකත්පසෙක සිටි සක්දෙව් රජුට ආයුෂ්මත් මහාමොග්ගල්ලාන තෙම මෙසේ වදාළහ. දෙවිඳුනි, බුදුන් සරණ යාම යහපති. දෙව්රජුනි, බුදුන් සරණ යාම හේතුකොටගෙන මෙසේ මෙලොව ඇතැම් සත්ව කෙනෙක් කය බිඳීමෙන් මරණින් මත්තෙහි,

සොඳුරු ගති ඇති සැපයෙන් අග්‍ර වූ ලෝකයකට උත්පත්ති වශයෙන් පැමිණෙත්. ඔවුහු අන්‍ය දෙවියන් කරුණු දහයකින් යටපත් කරත්. දිව්‍ය වූ ආයුෂයෙන්, දිව්‍ය වූ වර්ණයෙන් සැපයෙන් යසසින් අධිපති භාවයෙන් දිව්‍ය වූ රූපයෙන් ශබ්දයෙන් ගන්ධයෙන් රසයෙන් ස්පර්ශයෙන් යයි.) ධර්මය සරණයාමෙහිද සංඝයා සරණයාමෙහිද මේ නයමැයි. තවද වේලාම සූත්‍ර ආදීන්ගේ වශයෙන් ද සරණාගමනයාගේ ඵල විශේෂය දතයුතුයැ. මෙසේ සරණාගමන ඵලය දතයුතුයැ.

එහි ලෞකික සරණාගමනය වස්තු තුන විෂයෙහි, අඥාන, ශංසය, මිථ්‍යා ඥානාදීන් හේතුකොට කිලිටු වන්නේය. මහා බැබලීමක් ඇති නොවේ. මහත් පැතිරීමක් නොවෙයි. (මේ විපාක වශයෙනි) ලෝකෝත්තර සරණගමයාගේ කිලිටිවීමක් නොමැත.

ලෞකික සරණාගමනයාගේ භේද දෙකකි. සාවජ්ජ, අනවජ්ජ කියායි. ඔවුනතුරෙන් සාවජ්ජ භේදය අන්‍ය ශාස්තෘවරයන් විෂයෙහි අතත සනනියාාතනාදි වශයෙන් වෙයි. එය අනිටුඵල ඇත්තේ වෙයි. අනවජ්ජ (නිවැරදි) භේදය කළුරිය කිරීමෙන් වෙයි. හේ විපාක නැති බැවින් අඵලය. ලෝකෝත්තර (සරණාගමනයාගේ) භේද නොම ඇත්තේය. ඒ එසේමැයි. භවාන්තරයෙහිදු අරියසාවක තෙමේ අන්‍ය ශාස්තෘවරයෙකු නොඅදහයි. මෙසේ සරණගමනයාගේ කිළිටිවීම් ද භේද ද දතයුතුයැ.

උපාසකො මං භවං ගොතමො ධාරෙතු යනු මා උපාසකයකැයි භවත් ගෞතමයන් වහ්සේ මා මෙසේ දරන සේක්වා. දැනගන්නා සේක්වා යන අර්ථයි.

### උපාසක ලක්ෂණ

උපාසක විධි කුසලතා පිණිස මෙහි ලා උපාසක තෙමේ කවරෙක්ද? කුමක් හෙයින් උපාසක යයි කියනු ලැබේද? ඔහුගේ සීලය කුමක්ද? ආජීවය කවරේද? විපත්ති කවරේද? මේ ප්‍රකීර්ණකය දතයුතුය.

එහි, උපාසක තෙම කවරෙක්ද යනු, යම්කිසි තිසරණගත ගිහිතෙම උපාසක නම් වේ. මෙසේ කියන ලද්දේය.

**යතො ඛො මහානාම බුද්ධං සරණං ගතො හොති ධම්මං සරණං ගතොහොති සංඝං සරණං ගතො හොති එත්තාවතා මහානාම උපාසකො හොතිතී** යනුවේ යම්කලෙක පටන් බුදුන් සරණ ගියේ වේද, දහම් සරණ ගියේ වේද, සඟ සරණ ගියේ වේද, මෙපමණකින් උපාසක නම් වේයයි. කුමක් හෙයින් උපාසක වේද? තුණුරුවන් වෙත එළඹෙන හෙයිනි. හෙතෙම වනාහි බුදුරදුන් සමීපයට එළඹේනුයි ධර්මය සංඝයා වෙත එළඹේනුයි උපාසක නම් වේ. ඔහුගේ සීලය කුමක්ද? (පංචවෙරමණියො) වෙන් වීම් පසයි. මෙසේ වදාළහ.

**යතො ඛො මහානාමං, උපාසකො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා, කාමෙසු මිච්ඡාචාරා, මුසාවාදා, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති එත්තාවතා මහානාම උපාසකො සීලවා හොතිති.**

යනුවෙන්, (මහානාමය, යම්කලෙක පටන් උපාසක තෙම ප්‍රාණඝාතයෙන් වැළකුනේ වේද, සොරකමින් වැළකුනේ වේද, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුනේ වේද, මුසාවාදයෙන් වැළකුනේ වේද, රහමෙර පානයෙන් වැළකුනේ වේද, මෙපමණකින් උපාසක තෙම සිල්වත් වෙයි.) ආජීවය කවරේද යනු වැරදි වෙළඳම් දුරුකොට ධාර්මිකව ජීවිකාව ගෙනයාමයි. මෙසේ වදාරණ ලදී. **පඤ්චිමා භික්ඛවෙ, වණිජ්ජා උපාසකෙන අකරණියා කතමා පඤ්ච සත්ථවණිජ්ජා, සත්තවණිජ්ජා, මංස වණිජ්ජා, මජ්ජවණිජ්ජා, විසවණිජ්ජා ඉමා ඛො භික්ඛවෙ, පංචවණිජ්ජා උපාසකෙන අරණියාති** යනුවෙන්, (මහණෙනි උපාසක තැන විසින් නොකටයුතු වූ වෙළඳම් පසකි. ඒ පස කවරහුද? ආයුධ වෙළඳම, සත්ත්වයන් වෙළඳම, මාංස වෙළඳම, මත්පැන් වෙළඳමය වස විෂ යන ඒවායි. මහණෙනි, මෙකී වෙළඳම් පස උපාසක විසින් නොකට යුත්තාහ.)

විපත්ති කවරේද යත්, ඒ සීලයට ද ඒ ආජීවයටද යම් විපතක් වේද, එය එම උපාසක හට විපත්ති නම් වන්නීය. තව ද යමක් හේතුවෙන් මේ උපාසක තෙමේ සැඩොලෙක් වේද, කසට ඇත්තෙක් වේද, අන්තිම පහත් නීචයෙක් වේද, එයත් මේ උපාසක හට විපත්ති යයි දතයුතුයැ. එම විපත් අර්ථ වශයෙන් අශ්‍රද්ධා ආදි පංච ධර්මයෝය. වදාළේ මැනො.

**පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසක චණ්ඩාලොච හොති උපාසක මලඤ්ච, උපාසක පතිකිට්ඨොච, කතමෙහි**

**පඤ්චහි, අසසද්ධො හොති දුස්සීලො හොති. කොතුහල මංගලිකො හොති මංගලං පච්චෙති නො කම්මං ඉතො ච බහිද්ධා දක්ඛිණෙය්‍යං පරියෙසති. තත්ථච පුබ්බකාරං කරොතීති**

(මහණෙනි, අගුණ පසකින් හෙබි, උපාසක තෙම උපාසක චණ්ඩාලයෙක්ද වෙයි. කිලිටි වූ උපාසකයෙක්ද වෙයි. උපාසක නීචයෙක්ද වෙයි. කවර පසකින්ද යත්, සැදැහැ නැත්තේ වේද, දුස්සීල වේද, කුහුල් උපදවන දෙය දැකීම මගුලක් කොට ඇත්තේ වේද, මගුල බලාද, කර්මය නොබලාද, මෙම සසුනෙන් පිටත දක්ඛිණෙය්‍ය පුද්ගලයන් සොයාද, එම තීර්ථකයන් විෂයෙහි අග්‍රදානය දේද, යන මේ පසයි.)

සම්පත්ති කවරීද යත්, ඔහුට යම් සීල සම්පත්තියකුත් ආජීව සම්පත්තියකුත් වන්නීද (උපාසක) රත්නභාවය සිද්ධ කරන්නා වූ ශ්‍රද්ධා ආදී පඤ්ච ධර්ම කෙනෙක් මෙන්ද, මොවුහු සම්පත්ති නම් වෙති. එහෙයින් වදාළහ.

**පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකරතනඤ්ච උපාසක පදුමඤ්ච, උපාසක පුණ්ඩරීකො ච කතමෙහි පඤ්චහි, සද්ධො හොති සීලවා හොති න කොතුහල මංගලිකො හොති කම්මං පච්චෙති, නො මංගලං, න ඉතො බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති. ඉධච පුබ්බකාරං කරොතීති.**

(මහණෙනි, සම්පත් පසකින් යුතු උපාසක තෙම උපාසක රතන ද උපාසක පියුමද, උපාසක පුණ්ඩරීකයද වෙති. කවර සම්පත් පසකින්ද යත්, සැදැහැ ඇත්තේ වේද, සිල්වත් වේද, කුතුහල මංගල ඇත්තේ නොවේද, කර්මය විශ්වාස කෙරේද, දිටයී ආදී මංගල විශ්වාස නොකෙරේද, මේ ශාසනයෙන් පිටත දක්ඛිණෙය්‍ය පුද්ගලයන් නොසොයාද මේ සසුනෙහි අග්‍රදානය කෙරේද යන මේ පස වෙති.)

අග්ග ශබ්දය

**අජ්ජතග්ගෙ** යන මෙහි අග්ග ශබ්දය තෙම ආදි - කොටි (කෙළවර) කොට්ඨාස, සෙට්ඨ යන අර්ථයන්හි දක්නට ලැබේ.

**අජ්ජතග්ගෙ සම්ම දොවාරික ආවරාමි ද්වාරං නිගණ්ඨානං නිගණ්ඨීනං** යන තන්හි ආදිකොට ආදියෙහි යන අර්ථයන්හි යෙදේ.

තෙනෙව අංගුලග්ගෙන තං අංගුලග්ගං පරාමසෙය්‍ය උච්ඡග්ගං වෙළග්ගං යනාදි තන්හි කෙළවර යන අර්ථයෙහි දක්නා ලැබේ.

අනුජානාමි භික්ඛවෙ, අම්බිලග්ගං වා මධුරග්ගං වා තිත්තකග්ගං වා විහාරග්ගෙන වා පරිවෙණග්ගෙන වා භාජෙතුං යනාදි තන්හි කොට්ඨාශයෙහි යන අර්ථයෙහි දක්නා ලැබේ.

යාවතා භික්ඛවෙ, සත්තා අපදා -පෙ- තථාගතො තෙසං අග්ග මක්ඛායති යනාදි තන්හි ශ්‍රේෂ්ඨ යන අර්ථයෙහි වේ. මෙහි වනාහි අග්ග ශබ්දය ආදිය යන අර්ථයෙහි බව දතයුතුයැ.

එහෙයින් අජ්ජතග්ගෙ යනු අද ආදි කොට යයි මෙසේ මෙහි අර්ථය දතයුතුයැ. අජ්ජතං අද වූයේ යන අරුත් වේ. අජ්ජදග්ගෙ යනුද පාඨයි. ද කාර සන්ධියෙන් ආයේය. අද ආදිකොට යන අර්ථයෙහි වේ. පාණුපෙතං යනු පාණෙහි උපෙතං (ප්‍රාණය සීමාකොට මගේ ජීවිතය යම්තාක් පවතීද ඒ තාක් සීමාකොට අන්‍ය ශාස්තෘ කෙනෙකුගෙන් තොර තුන්සරණය සරණගත වූ උපාසක වූ කැපකරු වූ මා භවත් ගෞතමයන් වහන්සේ දරන සේක්වා. දැනගන්නා සේක්වා. ඉදින් මගේ හිස තියුණු කඩුවකින් සිඳිතත් මම වනාහි බුදුරදුන් නොබුදුනැයි කියා හෝ දහම් නොදහම් යයි කියා හෝ සඟුන් නොසඟුන් යයි කියා හෝ නොම කියන්නෙමි මෙසේ අත්තසන්නීය්‍යාතනයෙන් සරණ ගොස් සිවුපසයෙන් පමණ හුනස්නෙන් නැඟී බුදුරදුන් නමස්කාරකොට තුන්වරක් පැදකුණුකොට ගියේය.

**භයභෙරව සුත්ත වණ්ණනාව නිමි.**

## 1-1-5

එවං මෙසුතං, ආයසමා සාරිපුතෙතා යනු අනංගන සූත්‍රයයි. මෝ තොමෝ එහි අප්‍රකට පද වර්ණනාව වන්නීය. මේ සූත්‍රයෙහි යම්සේ ද, සියලු සූත්‍රයන්හි එසේමයි. එහෙයින් මෙයින් මත්තෙහි මෙපමණකුත් නොකියා පිළිවෙලින් පද වර්ණනාව කරන්නෙමු. චත්‍තාරො යනු ගණන පරිචෙඡද කිරීමයි. (කොටස් කිරීමයි.) පුගගලා යනු සත්ත්වයෝය. නරයෝය. පුරිසයෝය. මෙපමණකින් තෙරුන් වහන්සේ පුද්ගලවාදි යයි නොගත යුතුයි. මේ ආයුෂ්මත් තෙම වනාහි බුද්ධපුත්‍රයන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වේ. හෙතෙම බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව විරුද්ධ නොවෙමින්ම දේශනා කරයි. සම්මුති දේශනා පරමත්‍ථ දේශනා යයි භාග්‍යවත් බුදුරදුන්ගේ දේශනා ද්විධ වන්නීය. එහි පුග්ගල - සත්ත - ඉත්‍ථි - පුරිස - ඛත්‍තිය, බ්‍රාහ්මණ දේව මාර යනාදි මෙවන් දේශනා සම්මුති දේශනා නම් වේ. අනිච්ච, දුකඛ, අනත්‍ත, ඛන්‍ධ, ධාතු ආයතන සතිපටඨාන යනාදි දේශනා පරමත්‍ථ දේශනා නම් වේ.

එහි භාග්‍යවතුන් වහන්සේ ඔවුන් අතුරෙන් යමෙක් සම්මුති වශයෙන් දේශනාව අසා අර්ථය අවබෝධ කොට මෝහය දුරුකොට මාර්ගඵලයන්ට පැමිණෙන්ට සමර්ථ වූවාහු වෙත්ද, ඔවුනට සමමුති දේශනාව දේශනා කරති. එහි මේ උපමාවකි. යම්සේ දේශ භාෂාවන්හි දක්‍ෂ වූ තුන්වේදයට අර්ථ වර්ණනා කරන්නා වූ ආචාර්යතෙම, යමෙක් දෙමළ බසින් කී කල අරුත් දැනගනිත්ද, ඔවුන් දෙමළ බසින් කියාද, යමෙක් ආන්‍ද්‍ර භාෂා අතුරෙන් අන්‍යතර භාෂාවකින් ඔවුනට ඒ ඒ භාෂාවෙන් ප්‍රකාශ කෙරේද, මෙසේ ඒ මානවකයෝ දක්ෂ වූ ව්‍යක්ත වූ ආචාර්යවරයෙකු වෙත පැමිණ වහාම ශිල්ප උගනිති. මේ උපමාවෙහි ඇදුරා මෙන් භාග්‍යවත් බුදුහුද ත්‍රිවේදය මෙන් කිවයුතු බැවින් තුන්පිටකයද දේශ භාෂාවන්හි කුසලතාව මෙන් සම්මුති පරමත්‍ථ දේශනාවන්හි දක්‍ෂතාවයද නානා දේශ භාෂාවන් දත් මානවකයන් මෙන් සම්මුති පරමාර්ථ වශයෙන් අවබෝධ කිරීමෙහි දක්ෂ වූ (වෙනෙය්‍ය) හික්මවිය යුතු සත්ත්වයෝ ද ආචාර්යවරයා විසින් ද්‍රවිඩ භාෂා ආදියෙන් ප්‍රකාශ කිරීම මෙන් භාග්‍යවතුන් වහන්සේගේ සම්මුති පරමත්‍ථ දේශනා දතයුත්තාහුය. මෙහිලා කීහු.

දුවෙ සච්චානි අකඛාසි සමබුදෙධා වදතං වරො
සමමුතිං පරමත්‍ථඤච, තතියං නූපලබභති

සංකෙත වචනං සච්චං ලොක සම්මුති කාරණා
පරමත්ථ වචනං සච්චං ධම්මානං භූත කාරණා
තස්මා වොහාර කුසලස්ස ලොකනාථස්ස සත්ථුනො
සම්මුතිං වොහරන්තස්ස, මුසාවාදො නජායතී ති

(වාදීන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වූ සම්මා සම්බුදුරද සම්මුති සත්‍යය ද පරමාර්ථ සත්‍යය ද යන සත්‍යයන් දෙකක් වදාළේය. එහි පිටත තුන්වන සත්‍යයක් නොලැබේ.

ලෝක ව්‍යවහාර කථාව ලෝකයාගේ සම්මුතිය නිසා පවත්නා හෙයින් සත්‍යය වේ. එම නිසා ලෝවහරෙහි දක්ෂ වූ ලෝක ව්‍යවහාරය වදාරණ ලෝකනාථ වූ ශාස්තෘන් විහන්සේ හට මුසාවාදයෙක් නොවේ යනුයි.

පුද්ගල කථා

තවද කරුණු අටක් නිසා භාග්‍යවතුන් වහන්සේ පුද්ගල කථාව කරන සේක. හිරිඔතප් ප්‍රකට කරනු පිණිස, කර්මය ස්වකීය කොට ඇති බව ප්‍රකට කරනු පිණිසද ඒ ඒ සත්ත්වයන් විසින් කළයුතු කර්ම දැක්වීම පුරුෂ ස්වරූප දක්වනු පිණිස, ආනන්තරීය කර්ම විස්තර කිරීම පිණිස, බ්‍රහ්ම විහාර දැක්වීම පිණිස, පෙර විසූ කඳ පිළිවෙළ දැක්වීම පිණිස දක්ඛිණා විසුද්ධිය දක්වනු පිණිසද, ලෝක සම්මුති නොපිරිහෙලනු පිණිසද යන මේ කරුණු අට නිසාය. ඛන්ධ, ධාතු ආයතනයෝ ලජ්ජාවෙත් භයවෙත් යයි කීකල්හි මහජන තෙමේ නොදනී. මූලාවට පැමිණෙයි. විරුද්ධ නොවෙති.

එහෙයින් භාග්‍යවත් බුදුරදහු හිරිඔතප් දක්වනු පිණිස පුද්ගල කථාව වදාරති. ස්කන්ධයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහුය. ධාතුහු, ආයතනයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහු යයි කී කල්හිදු මෙම ක්‍රමයමැයි. එබැවින් කර්මය ස්වකීය කොට ඇති බව දක්වනු පිණිස පුද්ගල කථාව වදාරති. වෙළුවනාදි මහා විහාරයෝ ස්කන්ධයන් විසින් ධාතූන් විසින්, ආයතනයන් විසින් කරවන ලද්දාහුයයි කී කල්හිදු මෙම ක්‍රමයමැයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වෙන් වෙන්ව පුරුෂ ස්වරූප දක්වනු පිණිස පුද්ගල කථාව වදාරති.

ඛන්ධයෝ - ධාතුහු - ආයතනයෝ, මව ජීවිතයෙන් තොර කරති. පියා, රහත්හු ජීවිතයෙන් තොර කරති. (බුදු සිරුරෙන්) ලේ සෙලවීම

කරති. සංඝභේද කර්මය කෙරෙත් යයි කී කල්හිදු මෙම ක්‍රමයමැයි. එහෙයින් භාග්‍යවත් තෙම ආනන්තරිය කර්ම දැක්වීම පිණිස පුද්ගල කථාව වදාරති.

ඛන්ධයෝ ආයතනයෝ ධාතුහු මෛත්‍රී කෙරෙත් යයි කී කල්හිදු මෙම ක්‍රමයමැයි. එසේ හෙයින් භාග්‍යවත් තෙමේ බ්‍රහ්මවිහාර දැක්වීම පිණිස පුද්ගල කථාව වදාරති.

ඛන්ධයෝ, ධාතුහු, ආයතනයෝ පෙර විසූ කඳපිළිවෙල සිහිකරත යයි පෙර විසූ කඳපිළිවෙල දැක්වීම පිණිස පුද්ගල කථාව වදාරති.

ඛන්ධ-ධාතු-ආයතනයෝ දානය පිළිගනිතියි කීකල්හි මහජන තෙමේ නොදනී. මුලාවට පැමිණෙයි. පුද්ගලයෝ පිළිගනිත්. සිල්වත්හු යහපත් දහම් ඇත්තහු පිළිගනිත් යයි කී කල්හි දැනගනී. මුලාවට නොපැමිණෙයි. විරුද්ධ නොවෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දක්ෂිණා විසුද්ධිය දක්වනු පිණිස පුද්ගල කථාව වදාරති.

භාග්‍යවත් බුදුවරයෝ ලෝක සම්මුතිය අත්නොහරිත්. ලෝවහරෙහි, ලෝකනිරුත්තියෙහි ලෝකයාගේ ව්‍යවහාර කථාවෙහි පිහිටියාහුට දහම් දෙසති. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ලෝක ව්‍යවහාරය නොහරිනු පිණිස පුද්ගල කථාව වදාරති.

එබැවින් මේ ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ ද ලෝ වහරෙහි දක්ෂ බැවින් භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට විරුද්ධ නොවෙමින් ලෝවහරෙහි පිහිටාම චත්තාරො මෙ ආවුසො, පුගගලා යයි වදාළහ. එහෙයින් මෙහි පරමාර්ථ වශයෙන් නොගෙන සම්මුති වශයෙන්ම පුද්ගල තෙම දත යුත්තේයැ.

සනෙතා සංවිජ්ජමානා ලෝකයාගේ (සංකේත) සලකුණුකර ගැනීම් වශයෙන් ඇත්තාහුය. ලැබෙන්නාහුය. ලොකසමිං යනු සත්ත්ව ලෝකයෙහි. සාංගණොව සමානො යන ආදී තන්හි වනාහි අංගණං යනු කිසිතැනෙක්හි කිලේසයෝ කියනු ලබත්. මෙසේ කියන ලදහ. තත්ථ කතමානි තීණි අංගණානි, රාගො අංගණං දොසො අංගණං මොහො අංගණං යයි කිසි තැනෙක්හි යම්කිසි කිලුටක් හෝ මඩක් හෝ (අංගණයයි කියනු ලැබේ. මෙසේ කියන ලදහ.) තසෙසව, රජසස වා අංගණසස වා පහානාය

වායමති යනුවෙන් කිසියම් එවැනි භූමි භාගයකි. එය, බොධිසංගණං චෙතියංගණං යන ආදි වශයෙන් දතයුතුයැ. මෙහි වනාහි නන්වැදෑරුම් බලවත් කෙලෙස් අංගණ යනුවෙන් අදහස් කරන ලද්දාහුය. ඒ එසේමැයි. පාපකානං බො එතං ආවුසො අකුසලානං ඉච්ඡාවචරානං අධිවචනං යදිදං අංගණං යයි කියන්නේය. අංගණ සහිත වූයේ සාංගණ නම් වේ. සාංගණො සමානො තියුණු කෙලෙස් සහිත වූයේම අත්ථි මෙ අංගණන්ති යථාභූතං නප්පජානාති යනුවෙන් මගේ සන්තානගතව කිලේසයෝ ඇත්තාහයි නොම දනී. මේ කිලේශයෝ වනාහි කර්කශය. නපුරුය. දුරුකටයුතුය. නොගතයුතුයැ. විස පෙවූ හී හා සමානයෝ යයි මෙසේ යථා ස්වභාවයෙන් ද නොම දනී.

යමෙක් (කෙලෙස්) ඇතැයි කියාත් දැනගනී ද, හෙතෙම මෙසේත් දැනගනී. මගේ ඇතුළත තියුණු කෙලෙස් ඇතැයි තත් වූ පරිද්දෙන් දැනගනී යයි කියනු ලැබේ. යමෙකු විසින් වනාහි කිලේසයෝ මාර්ගයෙන් නොම නසන ලද්දාහුද, යම් ඒ ක්‍රමයකින් වැලකු බැවින් නොම උපදිත්ද, මෙතෙම මෙහි අනංගණං යයි අදහස් කරන ලද්දේය. නත්ථි මෙ අජ්ඣත්තං අංගණන්ති යථාභූතං නප්පජානාති මගේ කිලේසයෝ යම් හෝ ඒ හෝ අයුරකින් වැලැක්වූ බැවින් නැත. මාර්ගයෙන් නැසූ බැවිනැයි නොද දනී. ඔවුහු උපාදානාහු මහත් අනර්ථ කරන්නාහුය. කර්කෂයෝය. දරුණු වූවෝය. දුරු කටයුත්තෝයැ. විෂ පෙවූ ඊ සමානයෝ යයි මෙසේ යථා ස්වභාවයෙන්ද නොද දනී. යමෙක් තෙම මේ කාරණයෙන් නැතැයි කියාත් දැනගනී ද හෙතෙම මෙසේත් දැනගනී. මගේ අධ්‍යාත්මයෙහි කෙලෙස් නැතැයි තත් වූ පරිද්දෙන් දැනගනි යයි කියනු ලැබේ.

තත්‍ර යනු ඒ සතර පුද්ගලයන් අතුරෙහි නැතහොත් ඒ කෙලෙස් සහිත පුද්ගලයන් දෙදෙනා අතුරෙහි යවායං යො+අයං යනුයි. යායං යනුද පාඨයි. කොනුබො ආවුසො සාරිපුත්ත හෙතු කො පච්චයො යන දෙපදයෙන්ම කාරණයම විචාරයි. යෙනිමෙසං යනු යම් හේතුවකින් යම් ප්‍රත්‍යයකින් මොවුන් දෙදෙනා අතුරෙන් කෙනෙක් ශ්‍රේෂ්ඨ පුරුෂ වේ. කෙනෙක් හීන පුරුෂ වේයයි කියනු ලැබේ. එයට හේතු කවරේද ප්‍රත්‍ය කවරේද? මෙසේ මෙහි සම්බන්ධය දතයුත්තේයැ. එහිලා කිසිසේත් නප්පජානාති, පජානාති යයි මෙසේ කියන ලද, දැනීමය. නොදැනීමය යනුවෙන් කියන ලද මේ දෙකම හේතුද වෙයි. ප්‍රත්‍යයද වෙයි.

තෙරුන් වහන්සේ වනාහි තම විචිත්‍ර වූ පටිභාන ඥානයෙන් එය මැනවින් ප්‍රකටකොට දක්වන්නට තත්‍රාවුසො යන ආදිය වදාළහ. එහි **තසෙසතං පාටිකංඛං** යනුවෙන් ඒ පුද්ගලයා විසින් මෙය කැමති විය යුතුයි. මේ තෙම මෙයටම පැමිණෙන්නේය. අතිකකට නොපැමිණෙන්නේ යයි කැමතිවිය යුතුය. අවශ්‍යයෙන්ම වනසුළුයයි කියන ලද්දේ වෙයි. **න ඡන්‍දං ජනෙසසති** යනාදි ක්‍රමයෙන් කියන ලද ඡන්දය (කැමැත්ත) නොඉපදවීම ආදිය සඳහා කීහ. එහිදු **න ඡන්‍දං ජනෙසසති** නොදන්නේ ඒ අංගණයාගේ ප්‍රහාණය පිණිස කත්තුකම්‍යතා ඡන්‍දය නොඋපදවන්නේයි.

**තවායමිසසති** යනුවෙන් ඊට වඩා බලවත් උත්සාහයක්ද නොකරන්නේය. **න විරියං ආරභිසසති** ථාමගතවීර්ය (ථාම නම් වූ වීර්ය) නොම ආරම්භ නොකරන්නේය. නොපවත්වන්නේ යයි කියන ලද වෙයි. **සාංසණො,** මේ රාගාදි අංගණයන් නිසා සාංගණ වූයේ, **සංකිලිට්ඨචිත්තො** යනු ඔවුන් විසින්ම අතිශයින් කිලිටි සිත් ඇත්තේ, මලින වූ සිත් ඇත්තේ, වෙසෙසින් පෙළන ලද සිත් ඇත්තේ හාත්පසින් තවන ලද සිත් ඇත්තේම වී, **කාලංකරිසසති** මැරෙන්නේය. **සෙය්‍යථාපි** යම්සේ වනාහි, **කංසපාති** රන්බඳුනක් **ආභතා** ගෙනඑන ලද්දාහු, **ආපණා වා කම්මාර කුලා වා** වෙළඳහලින් හෝ රන්තලි කරන රන්කරුගේ ගෙදරින් හෝ රාජෙන ආගන්තුක රජසින් පස් ආදියෙන්, මලෙන එහිම හටගත්තා වූ ලෝහ මලින් **පරියොනද්ධා,** ගැවසී ගන්නා ලද්දා වූ, **නච පරියොදපෙය්‍යුං** සේදීම් ඉලීම් ආදියෙන් පිරිසිදු නොකරවන්නාහු නම්. **රාජාපථෙ** යනු රජපථෙ මෙයම හෝ පාඨයි. ඇඳයට හෝ දහයියා ගොඩෙහි හෝ භාජන අතර හෝ යම්තැනෙක රජසින් තවරනු ලැබේද, එසේම ධූලි එනතැනක හෝ නගින තැනක යන අර්ථයි.

**සංකිලිට්ඨතරා අසස මලගගහිතා** යනු මෙහි ධූලි නගින තැන්හි තැබීමෙන් අතිශයින් කිලිටි වූවා පරිභෝග නොකිරීමෙන් පිරිසිදු නොකිරීමෙන් මල බැඳුනේ අතිශයින් මල බැඳුනේ යයි කියන ලද්දේ වෙයි. මෙය පෙරලා විචාරීම් වචනයක්ද වෙයි. එහෙයින් මේ පදයාගේ අර්ථය මෙසේ දතයුත්තේය. ඇවැත්ති, ඕ කංසපාති (බෙදුන්) තොමෝ මෙසේ කරනු ලබන්නී පසුකලෙක අතිශයින් කිලිටි වූවා ද අතිශයින් මලගන්නා ලද්දී ද, මැටි භාජනයක හෝ රන් භාජනයක් හෝ දැයි දැනගන්ට දුෂ්කර වන්නේද? නොවේදැයි තෙරුන් වහන්සේ එය ප්‍රතිඥා කරන්නාහු **එවමාවුසො** යයි වදාළහ. යලි දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ

උපමාවක් මනා ලෙස ප්‍රතිපාදනය කරන්නාහු, එවමෙව ඛො යනාදිය වදාළහ. එහි උපමා සන්සන්දනය දතයුත්තේය. කිලිටි වූ රන්බඳුනට සමානය. සාංගණ පුද්ගලයා.

කිලිටි වූ රන්බඳුන පරිභෝග නොකිරීම, රජස් නගින තන්හි බහාතැබීම, මෙනි. පැවිදි බව ලබන්නා වූ පුද්ගලයා වෙදකම් ආදියෙහි නියුක්ත පුද්ගලයෙකු සමීපයෙහි පැවිදිබව ලැබීම.

කිලිටි වූ රන්බඳුන අතිශයින් කිලිටි බවට පත්වීම මෙනි. වෙදකම් ආදියෙහි නියුක්ත පුද්ගලයෙකු සමීපයෙහි පැවිද්ද ලැබීම.

කිලිටි වූ රන්බඳුන නැවත කිලිටිවීම මෙනි. ආචාර්ය උපාධ්‍යායයන් අනුව හික්මෙන්නා වූ ඒ (මහණ වූ) පුද්ගලයාද වෙදකම් ආදිය කිරීම.

මෙහි සිටියහුගේ අංගණ (කෙලෙස්) සහිත කාලක්‍රියාව සිදුවෙයි. නැතහොත් පිළිවෙලින්, දුක්කට දුබ්භාෂිත, (ශික්ෂාපද) ඉක්මවීම වෙයි. එබැවින් එහි සිටියහුගේ කාලක්‍රියාව අංගණ සහිත කාලක්‍රියා නම් වෙයි. නැතහොත් පිළිවෙලින් පාචිත්තිය ථුල්ලච්චය ශික්ෂාපද ඉක්මවීම සිදුවෙයි. සංඝාදිසෙස ඉක්මවීම පාරාජිකා ඉක්මවීම, මාතෘ ඝාතනය ආදි ආනන්තරිය කර්ම කිරීම වෙයි. (එබැවින්) එහි සිටියහුගේ අංගන සහිත කාලක්‍රියාව වෙයි.

සංකිලිට්ඨ චිත්තො කාලං කරිස්සති යනු මෙහි ද අකුසල සිතින් යුතුවම කළුරිය කරන්නේ යයි මෙසේ අර්ථ නොදැකිය යුතුය. සියලු සත්ත්වයෝම ප්‍රකෘති සිතින්ම භවාංග සිතින්ම කලුරිය කෙරෙත්. එහෙයින් මෙතෙම වනාහි චිත්ත සන්තානය ශුද්ධ නොකොට කලුරිය කරන්නේය යන මේ අර්ථය සඳහා මෙසේ වදාරණ ලද්දේ යයි දතයුතුයැ.

දෙවෙනි වාරයෙහි, පරියොදපෙය්‍යුං යනුවෙන් සේදීම ඇතිල්ලීම සියුම් අලුවලින් පිරිමැදීම ආදියෙන් පිරිසිදු වූ කැඩපතක් සේ කරන්නාහු නම්, න ච නං රජාපථෙ කලින් කියන ලද ආකාර ඇති ස්ථානයක නොතබා කරඬු මංජුසා ආදියෙහි හෝ තබන්නාහු නම්, වට්ටෙට වෙලා නාග දන්තයෙහි හෝ එල්ලන්නාහු නම්, සෙස්ස කියන ලද ක්‍රමයෙන්ම ගතයුතුය. මෙහි උපමා සංසන්දනය මෙසේ දතයුතු වන්නීය.

(කෙලෙස්) අංගණ සහිත පුද්ගල තෙමේ කිලිටි වූ රන්බඳුනක් සමාන වන්නේය. පැවිද්ද ලබන්නා වූ එම පුද්ගලයාට භික්ෂූහු අවවාද කෙරෙත්ද, අනුශාසනා කෙරෙත් ද, මඳ පමණ වූ ද ප්‍රමාදයක් දැක දඬුවම් කොට නැවත නැවත හික්මවත්ද, ප්‍රියශීලී භික්ෂූන්ගේ සමීපයෙහි පැවිද්ද ලැබීම කිලිටි වූ රන්බඳුන පරිභෝග කිරීම ආදිකොට පිරිසිදු ස්ථානයක තැබීම මෙන් වන්නේය. ආචාර්ය උපාධ්‍යායන්ට අනුව හික්මෙන්නා වූ ඒ පුද්ගලයාගේ යහපත් වත්පිළිවෙත් කිරීම කිලිටි වූ රන්බඳුන සම්බන්ධයෙන් පසුකලෙක පිරිසිදු බව හාත්පසින් පිරිසිදු බව මෙනි. මෙහි සිටියහුගේ අංගණ රහිත (කෙලෙස් රහිත) කාලක්‍රියාව වන්නීය.

නැතහොත් අනුක්‍රමයෙන් පිරිසිදු සීලයෙහි පිහිටා තමනට සුදුසු වූ බුදුවදන් ඉගෙන, ධුතාංග වත් සමාදන්ව තමන්ට අනුකූල වූ කර්මස්ථානයක් ගෙන ග්‍රාමාන්ත සේනාසනයෙහි විසීම අතහැර වනසෙනසුන්හි විසීම වෙයි. මෙහි සිටියහුගේ අනංගණ කාලක්‍රියාව වන්නීය.

නැතහොත් අනුක්‍රමයෙන් කසිණ පරිකර්ම කොට අටසමවත් ඉපිදවීමෙන් කෙලෙස් විෂ්කම්භනය කොට විදර්ශනා පාදක ධ්‍යානයෙන් නැගීසිට විදර්ශනාවෙන් තදංග නිර්වාණයද සෝතාපත්ති ඵලය පැමිණීමද -පෙ- රහත්බව පසක් කිරීමද මේයයි මෙහි සිටියහුගේ අත්‍යන්තයෙන් කෙලෙස් අංගණ රහිත කාලක්‍රියාවම වන්නීය.

තුන්වන වාරයෙහි **සුභනිමිත්තං** රාගයට කරුණු වූ ඉටු අරමුණයි. මනසිකරිස්සති, එහිදී විරුද්ධ ලෙස පැමිණි සතිය (සිහිය) එම නිමිත්ත ආවර්ජනය කරන්නේය.

**තස්ස සුභනිමිත්තස්ස මනසිකාරා** ඒ පුද්ගලයාට එම ශුභ නිමිත්ත මෙනෙහි කිරීම හේතුවෙන් **අනුද්ධංසෙස්සති** හිංසා කරන්නේය. මැඩ පවත්වන්නේය. එසේමැයි. රාගය උපදිනුයේ කුසලවාරය වලක්වා තමාම අකුසල ජවනය වී සිටින්නේ කුසල් සිත මැඩපවත්වයි යයි දතයුතුය. සෙස්ස කී ක්‍රමයෙන්ම දතයුතුයි.

මෙම උපමා ගැලපීම මෙසේ දතයුතුයි. ප්‍රකෘතියෙන්ම (විෂ්කම්භනය කළ කෙලෙස් ඇති) අංගණ රහිත පුද්ගල තෙම පිරිසිදු

රන්බඳුන වැන්න. පිරිසිදු රන්බඳුන පරිභෝග නොකිරීම ආදිකොට දූවිලි ගැටෙන තන්හි තැබීම මෙන් පැවිද්ද ලබන්නා වූ ඒ පුද්ගලයා යයි මෙයින් මත්තෙහි සියල්ල පළමුවාරය සමානමැයි.

සතරවන වාරයෙහි, සුභනිමිත්තං න මනසිකරිස්සති යන මෙහි සතියගේ විරහ භාවයක් නැති හෙයින් එම ශුභ නිමිත්ති ආවර්ජනා නොකරන්නේය. සෙස්ස, දෙවෙනි වාරයෙහි දතයුතුය. අයං ඛො ආවුසො යනාදිය වනාහි කො නුඛො ආවුසො, යනාදියෙහි කී නයමැයි. මෙවිට ඒ අංගණය තත් අයුරින් ප්‍රකට කරනු කැමැති වූ ආයුෂ්මත් මහමුගලන් තෙරුන් විසින් අංගණං අංගණං යනාදි නයින් විචාරණ ලද්දාහු එය ප්‍රකාශ කරන සේක් පාපකානං ඛො එතං ආවුසො යනාදිය වදාළහ. එහි ඉච්ඡාවචරානං යනු කැමැත්තෙන් හැසිරෙන්නා වූ ඉච්ඡා වශයෙන් ගැවසී ගත්තා වූ කෝප, අපත්‍යය යන අර්ථයි.

යං ඉධෙකච්චස්ස යම්හෙයකින් මේ ලෝකයෙහි කිසිවෙකුට කැමැත්තක් උපදින්නේ ද ඒ ස්ථානය එම කාරණය වන්නේය. ඇත. ලැබේයයි කියන ලද්දේ වෙයි. ආපන්නො අස්සං යනු පැමිණියෙමි. වන්නෙමි. න ච මං භික්ඛූ ජානෙය්‍යුං යනු භික්‍ෂූහුද මා නොදන්නාහු නම් මෙහි කාරණය කිම? ලාභය කැමති බවයි. එය එසේමැයි. ලාභය කැමති මහණ තෙම ප්‍රකෘතියෙන්ම කළපින් ඇත්තේ මිනිසුන් විසින් සත්කාර ගරුකාර කරන ලද්දේ මෙසේ සිතයි. ඇවැතට පැමිණි භික්‍ෂුව ගැන ස්ථවිර භික්‍ෂූහු දැන මධ්‍යම භික්‍ෂූන්ට දන්වති. ඔවුහු නවක භික්‍ෂූන්ට ද නවක භික්‍ෂූහු විහාරයෙහි විසාසාදීන්ටද (ඉතුරු දෙය කන්නවුන්ටද) ඔවුහු අවවාදයට පැමිණි භික්‍ෂූන්ටද (දන්වති) මෙසේ ක්‍රමයෙන් සිවුපිරිසද දැනගනිත්. මෙසේ ඔහුගේ ලාභයට අනතුරක් වෙයි.

ඒකාන්තයෙන් මම ඇවතට පැමිණියෙම් වෙමි. භික්‍ෂූහු මා නොද දැනගන්නාහු නම් ඉතා යෙහෙකැයි යං තං භික්ඛුං භික්ඛූ ජානෙය්‍යුං යනු යම් කරුණකින් ඒ භික්‍ෂුව, අන්‍ය භික්‍ෂූහු දැනගන්නාහුද, එම කරුණ විද්‍යමානමය. ඇත්තේමය නැත්තේ නොවේ.

ඒ එසේමැයි. ස්ථවිර භික්‍ෂූහු දැන මධ්‍යම භික්‍ෂූන්ට දන්වත්, මෙසේ එම භික්‍ෂුව පෙර කී සෙයින් සිව්පිරිස් අතර ප්‍රකට වෙයි. යළි මෙසේ ප්‍රකට වූයේ අයසින් මඩිනා ලද්දේ ගම් සියයකටද පැමිණ එළිපත් සියයක පා පිස හිස් පාත්‍රයෙන් යුතුව නික්මෙයි.

(ඒ භික්ෂු තෙම) ඉක්බිති භික්ෂූහු මා ඇවතට පැමිණියේ යයි දනිති. ඔවුන් විසින් මෙසේත් නසන ලද්දේත් වෙමියි සිතා ඉති සො කුපිතො හොති අප්පතීතො මෙසේ හෙතෙම මෙම කරුණින් ක්‍රෝධයෙන් මඩනා ලද්දේ කිපියේ වෙයි. දොම්නසින් මඩනා ලද්දේත් නොසතුටු වූයේත් වෙයි.

යො චෙව ඛො ආවුසො, කොපො යොච අප්පච්චයො උභය මෙතං අංගණං ඇවැත්නි, යම් මේ සංස්කාර ස්කන්ධයෙහි සංග්‍රහ වූ කෝපයක් වේද, වේදනා ස්කන්ධයෙහි සංග්‍රහ වූ යම් නොසතුටක් වේද, මේ දෙක අංගණ යයි මෙසේ මෙහි අර්ථය දතයුතුයි. මෙයද එබඳු පුද්ගලයන්ගේ වශයෙන් කියන ලදී. ලෝභය වනාහි මෙම අංගණයට පූර්වභාග වශයෙනි. මෝහය සම්පයෝග වශයෙන් ද ගන්නා ලද්දේම වෙයි. අනුරහො මං යනු පළමු මෙන්ම භික්ෂූහු තමා විහාර කෙළවර සෙනස්නට පමුණුවා දොර වසා චෝදනා කරන කල්හි කැමති වෙයි. ඨානං ඛො පන එතං යම් හෙයකින් එම භික්ෂුව සිටි පිරිස මැදට පමුණුවා, ව්‍යක්ත වූ විනීත වූ භික්ෂූහු තා විසින් අසවල් නම් තැන වෙදකම් කරන ලද්දේය, යනාදි නයින් චෝදනා කරන්නාහු ද මේ කරුණ ද වන්නේය. හෙතෙම සිව්පිරිස්හි ප්‍රසිද්ධ වූයේ වෙයි. මෙසේ ප්‍රසිද්ධ වූයේද අපකීර්තියෙන් මඩනා ලද්දේද වේයයි සියල්ල පෙර කී දෙයට සමානමැයි. සප්පටිපුග්ගලො සමාන වූ පුද්ගලයෙක්, 'සමාන' නම් ඇවැත් සහිත වූයේ යි, පටිපුග්ගල නම් චෝදක තෙමේයි. මෙතෙම ඇවත් සහිත කෙනෙකුට චෝදනා කරනු කැමති වෙයි. කුමක් හෙයින් ද යත්, තෙපි ද මෙනම් මෙනම් ඇවතට පැමිණියෙහි පළමුකොට එයට පිළියම් කරව, පසුව මට චෝදනා කරන්න යයි කියන්න හැකි වෙයි යයි සිතමිනි. තව ද ජාති ආදියෙන් ද සමාන වූ පුද්ගල තෙම 'සප්පටි' පුද්ගල නම් වේ. ඒ එසේමැයි. මෙතෙම තමහට ජාතියෙන් ද කුලයෙන් ද බහුශ්‍රැත බැවින් ද ව්‍යක්ත බැවින් ද, ධුතාංගයෙන් ද යන මේ ආදියෙන් සමාන වූවෙකු විසින්ම චෝදනා කිරීම කැමති වෙයි. එබඳු පුද්ගලයෙකු විසින් කියන ලද්ද දුක් නොවන්නේ යයි සිතන්නේ ද එහෙයිනි. අප්පටිපුග්ගලො යන මෙහි නොසුදුසු පුද්ගල තෙම අප්පටිපුග්ගල නම් වේ. මේ ඇවැත් ආදියෙන් අසමාන බැවින් සතුරු වූ විරුද්ධ වූ චෝදකයෙක් වන්ට නොසුදුසු යයි කියන ලද්දේ වෙයි. ඉතිසො කුපිතො මෙසේ හෙතෙම අසමාන පුද්ගලයාගේ චෝදනාවෙන් කිපියේ වෙයි.

සතරවෙනි වාරයෙහි, අහො වත යනු අහො වත රෙ අම්හාකං පණ්ඩිතකා අහොවත රෙ අම්හාකං බහුස්සුතකා තෙවිජ්ජකා යනු ගැරහීමෙහිද දක්නා ලැබේ. අහො වතං මං දහරං යෙව සමානං රජ්ජෙ අභිසිඤ්චෙය්‍යුං යනු ප්‍රාර්ථනාවෙහිද දක්නා ලැබේ. මෙහිද ප්‍රාර්ථනාවෙහි වේ. පටිපුච්ඡිත්වා පටිපුච්ඡිත්වා නැවත නැවත විචාරා, මේ මහණ තෙමේද ලාභ කැමැත්තේ භාග්‍යවතුන් වහන්සේ විසින් තමා විචාල යුත්තෙකු කොට (ධර්මදේශනා කරනු) කැමති වෙයි. එය වූකලී අනුමතියට පමණි. මාර්ගයක් හෝ ඵලයක් හෝ විදර්ශනාවක් සම්බන්ධකොට නොවේ. මෙතෙම වනාහි ශාරිපුත්‍ර ආදි මහතෙරවරුන් තං කිමඤ්ඤසි සාරිපුත්ත, මොග්ගල්ලාන කස්සප, රාහුල, චක්ඛුං නිච්චං වා අනිච්චං වා යි මෙසේ පිරිස් මැද නැවත නැවත විචාරා දහම් දෙසන භාග්‍යවතුන් වහන්සේ දකී. පණ්ඩිත වූ තෙරවරු බුදුරදුන්ගේ සිත සතුටු කෙරෙත් යයි ඒ භික්ෂූන් වහන්සේලාගේ ගුණ කියන්නාවූ ද, ලාභසත්කාර පිරිනමන්නා වූ ද මිනිසුන් දකී. එහෙයින් ලාභසත්කාර කැමැත්තේ, මෙසේ සිතා සාරා සිටුවන ලද කණුවක් මෙන් භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරිපිටම වෙයි.

ඉතිසො කුපිතො ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහු මෙනෙහි නොකොටම අන් භික්ෂුවක් විචාරමින් දහම් දෙසන සේක. ඒ කරුණෙන් හෙතෙම බුදුරදුන්ට ද එම තෙරුන්ට ද කිපුනේ වෙයි. කෙසේනම් භාග්‍යවතුන් වහන්සේට කිපේද යත්?

මම පැවිදි වූ තැන් පටන් ගඳකුටි පිරුවනින් බැහැර ගිය ගමනක් නො දනිමි. සියලු කල්හි ඡායාව මෙන් අත් නො හරිමි. මගේ නම කියා කරන ධර්මදේශනා මාත්‍රයකුදු නැත. එකෙණෙහි දුටු පමණ ඇති භික්ෂුවක් විචාරා දහම් දෙසයි යයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි කිපෙයි.

කෙසේනම් තෙරුන්ට කිපේද යත්, මෙම මහලු තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ අභිමුඛයෙහි කණුවක් මෙන් හිඳියි. කවර කලෙක මොහුව විනයකර්ම කරන නොසුදුසු කෙනෙකු බවට පත්කොට බැහැර කෙරෙත්ද, ඉදින් මෙතෙම මෙම විහාරයෙහි නොවන්නේ නම් අවශ්‍යයෙන් භාග්‍යවතුන් වහන්සේ මා සමග කථා කරන්නේය. මෙසේ තෙරුන්ට කිපෙයි. පුරක්ඛත්වා, පුරක්ඛත්වා යනු පෙරටුකොට, පෙරටුකොට පිරිවරාගෙන යයි කියන ලද්දේ වෙයි. මෙතෙමේ ද ලාභ බලාපොරොත්තු වන්නෙක් මය. ඒ එසේමැයි. බහුශ්‍රැත භික්ෂූහු සහපිරිවරින් ගම් වදිනු

සෑ වඳිනු, මෙතෙම දකියි. ඔවුන්ගේ එම සම්පත්තිය දැක පැහැදුනා වූ පැහැදුනු අයුරු දක්වන්නා වූ ද උපාසකයන් ද දකී. එසේ හෙයින් මෙසේ කැමති වෙයි.

කුපිතො යනු මෙතෙම භික්ෂූන්ට ද, තෙරුන්ට ද යන දෙතැනෙක්හි කිපෙයි. භික්ෂූන්ට කෙසේනම් කිපේද යත්, මේ භික්ෂූහු සිවුරු හෝ පිණ්ඩපාතය හෝ යමක් මට උපදීද, එය ගෙන පරිභෝග කරති. එසේ වුවත් මගේ පාසිවුරු ගෙන පිටිපසින් එන්නකු පවා නැතැයි මෙසේ භික්ෂූන්ට කිපෙයි. තෙරුන්ට කෙසේනම් කිපේද යත්, මේ මහලු ස්ථවිර තෙමේ ඒ ඒ තැන්වල තෙමේ ම පෙනී සිටියි. කවදානම් විනයකර්ම කරන්නෝ ඔහුව බැහැර කරන්නාහුද මොහු නැති කල්හි අවශ්‍යයෙන්ම මා ම පිරිවරා ගන්නාහු යයි කියා,

භත්තගෙග දානශාලාවෙහි, අගගාසනං, සංඝස්ථවිරයන්ගේ ආසනය අගෙගාදකං, වැලදීමට පෙර පිරිනමනු ලබන පැන්, අගගිපිණ්ඩං (සංඝස්ථවිරයන්ට පිරිනමන) අග්‍රපිණ්ඩය නොහොත් සියලු තන්හි අගගං යන මෙය ප්‍රණීතයට නමකි. එහි එය මම ම ලබන්නෙමි යන කැමැත්ත මහා සාවද්‍ය නොවේ. මෙය, අන්‍යයෝ නොලබන්නාහු නම්, යන මෙය ඉතා මහා සාවද්‍ය වන්නේය. මේ තෙමේ ද ලාභ කැමැත්තේ සිවුරු දැරීම් ආදියෙන් ප්‍රසාද එලවන්නේ වෙයි. කිසිකලෙක පැවිදි වෙයි. කලෙක සිවුරු හැර යයි. එහෙයින් හෙතෙම පෙර ලද විරූ ආසනාදිය පසුව නොලබන්නේ මෙසේ සිතයි. න සො භිකඛු ලභෙය්‍ය යනුවෙන්, එම භික්ෂුව ථෙරාදීන්ට අග අසුන් ආදිය ලැබෙන කල්හි, ඒ අනුසාරයෙන් මධ්‍යම නවක භික්ෂූන්ට ද ආසනාදිය ලැබුන කල්හි කිසිකලෙක ඒ සියල්ලටම පහත් වූ ආසනාදිය ලබයි. සමහරවිට නොලබයි. කුපිතො යනුවෙන් මෙතෙම දෙතැනෙක්හි කිපෙයි. මිනිසුන්ට ද තෙරවරුන්ට ද යනුවෙනි.

මිනිසුන්ට කෙසේනම් කිපේද යත්? මොවුහු මංගල අවමංගල කාරණවලදී මා නිසා භික්ෂූන් ලබති. ස්වාමීනි, මෙතෙක් භික්ෂූන් රැගෙන අපට අනුකම්පා කරනු මැනවයි කියති. දැන් එය මේ මොහොතේ දුටු පමණින් මහලු තෙරුන්ට කියා ගියාහුය. හොඳයි වේවා, ඔවුන්ගේ කටයුත්තක් ඇතිවූ කල්හි දැනගන්නෙමැයි මෙසේ මිනිසුන් කෙරෙහි කිපෙති.

තෙරවරුන්ට කෙසේ කිපේද යත්, ඉදින් මොවුහු නොසිටියාහු නම්, මට ම මිනිස්සු ආරාධනා කරන්නාහු යයි තෙරවරුනට කිපෙති.

අනුමොදෙය්‍යං යනුවෙන් අනුමෝදනාව කරන්නේ නම් මේ තෙමේද ලාභ කැමැත්තේ යම් බණ්ඩානු මෝදනාවක් දනී. අනුමෝදනා කරන තැන බොහෝ ස්ත්‍රීහුද පැමිණෙති. ඔවුහු මා හැඳින එතැන් පටන් සැලිබත් දෙන්නහු යයි හෙතෙම මෙසේ ප්‍රාර්ථනා කරන්නේ මෙසේ සිතයි.

ඨානං යනුවෙන් බහුශ්‍රැතයනට අනුමෝදනා භාරය. එහෙයින් බහුශ්‍රැත තෙම අනුමෝදනාව කරන්නේ යයි කියන ලද්දේ වෙයි. කුපිතො යනුවෙන්, මෙතෙම මිනිසුන්ට ද, තෙරුන්ට ද ධර්මකථිකයාට ද යන තුන් ස්ථානයෙහි කිපෙති. කෙසේනම් මිනිසුන්ට කිපෙත්ද යත්, පෙර මොවුහු මා කරාම එළඹ, අපට නාග ස්ථවිරයෝ අපට සුමන ස්ථවිරයෝ අනුමෝදනා කෙරෙත්වායි යාඥා කෙරෙති. අදනම් කීවේ නැතැයි මිනිසුන්ට කිපෙති. කෙසේනම් තෙරුන්ට (කිපේද යත්) මේ සංඝස්ථවිර තෙම තොපගේ කුළුපග වූ නාග ස්ථවිරයන් සුමන ස්ථවිරයන් වෙත යන්න හෙතෙම අනුමෝදනා කරන්නේ යයි නොකියයි. මෙසේ තෙරුන්ට කිපෙයි. ධම්මකථිකයාට කෙසේ (කිපේද?) තෙරුන් විසින් අනුමෝදනාව කළ ඇසිල්ලෙහිම පහර කෑ කුකුලකු මෙන් වහ වහා ශබ්ද කෙරෙයි. මොහු බැහැර කරන්නාහු නම් නැත. යම් හෙයකින් මොහු නැතිකල්හි මම ම අනුමෙවෙනි දේශනාව කරන්නෙම්ද එහෙයින් මෙසේ ධර්මකථිකයාට කිපෙයි.

ආරාමගතානං ආරාමයෙහි රැස්වූවන්, මෙතෙමේ ද ලාභ කැමැත්තේ යම් ඒ බණ්ඩ ධර්ම කථාවක් දනී. හේ එබඳු තැන්වලදී දෙයොදුන් තුන්යොදුන් දුරින් රැස්ව සර්වරාත්‍රික නිත්‍ය ධර්මදේශනාවන් ශ්‍රවණය කරන්නා වූ සතුටු සිත් ඇති භික්ෂූන්ද සාධු, සාධු යයි මහහඬින් සාදුකාර දෙන්නා වූ තරුණ භික්ෂූන් ද සාමණේරයන් ද දකී. එහෙයින් දෙවෙනි දිනයෙහි ඇතුළු ගමට ගියා වූ භික්ෂූන් ස්වාමීනි කවරෙක් ධර්මකථා කීවාහුදැයි ඔවුහු අසවල්, අසවල් තෙරුන් වහන්සේලා යයි කියති. එය අසා පැහැදුන මිනිස්සු ධර්මකථිකයන් වහන්සේට මහත් සත්කාර කරති. හෙතෙම එම සත්කාර කැමති වන්නේ මෙසේ සිතයි. ඨානං යනු බහුශ්‍රැත වූ විනිශ්වයෙහි දක්ෂ වූවන්ට දහම් දෙසීම භාරවෙයි. එහෙයින් බහුසුත තෙමේ දෙසන්නේ යයි කියන ලද්දේ වෙයි.

කුපිතො යනු චතුප්පද ගාථාවකුදු කියන්ට අවකාශ නොලබන හෙතෙම තමාගේ මන්දබුද්ධිභාවයට කිපෙයි. මම වනාහි මන්දබුද්ධිකයෙක්මි. නුවණ නැත්තෙක්මි. දහම් දෙසන්ට කෙසේනම් ලබන්නෙම්දැයි කියායි. භික්ඛුණීනං යනු අවවාද පිණිස හෝ උදෙසීම් පිණිස හෝ විචාරීම පිණිස හෝ පූජාකිරීම පිණිස හෝ ආරාමයට අවුත් රැස්වූ භික්ෂුණීන්ට මෙතෙමේ ද ලාභ කැමති වූයේ වෙයි. ඕහට මෙබඳු සිතක් වෙයි. මේ භික්ෂුණීහු මහාකුලවලින් පැමිණ පැවිදි වූවාහුය. භික්ෂුණීහු ඒ කුලයන්හි පිවිස සිටින්නාහුය. මිනිස්සු ඔවුන් කවරෙකුගෙන් අවවාද හෝ විචාරීම හෝ ලබාගන්නාහුදැයි විචාරන්නාහුය.

අනතුරුව අසචල් නම් ආර්යයන් වහන්සේ බහුස්සුතය. උන්වහන්සේට ප්‍රත්‍යය දෙවු. සත්කාර කරවු යයි කියන්නාහුය. එබැවින් ඔහුට මෙසේ ඉච්ඡාවක් උපදී. ඨානං අවවාද ආදිය නම් බහුස්සුතයන්ට අයත් වූවකි. එහෙයින් බහුස්සුත තෙම දේශනා කරන්නේ යයි කියන ලද්දේ වෙයි. කුපිතො මේ තෙම දෙතැනකදී කිපෙයි. මොවුහු පෙර මා නිසා පොහෝ පවාරණ ආදිය ලබති. දැන් ඔවුහු එකෙනෙහි දුටු පමණක් ඇති මහලු තෙරුන් සමීපයට ගියාහුයයි ඒ භික්ෂුණීන්ටද, මෙතෙම ඔවුන්ට වහා දුන්නේම යයි ධර්ම කථිකයා හටද කිපෙයි. උපාසකානං යනු ආරාමයට ගිය උපාසකයෝ නම් බැහැර කළ කර්මාන්ත ඇති මහා උපාසකයෝ වෙති. ඔවුහු පුත්‍ර සහෝදරයන්ට කර්මාන්ත පාවා දී බණ අසමින් හැසිරෙති. මෙතෙම ඔවුන්ට (ධර්ම) දේශනා කරන්ට කැමති වෙයි. කුමක් හෙයින් ද යත් මොවුහු පැහැදී උපාසිකාවන්ටද කියන්නාහුය. ඉන්පසු උපාසිකාවන් සමග මට ලාභ සත්කාර ගෙන එන්නාහුය. ඨානං යන මෙය බහුස්සුතයා සමගම යෙදිය යුතුය. කුපිතො මේ තෙම දෙතැනෙක්හි කිපෙයි. මොහු අතිකෙකු සමීපයෙහි (ධර්මය) අසත් අපගේ කුලුපග තෙරුන් සමීපයෙහි අසමු යයි නොපැමිණෙත්, එසේ වේවා, දැන් ඔවුන්ට කටයුත්තක් උපන් කල්හි දැනගන්නෙමැයි කියා උපාසකයන්ටද, මොවුන්ට දේශනා කළේ යයි ධර්ම කථිකයාට ද (කිපෙයි) උපාසිකානං ආරාමයට පැමිණියාහු උපාසිකා නම් වන්නීය. ආසන පූජා ආදිය කිරීමට හෝ පොහෝදින බණ අසන්ට හෝ එකරැස් වූවාහු (වෙති.) සෙස්ස උපාසක වාරයෙහි කී නියායමැයි.

සක්කරෙය්‍යුං යනු සකස්කොට කරන්නහු නම් සුන්දර ලෙස කරන්නහු නම්, මෙයින් තමා කෙරෙහි කරන්නා වූ සත්කාරය සකස්කොට

කරන ලද්දක් ද සුන්දර වූවක් ද, ප්‍රාර්ථනා කරයි. ගරුකරෙය්‍යුං ගරු කරන්නාහු නම් මෙයින් භික්ෂූන් විසින් තම ගෞරවණීය ස්ථානයක තබනු ලබන්නකු කොට ප්‍රාර්ථනා කරයි. මානෙය්‍යුං, ප්‍රිය කරන්නාහු නම්. පූජෙය්‍යුං මෙසේ සත්කාර කරන්නාහු ගරුකාර කරන්නහු, ප්‍රිය කරන්නාහු ප්‍රත්‍යයන්ගෙන් පුදන්නහු නම් මැනවයි ප්‍රාර්ථනා කෙරේ. ඨානං යනු පියො ගරුභාවනියො යයි කියන ලද ආකාර ඇති, බහුස්සුත වූද සිල්වත් වූ ද (භික්ෂුව) මේ අයුරින් සුදුසු වෙයි. එබැවින් භික්ෂූහු මෙබඳු වූවහුට මෙසේ කරන්නේ යයි, කියන ලද්දේ වෙයි. කුපිතො යනු මේ තෙමේ ද දෙතැනෙක්හි කිපෙයි. භික්ෂූන්ටද, මොවුහු ඒ භික්ෂුවට සත්කාර කෙරෙත් යයි තෙරුන්ටද යනුයි. මොහු නැති කල්හි මටම සත්කාර කරන්නාහු යයි කියා තෙරුන්ට දැයි දෙතැනෙක්හි කිපෙයි. මතු තුන් වාරයෙහිදු මේ ක්‍රමයමැයි.

පණීතානං චීවරානං යනු පට, දුහුල්, පත්තුණ්ණ, කොසෙය්‍ය මාහැඟි, සියුම්, සුවපහස් ගෙනදෙන සිවුරු මෙහිදී මම ම ලබන්නෙක් වන්නෙමියි යන කැමැත්ත මහාසාවද්‍ය නොවේ. අනිකෙකු ලබන්නෙක් නොවේවා යන ඉච්ඡාව මහා සාවද්‍ය වේ. පණීතානං පිණ්ඩපාතානං යනු ගිතෙල්-තෙල්-මී-සකුරු ආදියෙන් පිරුණු ශ්‍රේෂ්ඨ වූ පිණ්ඩපාතය. පණීතානං සෙනාසනානං යනු නොඑක් සියගණන් නොඑක් දහස්ගණන් අගනා ඇඳපුටු ආදිය. පණීතානං ගිලාන පච්චය භෙසජ්ජ පරික්ඛාරානං යනු, ගිතෙල්, තෙල්, උක්සකුරු ආදි උතුම් බෙහෙත් සියලු තන්හිම ඨානං යන්න බහුස්සුත වූ පුඤ්ඤ වූ ද අය විෂයෙහි යෙදිය යුතුය. කුපිතො සියලු තන්හි දෙතැනෙක්හි කිපෙයි. මොවුන්ගේ නම් පුරුදු පුරුදු බවකුදු නැත. බොහෝකලක් එක්ව වසන්නා වූ ද, පාංසුකූලය පිණිස හෝ පිණ්ඩපාතය පිණිස හෝ ගිතෙල් තලතෙල් ආදිය පිණිස හෝ ගෙපිළිවෙලින් හැසිරෙන්නා වූ මට එක දවසකුදු ප්‍රණීත ප්‍රත්‍යයක් නොදෙති. ආගන්තුක වූ මහලු තෙර දැකම යමක් කැමති නම් එය දෙතියි කියා මිනිසුන්ටද, මේ මහලු තෙරද මොවුන්ට තමන්ව දක්වමින් හැසිරෙයි. කවදානම් දහම් කම් කරන්නෝ මොහු බැහැර කරන්නාහු ද මෙසේ මොහු නැතිකල්හි මම ම ලාභි වන්නෙමැයි තෙරුන්ට කිපෙයි.

ඉමෙසං බො ආවුසොති මෙයින් යට එකුන්විසි වරෙක්හි කියන ලද, (කැමති පරිදි පවත්නා වූ) ඉච්ඡාවචරයන්ගේ, දිස්සන්ති චෙව සුයන්තිච යනුවෙන් ඉච්ඡාවචරයෝ ඇසින් දකිනු නොලැබෙති. කනින් අසනු

නො ලබති. මනෝ විඥානයට විෂය හෙයිනි. ප්‍රහීණ නොවූ ඉච්ඡාවචර ඇත්තා වූ පුද්ගලයාගේ ඉච්ඡාවචර වශයෙන් පැවති (=කැමති පරිදි පවත්නා වූ) කාය කර්මය දැක, දක්නා ලද්දවුන් මෙන් ද, වාක් කර්මය අසා අසන ලද්දවුන් මෙන් ද වෙත්. එහෙයින් වදාරණ ලදී. **දිස්සනති චෙව සූයනතිච** යනුවෙන්. අසවල් භික්ෂුව මෙසේ යයි ප්‍රත්‍යක්ෂ කාලයෙහිම පෙනෙති. ප්‍රත්‍යක්ෂ නොවූ කල්හි අසනු ලැබෙත්.

**කිඤචාපි** යනු අනුග්‍රහ, ගර්හා (සඳහා වූ) වචනයකි. එහෙයින් ආරණ්‍යක බවට අනුග්‍රහ කෙරෙයි. ඉච්ඡාවචරයන් ප්‍රහීණ නොකිරීමට ගර්හා කෙරෙයි. මෝතොමෝ එහි යෝජනා නම් වන්නීය. කිසිසේත් එම භික්ෂු තෙම ගමෙහි සෙනසුන ප්‍රතික්ෂෙප කොට, ආරණ්‍යක වේද, අවසන වනයෙහි ඉතා ඈත සෙනසුනක වාසය කෙරේ. එතකුදු වුවත් මෙතෙක් ඔහුගේ ඉච්ඡාවචරයෝ අප්‍රහීණ වූවාහු වෙති. කිසිසේත් හෙතෙම අතිරේක ලාභය ප්‍රතික්ෂේප කොට පිණ්ඩපාතික වේද, කිසිසේත් හෙතෙම ලොලුප්පචාරය (ආසා බහුල හැසිරීම්) අතහැර ගෙපිළිවෙලින් හැසිරෙනසුලු වේද, කිසිසේත් හෙතෙම ගිහියන් විසින් දුන් සිවුරු ප්‍රතික්ෂේප කොට පාංශුකූලික වේද?

**ලූඛචීවරධරො** යනු මෙහි ලූඛං යනු සත්ථලූඛ සුතතලූඛ - රජතලූඛ යයි කරුණු තුනකින් ලූඛ (දල) බව දතයුතුය. ඔවුනතුරෙහි ආයුධයකින් කඩ කඩකොට සිඳිනා ලද්දේ සත්ථලූඛ නම් වේ. එය වටිනාකමින් අඩුවේ. දල දික් නූල්වලින් මසන ලද්දේ සුත්තලූඛ නම් වේ. එය ස්පර්ශයෙන් පිරිහෙයි. (ගොරෝසු වේ.) සායම් පොවන ලද්දේ රජන ලූඛ නම් වේ. එය වර්ණයෙන් දුර්වල වේ. දුර්වර්ණ වේ. කිසිසේත් ඒ මහණ මෙසේ සත්ථලූඛ, සුත්තලූඛ, රජතලූඛ වූ සිවුරු දරන්නේ වේද, එතකුදු වුවත් ඔහුගේ මේ මෙපමණ ඉච්ඡාවචරයෝ අප්‍රහීණ වූවාහු දක්නාහුද ලැබෙති. අසනුද ලැබෙති. ඉක්බිති ඔහුට නුවණැති සබ්‍රහ්මචාරීහු සත්කාර නොම කරත්. පූජාකොට නොම කරත්. **තංකිසස හෙතු** කරුණු කිම, එහි තං යනු නිපාත මාත්‍රයකි. **කිසස හේතු** හේතුව කිම? ඔවුන් විසින් ඔහුගේ (ඉච්ඡාවචරයෝ) අසනුද ලැබෙත්. යම් හෙයකින් ඔහුගේ ඒ පාපක ධර්මයෝ අසනු ලැබෙත්ද, එහෙයිනැයි කියන ලද්දේ විය. මේ ඉච්ඡාවචර ධර්මය් ප්‍රහීණ නොවුන බැවින්, යනු මෙහි අදහසයි. දැන් මෙම කරුණ උපමාවකින් ප්‍රකට කරන්නේ, **සෙය්‍යථාපි** යනාදිය කීහ.

එහි කුණපං යනු මළසිරුරක්, සර්පයාගේ කුණපය අහිකුණප නම් වේ. අනිත් ඒවාද මෙබඳුය. ඉතා පිළිකුල් ගැරහිය යුතු බැවින් මෙහි මේ තුනම කියන ලද්දාහු යයි දතයුත්තාහුය. ඒ එසේමැයි. අන්‍ය වූ හා ඌරු ආදීන්ගේ කුණප මිනිස්සු කුළුබඩු ආදිය යොදා සකස්කොට පරිභෝගද කෙරෙත්.

ඔවුන්ගේ කුණප වනාහි අභිනව වුවද පිළිකුල් කෙරෙත්මය. කල්පසු වී කුණු වූවායින් පසු කියනුම කවරේද? රචයිත්වා යනු වඩා, පුරවා යන අර්ථයි. කුණපය ගෙන රුවන් බඳුනෙහි බහායයි කියන ලද්දේ වෙයි. අඤ්ඤිසසා යනු අන්‍ය වූ පටිකුජ්ජිත්වා යනු වසා, අන්තරාපණං යනු වෙළඳසැල් අතරෙහි, මහජනයා ගැවසීගත් වීථි ඉදිරිපිට, පටිපජ්ජෙය්‍යුං යනු යන්නාහු නම්, ජඤ්ඤ ජඤ්ඤං විය. මනොඥ වූවක්, අතිශයින් මනාප වූවක් මෙන්, තව ද තරුණ ස්ත්‍රියක් පිණිස වූ පඬුරක් මෙන් යයි ද කියන ලද්දේ වෙයි. ඒ එසේමැයි. වධුකාතොමෝ ජනී යයි කියනු ලැබේ. ඇයට ගෙනයන පඬුර ජඤ්ඤ නම් වේ. දෙපරිද්දෙන්ම ආදර වශයෙන් හෝ ප්‍රශංසා වශයෙන් හෝ පුනරුක්තයි. ජඤ්ඤං ජඤ්ඤං වියා යනුද පාඨයි.

අවාපුරිත්වා විවෘතකොට, තසස සහ දසසනෙන අමනාපතා ච සණ්ඨහෙය්‍ය යනුවෙන් එම කුණපය දැකීම සමගම එම ජනයාගේ අමනාපය නැගී සිටින්නේය. අමනාපතා යනුද අමනාපයයි. උපන්නා වූ චිත්ත චෛතසිකයන්ටම මේ නමකි. පිළිකුල් බව හා ගැරහිය යුතු බව යන දෙතන්හිද මේ ක්‍රමයමැයි. ජිඝච්ඡිතානමපි බඩගිනි ඇත්තවුන්ට ද, න හොතතු කම්‍යතා අසස යනු වළඳනු කැමැති බව ඇති නොවන්නේය. පගෙව සුහිතානං යනු, කා බී සිටිනවුන්ට පළමුකොටම වන්නේය. වළඳනු කැමැත්ත ඇති නොවන්නේ යයි කියන ලද්දේ වෙයි. මේ එහි උපමා ගැලපීමයි.

පිරිසිදු රන්බඳුන හා සමානය මොහුගේ පැවිද්ද, කුණප පිරවීම (එකතුවීම) මෙනි. ඉච්ඡාවචරයන්ගේ අප්‍රහීණ බව, අරණ්‍යකාංග යනාදිය වෙනත් රන් බඳුනකින් වැසීම මෙනි. අන්‍යකාංගාදිය විශ්වාස නොකොට ඉච්ඡාවචර දර්ශනයෙන් සබ්‍රම්සරුන්ගේ සත්කාර සම්මාන නොකිරීම, රන්බඳුන විවෘතකොට කුණප ආදිය පෙන්වීමෙන්, මහජනයා තුල ඇතිවන නොසතුට මෙනි.

කුසල පක්‍ෂයෙහි, කිඤ්චාපි යනු අනුග්‍රහ ප්‍රශංසා වචනයි. එයින් අරණ්‍යභාවයට ප්‍රශංසා කරයි.

ඉච්ඡාවචරයන්ගේ ප්‍රහාණයට ප්‍රශංසා කරයි.

නෙමන්තනිකො, නිමන්ත්‍රණ බත් පිළිගන්නේ, විචිත කාළකං කළු සහල් ඇට තෝරා ඉවත්කළ, අනෙක සූප අනෙක ව්‍යඤ්ජන යනු අතින් ගතහැක්කේ 'සූප' නමයි කියනු ලැබේ. ව්‍යඤ්ජන නම් උත්තරිභංගය. එහෙයින් මත්ස්‍ය, මාංශ, මුද්ගසූප ආදිය කරණකොටගෙන නොයෙක් සූප ඇති, නානාප්‍රකාර මාංශාදි ව්‍යඤ්ජනයන් කරණකොටගෙන නොයෙක් ව්‍යඤ්ජන ඇති යයි කියන ලද්දේ වෙයි. සෙස්ස කී නයින්ම දතයුතුය.

උපමා සංසන්දනයෙහි, හැල්බත් පිළියෙල වීම මෙනි. ඉච්ඡාවචරයන්ගේ ප්‍රහාණය, අල්පේච්ඡතාවෙන් උපන් ග්‍රාමාන්තර විහාරාදිය හේතුකොටගෙන ඉච්ඡාවචර ප්‍රහාණය වැසීම අන් රන් බඳුනකින් වැසීම මෙනි. ග්‍රාමාන්තර විහාර ආදිය නොගෙන, ඉච්ඡාවචර ප්‍රහාණය දැක සබ්‍රම්සරුන්ගේ සත්කාර ආදිය කරන බව රන්බඳුන විවෘත කිරීමෙන් හැල්බත් දැකීම නිසා ඇතිවන ජනයාගේ මනාප බව මෙන් යයි දතයුතුයැ.

උපමා මා ආවුසො සාරිපුත්ත පටිභාති යනු ඇවැත්නි, සාරිපුත්‍රයෙනි, මට උපමාවක් වැටහෙයි. මම එක් උපමාවක් කියනු කැමැත්තෙමි යන අදහසයි. පටිභාතුං තං එය වැටහේවා. තෙපි කියව යන අදහසයි. එකමිදාහං මෙහි 'ඉද' යනු නිපාත මාත්‍රයකි. එක් සමයෙක්හි මම යයි කියන ලද්දේ වෙයි. අදර අරුත්හි දුතියා වචනයි. රාජගහෙ විහරාමි ගිරිබ්බජෙ රජගහ යනු ඒ නගරයාගේ නාමයයි. පර්වතවලින් වටවූ හෙයින් ගාලක් මෙන් පිහිටි බැවින් ගිරිබ්බජ යයි කියනු ලැබේ. ඒ නගරයෙහි වාසය කරමි. ඒ නගරය ඇසුරුකොට වාසය කරමි යයි කියන ලද්දේ විය.

අථඛ්වාහං යනු අථ ඛො අහං යනුයි. මෙහි අථ යනු අඤ්ඤ-අධිකාර වචනාරම්භයෙහි නිපාතයි. ඛො යනු පදපූර්ණ මාත්‍රයි. පුබ්බණ්හසමයං දිනයාගේ පූර්වභාග කාලයෙහි, පෙරවරු කාලයෙහි යන අර්ථයි. පෙරවරුවෙහි හෝ එක් කාලයක් පුබ්බණ්හ සමය නම් වේ. පෙරවරුවෙහි එක් මොහොතක් කියන ලද්දේ වෙයි. මෙසේ අත්‍යන්ත

සංයෝගයෙහි උපයෝග ද්‍රිතියා වචනය ලැබෙයි. නිවාසෙත්වා හැඳ පෙරවා, වෙහෙරෙහි හඳනා පොරෝනා පරිවර්තන මෙයින් දතයුතුයැ. නැතහොත් ගම් වැදීම් පිණිස සකස්කොට හැඳීම පෙරවීම් වශයෙන් දතයුතුයැ. හෙතෙම එයින් පෙර නොහඳනා ලද්දේ නොම වී. පත්ත චීවර මාදාය අත්වලින් පාත්‍රයද, කයින් සිවුරද ගෙන පිණ්ඩාය, පිඬු පිණිස. සම්ති යනු ඔහුගේ නාමයයි. යානකාර පුත්තො, රියකරු පුත් තෙම. පණ්ඩු පුත්තො, පණ්ඩු නම් තැනැත්තහුගේ පුත්‍ර වූ. ආජීවකො නිර්වස්ත්‍ර ශ්‍රමණ තෙම, පුරාණයානකාර පුත්තො, පුරාණ රථකාර කුලයක පුත්‍රයෙක් වූ, පචවුපටඨිතො එළඹ සිටියේ, වංකං නම් එක්පසකින් වක් වූයේ, ජිම්හං නම් සර්පයෙකු ගිය ගමන සමාන වූයේ, දොසං එලය හා විෂම ගැට ආදිය, යථා යථා යනු මෙහි කාලාර්ථයෙහි වෙයි. හෙතෙම තමාගේ සූත්‍රානුලෝමයෙන් (තමන් දත් ශාස්ත්‍රයට අනුව) සිතයි. අනිත් තැනැත්තේ සිතූ කෙනෙහි සිතූ තැනම සසී. අත්තමනො තමාගේ සිත, සතුටු සිත, නැතහොත් ප්‍රීතිය හා සොම්නස යන දෙකින් යුත් සිත, අත්තමන වාචං නිච්ඡාරෙසි සතුටු සිත් ඇති බැවින් වූ වචනය, සතුටු බැවින් යුත් වචන පිටකළේය. උසස්කොට කීය. උසස් වශයෙන් ගෙනහැර දැක්වියැයි කියන ලද්දේ විය.

හදයා හදයං මඤ්ඤෙ අඤ්ඤාය, යනු සිතින් සිත දැන මෙන්, අසසද්ධා බුදුන් දහම් සඟුන් කෙරෙහි ඇදහිලි නැත්තා වූ, ජීවිකත්ථා ණය, භය ආදියෙන් පෙලුනාහු ජීවත්වීමට නොහැක්කා වූ මේ සස්නෙහි ජීවත්වනු කැමැත්තාහු වී. නසද්ධා - සද්ධා නැතිව සඨා මායාවිනො මායාවෙන් හා කපටි බැවින් යුක්ත වූ. කෙටුභිනො හික්මුණු කෛරාටික වූවාහු. උපත (බලවත් වූ) ථාමගත කපටි බැවින් යුක්ත වූයේ යයි කියන ලද්දේ විය. ඒ එසේමැයි. ශඨ බව, අභූතගුණ දැක්වීමෙන්, අභූත වූ භාණ්ඩයන්ගේ ගුණ දැක්වීමත් මෙනැයි මෙම කෛරාටික බව කියනු ලැබේ. උන්නලා උඩට නැගි නල ඇත්තාහු උස් වූ හිස් මාන ඇත්තේ යයි කියන ලද්දේ විය. චපලා පා සිවුරු සැරසීම් ආදි චපල බැවින් යුක්ත වූවාහු, මුඛරා මුඛයෙන් රළුවූවාහු. රළු වචන ඇත්තාහු යයි කියන ලද්දේ වෙයි. විකිණ්ණ වාචා, අසංවර වූ වචන ඇත්තාහු, දවස මුළුල්ලේ නිරර්ථක වචන කථාකරන්නා වූ, ඉන්‍ද්‍රියෙසු අගුත්තද්වාරා සවැදැරුම් ඉන්‍ද්‍රියයන්හි නොවසන ලද කර්ම ද්වාර ඇත්තාහු භොජනෙ අමත්තඤ්ඤුනො, සෙවීම, පිළිගැනීම, පරිභෝග කිරීම පිළිබඳ පමණ නොදන්නා වූ ජාගරියං අනුයුත්තා නිදි දුරුකිරීමෙහි නොයෙදුනාහු, සාමඤ්ඤෙ අනපෙක්ඛවන්තා මහණදහම්හි

බලාපොරොත්තු රහිත වූවාහු ධම්මානුධම්ම පටිපත්ති රහිත වූවාහු යන අර්ථයි.

**සික්ඛාය න තිබ්බගාරවා** ශික්ෂාපද විෂයෙහි බලවත් ගෞරවය නැත්තාහු වෙත්. ඇවැත්වලට පැමිණීම් බහුලකොට ඇත්තාහු වෙති. බාහුලිකා ආදියෙහි ධම්මදායාද සූත්‍රයෙහි කියන ලදී. **කුසීතා** කලින් භයභෙරව සූත්‍රයෙහි (දක්වන ලදී) ධම්ම පරියායෙන ධර්ම දේශනාවෙන්, **සද්ධා අගාරසමා,** ප්‍රකෘතියෙන් ම සැදැහැ ඇත්තාහුද පැවිදි වන්නාහුද සැදැහැයෙන් ගිහිගෙයින් නික්ම, සස්නෙහි පැවිදි වූවාහු. **පිවන්ති මඤ්ඤෙ සසන්ති මඤ්ඤෙ** බොන්නාක් මෙනි. කන්නාක් මෙනි. සතුටු තෙපුල් පිටකරන්නාහු වචනයෙන් බොන්නාක් මෙනි. මොනවට අනුමෝදන් වන්නාහු සිතින් අනුභව කරන්නාක් මෙනි. සාධුවත ඒකාන්තයෙන් සුන්දරය. **සබ්‍රහමචාරී,** බ්‍රහමචාරී යයි හ්‍රස්ව වූයේද බ්‍රහමචාරී දීර්ඝ වූයේද වටී. හ්‍රස්ව වූ කල්හි, සාරිපුත්ත තෙරුන් මත වැටේ. දීර්ඝ වූ කල්හි සබ්‍රහ්මචාරීන් කෙරෙහි වැටෙයි. යම්කලෙක්හි සැරියුත් තෙරුන් මතුයෙහි වෙයිද, සාරිපුත්‍ර තෙම අපව අකුසලින් නගාසිටුවා යන අර්ථයි. යම්විටක සබ්‍රම්සරුන් කෙරෙහි වේද, එවිට සමාන බඹසර ඇති භික්ෂූන් අකුසලින් නගා සිටුවා යන අර්ථයි. දහරො, තරුණයෙක්, යුවා යොවුන් බැව්හි සිටියේ, **මණ්ඩනක ජාතිකො** අලංකාර කරන ස්වභාව ඇත්තේ, ඔවුන් අන් කිසිවෙක් යොවුන් වූයේද, තරුණ වූයේද නොවෙයි. ඉතා තරුණ වූවෙක් යම්සේ ද එමෙනි. කිසිවෙක් යොවුන් වූයේ ද අලංකාර කරන ස්වභාව ඇත්තේ නොවෙයි. උපශාන්ත ගති ඇත්තේ අලස කමින් මඩිනා ලද්දේ යම්සේ දි එමෙනි. මෙහි වූ කලී තරුණ වූයේ ද යොවුන් වූයේ ද අලංකාර කරන ස්වභාව ඇත්තෙක් අදහස් කරන ලදී. එහෙයින් මෙසේ කීහ. උපුල් ආදිය ලෝක සම්මත හෙයින් කියන ලද්දාහු වෙති.

**ඉතිහ තෙ** මෙසේ මොවුහු **උභො මහානාගා** මහානාගයෝ දෙදෙනම, ඒ එසේමැයි. මේ අග්‍රශ්‍රාවක දෙදෙනම 'මහානාග' යයි කියනු ලබත්. එහි මේ වචනාර්ථයි. **ඡන්දාදීහි නගච්ඡන්තීති නාගා** ඡන්දාදියෙන් අගතියට නොයෙත්නුයි නාගනම් වෙති. **තෙනව තෙන මග්ගෙන පහීනෙ කිලෙසෙ න ආගච්ඡන්තීති නාගා** (ඒ ඒ මගින් ප්‍රහීණ වූ කෙලෙසුන්ට නොපැමිණෙත්නුයි නාග නම් වෙති.) **නානප්පකාරං ආගුංන කරොන්තීති නාගා** (නම් වැදෑරුම් වූ සොරකම් නොකෙරෙත් නුයි නාග නම් වෙති.) මේ මෙහි සාරාංශයයි. විස්තරය වනාහි මහා නිද්දේශයෙහි කී අයුරින් දත යුත්තේය.

තවද, ආගුං නකරොති කිඤ්චිලොකෙ
සබ්බ සංයොගෙ විසජ්ජ බන්ධනානි
සබ්බත්ථ නසජ්ජතී විමුත්තො
නාගො තාදි පවුච්චතෙ තථත්තා'ති

(යමෙක් තෙම ලෝකයෙහි අල්පමාත්‍ර වූ අපරාධයක් නොකෙරේද, හෙතෙම තථා ස්වරූප වූයේ නාගයයි කියනු ලැබේ. සියලු සංයෝගයන්ගෙන්ද සියලු බන්ධනයන්ද හැර සියලු තන්හි කිසිසේත් නොඇලෙයි. මිදුනේද තාදි ගුණයෙන් යුක්ත වූයේ ද වෙයි.

මෙසේද මෙහි අර්ථය දතයුත්තේය. මහන්තා නාගා මහානාගා මහත් වූ නාගයෝ මහානාග නම් වෙති. අන්‍ය ක්ෂීණාශ්‍රවයන් විසින්ද අතිශයින් පිදිය යුතුද පැසසිය යුතු ද වෙයි යන අර්ථයි. අඤ්ඤමඤ්ඤස්ස අනිකෙක් අනිකෙකුගේ සමනුමොදිංසු මනාව අනුමෝදන් වූවාහුය. ඔවුන් අතුරෙහි මේ උපමාවෙන් මහමුගලන් තෙරුන් වහන්සේ අනුමෝදන් වූ සේක. එයින් කියන ලදී. අඤ්ඤමඤ්ඤස්ස සුභාසිතං සමනුමොදිංසු යනුවෙන්.

අනංගණ සූත්‍ර වර්ණනාව නිමි.

## 1-1-6

එවං මෙසුතං යනු ආකංඛෙය්‍ය සූත්‍රයයි. එහි සමපනනසීලා යනු සම්පන්නය ත්‍රිවිධ වෙයි. පරිපුණ්ණ, සමංගි, මධුර වශයෙනි. එහි

සමපනනං සාලිකෙදාරං සුවාභුඤ්ජනති කොසිය
පටිවෙදෙමි තෙ බ්‍රහෙම, න නං වාරෙතු මුසසහෙ'ති

(කොසියගෝත්‍ර ඇත්ත, පරිපූර්ණ වූ හැල්කෙත ගිරවු කති. බ්‍රාහ්මණය, තට දන්වමි. එය වලක්වන්ට උත්සාහ නොකරමි.)

මෙය පරිපුණ්ණ සම්පන්න නම් වේ. ඉමිනා පාතිමොකඛසංවරෙන උපෙතොහොති, සමුපෙතො උපාගතො සමූපාගතො උපපනෙනා සමපනෙනා, සමනනාගතො යනු මෙය සමංගි සම්පන්න නම් වෙයි.

ඉමිසසා භනෙත මහාපඨවියා හෙට්ඨිමං තලං සමපනනං සෙය්‍යථාපි ඛුද්දං මධුං අනෙලකං එවමසසාදං යනු මෙහි මධුර සම්පන්න නම් වේ. මෙහි වනාහි පරිපුණ්ණ සම්පන්නය ද සමංගි සම්පන්නයද වටී. එහෙයින් සමපනනසීලා යනු පිරිපුන් සිල් ඇත්තාහු වූවාහු යයි ද, සීලයෙන් සමන්විත වූවාහු යයිද මෙහි අර්ථය දතයුතුය. සීලං යනු කිනම් අර්ථයෙන් සීල නම් වේද? සීලනාර්ථයෙන් සීලනම් වේ. මෙහි විස්තර කථාව විසුද්ධි මාර්ගයෙහි කියන ලද්දීය. එහි පරිපුණ්ණසීලා, පරිපූර්ණ සිල් ඇත්තාහු යන අර්ථයන් ක්ෂේත්‍රදෝෂ පහවී යාමෙන් ක්ෂේත්‍රයාගේ පිරීම මෙන් සීල දෝෂ පහවී යාමෙන් ශීලයාගේ පිරීම කියන ලද්දේ වෙයි. එය එසේමැයි. බීජඛණ්ඩ, වපපඛණ්ඩ, උදක ඛණ්ඩ, ඌසඛණ්ඩ යන සතර දෝෂයන්ගෙන් යුත් කෙත අසම්පූර්ණ වූයේ වෙයි.

එහි බීජ ඛණ්ඩය නම් යම්තැනක අතරින් අතර බීජයෝ නැසුනාහු හෝ කුණු වූවාහු වෙත් ද එහි බීජ යම්තැනෙක වැටෙත් ද ශස්‍යය නොනගී. කෙත ඛණ්ඩ වූයේ වෙයි.

වපපඛණ්ඩය නම් යම්තැනක අදක්ෂයෙක් තෙම බීජ ඉසින්නේ,

අතරින් පතර නොහෙළාද, මෙසේ කල්හි සියලු තැන ශස්‍ය නොනගී. කෙත ඛණ්ඩ වූයේ වෙයි.

උදක ඛණ්ඩ නම්, යම්කිසි තැනක ජලය බොහෝ වූයේ වේද, නොවූයේ හෝ වේද, එහිද ශස්‍යයෝ නොනගිති. කෙත ඛණ්ඩ වූයේ වෙයි.

ඌසඛණ්ඩ නම්, යම් කෙතක ගොවිතෙම කෙතෙහි කිසි පෙදෙසක් නගුලෙන් සතර පස්වරක් සාන්නේ ඉතා ගැඹුරු කෙරේ ද? එහෙයින් කරමැටි උපදීද එහි ශස්‍ය නො නගී. කෙත ඛණ්ඩ වූයේ වෙයි. එබඳු කෙතද මහත්ඵල වූයේ නොවෙයි. මහත් ආනිශංස (ප්‍රයෝජන) ඇත්තේද නොවේ. එහි වනාහි බොහෝ වපුරා ස්වල්පයක් ලබති. මෙම සතර දෝෂයන්ගෙන් මිදුන කෙත පරිපූර්ණ වූයේ වෙයි. එවන් කෙත මහත් ප්‍රතිඵල ඇත්තේ වෙයි. මහත් ප්‍රයෝජන ඇත්තේ වෙයි.

සීල දෝෂ

මෙපරිද්දෙන් ඛණ්ඩ, ඡිද්ද, සබල, කම්මාස යන සතර දෝෂයන් සහිත සීලය අපරිපූර්ණ සීලය වේ. එවැනි සීලය මහත්ඵල මහානිසංස නොවේ. මෙම සතර දෝෂයන්ගේ පහව යාමෙන් සීලය පරිපූර්ණ වූයේ වෙයි. එවැනි සීලය මහත්ඵල මහානිශංස ඇත්තේ වේ. **සීලසමංගිනො** යන මේ අරුතින් සීලයෙන් සමන්විත වූවාහු රැස්වීමට ගියාහු, සමන්නාගත වූවහු වී වාසය කරවු යන මෙය කියන ලද්දේ විය.

එහි කරුණු දෙකක් නිසා සීලයෙන් සම්පූර්ණ බව වෙයි. සීල විපත්තියේ ආදීනව දැකීමෙන් ද, සීල සම්පත්තියේ ආනිශංස දැකීමෙන්ද යන කරුණු දෙකෙනි. මෙම දෙකරුණම විසුද්ධි මග්ගයෙහි විස්තර කරන ලදී.

එහි **සම්පන්නසීලා** යන මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ චතුපාරිසුද්ධි සීලය උදෙසා **පාතිමොක්ඛ සංවර සංවුතො** යන මෙයින් එහි ජ්‍යෙෂ්ඨ සීලය විස්තරකොට දැක්වූ සේකැයි දීපවිහාරවාසී සුමම ස්ථවිර තෙම කීය. උන්වහන්සේගේ අතවැසි වූ ත්‍රිපිටක 'චූලනාග' ස්ථවිර තෙම මෙසේ කීය. දෙතැන්හිම භාග්‍යවතුන් විසින් ප්‍රාතිමොක්ෂ සංවරය වදාරණ ලද්දේය. ඒ එසේමයි. ප්‍රාතිමොක්ෂ සංවරයම සීලයයි. අන්‍ය වූ

(ඉන්ද්‍රිය සංවර ආදී) තුන සීලය යයි කී තැනෙක්නම් ඇතැයි නොපිළි ගනිමින් මෙසේ කිය. ඉන්ද්‍රිය සංවරය නම් සදොර රැකීම පමණක්මැයි. ආජීව පාරිසුද්ධිය දැහැමෙන් සෙමෙන් ප්‍රත්‍යය ඉපදවීම, පමණි. ප්‍රත්‍ය සන්නිශ්‍රිතය ලැබූ ප්‍රත්‍යයන් මේ පිණිස යයි පස්විකා පරිභෝග කිරීම පමණය. නිස්පර්යායයෙන් වෙනස් නොකළ හැකි අර්ථයෙන් ප්‍රාතිමොක්ෂ සංවරයම ශීලයයි. යමෙකුගේ ඒ ප්‍රාතිමොක්ෂ සංවර සීලය බිඳුනේ ද, හිස සුන් පුරුෂයෙකු සෙසු හස්තපාදයන් රකින්නේ යයි නොකිය යුත්තේය. යමෙකුගේ ප්‍රාතිමොක්ෂ සංවරය නිරුපද්‍රිතද මෙතෙම නොසුන් හිස් ඇති පුරුෂයෙකු මෙන් ජීවිතය ද සෙසු අවයවද ප්‍රකෘතිමත් කොට රකින්නට සමර්ථ වෙයි. එහෙයින් සමපනන සීලා යන මෙයින් ප්‍රාතිමොක්ෂ සංවරය උදෙසා සමපනන පාතිමොකඛා යි ඊටම පර්යාය වචන වදාරා එය විස්තරකොට දක්වන්නාහු පාතිමොකඛ සංවර සංවුතා යනාදිය වදාළ සේක.

එහි පාතිමොකඛ සංවර සංවුතා ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්ත වූවාහු, ආචාර ගොචර සමපනනා ආචාරයෙන් ද ගෝචරයෙන් ද යුක්ත වූවාහු, අණුමතෙතසු අල්පමාත්‍ර වූ, වජ්ජෙසු අකුසල ධර්මයන් භයදසසාවී භය දක්නා සුළු වූවාහු සමාදාය, මනාකොට ගෙන, සිකඛථ, සිකඛාපදෙසු ශික්ෂාපද අතුරෙහි ඒ ඒ ශික්ෂාපද සමාදන්ව, හික්මෙවු. යළිද්‍ද, සමාදාය සිකඛථ සිකඛාපදෙසු යන කිසියම් ශික්ෂාපදයන්හි, ශික්ෂාපද කොටඨාශයන්හි හික්මිය යුතුය. කායික හෝ වාචසික හෝ ඒ සියල්ල මනාව ගෙන හික්මෙවු යනු මෙහි සංක්‍ෂෙප යයි. විස්තර වශයෙන් පාතිමොකඛ සංවර ආදි පදයන් විසුද්ධි මග්ගයෙහි කියනු ලද්දාහු වෙති.

ආකංඛෙය්‍ය චෙ යනු කුමක් හෙයින් අරඹන ලද්දේද? සීලානිශංස දක්වනු පිණිසය. ඉදින් අළුත පැවිදි වූවන්ට හෝ නැණ හීනයන්ට හෝ මෙබඳු සිතක් වන්නේ නම් භාග්‍යවතුන් වහන්සේ සිල් පුරවු සිල් පුරවු යයි වදාරති. සිල් පිරීමෙහි අනුසස් කවරේද, විශේෂය කවරේද, වැඩීම කවරේද, ඔවුන්ගේ සතතරස (දාහතක්) ආනිශංස දක්වන්ට මෙසේ වදාළහ. මෙපරිද්දෙන් සබ්‍රම්සරුන්ට ප්‍රියමනාපතාදී ආශ්‍රවයන් නැතිකිරීම අවසන්කොට ඇති, අනුසස් අසාද සිල් පුරන්නාහු නම් ඉතා මැනවැයි කියායි. විෂකණටක වානිජයා මෙනි (විසකණටක=උක්සකුරු)

විෂකණ්ටක වෙළෙඳ තෙමේ

විසකණ්ටක වාණිජ යනු උක්සකුරු වෙළෙන්දාට නමකි. හේ වනාහි උක්සකුරු බණ්ඩසක්කර (වැලිහකුරු) ආදිය ගැලකින් ගෙන පිටිසර ගමකට ගොස් විසකණ්ටක ගනිව්, විසකණ්ටක ගනිව් යයි උද්ඝෝෂණය කළේය. එය අසා ගම්වැසියෝ විස නම් කර්කශ දෙයකි. යමෙක් කයි ද හේ මැරෙයි. කණ්ටක (කටු) ද විද මරයි. මේ දෙකම නපුරුය. මින් ඇති ප්‍රයෝජනය කිමෙක්දැයි ගෙවල් දොරවල් වැසූහ. දරුවන් ද පලවා හැරියහ. මේ දැක වෙළඳ තෙම මේ ගම්වැසියෝ ව්‍යවහාර භාෂාව නොදන්නාහුය. උපායෙන් (බඩු) ගන්වන්නෙමි යයි, ඉතා මධුරය ගනිවු, ඉතා ප්‍රණීතය ගනිවු. උක්සකුරු පැණි-සකුරු සම අගය ලැබෙයි. කූටමාසක, කූටකහාපන ආදියටද ලැබෙයි යයි උද්ඝෝෂණය කළහ. එය අසා ගම්වැසියෝ තුටුපහටු සිත් ඇත්තාහු නික්ම බොහෝ මුදල් දී (බඩු) ගත්තාහුය.

එම උපමාවෙහි බුදුරදුන්ගේ මහණෙනි, සීලයෙන් සම්පූර්ණව වාසය කරවු, ශික්ෂාපදයන් අතුරෙන් ඒ ඒ ශික්ෂාපද මොනවට ගෙන හික්මෙවු යන වචන වෙළෙන්දාගේ විෂකණ්ටක ගණිවු යයි උද්ඝෝෂණය මෙනි. බුදුරදහු ශීලයෙන් සම්පූර්ණව වාසය කරවු යයි වදාළහ. එතකුදු වුවත් මෙම ශීලය නම් කර්කෂය. හාස්‍ය ක්‍රීඩා ආදියට විරුද්ධය. සීලයෙන් සම්පූර්ණ වූවන්ට අනුසස් කිමෙක්දෝ හෝයි භික්ෂූන්ගේ සිතීම ද (විෂකටු) යන මේ දෙකම කර්කෂය. මෙහි අනුසස් කවරේද? යනුවෙන් ගම් වැසියන්ගේ සිතීම මෙනි. බුදුරදුන්ගේ ප්‍රියමනාපතා ආදිකොට ආසවක්ඛය අවසන්කොට සතළොස් අනුසස් ප්‍රකාශ කිරීම පිණිස ආකංඛෙය්‍ය යන වචනයට අනතුරුව, එම වෙළෙන්දාගේ අතිමධුරස ගනිවු යනාදි වචනය මෙනැයි දතයුතුයැ.

එහි ආකංඛෙය්‍ය චෙ ඉදින් බලාපොරොත්තු වන්නේ නම් කැමති වන්නේ නම්, පියොචසස යනු ප්‍රිය ඇස්වලින් බැලිය යුත්තෙක් සෙනෙහස ඉපදීමට හේතුභූත වූවෙක් වන්නෙම් යයි, කියන ලද්දේ වෙයි. මනාපො, යනු ඔවුන්ට මනවඩන්නෙක් නැතහොත් ඔවුන්ගේ සිතින් පැමිණිය යුත්තෙක් මෙත් සිතින් පැතිරිය යුත්තෙකැයි කියන ලද්දේ වෙයි. ගරු ඔවුන් ගරුතැන්හි වූවෙක් පාසාණ ඡත්‍රයකට සමාන වේ. භාවනීයො ඒකාන්තයෙන් ආයුෂ්මත් තෙම දතයුත්ත දනී. දැක්කයුත්ත දකී. මෙසේ සම්භාවනාවට පත්වූයේ, **සීලෙසෙවචසස** පරිපූරකාරී චතුපාරිසුද්ධි සීලයෙහිම පරිපූරකාරී වූයේ වන්නේය. අනූන වූ පිරිපුන් ආකාරයෙන්

යුක්ත වූයේ වන්නේ යයි කියන ලද්දේ විය. අජ්ඣත්තං චෙතො සමථ මනුයුත්තො යනු තමාගේ චිත්ත සමථයෙහි යෙදුනේ මෙහි වූකලී අජ්ඣත්තං යනු ද අත්තනො යනුද එකම අර්ථයෙහි වේ. අක්ෂර පමණි වෙනස, සමථං යනු ආධාර අර්ථයෙහි කර්මය වේ. අනු යන උපසර්ග හේතුවෙන් මෙම ප්‍රයෝගය සිද්ධ විය. අනිරාකතජ්ඣානො බැහැර නොකරන ලද ධ්‍යාන ඇත්තේ නොනට ධ්‍යාන ඇත්තේ හෝ මේ නිරාකරණය නම් බැහැර කිරීම විනාශ කිරීම අර්ථය මැයි. ථමහං, තිරං, කත්වා නිවාතවුත්ති යනාදි තන්හිද මෙම පදයාගේ ප්‍රයෝගය දතයුතුයැ.

විපස්සනාය සමන්නාගතො සප්තවිධ අනුපස්සනාවන්ගෙන් යුක්ත වූයේ. සප්තවිධ අනුපස්සිනා නම් අනිච්චානු පස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානු පස්සනා, නිබ්බිදානු පස්සනා, විරාගානු පස්සනා, නිරෝධානු පස්සනා, පටිනිස්සග්ගානු පස්සනා යන මොහුයි. ඔවුහු විසුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලද්දාහුය. බ්‍රෑහෙතා සුඤ්ඤා ගාරානං ශුන්‍යාගාරයන්ගේ (භාවනාව) වඩන්නේ මෙහිද සමථ විපස්සනා කමටහන් ගෙන රෑ දවල් ශුන්‍යාගාරයට පිවිස, හිඳින්නා වූ මහණ බ්‍රෑහෙතා සුඤ්ඤාගාරතා යනුවෙන් දතයුතුයැ. එක භූමකාදි ප්‍රාසාදයෙහි (භාවනා) කරන්නේ ද, ශුන්‍යාගාර භාවනා වඩන්නේ තොම වේ යයි දතයුතුයැ.

මෙතෙකින් තණ්හා විචරිත (තණ්හා ඇසුරුකළ) දේශනාව පළමුකොට තණ්හාවගේ වශයෙන් පටන්ගන්නා ලදී. නමුත් මාන දිට්ඨීහුද තණ්හාවට පදට්ඨාන (ආසන්න කාරණා) බැවින් මාන දෘෂ්ටීන් බැස ක්‍රමයෙන් පපඤ්චත්තය දේශනා වූවා වේ. එසේ මෝ දේශනාතොමෝ පළමුකොට අධිසීල සික්ඛා වශයෙන් ආරම්භ කරන ලද්දේ නමුත් සමථ විදර්ශනාවන් සීලයටම පදට්ඨාන බැවින් සමථ විදර්ශනාවට බැස ක්‍රමයෙන් ශික්ෂාත්‍රය දේශනා වීයයි දතයුතුයැ.

මෙහි සීලෙසෙවස්ස පරිපූරකාරී යන මෙතෙකින් අධිසීල සික්ඛාව කියන ලදී. අජ්ඣත්තං චෙතොසමථ මනුයුත්තො, අනිරාකතජ්ඣානො මෙතෙකින් අධිචිත්ත සික්ඛා (කියන ලදී) විපස්සනා වශයෙන් අධිපඤ්ඤා සික්ඛා (කියන ලද්දී වෙයි) බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං, මෙයින් සමථ වශයෙන් සුඤ්ඤාගාර වැඩීම, අධිචිත්ත සික්ඛාවද, විපස්සනා වශයෙන් අධිපඤ්ඤා සික්ඛාවදැයි සික්ඛා ද්වය සංග්‍රහකොට කියන ලද්දී වෙයි.

මෙහි ද අජ්ඣත්තං චෙතො සමථ මනුයුතෙතා, අනිරාකතජ්ඣානො යන මේ පදයන්ගෙන් සීලයෙන් රක්නා ලද, චිතෙතකගගතාවය කියන ලද්දීය. විපසසනාය මේ පදයෙන් සීලය අනුව රකින ලද සංඛාර පරිග්‍රහය කියන ලද්දේය.

කෙසේනම් චිත්ත ඒකග්ගතාවය සීලය රකීද යත්? යම් හෙයකින් යමෙකුට චිත්ත ඒකග්ගතාවය නැද්ද, හෙතෙම ලෙඩක් හටගත් කල්හි, දුකට පැමිණෙයි. හෙතෙම ලෙඩෙන් විසුරුණු සිත් ඇත්තේ සීලය විනාශකොට ද රෝග සංසිඳීම කරන්නේ වෙයි.

යමෙකුට වනාහි චිත්ත ඒකග්ගතාව ඇද්ද, හෙතෙම එම ව්‍යාධි දුකඛය දුරුකොට සමවතට සමවදී. සමවන් කෙනෙහි දුක දුරින් වෙන්ව ගියේ වෙයි. ඉතා බලවත් සුවය උපදියි. මෙසේ චිතෙතකගගතා තොමෝ සීලය රකියි.

සංඛාර පරිගගහ තෙමේ කෙසේනම් සීලය ආරක්ෂා කෙරේද යත්, යමෙකුට සංඛාර පරිගගහයක් නැද්ද, ඕහට මගේ රූපය, මගේ විඤ්ඤාණය යයි ආත්මභාවයෙහි බලවත් මගේකමක් ඇතිවෙයි. හෙතෙම දුර්භික්ෂා, ව්‍යාධි ආදීන් පැමිණි පැමිණි කල්හි සීලය විනාශ කොටද ආත්මභාවය පෝෂණය කරන්නේ වෙයි.

යමෙකුට සංඛාර පරිගගහය ඇද්ද, ඔහුට ආත්මභාවය පිළිබඳව බලවත් මගේකමක් හෝ බලවත් ආදරයක් හෝ නොවේ. හෙතෙම එවන් දුබහිකඛ - ව්‍යාධි - භය ආදියක් පැමිණි කල්හි ඉදින් බඩවැල් පිටත නික්මේ ද, වියලේ ද විශේෂයෙන් වියලි යේ ද, සියක් ප්‍රකාරයෙන් දහස් ප්‍රකාරයෙන් කඩ කඩ හෝ වේද, සීලය විනාශ කොට ආත්මභාවය පෝෂණයි කරන්නේ නොම වෙයි. මෙසේ සංඛාර පෝෂණය කරන්නේ නොම වෙයි. මෙසේ සංඛාර පරිගගහ තොමෝ සීලය ආරක්ෂා කරන්නීය. **බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං** යන මෙයින් (චිතෙතකගගතා සංඛාර පරිගගහ) දෙදෙනාගේම බ්‍රෑහනය, වැඩීම සතතයෙන් ක්‍රියාකාරී වීම දක්වන ලද්දේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ යම්හෙයකින් සබ්‍රම්සරුන්ට ප්‍රිය වූවෙක් වන්නෙමියි -පෙ- සැලකිය යුත්තෙක්ද වන්නෙමියි, මේ සතර ධර්මයන් කැමති වන්නාහු විසින් කළයුතු අන් කිසිවක් නැද්ද, ඒකාන්තයෙන් සීලාදි ගුණයන්ගෙන් යුක්ත වූවෙක්ම විය යුතුද, මෙබඳු තැනැත්තේ

සබ්‍රම්සරුනට ප්‍රිය වූයේ මග වඩන්නේ, ගරුතන්හි වූයේ සම්භාවනීය වූයේ වේද, මෙසේ වදාරණ ලද්දේ ද වෙයි.

සීලදස්සන සම්පන්නං ධම්මට්ඨං සච්චවාදිනං
අත්තනොකම්මකුබ්බානං තංජනො කුරුතෙ පියං

(චතුපාරිශුද්ධි සීලයෙන් හා සම්‍යග් දර්ශනයෙන් යුක්ත වූ නවලොව්තුරු දහම්හි පිහිටියා වූ තම කර්මය කරන්නා වූ ඒ පුද්ගලයා ජනතෙම ප්‍රිය කෙරෙයි.)

එහෙයින්, ආකංඛෙය්‍ය චෙ භික්ඛවෙ, භික්ඛු සබ්‍රහමචාරීනං පියො චස්සං -පෙ- භාවනීයො චාති සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- සුඤ්ඤාගාරානං යයි වදාරා මෙවිට යම්හෙයකින් ප්‍රත්‍යලාභාදි භාවය ප්‍රාර්ථනා කරන්නහු විසින් ද මෙයම කළයුතු ද අන් කිසිවක් නොකළ යුතු ද, එහෙයින්

ආකංඛෙය්‍ය චෙ භික්ඛවෙ, භික්ඛුලාභී අස්සං යනාදිය වදාළහ. මෙහිලා භාග්‍යවතුන් වහන්සේ ලාභය නිමිති කොට සීලාදිය පිරීම නොවදාරත් යයි දතයුත්තේය. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ ලාභය නිමිතිකොට සීලාදිය සම්පූර්ණ කිරීම නොවදාරත් යයි දතයුත්තේය. ඒ එසේමැයි භාග්‍යවතුන් වහන්සේ, සාසෙස්සනං ජිඝච්ඡකථො න වාචං පසුතං භණෙ

(ජිඝච්ඡකථා ඇත්තෙක් මෙන් වී අවභාස පරිකථා නිමිත්ත විඥප්ති ප්‍රයුක්ත වූ ආහාර සෙවීම පිණිස වූ වචනය නොකියන්නේ යයි) මෙසේ ශ්‍රාවකයන්ට අවවාද කරති. ඒ භාග්‍යවත්හු ලාභය නිමිතිකොට සීලය පිරීම වදාරන්නාහු ද? පුද්ගල අධ්‍යාසය වශයෙන් වදාරණ ලදී. ඒ එසේමැයි, යම් කෙනෙකුට මෙබඳු අදහසක් වන්නේ නම් ඉදින් අපි සිව්පසයෙන් විඩා නොවන්නෙමු නම් සිල් පුරන්ට හැකිවන්නෙමු, යයි කියායි. ඔවුන්ගේ අදහස් වශයෙන් බුදුරදහු මෙසේ වදාළහ. යම් මේ සිව්පසයක් වේද, එය සීලයාගේ කෘත්‍ය සංඛ්‍යාත ආනිශංස යයි. එබැවින් පණ්ඩිත මනුෂ්‍යයෝ ගබඩාකොට තබන ලද්ද ද ගෙන පුත්‍රාදීන්ටත් නොදී තමනුත් පරිභෝග නොකොට සිල්වතුන්ට දෙති. සීලයාගේ කෘත්‍ය නම් වූ අනුසස් දැක්වීම පිණිස දක්වන ලද්දේ වෙයි.

තුන්වන වාරයෙහි යෙසාහං යනු යෙසං+අහං තෙසං තෙකරා ඒ දෙවියන්ගේ හෝ මිනිසුන්ගේ හෝ මා කෙරෙහි කරන ලද එම ප්‍රත්‍ය සත්කාරයෝ ඒ එසේමැයි. දෙවියෝ ද සිල්වතුන්ට ප්‍රත්‍යය දෙති. හුදු මනුෂ්‍යයෝ පමණක් නොවෙති. ආයුෂ්මත් මහා කාශ්‍යප හිමියන්ට සක්දෙව් රජු මෙනි. මහපඵලා මහානිසංසා යන මේ දෙක අරුත් වශයෙන් එකකි. ඛ්‍යඤ්ජන පමණි එහි වෙනස. නොහොත් මහත් වූ ලෞකික සැපයට ප්‍රත්‍ය වේනුයි කෙරෙත්නුයි මහපඵලා යනු වේ. මහත් වූ ලෝකෝත්තර සැපයට ප්‍රත්‍ය වෙත්නුයි මහානිසංස වේ. ඒ එසේමැයි. සීලාදී ගුණයන්ගෙන් යුක්ත වූවහුට හැන්දක් පමණ දානය ද, පස්රියන් පමණ බිම පන්සලක්ද කොට දෙන ලද්දේ, නොඑක් කල්ප දහස් ගණන් දුර්ගතියෙහි වැටීමෙන් රකියි. අවසන නිවනින් පරිනිර්වාණයට ප්‍රත්‍යයද වෙයි.

මෙහිලා, ඛීරොදනං අහමදාසිං යනාදි (කථා) වස්තුහු ද, සියලුම ප්‍රේත වස්තු ද, විමාන වස්තු ද සාධකය. එහෙයින් ප්‍රත්‍ය දෙන්නවුන් විසින්, තමා කෙරෙහි කරන ලද සත්කාරයන්ගේ මහත්ඵල භාවය කැමැති වන්නවුන් විසින් ශීලාදී ගුණ යුත්තයන්ම (ප්‍රතිග්‍රාහකයන්) වියයුතු යයි දක්වන සේක.

සතරවන වාරයෙහි, ඥාති නැදි මයිල් පක්ෂයෙහි වූවාහු, සාලොහිතා, එක් ලෙසින් බැඳුනා වූ පියා, පියාගේ පියා ආදීහු. පෙතා පෙටවභාවයට (පරලොවට) ගියාහු, කාලකතා මළාහු, තෙසංතං ඔවුන්ගේ ඒ මා කෙරෙහි පැහැදුනු සිත් ඇති බව හෝ පැහැදුන් සිතින් සිහිකිරීම හෝ සැවව යම් පැවිද්දෙකුගේ කලුරිය කළ පියා හෝ මව අපගේ ඤාති තෙරුන් වහන්සේ සිල්වතෙක, යහපත් දහම් ඇත්තෙකුයි පැහැදුනු සිතින් යුතුව ඒ භික්ෂුව සිහිකෙරේද, ඔහුගේ ඒ චිත්තප්‍රසාදය ද ඒ සිහිකිරීම මාත්‍රයද, මහත්ඵල මහානිසංස වූයේම වෙයි. නොයෙක් දහස් ගණන් කල්ප දුගතියෙන් වළකන්ටද, අන්තයෙහි නිවනට පමුණුවන්ටද සමර්ථ වූයේම වෙයි. මෙය වදාරණ ලද්දේමැයි බුදුරදහු විසින්,

**යෙ කෙචි භික්ඛවෙ, භික්ඛු සීලසම්පන්නා, සමාධි සම්පන්නා, පඤ්ඤා, විමුත්ති, විමුත්ති ඤාණදස්සන සම්පන්නා දස්සනම්පහං භික්ඛවෙ, තෙසං භික්ඛූනං බහුකාරං වදාමි. සවනං - අනුස්සතිං අනුපබ්බජ්ජං උපසංඛමනං පයුරුපාසනම්පහං භික්ඛවෙ, තෙසං භික්ඛූනං බහුකාරං වදාමි** යනුවෙන් සහලේ නෑයන්ට තමා කෙරෙහි චිත්තප්‍රසාදයාගේ ද

අනුස්මෘතියගේද, මහත්ඵල භාවය කැමැත්තහු විසින් ද, සීලාදි ගුණ යුක්තයෙක්ම විය යුතුයයි දක්වන සේක.

පස්වන වාරයෙහි, අරති රති රහො අසසං අරතියද රතියද, ඉවසන්නේ, මැඩපවත්වන්නේ යටපත් කරන්නේ වන්නෙමි. මෙහි ද අරති යනු අධි කුසල ධර්මයන්හි ද පන්ත සේනාසනයන්හි ද උකටලී වෙයි. රති, යනු පංචකාම ගුණයන්හි ඇලීමයි. න ච මං අරති සහෙය්‍යං මා ද අරතිය මැඩනොපවත්වන්නේය. නොමඩින්නේය. යටපත් නොකරන්නේය. උපපන්නං හටගත් උපන් යම්හෙයකින් ශීලාදි ගුණ යුක්ත වූයේ, අරතියද, රතියද ඉවසා ද, යටපත් කෙරේ ද, මැඩ සිටී ද, එහෙයින් මෙබඳු වූ ආත්මභාව කැමැත්තහු විසින් ද, ශීලාදි ගුණ යුක්ත වූවෙක්ම විය යුතුයයි දක්වන සේක.

සයවන වාරයෙහි, භයං සිත තැති ගැන්මද අරමුණද වේ. භෙරව නම් අරමුණමැයි. සෙස්ස පස්වන වාරයෙහි කී ක්‍රමයමැයි. සීලාදි ගුණයෙන් යුත් තැනැත්තේ භයභේරවයන් ඉවසයි. යටපත් කොට මැඩගෙන සිටී. අරියකොට්වාසි මහාදත්ත තෙර මෙනි.

**අරියකොට්වාසි මහාදත්ත තෙර**

මගට පිළිපන් මහාදත්ත තෙරුන් වහන්සේ සිත්කලු වනලැහැබක් දැක අද මෙහි මහණදම් කොට යන්නෙමැයි මගින් ඉවත්ව එක් වෘක්ෂයක් මුල සඟල සිවුරින් (අසුනක්) පනවා පලක්බැඳ වැඩහුන්හ. රුක් දෙවියාගේ දරුවෝ තෙරුන්ගේ සිල් තෙදින් ස්වකීය ස්වරූපයෙන් සිටිය නොහැක්කාහු මහහඬින් කැගැසූහ. දේවතාවියද සල්ගස සෙලවූවාය. තෙරුන් වහන්සේ නොසෙල්වී වැඩසිටි සේක. දේවතාවිය දුවන්ට පටන් ගත්තීය. දිලිසෙන්ට විය. තෙරුන් සොලවන්ට නොම හැකිවූවාහ. අනතුරුව උපාසක වේසයෙන් අවුත් වැඳ සිටියාය. මේ කවරෙක්දැයි විචාල කල්හි වහන්ස, මම තෙල රුකෙහි අධිගෘහිත දේවතාවා වෙමියි කීවාය. තී, තෙල විකාර කෙළෙහිද? එසේය වහන්ස, කුමක් හෙයින්ද? විචාරණ ලද්දේ මෙසේ කීවාය. වහන්ස, ඔබගේ සිල් තෙදින් දරුවෝ ස්වකීයි ස්වභාවයෙන් සිටිය නොහැක්කාහු මහත්කොට හැඬූහ. මම ඔබ පලවා හරින්ට මෙසේ කෙළෙමියි (කීවාය)

තෙරුන් වහන්සේ මෙසේ කී සේක. වැලි කුමක් හෙයින්ද වහන්ස

මෙහි නොවිසුව මැනව. මට අපහසු යයි පළමුකොටම නො කීයෙහි ද, දැන්වූ කලී කිසිවක් නොකියව, අරියකොටියවැසි මහදත්ත තෙම, අමනුෂ්‍යයන්ට බියෙන් ගියේය යන වචනයෙන් ලැජ්ජා වෙමි. මම මෙහිම වසන්නෙමි. තී වනාහි අද එකදවසක් යම්කිසි තැනක වාසය කරවයි යි මෙසේ සීලාදි ගුණයෙන් යුක්ත වූයේ භය, භය අරමුණු ඉවසන්නේ වෙයි. එහෙයින් තමා මෙබඳු වූවෙක් කොට කැමැත්තහු විසින් ශීලාදි ගුණ යුක්ත වූවෙක්ම විය යුතුයයි දක්වන සේක.

සත්වන වාරයෙහි ආභිචෙතසිකානං, අභිචෙත නම් ඉතා අභික්කන්ත වූ (මනවඩන) විසුද්ධ වූ චිත්තය අධිචිත්තය යයි කියනු ලැබේ. විසුද්ධ චිත්තයෙහි ඇතිවූවාහු, අභිචෙතසික නම් වේ. දිට්ඨ ධම්ම සුඛ විහාරානං, ඉහාත්මයෙහි සැප විහරණ ඇති. දිට්ඨධම්ම යනුවෙන් ප්‍රත්‍යක්ෂ වූ ආත්මභාවය කියනු ලැබේ. එහි සැපවිහරණ වූයේය යන අර්ථයි. රූපාවචර ධ්‍යානයට මේ නමකි. ඒ රූපාවචර ධ්‍යානයට පැමිණ හුන්නාහු ධ්‍යානලාභීහු, මේ ආත්මභාවයෙහිම, පිරිසිදු වූ නෙක්ඛම්ම සැපය විඳිත්, එහෙයින් දිට්ඨධම්ම සුඛ විහාරානි යයි කියනු ලැබෙත්.

නිකාමලාභි, පහසුවෙන් ලබනසුලු වූයේ, තමාගේ කැමැත්ත පරිදි ලබනසුලු වූයේ, කැමති කැමති මොහොතෙහි සමවදින්ට සමර්ථ වූයේ යයි කියන ලද්දේ වෙයි.

අකිච්ඡලාභී සැපසේම විරුද්ධ ධර්මයන් විෂ්කම්භනය කොට සමවැදීමට සමර්ථයයි කියන ලද්දේ වෙයි. අකසිරලාභි, පීඩාවක් නොමැතිව මහත් ලෙස ලබනසුලු වූයේ, පරිච්ඡෙද කිරීම පරිදිම නැගී සිටීමට සමර්ථ වූයේ යයි කියන ලද්දේ වෙයි. ඇතැමෙක් ලාභී වූයේම වෙයි. එතකුදු වුවත් කැමති කැමති මොහොතෙහි සමවදින්ට නොහැකි වෙයි. කිසිවෙක් එසේ සමවදින්ට සමර්ථ වෙයි. උවදුරු දුකසේ දුරුකරයි. කිසිවෙක් එසේත් සමවදියි. උවදුරුද පහසුවෙන්ම විෂ්කම්භනය කරයි. නාලිකා (හෝරා) යන්ත්‍රයක් මෙන් සම්පූර්ණ වූ කල්හිම නැගීසිටින්ට නොහැකි වෙයි. යමෙක් වනාහි මෙම ත්‍රිවිධ සම්පත්තියම කැමති වේද, හෙතෙම ශීලයන්ව සම්පූර්ණ කරනසුලු වූයේ වන්නේය.

මෙසේ අභිඥා පාදක ධ්‍යානය කී කල්හි කිසි අයුරකින් අභිඥාවන්ගේ වාරය ආයේ ද, එතකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේ එය නොගෙන, යම්

හෙයකින් හුදෙක් අභිඥාපාදක ධ්‍යානයෝ ද, අභිඥාවෝ ද, ශීලයන්ගේ ආනිශංස නොවේද, වැලිදු සතර අරූපාවචර ධ්‍යානයෝද යටත් පිරිසෙන් තුන් ආර්යමාර්ගයෝ ද, ආනිශංසය වේද, එහෙයින් ඒ සියල්ල හාත්පසින් ගෙන දක්වන්ට **ආකංඛෙය්‍ය චෙ -පෙ- යෙ තෙ සනතා** යන ආදිය කීහ. එහි **සනතා** යනු අංගයන්ගේ ශාන්ත භාවයෙන් ද, ආරම්මණ ශාන්ත භාවයෙන් ද ශාන්ත වූයේ, විමොකඛා, විරුද්ධ ධර්මයන්ගෙන් මිදුනා වූ, අරමුණෙහි අධික ලෙස ඇලුනා වූ **අතිකකමම රූපෙ** යනු රූපාවචර ධ්‍යානයන් ඉක්මවා, **යෙ තෙ විමොකඛා අතිකමම රූපෙ සනතා** යනුවෙන් පද සම්බන්ධය වේ. සැබව අන්පරිද්දකින් වීනම්, රූපාවචර ධ්‍යානයන් ඉක්මවා කුමක් කෙරෙත්දැයි නොපෙනෙන්නාහුය. **ආරුප්පා** යනුවෙන් අරමුණු වශයෙන් විපාක වශයෙන් ද රූප විරහිත වූ **කායෙන ඵසසිතවා** නාමකයින් ස්පර්ශකොට පැමිණ, අධිගමකොට යයි කියන ලද වෙයි. සෙස්ස ප්‍රකටමැයි කියන ලදද වෙයි. යම්කිසි මහණ කෙනෙක් මෙම විමෝක්‍ෂයන් ස්පර්ශකොට වසනු කැමැත්තේ වේද, හෙතෙමේද සීලයෙහිම සම්පූර්ණ කළ කෙනෙක් වන්නේය.

නවවන වාරයෙහි, **තිණණං සංයොජනානං** යනු සකකාය දිට්ඨි, විචිකිචඡා, සීලබබතපරාමාස නම් වූ බන්ධනයන් තුන, යම්හෙයකින් ඔවුහු බනධ-ගති-භව ආදීන් සමග, බන්ධ-ගති-භව ආදීහුද කර්මය හෝ ඵලය සමග යොදවත්ද, එහෙයින් සංයෝජනයෝ යයි කියනු ලැබෙත්. බන්ධනයෝය යන අර්ථයි. **පරිකඛයා,** නැති කිරීමෙන්, **සොතපනෙනා** යනු සෝතයට පැමිණියේ සොත යනු මාර්ගයට නමකි. සොතාපනෙනා යන මාර්ග මොහොතෙහි පුද්ගලයා සොත නම් වේ. **සොතො, සොතොති හිදං සාරිපුතත වුචචති කතමොනුඛො සාරිපුතත සොතොති. අයමෙව හි භනෙත අරියො අට්ඨංගිකො මගෙගා සෙය්‍යථීදං සමමදිට්ඨි -පෙ- සමමා සමාධි, සොතාපනෙනා, සොතාපනෙනාති හිදං සාරිපුතත වුචචති, කතමො නුඛො සාරිපුතත සොතාපනෙනාති, යොහි භනෙත ඉමිනා අට්ඨංගිකෙන මගෙගන සමනනාගතො අයං වුචචති සොතාපනෙනා සො යමායසමා, එවං නාමො එවං ගොතෙතා ති**

(ශාරිපුත්‍රය, සොත සොත යයි කියනු ලැබේ. ශාරිපුත්‍රය, සෝත නම් කවරේදැයි ස්වාමීනි, මේ අරිඅටඟි මගමැයි. ඒ කවරේද යත්, සමමාදිට්ඨි -පෙ- සමමා සමාධි යන මොහුයැ. ශාරිපුත්‍රය, සෝතාපන්නය, සෝතාපන්නයා යනුවෙන් කියනු ලැබේ. ශාරිපුත්‍රය, කවරෙක් වනාහි

සෝතාපන්න වූයේද? ස්වාමීනි යමෙක් වනාහි මෙම අරිඅටඟි මගින් යුක්ත වූයේද? මෙතෙම සෝතාපන්න යයි කියනු ලැබේ. ඒ මේ ආයුෂ්මත් තෙම, මෙනම් ඇත්තේ මෙනම් ගෝත්‍ර ඇත්තේ වේයයි)

මෙහි වනාහි මාර්ගයෙන් ඵලයට නාමය දෙන ලදී. එහෙයින් ඵලස්ථ වූයේ සෝතාපන්න යයි දතයුතුය.

අවිනිපාතධම්මො නපුරුකොට (අපාය ආදියෙහි) වැටෙත්නුයි විනිපාත නම් වේ. ඔහුට විනිපාත ධර්ම නැත්තේනුයි අවිනිපාතධම්ම නම් වේ. තමා අපායයන්හි නො උපදවන ස්වභාව ඇත්තේ යයි කියන ලද්දේ වෙයි. කුමක් හෙයින්ද යත්, අපාය ගාමිනී වූ යම් ධර්ම කෙනෙක් වෙත්ද, ඒ ධර්මයන් ප්‍රහීණ වූ බැවිනි. සම්බෝධිය උතුම් වූ මාර්ගයි වූයේ උතුම් වූ ගතිය වූයේ මොහුට නුයි සමෙබාධි පරායනො නම් වේ. මතු තුන්මගට අවශ්‍යයෙන්ම පැමිණෙන්නේය යන අර්ථයි. කුමක් හෙයින්ද යත්, ලබන ලද පළමු මග ඇති බැවිනි. සීලසෙසව මෙවැන්නක් සිදුවීමට සීලය සම්පූර්ණ කරන සුලුවූයේම වන්නේ යයි (දතයුතුයැ)

දසවන වාරයෙහි, පළමු මගින් නැසූ සංයෝජන තුනද සකදාගාමී මාර්ගයාගේ ගුණ කථනය සඳහා කියන ලද්දාහු වෙති. රාග දෝස මෝහානං තනුත්තා යන මොවුන්ගේ තුනීභාවයෙන් තුනී බව කිරීමෙන් යයි කියන ලද වෙයි. එහි කරුණු දෙකකින් තුනී බව දතයුතුයි. හේතු රහිතව ඉපදීමෙන් ද, පරියුට්ඨාන (නැගී සිටීම) මදබැවින්ද යනුයි. සැබෑව සකදාගාමී පුද්ගලයා හට සංසාරික මහජනයාට මෙන් කෙලෙසයෝ නිතර නො උපදිති. ඇතැම්විටෙක උපදිත්. ඉතා විරලාකාරව තුනීව වපුරන ලද කෙත ගොයම් මෙනි. යලි උපදින්නාහුද වට්ටගාමී සත්ත්වයන්ට මෙන් මඩිමින් පැතිරෙමින් වියමින් අන්ධකාර කරමින් නො උපදිත්, මද මදව උපදිත්, තුනී ආකාරව වලාපටලයක් මෙන් මැසි පියාපතක් මෙන්ද උපදිත්.

එහි (කෙචි ථෙරා) කිසි තෙරකෙනෙක් මෙසේ කියති. සකදාගාමී පුද්ගලයාගේ කිලේසයෝ නිතර නො උපදිත්. කිසිවිටක කලකින් උපදිත්. බහුල වූවාහුම උපදිත්. ඒ එසේමැයි. ඔහට පුත්‍රයෝ ද දුහිතෘහු ද දක්නා ලැබෙත් යයි, මේ වනාහි අප්‍රමාණයි. යම්හෙයකින් පුත්‍රදුහිතෘහු අඟපසඟ පරාමර්ෂණ මාත්‍රයකිනුත් වෙත්ද, එහෙයිනි. හේතු රහිතව ඉපදීමෙන්ද

සමුදාචාරයාගේ (නැගීසිටීම) මද බැවින්දැයි මේ දෙකරුණකින් ඔහුගේ කිලේසයන්ගේ තුනී බව දතයුතුයි. සකදාගාමී වරක් පැමිණෙන ස්වභාව ඇත්තේ සකිදෙව ඉමං ලොකං ආගනත්වා එක්වරක් මේ මිනිස්ලොවට පටිසන්ධි වශයෙන් පැමිණ, යමෙක් වනාහි මෙහිද සකදාගාමී මාර්ගය වඩා, අනතුරුව මෙහිම පිරිනිවේද, හෙතෙමේත් මෙහි නොගන්නා ලදී. යමෙක් මේ ලෝකයෙහි මාර්ගය වඩා දෙව්ලොව ඉපිද එහි පිරිනිවේද, යමෙක් දෙව්ලොව මාර්ග වඩා එහිම පිරිනිවේ ද, යමෙක් දෙව්ලොව මාර්ග වඩා මේ මිනිස් ලොව ඉපිද පිරිනිවේ ද, හෙතෙමේත් නොගන්නා ලදී. යමෙක් වනාහි, මේ ලෝකයෙහි මාර්ග වඩා දෙව්ලොව උපන්නේ, එහි ආයුෂ ඇතිතාක් සිට නැවත මේ ලෝකයෙහි ඉපිද පිරිනිවේද, මෙතෙම මෙහි ගන්නා ලදැයි දතයුතුයැ. දුක්ඛස්සන්තං කරෙය්‍ය, වට්ට දුක්ඛයාගේ අන්තය පිරිසිඳ දැනීම කරන්නෙමි. සීලෙස්වෙව මෙවන් තත්වයකට පත්වනු කැමැත්තහු විසින් සීලයාගේ පරිපූරකාරී වන්නේ යයි (දතයුතුයැ).

එකළොස්වන වාරයෙහි, පඤ්චන්නං යනු ගණන පරිච්ඡේද කිරීමයි. ඔරං භාගියානං, ඔරං යනු යට කියනු ලැබේ. යට භජනය කරන්නා වූ යන අර්ථයි. කාමාවචර දිව්‍ය ලෝකයෙහි උපතට හේතු වේ යනු මෙහි අදහසයි. සංයොජනානං බන්ධනයන්ගේ, ඒවා කාමරාග, ව්‍යාපාද සංයෝජනයන් සමග කලින් කියන ලද සංයෝජනයන්ම දතයුත්තාහ. ඒ එසේමැයි. යමෙකුගේ එම සංයෝජනයෝ අප්‍රහීණ වූවාහු වෙත්ද, හෙතෙම යම් හෙයකින් භවාග්‍රයෙහි උපන්නේ වේද, එතකුදු වුවත් හෙතෙම ආයු ගෙවීමෙන් කාමාවචරයෙහි උපදීමැයි. මේ පුද්ගල තෙම ගිලින ලද බිලිය ඇති මසුට උපමා ඇත්තේ ද, දිග නූලකින් පා බඳිනා ලද පක්ෂියෙකුට උපමා ඇත්තේ ද, වේ යයි දතයුතුයැ.

ඕපපාතිකො මෙය සෙසු යෝනි ප්‍රතික්ෂෙප කිරීමේ වචනයකි. තත්‍ථ පරිනිබ්බායි යනු එම බඹලොවෙහිම පිරිනිවන්පායි. අනාවත්ති ධම්මො තස්මා ලොකා යනු බඹලොවින් පටිසන්ධි වශයෙන් නැවත නොඑන ස්වභාව ඇත්තේ, සීලස්වෙව මෙබන්දෙක් වන්නට කැමැත්තේ නම් සීලයම සම්පූර්ණ කරන්නේය යනුයි.

මෙසේ අනාගාමී මාර්ගය වදාල කල්හි, යම් හෙයකින් සතරවෙනි මාර්ගයට වාරය ආයේද, එතකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේ එය

නොගෙනම, යම්හෙයකින් ආසවක්ඛය, අභිඤ්ඤා, තොමෝම සීලයාගේ ආනිශංස නොවේද, යලිදු ලෞකික පඤ්ච අභිඤ්ඤා ද ආනිශංස වේද, තව ද ඔවුන් ද දක්වන්නට ද, තවද යම්හෙයකින් ආසවක්ඛය වදාළ කල්හි දේශනාව නිමවූවා වන්නේ ද, එහෙයින් අභිඥාවන් සම්පූර්ණ කොට දේශනාව කරනු පිණිස ද, තව ද අනාගාමී මාර්ගයෙහි සිටියිහුට සමාධිය උවදුරු වූ කාමරාග, ව්‍යාපාදයන් සහමුලින් නැසූ බැවින් පහසුවෙන් ඉද්ධි විකුර්වණං සමෘද්ධ වේද, යම් හෙයකින් අනාගාමී තෙම සීලයෙන් ද, සමාධියෙන් ද, සම්පූර්ණ කරන සුලු වේද, එහෙයින් සුදුසු ස්ථානයෙහි ලෞකික අභිඥාවන් දක්වනු පිණිස ද, **ආකංඛෙය්‍ය චෙ -පෙ- අනෙකවිහිතං ඉද්ධිවිධං** යන ආදි නයින් ආවා වූ පංචවිධ අභිඥාවන්ගේම භාවනා ක්‍රමය සමග පාලි වර්ණනාව විසුද්ධි මාර්ගයෙහි කියන ලද්දීය.

සවන අභිඥාවෙහි **ආසවානං ඛයා** රහත් මගින් සියලු කෙලෙස් ප්‍රහීණ කිරීමෙන්, **අනාසවං** ආසව රහිත, **චෙතො විමුත්තිං පඤ්ඤා විමුත්තිං** මෙහි චෙතො යන පදයෙන් රහත්ඵල සම්පයුත්ත සමාධිය ද, පඤ්ඤා යන පදයෙන් ඒ හා යෙදුන පඤ්ඤාව ද කියන ලද්දීය. එහි සමාධිය රාගයෙන් මිදුන බැවින් චෙතො විමුත්ති නම් වේ. ප්‍රඥාව අවිද්‍යාවෙන් මිදුන බැවින් පඤ්ඤා විමුත්ති යයි දතයුතුයැ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ ද වදාරණ ලදී. **යො හිසස භික්ඛවෙ සමාධි තදසස සමාධින්ද්‍රියං යාහිසස භික්ඛවෙ පඤ්ඤා තදසස පඤ්ඤින්ද්‍රියං ඉති ඛො භික්ඛවෙ, රාග විරාගා චෙතො විමුත්ති, අවිජ්ජා විරාගා පඤ්ඤා විමුත්ති** යුයි. සමථයාගේ ඵලය චෙතො විමුත්ති යයි. විදර්ශනාවගේ ඵලය පඤ්ඤා විමුත්ති යයි. දතයුත්තීය. **දිට්ඨෙව ධම්මෙ** මේ අත්බැව්හිම, **සයං අභිඤ්ඤා සච්ඡි කත්වා** තමා විසින්ම ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කොට, පරප්‍රත්‍යය නැතිව දැන යන අර්ථයි. **උපසම්පජ්ජ විහරෙය්‍ය**, පැමිණ සපයාගෙන වාසය කරන්නෙමි. **සීලෙසෙවච** මෙසේ සියලු ආසව ධර්ම කම්පාකොට හැර චෙතො විමුත්තියට ද, පඤ්ඤා විමුත්තියට ද පැමිණෙන්නට කැමැත්තේද සීලයම සම්පූර්ණ කළයුතු වන්නීය.

මෙසේ බුදුරදහු ශීලානිශංස කථාව රහත් බව තෙක් වදාරා ඒ සියලුම ශීලානිශංස කථා හකුලා දක්වන සේක් නිගමනය වදාළහ. **සම්පන්න සීලා භික්ඛවෙ, -පෙ- ඉදමෙතං පටිච්ච වුත්තං** යනු එහි සංක්ෂෙප අර්ථයයි. 'මහණෙනි, සීලයෙන් සම්පූර්ණව වාසය කරවු, -පෙ- ශික්ෂාපදයන් අතුරෙන් ඒ ඒ ශික්ෂාපදය මොනවට ගෙන හික්මෙව් යයි **ඉති යන්තං වුත්තං** ඒ

යමක් මවිසින් මෙසේ කියන ලදද, ඒ සියල්ල සීලයෙන් සපිරි මහණ සබ්‍රම්සරුන්ගේ කැමති බව, මනාප බව ගරු බව සම්භාවනා කටයුතු බව පිණිස වූයේ, සිවුපස ලැබීම පිණිස දායකයන්ට මහත්ඵල ගෙනදෙන්නේද, (වෙයි) පෙර ඥාතීන් සිහිකිරීම පිළිබඳ චේතනාවට ඵල මහත් තත්වය ඇතිකරන්නේද, (වෙයි) (එසේම) අරති-රති ඉවසන්නේ භයභේරවයන් ඉවසන්නේ, රූපාවචර, අරූපාවචර ධ්‍යානයන් ලබනසුළු වූයේ යටත් පිරිසෙන් තුන් සමණ ඵලයන් පංච ලෞකික අභිඥාඥා, ආසවක්ඛය ඥාණය යන මේ ගුණයන් ද තෙමේ විසිටය ඥාණයෙන් පසක් කරන්නේ වෙයි. මේ සඳහා කියන ලද්දේ යයි දතයුතුයැ.

**ආකංඛෙය්‍ය සූත්‍ර වර්ණනාව නිමි.**

## 1-1-7

**එවං මෙ සුතං,** යනු වත්ථ සූත්‍රයයි. එහි **සෙය්‍යථාපි භික්ඛවෙ වත්ථං** යනුවෙන් මහණෙනි, වස්තරයක් යම්සේ ද, මේ උපමා වචනයකි. උපමාව ප්‍රකාශ කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ කිසිතැනෙක්හි උපමාව පළමුකොට දක්වා පසුව අර්ථය දක්වන සේක. කිසිතැනෙක්හි පළමුකොට අර්ථය දක්වා පසුව උපමාව දක්වයි. කිසිතැනෙක්හි උපමාවෙන් අර්ථය පිරිවරා දක්වති. කිසිතැනෙක්හි අර්ථයෙන් උපමාව පිරිවරකොට දක්වති. ඒ එසේමැයි. භාග්‍යවතුන් වහන්සේ,

**සෙය්‍යථාපසසු භික්ඛවෙ, දෙව අගාරා සදවාරා තත්‍ථ චක්ඛුමා පුරිසො මජ්ඣෙ ඨිතො පසෙසය්‍ය** යනුවෙන් සියලුම දේවදූත සූත්‍රය උපමාව පළමුකොට දක්වා පසුව අර්ථය දක්වා වදාළහ.

**තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ** යන මේ ආදි නයින් සියලු ඉද්ධිවිධි, අර්ථය පළමුකොට දක්වා පසුව උපමාව දක්වමින් වදාළහ.

සෙය්‍යථාපි බ්‍රාහමණ, පුරිසො සාරත්ථිකො සාරගවෙසි යනාදි ක්‍රමයෙන්ම සියලු චූල සාරොපම සූත්‍රය උපමාවෙන් අර්ථය පිරිවරකොට වදාළහ.

ඉධපන භික්ඛවෙ, එකචෙච කුලපුත්තා ධම්මං පරියාපුණන්ති සුත්තං -පෙ- සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො අලගද්දත්ථිකො, යනාදි ක්‍රමයෙන් වනාහි සියලුම අලගද්ද සූත්‍රය. මහාසාරොපම සූත්‍රය යන මේ සූත්‍රයන් අර්ථයෙන් උපමාව පිරිවරකොට දක්වමින් වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ මෙහි පළමුකොට උපමාව දක්වා පසු අර්ථය දක්වන සේක. කුමක් නිසා භාග්‍යවත්හු මෙසේ දක්වන සේක් ද යත් පුද්ගලාධ්‍යාසය වශයෙන් හෝ වෙයි. දේශනා විලාසයක් වශයෙන් හෝ වෙයි. එය එසේමය.

යම්කිසි පුද්ගල කෙනෙක් පළමුකොට උපමාව දක්වා, කියනු ලබන අරුත පහසුවෙන් අවබෝධ කෙරෙත් ද, ඔවුනට පළමුකොට උපමාව දක්වති. සියලු තන්හිම (අරුත්) මේ ක්‍රමයමැයි.

යම් ධර්ම ධාතුවක් වේද, එය මනාකොට අවබෝධ කළ හෙයින් එසේ හෙයින් මෙම දේශනා විලාසයන්ට, පත් ධම්මිස්සර වූ ධම්මරාජ වූ ඒ භාග්‍යවත්හු යම් යම් පරිදි කැමැති වේද, එපරිද්දෙන් ධර්මදේශනා කෙරෙත් යයි. පුද්ගල අධ්‍යාශය වශයෙන් හෝ දේශනා විලාස වශයෙන් හෝ මෙසේ දක්වන්නේ යයි දතයුතු යැ.

එහි, වත්ථං පියවි පිරිසිදු වස්ත්‍රයක්, සංකිලිට්ඨං මලග්ගහිතං බාහිර වූ පස් ධූලි ආදියෙන් කිලිටි වූ දහදිය දැලි ආදි මලයෙන් ගන්නා ලද බැවින් (මලග්ගහිත) මලගන්නා ලද, රංගජාතෙ, මෙහි රංගයම රංගජාත නම් වේ. උපසංහරෙය්‍ය එළවන්නේ නම්, යදිනීලකාය, නීල වර්ණය පිණිස යයි කියන ලද්දේ විය. සියලු තන්හි මෙසේය. ඒ එසේමැයි. රදාතෙම, නිල්පැහැය පිණිස (සායම්) යොදන්නේ ලොහො නිල, පලාවග නිල, ආදී වූ නිල් පැහැයෙන් පෙන්වයි. පීත (කහ) වර්ණය පිණිස යොදන්නේ කිණිහිරි මල සමාන වූ කසාවන් පැහැයෙන් ද ලෝහිත වර්ණය පිණිස යොදන්නේ බඳු වදමල් සමාන වූ රත් පැහැයෙන් ද, මදට පැහැය පිණිස යොදන්නේ කණේරුමල් සමාන වූ මද රත් පැහැයෙන් ද, පෙනේ. එයින් කියන ලදී.

යදි නීලකාය, යදි පීතකාය, යදි ලොහිතකාය යදි මඤ්ජෙට්ඨකාය යයි දුරතත වණ්ණමෙවස්සා නපුරුකොට රඳනා ලද්දක්ම වන්නේය. අපරිසුද්ධ වණ්ණ මෙවස්සා ඒ වස්ත්‍රයාගේ නිල් පැහැයද සෙසු පැහැයන්ද, පිරිසිදු නො වන්නේය. සැබව, එබඳු වස්තරය නිල්සායම් බඳුනේ බහාලන ලද්දේ නමුදු මනා නිල්පැහැයක් නො වෙයි. සෙසු පීතකාදි බඳුන්හි බහාලන ලද්දේ ද, මනා වූ පීතාදි වර්ණයන් නො වෙයි. මලානික වූ, නිල් කටුකරඬු, කිණිහිරි බඳුවද කණේරු මල් මෙන් වූයේම වෙයි. තංකිස්ස හෙතු, එම වස්ත්‍රය කවර හේතුවක් නිසා කවර කාරණයක් නිසා, මෙබඳු වීද, එම වස්ත්‍රයෙහි එම රංගජාතය කවර හේතුවක් නිසා මෙබඳු දුර්වර්ණයක් අපිරිසිදු වර්ණයක් වීද යත්, යම් හෙයකින් වස්ත්‍රයාගේ කිලිටිභාවය මය. අන් කිසිදු කරුණක් නිසා නොවේ.

එහෙයින් අපරිසුද්ධතතා භික්ඛවෙ, වත්ථස්ස යයි වදාළහ. එවමෙව යනු උපමාව ඉදිරිපත් කිරීමයි. චිතෙත සංකිලිට්ඨෙ චිත්තයාගේ කිලිටි බවක් ඇතිකල්හි කවර හෙයකින් භාග්‍යවතුන් වහන්සේ කිලිටි වස්ත්‍රයකින් උපමාව කළේද යත්, උත්සාහයාගේ ප්‍රතිඵලය දැක්වීම පිණිසයි. යම්සේ අමුතුවෙන් පැමිණි කිලිටිවලින් කිලිටි වූ වස්ත්‍රය පියොවින්ම පඬුවන් පැහැ ඇති බැවින්, නැවත සෝදන්නේද, පඬුවන් පැහැයම වේ. එහි උපතින්ම කළු වූ එළු ලොමෙහි මෙන් ව්‍යායාමය නිෂ්ඵල වූයේ නොවේද, එසේ සිතද, ආගන්තුක වූ කෙලෙසුන්ගෙන් කිලිටි වූයේ, ස්වභාවයෙන්ම එය සියලුම පටිසන්ධි භවාංග වාරයෙහි, පඬුවන් වූයේම වෙයි. වදාළේමය.

**පභස්සරමිදං භික්ඛවෙ, චිත්තං තඤ්චඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං**

(මහණෙනි, මේ භවාංග චිත්තය පිරිසිදුය. එය ආගන්තුක වූ උපක්ලේශයන්ගෙන් කිලිටි වෙයි.) එය පිරිසිදු කරනු ලබන්නේ පිරිසිදු කළ හැකිය. ඒ සඳහා වූ උත්සාහය නිෂ්ඵල නොවේ. මෙසේ උත්සාහයාගේ සඵල බව දැක්වීම පිණිස කිලිටි වස්ත්‍රයෙන් උපමාව කළේයයි දතයුතුයැ.

**ද්විධ දුගති**

දුග්ගති පාටිකංඛා මෙබඳු (කිලිටි) සිත ඇතිකල්හි දුගතිය කැමතිවිය යුත්තීය. දුගතියටම මෙතෙම පැමිණෙන්නේය. අන් තැනකට නො පැමිණේ. මෙසේ දුගතියම කැමතිවිය යුත්තීය. අවශ්‍යයෙන්ම විය

යුත්තක් යයි කියන ලද්දේ වෙයි. ඕ දුගති තොමෝ පටිපත්ති දුග්ගති, ගති දුග්ගති ය යනුවෙන් ද්විධ වන්නීය. පටිපත්ති දුගති තොමෝ ද ආගාරිය පටිපත්ති දුග්ගති, අනගාරිය පටිපත්ති දුග්ගති යනුවෙන් ද්විධ වන්නීය. ඒ එසේමැයි. අගාරික තෙමේ, අපිරිසිදු සිතින් ප්‍රාණීන් නසයි, සොරකම් කරයි, සියලු දස අකුසල කර්මපථය සපුරයි. මේ ඔහුගේ අගාරි පටිපත්ති දුග්ගතිය නම් වන්නීය. හෙතෙම එහි සිටියේ කය බිඳීමෙන් (මරණින් මතු) නිරයට (උත්පත්ති වශයෙන්) පැමිණෙයි. තිරිසන් ලෝකයටද, ප්‍රේත ලෝකයටද යයි, මේ ඔහුගේ දුග්ගති ගතිය නම් වේ.

අනගාරික තෙමේ ද, සසුනෙහි පැවිදි වූයේ, කිලිටි සිත් ඇත්තේ, දූත භාවයෙන් යවන ගමනට යයි ද, වෙදකම් කෙරේ ද, සංඝභේදය පිණිස චෛතිය භේදය පිණිස, උත්සාහ කෙරේද, වෙළු දානාදියෙන් ජීවිකාව කෙරේ ද, සියලුම අනාචාරයත් අගෝචරයත් සම්පූර්ණ කෙරේද, මේ ඔහුගේ අනගාරිය පටිපත්ති දුග්ගතියයි, හෙතෙම එහි සිටියේ, මරණින් මතු අපායෙහි උපදියි. තිරිසන් යෝනියෙහිද, ප්‍රේත විෂයෙහිද උපදියි. ශ්‍රමණ යක්ෂ නම් වූ ප්‍රේතයෙක් වෙයි. ඇවිලගත් සගල සිවුරු ආදියෙන් යුත ගිනිගෙන දිලියෙන සිරුරු ඇතිව, මහත් වූ ශබ්ද කරමින් හැසිරෙයි. මේ ඔහුගේ ගති දුගතියයි.

සෙය්‍යථාපි යනුවෙන් කුසල පක්ෂය දැක්වීම ආරම්භ කරන ලද්දේ වෙයි. එහි අර්ථය, අකුසල පක්ෂයෙහි කියන ලද්දට විරුද්ධ ක්‍රමයෙන් දතයුතුයැ. මෙහිදු සුගතිය වනාහි, පටිපත්ති සුගති, ගති සුගති යයි ද්විධ වන්නීය. පටිපත්ති සුගතිය ද අගාරිය පටිපත්ති සුගති, අනගාරිය පටිපත්ති සුගති යයි ද්විධ වන්නීය. අගාරික (ගිහි) තෙම පිරිසිදු සිතින් යුතුව ප්‍රාණඝාතයෙන් වළකියි. සොරකමින් වලකියි. සියලු දසකුසල කර්මපථය සම්පූර්ණ කරයි. මේ ඔහුගේ අගාරිය පටිපත්ති සුගතියයි. හෙතෙම එහි පිහිටියේ, මරණින් මතු උසස් මිනිසත් බැව්ද උසස් දෙව් බැව්ද, ලබයි. මේ ඔහුගේ සුගති ගතියයි.

පැවිදි තෙමේ ද මේ ශාසනයෙහි, පැවිදිව, පිරිසිදු සිත් ඇත්තේ, සිව්පිරිසිදු සිල් පිරිසිදු කෙරෙයි. තෙලෙස් ධූතාංගයන් සමාදන් වෙයි. අටතිස් අරමුණු අතුරෙහි තමන්ට අනුරූප වූ කමටහනක් ගෙන වන සෙනසුන් ඇසුරු කරමින් කසිණ පරිකර්ම කොට ධ්‍යාන සමවත් උපදවයි. සෝවාන්මග වඩයි. අනාගාමි මග වඩයි. මේ ඔහුගේ අනගාරිය පටිපත්තිවල

සුගතියයි. හෙතෙම එහි සිටියේ මරණින් මතු මනුෂ්‍ය ලෝකයෙහි තුන්මහ කුලවල හෝ සවැදෑරුම් කාමාවචර දේවලෝකවල හෝ දසවිධ බ්‍රහ්ම ලෝකයෙහි හෝ, පඤ්ච සුද්ධාවාසයෙහි හෝ සතර අරූපාවචර ලෝකවල හෝ උපදියි. මේ ඔහුගේ ගති සුගතියයි. මෙසේ අපිරිසිදු සිත ඇතිකල්හි දුගතිය කැමතිවිය යුත්තාහුය. පිරිසිදු සිත් ඇතිකල්හි සුගතිය කැමතිවිය යුත්තාහුයයි කියා, මෙවිට මේ උපක්ලේශයක් හේතුකොට සිත කිලුටු වූයේ වේද, ඔවුන් දක්වන්නේ **කතමෙච භික්ඛවෙ චිත්තසස උපක්කිලෙසා අභිජ්ඣා විසමලොභො** යනාදිය වදාළහ.

එහි තමන් සතු දේවල ඡන්දරාගය අභිජ්ඣා නම් වේ. අනුන් සතු දෙයට ඇති ඡන්දරාගය විෂම ලෝභ නම් වේ. නැතහොත්, තමන්ගේ බඩු පිළිබඳව හෝ අනුන්ගේ බඩු පිළිබඳව හෝ සුදුසු අයුරින් ලැබූ කල්හි එහි ඡන්දරාගය අභිජ්ඣා නම් වේ. නුසුදුසු අයුරින් ලැබූ කල්හි, එහි ඡන්දරාගය විසම ලෝභ නම් වේ. තෙරුන් වහන්සේ වනාහි කීහ. කුමක් හෙයින් කොටස් කරවුද, යුත්ත හෝ වේවා, අයුත්ත හෝ වේවා, **රාගො විසමං දොසො විසමං මොහො විසමං** යයි වදාළ හෙයින් කිසි ලෝභයක් විෂම නොවූයේ නොවෙයි. එහෙයින් මෙම ලෝභයම අභිමුඛ කොට සිතීම් අර්ථයෙන් අභිජ්ඣා වේ. විෂම අර්ථයෙන් විෂමය. මෙහි අර්ථය සමානයි. ව්‍යඤ්ජන පමණකිම වෙනස්ය. ඒ, මේ, අභිජ්ඣා විෂම ලෝභය ඉපිද, සිත දූෂ්‍ය කෙරෙයි. බබලන්ට නොදෙයි. එහෙයින් චිත්තයාගේ උපක්කිලෙසයකැයි කියනු ලැබේ.

මේ අභිජ්ඣා විසම ලෝභය යම්සේ ද, එසේම නවවිධ අඝාත වස්තුවෙන් හටගත්තේ කොධ නම් වේ.

නැවත නැවත සිත හාත්පසින් බඳනේ උපනාහ නම් වේ. (=බද්ධ වෛරයයි) ගිහියාගේ හෝ පැවිද්දාගේ හෝ කළ හොඳ නසන්නේ මක්ඛ නම් වේ. ඒ එසේමැයි. අගාරික තෙම කිසිවෙකු විසින් අනුකම්පා කොට, ඔහුව දිළිඳු බැවින් නගාසිටුවන ලද්දේද, (උසස් තන්හි තබන ලද්දේද) මෑත කාලයෙහි තා විසින් මට කුමක් කරන ලදදැයි මෙසේ ඔහුගේ කළ ගුණය නසයි. අනගාරිය තෙමේද, තමා සාමණේර අවදියේ පටන් ආචාර්යවරයා විසින් හෝ උපාධ්‍යායවරයා විසින් හෝ සිවුපසයෙන් ද, උද්දේශ පරිපුච්ඡාවෙන් ද, අනුග්‍රහ කොට, ධර්මකථාවෙහි හා ප්‍රකරණයන්හි දක්ෂ භාවයෙහි හෝ හික්මවන ලද්දේ ද, මෑත කාලයෙහි රාජරාජ මහා

මාතෘාදීන් විසින් සත්කාර කරන ලද්දේ ගරුකාර කරන ලද්දේ ආචාර්ය උපාධ්‍යායයන් කෙරෙහි අනාදරව හැසිරෙන්නේ මෙතෙම අප විසින් තරුණ කාලයෙහි මෙසේ අනුග්‍රහ කරන ලද්දේ ද වර්ධනය කරන ලද්දේ ද, වෙයි. එසේ වුවත් දැන් සෙනෙහෙ රහිත වූයේ යයි කියනු ලබන්නේ මට තොප විසින් කුමක් කරන ලදදැයි ඔවුන්ගේ එම යහපත් උපකාරය විනාශ කරයි. මෙසේ මේ කළ හොඳ දෙය නසන්නා වූ (මක්ඛය) මකුබව ඉපිද සිත දූෂ්‍ය කරයි. බබලන්ට නොදෙයි. එහෙයින් චිත්තයාගේ උපක්ලේශයකැයි කියනු ලැබේ.

මේ මකුබව යම්සේද, එසේම බහුසසුත පුද්ගලයන් යටපත්කොට ඉදින් මෙබඳු වූ බහුසසුතයාට අනියත වූ ගතිය වී නම්, තට හෝ මට කවර විශේෂයක්දැයි උපදනා වූ යුගග්‍රාහය **පළාස** නම් වේ.

අනුන්ගේ සත්කාර ආදියට රුචි නොකරන බව **ඉසසා** නම් වේ.

තම සම්පත් අනුන්ගේ සම්පත් සමග සාධාරණ බව නොඉවසීම මච්ඡරිය නම් වේ.

වංචනික ලෙස හැසිරීම මායා නම් වේ. කෛරාටික භාවයෙන් උපදිනු ලබන්නේ සඨෙය්‍ය නම් වේ. කපටියා වනාහි ආනන්ද නම් මත්ස්‍යයා මෙන් වේ. ආනන්ද මත්ස්‍යයා වූ කලී මත්ස්‍යයන්ට නකුටද, සර්පයන්ට හිසද දක්වයි. මම ද තොප හා සමාන යයි දක්වන්නට, එසේම මෙම කෛරාටික පුද්ගලයා ද, සුත්තන්තිකයන් වෙත හෝ ආභිධම්මිකයන් වෙත එළඹ ඔවුන්ට මෙසේ කියයි. මම ද තමුන්නාන්සේලා සමගම හැසිරෙමි. ඔබවහන්සේලා මට අනුකම්පා කරන්නෝය. මම තමුන්නාන්සේලාව අත්නොහරිමි. මෙසේ මොවුහු මෙතෙම අප කෙරෙහි ගෞරව සහිතය. (සප්පතිසය) ප්‍රධානියෙකු සහිතය යි සිතන්නාහු යයි කියායි. ඕහට කෛරාටික බැවින් උපදින සඨ බව ඇතිවී සිත දූෂ්‍ය කරයි. බබලන්ට නොදෙයි. එහෙයින් චිත්තයාගේ උපක්ලේශයකැයි කියනු ලැබේ.

මේ ශඨ බව යම්සේ ද, එසේ වාතයෙන් පිරුණු හම් පසුම්බියක් (භසතාවක්) සමාන වූ තද බැවින් දැඩිකොට ගන්නා ලද හිස නොපහත් කරනසුළු තද පැවැත්ම ථම්භ නම් වේ. කරන ලද්දට වැඩියක් කිරීම **සාරම්භ** නම්. ඒ සාරම්භය අකුසල වශයෙන් ද කුසල වශයෙන් දැයි

දෙපරිද්දකින් ලැබෙයි. ඒ කාරණා දෙක අතුරෙහි අගාරිකයාට අනුන් විසින් කරන ලද අලංකාර ආදිය දැක, ඊට දෙගුණයක්, කිරීමෙන් උපදනේද, අනගාරිකයාට යම්පමණ යම් පමණ මෙරමා ප්‍රගුණ කෙරේ ද කියා හෝ වේ ද, මාන වශයෙන් ඊට දෙගුණයක්, කිරීමෙන් උපදනේ ද, අකුසල වෙයි.

අගාරිකයාට එක් සලාක බතක් දෙන්නා වූ මෙරමා දැක තමා විසින් ද දෙකක් හෝ තුනක් හෝ දෙනු කැමති බැවින් උපදනේද,

අනගාරිකයා හට මෙරමා එක් නිකායක් ඉගෙන ගත් කල්හි, මානය නිසා නොව හුදෙක් දැක තමාගේ අලස බව මැඩ නිකාය දෙකක් ගනු කැමති බැවින් උපදනේ ද කුසල් වෙයි. මෙහි වනාහි අකුසල් අදහස් කරන ලදී. එය එසේමැයි. මේ සාරම්භය ඉපිද සිත දූෂ්‍ය කරයි. බබලන්ට ඉඩ නොදෙයි. එහෙයින් චිත්තයාගේ උපක්කිලෙසයකැයි කියනු ලැබේ.

මෙය යම්සේ ද එසේ ජාති ආදිය නිසා චිත්තයාගේ උන්නති වශයෙන් පවත්නේ මාන නම්. අති උන්නති වශයෙන් වූයේ අතිමාන නම් වේ. මද ග්‍රහණ ආකාර වූයේ මද නම්. කාමගුණයන්හි සිත බැස ගැනීම් වශයෙන් ඇතිවන්නේ පමාද නම් එය ඉපිද සිත දූෂ්‍ය කරයි. බබලන්ට ඉඩ නොදෙයි. එහෙයින් චිත්තයාගේ උපක්ලේශයකැයි කියනු ලැබේ.

උපක්ලේශයන් දක්වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ කුමක් හෙයින් ලෝභය ආදිකොට දක්වන ලද්දේ දැයි යත්, ඒ ලෝභයාගේ ප්‍රථම උපත සිදුවන බැවිනි.

සැබව, යම්කිසි තැනක උපන්නා වූ සියලු සත්ත්වයන්ට යටත් පිරිසෙන් ශුද්ධාවාස භූමියෙහි උපන්නවුන්ටද සියල්ලට පළමුව භවනිකාන්තිය වශයෙන් ලෝභය උපදී. අනතුරුව තමනට අනුරූප වූ ප්‍රත්‍ය සඳහා ලැබෙන පරිදි අන්‍ය වූ (ක්ලේශයෝ) උපදිති. මේ සොළොස් දෙනම චිත්තයාගේ උපක්ලේශයෝ නොවෙති. මේ ක්‍රමයෙන් වනාහි සියලුම කිලේශයෝ ගන්නා ලද්දාහු වෙත් යයි දත යුත්තාහුය. මෙතෙකින් සංකිලෙස දක්වා දැන් පිරිසිදු බව දක්වන්නාහු, ස ඛො සො භික්ඛවෙ, ආදිය වදාළහ. එහි ඉති විදිත්වා යනු මෙසේ දැන, පජහති, සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන් ආර්ය මාර්ගයෙන් ප්‍රහීණ කෙරෙත්.

කෙලෙස් ප්‍රහාණය

එහි ක්ලේශයන්ගේ පිළිවෙලින් මාර්ග පිළිවෙලින් යයි දෙවැදෑරුම් වූ ප්‍රහාණ දතයුතුය. පළමුකොට කෙලෙස් පිළිවෙලින්,

අභිජ්ඣා විසමලොභ, ථම්භ - සාරම්භ
මාන අතිමාන මද මෙ කෙලේසයෝ සයදෙන රහත් මගින් ප්‍රහීණ වෙයි.

ව්‍යාපාද - කෝධ, උපනාහ, පමාද මේ සතර
අනාගාමි මාර්ගයෙන් ප්‍රහීණ වෙයි.

මක්ඛ පලාස, ඉස්සා මච්ඡිරිය, මායා සාඨෙය්‍ය යන මෙම කෙලෙස් සය සෝතාපත්ති මාර්ගයෙන් ප්‍රහීණ වෙයි.

මාර්ග පිළිවෙලින්

සෝවාන් මාර්ගයෙන් - මක්ඛ - පලාස - ඉච්ඡා මච්ඡරිය
මායා සඨෙය්‍ය යන මේ කෙලේසයෝ සය ප්‍රහීණ වෙති.

අනාගාමි මාර්ගයෙන්,

ඛ්‍යාපාද, කෝධ, උපනාහ පමාද යන මේ සතර කෙලේසයෝ ප්‍රහීණ වෙත්.

රහත් මාර්ගයෙන්,

අභිජ්ඣා විසම ලෝභ, ථම්භ සාරම්භ මාන අතිමාන මද,
මේ සවැදෑරුම් කෙලේසයෝ ප්‍රහීණ වෙත්.

මෙහි වූ කලී මෙම කෙලේසයෝ සෝවාන් මගින් නැසිය යුත්තාහු හෝ සෙසු මගකින් නැසිය යුත්තාහු හෝ වෙත්වා එතකුදු වුවත් අනාගාමි මාර්ගයෙන්ම ප්‍රහාණය සඳහා අභිජ්ඣා විසම ලොභං චිත්තස්ස උපක්කිලෙසං පජහති යනාදිය වදාළහයි දතයුතුයැ.

මේ මෙහි ප්‍රවේණි මාර්ගාගත වූ සද්භාවයයි. එයද මත්තෙහි සතර මාර්ගය පිළිබඳවම, දැක්වූ හෙයින් යෙදෙයි. ඒ එසේමැයි. තුන්වෙනි මාර්ගයෙන් ප්‍රහීණ වීමෙන් අවශේෂ වූ විෂම ලෝභය ආදීන්ගේ ප්‍රහාණය එයින් වෙයි. සෙස්සන්ගේ ප්‍රහාණය මේ මාර්ගයෙන්ම වෙයි. යමෙකුන්

සෝවාන් මගින් ප්‍රහීණ වෙත්ද, ඔවුහුද, ඔවුන් උපදවන නයින් ප්‍රහීණ නොවූ බැවින් අනාගාමී මාර්ගයෙන්ම මනාකොට ප්‍රහීණ වූවාහු වෙත් යයි කිසි ආචාර්ය කෙනෙක් ප්‍රථම මාර්ගයෙන්ම මෙහි ප්‍රහාණය වර්ණනා කෙරෙති. එය පූර්වාපර හා නොගැලපෙයි. කිසිවෙක් විෂ්කම්භණ ප්‍රහාණ යයි කියති. එය ඔවුන්ගේ කැමති වීම් (පිළිගැනීම්) මාත්‍රයක් පමණි.

**යතො ඛො භික්ඛවෙ**, මෙහි **යතො** යනු යම්කලෙක්හි **පහීනො හොති** යනු අනාගාමී මාර්ගක්ෂණයෙහි ප්‍රහාණය සඳහාම වදාළහ.

**සො බුද්ධෙ අවෙච්චප්පසාදෙන යු** මෙය මහණෙනි, යම්කලෙක්හි, විෂම ලෝභය ප්‍රහීණ වූයේ ද හෙතෙම බුදුරදුන් කෙරෙහි -පෙ- අවෙච්ච පසාදයෙන් යුක්ත වේයයි මෙසේ එක එක පදය හා යෙදිය යුතුයැ.

මෙම භික්ෂුවට අනාගාමී මාර්ගය සමග ලෝකෝත්තර ප්‍රසාදය පැමිණියේය. ඊට පසු මෑත කාලයෙහි බුදුගුණ, දහම් ගුණ, සඟ ගුණ සිහි කරන්නා වූ ඕහට ලෞකික ප්‍රසාදය උපදී. ඔහුගේ ඒ සියලු ලෞකික ලෝකෝත්තර මිශ්‍ර වූ ප්‍රසාදය දක්වන්නා වූ බුදුරදහු, **බුද්ධෙ අවෙච්චප්පසාදෙන** යනාදිය වදාළහ.

එහි **අවෙච්චප්පසාදෙන** යනු බුද්ධ - ධම්ම - සංඝ ගුණයන්ගේ යථා ස්වරූප අවබෝධයක් ඇති හෙයින්, නිශ්චල වූ වෙනස් නොවන ප්‍රසාදයෙන්, මේ වනවිට යම් ආකාරයකින් සිහිකරන්නා වූ ඒ මහණ හට ඒ අචල වූ ප්‍රසාදය උපදනේද, ඒ වූ ආකාරය දක්වන සේක්, **ඉතිපි සො භගවා** යනාදි නයින් ත්‍රිවිධ අනුස්සති කරුණු විස්තර කළ සේක. ඔවුන්ගේ අර්ථ වර්ණනා සර්වප්‍රකාරයෙන් විසුද්ධි මාර්ගයෙහි අනුස්සති කථාවේ කියන ලද්දේය.

මෙසේ ඔහුගේ ලෞකික ලෝකෝත්තර මිශ්‍ර වූ ප්‍රසාදය දක්වා මේ වනවිට කෙලෙස් ප්‍රහාණයද අචල වූ ප්‍රසාදයෙන් යුක්ත බවද ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට උපදින සොම්නස ආදි ආනිශංස දක්වමින් **යතොපි ඛො පනස්ස** යනාදිය වදාළහ. ප්‍රත්‍යන්ත දේශයෙහි හටගත් සොර බිය සංසිඳුවා මහා නගරයෙහි වාසය කරන මහරජුට මෙන් අනාගාමී පුද්ගලයා හට, මගේ මේ මේ කිලේසයෝ ප්‍රහීණ වූවාහු යයි තම කිලේස ප්‍රහාණය ප්‍රත්‍යවේක්ෂා කරන්නේ, බලවත් සොම්නසක් උපදී. එය දක්වන්නා වූ බුදුරදහු **යතොපි ඛො පනස්ස** යනාදිය වදාළහ.

එහි අර්ථය නම්, යම් ඒ අනාගාමි මහණ කෙනෙක්, බුදුරදුන් කෙරෙහි අචල වූ පැහැදීමෙන් යුක්ත වූයේ වේද, ධර්මය කෙරෙහි, අනුත්තර වූ ලෝකයාගේ පින්කෙත වූ සංඝයා කෙරෙහි අචල වූ පැහැදීමෙන් යුක්ත වූයේ වේද, ඔහු විසින් එම කෙලෙස් යම්කලෙක්හි, අත්හරින ලද්දේ වේද, දුරලන ලද්දේ වේද, තම සීමාවන්ගේ වශයෙන් දුරලන ලද්දේම වේද, ඒ ඒ කෙලෙස් සමූහ වමනය කරන ලද්දේ මුදන ලද්දේ දුරලන ලද්දේ වෙයි.

ස්වකීය ස්වකීය අවධි වශයෙන් යනු කෙලෙස් අවධිය මාර්ග අවධිය යයි අවධීහු දෙදෙනෙක් වෙති.

ඒ අවධි දෙක අතුරෙහි කෙලෙස් අවධියෙන් ද යම් කෙලෙස් කෙනෙක් යම් මගකින් නැසිය යුත්තාහු ද ඔවුහු අන්මගකින් නැසියයුතු කෙලෙසුන් හා මිශ්‍ර නොවී, ස්වකීය අවධියෙන්ම (සීමාවෙන්ම) ප්‍රහීණ වූවාහු වෙති.

මාර්ග අවධි වශයෙන් ද යම් කෙලෙස් කෙනෙක් යම් හෙයකින් ප්‍රහීණ කළ යුත්තාහු ද ඒ මගින්ම ඔවුහු ප්‍රහීණ වූවාහු වෙති. මෙසේ ස්වකීය ස්වකීය සීමා (අවධි) වශයෙන් ඒ ඒ කෙලෙස් සමූහය හරින ලද්දේම දුරලන ලද්දේම වෙයි. එය මෙනෙහි කොට ලැබූ සොම්නස් ඇත්තේ එයින් මත්තෙහි ද බුදෙධ අවෙච්චප්පසාදෙන සමන්නාගතොම්හිති ලභති අත්‍ථවෙදං හෙතෙම බුදුරදුන් කෙරේ අචල ප්‍රසාදයෙන් යුක්ත වූයෙම් වෙමි යි අර්ථවේදය (අචල ප්‍රසාදය අරමුණුකොට උපන් සොම්නස) ලබයි කියා සම්බන්ධ වෙයි.

යතොධි ඛො යයි ද පාඨයි. ඒ පාඨයාගේ වශයෙන් මේ අර්ථය වෙයි. ඒ මහණ විසින් යම්හෙයකින් අවධිය වර්ජනය කරන ලද්දේ දුරලන ලද්දේ වේද, (කියායි) එහි යතො යනු කාරණ වචනයි. යම් හෙයකින් කියන ලද්දේ වේද, ඔධි යනුවෙන් යට තුන් මගම කියන ලද්දාහු වෙති. කුමක් හෙයින් ද යත්, යම්හෙයකින් ඒ තුන්මග සීමාකොට කොටස්කොට මතු මගින් ප්‍රහීණ කළයුතු කෙලෙසුන් තබා ප්‍රහීණ කෙරෙත්ද එහෙයින් ඔධි යයි කියනු ලැබෙත්.

රහත්මග වූ කලී කිසිදු කිලේසයක් ඉතිරි නොකොට දුරුකෙරෙයි.

එහෙයින් අනොධි යයි කියනු ලැබේ. මේ භික්ෂුව විසින් යට තුන් මගින් දුරුකරන ලද්දේ යථොධි බො පනවත්තං හොති යයි කියනු ලැබේ. එහි බො පන යනු නිපාත මාත්‍රයකි. මේ දක්වන ලබන්නේ පිඩු කරන ලද අර්ථයයි. යම්හෙයකින් ඔහු විසින් අවධිය හරින ලද්දේ දුරුකරන ලද්දේ වේද, එසේ හෙයින් එය ප්‍රත්‍යවේක්ෂා කොට ලැබූ සොම්නස් ඇත්තේ, එයින් මත්තෙහිද හෙතෙම බුදුරදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූයෙම් වෙම් යයි අත්ථවෙදය ලබයි කියා පෙළෙහි දැක්වූ පරිද්දෙන් සම්බන්ධය ගතයුතු වේ.

එහි චත්තං යන මෙය සකභාවය පරිත්‍යාග කිරීම් වශයෙන් කියන ලදී. චත්තං යන මෙය නැවත, නොගන්නා බව දැක්වීම් වශයෙන් ද, මුත්තං යන මෙය සන්තතියේ විදීම් වශයෙන් ද, පහීනං යන මෙය මුදන ලද්දහුගේ ද කිසිතැනෙක්හි නොසිටීම දැක්වීම් වශයෙන් ද, පටිනිස්සට්ඨං යන මෙය පෙර ගන්නා ලද දුරලීම දැක්වීම් වශයෙන් හෝ ප්‍රතිමුඛව දුරලන බව දැක්වීම් වශයෙන් ද (කියන ලද්දේ වෙයි) භාවනා බලයෙන් මැඩපවත්වා දුරුකළ බව දැක්වීම් වශයෙන් යයි කියන ලද්දේ වෙයි.

ලභති අත්ථවෙදං ලභති ධම්මවෙදං යන මෙහි බුද්ධාදීන් කෙරෙහි වූ අචල ප්‍රසාදයම කෙලෙසුන්ගෙන් මිදුනු බැවින් අත්ථ නම්. එළඹිය යුතු බැවිනැයි කියන ලද වෙයි. ධාරණය කරන හෙයින් ධම්ම නම්. දුගතියෙහි වැටෙන්න නොදෙන බැවිනැයි කියන ලද්දේ වෙයි.

වෙදො යනු ග්‍රන්ථය ද, ඤාණය ද, සොම්නස ද (යන අරුත් ගෙන දෙන්නකි) ඒ, එසේමැයි. තිණ්ණං වෙදානං පාරගූ, යනාදි තන්හි ග්‍රන්ථය 'වෙදය' යයි කියනු ලැබේ. යං බ්‍රාහමණං වෙදගුං ආභිජඤ්ඤං, අකිඤ්චනං කාමභවෙ අසත්තං ආදි තන්හි ඤාණ (අරුතෙහි වේ). යෙ වෙදජාතා විචරන්ති ලොකෙ ආදි තන්හි සොම්නස යන අර්ථයෙහි වේ. මෙහි සොම්නස ද සොමනස්ස සම්පයුත්ත ඤාණය අදහස් කරන ලදී. එහෙයින් ලභති අත්ථවෙදං ලභති ධම්මවෙදං යයි අචල ප්‍රසාදය අරමුණුකොට ඇති සොම්නසද සොමනස්සමය ඤාණයද, ලබා යයි මෙසේ මෙහි අර්ථ දතයුතුය. නැතහොත් අත්ථවෙදං යනු අචල ප්‍රසාදය මෙනෙහි කරන්නහුට ලැබෙන්නා වූ උක්තප්‍රකාර වූම වේදයයි. (ඤාණයයි) ධම්මවෙදං අචල ප්‍රසාදයට හේතු වූ අවධි (සීමා) වශයෙන් කෙලෙස් ප්‍රහාණය කරන්නහුට උපන් උක්තප්‍රකාර වූම වෙද (ඤාණ) යයි. මෙසේද

මෙහි අර්ථය දතයුතුයි. මෙසේ වදාරණ ලද්දේමය. හෙතුම්හි ඤාණං ධම්ම පටිසම්භිදා හෙතුඵලෙ ඤාණං අත්‍ථපටිසම්භිදා යනුයි.

ධම්මූපසංහිතං පාමුජ්ජං යනුවෙන්, එම අර්ථයද, ධර්මයද, අත්‍ථ, ධම්ම දෙදෙනාගේ ආනිශංස වූ ඤාණයද, ප්‍රත්‍යවේක්‍ෂා කරන්නහු උපන් ප්‍රමෝදය (කියන ලද්දේ වෙයි) එම ප්‍රමෝදය වූ කලී, නිවැරදි ලක්‍ෂණයන්ගෙන් යුතු මෙනෙහි කිරීම් ආකාරයෙන් පැවැති, ධර්මයෙන් යුක්ත වූයේ යයි කියනු ලැබේ.

පමුදිතස්ස පීති ජායති යනු, මෙම ප්‍රමෝදයෙන් ප්‍රමුදිත වූවහුට නිරාමිස වූ ප්‍රීතිය උපදී. පීතිමනස්ස යනු එම ප්‍රීතියෙන් පිනවන ලද සිත් ඇත්තහුගේ, කායො පස්සම්භති කය නිවුනේ, සංසිඳුනු දරථ (=කෙලෙස් දැවිල්ල) ඇත්තේ වෙයි. පස්සද්ධකායො සුඛං යනු මෙසේ සංසිඳුනු කාය දරථ ඇත්තේ චෛතසික සුඛය විඳී. චිත්තං සමාධියති, සිත මනාකොට පිහිටුවයි. පුරවන ලද්දක් මෙන් අචලව සිටී. මෙසේ ඔහුගේ කෙලෙස් ප්‍රහාණයද අචල ප්‍රසාදයෙන් යුක්ත වීමද, මෙනෙහි කිරීමෙන් උපදින්නා වූ සොම්නසත් ආදි ආනිශංස දක්වා දැන්, යතොපි ඛො පන මෙ යන මේ වාරයෙන් එම ප්‍රත්‍යවේක්‍ෂාවේ පැවැති ආකාරය දක්වා එම අනාගාමි මාර්ගයාගේ අනුසස් ද, බලය ද දක්වන්නේ, ස ඛො සො භික්ඛවෙ යන ආදිය වදාළහ. එහි එවං සීලො ඔහුගේ අනාගාමි මාර්ග සම්ප්‍රයුක්ත වූ සීලස්කන්ධය දක්වන සේක්. එවං ධම්මො එවං පඤ්ඤො යනුවෙන් එම අනාගාමි මාර්ග සම්ප්‍රයුක්ත වූ ම සමාධි ස්කන්ධය ද, ප්‍රඥා ස්කන්ධයද දක්වන සේක. සාලීනං රත්හැල් සුවඳහැල් ආදි වූ අනේකාකාර හැල් සම්බන්ධ වූ පිණ්ඩපාතං, පිණ්ඩපාතය (බත) විචිත කාලකං ඉවත්කළ කළු සහල් ඇට ඇති, නෙවස්ස නං හොති අන්තරාය. ඒ එබඳු වූ භික්‍ෂුහුගේ ඒ කියන ලද පිණ්ඩපාත භෝජනය, මාර්ගයට හෝ ඵලයට අනතුරු පිණිස නොම වෙයි. ඒ සැබව. ලබන ලද ගුණ ඇත්තහුට එම පිණ්ඩාහාරය, කවර අන්තරායක් කරන්නේ ද යමෙකු නොලත් සතරමග මාර්ගඵලයක් ඇත්තේද එය ලබාගැනීම පිණිස විපස්සනා වඩන්නා වූ ඔහුට එම භෝජනය අනතුරු පිණිස නොම වෙයි. අන්තරාය කරන්ට අසමර්ථ වූයේම වෙයි. කුමක් හෙයින්ද යත්, උක්තප්‍රකාර වූ සීල සමාධි ප්‍රඥාවන්ගේ සංග්‍රහය ඇති මාර්ගයෙන් විසුද්ධ වූ සිත් ඇති බැවිනි. තව ද යම් හෙයකින් මෙහි මෙසේම කාරණය වේද, එහෙයින් එයට අනුරූප වූ උපමාවක් දක්වන්නේ සෙය්‍යථාපි ආදිය වදාළහ.

එහි අවජං යනු විශේෂයෙන් පැහැදුනා වූ මල පහවී යාමෙන් පරිසුද්ධ නම් වූ, ප්‍රභාස්වර බැවින් පරියොදාතං නම් වූ, උක්කාමුඛං රන්කරුවන්ගේ කෝව මුඛය රන්කරුවන්ගේ කෝවම මෙහි උක්කා නම් වේ. අන් තන්හි පන්දම් ආදියද කියනු ලැබෙත්. උක්කාසු ධාරියමානාසු යයි ආදී තන්හි පන්දම් උක්කා යයි කියනු ලැබේ. උක්කං බන්ධෙය්‍ය, උක්කං බන්ධිත්වා උක්කාමුඛං ආලිම්පෙය්‍ය යයි ආතන්හි අගුරු කබලය. කම්මාරානං යථා උක්කා අනෙතා ඣායති නොබහි යන තන්හි කඹුරු උදුනය. එවං විපාකො උක්කාපාතො භවිස්සති යයි ආ තන්හි වාත වේගය උක්කා යයි කියනු ලැබේ. මෙතැන්හිද, මෙබඳුමය. අන් තැන්වලද, සණ්ඩාසෙන ජාතරූපං ගහෙත්වා, උක්කාමුඛෙ පක්ඛිපති යයි ආතන්හිද රන්කරුවන්ගේ කෝව උක්කා යයි දතයුත්තීයැ.

එහි මේ උපමා සංසන්දනාවයි. කිලිටි වස්තර මෙන් ද කිලිටි වූ ජාතරූපය මෙන් ද මේ භික්ෂුවගේ පෘථග්ජන කාලයෙහි කාමරාග ආදි කෙලෙස් මල අනුව ගිය සිත දතයුතුය. පිරිසිදු ජලය මෙන් ද, උක්කාමුඛය (කෝවේ මුඛය) මෙන් ද අනාගාමි මාර්ගය, දතයුතුය. ඒ ජලයට ද කෝප මුඛයට ද පැමිණ වස්ත්‍රය වස්ත්‍රයාගේ ස්වර්ණ වර්ණයෙහි පිරිසිදු බව මෙනි. ඒ භික්ෂුවගේ කියන ලද ප්‍රකාර වූ, සීල-සමාධි පඤ්ඤා සංග්‍රහ වූ අනාගාමි මාර්ගයට පැමිණි විසුද්ධ වූ සිත් ඇති බව යයි සො මෙත්තා සහගතෙන චෙතසා යනුවෙන් යථානුසන්ධි වශයෙන් දේශනා තොමෝ පැමිණියාය.

### ත්‍රිවිධ අනුසන්ධි

ඒ එසේමැයි, පුච්ඡානු සන්ධි අජ්ඣාසයානුසන්ධි, යථානුසන්ධි යනුවෙන් අනුසන්ධීහු තිදෙනෙක් වෙති.

එහි එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච, සියා නුඛො භන්තෙ බහිද්ධා අසති පරිතස්සනාති, සියා භික්ඛූති භගවා අවොච යනුවෙන්, මෙසේ විචාරන්නවුන්ගේ, විසඳනා ලද සූත්‍රයන්ගේ වශයෙන් පුච්ඡානුසන්ධිය දතයුත්තේය.

සියා ඛො පන තෙ බ්‍රාහමණ එවමස්ස අජ්ජාපි නූන සමණො ගොතමො අවීතරාගො යනුවෙන් මෙසේ අනුන්ගේ අදහස් දැන ප්‍රකාශිත සූත්‍රයන්ගේ වශයෙන් අජ්ඣාසයනුසන්ධිය දතයුතුය.

යම් ධර්මයකින් ආදියෙහි දේශනා තොමෝ පිහිටුවන ලද්දේද, ඒ ධර්මයට අනුරූප ධර්මයාගේ වශයෙන් හෝ ප්‍රතිපක්ෂ වශයෙන් හෝ යම් සූත්‍රයක මත්තෙහි දේශනා තොමෝ එන්නීද, ඒ සූත්‍රයන් අනුව යථානු සන්ධිය දතයුත්තේය.

ඒ කවරහුද, ආකංඛෙය්‍ය සූත්‍රයෙහි, යට ශීලයෙන් දේශනාව පටන්ගන්නා ලදී. මත්තෙහි ෂඩ් අභිඥා පැමිණියාහුය. කකචොපම සූත්‍රයෙහි යට අක්ඛන්තියෙන් (නොඉවසීමෙන්) පටන්ගන්නා ලද්දී මත්තෙහි කකචොපම වාදය ආයේය. අලගද්ද සූත්‍රයෙහි යට දෘෂ්ටි දැක්වීමෙන් ආරම්භ කරන ලද්ද මත්තෙහි තිපරිවට්ට සුඤ්ඤතා ප්‍රකාශ කිරීමට පැමිණියාය. චූල අසසපුර සූත්‍රයෙහි යට කෙලෙස් දැක්වීමෙන් පටන්ගන්නා ලද්ද මත්තෙහි බ්‍රහ්ම විහාරයෝ පැමිණියාහුය. කොසම්බක සූත්‍රයෙහි යට භාණ්ඩනයෙන් පටන්ගන්නා ලද්ද මත්තෙහි සාරාණීය ධර්මයෝ ආවාහුය. මේ වත්ථ සූත්‍රයෙහි ද ක්ලේශයන්ගෙන් ආරම්භ කරන ලද්ද මත්තෙහි බ්‍රහ්මවිහාර පැමිණියාහුය. බ්‍රහ්මවිහාර භාවනාවන්ගේ අනුපද වර්ණනා ද භාවනා ක්‍රම ද විසුද්ධි මාර්ගයෙහි සියල්ල සර්වප්‍රකාරයෙන් කියන ලද්දේ ය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අභිජ්ඣා ආදි උපක්ලේශයන්ට විරුද්ධ වූ සර්වප්‍රකාරයෙන්ම කාම රාග ව්‍යාපාද ප්‍රහාණයෙන් පහ වූ විරුද්ධ ධර්ම ඇති බැවින් ලබන ලද පදට්ඨාන ඇති ඒ අනාගාමීහුගේ බ්‍රහ්මවිහාර භාවනාව දක්වා දැන් ඔහුගේ රහත්බව පිණිස විදර්ශනා භාවනාව දක්වා රහත් බවට පත්වීම දක්වනු පිණිස, සො අත්ථි ඉදං යනාදිය වදාළහ. එහි අර්ථය නම්, ඒ අනාගාමී තෙම මෙසේ වඩන ලද බ්‍රහ්මවිහාර ඇත්තේ, මේ බ්‍රහ්මවිහාරියන් අතුරෙන් යම් කිසිවකින් නැගීසිට ඒ බ්‍රහ්මවිහාර ධර්මයන්ම නාම වශයෙන් ද ඔවුන්ට නිස්සය වූ හදයවත්ථුවය, වත්ථු නිස්සය වූවාහු භූතයෝ යයි, මේ ක්‍රමයෙන් භූත උපාදාය ධර්මයන් රූප වශයෙන් ද වෙන්කිරීම කොට අත්ථි ඉදං මේ දුක්ඛ සත්‍යය ඇතැයි දැනගනී. මෙතෙකින් මොහු විසින් දුක්ඛ සත්‍යයෙහි, වවත්ථානය (වෙන්කොට දැනගැනීම) කරන ලද්දේ වෙයි.

අනතුරුව එම දුක්ඛයාගේ සමුදය ප්‍රතිවෙධ කරන්නේ, අත්ථි හීනං හීන වූ සමුදය සත්‍යය ඇතැයි දැනගනී. මෙතෙකින් මොහු විසින් සමුදය සත්‍යයාගේ වවත්ථානය කරන ලද්දේ වෙයි.

අනතුරුව සමුදයාගේ ප්‍රහාණ උපාය සොයන්නේ අත්ථි පණීතං ප්‍රණීත වූ මාර්ග සත්‍යය ඇතැයි දැනගනී. මෙපමණකින් මොහු විසින් මාර්ග සත්‍යය වච්ඡානය කරන ලද්දේ වෙයි.

අනතුරුව එම මාර්ගයෙන් පැමිණිය යුතු තැන සොයන්නේ අත්ථි උත්තරිං ඉමස්ස සඤ්ඤාගතස්ස නිස්සරණං යන්නෙන් මෙම බ්‍රහ්මවිහාර සංඥාවට මත්තෙහි නිස්සරණය වූ නිවන ඇතැයි මෙසේ දැනගනියි යන අදහසය මෙපමණකින් මොහු විසින්, නිරෝධ සත්‍යයාගේ වච්ඡානය කරන ලද්දේ වෙයි. තස්ස එවං ජානතො එවං පස්සතො යනුවෙන් මෙසේ විදසුන් නැණින් සිව් අයුරකින් සිව්සස් දක්නා වූ මග නැණින් මෙසේ දක්නා වූ ඔහුගේ භයභෙරව සූත්‍රයෙහි කී නියායෙන්ම කාමාසවයන්ගෙන් සිත මිදෙයි. මේ ආත්මභාවය පිණිස අනික් කළයුත්තක් නැතැයි දැනගනියි යයි.

මෙසේ අර්හත්වය තෙක් දේශනා පමුණුවා මේ වනවිට එම පිරිස්හි ස්නානයෙන් සුද්ධිය වේ යයි ලබ්ධිය ඇති බ්‍රාහ්මණයෙක් හුන්නේ, හෙතෙම .මෙසේ ස්නානය සුද්ධියෙහි කියනු ලබන්නාව වර්ණනා අසා පැවිදිව රහත් බවට පැමිණෙන්නේ යයි භාග්‍යවතුන් වහන්සේ දන්නා සේක් ද, එහෙයින් ඔහුගේ පිරිසිදු බව සඳහා අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු සිනාතො අන්තරෙන සිනානෙන යයි මේ වෙනම අනුසන්ධියක් වදාළහ. එහි අන්තරෙන සිනානෙන අභ්‍යන්තරයෙහි කිලේශයන්ගේ නැගීසිටීම පිරිසිදු කරන්නා වූ ස්නානයෙන්, සුන්දරික භාරද්වාජො, භාරද්වාජො යනු ඒ බමුණු තෙම තමන්ගේ ගෝත්‍ර වශයෙන් භාරද්වාජ වේ. යම් හෙයකින් 'සුන්දරිකා' නදියෙහි ස්නානය කරන්නහුගේ පව් සෝදා යේයයි යනු මෙය ඔහුගේ දෘෂ්ටිය වේද, එහෙයින් සුන්දරික භාරද්වාජ යයි කියනු ලැබේ. හෙතෙම ඒ වචනය අසා මෙසේ සිතීය. අපිද ස්නාන සුද්ධිය වර්ණනා කරමු. ශ්‍රමණ භවත් ගොතම තෙමේ ද වර්ණනා කෙරෙයි. එහෙයින් මෙතෙම මේ වනවිට, අප හා සමාන අදහස් ඇත්තේවනයි (සිතා)

නැවත භාග්‍යවත්හු බහුකා නදියට ගොස් එය පව් සෝදා ආ කෙනෙකු මෙන් සිතා, ගච්ඡති පන භවං ගොතමො බාහුකං නදිං සිනායිතුං යයි ඇසීය. භාග්‍යවතුන් වහන්සේ, යම් හෝ නොයම් හෝ නොවදාරාම, ඔහුගේ දෘෂ්ටිය දුරුකරනු කැමැත්තාහු කිං බ්‍රාහමණ, බාහුකාය නදියා,

**කිං බාහුකං නදිං කරිස්සති** යයි වදාළහ. එම වචනයාගේ අර්ථය නම්, බහුකා නදියෙන් කවර ප්‍රයෝජනද? කුමක් කරන්නේද? ඕතොමෝ කිසිවෙකුට අර්ථ පිණිස අසමර්ථ වන්නීය. කුමට එහි යන්නෙම් දැයි ඉක්බිති ඒ බමුණුතෙම, එම නදියට පසසන්නේ **ලොඛ්‍ය සමමතා** යනාදිය කීය.

එහි **ලොඛ්‍ය සමමතා** රුක්‍ෂභාවයෙන් සම්මතය, (වොකඛභාවං)= පිරිසිදු බව, විසුද්ධි බව, දෙයි කියා මෙසේ සම්මතයයි කියන ලද්දේ වෙයි. **ලොක්‍ය සමමතා** කියාද පාඨයකි. ඒ පාඨයාගේ අර්ථය නම් ශ්‍රේෂ්ඨ වූ ලෝකයට පමුණුවයි කියා මෙසේ සම්මතයැ. **පුඤ්ඤ සමමතා** පිනකැයි සම්මතයැ. පවාහෙති පමුණුවයි පිරිසිදු කෙරෙයි. **ගාථාහි අජ්ඣභාසි** ගාථාවලින් කීහ. ඒ එසේමැයි. ගාථා වදාරනු ලබන්නාහු ගාථා රුචිකයන්ට එම අර්ථය දක්වනු පිණිසම හෝ විශේෂ අරුතක් දක්වනු පිණිස හෝ වදාරනු ලබත්. මෙහි වනාහි මෙම ගාථා උභයාර්ථය පිණිස වදාරණ ලදහයි දතයුතුයැ.

බාහුකං යන මේ වචනයම මෙහි එම අරුත දීපනය කෙරේ. සෙසු වචනයෝ විශේෂ අර්ථ දීපකයෝ වෙති. මේ විස්තරය වේ. බාහුකා නදියට යම්සේ ද එසේ අධිකක්කා ආදි නදීන් කරාද, ලෝවැසි තෙම ස්නානයෙන් පව්, සෝදා හැරීම පිණිස යෙයි. ඒ එහි යන්නවුන් අතුරෙන් යමෙක් ඒ ස්ථානයන්ට ආසන්න වූවාහුද ඔවුහු දවසට තුන්වරක් ස්නානය කෙරෙති. යමෙක් දුර වූවාහුද, ඔවුහු පිළිවෙලින් දෙවරක් වරක් අතරතුර දිනක් වර්ෂයක් අතර දිනක් ස්නානය කෙරෙත්. තවද යමෙක් සර්වප්‍රකාරයෙන් යන්ට නොහැකි වෙත් ද, ඔවුහු කළවලින් දිය ගෙන්වාගෙන ස්නානය කෙරෙති. මේ සියල්ල නිරර්ථකය. එහෙයින් මෙම විශේෂ අර්ථය දක්වන්ට අධිකක්කා ආදියද වදාළහ. එහි අධිකක්කං යනුවෙන් ස්නාන ද්‍රව්‍යයන්ගේ වශයෙන් ලද ව්‍යවහාර ඇති එක් තොටක් කියනු ලැබේ. ගයා යන මෙයද (මණ්ඩල වාපි) මණ්ඩල වැවෙහි සටහන් ඇති තොටක් ම කියනු ලැබේ. පයාගො මෙය ගංගා නදියෙහි එක් තොටක්මය. මහාපනාද රජුගේ ගංගාවෙහි ගිලුනු ප්‍රාසාදයාගේ හින හමුවූ තැනය. (මෙකල ගංගා යමුනා ගංගා දෙක එක්වන තැනය). **බාහුකා සුන්දරිකා සරසසතී බාහුමතී** යන මේ සතර නදීහු වෙති. **බාලො,** මදනුවණ ඇත්තේ, **පකකනෙත** ප්‍රවේශ වන්නේ, **නසුජ්ඣති,** කිලේස සුද්ධියට

නොපැමිණෙයි. හුදෙක් ධූලිම සෝදා හරියි. සුද්ධ කෙරෙය. (කියන ලද්දේ වෙයි.)

**කිං සුන්‍දරිකා කරිසසති** සුන්‍දරිකා නදී තොමෝ කෙලෙස් සෝදාහැරීම කිම කරන්නේ ද? කිසිත් කරන්ට සමර්ථ නොවේ යන අදහසයි. පයාග බාහුකා ආදියෙහි ද මේ නයමැයි. යම්හෙයකින් කියන ලද මේ පද තුනෙන් අනිත් සතර ද ලක්‍ෂණ හාර න්‍යායෙන් කියන ලද්දාහුම වෙත් ද, එහෙයින් යම්සේ සුන්‍දරිකා - පයාග - බාහුකා යන මොවුහු කිසිවක් නොකෙරෙත් ද එසේ අධිකක්කතාදිහු ද නොකෙරෙත් යයි දතයුත්තාහුය.

**වෙරිං** ප්‍රාණඝාත, ආදි වූ පඤ්ච වෛරයෙන් යුත්, **කත කිබ්බිසං** කර ලද රුදුරු කර්ම ඇති. **නහි නං සොධයෙ**, සුන්‍දරිකා නදිය හෝ ප්‍රයාග තීර්ථය හෝ බාහුකා නදිය හෝ (පාප) ශෝධනය නො කරන්නේය. වෙසෙසින් පිරිසිදු නොකෙරේ යයි කියන ලද්දේ වෙයි. **පාපකම්මිනං** ලාමක වූ වෛර, රෞද්‍ර කර්මයන්ගෙන් යුක්ත වූ නොහොත් ලාමක කර්මයෙහි යෙදුනා වූ වෛර රෞද්‍ර බවට නොපැමිණි කුඩා වූද පාපයන්ගෙන් යුක්ත වූ යයි කියන ලද්දේ වෙයි.

**සුද්ධසස** කෙලෙස් රහිත වූවහුට, **සදාඑගගු** හැමදා එගගුණ (උතුරුපල්) නැකත වේ. මැදින් මස උතුරුපල් නැකැත් දිනයෙහි යමෙක් ස්නානය කෙරේද, හෙතෙම අවුරුද්ද මුළුල්ලේම කළ පව් පිරිසිදු කෙරේ යයි ඒ බමුණු තෙම මෙවන් දෘෂ්ටි ඇත්තෙක් වීල. එහෙයින් බුදුරදහු ඔහුගේ දෘෂ්ටිය සටමින් (මෙය) වදාළහ.

**සුද්ධසස වෙ සදා එගගු** යයි, කෙලෙස් නැත්තහුට නිරතුරු උතුරුපල් ගුණ නැකත වෙයි. එයින් අන්‍යයෝ කිම පිරිසිදු වෙත්දැයි, **උපොසථො සදා** යනු තවද කෙලෙස් රහිත වූ තුදුස්වක් පසලොස්වක් ආදී දිනයන්හි, පෙහෙවස් සමාදන් නොවන්නහුට ද නිත්‍යයෙන් ම පොහොය වෙයි. **සුද්ධසස සුචිකම්මසස** කෙලෙස් රහිත වූ බැවින්, පිරිසිදු වූ පවිත්‍ර වූ කාය කර්මාදියෙන් ද යුක්ත වූවහුට **සදා සම්පජ්ජතෙ වතං** යනුවෙන් මෙබඳු වූවහුට කුසලින් යුතු වත් සමාදානය නිතරම සමෘද්ධ වූයේම වේ යයි (දතයුතුයැ.)

**ඉධෙව සිනාහි** යනුවෙන් මේ මාගේ සසුනෙහිම ස්නානය කරව,

මෙයින් කුමක් කියන ලදද යත්, ඉදින් අධ්‍යාත්මයෙහි කෙලෙස් පිරිසිදු කරනු කැමැත්තෙහි නම්, මේ මාගේ සස්නෙහි ආර්ය අෂ්ටාංගික මාර්ග නමැති ජලයෙන් ස්නානය කරව, යම්හෙයකින් අන්තැනෙක්හි මෙම (අරිඅටඟි මග නම් වූ ජලය) නැත් ද එහෙයිනි. මේ වනවිට ඔහුට සුදුසු දේශනා වශයෙන් තිදොර ශුද්ධිය දක්වන සේක්, සබ්බ භූතෙසු කරොහි ඛෙමතං යනාදිය වදාළහ. ඛෙමතං යනු අභය, හිතබව, මෛත්‍රිය යයි කියන ලද්දේ වෙයි. මේ පද දෙකෙන් ඔහුගේ මනෝද්වාරයෙහි ශුද්ධිය දක්වන ලද්දේ වෙයි. සචෙ මුසා න භණසි යනුවෙන් මෙයින් වාග් ද්වාර ශුද්ධිය ද, සචෙ පාණං න හිංසසි සචෙ අදින්නං නාදියසි යනුවෙන් කායද්වාර ශුද්ධියද දක්වන ලද වෙයි. සද්දහානො අමච්ඡරී යන මේ පදවලින් මෙසේ පිරිසිදු තුන්දොර ඇති ඔහු සද්ධා සම්පත්තියෙහි ද, ත්‍යාග සම්පත්තියෙහි ද, යෙදවූහ. කිං කාහසි ගයං ගන්ත්වා උදපානොපි තෙ ගයා. යන මේ ගාථා අර්ථයෙන්, ඉදින් සියලු සත්ත්වයන් කෙරෙහි මෙත් කරන්නෙහි නම් බොරු නොකියන්නෙහි නම් ප්‍රාණඝාත නොකරන්නෙහි නම්, සොරකම් නොකරන්නෙහි නම්, ඇදහීම් ඇත්තේ නොමසුරු වන්නෙහි නම් ගයාවට ගොස් කුමක් කරන්නෙහි ද ළිඳද ඔබට ගයාව වෙයි. ගයාවෙහි ද ළිඳෙහි ද ස්නානය කරන්නා වූ ඔබගේ, මෙසේ වූ මෙම පිළිවෙතින් ක්ලේස ශුද්ධිය වෙයි. ශරීර මල ශුද්ධිය වනාහි දෙතැන්හිම සමානයයි මෙසේ යෙදිය යුත්තේය. යම් හෙයකින් ගයාව ලෙව්හි සම්මත ද, එහෙයින් ඔහු විසින් භාග්‍යවත්හු, ගච්ඡති පන භවං ගොතමො බාහුකං යයි විචාරණ නමුත් කිං කාහසි බාහුකං ගන්ත්වා යයි නො වදාරා කිං කාහසි ගයං ගන්ත්වා යයි වදාළ බව දතයුතුයැ.

එවං වුත්තෙ යන මේ ආදිය භයභෙරව සූත්‍රයෙහි කී බැවින් ප්‍රසිද්ධය. එකො වූපකට්ඨො යාදියෙහි එකො, කාය විවේකයෙන් එකලා වූයේ, වූපකට්ඨො චිත්ත විවේකයෙන් හුදෙකලා වූයේ, අප්පමත්තො කමටහන්හි සිහිය නොහැරීමෙන් පමා නොවූයේ, ආතාපී කායික, චෛතසික වීර්ය නම් වූ ආතාපයෙන් යුක්ත වූයේ, පහිතත්තො කයෙහි ද, ජීවිතයෙහි ද අපේක්ෂා රහිත බැවින්, එක්තරා ඉරියව් විහරණයකින් වාසය කරන්නේ, න චිරස්සෙව පැවිද්ද පිළිබඳව කියන ලදී.

## ද්විධ කුලපුත්‍රයෝ

කුලපුත්තා යනුවෙන් ජාති කුලපුත්‍රයෝය, ආචාර කුලපුත්‍රයෝ යයි

කුලපුත්‍රයෝ ද්විධ වෙති. මේ තෙම වනාහි දෙපරිද්දෙන්ම කුලපුත්‍ර වූයේ වෙයි. අගාරා, ගෙදරින් (ගිහිගෙයින්) අනගාරියං ගිහිගෙට හිත වූයේ අගාරිය නම් වේ. කෘෂිකර්මය, ගවපාලනය ආදී කුටුම්බ පොසන කමම 'අගරිය' යයි කියනු ලැබේ. එහි අගාරිය වූ කිසිවක් නැති බැවින් 'අනගාරිය' නම් වේ. අනගාරියං යනු පැවිද්දට නමකි. පබ්බජන්ති පැමිණෙත්. එළඹෙත්. තදනුත්තරං, තං+අනුත්තරං යනුයි. බ්‍රහමචරිය පරියොසානං, මග බඹසරෙහි අවසානය වූ රහත්ඵලය කියන ලද වෙයි. එය එසේමැයි. එය සඳහා කුලපුත්‍රයෝ පැවිදි වෙති. දිට්ඨෙව ධම්මෙ එම ආත්මභාවයෙහිම සයං අභිඤ්ඤා සච්ඡි කත්‍වා තමා විසින්ම නුවණින් ප්‍රත්‍යක්‍ෂ කොට පරප්‍රත්‍ය රහිතකොට යන අර්ථයි. උපසම්පජ්ජ විහාසි පැමිණ සපයාගෙන වාසය කළේය. මෙසේ වාසය කරන්නේ ද, ඛීණා ජාති -පෙ- අබ්භඤ්ඤාසි මෙයින් ඔහුගේ ප්‍රත්‍යවේක්‍ෂා භූමිය දක්වයි.

ඔහුගේ කිනම් ජාතියක් ක්‍ෂය වූවාද? කෙසේ නම් එය දැනගත්තේද? යම් හෙයකින් මෙය භයභේරව සූත්‍රයෙහි කියන ලදද, එතකුදු වුවත් එය මෙහි ප්‍රථම පුරුෂයාගේ වශයෙන් යෝජනා ක්‍රමය දක්වනු පිණිස නැවත සැකෙවින් කියමු. පළමුකොට ඔහුගේ අතීත ජාති ක්‍ෂය වූවා නොවෙයි. පෙරම ක්‍ෂය වූ බැවිනි. අනාගත ජාතිය ද නොවේ. එහි උත්සාහයක් නැති හෙයිනි. වර්තමාන ජාතියද නොවේ. විද්‍යමාන බැවිනි. විශේෂයක් ඇත. මාර්ගය නොවැඩූ බැවින්, එක-චතු-පඤ්ච-වොකාර භවයන්හි, එක-චතු-පඤ්ච-ස්කන්ධ ප්‍රභේදගත වූ යම් ජාතියක් උපදීනම් ඕතොමෝ මාර්ගය වැඩූ බැවින් අනුත්පාද ස්වභාවයට පැමිණීමෙන් ක්‍ෂය වූවාය. හෙතෙම මාර්ග භාවනාවෙන් ප්‍රහීණ වූ කෙලෙසුන් ප්‍රත්‍යවේක්‍ෂාකොට කෙලෙස් නැති කල්හි විද්‍යමාන වූ කර්මය මත්තෙහි පටිසන්ධිය නොදෙන්නේ වේ යයි දන්නේ එය දැනගනී. වුසිතං වසන ලද පරිවසන ලද, කරන ලද, හැසිරෙන ලද, නිමවන ලද යන අර්ථය. බ්‍රහමචරියං මාර්ග බ්‍රහ්මචර්යාවයි. කතං කරණියං චතුරාර්ය සත්‍ය ධර්මයන්හි සතර මගින් පරිඤ්ඤා-පහාන-සච්ඡිකිරියා-භාවනා වශයෙන් සොළසවිධ වූ කෘත්‍ය නිමවන ලද යන අර්ථයි.

නා පරං ඉත්‍ථත්තාය දැන් නැවත ඉත්‍ථමභාවය (මේ භවය) පිණිස මෙසේ සෝලසාකාර කෘත්‍යය කළයුතු බව පිණිස හෝ ක්ලේශ ප්‍රහාණය පිණිස මාර්ග භාවනාවකින් නැතැයි නොහොත් ඉත්‍ථත්තාය, මේ භාවයෙන් මෙබඳු ප්‍රකාර වූ දැන් පවත්නා ස්කන්ධ පරම්පරාවෙන් අන්‍ය වූ ස්කන්ධ

පරම්පරාවක් නැත. මේ පංචස්කන්ධයෝ සිඳින ලද මුල් ඇති රුකක් මෙන් සිටිත් යයි දැන ගත්තේය. අඤ්ඤතරො යනු එක් අරහතං රහතුන් අතුරෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක රහතුන්ගේ අතරෙහි අභ්‍යන්තරයෙහි වූයේ විය.

**වත්ථ සූත්‍ර වර්ණනාව නිමි.**

## 1-1-8

එවමෙමසුතං යනු සලෙලඛ සූත්‍රයයි. එහි මහාචුන්දො යනු එම තෙරුන්ගේ නාමයයි. සායණ්භ සමයං, සවස් කාලයෙහි, පටිසල්ලාණා වුට්ඨිතො මෙහි පටිසල්ලාණං යනු ඒ ඒ සත්ත්ව සංඛාරයන් කෙරෙහි ආපසු හැරී, සල්ලාණය, නිලීයන එකග්‍ර බව ප්‍රකර්ෂ විවේකය යයි කියන ලද වෙයි. යමෙක් එම (සල්ලාණ නම් වූ) සමවතින් නැගීසිටියේද, හෙතෙම පටිසල්ලාණ වුට්ඨිත නම් වේ. මෙතෙම වූ කලී උතුම් වූ ඵලසමවතින් නැගී සිටියේ ද, එහෙයින් පටිසල්ලාණා වුට්ඨිතො යයි කියන ලද්දේ වෙයි.

භගවනතං අභිවාදෙත්වා, සම වූ දසනියෙන් දිලියෙන, දොහොතින් සරසන ලද හිසින් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ, අභිවාදනය කරවා, හෙවත් චුන්දය, සුවපත් වේවායි මෙසේ වාග්භේදය කරවා, භාග්‍යවතුන් වහන්සේ වඳනා ලද්දාහු රන් මිහිඟු බෙරයක් වැනි වූ ග්‍රීවය ගෙන කර්ණසුඛ වූ ප්‍රේමණීය වූ අමෘතාභිෂේකයක් වැනි වූ බ්‍රහ්ම ඝෝෂය විහිදුවමින් සුඛී හොහි යයි ඒ ඒ වැන්ද අයගේ නමද ගෙන කියන සේක. මෙසේ එම කාරණය බුදුරදුන් විසින් පුරුදු කරන ලද්දකි. මේ එයට නිදර්ශන සූත්‍රයකි.

සකෙකා භනෙත දෙවා නමිනෙදා සාමචෙවා සපරිජනො භගවතො පාදෙ සිරසා වනදතීති, සුඛී හොතු පඤචසිඛ, දෙවානමිනෙදා සාමචෙවා සපරිජනො සුඛකාමාහි දෙවා මනුසසා අසුරා නාගා ගනධබබා යෙපිචඤෙඤ සනති පුථුකායාති

(ස්වාමීනි, සක්දෙව් තෙම හිතවත් පිරිවර ජනයා සහිත වූයේ, බුදුරදුන්ගේ පාදයන් මස්තකයෙන් වඳියි යයි, පඤ්චශිඛය, සුහෘදයන් සහිත වූ සක්දෙව්රද සුවපත් වේවා. යම්හෙයකින් දෙවියෝ ද මනුෂ්‍යයෝ ද අසුරයෝ ද නාගයෝ ද, ගාන්ධර්වයෝ ද අන්‍ය වූත් යම් මහජන කෙනෙක් වෙත්නම් ඔවුහු ද සැපයට කැමැත්තාහු ද එහෙයිනැයි) මෙසේද තථාගතයන් වහන්සේ මෙබඳු මහේශාක්‍ය දේවතාවන්ට ප්‍රකාශ කෙරෙත් යයි.

යා ඉමා යනුවෙන් දැන් කිවයුතු වූ දෘෂ්ටීන් ඉදිරිපත් කරන්නාක් මෙන් වදාළහ. අනෙක විහිතා නානාප්‍රකාර වූ දිට්ඨියො මිථ්‍යා දෘෂ්ටීහු, ලොකෙ උපපජ්ජනති සත්ත්වයන් අතරෙහි උපදිත් ද, අතතවාද පටිසංයුතතා යනු රූපං අතතතො සමනුපපසසති ආදි ක්‍රමයෙන් පැවැති ආත්ම දෘෂ්ටීන්ගෙන් යුක්ත වූවාහු. ඔවුහු විසිදෙනෙක් වෙති.

ලොකවාද පටිසංයුතතා යන සසසතො අතතා ච ලොකොච යනාදි ක්‍රමයෙන් පැවැති ලෝකවාදයෙන් යුක්ත වූවාහු. ඒ දෘෂ්ටීහු අටදෙනෙක් වෙති. සසසතො, අසසසතො, සසසතො ච අසසසතො ච, නෙව සසසතො නාසසස තො, අනතවා, අනනතවා, අනතවා ච අනනතවා ච, නෙවනතවා නානනතවා අතතා ච ලොකො යයි මේ අයුරින් පැවති බැවිනි.

ආදිමෙව යනාදියෙහි මේ අර්ථයයි. කිමෙක්ද ස්වාමීනි, පළමුකොටම මෙනෙහි කරන්නහුට, සෝවාන්මගට නොපැමිණම, විදර්ශනාවෙන් මිශ්‍ර වූ පළමු මනසිකාරයම මෙනෙහි කරන භික්ෂුවට මෙසේ මොවුන්ගේ මෙතෙක් දැක්වූ උපායෙන්ම මේ දෘෂ්ටීන්ගේ ප්‍රහාණයත් දුරලීමත් වේද? යනුවෙන් තෙරණුවෝ තමන් අධිමාන රහිත වූවාහුම, අධිගතයෙමියි යන මාන ඇත්තවුන්ගේ, අධිමාන ප්‍රහාණය පිණිස අධිමාන ඇත්තෙකු මෙන් වී, විචාරත් යයි දතයුතුයැ.

(අපරෙ) අන්‍ය ආචාර්ය කෙනෙක් තෙරුන් වහන්සේගේ අතවැසියෝ ප්‍රථම මනසිකාරයෙන් ම දෘෂ්ටීන්ගේ සමුච්ඡෙද ප්‍රහාණය

වේයයි මෙවන් හැඟීම් ඇත්තාහු ද, සමාපත්ති විහරණයෝ සල්ලෙඛ විහරණයෝ යයි, මෙසේ සංඥා ඇත්තාහුද ඇති බැවින් ඒ තෙරුණුවෝ ඔවුන්ට වැඩ පිණිස බුදුරදුන් විචාළහයි කීහ.

අනතුරුව එම තෙරුන්හට එම දෘෂ්ටීන්ගේ ප්‍රහාණය දක්වන සේක්, යා ඉමා, යනාදිය වදාළහ. එහි යඤච චෙතා දිට්ඨියො උපපජ්ජනති යනාදිය පංචස්කන්ධය සඳහා වදාරණ ලදී. මේ පංචස්කන්ධයෙහිම මෙම දෘෂ්ටීහු උපදිති. එහෙයින් වදාළහ.

**රූපෙ ඛො භිකඛවෙ සති, රූපං අභිනිවිසස එවං දිට්ඨි උපපජ්ජති සො, අතතා සො ලොකො සො පෙචච භවිසසාමි, නිචෙචා ධුවො සසසතො අවිපරිණාම ධමෙමා**

(මහණෙනි, රූපය ඇතිකල්හිම, රූපයෙහි පිහිටා මෙසේ දෘෂ්ටිය උපදියි. ඒ මම ආත්මය වෙමි. ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලොව වන්නෙමි. සර්වකාලිකය. ස්ථිරය. ච්‍යුත වීම් රහිතය. ප්‍රකෘතිය අත්නොහරින ස්වභාව ඇත්තේ යයි) යනු විස්තරයයි. අරමුණු වශයෙන් එක්වචන කොට යඤච යයි වදාළහ. යම් අරමුණෙක්හි උපදිත් යයි කියන ලද්දේ වෙයි. මෙහිද **උපපජ්ජති, අනුසෙනති, සමුදාචරනති** යන මෙ පදයන්ගේ නානාකරණය දතයුතුය. ජාති වශයෙන් වනාහි, නූපන්නහු උපදින්නේ **උපජ්ජනති** යයි කියනු ලැබෙත්. නැවත, නැවත සෙවුනා ලද්දාහු, ථාවර වූවාහු නොහික්මවන ලද්දාහු **අනුසෙනති** අනුව හොවිත් යයි කියනු ලැබෙත්. කාය, වාග් ද්වාරයට පැමිණියාහු **සමුදාචරනති** හැසිරෙත් යයි කියනු ලැබෙත්. මේ ඔවුන්ගේ නානාකරණයයි. (නානත්වයයි)

**තං නෙතං මම** යන ආදි තන්හි, ඒ පංචස්කන්ධයාගේ ප්‍රභේද වූ අරමුණ, මෙය මාගේ නොවෙයි. මමත් මෙතෙම නොවෙමි. මේ මගේ ආත්මයත් නොවේ යයි.

**එවමෙතං යථාභූතං සමමපපඤඤාය පසසතො** මෙසේ පළමුකොට පදාර්ථ දතයුතුයැ. යම්හෙයකින් වනාහි මෙහි **එතං මම** යනු තණ්හාවෙන් ගැනීම වේද, එයද ග්‍රහණය කරන්නේ, එකසිය අටක් හැසිරීම් ප්‍රභේද ඇති, තණ්හා ප්‍රපඤචය ගනියි. **එසොහමසමි** යනු මානයෙන් ගැනීමයි. නව ප්‍රභේද ඇති මාන පපඤචය ගනියි.

එසො මෙ අත්තා යනු දෘෂ්ටි වශයෙන් ගැනීම් වේද, එය ග්‍රහණය කරන්නේ හැටදෙකක් ප්‍රභේදගත දෘෂ්ටි පපඤ්චය ගනියි.

එහෙයින්, නෙතං මම යයි වදාරන්නා වූ බුදුරදහු ඉහත සඳහන් තෘෂ්ණා ප්‍රපඤ්චය ප්‍රතික්ෂේප කරන සේක. නෙ සො හමස්මි යනුවෙන් මාන ප්‍රපඤ්චය ද න මෙ සො අත්තා යනුවෙන් දෘෂ්ටි ප්‍රපඤ්චය ද, (ප්‍රතික්ෂෙප කරන සේක.) මෙහි තණ්හා මානයෝ දිට්ඨිය හා එක් වූවාහු යයි දතයුත්තාහ. එවමෙතං, මෙසේ නෙතං මම යනාදි ආකාරයෙන් මෙම ස්කන්ධ පංචකය යථාභූතං තත් වූ පරිදි යම්සේ ඇත්තේ ද එසේ යයි කියන ලද්දේ වෙයි. ඒ එසේමැයි. පංචස්කන්ධය මේ ආකාරයෙන්ම අත්‍ථි මම, යනාදි වශයෙන් ග්‍රහණය කරන්නේ නොම ඇත යන අදහසයි. සම්මප්පඤ්ඤාය පස්සතො සෝවාන් මග නැණ අවසන්කොට ඇති විදසුන් නැණින් මනාකොට දක්නහුට එවමෙතෙසං මේ උපායෙන් මොවුන්ගේ පහාතං පටිනිස්සග්ගො යන මේ (පද) කෙම සමුච්ඡෙද ප්‍රහාණයටම නමකි.

මෙසේ බුදුරදහු ආදි මනසිකාරයෙන්ම දෘෂ්ටින්ගේ ප්‍රහාණය වේදෝ හෝ නොවේදෝහෝයි ආයුෂ්මත් මහාචුන්ද තෙරුන් විසින් අධිගතයෙමි යන මාන ඇත්තවුන්ගේ, වශයෙන් ප්‍රශ්න විචාරණ ලද්දාහු සෝවාන් මගින් දිට්ඨි ප්‍රහාණය දක්වා මේ වනවිට තමන් වහන්සේම අධිමානිකයන්ගේ ධ්‍යානය විභාග කරන සේක්, ඨානං ඛො පනෙතං යනාදිය වදාළහ.

එහි අධිමානිකයෝ නම්,

යම් කෙනෙකුට නොපැමිණි (මාර්ගඵල)යෙහි පැමිණියේය යන සංඥාවෙන් අධිමානය උපදී ද, (ඔවුහුය) ඒ මේ අධිමාන උපදනේ ලෝකයෙහි වට්ටානුසාරී වූ බාල පුහුදුන් හට නොම උපදී. ආර්ය ශ්‍රාවකයන්ට නොම උපදියි. සෝවාන් වූවහුට මම සකෘදාගාමි වෙමියි, යයි අධිමානය නොම උපදී. සකෘදාගාමියාට මම අනාගාමි වෙමියි අධිමානය නොම උපදී. අනාගාමි පුද්ගලයාට මම රහත් වෙමියි, අධිමාන නොම උපදී. සමථ වශයෙන් හෝ විදර්ශනා වශයෙන් හෝ විෂ්කම්භණය කළ කෙලෙස් ඇති නිත්‍යයෙන් යුක්ත වූ ප්‍රයුක්ත වූ පටන්ගන්නා ලද විදර්ශනා ඇති කාරකයා හටම උපදී.

ඒ එසේමැයි, සමථ භාවනාවෙන් විෂ්කම්භණය කළා වූ හෝ විදර්ශනා භාවනාවෙන් විෂ්කම්භණය කළා වූ හෝ කෙලෙසුන් හැසිරීම නොදක්නා වූ ඕහටම මම සෝතාපන්න වෙමියි හෝ සකෘදාගාමි-අනාගාමි මම රහත් වෙමියි හෝ අධිමානය උපදී. තලගුරු තිස්සපබ්බතවාසී ධම්මදින්න තෙරුන් විසින් අවවාද කරනු ලැබූ තෙරවරුන් මෙනි.

## ධම්මදින්න තෙරුන් වහන්සේ

උපසපත් නොබෝකල් ඇති ධම්මදින්න තෙරුන්වහන්සේගේ අවවාදයෙහි පිහිටා බොහෝ භික්ෂූහු විශේෂ ගුණයන්ට පැමිණියාහුය. මෙම පුවත අසා තිස්සමහා විහාරවාසී, භික්ෂු සංඝතෙම ස්ථවිර තෙම අස්ථානයෙහි යොදවන්නෙක් නොවෙති. තෙරුන් කැඳවාගෙන එව් යයි බොහෝ භික්ෂූන් යැවූහ. ඔවුහු ගොස් ඇවැත්නි ධම්මදින්නයෙනි, භික්ෂු සංඝතෙම ඔබ කැඳවායයි, කීවාහුය. හෙතෙම මෙසේ කීය. කිමෙක්ද වහන්ස, තෙපි තමා සෙවීම කෙරෙත් ද, අනුන් සෙවීම කෙරෙත්දැයි සත්පුරුෂය තමා සෙවීම කරමුයයි (කීහ) හෙතෙම ඔවුන්ට කමටහන් දින. සියල්ලෝම රහත්බවට පැමිණියාහුය. භික්ෂු සංඝ තෙම නැවත අන්‍ය භික්ෂූන් යැවීය. මෙසේ තුන්වන වර දක්වා යවනු ලැබූ සියල්ලෝම එහිදීම රහත්බවට පැමිණ වාසය කළාහුය. ඉක්බිති සංඝ තෙම ගිය ගිය අන නොම එතියයි, එක්තරා මහලු පැවිද්දෙකු යැවීය. හෙතෙම ගොස්, ස්වාමීනි, ධම්මදින්නය, තුන්වරක් තිස්සමහා විහාර භික්ෂු සංඝ තෙම ඔබ වෙත දූතයන් එවූයේය. තෙපි සංඝයාගේ ආඥාව ගරු නොකළහුද? නොආවාහුදැයි කීය. ස්ථවිර තෙම මේ කිමෙක්දැයි පත්සලට නොපිවිසම පාසිවුරු ගෙන්වාගෙන, එකෙනෙහිම නික්මින.

හෙතෙම අතරමග හඬකන විහාරයට පිවිසීය. එහිදූ එක් සැටවස් ඉක්මවන ලද මහතෙර කෙනෙක් අධිමානයෙන් යුතුව රහත්බව ප්‍රතිඥා කෙරෙයි. තෙරුන්වහන්සේ එම මහතෙරුන් වෙත එළම වැඳ පිළිසඳර කථාකොට අධිගමය විචාළහ. මහතෙර මෙසේ කීය. එසේය ධම්මදින්නය, පැවිද්දා විසින් යමක් කළයුතුද, එය මා විසින් කරන ලදුව බොහෝකල් ඉක්ම ඇත. දැන් ඉක්මවූ සැටවස් ඇත්තෙක් වෙමි. කිම වහන්ස, ඍද්ධිය වළඳන්නහුද? එසේය ධම්මදින්නය, ඒකාන්තයෙන් යහපති ස්වාමීන් වහන්ස. ඇතෙකු ඔබ හමුවට එන්නක්හුකොට මැවුව මැනවයි, මැනවි ඇවැත්නි, යයි ස්ථවිර තෙමේ සර්වශ්වේත වූ සත්තැනකින් (පොළොවේ) පිහිටි තුන්පරිද්දකින් ප්‍රභේද වූ නගුට චලනය කරන්නා වූ සොඬ මුඛයෙහි

බහා දෙදලින් විදිනු කැමති වූවෙකු මෙන් වූ ඉදිරියට එන්නා වූ මහා හස්තියෙකු මැවීය.

හෙතෙම ඒ තමා විසින්ම මවන ලද ඇතා දැක බියවූයේ පලායන්ට පටන්ගත, එවිටම තමා මම නො රහත්මි යයි, දැන ධම්මදින්න තෙරුන් පාමුල උක්කුටිකට හිඳ ඇවැත්නි මට පිහිට වේවයි කීය. ධම්මදින්න තෙම, වහන්ස ශෝක නොවන්න. දොම්නස් නොවන්න. කාරකයන්ටම (අධිගමය සඳහා ක්‍රියා කරන්නවුන්ටම) අධිමානය උපදී යයි තෙරුන් සනසා කමටහන් දිනි. තෙරණුවෝ ධම්මදින්න තෙරුන්ගේ අවවාදයෙහි පිහිටා රහත්බව ලැබී.

සිතුල්පව්වෙහි ද එබඳුම තෙරකෙනෙක් වෙසෙයි. ධම්මදින්න තෙම ඔහු කරා ද එළඹ එසේම විචාළේය. හෙතෙමේ ද එසේම පිළිතුරු දුන්නේය. වහන්ස, ඍද්ධියත් වළඤ්ජනය කරහුදැයි කීය. එසේය ඇවැත්නි, ඉතා මැනවි ස්වාමීනි, එක් පොකුණක් මවන්න. ස්ථවිර තෙම මැවීය. ස්වාමීනි, මෙහි පියුම් ගොමුවක් මවන්න, එයද මැවීය. පියුම් ගොමුවෙහි මහත් වූ පියුමක් මවන්න. එයද මැවීය. ඒ පියුම් ගැබෙහි සිට මිහිරි නදින් ගයන්නා වූ ද නටන්නා වූ ද එක් ස්ත්‍රී රුවක් මවන්න. එය මැවී. හෙතෙම වහන්ස, තෙල ස්ත්‍රීරූපය ගැන නැවත නැවත හාත්පසින් සිතනු මැනවයි කියා පහයට ප්‍රවිෂ්ට විය. ඒ රූපය ගැන හාත්පසින් සිතන්නා වූ තෙරුන්ගේ සැටවසක් යටපත්ව තිබූ ක්ලේශයෝ චලිත වූහ. එකල්හි හෙතෙම තමා (නොරහත් බව දැන) ධම්මදින්න තෙරුන් සමීපයෙහි කමටහන් ගෙන රහත් බවට පැමිණියේය.

ධම්මදින්න තෙරණුවෝ පිළිවෙලින් තිස්සමහා විහාරයට ගියහ. එසමයෙහි තෙරවරු චෛතියංගණය හැමද, බුද්ධාරම්මණ ප්‍රීතිය උපදවා හුන්නාහු වෙත්, මෙය වනාහි ඔවුන්ගේ වතයි. එහෙයින් ඔවුන්ගේ එක්කෙනෙකුදු ධම්මදින්න තෙරුන්ට මෙහි පාසිවුරු තබවය කියන්නෙකු හෝ විචාරන්නෙකු හෝ නො වීය. ධම්මදින්න තෙම, මේ තෙමේ වත්තේ යයි සිතා ප්‍රශ්න විචාළාහුය. හෙතෙම විචාළ තාක් ප්‍රශ්නයන් තියුණු අසිපතකින් කුමුදුනල කළඹක් සෙයින් සිඳ පා ඇඟිල්ලෙන් මහපොළොවට පහළේය. වහන්ස, මෝ සිත් නැති මහපොළොවද ධම්මදින්නයාගේ ගුණ දනී, තෙපි වනාහි නොදන්නහු යයි කියා මේ ගාථාව කීය.

අචෙතනායං පඨවී විජානාති ගුණාගුණං
සචෙතනාම බො භනෙත නජානාථ ගුණාගුණං

(චේතනා රහිත වූ මෝ පඨවි තොමෝ ගුණාගුණ දෙක විශේෂයෙන් දනී, වහන්ස, තෙපි චේතනා සහිත වූවාහුම ගුණාගුණ දෙක නොදන්නහුය.)

මෙසේ ප්‍රකාශකොට එකෙනෙහිම අහසට පැනනැගී තලගුරු තිස් පච්වටම වැඩියේය. මෙසේ කාරකයා හටම අධිමානය උපදී. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ එවැනි භික්ෂූන්ගේ වශයෙන් ධ්‍යාන විභාග කරන්නේ ඨානං බො පන යනාදිය වදාළහ. ඒ දේශනාවගේ අර්ථය, මේ කාරණය ඇත. නැත්තේ නොවේ. (කුමක්ද?) (යම් කරුණකින් මේ සස්නෙහි ඇතැම් මහණ කෙනෙක්.

ඉධෙ කචෙචා භිකඛු, බාහිර පිරිමැදියන් හා සාධාරණ වූ විවිචෙචව කාමෙහි -පෙ- පඨමජකධානං උපසමපජජ විහරෙයය යනුවෙන්, යම්හෙයකින්, තසස එවමසස සලෙලඛෙන විහරාමි ඔහුට කෙලෙසුන් ලියා දැමීමෙන් කෙරෙමී යයි ද, යම් ප්‍රතිපත්ති විධානයක් කෙලෙසුන් මනාලෙස ලියාදමාද, මම එම ප්‍රතිපත්තියෙන් යුතුව වෙසෙමී යයි මෙබඳු සිතක් වේද, එය නොයෙදෙයි. අධිමානයෙන් යුත් භික්ෂුවට සලෙලඛයක් හෝ සලෙලඛ ප්‍රතිපදාවක් හෝ නොවේ. කුමක් හෙයින් ද, විදර්ශනා පාදක නොවන හෙයිනි.

යම්හෙයකින් හෙතෙම ධ්‍යානයට සමවැද එයින් නැගීසිට සංස්කාරයන් සම්මර්ශනය නො කෙරේද, තව ද ඔහුගේ ධ්‍යානය, සිත එකඟවීම පමණක් කරන්නා වූ ඉහාත්ම සැප විහරණයක් වූයේ ද, එහෙයින් එම කරුණ දක්වන බුදුරදහු න බො පනෙතෙ චුන්‍ද. අරියසස විනයෙ සලෙලඛා වුචචනති, දිට්ඨධමමසුඛවිහාරා එතෙ අරියසස විනයෙ, වුචචනති යයි වදාළහ. එහි එතෙ යනු ධ්‍යාන ධර්ම වශයෙන් බහුවචන දතයුතුයැ. මේ ප්‍රථම ධ්‍යාන ධර්මයෝ යයි කියන ලද්දේ විය. සමාන වත් වශයෙන් හෝ එකම පළමු ධ්‍යානය නැවත, නැවත සමවැදීම් වශයෙන් පැවැත්තේ බොහෝ බවට යෙයි. අරමුණු වශයෙන් හෝ එකම ප්‍රථම ධ්‍යානය, පඨවි කසිණාදියෙහි පැවැතීම් වශයෙන් බොහෝ බවට පැමිණේ යයි, (කියන ලද්දේ විය) දෙවන, තුන්වන, හතරවන, ධ්‍යානයන් පිළිබඳවද මෙම ක්‍රමයමැයි.

අරූපාවචර ධ්‍යානයන්ගේ, අරමුණු භේදයක් නොමැති බැවින් පළමු දෙකාරණයාගේ වශයෙන්ම බහුවචනය දතයුතු යැ.

තව ද යම්හෙයකින් එම ධ්‍යානයන්ගේ අංගයෝ ද ශාන්ත වූවාහු ද අරමුණු ද ශාන්ත වූවා ද නිවී ගියාහු ද, පියුම් වූවාහු ද වෙත් යයි කියනා ලද වේද, එහෙයින් ඔවුහු සනතා එතෙ විහාරා මෙසේ වදාරණු ලද්දාහු යයි දතයුතුයැ. මේ දක්වන ලද්දේ ඔවුන් සතරදෙනාගේම සාධාරණ වර්ණනාවයි.

විශේෂ වර්ණනාව වූකලී සබ්බසො රූපසඤ්ඤානං යන පද අනුව කිවයුතු වන්නීය. ඒ වර්ණනා තොමෝ විසුද්ධි මාර්ගයෙහි සර්වප්‍රකාරයෙන්ම කියන ලද්දේ මය. මෙසේ යම්හෙයකින් අධිමානික භික්‍ෂුවගේ ධ්‍යාන විහරණය විපස්සනා පාදක නොවන බැවින් සලෙලඛ විහරණයක් නොවේ. හෙතෙම ධ්‍යානයට සමවැදී එයින් නැගීසිට සංඛාරයන් සම්මර්ශනය නොකෙරේද ඔහුට චිත්ත ඒකගගතාකාර වූ ඉහාත්ම සැප විහරණයම වේ ද, එහෙයින් එම අර්ථ දක්වමින් රූප ධ්‍යානයන් සහ අරූප ධ්‍යානයන් ද විභාගකොට දැන් යම්තැනෙක්හි සලෙලඛනය කළයුතුද සුසාලිස් ආකාරයකින් ඒ වස්තුවද ඒ සලෙලඛයද දක්වන්නාහු ඉධ ඛො පන වො යනාදිය වදාළහ. කුමක් හෙයින් අෂ්ට සමාපත්තීන් සමග අවිහිංසාවාදීහුම සලෙලඛයෝ යයි වදාරණ ලද්දාහුද යත් ලෝකෝත්තර ධර්මයන්ට පාදක බැවිනි. ඒ එසේමැයි. බාහිර (සමයන්හි) අටසමවත් වටපාදක වූවාහුම වෙති. බුදුසසුනෙහි, සරණාගමනය පවා ලෝකෝත්තරපාදකයැ. අවිහිංසාදීහු ගැන කියනු කිම? යම්සේ බාහිරක අටසමවත් ලාභියාට ද පංච අභිඥා ඇත්තහුට ද දුන් දනට වඩා බුදු සසුනෙහි තිසරණගතයා හට දුන් දන අතිශයින් මහත්ඵල වේද, මේ කාරණය මෙම සූත්‍රයෙන්ම දතයුතු. මේ සඳහාම දක්ෂිණා විසුද්ධි සූත්‍රයෙහි **බාහිරකෙ කාමෙසු වීතරාගෙ දානං දත්‍වා කොටි සත සහසස ගුණ දකඛිණා පාටිකංඛිතබ්බා, සොතාපතති ඵල සචඡිකිරියාය, පටිපනෙන දානං දත්‍වා අසංඛෙය්‍යා අප්පමෙය්‍යා- දකඛිණා පාටිකංඛිතබ්බා කො පන වාදො සොතාපනෙන** යයි වදාරණ ලද සරණාගමනයෙහි පටන්ම එහි සෝවාන් ඵලයට පැමිණීම තෙක් අදහස් කරන ලද්දේ වෙයි. මේ මෙහි පළමුකොට පෙළ යෙදුමයි.

අනුපද වර්ණනාවෙහි ඉධ යන මේ පදය විහිංසා ආදි වස්තු දැක්වීම (පිණිසය) ඛො පන යනු නිපාත මාත්‍රයකි. වො යන කරණාර්ථයෙහි

සාමි වචනයි. මේ වනාහි මෙහි සංක්‍ෂෙප අර්ථයයි. පරෙ විහිංසකා භවිස්සන්ති යනාදි නයින් යම් මේ විහිංසා ආදි වස්තුවක් කියවුද, චුන්දය මේ විහිංසාදි වස්තුවෙහි තොප විසින් සලෙලබය කළයුතු යයි මෙසේ සැකෙවින් වදාරා දැන් විස්තර කරන සේක්, පරෙ විහිංසකා භවිස්සන්ති මයමෙත්‍ථ අවිහිංසකා භවිස්සාමාති සලෙලබො කරණීයො යනාදිය වදාළහ. එහි පරෙ යනු මේ කෙලෙසුන් ලියා දැමීමෙහි යෙදුනා වූ යම්කිසිවෙක්, විහිංසකා භවිස්සන්ති අතින් ගලින් යනාදියෙන් සත්නට හිංසා කරන්නාහු වන්නාහුය.

මයමෙත්‍ථ අවිහිංසකා භවිස්සාම, අපි වනාහි යම් වස්තුවෙක්හිම අන්‍යයෝ මෙසේ විහිංසක වන්නාහුද තෙල වස්තුවෙහිම අවිහිංසක වූවෝම වන්නෙමු. අවිහිංසාව උපදවා වාසය කරන්නෙමු. ඉති සලෙලබො කරණීයො, මෙසේ තොප විසින් කෙලෙස් ලියා දැමීම කළයුතුය. මෙහි සලෙලබ යයි ද අවිහිංසාවම දතයුතු. යම්හෙයකින් අවිහිංසා තොමෝ විහිංසාව මොනවට ලියා දමාද, සිඳිද, එහෙයින් සලෙලබයයි කියනු ලැබේ. මේ සියලු තන්හිම මේ ක්‍රමය මයි.

මේ වනාහි විශේෂයයි. පරෙ මිච්ඡාදිට්ඨී යන මෙහි කම්මපථයන්ගේ අන්තයෙහි වූ මිච්ඡාදිට්ඨීයද, මිච්ඡත්තයන්ගේ ආදි මිථ්‍යාදෘෂ්ටියද මිශ්‍රකොට දිට්ඨීය කියන ලද්දාහුයයි දතයුත්තාහුය. මෙහි මේ මිථ්‍යා දෘෂ්ටිය යම්සේද 'සම්මා දිට්ඨී' යයි කී තන්හි සම්මා දිට්ඨීය ද එසේය.

තව ද මෙහි කර්මපථයෝ විස්තර වශයෙන් සම්මා දිට්ඨී සූත්‍රයෙහි මතු ප්‍රකාශ වන්නාහුය. මේ කියන මිච්ඡත්තයන් අතුරෙහි මිථ්‍යා දෘෂ්ටි ආදිහු ද්වෙධාවිතක්ක සූත්‍රයෙහි ප්‍රකාශ වන්නාහුය. මේ කියනු ලබන්නේ මෙහි සංක්‍ෂෙපයෙහි ප්‍රාණය අතිපතනය කෙරෙත්නුයි පාණාතිපාති නම් වෙත් ප්‍රාණඝාත කරන්නාහු යන අර්ථයි. නොදුන් වස්තුව හැර ගණිත්නුයි අදින්නාදායි නම. සොරකම් කරන්නාහු යන අර්ථයි. අශ්‍රේෂ්ඨ වූ, හීන වූ, ලාමක වූ ධර්මයෙහි හැසිරෙත්නුයි අබ්‍රහ්මචාරී නම් වේ. මෙවුන්දම් සෙවනාහු යන අර්ථයි. බ්‍රහ්මං, ශ්‍රේෂ්ඨ වූ පිළිවෙත හැසිරෙත්නුයි බ්‍රහ්මචාරී නම, මෙවුන්දමින් වැළකුණාහු යන අරුති. මෙහිද බ්‍රහ්මචර්යාව සලෙලබ යයි දතයුතු. සැබව, බ්‍රහ්මචර්යා තොමෝ අබ්‍රහ්මචර්යාව මොනවට ලියා සිඳ දමයි. මුසා බෙනෙත් නුයි මුසාවාදී නම් වේ. මෙරමාගේ වැඩ සිඳින්නා වූ හිස් බොරු වූ තෙපුල් කියන්නාහු යන අර්ථයි. පිය සුත්

තෙපුල් ඇත්තේ මොවුන්ට නුයි පිසුණාවාචා නම් වෙති. මෙරමා මර්ම සිඳින්නා වූ අනුන්ට මහා ලජ්ජාව ඇතිකරන්නා වූ, නින්දාජනක පරොස් තෙපුල් මොවුන්ට නුයි ඵරුසාවාචා නම් වේ. සමඵං නම් වූ නිරර්ථක වූ වචනය කියත්නුයි, සමඵපපලාපි නම් වෙති. දැඩි ලෝභය කෙරෙත්නුයි අභිජ්ඣාලු නම් වෙති. පර භාණ්ඩයෙහි ලෝභ කරන සුලුවූවාහු යන අර්ථයි. ව්‍යාපන්න වූ කුණු වූ සිත මොවුන්ට නුයි ව්‍යාපනන චිතතා නම් වෙති. මිථ්‍යා වූ ලාමක වූ නුවණැත්තන් ගරහන ලද දෘෂ්ටිය මොවුන්ට වෙත්නුයි මිචඡාදිටඨී නම් වෙති. කර්මපථයෙහි ඇතුළත් නත්ථිදිනන යනාදිය වස්තුකොට ඇති දෘෂ්ටියෙන් ද, මිචඡතත පරියාපනන වූ නෛර්යාණික නොවූ දෘෂ්ටියෙන් සමනනාගත වූ යන අර්ථයි. යහපත් වූ ශෝභන වූ නුවණැත්තන් පසස්නා ලද දෘෂ්ටිය මොවුන්ට නුයි සමමා දිටඨී නම් වෙති. කමමපථ පරියාපන්න වූ අත්ථිදිනනං යනාදි වූ කමමසසකතා සමමා දිටඨී පරියාපන්න වූ මගග සමමා දිටඨීයෙන් යුක්ත වූ යන අර්ථයි.

මිචඡා සංකපපා යනු යථා තත්ත්වයට විරුද්ධ වූ අනීය්‍යානික වූ අකුසල සංකල්පයෝය. මිචඡාවාචා යනාදියෙහි ද මේ ක්‍රමයමයි. මේ වනාහි විශේෂ්‍යය, මිචඡා සංකල්ප ආදිය මෙන් මිචඡා සති නම් වූ චෙතම කිසිදු ධර්මයෙක් නොමැත. අතීතය සිතන්නහුට වනාහි පවත්නා වූ සතර අකුසල ස්කන්ධයන්ටම මේ නමකි. භාග්‍යවත්හු විසින් යමක් වදාරණ ලදද, අතෙථසා භිකඛවෙ, අනුසසති, නෙසා නත්ථීති වදාමි. පුතතපටිලාභං වා භිකඛවෙ යස පටිලාභං වා භිකඛවෙ, අනුසසරතො, යයි මෙයද ඒ ඒ කරුණ සිතන්නහුට සති ප්‍රතිරූපකයෙන් ඉපදීම සඳහා වදාරණ ලදැයි දතයුතු. මිචඡා ඤාණි, යන මෙහි මිචඡා ඤාණ නම් පාපක්‍රියාවන්හි, උපාය චින්තා වශයෙන් පවිකොට මා විසින් යහපතක් කරන ලදැයි ප්‍රත්‍යවේක්ෂාකාරයෙන් ද, උපන්නා වූ මෝහයයි දතයුතුය. එයින් යුක්ත වූ පුද්ගලයෝ මිචඡාඤාණි නම් වෙති. සමමාඤාණි යන මෙහි එකුන්විසි ප්‍රභේද වූ ප්‍රත්‍යවේක්ෂා ඤාණය 'සමමා ඤාණ' යයි කියනු ලැබේ. එයින් යුක්ත වූ පුද්ගලයෝ සමමා ඤාණි නම් වෙති. මිචඡා විමුතති කෙලෙසුන් කෙරෙන් නොමිදුනේම අපි මිදුනෝ වම්හයි මෙසේ සංඥා ඇත්තාහු, නොහොත් අවිමුතතියෙහි මුත්ති සංඥා ඇත්තාහු එහි මෙම වචනාර්ථයි. වැරදි වූ ලාමක වූ විපරීත වූ විමුත්තිය මොවුන්ට ඇත්නුයි මිචඡා විමුත්ති නම් වෙති. මිචඡා විමුතති යනු ද යථෝක්ත ආකාරයෙන් පැවැත (කෙලෙසුන්ට) අකුසල ස්කන්ධයන්ට නමකි. ඵල සම්පයුත්ත සමමා දිටඨී ආදි අංග අට හැර සෙසු ධර්මයෝ සමමා

විමුත්ති යයි දතයුත්තාහුය. ඔ සම්මා විමුත්ති නොමෝ මිච්ඡා විමුත්ති සල්ලෙබනය කොට (ප්‍රහාණයකොට) සිටි හෙයින් සල්ලෙබ යයි දතයුතුය. එහි, යොදවන සේක් වදාළහ. මයමෙත්ථ සම්මා විමුත්ති භවිස්සාමාති සල්ලෙඛො කරණියො මෙයින් මත්තෙහි වූ තිදෙන නීවරණ වශයෙන් කියන ලද්දාහුයයි දතයුතුය.

අභිජ්ඣාලු බ්‍යාපන්න චිත්තා යයි මෙසේ කම්මපථයන්හි කී බැවින් මෙහි ප්‍රථම නීවරණය නොකියන ලද්දාහු යයි දතයුතුය. ඔවුන් අතුරෙහි ථීන මිද්ධයෙන් වළඳනා ලද්දාහු මඩනා ලද්දාහුනුයි ථිනමිද්ධ පරියුට්ඨිතා නම් වෙති. උද්ධච්චයෙන් යුක්ත වූවාහු නුයි උද්ධතා නම් වෙති. විමසමින් දූකට පැමිණෙත් සනිටුහන් කරන්ට නොහැකි වෙත් නුයි වෙචිකිච්ඡී නම් වෙති.

කොධනා යනාදි (ධර්ම) දසය, චිත්තයාගේ උපක්ලේශ වශයෙන් වදාරණ ලද්දාහුය. ඒ ක්‍රෝධාදීන් අතුරෙහි යමක් කිවයුතු වේද, ඒ සියල්ල ධම්මදායාද වත්ථු සූත්‍රයන්හි කියන ලදී. මේ වනාහි මෙහි වචන අර්ථයි. කොධනා කිපෙනසුලු වූවාහු, උපනාහි නැවත, නැවත සිත බඳිනසුලු වූවාහු, නොහොත් උපනාහය මොවුන්ට ඇත්තේනුයි, උපනාහී නම් වෙති. මක්ඛී යනුද පළාසී යනුද, එසේමැයි. ඊර්ෂ්‍යා කෙරෙත්නුයි ඉස්සුකී නම් වෙති. මසුරුබව කෙරේනුය හෝ ඔවුන්ට මසුරුබව ඇත්තේනුයි මච්ඡරී නම් වේ. වඤ්චා කෙරේනුයි. සඨා නම් වෙති. මනාකොට කථා නොකෙරෙත් යයි කියන ලද වෙයි. කෛරාටික බැවින් යුත්ත වූවන්ට මේ නමකි. මායාව මොවුනට ඇත්තේනුයි මායාවී නම් වෙති. තද ගතියෙන් යුක්ත බැවින් ථද්ධා නම් වෙති. අතිමාන යෝගයෙන් අතිමානී නම් වෙති. කියන ලද්දට විරුද්ධ නයින් කුසල පක්ෂය දතයුත්තේය. දුබ්බචා කියන්ට දුෂ්කර වූවාහු, කියනු ලබන දෙය නොඉවසන. ඊට විපරීත වූවාහු සුබ්බචා, නම් වෙති. දේවදත්ත ආදීන් වැනි වූ ලාමක මිත්‍රයෝ මොවුන්ට වෙත්නුයි පාපමිත්තා නම් වෙති. බුදුවරයෝ හෝ සැරියුත් තෙරුන් වැනි වූ හෝ කළ්‍යාණ මිත්‍රයෝ මොවුන්ටනුයි කළ්‍යාණ මිත්තා නම් වේ. කාය දුෂ්චරිත ආදියෙහි සිත එලවත්නුයි පමත්තා නම් වෙති. විපරීත වූවාහු අප්පමත්තා නම් වෙති යයි දතයුත්තාහුය. මේ තුන ප්‍රකීර්ණ වශයෙන් කියන ලද්දාහුය.

අස්සද්ධා යනාදි පදයෝ සත්දෙන අසද්ධර්ම වශයෙන් කියන

ලද්දාහුය. ඔවුන් අතුරෙහි තුණුරුවන් කෙරෙහි ශ්‍රද්ධාව මොවුන්ට නැත්තේනුයි අසසදධා නම් වෙති.

කුසල පක්‍ෂයෙහි අදහත් නුයි සද්ධා නම් වෙති. ලැජ්ජාව මොවුන්ට නැත්නුයි අහිරිකා නම් වෙති. අකුසල් පැමිණීමෙහි, පිළිකුල් නොකරන්නහුට මේ නමකි. හිරිය (ලජ්ජාව) මොවුන්ගේ සිත්වල ඇත්තේනුයි හෝ ලැජ්ජාවෙන් යුත් සිත් ඇත්තාහු වෙත්නුයි 'හිරිමතා' නම් වෙති. භය නොවෙත් නුයි, අනොතතපපී නම් වෙති. අකුසල් පැමිණීමෙහි භයක් නැත්තේ යයි කියන ලද වෙයි. ඊට විපරීත වූවාහු ඔතතපපී නම් වෙති. අල්ප වූ ශ්‍රවණය ඇසීම මොවුන්ට වෙත්නුයි අපපසසුතා නම් වෙති. මෙහි අල්පයයි, ටිකයයි නොගත යුතුය. නැතයයි ගතයුතුයැ අපපසසුතයෝ වනාහි නිසසුතයෝය. සූත විරහිතයෝය බොහෝ සූතයෝ මොහුට වෙත්නුයි බහුසසුතා නම් වෙති. බුද්ධභාෂිත වූ එක ගාථාවකුදු තත්වූ පරිද්දෙන් දැන ඊට අනුරූප වූ ප්‍රතිපදාවට පැමිණියවුන්ට මේ නමකි.

කුසීත බවට බැසගනිත්නුය කුසිතා නම් වෙති. හීනවූ වීර්ය ඇත්තවුන්ට මේ නමකි. පටන් ගන්නා ලද වීර්ය ඇත්තේ මොවුන්ට නුයි ආරදධ විරිය නම් වෙත්. සම්‍යග් ප්‍රධාන වීර්යයෙන් යුක්ත වූවන්ට මේ නමකි. මොට වූ සිහිය මොවුන්ට වෙත්නුයි මුටඨසසති නම් වෙති. නටුවා වූ සිහි ඇත්තවුන් යයි කියන ලද වෙයි. එළඹ සිටියා වූ සිහිය මොවුන්ට නුයි උපටඨිත සති නම් වෙති. නිතර අමුණ වෙත එළඹ සිටි සිහිය ඇත්තවුන්ට මේ නමකි. දුෂ්ට වූ ප්‍රඥාව මොවුන්ට වෙත් නුයි දුපපඤඤා නම් වෙති. නටුවා වූ ප්‍රඥාව ඇත්තාහු යයි කියන ලද්දාහු වෙති. ප්‍රඥාවෙන් යුක්ත වූවාහු පඤඤා සමපනනා නම් වෙති. ප්‍රඥා යනුවෙන් මෙහි විදර්ශනා ප්‍රඥාව දතයුතුය. යම් හෙයකින් විදර්ශනා සම්භාරය සම්පූර්ණ වූයේ, මෙතැන්හි ආයේ ද එහෙයින් මෝ ප්‍රඥා තොමෝ විදර්ශනා ප්‍රඥාවමැයි. පෞරාණිකයන්ගේ නියමයයි.

දැන් ලෝකෝත්තර ගුණයන්ට අනතුරු කරන්නා වූ ඒ අනෛය්‍යාර්ණික එකම දෘෂ්ටිය තුන් අයුරකින් දක්වනසේක් සන්දිටඨී පරාමාසි යනාදිය වදාළහ. එහි සංදිටඨී (ස්වකීය දෘෂ්ටිය) පරාමර්ශනය කෙරෙත්නුයි සන්දිටඨී පරාමාසී නම් වෙති. දැඩිකොට ගණිත් නුයි ආධානගාහි නම් වෙති. ආධානං යනු දැඩිබව යයි කියනු ලැබේ. දැඩිකොට ගන්නා ලද්දේය යන අර්ථයි. යෝග්‍ය වූ කාරණය දැක ලබ්ධිය දුරලත්නුය

පටිනිසසගගී නම් වෙති. දුකින්, අපහසුතාවයෙන්, කරදරයෙන් බොහෝ කරුණු දක්වාත් දුරලන්නට නොහැකි වෙත්නුයි දුප්පටිනිසසගගි නම් වෙත්. යමෙක් තමාට උපන් දෘෂ්ටිය 'ඉදමෙම සච්චං' මෙයම ඇත්තයැයි දැඩිකොට ගෙන බුද්ධාදීන් විසිනුදු කරුණු දක්වා කියනු ලබන්නාහු නොහරිත්ද, ඔවුන්ට මේ නමකි. එබඳු පුද්ගලයෝ වනාහි යමක් යමක්ම ධර්මය හෝ අධර්මය අසත්ද ඒ සියල්ල මෙසේ අප ඇදුරන් විසින් කියන ලද්දේය. අප විසින් අසන ලද්දේ යයි, ඉදිබු තෙම අවයවයන් සිය කබලෙහි මෙන් ඇතුළතම ප්‍රවේශ කරති. කුම්භීල ග්‍රාහයෙන් ගනිති. අත් නොහරිති. කියන ලද්දට විපර්යාසයෙන් කුසල පක්ෂය දතයුතුය.

චිත්තොද්පාදය

මෙසේ සිවුසාලිස් ආකාරයකින් සලෙලබයන් දක්වා මෙවිට එම සලෙලබයෙහි චිත්තොද්පාදයාගේ ද බොහෝ උපකාර ඇති බව දක්වන්ට චිත්තුප්පාදම්පි බො අහං යනාදිය වදාළහ. එහි අදහසනම්ඃ චුන්දය, මම කුසල ධර්මයන් විෂයෙහි සිත ඉපදවීම පවා බොහෝ උපකාර ඇත්තේ යයි, කියමි. තව ද යම් මේ කයින් වචනයෙන් කිරීමක් වෙත්ද, යම් සේ පළමු සිත උපන්නේ ද, එසේම ඒ ධර්මයන් පිළිබඳව කයින් කිරීමද, වචනයෙන් කරවු යයි ඇණවීමක් හෝ ඉගෙනීම් විචාරීම් ආදියක් හෝ වෙත් ද, ඒ ගැන කියනුම කවරේද? එම ක්‍රියාත්මක වීම්, ඒකාන්තයෙන් බොහෝ උපකාර ඇත්තාහුමැයි දක්වන සේක.

කුමක් හෙයින් මෙහි සිත් ඉපදවීමත් බොහෝ උපකාර ඇත්තේ ද යත්, ඒකාන්තයෙන් හිතසුව එළවන හෙයින් ද, ක්‍රියාත්මක කරන්නවුන්ට හේතුවන බැවින් ද බොහෝ උපකාර ඇත්තේය.

දානයක් දෙමියි සිත පහළවීම තෙමේත් ඒකාන්තයෙන් හිතසුව එළවන්නේ වෙයි. ක්‍රියාත්මක වීමටද එය හේතු වෙයි. මෙසේ උපන් සිත් ඇති බැවින්ම දෙවනදවස් මහාමාර්ග වසා මහමඩුකොට භික්ෂූන් සියයකට හෝ භික්ෂූන් දහසකට හෝ දන් දෙයි. භික්ෂු සංඝයා පවරවු, පුදවු, වළඳවව් යයි පිරිවර ජනයාට අණකරයි. එසේ සංඝයාට සිවුරු සෙනසුන් බෙහෙත් දෙන්නෙමියි සිත පහලවීම් තෙමේත් ඒකාන්තයෙන් හිතසුව එළවයි. සිත ඒ වූ පරිදි ක්‍රියාත්මක වීමටද හේතුවෙයි. එසේ උපන් සිත් ඇති බැවින්ම සිවුරු ආදිය සකස් කෙරෙයි. දෙයි. දෙවන්නේද වෙයි.

සරණාගමන ආදියෙහිද මෙම ක්‍රමයමැයි. සරණයමියි සිත් ඉපදවූ කල්හිම පසුව කයින් හෝ වචනයෙන් සරණ ගනියි. එසේ පසඟ, අටඟ, දසඟ හෝ සීලයක් සමාදන් වන්නෙමියි සිත් උපදවාම කයින් හෝ වචනයෙන් හෝ සමාදන් වෙයි.

පැවිදිව, චතුපාරිසුද්ධි සීලයෙහි පිහිටන්නෙමියි සිත් උපදවාම කයින්ද වචනයෙන් ද පිරිය යුතු සිල් පුරයි. බුදුදහම ඉගෙන ගනිමියි, සිත් උපදවාම එක් නිකායක් හෝ දෙනිකායක් හෝ තුන් නිකායක් හෝ සතර නිකායක් හෝ පස් නිකායක් හෝ වචනයෙන් උගනී.

මෙසේ ධුතාංග සමාදාන, කමටහන් ඉගෙනීම කසිණ භාවනා ධ්‍යාන, සමවත් විදසුන් මගඵල ප්‍රත්‍යෙක බොධි සම්‍යග් සම්බෝධි යන මොවුන්ගේ වශයෙන් දැක්විය යුතුය.

බුදුවන්නෙමියි සිත ඉපදවීමම තෙමේම ඒකාන්ත සුව එළවන්නේ වෙයි. අනුවිධීනනයනට (ඒ අනුව එය සිදුවීමට) හේතු වෙයි. මෙසේ උපන් සිත් ඇත්තේම පසුකලෙක, කල්ප ලක්‍ෂයක් අධිකකොට ඇති සාරාසංඛ්‍යයක් කයින් ද වචනයෙන් ද පෙරුම් පුරා දෙවියන් සහිත ලෝකයා (සසරින්) තරණය කරවමින් හැසිරෙයි. මෙසේ සියලු තැන්හිම චිත්තොාදපාදයද බොහෝ උපකාර ඇත්තේය. කය වචන දෙකින් ක්‍රියාත්මක වීම වනාහි බොහෝ උපකාර ඇත්තේ යයි දතයුත්තේය.

මෙසේ කුසල ධර්මයන්ගේ චිත්තොත්පාදයාගේ ද බොහෝ උපකාර ඇති බව දක්වා දැන් එහි යොදවන සේක් තසමාතිහ චුන්ද යනාදිය වදාළහ. එය අර්ථ වශයෙන් ප්‍රකට වූයේම වෙයි. මෙසේ සිවුසාළිස් අයුරින් දක්වන ලද සලෙලබයෙහි චිත්තොත්පාදයාගේද බොහෝ උපකාර ඇති බව දක්වා දැන් එම සලෙලබයම අධිගමයට හිතවත් වූ මාර්ගය බැව් දක්වන්නේ සෙය්‍යථාපි යනාදිය වදාළහ. එහි අර්ථය නම්, චුන්දය, යම්සේ කණු, කටු ගල් ආදියෙන් විෂම වූ මාර්ගයක් වන්නේද, එම මාර්ගය දුරලීම පිණිස වැලැක්වීම පිණිස අනිත් මනාව පිරියම් කළ, බිම් පෙදෙසක් වැනි සම වූ මාර්ගයක් වන්නේද, නැතහොත්, රුක්මුල් ගල් ප්‍රපාත, කිඹුල් මකර ආදීන් ගැවසීගත් විෂම වූ තොටක් වන්නේ ද, ඒ තොට දුරලීම පිණිස අතහැර දැමීම පිණිස අන්‍ය වූ විෂම නොවූ පිළිවෙලින් ගැඹුරු වූ තොටක් වන්නේ ද, යම් තොටකට පිළිපන්නේ සුවසේම එම

නදියට හෝ එම තඩාගයට හෝ බැස නාන්නේ හෝ එතර වන්නේ හෝ වේද, චුන්දය, එපරිද්දෙන්ම විෂම මග විෂම තොට වැනි වූ විහිංසාවෙන් යුතු විහිංසක පුද්ගලයාගේ එම විහිංසාව දුරලීම පිණිස සම වූ මග සම වූ තොට වැනි වූ අවිහිංසාව වෙයි. ඒ එසේමැයි, විෂම වූ මග හා තොට දුරලීම පිණිස සම වූ මාර්ගයද තීර්ථයද යම්සේ පිළියෙල කරන ලදද, එසේ විහිංසාව දුරලීම පිණිස අවිහිංසාව පිළියෙල කරන ලද්දීය. හෙතෙම යම් අවිහිංසාවකට පිළිපන්නේ සුවයේම මනුෂ්‍ය ගතියට හෝ දේවගතියට පැමිණ සැපත් අනුභව කරන්නේ හෝ ලෝකයෙන් එතර වන්නේ හෝ වේද මේ ක්‍රමයෙන් සියලු පදයෝ යෙදිය යුත්තාහුය. මෙසේ ඔහුගේම අධිගමයට හිතවූ මාර්ගය බැව් දක්වා උපරිභාවයට යායුතු බව දක්වන සේක්, සෙය්‍යථාපි යනාදිය වදාළහ. එහි අර්ථය නම්,

චුන්‍දය, යම්සේ වනාහි පටිසන්ධිය ගෙනදෙන්නා වූ හෝ පටිසන්ධිය ගෙන නොදෙන්නා වූ හෝ දුන් පටිසන්ධියට විපාක ගෙන දෙන්නා වූ හෝ නොදෙන්නා වූ හෝ යම්කිසි අකුසල ධර්ම කෙනෙක් වෙත් ද, ඒ සියල්ලෝ ජාති වශයෙන් අධෝභාවයට යායුත්තාහු නුයි, එබඳු නම් ඇත්තාහුම වෙත් ද, විපාක කාලයෙහි අනිෂ්ට වූ අකාන්ත වූ විපාක දෙන බැවිනි.

තව ද, යම්සේ පටිසන්ධි ගෙනදෙන්නා වූ හෝ නොදෙන්නා වූ හෝ දුන් පටිසන්ධියට විපාක දෙන්නා වූ හෝ නොදෙන්නා වූ යම්කිසි කුසල ධර්ම කෙනෙක් වෙත්ද, ඒ සියල්ලෝම ජාති වශයෙන් උපරිභාවයට යායුත්තාහුනුයි එබඳු නම් ඇත්තාහුම වෙත් ද, විපාක කාලයෙහි ඉෂ්ට වූ කාන්ත වූ විපාක ඇති බැවිනි. එව මෙව ඛො චුන්‍ද විහිංසකසස -පෙ- උපරිභාවය එපරිද්දෙන්ම චුන්‍දය, විහිංසක වූ -පෙ- උපරිභාවය පිණිස වේයයි.

මේ මෙහි උපමා සසන්දනයයි. යම්සේ සියලු අකුසල ධර්මයෝ අධෝභාවයට පැමිණිය යුත්තාහුද එසේ විහිංසක වූ පුද්ගලයා හට හුදු විහිංසා තොමෝම අධෝභාව ගමනීය වෙයි. යම්සේ සියලු කුසලයෝ උපරිභාවයට පැමිණිය යුත්තාහු වෙත්ද, එසේ අවිහිංසක වූ පුද්ගලයාට හුදු අවිහිංසාවම උපරිභාව ගමනීය වෙයි. මේ ක්‍රමයෙන්ම අකුසලය, අකුසලය සමගද කුසලය කුසලය සමගද උපමා කටයුතුයි. මේ වනාහි මෙහි අදහසයි. මෙසේ ඒ සලෙලඛයන් විසින්ම උපරිභාවයම යායුතු

බැව් දක්වා දැන් පරිනිර්වාපණයෙහි (සම්පූර්ණයේ නිවීමෙහි) සමර්ථ බව දක්වන්ට සො වත චුන්ද යනාදිය වදාළහ.

එහි සො යනු කිවයුතු ආකාර වූ පුද්ගලයා දැක්වීමයි. ඒ දේශනාවෙහි සො යන මෙම උද්දේශ වචන ගෙන යො අත්තනා පලිපපලිපනෙනා සොවත චුන්ද, පරං පලිපපලිපන්නං උද්ධරිස්සති යයි මෙසේ සියලු තන්හි පද සම්බන්ධය දතයුතු.

පලිපපලිපනෙනා යනුවෙන් ගැඹුරු මඩෙහි ගිලුනේ යයි කියනු ලැබේ. ආර්ය විනයෙහි එසේ කියනු නොලැබේ. ආර්ය විනයෙහි පලිපං යනුවෙන් පස්කම් ගුණයෝ කියනු ලැබෙත්. පලිපනෙනා යනු එහි ගැලුනා වූ බාල පෘථජ්ජන තෙම කියනු ලැබේ. එහෙයින් මෙසේ මෙහි අර්ථ යෝජනා දතයුත්තීය.

චුන්දය, යම්සේ කිසි පුරුෂයෙක් නැහැය අග දක්වා ගැඹුරු මඩෙහි ගැලුනේ අන්‍ය වූත් එහිම ගැලුන කෙනෙකු අත හෝ හිස හෝ ගෙන ගොඩ ගන්නේය යන මේ කාරණය නොවන්නේය. යම් හෙයකින් හෙතෙම ඔහුව ගොඩගෙන පොළොවෙහි තබන්නේ ද යන්නට හේතුවක් නැත.

එසේම යමෙක් තමා පංචකාම ගුණ නමැති මඩෙහි ගැලුනේ හෙතෙම එහිම ගිලුන අනිකෙකු ගොඩ ගන්නේය යන මෙයට හේතුවක් නැත්තේය. (ගොඩ ගැනීම නොවන්නේමය) මෙය ඉහි චෝදනාවක් වශයෙන් වන්නේය. මෙය නොයෙදෙයි.

පුහුදුන් වූ භික්ෂු - භික්ෂුණී උපාසක උපාසිකාවන්ගේ ද ධර්ම දේශනාව අසා දහම් අවබෝධ කරන්නාහු වෙත්මය. පස්කම් ගුණයෙහි ගැලුනේ අන්‍යයන් නගා සිටුවා යයි එය එසේ නොදත යුතුය. ඒ එසේමැයි. භාග්‍යවත්හුම, එහි නගාසිටුවීම කෙරෙති.

ධර්මකථිකයෝ (අකුසල පක්ෂයෙහි) ප්‍රශංසා මාත්‍රයක්ව ලබති. රජු විසින් යවන ලද හසුන කියවන්නෙකු මෙනි. එය එසේමැයි, රජු විසින් ප්‍රත්‍යන්ත ජපදයකට යවන ලද ලියමනක් එහි මනුෂ්‍යයෝ ලියමන කියවන්ට නොදන්නාහු යමෙක් කියවන්ට දන්නේ ද ඔහු ලවා කියවාගෙන එහි අර්ථය අසා යම්සේ රජුගේ ආඥාව යයි ආදරයෙන් සම්පාදනය

කෙරෙත් ද, මේ අනුව ලියවන කියවන්නාගේ යයි ඔවුන්ට සිතක් නොද වේද, ලියුම කියවන්නා වනාහි කෙලතොලු නොවූයේ නොපැකිලෙන වචනයෙක් කියවන්නේ යයි පැසසුම් පමණක් ලබන්නේද, එපරිද්දෙන්ම කිසිසේත් ශාරිපුත්‍ර ආදි ධර්ම කථිකයෝ ධර්මදේශනා කෙරෙත්ද, එතකුදු වුවත් ඔවුහු ලියූ පතක් කියවන්නවුන් මෙන් නොවෙති. එම දේශනා තොමෝ භාග්‍යවතුන් වහන්සේගේම වෙයි. රජුගේ ආඥාව මෙනි. යමෙක් තුමූ එම දහම් අසා අවබෝධ කෙරෙත් ද, භාග්‍යවතුන් වහන්සේම ඔවුන් නගාසිටුවන සේකැයි දතයුතුයැ. ධර්ම කථිකයෝ වනාහි කෙලතොලු නොවූ ඒ ඒ තැන නොපැකිලෙන වචනයෙන් දහම් දෙසත්යයි පැසසුම් පමණක්ම ලබත් යයි කියන ලදි. එහෙයින් මෙහිදී තෙල වචනය යෙදේමය. කියන ලද්දට විපර්යාස වශයෙන් කුශල පක්‍ෂයෙහි දතයුතුයැ.

අදනෙතා, අවිනීතො, අපරිනිබ්බුතො යන මෙහි විස සහිත බැවින් (=අනිබ්බියතාය) අදාන්ත නම් වේ. නොහික්මුණු විනය ඇති බැවින් අවිනීත නම් වේ. නො නිවූ කෙලෙස් ඇති බැවින් අපරිනිබ්බුත නම් වේ යයි දතයුතුයැ. එබඳු වූ එම පුද්ගල තෙම මෙරමා දමෙසසති විෂ රහිතයෙකු කරන්නේය. විනෙසසති, ත්‍රිවිධ ශික්‍ෂාවෙන් හික්මවන්නේය. හෝ පරිනිබ්බාපෙසසති, ඔහුගේ කෙලෙසුන් පරිනිර්වාණට කරවන්නේය යන මේ කාරණය නොවන්නේය කියන ලද්දට විරුද්ධ වශයෙන් කුසල පක්‍ෂය දතයුතු යැ.

එවමෙව බො චුන්ද, විහිංසකසස -පෙ- පරිනිබ්බානාය

මෙහි වනාහි මෙසේ අර්ථය දතයුතුයැ. තමා පලිප නම් වූ පඤ්චකාම ගුණයෙහි නො ගැලුනේ පඤ්චකාම ගුණයෙහි ගැලුනාහු මෙරමා නගනේය. තමා දැමුනේ මෙරමා දමනය කරන්නේය, තමා හික්මුනේ මෙරමා හික්මවන්නේය. තමා පිරිනිවියේ මෙරමා පරිනිර්වාණය කරවන්නේය, යන මේ කාරණය මෙසේ විද්‍යමාන වන්නේ ද ඒ කාරණය කුමක්ද යත්, පස්කම් ගුණයෙහි නොගැලුණු බවද, දැමුණු බවද හික්මුණු බවද, පිරිනිවි බවද වේ.

එපරිද්දෙන්ම චුන්දය, විහිංසක වූ පුරුෂ පුද්ගලයාගේ අවිහිංසා තොමෝ පරිනිර්වාණය පිණිස වේ. කුමක් කියන ලද්දේද, යමෙක් තමා අවිහිංසක වූයේ, ඔහුගේ යම් අවිහිංසාවක් වේද, මෝ අවිහිංසක වූයේ,

ඔහුගේ යම් අවිහිංසාවක් වේද, මෝ අවිහිංසා තොමෝ විහිංසකව වූ මෙරමාගේ යම් මේ විහිංසාවක් වේද, ඒ විහිංසාවගේ පිරිනිවීම පිණිස වෙයි. තමා අවිහිංසක වූයේ අන්‍යයන්ගේ විහිංසා චේතනාව නිවන්නේය යන, මේ කාරණය වන්නේය. ඒ කාරණය කුමක්ද යත්, අවිහිංසක බව මැයි. එය එසේමැයි. යම්හෙයකින් තමා යමක් අධිගමය කරන ලද්දේද, හෙතෙම අන්‍යයන් එහි යොදවන්ට හැකිවෙයි.

නැතහොත් තමා පස්කම් ගුණයෙහි නොගැලුනේ දැමුනේ හික්මුනේ පිරිනිවියේ, පස්කම් ගුණයෙහි ගැලුනා වූ නොදැමුනා වූ නොහික්මුනා වූ නොපිරිනිවියා වූ අන්‍යයා පස්කම් ගුණයෙන් නගා සිටුවන්නේය. (ත්‍රිවිධ ශික්‍ෂාවෙහි) හික්මවන්නේය. දමනය කරන්නේය පරිනිර්වාණය කරවන්නේය යන මේ කාරණය යම්සේ විද්‍යමාන වේද, එපරිද්දෙන් විහිංසක වූ විහිංසා-ප්‍රහාණය පිණිස මාර්ගය වඩන්නා වූ පුරුෂයා හට උපන් අවිහිංසා තොමෝ පරිනිර්වාණය පිණිස වෙයි. ඒ එසේමැයි. පරිනිර්වාණය නොකළ එකක්හු, පරිනිර්වාණය කළ එකෙකු මෙන් අවිහිංසා චේතනා තොමෝ මේ විහිංසා චේතනාව පරිනිර්වාණය කරවන්ට සමර්ථ වන්නීය. මේ අර්ථය දක්වන්නාහු එව මෙව බො චුන්ද, මෙසේ වදාළහයි. මෙසේ මෙහි අර්ථය දතයුත්තේය. මෙහි යම් සේද, එසේ සියලු පදයන්හි අරුත් දතයුතුයැ. විස්තරය දීර්ඝ වේය යන හයින් අනුපද යෝජනා (පදයක් පාසා යෙදීම) නොකරන ලද්දීය. මෙසේ ඔහුගේ පරිනිර්වාණයෙහි සමර්ථ බැව් දක්වා මෙවිට එම දේශනාව නිගමනය කොට දහම් පිළිවෙතෙහි යොදවන්ට ඉති බො චුන්ද යනාදිය වදාළහ.

එහි **සලෙලඛ පරියායො** සල්ලේඛ කාරණය සියලු තන්හි මේ ක්‍රමයමයි. මෙහි අවිහිංසාදීහුම විහිංසාදීන්ගේ සලෙලඛනය කරන හෙයින් සලෙල්ඛකාරණය වෙයි. ඔවුන් වශයෙන් සිත් ඉපදවීම කළයුතු බැවින් චිත්තුප්පාද කාරණය වේ. විහිංසාදීන්ගේ දුරලීමට හේතුව වග බැවින් පරික්කමන කාරණය වේ. ස්වර්ගාදි උපරිභාවය නිෂ්පාදනය කරන හෙයින් උපරිභාව කාරණය වේ. විහිංසාදීන්ගේ පරිනිර්වාණය කරවන හෙයින් පරිනිර්වාණ කාරණය වේයයි දතයුත්තාහුය.

**හිතෙසිනා** හිත සොයන්නහු **අනුකමපකෙන** අනුකම්පා කරන්නා වූ **අනුකමපං උපාදාය,** අනුකමපා සිතින් ගෙන සඳහා යයිද කියන ලද වෙයි. **කතං වො තං මයා** මේ කරුණු පස දේශනා කරන්නා වූ මා විසින්

එය තොපට කරන ලදී. යම් මේ අවිපරීත දේශනාවක් වන්නී ද, මෙපමණකින්ම අනුකම්පා කරන ශාස්තෘහුගේ කෘත්‍යය වෙයි. මින් මතුයෙහි ප්‍රතිපත්තිය නම් ශ්‍රාවකයන්ගේ කෘත්‍ය වෙයි. එහෙයින් වදාළහ.

**එතානි චුන්ද රුක්ඛමූලානි -පෙ- අම්හාකං අනුසාසනී,** යන එහි **රුක්ඛමූලානි -පෙ- අම්හාකං අනුසාසනී,** දක්වන සේක, **සුඤ්ඤාගාරානි** යන මෙයින් ජනයාගෙන් වෙන් වූ ස්ථානය දක්වන සේක. තව ද පද දෙකෙන්ම යෝගාවචරයනට සුදුසු වූ සේනාසනය ප්‍රකාශ කරන සේක. දායාදය පාවාදෙන සේක. ඣායථ අටතිස් අරමුණු, (ආරම්මණ උපනිජ්ඣාන) අරමුණ නැවත නැවත සිතීම මෙන් ද, අටතිස් අරමුණෙන් ද ලක්ඛණූපනිජ්ඣානයෙන් (ලක්‍ෂණ නිතර නිතර සිතීමෙන් ද, අනිත්‍යාදි වශයෙන් ඛන්ධ-ධාතු-ආයතන ආදීන්ගේ ලක්‍ෂණ නැවත නැවත සිතීමෙන් ද ධ්‍යාන කරවු. සමථය ද, විදර්ශනාව ද වඩවු යයි කියන ලද්දේ වෙයි. **මා පමාදත්ථ** පමා නොවවු. **මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ** යමෙක් පෙර තරුණ කාලයෙහි ද, නිරෝග කාලයෙහි ද සප්තවිධ සැපසම්පත් ඇතිකල්හිද, යෝනිසො මනසිකාරයෙන් වෙන් වූවාහු රෑදාවල මකුණුබත්ව, ශයන සුඛය, නිද්‍රාසුඛය අනුභව කරමින් ප්‍රමාද වෙත්ද, ඔවුහු පසුව ජරාවට පැමිණි කල්හිද, රෝග ඇති කාලයෙහි ද ශාස්තෘන් පිරිනිවි කල්හිද ඒ පෙර ප්‍රමාද විහරණය සිහි කරමින් පිළිසිඳ සහිත කාලක්‍රියාවද බරක් කොට දක්වන්නාහු විපිළිසර ඇත්තාහු වෙති. තෙපි වනාහි එබඳු වූවෝ නොවවු යයි මේ අරුත දක්වමින් වදාළහ. **මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ** යයි **අයං වො අම්හාකං අනුසසනී, ඣායථ, මා පමාදත්ථ** ධ්‍යාන වඩන්න පමා නොවන්න. මේ වූ කලී අප හමුවෙන් තොපට අනුශාසනාය අවවාදයයි කියන ලද්දේ වේ.

**සල්ලෙඛ සූත්‍ර වර්ණනාව නිමි.**

## 1-1-9

**එවං මෙ සුතං,** සම්මා දිට්ඨී සූත්‍රයයි. එහි **සම්මා දිට්ඨී සම්මා දිට්ඨීති ආවුසො වුච්චති කිත්තාව නුඛො ආවුසොති වා කතමං පනාවුසො අකුසලං**

යනුවෙන්, මෙසේ තෙරුන් විසින් යම්පමණ ප්‍රශ්න වදාරණ ලද්දාහුද, ඒ සියල්ල කථෙතු කම්‍යතා පුච්ඡාම වෙති. ඔවුන් අතුරෙහි යම්හෙයකින් දන්නාහුද නොදන්නාහු ද, බාහිරකයෝද, ශාසනිකයෝ ද අනුස්සව ආදීන් (පරපුරෙන් ආසන ලද) තමා ප්‍රත්‍යක්‍ෂ කිරීම් වශයෙන් ද, සම්මා දිට්ඨි යයි කියති. එහෙයින් ඒ බොහෝ දෙනාගේ වචනය ගෙන දෙවරක් ස්පර්ශ කරමින්, සම්මා දිට්ඨි, සම්මා දිට්ඨි ආවුසො වුච්චනති වදාළහ. මේ වූකලී මෙහි අදහසයි. අන්‍යයන් විසින් ද 'සම්මා දිට්ඨි' යයි කියනු ලැබේ. එයින් අන්‍යයන් විසින් ද සම්මා දිට්ඨියයි කියනු ලැබේ.

මේ මෙසේ කියනු ලබන්නේ අර්ථයද, ලක්‍ෂණයද ගෙන, ඇවැත්නි, ආර්ය ශ්‍රාවක තෙම කොපමණකින් සම්මා දිට්ඨි ඇත්තේ වේදැයි, එහි සම්මා දිට්ඨි යනු සෝභන වූ ද, ප්‍රශස්ත වූ ද දෘෂ්ටියෙන් යුක්ත වූයේ යම්කලෙක්හි ධර්මයෙහිම මේ සම්මා දිට්ඨි ශබ්දය පවතී ද, එකල්හි එමම දෘෂ්ටියට, සෝභන වූ ද ප්‍රශස්ත වූ ද දෘෂ්ටිය 'සම්මා දිට්ඨි' යයි මෙසේ අර්ථය දතයුතුයැ. ඕ තොමෝ සම්මා දිට්ඨි තොමෝ දුවිධ වන්නීය. ලෞකික ලෝකෝත්තර කියා,

එහි කම්මසසකත ඤාණය, සච්චානුලොම ඤාණය ලෞකික සම්මා දිට්ඨි නම් වේ. සංක්‍ෂේප වශයෙන් සියලුම ආශ්‍රවයන්ට ප්‍රත්‍ය වූ පඤ්ඤාවයි. අරිය මග්ගඵල සම්පයුත්ත වූ පඤ්ඤාව ලෝකෝත්තර සම්මා දිට්ඨි නම් වේ.

සම්මා දිට්ඨි පුද්ගලයා ත්‍රිවිධ වේ. පුථුජ්ජන සේඛ, අසේඛ යනුවෙනි. එහි පුථුජ්ජන සම්මා දිට්ඨිකයාද දුවිධ වේ. බාහිරක, ශාසනික වශයෙනි. එහි බාහිරක තෙමේ, කම්මවාදි කම්මසසකත දිට්ඨියෙන් සම්මාදිට්ඨික වූයේ වෙයි. සච්චනුලෝමික දිට්ඨියෙන් නොවේ. ආත්ම දෘෂ්ටිය පරාමර්ශනය කරන හෙයින් ශාසනික තෙම මෙම දෘෂ්ටි දෙකෙන්ම සම්මදිට්ඨික වූයේ වෙයි. සේඛ තෙමේ නියත වූ සම්මා දිට්ඨියෙන් යුක්ත වූයේ වෙයි. මෙහි වනාහි නියත වූ නීය්‍යානික වූ ලෝකෝත්තර කුසල් සම්මා දිට්ඨියෙන් යුක්ත වූයේ වෙයි. සම්මා දිට්ඨි යයි අදහස් කරන ලදී. එහෙයින්ම වදාළහ, උජුගතාසස දිට්ඨි, ධම්මෙ අවෙච්චපපසාදෙන සමනනාගතො ආගතො ඉමං සද්ධම්මං යනුවෙන් ලෝකෝත්තර කුසල සම්මා දිට්ඨියම අන්ත දෙකට නොපැමිණ ඍජු භාවයට ගිය හෙයින් කාය වංකාදී වූ සියලුම වංකයන් මුල්සිඳ ගිය හෙයින් ඍජුව ගියා වෙයි.

එම දෘෂ්ටියෙන්ම යුක්ත වූයේ නවාකාර වූ ලෝකෝත්තර ධර්මයෙහි අවෙච්චප්පසාදයෙන් අචල ප්‍රසාදයෙන් සමන්නාගත වූයේ වෙයි. සියලු දෘෂ්ටි ග්‍රහණයන් ද අවුල් හරිමින් සියලු කෙලෙසුන් දුරුකරමින් ජාති සංසාරයෙන් නික්මෙන්නේ ප්‍රතිපත්ති නිමාවට පත් කරවමින් ආරිය මාර්ගයෙන් පැමිණියේ සම්මා සම්බුදුරදුන් විසින් ප්‍රකාශ කොට වදාළ අමතොගධ නම් වූ ද නිබ්බාන නම් වූද සද්ධර්මයට පැමිණියේ යයි කියනු ලැබේ.

## කම්මපථ වාරය

යථොබො, මෙය කාලය වෙන්කිරීමේ වචනයකි. යම් කාලයකැයි කියන ලද්දේ වෙයි. අකුසලඤ්ච පජානාති දස අකුසල කම්මපථ නම් වූ අකුසලයද නිරෝධය අරමුණුකොට ඇති, ප්‍රඥාවෙන් මේ දුකයයි ද කෘත්‍ය වශයෙන් ප්‍රතිවේධ කරන්නේ දැනගනී. අකුසල මූලඤ්ච පජානාති, එය මූල ප්‍රත්‍ය වූ ද අකුසලය ද දැන ගනී. මේ අයුරින් දුක්ඛ සමුදය යයි ප්‍රතිවේධ කරන්නේ දැනගනී. කුසලඤ්ච කුසල මූලඤ්ච යන මෙහිද මේ ක්‍රමයමැයි. මෙහි යම්සේද, මෙයින් මත්තෙහි සියලු වාරයන්හි කෘත්‍ය වශයෙන්ම වස්තු දැනගැනීම දතයුතුය. එත්තාවතාපි මෙපමණකින් මෙම අකුසල ආදීන් දැනගැනීමෙන් සම්මාදිට්ඨී හොති ඉහත දැක්වූ ආකාරයෙන් ලෝකෝත්තර සම්මා දිට්ඨීයෙන් යුක්ත වූයේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු වූයේ -පෙ- නිර්වාණ සංඛ්‍යාත සද්ධර්මයට පැමිණියේ වේයයි මෙතෙකින් සංක්ෂිප්ත වූ දේශනාව නිමවන්නීය. දේශනාව සංක්ෂිප්ත වුවද ඒ භික්ෂූන්ගේ මනසිකාර ප්‍රතිවේධය විස්තර වශයෙන්ම දතයුතුය.

දෙවන වාරයෙහි දේශනාවද විස්තර වශයෙන් පැවතිනැයි මනසිකාර ප්‍රතිවේධයද විස්තර වශයෙන් පැවතිනැයි දතයුතුය. එහි සංක්ෂිප්ත දේශනාවෙහි යට දෙමග ද විස්තර දේශනාවෙහි මතුදෙමග ද වදාරණ ලද්දාහු යයි භික්ෂූහු කීවාහුය. විස්තර දේශනාවගේ අවසානයෙහි සබ්බසො රාගානුසයං පහාය යනාදි වචන දක්නා වූ භික්ෂූහු කීවාහුය. එතෙකුදු වුවත් තෙරණුවෝ සංක්ෂිප්ත දේශනාවෙහිද විස්තර දේශනාවෙහිද සතර මාර්ගයෝ රාශි වශයෙන් වදාරණ ලද්දාහුයයි කීහ. මෙහි සංක්ෂිප්ත විස්තර දේශනාවන්හි යම් මේ විචාරීමක් පහල කරන ලද්දීද ඕ තොමෝ සියලු වාරයන්හි මෙකී නයින්ම දතයුත්තීය. මෙයින් මතු අපූර්ව අප්‍රකට පද වර්ණනා පමණක් කරන්නෙමු. එහි ප්‍රථම වාරයාගේම විස්තර

දේශනාවෙහි පාණාති පාතො ඛො ආවුසො අකුසලං යනාදි තැන්හි අසමත් බැවින්, (නොවියත් බැවින්) අකුසලයයි දතයුතුය. කුසලයට ප්‍රතිපක්ෂ වශයෙන් හෝ අකුසලය දතයුතුය එය ලක්ෂණ වශයෙන් සාවද්‍ය ලක්ෂණ, දුක්ඛ විපාක ලක්ෂණ සංක්ලේශ ලක්ෂණ හෝ වෙයි. මෝ තොමෝ වනාහි මෙහි සාධාරණ වූ පද වර්ණනාවයි.

## කායකම්ම පාණාතිපාතය

අසාධාරණ පදයන්ගේ වනාහි ප්‍රාණයාගේ අතිපාතය (හෙළීම, නැසීම) පාණාතිපාත නම් වේ. ප්‍රාණ වධය, ප්‍රාණඝාතය යයි කියන ලද්දේ වෙයි. 'පාණො' යනු මෙහි ව්‍යවහාර වශයෙන් සත්ත්වයෙකි. පරමාර්ථ වශයෙන් ජීවිතින්ද්‍රියයි. ඒ ප්‍රාණියා කෙරෙහි ප්‍රාණියෙකැයි යන සංඥා ඇත්තහුගේ ජීවිතය සිඳින්නා වූ උපක්‍රමයෙන් උපදවන ලද කාය වාග් ද්වාරයන් අතුරෙන් එක්තරා ද්වාරයෙක්හි පැවැති වධක චේතනා තොමෝ පාණාතිපාත නම්. එම ප්‍රාණඝාතය තෙම ගුණ විරහිත වූ තිරශ්චීනගතාදි ප්‍රාණීන් අතුරෙන් කුඩා ප්‍රාණයෙහි අල්පසාවද්‍යය මහත් වූ ශරීරයෙහි මහා සාවද්‍යය. කුමක්හෙයින්ද යත් ප්‍රයෝග මහත් බැවිනි. ප්‍රයෝග සමව ඇතිකල්හිදු වස්තුහුගේ මහත් බැවිනි.

ගුණවත් වූ මනුෂ්‍යයන් අතුරෙහි මදගුණ ඇති ප්‍රාණයෙහි අල්පසාවද්‍යය. මහත් වූ ගුණ ඇති ප්‍රාණයෙහි මහාසාවද්‍යය. ශරීර ගුණයන්ගේ සමබව ඇතිකල්හි ක්ලේශයන්ගේද, උපක්‍රමයන්ගේද මෘදු බැවින් අල්පසාවද්‍ය වෙයි. තීව්‍ර බැවින් මහාසාවද්‍ය වේයයි දතයුතුය. ඒ ප්‍රාණඝාතයාගේ අංග පසක් වෙති. ප්‍රාණියෙකු වීම, ප්‍රාණියෙකු යන සංඥාව, වධකචිත්තය, උපක්‍රමය එයින් මරණය සිදුකිරීම යනුයි.

සාහත්ථික, ආණත්තික, නිස්සග්ගිය, ථාවරය, විජ්ජාමය, ඉද්ධිමය යයි ප්‍රයෝග සසක් වෙති. යම්හෙයකින් මෙම අර්ථය විස්තර කරනු ලබන කල්හි ඉතා ප්‍රපඤ්චව වේද, එහෙයින් එයද මෙබඳු වූ අන්‍ය විස්තර ද නොකරමු. විස්තර වශයෙන් සමන්තපාසාදිකා විනය අටුවාව බලා දතයුතුය.

## අදින්නාදානය

නොදුන් වස්තූන්ගේ ගැනීම අදින්නාදාන නම් වේ. අනුන්ගේ වස්තුව පැහැරගැනීම ථෙය්‍ය යයි ද, චොරකම්ම යයි ද කියන ලද්දේ වෙයි. එහි අදින්නං යනු අනුන් අයත් වූ යම් වස්තුවෙක්හි, අනිකෙක් රුචි

පරිද්දෙන් කරන බවට පැමිණෙන්නේ, දඬුවමට නොසුදුසු වූයේත් උපවාදයෙන් මිදුනේත් වේද, ඒ පරා අයත් වස්තුවෙහි පරා අයත් යයි යන සංඥා ඇත්තහුගේම ඒ වස්තුව ගැනීම පිණිස වූ උපක්‍රමයෙන් උපදවන ලද ථෙය්‍ය චේතනා තොමෝ අදින්නාදාන නම් වේ.

එහි හීන වූ පරසතු භාණ්ඩයෙහි අල්ප සාවද්‍ය වේ. ප්‍රණීත වූ භාණ්ඩයෙහි මහාසාවද්‍ය වේ. කුමක් හෙයින්ද යත් වස්තුහුගේ ප්‍රණීත බව නිසාය. වස්තූන්ගේ සමබව ඇතිකල්හි ගුණයෙන් වැඩි සිටියන් සතු වස්තුවෙහි මහාසාවද්‍ය වේ. එම අදත්තාදානයට අංග පසක් වෙති.

මෙරමා සතු වස්තුවක් වීම, අනුන්ට අයත්ය යන සංඥාව ඇති බව, සොරසිත, උපක්‍රමය එම උපක්‍රමයෙන් පැහැරගැනීම යනුයි.

ප්‍රයෝග සයක් වෙති. සාහත්ථික ආදියමැයි. ඔවුහුද යෙදෙන පරිද්දෙන්, ථෙය්‍යාවහාරය, පසය්හාවහාරය, පටිච්ඡන්නාවහාරය, පරිකප්පාවහාරය, කුසාවහාරය යන මේ අවහාරයන්ගේ වශයෙන් පැවැත්තාහු යයි මේ සංක්ෂෙපයන් විස්තර වනාහි සමන්තපාසාදිකාවෙහි කියන ලදී.

**කාම මිත්‍යාචාරය**

කාමෙසු මිච්ඡාචාරො යන මෙහි කාමෙසු යනු මෛථුන සමාචාරයන්හි මිච්ඡාචාරො යනු ඒකාන්තයෙන් නිහිත වූ ලාමක වූ හැසිරීම ලක්ෂණ වශයෙන් වනාහි අසද්ධර්මයෙහි හැසිරෙන අදහසින් කායද්වාරයෙහි පැවැති මාතුරක්ඛිතාදී නොයායුතු ස්ථානයන් ව්‍යතික්‍රමණය කරන චේතනා තොමෝ කාමෙසු මිච්ඡාචාර නම් වේ. එහි පුරුෂයන්ට නොයායුතු ස්ථාන නම්, පළමුකොට 'මව විසින් රක්නා ලද්දීය.' 'පියා විසින් රක්නා ලද්දීය.' 'මව්පිය දෙදෙනා විසින් රක්නා ලද්දීය.' 'බෑයා විසින් රක්නා ලද්දීය.' 'බූනණිය විසින් රක්නා ලද්දීය.' 'නෑයන් විසින් රක්නා ලද්දීය.' 'ගෝත්‍රයෙහි වූවන් විසින් රක්නා ලද්දීය.' 'සහදැමියන් විසින් රක්නා ලද්දීය.' ආරක්ෂා සහිත වූවායැ. දණ්ඩ නිග්‍රහ සහිත වූවායැ යන මේ මාතු රක්ඛිත පටවාසිනී ඔදපත්තකිනී ඔහත චුම්බටා, දාසීච භරියා, කම්මකාරීච භරියා, ධජාහටා මුහුත්තිකා ආදි දසදෙන යයි විසි ස්ත්‍රීහු ද, ස්ත්‍රීන් අතුරෙහි වනාහි, සාරක්ඛ සපරිදණ්ඩ දෙදෙනාට ද ධනක්කීතාදි දසදෙනාට ද යන දොලොස් ස්ත්‍රීන්ට සෙසු පුරුෂයෝ ද

අගමනීයස්ථාන නම් වේ. හේ මේ මිථ්‍යාචාරය ශීලාදිගුණ රහිත වූ අගමනීයස්ථානයෙහි අල්ප සාවද්‍යයැ. ඒ කාම මිථ්‍යාචාරයට අංග සතරක් වෙති. නො එළඹිය යුතු වස්තුවෙක. එහි සේවනය කිරීමේ සිතය. සේවනය පිණිස ප්‍රයෝගය. මාර්ගයෙන් මාර්ගය ප්‍රතිපාදනය ඉවසීම කියාය. එක් ප්‍රයෝගයකි. සාහත්ථික මැයි.

### වචීකම්ම

මුසා යනු විසංවාද (=අසත්‍ය වූවක් සත්‍ය ලෙස කීම) පෙරටුකොට ඇත්තහුගේ අර්ථ නසන්නා වූ වාග් ප්‍රයෝගය හෝ කායප්‍රයෝගය හෝයි. ඔහු විසින් බොරුවක් කියන අදහසින් මෙරමා රවටන කාය වාක් ප්‍රයෝගයෙන් උපදවන ලද චේතනා තොමෝ මුසාවාද නම් වේ. අනිත් ක්‍රමයක් කියනු ලැබේ. මුසා යනු අභූත වූ අතථ්‍ය වූ වස්තුවය. වාදො යනු ඒ වස්තුව භූත වශයෙන් තථ්‍ය වශයෙන් දැක්වීමයැ. ලක්‍ෂණ වශයෙන් වනාහි, අතථ්‍ය වූ වස්තුව තථ්‍ය වශයෙන් අන්‍යා හට දක්වනු කැමැත්තහුගේ එබඳු වූ විඥප්තියෙන් උපදවන ලද චේතනා තොමෝ මුසාවාද නම් වේ. ඒ මුසාවාදය තෙම යම් අර්ථයක් නසා ද, ඒ අර්ථයාගේ අල්ප භාවයෙන් අල්පසාවද්‍යයැ. මහද්භාවයෙන් මහාසාවද්‍යයැ. තවද ගෘහස්තයාට තමා සතු වස්තුවක් නොදෙනු කැමැති බැවින් නැත යනාදි ක්‍රමයෙන් පැවැති මුසාවාදය අල්පසාවද්‍ය වේ. සාක්ෂි වශයෙන් සිට අර්ථ නසන පිණිස කියන ලද්දේ මහාසාවද්‍ය වේ. පැවිද්දන්ට මඳවූත් තෙලක් හෝ ගිතෙලක් හෝ සිනාසෙන අදහසින් අද ගමෙහි තෙල් ගඟක් මෙන් ගලා යයි. පූරාණ කථා නයින් පැවැත්තේ අල්පසාවද්‍ය වේ. නොදක්නා ලද්දක්ම දක්නා ලද්දේය යනාදි නයින් කියන්නවුන්ට මහාසාවද්‍ය වෙයි. ඒ මුසාවාදයාගේ අංග සතරක් වෙති. අභූත වූ වස්තුවක් වීම, බොරුවෙන් රවටා කියන සිත, ඒ පිණිස වූ උත්සාහය, අන්‍යයාට එම වචනාර්ථය අවබෝධ වීම යනුයි. එක් ප්‍රයෝගයකි. සාහත්ථික මැයි. එම ප්‍රයෝගය කයින් හෝ කය පිළිබඳ වූවකින් හෝ වචනයෙන් හෝ පරහට සත්‍ය සඟවමින් ක්‍රියා කිරීමෙහි දතයුතුයැ. ඉදින් එම ක්‍රියාවෙන් මෙරමා තදර්ථය දැන ගනී ද, මේ පුද්ගල තෙම ක්‍රියා උපදවන චේතනා ක්‍ෂණයෙහිම මුසාවාද කර්මයෙන් බැඳේ.

### පිසුනා වාචා

පිසුනා වාචා යනාදි තන්හි යම් වචනයකින් යමෙකුට එම වචනය කියයිද, ඔහුගේ හෘදයෙහි තමාගේ ද මෙරමාගේ ද ප්‍රියභාවය සුන්කෙරේද ඒ වචනය පිසුණා වාචා නම් වන්නීය.

යම් වචනයකින් තමා ද මෙරමා ද ඵරුස භාවයට පත්කෙරේද, යම් වචනයක තොමෝත් පරුෂ වූවා කණට සුව නොවූ සිතට සුව නොවූ මෝ තොමෝ ඵරුසාවාචා නම් වන්නීය.

යම් වචනයකින් (සමපං) නිරර්ථක තෙපුල් බෙණේද, හේ සම්පප්ඵලාප නම් වේ. ඔවුන් මුල් වූ චේතනාවද පිසුණාවාචා ආදි නමම ලබයි. ඕ චේතනා තොමෝ ම මෙහි අදහස් කෙරේ. ඔවුනතුරෙහි කිලිටි සිත් ඇත්තහුගේ අනුන් බිඳීම පිණිස හෝ තමාට ප්‍රිය කැමැති බැවින් හෝ කාය වාක් ප්‍රයෝගයෙන් උපදවන ලද චේතනා තොමෝ පිසුනාවාචා නම් වන්නීය. ඕ වාක් තොමෝ යමෙකුගේ භේදය කෙරේද ඔහුගේ අල්ප ගුණත්වයෙන් අල්පසාවද්‍ය වේ. මහා ගුණත්වයෙන් මහාසාවද්‍ය වේ. ඒ පිසුණාවාචාවට අංග හතරක් වෙති.

බිඳිය යුතු අන්‍යයෙක්, මෙසේ මොහු විවිධ වන්නාහුය. වෙන් වන්නාහු යයි භේදය පෙරටුකොට ඇති බව හෝ මම ප්‍රියවූවෙක් වන්නෙමි. විශ්වාස වූවෙක් වන්නෙමි යයි ප්‍රිය කැමැති බව, ඒ පිණිස වූ ව්‍යායාමය ඔහු විසින් එම අර්ථය දැනගැනීම යන මොහුයැ. අන්‍යයාගේ මර්ම සිඳින්නා වූ කාය වාග් ප්‍රයෝගයෙන් උපදවන ලද ඒකාන්තයෙන්ම පරුෂ වූ චේතනා තොමෝ ඵරුසාවාචා නම් වන්නීය. ඒ පරුෂ වචනය දැක්වීම පිණිස මේ වස්තුව වේ.

ගම්දරුවෙකුගේ වස්තුව

එක් ගම්දරුවෙක් මවගේ වචනය නොසලකා වනයට යේ, මව එය නැවැත්වීම නොහැකි වන්නී නපුරු මීදෙනක් තා ලුහුබඳීවායි ආක්‍රෝෂ කළාය. ඉක්බිති ඔහුට වනයේ මී දෙනක් එළඹ සිටියාය. දරුවා එය දැක, මගේ මව්තොමෝ මුවින් යමක් කීවාද එය නොවේවා. යමක් සිතින් සිතීනම් එය ම වේවායි සත්‍යක්‍රියා කළේය. මී දෙන තොමෝ එහිම බඳින ලද්දියක මෙන් සිටියාය. මෙසේ මර්මච්ඡේදක වූ ප්‍රයෝග පවා චිත්තයාගේ මෘදුභාවය නිසා පරුෂ වචන නොවන්නීය.

සැබව, මව්පිය දෙදෙනා කිසිවිටෙක දරුවන්ට සොරු තොපව කඩ කඩ කෙරෙත්වායි මෙසේ කියති. එතකුදු වුවත් උප්‍රලපතකුදු ඔවුන් මත වැටෙන්නේ නොකමැති වෙත්. ආචාර්ය උපාධ්‍යායවරු ද, කිසිවිටෙක ඇසුරු කළවුන්ට මෙසේ කියති. 'මේ හිරි ඔතප් නැත්තාහු කුමටද, ඔවුන්

බැහැර කරවූ යයි කියති. එතකුදු වුවත් ඔවුන්ගේ ආගම අධිගම සම්පත්තිය කැමති වෙති. තවද චිත්තයාගේ මෘදු බැවින් යම්සේ පරුෂ වචන නොවේද, එසේ වචනයාගේ සිලිටු බැවින් පරුෂ වචන ද නොවෙයි. ඒ සැබව, මරවනු කැමැත්තහුගේ 'මොහු සුවසේ සයනය කරවවූ, යන වචනය අපරුෂ වචනයක්ම නොවෙයි. පරුෂ වචනයක්ම වෙයි. චිත්තයාගේ පරුෂ බැවින්ම මෝ තොමෝ පරුෂ වචනයක්මය.

මේ පරුෂ වචනය යමෙකු සඳහා පැවැත්වීද ඔහුගේ අල්ප ගුණත්වයෙන් අල්පසාවද්‍ය වේ. මහා ගුණත්වයකින් මහාසාවද්‍ය වෙයි. ඒ පරුෂ වචනයට අංග තුනක් වෙති.

ආක්‍රෝශ කළයුතු අන් කෙනෙකු වීම, කිපුණු සිත, ආක්‍රෝශ කිරීම යන මොහුයි. අනර්ථය දනවන්නා වූ කාය වාක් ප්‍රයෝගයෙන් උපදවන ලද අකුසල චේතනාව සම්ඵප්පලාප නම්. එය සේවනය මද බැවින් අල්ප සාවද්‍ය වෙයි. සේවන මහත්තත්වයෙන් මහාසාවද්‍ය වේ.

ඊට අංග දෙකක් වෙති. භාරත යුද්ධ, සීතාහරණ ආදි නිරර්ථක කථාවක් පෙරටුකොට වීම එබඳු කථාකරන බවද යන මෙයයි.

**මනො කම්ම**

දැඩි ලෙස ආසා කෙරෙනුයි අභිජ්ඣා නම් වන්නීය. පරභාණ්ඩයන්ට අභිමුඛව එහි නැමුනු සිත් ඇති බැවින් පවතී යන අර්ථයි. ඕ අභිජ්ඣා තොමෝ මෙය මට වන්නේ නම් ඉතා යෙහෙකැයි මෙසේ පර භාණ්ඩය් අභිමුඛකොට සිතීම ලක්ෂණකොට ඇත්තීය. අදින්නා දානය මෙන් අල්පසාවද්‍ය ද, මහාසාවද්‍යද වෙයි. ඒ අභිධ්‍යාවට අංග දෙකක් වෙති. අනුන් අයත් භාණ්ඩයක් වීම තමනට පිරිනැමීමද යන මෙයයි. පරභණ්ඩ වස්තුක වූ ලෝභය උපන් කල්හිදු භාණ්ඩ මට වන්නේ නම් ඉතා යෙහෙකැයි යම්තාක් තමහට නොපිරිනමාද ඒ තාක් කර්මපථ භේදයක් නොවෙයි.

හිතසුවය නසානුයි බ්‍යාපාද නම් වේ. ඒ බ්‍යාපාදය තෙම මෙරමා නැසීම පිණිස සිත දූෂ්‍ය වීම ලකුණුකොට ඇත්තේය. පරුෂ වචනය මෙන් අල්පසාවද්‍යද මහාසාවද්‍යද වේ. ඒ බ්‍යාපාදයට අංග දෙකකි. පර සත්ත්වයෙක් වීම, ඔහු විනාශ කිරීමට සිතීම යනුයි. පර සත්ත්වයෙකු

වස්තුකොට ඇති ක්‍රෝධය උපන් කල්හිදු මෙතෙම සිදෙන්නේ නම් නැසෙන්නේ නම් ඉතා යෙහෙකැයි යම්තාක් ඔහුගේ විනාශය නොසිතාද ඒතාක් 'කර්මපථ' භේදය නොවෙයි.

තත්වූ පරිද්දෙන් ගැනීමක් නැති බැවින් වරදවා දකීනුයි 'මිච්ඡාදිට්ඨි' නම් වන්නීය. එය 'නත්ථි දින්නං' යනාදී නයින් විපරීත දැකීම ලකුණුකොට ඇත්තේය. සම්පප්‍රලාපය මෙන් අල්ප සාවද්‍යද, මහාසාවද්‍යද වෙයි. තවද අනියත වූවා අල්පසාවද්‍ය නම් වන්නීය. නියත වූ මහාසාවද්‍ය නම් වන්නීය. ඒ මිථ්‍යා දෘෂ්ටියට අංග දෙකකි. වස්තුව පිළිබඳ ගත් ආකාරයාගේ විපරීත බව යම්පරිද්දකින් එය ග්‍රහණය කෙරේනම් එපරිද්දෙන් එම වස්තුහුගේ වැටහීමද යන මොහුයි.

### දශ අකුසල කම්මපථ විභාගය

මේ දශ අකුසල කම්මපථයන්ගේ, ධර්ම වශයෙන් ද කොටස් වශයෙන් ද, අරමුණු වශයෙන් ද, මූල වශයෙන්දැයි පස් අයුරකින් විනිශ්චය දතයුත්තේය.

එම විනිශ්චයෙහි ධම්ම වශයෙන් යනු, මේ විස්තරයයි, මේ දශ අකුසලයන් අතුරෙහි පිළිවෙලින් සත්ත චේතනාවෝ ධර්මයෝම වෙති. අභිජ්ඣා ආදි තුන චේතනා සම්පයුත්ත ධර්මයෝය.

කොට්ඨාස වශයෙන් යනු, පිළිවෙලින් සතක්ද, මිථ්‍යාදෘෂ්ටියද යන අට කර්මපථයෝම වෙති. මූලයෝ නොවෙති. අභිජ්ඣා, ව්‍යාපාදයෝ කර්මපථයෝ ද, මූලයෝ ද වෙති. ඒ එසේමැයි. අභිජ්ඣා තොමෝ අකුසලයන්ගේ මුල්බවට පැමිණ ලෝභ නම් වූ අකුසල මූලය වෙයි. ව්‍යාපාදය තෙම දෝස නම් වූ අකුසල මූලය වෙයි.

ආරම්මණ වශයෙන් යනු, ප්‍රාණඝාතය, ජීවිතින්ද්‍රිය, ආරම්මණ වශයෙන් සංඛාර ආරම්මණ වෙයි. අදත්තාදානය, සත්තාරම්මණ හෝ සංඛාර ආරම්මණ වෙයි. සත්තාරම්මණය යයිද ඇතැම් ආචාර්ය කෙනෙක් කියති. මිථ්‍යාචාරය ස්පර්ශය ආරම්මණ වශයෙන් සංඛාර ආරම්මණ වේ. සත්තාරම්මණ යයිද ඇතැම් ආචාර්ය කෙනෙක් කියත්. මුසාවාදය, සත්තාරම්මණ හෝ සංඛාර ආරම්මණ වෙයි. එසේම පිසුණාවාච ඵරුසාවාච සත්තාරම්මණ වෙයි. සම්පප්‍රලාපය, දිට්ඨ-සුත-මුත-විඤ්ඤාත වශයෙන් සත්තාරම්මණ හෝ සංඛාරම්මණ හෝ වෙයි. එසේම අභිධ්‍යාව හා ව්‍යාපාදය

සත්තාරම්මණ වෙයි. මිච්ඡා දිට්ඨිය, තේභූමක ධර්ම වශයෙන් සංඛාර ආරම්මණ වේ.

වේදනා වශයෙන්, ප්‍රාණඝාතය තෙම දුක්ඛ වේදනා වෙයි. එය එසේමැයි. කිසිසේත් රජවරු සොරෙකු දැක සිනහ සෙමිනුදු යවු ඔහු නසවු යයි කියත්ද, එතකුදු වුවත් ඔවුන්ගේ නිශ්චයාත්මක චේතනාව දුක්ඛ සම්පයුත්ත වූවාම වෙයි. අදත්තාදානය ත්‍රිවේදනායැ. මිථ්‍යාචාරය සුඛාපේක්ෂා වශයෙන් වේදනායැ. (සන්නිට්ඨාපක) නිශ්චයාත්මක චේතනාව උපේක්ෂා වේදනාව වෙයි. මුසාවාදය, ත්‍රිවේදනාව වෙයි. පිසුණාවාචාද එබඳුයැ. ඵරුසාවාචා, දුක්ඛ වේදනාව වෙයි. සම්පප්ඵලාපය ත්‍රිවේදනා වෙයි. අභිජ්ඣාව, සුඛ මජ්ඣත්ත වශයෙන් ද්විවෙදනා වෙයි. මිච්ඡා දිට්ඨියද එබඳුය. බ්‍යාපාදය - දුක්ඛවේදනා වෙයි.

මූලතො මූල වශයෙන් ප්‍රාණඝාතය දෝස-මෝහ වශයෙන් ද්විමූලක වේ. අදින්නාදානය දෝස-මෝහ වශයෙන් හෝ ලෝභ-මෝහ වශයෙන් හෝ ද්විමූලක වෙයි. මිථ්‍යාචාරය ලෝභ-මෝහ වශයෙන් ද්විමූලකයැ. මුසාවාදය දෝස-මෝහ වශයෙන් හෝ ලෝභ-මෝහ වශයෙන් හෝ ද්විමූලකයැ. පිසුණාවාචාවත් සම්පප්ඵලාපයත් එසේය. පරුෂ වචනය ද්වේෂ මෝහ වශයෙන් ද්විමූලකයැ. අභිජ්ඣාව මෝහ වශයෙන් එක් මුලක් ඇත්තී වෙයි. ව්‍යාපාදයත් එසේය. මිථ්‍යාදෘෂ්ටිය - ලෝභ - මෝහ දෙමුලක් ඇත්තී යයි (දතයුතුයැ).

ලොභො අකුසල මූලං යනාදියෙහි ලෝභ කෙරේනුයි ලෝභ නම් වේ. නොසතුටු වේනුයි දෝස නම් වෙයි. මුලා වේනුයි මෝහ නම් වේ. ඔවුන් අතුරෙහි ලෝභය සාවද්‍ය දුක්ඛ විපාක අර්ථයෙන් තෙමේත් අකුසල වෙයි. මේ පාණාතිපාත අකුසලයන් අතුරෙන් කිසිවෙකුට කිසිවෙකුම සම්පයුත්ත ප්‍රභාව අර්ථයෙන්ද කිසිවෙකුට උපනිස්සය ප්‍රත්‍යාර්ථයෙන් ද මුල් වූයේනුයි අකුසල මූල නම් වේ. මෙසේත් කියන ලදී.

**රත්තො ඛො ආවුසො රාගෙන, අභිභූතො පරියාදින්න චිත්තො පාණම්පි හනති** යනාදියයි. දෝස මෝහයන්ගේ අකුසල මූල භාවයෙහි ද මේ නයයි.

**දස කුසල විභාගය**

**පාණාතිපාතා වෙරමණී කුසලං** යනාදියෙහි පාණාතිපාතාදීහු කියන

ලද අර්ථ ඇත්තාහුමය. වෛරය හරීනුයි වෙරමණී නම් වේ. වෛරය දුරුකරයි යන අර්ථයි. මෙයට කාරණ වූ මෙය කරණ කොටගෙන පුද්ගල තෙම වෛරය කෙරෙන් වෙන්වේනුයි, (විරමණී යයි කිවයුත්තෙහි) 'වි' කාරයට 'වෙ' කාරය කොට ද, වෙරමණී නම් වේ. මෝ පළමුකොට දක්වන ලද මෙහි ව්‍යඤ්ජනයන්ගේ වශයෙන් වර්ණනායැ. අනතුරුව අර්ථ වශයෙන් වර්ණනා කරනු ලැබේ. වෙරමණී යනු කුසල චිත්ත සම්ප්‍රයුක්ත විරතියයි. ඕතොමෝ ප්‍රාණඝාතයෙන් වෙන්වන්නහුගේ, යා තස්මිං සමයෙ පාණාතිපාතා ආරති විරති යයි මෙසේ වදාරණ ලද කුසල් සිත හා යෙදුන විරතියයි. එය භේද වශයෙන් ත්‍රිවිධ වේ. සම්පත්ත විරති, සමාදාන විරති, සමුච්ඡෙද විරති යයි කියා, ඔවුනතුරෙහි සමාදන් නොවූ ශික්ෂාපද ඇති, තමාගේ ජාතිය, වයස, බහුශ්‍රැත බව ආදිය ප්‍රත්‍යවේක්ෂා කොට අපට මෙබන්දක් කරන්ට අයුතුයයි පැමිණි වස්තුව ව්‍යතික්‍රමණය නොකරන්නවුන්ට උපදනා වූ විරති තොමෝ සම්පත්ති විරතියයි දතයුතුය. හෙළදිව චක්කන නම් උපාසක තැනට මෙනි.

**චක්කන උපාසකතුමා**

චක්කන උපාසකගේ මවට ඔහු තරුණ කාලයේදීම රෝගයක් උපනි. වෙදා විසින් අමු සා මස් ලබන්ට සුදුසු යයි කියන ලදී. එහෙයින් චක්කනගේ සහෝදර තෙම දරුව යන්න, කෙතෙහි ඇවිද බලන්න යයි චක්කනව යැවීය. එහෙම එහි ගියේ එසමයෙහිම එක් සාවෙක් තරුණ සස්‍ය කෑමට පැමිණියේ වෙයි. ඌ ඔහු දැක වේගයෙන් දුවන්නේ වැලකින් බැඳුනේ කිරි කිරි යනුවෙන් ශබ්ද නැගුවේය. චක්කන ඒ ශබ්දයෙන් ගොස් ඔහු අල්වාගෙන මවට බෙහෙත් කෙරෙමියි සිතීය. නැවත මෙසේ සිතී, යම්බඳු වූ මම මවගේ ජීවිතය හේතුකොට අනෙකෙකු දිවියෙන් තොර කරන්නෙම් ද, මේ දිවි තොර කිරීම මට සුදුසු නොවේ යයි ඉක්බිති එම සාවාට යව, වනයෙහි සාවුන් සමග තණ දිය වළඳවයි මුදාහැරියේය. සහෝදරයා විසින්ද කිම දරුව සාවෙකු ලද්දේදැයි විචාරණ ලද්දේ එපුවත කීවේය. එවිට සහෝදර තෙමේ ඔහුට පරිභව කළේය. උපාසක තෙම මව වෙතට ගොස් මම යම්කලෙක පටන් මේ මිනිස්බවෙහි උපන්නෙම් ද, එතැන් සිට දැන දැන සතෙකු දිවියෙන් තොර කරවූයෙම් නොදනිමි. මෙම ඇත්ත කියා අධිෂ්ඨාන කළේය. එකෙනෙහිම ඔහුගේ මව සුව වූවා විය.

සමාදන් වූ ශික්ෂාපද ඇතිව, ශික්ෂාපද සමාදාන කාලයෙහි ද එයින් මත්තෙහි ද තමාගේ ජීවිතය පවා පූජාකොට වස්තුව්‍යතික්‍රමය

නොකරන්නවුන්ට උපදින්නා වූ විරති තොමෝ සමාදාන විරති නමයි දතයුතු උතුර වඩමන් වැසි උපාසක තැනට මෙනි.

**උතුරුවඩමන් වැසි උපාසකතුමා**

හෙතෙම, අඹරිය විහාරවැසි පිංගල බුද්ධරක්ඛිත තෙරුන්ගේ සමීපයෙහි ශික්‍ෂාපදයන් සමාදන්ව කෙතක් සායි. එකල ඔහුගේ ගවයෙකු නැති වූයේය. හෙතෙම එම ගවයා සොයමින් උත්තර වඩ්ඪමාන පර්වතයට නැග්ගේය. එහි දී ඔහුව පිඹුරෙක් අල්ලා ගත්තේය. හෙතෙම මේ මුවහත් කැත්තෙන් මොහුගේ හිස සිඳිමියි සිතී, නැවත මෙසේ සිතුවේය. 'යම්බඳු වූ මම භාවනීය වූ (සිහිකටයුතු වූ) ගුරු වූ තෙරුන් සමීපයෙහි ශික්‍ෂාපද සමාදන්ව බිඳින්නේ නම් මේ ශික්‍ෂාපද සිඳීම නොසුදුසුය. මෙසේ තෙවන වට දක්වා සිතා දිවිහරිමි ශික්‍ෂාපද නොහරිමියි පසෙක තිබූ තියුණු කැත්ත වනයෙහි දැම්මේය. එකෙණෙහිම පිඹුරුතෙම ඔහු මුදා ගියේය.

අරියමග්ග සම්පයුත්ත විරති තොමෝ සමුච්ඡේද විරති යයි දතයුතුය. යම් විරතියක්හුගේ උත්පත්තියෙහි පටන් ප්‍රාණවධ කරන්නෙමුයි ආර්ය පුද්ගලයන්ට සිතකුත් නො උපදී ද, මෙම විරතිය (කොසලල) යහපත් ලෙස පැවැති බැවින් කුසල යයි කියන ලදි. කුත්සිත කර්මය සලනය කරන හෙයින් කුසලයයි කියන ලදී. කුසලයයි ලත් ව්‍යවහාර ඇති දුශ්ශීල බව සිඳීනුයි කුසල නම් වේ.

කතමඤ්ච ආවුසො කුසලං යන ප්‍රශ්නයට අනුරූප නොවන බැවින් කුසලා යයි නොයන ලදහ. අකුසලයන්ගේ යම්සේද එසේ මේ කුසල කර්මපථයන්ගේද ධර්ම වශයෙන් කොටස් වශයෙන් ආරම්මණ වශයෙන් මූල වශයෙන්දැයි පස් ආකාරයකින් විනිශ්චය දතයුතුයැ.

එම විනිශ්චයෙහි ධර්ම වශයෙන් යනු මේ කුසලයන් අතුරෙහි ද, පිළිවෙලින් සතක් චේතනා වශයෙන්ද විරති වශයෙන් ද (ගැනීම) සුදුසුය. අන්තයෙහි වූ තුන චේතනා සම්පයුත්ත වූවාහුම වෙති.

කොට්ඨාස වශයෙන් යනු පිළිවෙලින් සතක් කර්මපථයෝම වෙති. මූලයෝ නොවෙති. අන්තයෙහි වූ තුන කම්ම පථයෝ ද, මූලයෝ ද වෙති. අනභිජ්ඣා තොමෝ මුල්බවට පැමිණ අලෝභ සංඛ්‍යාත කුසල

මූලය වෙයි. අබ්‍යාපාදය අදෝස නම් වූ කුසල මූලය වෙයි. සම්මා දිට්ඨිය, අමෝහ නම් වූ කුසල කුසල මූලය වෙයි.

ආරම්මණ වශයෙන් යනු ප්‍රාණඝාතාදීන්ගේ ආරම්මණයෝම මොවුන්ට ආරම්මණ වෙති. වීතික්කමයෙන් (ඉක්ම වීමෙන් කළයුතු බැවින්ම වෙරමණී නම් වේ. නිවන් අරමුණු කොට ඇති ආර්ය මාර්ගය යම්සේ කෙලෙසුන් දුරු කෙරේද, එසේ ජීවිතෙන්‍ද්‍රිය ආදිය අරමුණුකොට ඇත්තා වූ මේ කර්මපථයෝ ප්‍රාණඝාත ආදි දුශ්ශීල භාවයන් දුරුකෙරෙත් යයි දතයුත්තාහුය.

වේදනා වශයෙන් යනු සියල්ලෝම සුඛ වේදනා හෝ මධ්‍යස්ථ වේදනා හෝ වෙති. ඒ එසේමැයි. කුසලයට පැමිණ දුක්ඛ වේදනා නම් නැත.

මූල වශයෙන් පිළිවෙලින් සතක් ඤාණසම්පයුත්ත චිත්තයෙන් වෙන්වන්නහුට අලොභ-අදොස-අමොහ වශයෙන් ත්‍රිමූල වෙති. ඤාණ විප්පයුත්ත චිත්තයෙන් වෙන් වන්නහුට ද්විමූල වෙති. අනභිජ්ඣා තොමෝ ඤාණ සම්පයුත්ත චිත්තයෙන් වෙන්වන්නහුට ද්විමූල ද ඤාණවිප්පයුත්ත චිත්තයෙන් ඒක මූලද වෙයි. අලෝභං වනාහි තෙමේම, තමහට මූල නොවෙයි. අබ්‍යාපාදයෙහිද මේ නයමැයි. සම්මා දිට්ඨි තොමෝ අලොභ, අදොස වශයෙන් ද්විමූල වේ යයි.

අලොභො කුසලමූලං යනාදියෙහි ලෝභය නොවේනුයි අලෝභ නම්. ලෝභයට ප්‍රතිපක්‍ෂ වූ ධර්මයට මේ නමකි. අදෝස, අමෝහ යන්හිදු මේ නයමැයි. ඔවුන් අතුරෙහි අලෝභය තෙමේත් කුසලය ප්‍රාණඝාතයෙන් වෙන්වීම් ආදි වූ කුසලයන් අතුරෙන් කිසිවෙකුට සම්පයුත්තපභාව (=බලය යන) අර්ථයෙන් ද, කිසිවෙකුට උපනිශ්‍රය ප්‍රත්‍යාර්ථයෙන් ද මූල වේනුයි, කුසල මූල ම් වේ. අදෝස, අමෝහයන්ගේ ද කුසලයන්ට මුල්බැව්හි මේ නයමැයි. මෙවිට ඒ සියල්ල සංක්ෂේප වශයෙන් ද, විස්තර වශයෙන් ද දෙසූ අර්ථය නිගමනය කරන්නාහු යතො ඛො ආවුසො යනාදි අර්පණාවාරය වදාළහ. එම වාරයෙහි එවං අකුසලං පජානාති යනු මෙසේ දැක්වූ පරිදි දශඅකුසල කර්මපථයන්ගේ වශයෙන් අකුසලය දැනගනී. එවං අකුසල මූලං යනාදියෙහිද මේ ක්‍රමයමැයි.

මෙතෙකින් එක් ක්‍රමයකින් චතුසච්චකම්මට්ඨානිකයාගේ රහත් බව තෙක් ගෙනයාම වදාරණ ලද්දේ වෙයි. කෙසේද යත්, අභිජ්ඣාව තබා දස අකුසල කම්මපථයෝ ද දසකුසල කම්මපථයෝ ද දුක්ඛසත්‍ය වෙයි. අභිජ්ඣාව ලෝභ නම් වූ අකුසල මූලයදැයි මේ ධර්මයෝ දෙදෙන නිප්පරියාය වශයෙන් සමුදය සත්‍ය වේ. පරියාය වශයෙන් සියලුම කම්මපථයෝ දුක්ඛ සත්‍ය වෙයි. සියලුම කුසලාකුසල මූලයෝ සමුදය සත්‍ය වෙයි. දෙදෙනාගේ (දුක-සමුදය) නොපැවැත්ම නිරෝධ සත්‍ය වෙයි. දුක හාත්පසින්ම දැනගන්නා වූ සමුදය දුරුකරන්නා වූ නිරෝධය දැනගන්නා වූ ආර්ය මාර්ගය මාර්ග සත්‍යයයි.

මෙසේ සත්‍යයෝ දෙදෙනෙක් ස්වරූපයෙන් කියන ලද්දාහුය. දෙදෙනෙක් ආවත්තහාර වශයෙන් දතයුත්තාහුය. **සො සබ්බසො රාගානුසයං පහාය,** හෙතෙම මෙසේ අකුසලාදිය දැනගත්තේ සර්වප්‍රකාරයෙන් රාගානුසය දුරුකොට, **පටිඝානුසයං පටිවිනොදෙත්වා,** **පටිඝානුසය** සර්වප්‍රකාරයෙන්ම බැහැරකොට යයි කියන ලද්දේ වෙයි. මෙතෙකින් අනාගාමි මාර්ගය වදාරණ ලද්දේ වෙයි. **අස්මීති දිට්ඨි මානානුසයං සමූහනිත්වා** පංචස්කන්ධය අතුරෙන් කිසි ධර්මයක් ඉතිරි නොකොට 'මම වෙමි' යන මේ සමූහ ගහනාකාරයෙන් පැවැති දිට්ඨි-මාන අනුසය මුලින්පුටා එහි දිට්ඨි මානානුසයං යනු දෘෂ්ටිය වැනි වූ මානානුසය යයි කියන ලද වෙයි. යම්හෙයකින් මේ මානානුසය තෙම මම වෙමි යයි පැවැති බැවින් දෘෂ්ටිය සමාන වේද, එහෙයින් මෙසේ කියන ලදී. මේ අස්මිමානය විස්තර වශයෙන් දැනගනු කැමැත්තහු විසින් ඛන්ධ වර්ගයෙහි 'ඛෙමක' සූත්‍රය බැලිය යුතුයැ. **අවිජ්ජං පහාය,** වට්ටමූල වූ අවිද්‍යාව දුරුකොට **විජ්ජං උප්පාදෙත්වා,** එම අවිද්‍යාව සමූලඝාතනය කරන්නා වූ රහත්මග නම් වූ විද්‍යාව උපදවා, මෙතෙකින් රහත් මග වදාරණ ලද වෙයි. **දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්ත කරො** යනුවෙන් මේ ආත්මභාවයේදීම වට්ට දුක්ඛයාගේ දුරුකිරීම කරන්නේ වෙයි. **එත්තාවතාපි ඛො ආවුසො** යනුවෙන් දේශනාව නියය්‍යාතනය (පැමිණවීම) කෙරෙයි. මෙම කර්මපථ දේශනාවෙහි කියන ලද මනසිකාර ප්‍රතිවෙධ වශයෙන්ම යයි කියන ලද්දේ වෙයි. සෙස්ස කී අයුරුමැයි. මෙසේ අනාගාමි, රහත් මාර්ග වශයෙන් දේශනාව නිමවූ සේක.

**කම්මපථ වාර වර්ණනාව නිමි.**

2. ආහාර

**සාධාවුසො ති ඛො -පෙ- ආගතො ඉමං සද්ධම්මං** යනු මෙසේ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ කුසලාකුසල මුඛයෙන් කළ චතුරාර්ය සත්‍ය දේශනාව අසා, ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ එම දෙසුම **සාධාවුසො** යන වචනයෙන් ඒ භික්ෂූහු අභිමුඛව පිළිගෙන මෙම වචනයාගේම හේතුවෙන් හටගත් සිතින් අනුමෝදන්ව වචනයෙන් පිළිගෙන, සිතින් ද ප්‍රියකොට යයි කියන ලද වෙයි. දැන් යම්හෙයකින් තෙරුන්වහන්සේ සිවුසස් දෙසුම් දෙසන්ට සමර්ථ වේද, වදාළේ මැනො. **සාරිපුත්තො භික්ඛවෙ, පහොති චත්තාරි අරියසච්චානි විත්ථාරෙන ආචික්ඛිතුං දෙසෙතුං** යනුවෙන්, නැතහොත් මත්තෙහිද දේශනා කරනු කැමතිව **එත්තාව තාපි ඛො** යයි වදාළාහුද, එහෙයින් වෙනත් ක්‍රමයකින් සත්‍ය දේශනාව අසනු කැමති වූ ඒ භික්ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරුන් මත්තෙහි ප්‍රශ්න විචාළාහුය. එහෙයින් තමන් වහන්සේම විචාරා විසඳූ ප්‍රශ්නයන් මත්තෙහි **සියා ඛො පනාවුසො අඤ්ඤොපි පරියායො** අනෙකුදු කරුණක් වන්නේ දැයි මේ ක්‍රමයෙන් අන්‍ය වූ අතිරේක වූ ප්‍රශ්නයක් විචාළාහුය. නොහොත් පළමු ප්‍රශ්නයට මතු භාගයෙහි විචාළාහු යයි කියන ලද්දේ වෙයි.

ඉක්බිති ඔවුන්ට ප්‍රකාශ කරන්නා වූ තෙරණුවෝ **සියා ආවුසො** ආදිය වදාළහ. එහි මෝ අනුත්තාන (අප්‍රකට) පද වර්ණනාවයි. **ආහාරං**, ප්‍රත්‍යය, යම්හෙයකින් ප්‍රත්‍ය තෙමේ තමාගේ ඵලය ඵලවාද එහෙයින් 'ආහාර' යයි කියනු ලැබේ. **භූතානං වා සත්තානං** යනාදියෙහි **භූතා** යනු හටගත්තාහු උපන්නා වූ. **සම්භවෙසීනං** යමෙක් තුමූ සම්භවය ජාතිය නිෂ්පත්තිය සොයත් ද ගවේෂණය කෙරෙත් ද එහි සිව්යෝනින් අතුරෙහි අණ්ඩජ ජලාබුජ සත්ත්වයෝ අණ්ඩකෝෂය ද වස්ති කෝෂය ද යම්තාක් නොබිඳිත් ද ඒතාක් සම්භවෙසි නම් වෙති. අණ්ඩ කෝෂය ද වස්ති කෝෂය ද බිඳ පිටත නික්මුණාහු භූතයෝ නම් වෙති. සංසේදජයෝ ද ඕපපාතිකයෝ ද පළමු චිත්තක්ෂණයෙහි සම්භවෙසි නම් වේ. දෙවන චිත්තක්ෂණයේ සිට භූත නම් වේ. යමෙක් හෝ යම් ඉරියව්වකින් උපදිත් ද යම්තාක් එම ඉරියව්වෙන් අන් ඉරියව්වකට නොපැමිණෙත් ද ඒ තාක් සම්භවෙසි නම් වෙති. එයින් මත්තෙහි භූතනම් වෙති. නොහොත් **භූතා** යනු හටගත්තා වූ උපන්නා වූ යමෙක් තුමූ හටගත්තාහුම වෙත්ද, නැවත නොහට ගන්නාහු යන සංඛ්‍යාවට යෙත්ද, ඒ ක්ෂීණාශ්‍රවයන්ටද මේ නමකි. සම්භවය එෂණය කෙරෙත්නුයි සම්භවෙසි නම් වෙති. ප්‍රහීණ නොකළ

කෙලෙස් ඇති බැවිනි. භව සංයෝජන ඇති බැවිනි. මත්තෙහි සම්භවය සොයන්නා වූ සෙඛ - පුථුජ්ජනයන්ට මේ නමකි. මෙසේ මේ දෙපදයෙන් සර්වප්‍රකාරයෙන්ම සියලු සත්ත්වයන් ඇතුළත්කොට ගනිති. මෙහි වා ශබ්දයද, සම්පිණ්ඩනාර්ථය එහෙයින් භූතයන්ගේ ද සම්භවෙසීන්ගේ දැයි මේ අර්ථ දතයුතු.

ඨිතියා, ඨිතිය (නැවතී සිටීම) පිණිස අනුග්ගහාය අනුග්‍රහය පිණිස උපකාරය පිණිස මෙහි වචන භේදයම වෙයි. අර්ථය වූ කලී දෙපදයාගේ එකක්මය. නැතහොත් ඨිතියා, ඒ ඒ සත්ත්වයා හට උපන් ධර්මයන් අනුව බැඳීම් වශයෙන් නොසිඳීම පිණිස, අනුග්ගහාය නූපන් ධර්මයන්ගේ ඉපදීම පිණිස මේ දෙකම භූතයන්ගේ පැවැත්ම හා අනුග්‍රහය පිණිස ද, සම්භවෙසීන්ගේ පැවැත්ම හා අනුග්‍රහය පිණිසදැයි මෙසේ දෙතැන්හි (අර්ථය) දතයුතුයැ.

කබළිංකාර ආහාරය

කබළිංකාරො ආහාරො යනු කැබලිකොට ගිලිය යුතු ආහාරය. බත් කැවිලි ආදිය වස්තුකොට ඇති ඕජාවට මේ නමකි. ඔළාරිකො වා සුඛුමො වා වස්තූන්ගේ ඕලාරික බැවින් ඕලාරික වූ වස්තූන්ගේ සියුම් බැවින් සියුම් වූ, එතකුදු වුවත් ස්වභාවයෙන්ම සියුම් රූපයට ඇතුළත් බැවින් කවලාකාර ආහාරය සියුම්ව වෙයි. එබැවින් ඕජා තොමෝ ද ඒ වස්තූන්ගේ ඕලාරික බවද සියුම් බවද පිළිවෙලින් ගෙන දතයුත්තීය. ඒ එසේමැයි. කිඹුලන්ගේ ආහාරයට සමාන කරන විට මොනරුන්ගේ ආහාරය සියුම් වේ. කිඹුල්හු වනාහි ගල් ගිලිති. ඒවා ඔවුන්ගේ කුසට පැමිණියේ දියවී යයි. මොනරු සර්ප ගෝනුසු ආදී ප්‍රාණීන් කත්. මොනරුන්ගේ ආහාරය හා සමාන කරනවිට වලසුන්ගේ ආහාරය සියුම් වේ. ඔවුහු හැරදමන ලද තුන් අවුරුදු වූ ද හැරදමන ලද අං හා ඇට කත්, ඔවුන්ගේ කෙලවලින් තෙමුණු ඇසිල්ලෙහි අල මුල් මෙන් මෘදුවෙත්. වලසුන්ගේ ආහාරය හා සමාන කරනවිට ඇතුන්ගේ ආහාරය සියුම් වේ. ඔවුහු වනාහි නොයෙක් රුක් අතු කති. ඇතුන්ගේ ආහාරය හා සමාන කරනවිට ගවර, ගෝණ, මුව ආදීන්ගේ ආහාරය සියුම් වේ. ඔවුහු නිසරු වූ නොයෙක් ගස්වල කොල ආදිය කති. ඔවුන්ගේ ආහාරයට වඩා ගවයන්ගේ ආහාරය සියුම් වේ. ඒ ගවයෝ අමු වූද, වියලුණා වූද තණ කති. ඔවුන්ගේ ආහාරයට වඩා සාවුන්ගේ ආහාරය සියුම් වේ. සාවුන්ගේ ආහාරයට වඩා පක්ෂීන්ගේ ආහාරය සියුම් වෙයි. පක්ෂීන්ගේ ආහාරයට

වඩා පසල්වැසියන්ගේ ආහාරය සියුම් වෙයි. පසල්වැසියන්ගේ ආහාරයට වඩා ගම්මුදලින්ගේ ආහාරය සියුම් වෙයි. ඔවුන්ගේ ආහාරයට වඩා රජමහ ඇමතියන්ගේ ආහාරය සියුම් වේ. ඔවුන්ගේ ආහාරයට වඩා සක්විති රජුගේ ආහාරය සියුම් වෙයි. සක්විති රජුගේ ආහාරයට වඩා භූමාටු දෙවියන්ගේ ආහාරය සියුම් වේ. ඔවුන්ගේ ආහාරයට වඩා චාතුර්මහාරාජිකයන්ගේ ආහාරය සියුම් වේ. ඔවුන්ගේ ආහාරයට වඩා මෙසේ පරනිර්මිත වසවර්තීන්ගේ ආහාරය දක්වා විස්තර කටයුතුයැ. ඔවුන්ගේ ආහාරය වනාහි සියුම් යයි කියාම මෙය නිමාවට පැමිණියේ වෙයි.

මෙහි ද ඕලාරික වස්තුවෙහි ඕජාව මඳ වෙයි. දුර්වල වෙයි. සියුම් වස්තුවෙහි බලවත් වෙයි. ඒ සැබව. පාත්‍රයක් පුරා කැඳ පානය කළේ නමුදු මොහොතකින් බඩසා ඇත්තේ වෙයි. යම් කිසිවක්ම කනු කැමැත්තේ වෙයි. ගිතෙල් වූ කලී පතක් පමණ බී දවසක් නොවළඳනු කැමැත්තේ වෙයි. ඔවුන් අතුරෙහි වස්තුව පරිශ්‍රමය දුරු කෙරෙයි. පාලනය කරන්ට නොහැකි වෙයි. ඕජා තොමෝ පාලනය කෙරෙයි. විඩාව දුරුකරන්ට නොහැකි වෙයි. දෙදෙනම එක්ව විඩාවද දුරුකෙරෙන පාලනයද කෙරෙත්.

**ඵසෙසා දුතියො, චක්ඛු සම්ඵස්ස** ආදී වශයෙන් ඵස්සයෝ සවැදෑරුම් වෙති. ඵස්සය සතර ආහාරයන් අතුරෙහි දෙවන ආහාරය යයි දතයුතුයැ. මේ දේශනා ක්‍රමයමැයි. එහෙයින් මේ කරුණින් දෙවනයයි තුන්වන යයි මෙය මෙහිදී නොසෙවිය යුතුයැ.

**මනො සංචෙතනා** යනුවෙන් චේතනාවම කියනු ලැබේ. **විඤ්ඤාණං** යනුවෙන් යම්කිසි සිතක් කියනු ලැබේ. මෙහි කියන ලද්දාහ. ඉදින් ප්‍රත්‍යාර්ථයම ආහාරාර්ථය නම්, ඉක්බිති කුමක් හෙයින් අන්‍ය වූ සත්ත්වයන්ට ද ප්‍රත්‍යයන් විද්‍යමාන කල්හි මේ සතරම වදාරණ ලද්දේදැයි කියනු ලැබේ. අධ්‍යාත්මික සන්තතියට විශේෂ ප්‍රත්‍ය වන බැවිනි. ඒ එසේමැයි. කබලිංකාකාර ආහාරය බුදින්නා වූ සත්ත්වයන්ගේ, රූප කයට කබලිංකාකාර ආහාරය ද, නාම කයෙහි වේදනාවට ඵස්සයද, විඤ්ඤාණයට චේතනාවද, නාමරූප දෙකට විඤ්ඤාණයද විශේෂ ප්‍රත්‍ය වෙයි. එහෙයින් වදාළහ. **සෙය්‍යථාපි භික්ඛවෙ, අයං කායො ආහාරට්ඨිතිකො ආහාරං පච්චයා වෙදනා, සංඛාර පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාමරූපං** යනුවෙන්.

ආහාරයන්ගේ කෘත්‍ය

මෙහි කවර ආහාරයක් කුමක් එලවාද යත්, කබලිංකාර ආහාරය තෙම ඕජාව අටවැනිකොට ඇති රූපයන් එලවයි. (ගෙන එයි) ඵස්ස ආහාරය තෙම ත්‍රිවිධ වේදනාව එලවයි. මනොසඤ්චෙතනා ආහාරය තෙම, තුන්භවය එලවයි. විඤ්ඤාණ ආහාරය තෙම පටිසන්ධි නාමරූපය එලවයි. කෙසේනම් කබලිංකාර ආහාරයි මුඛයෙහි තැබූ කෙනෙහි රූප අටක් උපදවන්නේද යත්, දතින් කුඩුකොට ආහාරකොට ගනු ලබන්නා වූ එක එක බත්හුල අට අට රූපයන් උපදවා මැයි. මෙසේ ඕජාව අටවැනි කොට ඇති රූපයන් එලවයි.

ඵස්සාහාරය වනාහි, සුව විඳිය යුතු වූ ඵස්සං සුඛ වේදනාව එළවයි. දුක්ඛ වේදනීය වූ ඵස්සය දුක්ඛ වේදනාව ද උපේක්ෂා වේදනීය වූ ඵස්සය උපෙක්ෂා වේදනාවදැයි මෙසේ සර්වප්‍රකාරයෙන්ම ඵස්සාහාරය තෙම ත්‍රිවිධ වේදනාවන් එලවයි.

මනො සඤ්චෙතනා ආහාරයෙහි කාම භවයට පැමිණෙන්නා වූ කර්මය කාමභවය එලවයි. රූපාරූප භවයන්ට පැමිණෙන්නා වූ කර්මයෝ ඒ ඒ භවයන් එලවත් මෙසේ සර්වප්‍රකාරයෙන්ම මනෝ සඤ්චෙතනාහාරය භවත්‍රය එලවයි.

විඤ්ඤාණාහාරය වනාහි පටිසන්ධි සිදුවූ මොහොතෙහි එය හා සම්පයුත්තව යම් ස්කන්ධත්‍රයක් වෙත් ද ත්‍රිසන්තති වශයෙන් යම් තිස් රූප කෙනෙකුත් උපදිත් ද සහජාත ප්‍රත්‍යයෙන් ඔවුන් එළවා යයි කියනු ලැබේ. මෙසේ විඤ්ඤාණාහාරය පටිසන්ධි නාමරූපය එලවා යයි, මෙහිද මනොසඤ්චෙතනා තොමෝ තුන්භවය එලවා යයි, ආශ්‍රව සහිත වූ කුසලාකුසල චේතනා තොමෝ ම කියන ලද්දී වන්නීය. විඤ්ඤාණය පටිසන්ධි නාමරූපය එලවා යයි පටිසන්ධි විඤ්ඤාණයම කියන ලදී. අවිශේෂයෙන් තත් සම්පයුත්ත වූ තත් සමුට්ඨාන වූ ධර්මයන් එලවන හෙයින් ද මොවුහු ආහාරයෝ යයි දතයුත්තාහුය. මේ සතර ආහාරයන් අතුරෙහි කබලිංකාකාර ආහාරය පිහිට ලබමින් ආහාර කෘත්‍යය සිද්ධ කරයි. මනො සඤ්චෙතනා තොමෝ ආයූහනය (රැස්කිරීම) කරමින්ම (ආහාර කෘත්‍යය කෙරෙයි) විඤ්ඤාණය තෙම විජානනය කරමින්ම (ආහාර කෘත්‍යය කෙරෙයි) කෙසේ ද යම්හෙයකින් කබලිංකාකාර ආහාරය පිහිටකර ගනිමින්ම කය පිහිටුවීමෙන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස වේද, ඒ එසේමැයි. කර්මයෙන් උපදවන ලද්දා වූද මේ කය, කබලිංකාකාර

අහරින් පිහිට ලබනුයේ දවසක් හෝ විසිවසක් හෝ ආයු ප්‍රමාණයක් තෙක් සිටීද, කුමක් මෙන්ද යත්? මව විසින් උපදවන ලද්දා වූ දරුතෙම කිරිමව විසින් කිරි ආදිය පොවා පෝෂණය කරනු ලබන්නේ යම්සේ බොහෝ කලක් සිටීද, තව ද ආධාරයකින් පිහිට ලැබූ ගෙයක් යම්සේ ද, එසේය. වදාරන ලද්දේ වෙයි. යථාමහාරාජ, ගෙහෙ පතනෙත අඤ්ඤානි දාරූනි උපත්ථම්හෙනති අඤ්ඤානි දාරූනි උපත්ථම්භිතං සනතං එවං තං ගෙහං නපතති එව මෙව බො මහාරාජ අයං කායො ආහාරට්ඨිතිකො ආහාරං පටිච්ච තිට්ඨති (මහරජ, ගෙයක් වැටෙන කල්හි අනිත් දැවයකින් යම්සේ උපකාර කෙරෙත්ද, අනිත් දැවයකින් උපකාර කරන ලදුයේ මෙසේ එම ගෙය නොවැටේ ද, එසේම මහරජ, මෙම කය ආහාරයෙන් පවත්නේ ආහාරය නිසා සිටී.) මෙසේ කබලිංකාර ආහරයෙන් ආධාර ලබමින් අහරකිස සිද්ධ කෙරෙයි. මෙසේ අහර කිස සිද්ධ කරන්නා වූම කබලිංකාර ආහාරය තෙම ආහාර සමුට්ඨාන රූපයට ද, උපාදිණ්ණ රූපයට ද, යන රූප සන්තති දෙදෙනා හව ප්‍රත්‍ය වෙයි. කර්මරූපයන්ට අනුපාලකවද ආහාර සමුට්ඨාන රූපයන්ට ජනක වී ප්‍රත්‍ය වේ.

ඵස්සාහාරය වාහි සුඛාදියට කරණු වූ අරමුණ ස්පර්ශ කරමින්ම සුඛාදි වේදනා පැවැත්වීමෙන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස වෙයි. මනෝ සඤ්චෙතනා ආහාරය කුසලාකුසල කර්මයන්ගේ වශයෙන් ආයූහනය කරමින්ම භවමූලය නිපදවන හෙයින් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස වෙයි. විඤ්ඤාණාහාර විජානනය කරන්නේම නාමරූපයන්ගේ පැවැත්වීමෙන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස වෙයි.

මෙසේ උපසථම්භනාදි වශයෙන් ආහාර කෘත්‍ය සිද්ධ කරන්නා වූ ඒ සතර ආහාරයන්හි භය සතරක් දැක්ක යුතුය. ඔවුහු කවරහුද? කබලිංකාර ආහාරයෙහි, නිකනති නම් වූ බලවත් තෘෂ්ණාව භය වෙයි. ඵස්ස ආහාරයෙහි අරමුණ හා එක්වීම භය වෙයි. මනෝ සඤ්චෙතනා ආහාරයෙහි ආයූහන (රැස්කිරීම) භය වෙයි. විඤ්ඤාණ ආහාරයෙහි අභිනිපාතයම (ඒ ඒ භවයන්හි පටිසන්ධි වශයෙන් පහලවී) භය වේයයි කරුණු කිමයත් යම් හෙයකින් කබලිංකාර ආහාරයෙහි තෘෂ්ණාවකොට ශීතාදීන්ට පෙරටු වූ සත්ත්වයෝ ආහාර පිණිස මුද්‍රා, ගණිත ආදී වූ කර්මයන් කරන්නාහු අනල්ප වූ දුකට පැමිණෙත් ද,

තවද යම් කෙනෙක් මේ සස්නෙහි පැවිදිවද වෙදකම් ආදිකොට ඇති අනෙසනයෙන් ආහාර සොයන්නාහු ඉහාත්මයෙහි ගැරහිය යුත්තාහු

වෙත්ද, පරලෙව්හිද තස්ස සංඝාටිපි ආදිත්තා සම්පජ්ජලිතා යනාදි ලක්‍ෂණ සංයුත්තයෙහි කී න්‍යායෙන් ශ්‍රමණ ප්‍රේතයෝ වෙත්ද, එහෙයින් මේ කාරණයෙන් කබලිංකාර ආහාරයෙහි නිකාන්තිය (දැඩි ලෝභය)ම භයයි දතයුතුයැ.

ඵස්සයට පැමිණෙන්නා වූ ඵස්ස ආස්වාදනය කරන්නාහු අන්‍යයන් විසින් රක්‍ෂිත - ගෝපිත වූ භාර්යාදී වූ භාණ්ඩයන්හි අපරාධ කෙරෙති. බඩුහිමියෝ ඔවුන් බඩුත් සමග ගෙන කඩ කඩකොට හෝ සිඳ කසල ගොඩ දමති. රජුට හෝ පාවා දෙති. ඉක්බිති ඔවුන්ට රජතෙමේ විවිධ වධහිංසා පමුණුවයි. ඔවුන් විසින් මරණින් මතු දුගතිය කැමතිවිය යුත්තීය. මෙසේ ඵස්සය ආස්වාදනය කිරීම මුල්කොට ඇති දිට්ඨධම්මික වූ ද සම්පරායිත වූ ද සියලු භය ආයේම වෙයි. මේ කරුණෙන් ඵස්සාහාරයෙහි උපගමනයම භයයයි දතයුතුයැ.

කුසලාකුසල කර්මයන්ගේ රැස් කිරීමෙන්ම ඒ කර්මායූහනය මුල්කොට ඇති තුන්භවයෙහි සියලු භය ආයේම වෙයි. මේ කරුණෙන් මනෝ සඤ්චේතනා ආහාරයෙහි ආයූහනයම භය යයි දතයුතුයැ. පටිසන්ධි විඤ්ඤාණයක් යම් යම් තැනෙක්හි පැමිණේ ද, ඒ ඒ තැන්හි පටිසන්ධි නාමරූපය ගෙනම උපදී. එම නාමරූපය උපන් කල්හිද සියලු භය උපන්නාහුම වෙති. (යම් හෙයකින් භය) ඒ නාමරූපය මුල්කොට ඇති බවක් වේද, එහෙයිනි. මෙම කරුණින් විඤ්ඤාණ ආහාරයෙහි අභිනිපාතයම (පිළිසිඳ ගැනීමම) භය යයි දතයුතුය.

මෙසේ මේ භය සහිත වූ ආහාරයන් අතුරෙන් කබලිංකාර ආහාරයෙහි තෘෂ්ණාව ක්‍ෂය කිරීම පිණිස සම්බුදුරජාණන් වහන්සේ, සෙය්‍යථාපි භික්ඛවෙ ද්වෙ ජයම්පතිකා යනාදී නයින් පුත්‍රමාංස උපමාව දේශනා කළ සේක.

ඵස්සා ආහාරයෙහි තෘෂ්ණාව ක්‍ෂය කිරීම පිණිස සෙය්‍යථාපි භික්ඛවෙ ගාවි නිච්චම්මා යනාදි නයින් හම ඉවත්කළ (නිච්චම්මා) දෙනගේ උපමා දේශනා කළ සේක.

මනොසඤ්චේතනා ආහාරයෙහි තෘෂ්ණාව ක්‍ෂය කිරීම පිණිස සෙය්‍යථාපි භික්ඛවෙ අංගාරකාසු යනාදි නයින් අංගාරකාසු උපමාව දේශනා කළ සේක.

විඤ්ඤාණාහාරයෙහි තෘෂ්ණාව ක්‍ෂය කිරීම පිණිස සෙය්‍යථාපි භික්ඛවෙ චොරං ආගුචාරිං යනාදි නයින් සත්තිසතාහත උපමාව දේශනා කළ සේක. එහි මෙය භූතාර්ථ කොට, සංක්‍ෂේප අර්ථ යෝජනා වේ.

පුත්ත මංසූපමා

අඹු සැමි යුවලක් පුතෙකු ද ගෙන මද වූ ගමන් වියදම් ඇතිව, සියක්යොදුන් ගමන් මගකට පිළිපන්නාහුය. පනස් යොදුනක් ගියපසු ඔවුන්ගේ සියලු ගමන් වියදම් නිමාවට ගියේය. ඔවුහු සා පවසින් පෙලුනාහු කුඩා සෙවනක හුන්හ. ඉක්බිති පුරුෂතෙම භාර්යාවට මෙසේ කීය. සොඳුර, මෙයින් හාත්පස ගමක් හෝ නියම්ගමක් හෝ නොමැත. එහෙයින් පුරුෂයෙකු විසින් කළයුතු කෘෂිකර්මය, ගව පාලනය ආදි බොහෝ වූ යම් කර්මයක් වේද, මෙවිට එය මා විසින් කළ නොහැක. එව, මා මරා අඩක් කා අඩක් ගමන් වියදම් සඳහා තබාගෙන පුතු සමග මෙම කාන්තාරය එතර කරවයි (කීය.) ඕ තොමෝද මෙසේ කීවාය. හිමියනි, ස්ත්‍රියක විසින් කළයුතු බොහෝ වූ හූ කැටීම් ආදි කර්මාන්තයන් ඇතත් දැන් මට ඒවා කළ නොහැක. එනු මැන මා මරා අඩ මසක් කා අඩක් ගමන් වියදම් වශයෙන් තබාගෙන පුතු සමග කාන්තාරය එතර කරව. ඉක්බිති හෙතෙම ඇයට කියයි. සොඳුර, මාගමකගේ මරණයෙන් දෙදෙනෙකුගේ මරණය පෙනෙයි. යම් හෙයකින් ළදරු කුමර මවගෙන් වෙන්ව ජීවත්වන්ට නොහැක්කේ ද එහෙයිනි. ඉදින් අපි ජීවත් වන්නමෝ නම් යම් දරුවෙකු ලබන්නෙමු. දැන් වනාහි පුතු මරා මස්ගෙන කතර එතර කරමුයි. ඉක්බිති මව් තොමෝ පුත්‍රයාට දරුව පියා වෙත යවයි කීය. හෙතෙම ගියේය. ඉක්බිති පිය තෙමේ ඕ හට මවිසින් පුතු පෝෂණය කරන්නෙමැයි සීසෑම් ගවයන් රැකීම් ආදී වශයෙන් නොමද දුක් විඳින ලදී. පුතු මරන්ට නොහැකි වෙමි. තීම පුතු මරවයි කියා දරුවා මව වෙත යවයි. කීය හෙතෙම ගියේය. ඉක්බිති ඕහට මව්තොමෝ මවිසින් ගෝ ව්‍රත, කුක්කුර ව්‍රත, දේවතායචනා ආදි වශයෙන් පළමුකොට පමණ කළ නොහැකි දුක්විඳින ලදී. කුසින් උසුලන්නිය විසින් කියනු කිම? මම පුතු මරන්ට අසමත් වෙමියි කියා දරුවා පියා වෙතම යවයි කීය. මෙසේ හෙතෙම දෙදෙනා වෙතම යන්නේ අතරමග මළේය. ඔවුහු මළ පුතු දැක හඬා වැලප, සූත්‍රයෙහි කී නයින් මස්ගෙන කමින් ගියාහුය. ඔවුන් එම පුත්‍රමාංශය නව කරුණකින් පිළිකුල් බැවින්, ක්‍රීඩා පිණිස නොම වෙයි. මද වැඩීම පිණිස නොම වෙයි. මණ්ඩනය පිණිස නොම වෙයි. විභූෂණය පිණිස නොම වෙයි. හුදෙක් කාන්තාරය එතර කිරීම පිණිසම වෙයි. කවර නව

කරුණකින් පිළිකුල් වේද යත්, ස්වජාතීය මාංශයක් බැවින්, ඥාති මාංශයක් බැවින් පුත්‍රමාංශය බැවින්, ප්‍රිය පුත්‍ර මාංශය බැවින්, තරුණ මාංශය බැවින්, අමු මස බැවින්, ගොරස රහිත මාංශයක් බැවින් ලුණු රහිත බැවින් දුන් නොගන්වන ලද බැවින් යයි කියායි. එහෙයින් යම් මහණ කෙනෙක් කබලිංකාර ආහාරය මෙසේ පුත්‍රමාංශය සමානකොට දකීද, හෙතෙම එහි නිකාන්තිය (දැඩි තෘෂ්ණාව) දුරුකෙරෙයි. මේ වනාහි පුත්‍රමාංශ උපමාවෙහි අර්ථ යෝජනාවයි.

නිච්චම්මගාවූපමා

නිච්චම්ම ගාවූපමාවෙහි වනාහි ඕ දෙන්තොමෝ බෙල්ලෙහි පටන් කුර දක්වා පළමුකොට සම උපුටා හරින ලද්දී, යම් යම් තැනක් ඇසුරුකොට සිටීද, පණුවන් විසින් කනු ලබන්නී යම් සේ දුකටම භාජන වේද, එසේ එසසය ද, යම් යම් වස්තුවක් හෝ අරමුණක් හෝ ඇසුරුකොට සිටීද, ඒ ඒ වස්තු හා ආරම්මණයෙන් හටගත්තා වූ වේදනා දුක්ඛයට ආධාර වූයේම වෙයි. එසේ හෙයින් යම් මහණෙක් එසසාහාරය මෙසේ සම ඉවත්කළ දෙන හා සමානකොට දකීද එකී මහණ එහි නිකාන්තිය (දැඩි තෘෂ්ණාව) දුරුකෙරෙයි. මේ නිච්චම්ම ගාවූපමාවෙහි අර්ථ යෝජනාවයි.

අංගාරකාසූපමා

අංගාරකාසු උපමාවෙහි අඟුරුවල යම්සේ ද මහත් වූ පරිදාහාර්ථයෙන් තුන්භවයෝ එසේ වූවාහුය. නානා අත්වලින් ගෙන එහි ඇද දමන්නා වූ පුරුෂයෝ දෙදෙන යම්සේද, භවවලට අදින්නා වූ යන අර්ථයෙන් මනෝසඤ්චනනාවද එසේය. එසේ හෙයින් යම් මහණ කෙනෙක් මනොසඤ්චතනාහාරය මෙසේ අගුරුවලට ඇදදමන්නා වූ පුරුෂයන්ට සමානකොට දකී ද, හෙතෙම එහි නිකාන්තිය දුරුකෙරෙයි. අංගාරකාසු උපමාවෙහි අර්ථ යෝජනාව මෙසේය.

සත්තිසතාහත උපමාව

සත්ති හත උපමාවෙහි, යම්හෙයකින් ඒ පුරුෂතෙම, පෙරවරු කාලයෙහි සැත් (පහර) සියයකින් පෙළනු ලැබේද, ඒ සැත් පහර සියය ඔහුගේ සිරුරෙහි වණ මුඛ සියයක් කොට හෙලයි. අපර භාගයෙහිම අනිත් සැත්පහර දෙසීය අතරක් නොමැතිව විනිවිද යනසේ මෙසේම (හෙලයි) මෙසේ ඔහුගේ සිරුරෙහි, පහර ලද අවකාශයෙහි නොවැටී

ගියා වූ සැත්පහරවලින් ඔහුගේ සිරුර ලොකු කුඩා සිදුරුවලින් යුක්ත වූවක්ම වෙයි. ඔහුගේ එක් වණ මුඛයකින් උපන් දුක්ඛයාගේ ප්‍රමාණයක් නොමැති තුන්සියයක් වණමුඛ ගැන කියනුම කවරේද?

ඒ උපමාවෙහි සැත්පහර වදින කාලය මෙන් පටිසන්ධියද, වණමුඛ ඉපදීම මෙන් පඤ්චස්කන්ධය ඉපදීමද, වණ මුඛයන්හි දුක්ඛවේදනා ඉපදීම මෙන් උපන් ස්කන්ධයන්හි වට්ටමූලක නානාවිධ දුක්ඛයන්ගේ ඉපදීමද දතයුතු.

අනිකුදු ක්‍රමයක් කියනු ලැබේ. සොරකම් කළ පුරුෂයා මෙන් පටිසන්ධි විඤ්ඤාණය ද, ඔහුගේ සැත්වලින් ඇනීමෙන් උපන් වණ මුඛයන්ට කර්කශ දුක් ඉපදීම මෙන් නාමරූප ප්‍රත්‍යයෙන් විඤ්ඤාණයාගේ දෙතිස් කම්කටොලු අටඅනූ රෝගාදි වශයෙන් නන්වැදෑරුම් දුක් ඉපදීම ද දතයුතු. එහෙයින් යම් මහණ කෙනෙක් විඤ්ඤාණාහාරය සැත් සියයක් ගැනීමක් සමානකොට දකීද හෙතෙම එහි දැඩි ලෝභය දුරුකෙරෙයි. මේ සත්තිසතාහත උපමාවෙහි අර්ථ යෝජනාවයි.

හෙතෙම මෙසේ මේ ආහාරයන්හි දැඩි ලෝභය දුරුකරන්නේ සතර ආහාරයන්ම පිරිසිඳ දනී. එම සතර ආහාරයන් පිරිසිඳ දත් කල්හි, සියලු දතයුතු වස්තුව පිරිසිඳ දත්තේ වෙයි. මෙසේ වදාරණ ලදමැයි, බුදුරදුන් විසින් මහණෙනි, කබලිංකාකාර ආහාරය පිරිසිඳ දත් කල්හි පස්කම් ගුණයෙන් උපන් රාගය පිරිසිඳ දන්නා ලද්දේ වෙයි. පඤ්චකාම ගුණික රාගය පිරිසිඳ දත් කල්හි යම් සංයෝජනයකින් යුතු ආර්යශ්‍රාවක තෙම නැවත මේ ලෝකය පටිසන්ධි වශයෙන් පැමිණෙන්නේ ද, එම සංයෝජනය නැත්තේය. මහණෙනි, ඵස්සාහාරය පිරිසිඳ දත් කල්හි, ත්‍රිවිධ වේදනා පිරිසිඳ දත්තාහු වෙති. ත්‍රිවිධ වේදනාවන් පිරිසිඳ දත් කල්හි ආර්යශ්‍රාවක විසින් මත්තෙහි කටයුතු කිසිවක් නැතැයි කියමි. මහණෙනි, මනොසඤ්චේතනාහාරය පිරිසිඳ දත්කල්හි ත්‍රිවිධ තෘෂ්ණාව පිරිසිඳ දත්තාහු වෙති. ත්‍රිවිධ තෘෂ්ණාව පිරිසිඳ දත්කල්හි ආර්යශ්‍රාවක විසින් මත්තෙහි කටයුතු කිසිවක් නැතැයි කියමි. මහණෙනි, විඤ්ඤාණාහාරය පිරිසිඳ දත්කල්හි නාම-රූප පිරිසිඳ දත්තේ වෙයි. නාමරූප පිරිසිඳ දත්කල්හි ආර්යශ්‍රාවක විසින් මත්තෙහි කටයුතු කිසිවක් නැතැයි කියමි යනුයි.

තණ්හා සමුදයා ආහාර සමුදයො යනුවෙන් පෙර භවයන්හි තණ්හාවන්ගේ සමුදය හේතුකොට ගෙන, පටිසන්ධිය උපදවන්නා වූ ආහාරයන්ගේ සමුදය ද ඉපදීම ද වෙයි යන අර්ථයයි. කෙසේද යත්, පටිසන්ධි මොහොතෙහි, ත්‍රිසනතති (වස්තු-කාය-භාව දසක) වශයෙන් උපන් සමතිස් රූපයන් ඇතුළත උපන්, ඕජාවක් ඇති, තණ්හා ප්‍රත්‍යයෙන් උපන් උපාදිනනක කබලිංකාකාර ආහාරයයි. පටිසන්ධි චිත්තය සමපයුතත වූ එසස චේතනා තොමෝ වනාහි තොමෝ ද, චිත්තයද විඤ්ඤාණයද යන මොවුහු තණ්හා ප්‍රත්‍යයෙන් උපන්නා වූ උපාදිනනක එසස-මනො සඤ්චතනා විඤ්ඤාණ යන ආහාරයෝ වෙත්යයි මෙසේ පළමුකොට පූර්ව, තණ්හා සමුදය හේතුකොටගෙන පටිසන්ධියට හිතවූ ආහාරයන්ගේ සමුදය දතයුතුය. යම්හෙයකින් වනාහි මෙහි උපාදිනනක වූද අනුපාදිනනක වූ ද ආහාරයෝ මිශ්‍රකොට වදාරණ ලද්දාහු ද, එහෙයින් අනුපාදිණණක යන්ගේද තණ්හා සමුදයෙන් ආහාර සමුදය දතයුතුය.

අටවැදෑරුම් ලෝභසහගත චිත්තයන්ගෙන් උපදවන ලද රූපයන්ගේ ඕජාව ඇති, මෙම ඕජාතොමෝ සහජාත තණ්හා ප්‍රත්‍යයෙන් උපන්නා වූ අනුපාදිණණක කබලංකාර ආහාරයෙහි ලෝභ සහගත චිත්තයන් හා සම්පයුත්ත වූ එසස චේතනා තොමෝද චිත්තයද විඤ්ඤාණයද යන මොවුහු තණ්හා ප්‍රත්‍යයෙන් උපන්නා වූ අනුපාදිණණක එසස, මනො සඤ්චතනා, විඤ්ඤාණ, ආහාරයෝ වෙත්යයි (දතයුතුයෑ)

තණ්හා නිරොධා ආහාර නිරොධො යනුවෙන් උපාදිණණක වූ ද අනුපාදිණණක වූ ද ආහාරයන්ට ප්‍රත්‍ය වූ මේ තණ්හාවගේ නිරෝධයෙන් ආහාරයාගේ නිරෝධය පැනෙයි. සෙස්ස කී නයින් දතයුතුය. මේ වනාහි විශේෂයයි. මෙහි චතුසත්‍යයෝම ස්වරූපයෙන්ම කියන ලද්දාහු වෙති. මෙහි යම්සේ ද එසේ මෙයින් මත්තෙහිද සියලු වාරයන්හි ද, එහෙයින් සියලු තන්හි මුලා නොවන්නහු විසින් සත්‍යයෝ උපුටාගැනීම කළ යුත්තාහුය. තව ද සියලු වාරයන්හි එත්තාවතාපි ඛො ආවුසො යන මේ දේශනා නියාාතනය (දේශනාවෙන් ලබාදෙන ලද්ද) ඒ ඒ තැන්වල දේශනා කරන ලද ධර්මයන්ගේ වශයෙන් යෙදිය යුතුය. ඒ නීයාාතනයාගේ පළමුකොට මේ මෙහි යෙදීමයි. එත්තාවතාපි යනු මේ ආහාර දේශනාවෙහි වදාළ මනසිකාර ප්‍රතිවේධ වශයෙන්ද යයි කියන ලද වෙයි. සියලු තන්හි මේ ක්‍රමයම වෙයි.

**ආහාර වර්ණනාව නිමි.**

### 3. සච්චවාරය

දැන් සාධාවුසො යයි පළමු නයින්ම තෙරුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන අනුමෝදන් වූ ඒ භික්ෂූහු මත්තෙහි ප්‍රශ්න විචාලාහුය. තෙරුන් වහන්සේ ද ඔවුන්ට අන් ක්‍රමයකින් ප්‍රකාශ කළහ. මෙයින් මතු සියලු වාරයන්හි මෙම ක්‍රමයමයි. එහෙයින් මින් මත්තෙහි මෙවැනි වචන නොසලකා යම් යම් ක්‍රමයකින් ප්‍රකාශ කෙරේද, ඒ ඒ ක්‍රමයාගේම අර්ථ වර්ණනා කරන්නෙමු. මේ වාරයාගේ වනාහි සංක්‍ෂෙප දේශනාවෙහි, දුක්ඛඤ්ච පජානාති, යන මෙහි දුක්ඛං දුක්ඛ සත්‍යය විස්තර දේශනාවෙහි යමක් කිවයුතු වන්නේද ඒ සියල්ල විසුද්ධි මාර්ගයෙහි සත්‍ය නිර්දේශයෙහි කියන ලද්දේම වෙයි.

### 4. ජරා මරණ වාරය

මෙතැන්සිට පටිච්ච සමුප්පාද වශයෙන් දේශනා තොමෝ එයි. එහි පළමුකොට ජරා මරණ වාරයෙහි තෙසං තෙසං යන මෙය සංක්ෂේපයෙන් නොයෙක් සත්ත්වයන්ගේ සාධාරණ නිර්දේශ යයි දතයුතුය. දේවදත්තගේ යම් දිරීමක් වේද, සෝමදත්තගේ යම් දිරීමක් වේද යනුවෙන් දවසකුත් කියන්නහුට සත්ත්වයෝ අවසන් නොවෙත් ම ය. මේ පදයෙන් කිසි සත්ත්වයෙකු ඇතුළත්කොට නොගන්නා ලද්දේ නොවෙයි. එහෙයින් මෙය සංක්ෂේපයෙන් නොයෙක් සත්ත්වයන්ගේ සාධාරණ නිර්දේශයයි කියන ලදී. තම්හි තම්හි යන මෙය ගති ජාති වශයෙන් නොයෙක් සත්ත්ව නිකායන්ගේ සාධාරණ නිර්දේශයයි. සත්ත නිකායෙ යනු සාධාරණ නිර්දේශයෙන් දක්වන ලද්දහුගේ ස්වරූපයෙන් දැක්වීමය. ජරා ජීරණතා යනාදියෙහි ජරා යනු ස්වභාව නිර්දේශයයි. ජීරණතා යනු ආකාර නිර්දේශයයි. ඛණ්ඩිච්චං යනාදීහු කල්‍යාමේ දී කෘත්‍ය නිර්දේශයයි. පසුව කී පද දෙක ප්‍රකෘති නිර්දේශයෝ යි. එසේමැයි මේ ජරා තොමෝ ජරා යන පදයෙන් ස්වභාව වශයෙන් දක්වන ලදී. එහෙයින් මේ ජරා යන පදය ජරාවගේ ස්වභාව නිර්දේශයයි. ජීරණතා යන පදයෙන් ආකාර වශයෙන් ජරාව දක්වන ලද්දී වෙයි. එහෙයින් මේ පදය ඒ ජරාවගේ ආකාර නිර්දේශයයි. ඛණ්ඩිච්චං යන මේ පදයෙන් කල්‍යාමේ දී දත් නියපොතුවල කැඩුනු බව සිදුකරන්නා වූ කෘත්‍යයෙන් ජරාව දක්වන ලද්දාහු වන්නීය. පාලිච්චං යන මේ පදයෙන් කේස ලෝමයන්ගේ පැසුණු බව ඇතිකරවන කෘත්‍ය වශයෙන් දක්වන ලද්දීය.

වලිත්තචතා මෙයින් මස් වියලවා හමෙහිද රැලි නංවන කෘත්‍ය වශයෙන් දක්වන ලද්දීය. එහෙයින් මෙම ඛණ්ඩිච්චං යනාදි පද තුන කල්

ඉක්මයාමේදී එම ජරාවගේ කෘත්‍ය නිර්දේශයෝය. ඒ පද තුනෙන්ම මේ විකාරයන් දැක්වීම වශයෙන් ප්‍රකට වූ ප්‍රකට ජරා තොමෝ දක්වන ලදී.

එසේම, දියෙහි හෝ වාතයෙහි හෝ ගින්නෙහි හෝ තෘණ වෘක්ෂ ආදීන්ගේ හාත්පසින් බිඳීගිය බැවින් හෝ දාගිය බැවින් හෝ ගියමග යම්සේ ප්‍රකට වූයේද ඒ ගියමග උදකාදීහුම නොද වෙත්ද, එසේම ජරාව විසින් දත් ආදීන්ගේ කැඩුනු බැව්, ආදීන්ගේ වශයෙන් ගියමග ප්‍රකට වූයේ ඇස දල්වාත් අරමුණු වශයෙන් ඇස දල්වාගනු ලැබේද, කැඩුනු බැව් ආදීහු ජරා නොම වෙති. ඒ එසේමැයි. ජරාව චක්ඛු විඤ්ඤෙය්‍ය නොම වෙති. ආයුනො සංහානි ඉන්‍ද්‍රියානං පරිපාකො යන මෙම පදයන්ගෙන් වනාහි කාලය ඉක්ම යාමෙන්ම අතිශයින් ප්‍රකට වූ ආයුෂ පිරිහීම, චක්ෂුරාදි ඉන්‍ද්‍රියයන්ගේ මුහුකුරා යාම නම් වූ ප්‍රකෘති වශයෙන් ජරාව දක්වන ලද්දීය. එහෙයින් මෙම පසුව කී දෙපදයෝ ජරාවගේ ප්‍රකෘති නිර්දේශයෝ යයි දතයුත්තාහුය. ඒ ජරා නිර්දේශයෙහි, යම්හෙයකින් ජරාවට පැමිණියහුගේ ආයු පිරිහේ ද එහෙයින් ජරාතොමෝ ආයුනො සංහානි යනුවෙන් ඵලොපචාර වශයෙන් වදාරණ ලදී.

තව ද යම්හෙයකින් තරුණ කාලයෙහි වෙසෙසින් ප්‍රසන්න වූ ද, සියුම් වූ ද තමහට විෂය වූ අරමුණ සුවසේ ගැනීමට සමර්ථ වූ චක්ෂුරාදි ඉන්‍ද්‍රියයෝ ජරාවට පැමිණියහුගේ මේරීමට ගියාහු කැළඹුනා වූ නොපැහැදුනා වූ ඕලාරික වූත් තමහට විෂය වූ අරමුණ ගන්නට අසමර්ථ වූවාහු වෙත්ද, එහෙයින් ඉන්‍ද්‍රියානං පරිපාකො ඉඳුරන්ගේ මෝරායාමයයි ඵලොපචාර වශයෙන් වදාරණ ලද්දීය. මෙසේ දක්වන ලද සියලුම ජරා තොමෝ ප්‍රකටජරාය, පටිච්ඡන්න ජරාය යයි විවිධ වෙයි. ඔවුනතුරෙහි දන්තාදීන්ගේ ඛණ්ඩභාව ආදිය දක්නා ලබන හෙයින් රූප ධර්මයන්හි මෝ තොමෝ ප්‍රකට ජරා නමු. එතකුදු වුවත් අරූප ධර්මයන්හි ජරා තොමෝ එබඳු විකාරයක්හුගේ නොදක්වන බැවින් පටිච්ඡන්න ජරා නම් වේ.

නැවත අවීචි සවීචි (අතරක් නැති-අතරක් ඇති) යනුවෙන් ජරාව ද්වවිධ වන්නීය. එම ද්වවිධ ජරාවන් අතුරෙහි මණි-කනක-රජත-පවාළ-චන්‍ද-සුරිය ආදීන්ගේ මෙන්ද, මන්‍දදසක ආදි අවස්ථාවන්හි ප්‍රාණීන්ගේ මෙන්ද මල් ඵල පලු ආදි අවස්ථාවන්හි අප්‍රාණීන්ගේ මෙන්ද අතරතුර වර්ණ විශේෂාදීන්ගේ නොදතහැකි බව හෙයින් එම ජරාව අවීචි ජරා නම් වේ. නිරන්තර ජරාය යන අර්ථයි. මණි කනක ආදි වස්තූන් කෙරෙන්

අන්‍ය වූ දන්ත ආදීන්හි අතරතුර වර්ණ විශේෂාදීන් හෝ සුවසේ දතහැකි බව නිසා එම ජරාව සවීචි ජරා නමයි දතයුත්තාහුය.

මෙයින් මතුයෙහි තෙසං තෙසං යන ආදිය කී නියායෙන් දතයුතුයැ. චුති චවනතා යනාදියෙහි වනාහි, චුති යනු චුතවීම වශයෙන් කියනු ලැබේ. එකස්කන්ධ චතුස්කන්ධ පඤ්චස්කන්ධයන්ට මෙය සාමාන්‍ය වචනයකි. චවනතා යන භාවප්‍රත්‍ය යුක්ත වචනයෙන් ලක්‍ෂණ දැක්වීමයි. භෙදො යන වචනයෙන් චුතිස්කන්ධයන්ගේ භංගය උප්පත්තිය දැක්වීමයි. අන්තරධානං යනු බිඳුනු කළයෙහි මෙන් බිඳුනා වූ චුතිස්කන්ධයන්ගේ යම්කිසි පරියායකින් නොපැවැත්ම දැක්වීමයි.

මච්චුමරණං, මච්චු නම් වූ මරණයයි. ඒ වචනයෙන් සමුච්ඡෙද මරණය වළකයි. කාල නම් අන්තකයාය (මාරයාය) ඔහුගේ කිරියාව කාලකිරියා නම් වේ. මෙයින් ලෝකසම්මත මරණය දක්වයි. දැන් පරමාර්ථ වශයෙන් දක්වන්ට ඛන්ධානං භෙදො යනාදිය වදාළහ. ඒ එසේමැයි. පරමාර්ථ වශයෙන් ඛන්ධයෝ තුමූම බිඳෙති. කිසි සත්ත්වයෙක් නම් නොමැරෙයි. ස්කන්ධයන් බිඳෙනකල්හි සත්ත්වයා මැරෙයි කියා ද බිඳුනු කල මළේයයි කියා ද ව්‍යවහාර වෙයි. මේ දෙපදයන් අතුරෙහි චතුවෝකාර පඤ්චවෝකාර භවයන්ගේ වශයෙන් ස්කන්ධයන්ගේ බිඳීම දතයුතුයැ. එකවොකාර භවයාගේ වශයෙන් ශරීරය බහාතැබීම දතයුතුය. චතුවොකාර භවයාගේ වශයෙන් ස්කන්ධයන්ගේ බිඳීමද, සෙසු භවයන් දෙදෙනාගේ වශයෙන් ශරීරයාගේ බහාතැබීම දතයුතුය. කුමක් හෙයින්ද යත් එක පඤ්චවොකාර භව දෙකෙහිම රූපකාය නම් වූ ශරීරයාගේ සම්භවය ඇතිවන හෙයිනි. චාතුර්මහාරාජිකාදී ලෝකවල ස්කන්ධයන්ගේ බිඳීම වෙත්ද, කිසිවක් බහානොලත් ද එහෙයින් ඔවුන්ගේ වශයෙන් ස්කන්ධයන්ගේ බිඳීම දතයුතුය. මනුෂ්‍යාදීන් කෙරෙහි, ශරීරයාගේ බහාතැබීම දතයුතුයි. මෙහිද්‍ද ශරීරයාගේ බහාතැබීමේ කරුණෙන්ම මරණය තෙමේ කලෙබරසස නික්ඛෙපො යයි කියන ලදැයි මෙසේ අර්ථය දතයුතුය. ඉති අයඤ්ච ජරා ඉදඤ්ච මරණං ඉදං වුච්චතාවුසො යන මේ දෙකම එක්තැන්කොට ජරාමරණ යයි කියනු ලැබේ. සෙස්ස කී නයම වේයයි.

ජරා මරණ වර්ණනාව නිමි.

5 ජාති වාරය

ජාති වාරයෙහි, ජාතිසඤ්ජාති, යනාදි තන්හි ඉපදීම් අර්ථයෙන් ජාති නම් වන්නීය. ඕ ජාති තොමෝ නොපිරිපුන් ආයතන ඇත්තවුන්ගේ වශයෙන් කියන ලද්දී, මනාව ඉපදීම් අර්ථයෙන් සඤ්ජාති නම්. ඕ තොමෝ පිරිපුන් අවයව ඇත්තවුන්ගේ වශයෙන් කියන ලදී. මව්කුසට පිවිසීම් අර්ථයෙන් ඔක්කන්ති නම්. ඕ තොමෝ අණ්ඩජ, ජලාබුජ යෝනි වශයෙන් කියන ලද ඔවුහු අණ්ඩ කෝෂයෙහිද වස්ති කෝෂයෙහි පිළිසිඳ ගන්නාහු පිවිසෙන්නවුන් මෙන් පිළිසිඳ ගනිත්. ප්‍රකට වූ ඉපදීමය යන අර්ථයෙන් අභිනිබ්බත්ති නම් වන්නීය. මෝ පළමුකොට දක්වන ලද්දී වෝහාර දේසනා නම් වන්නීය. දැන් පරමාර්ථ දේශනා තොමෝම වන්නීය.

පරමාර්ථ වශයෙන් ස්කන්ධයෝම පහළ වෙති. සත්ත්වයෙක් පහළ නොවෙයි. ඒ පරමාර්ථ දේශනාවෙහි ඛන්ධානං යනු එකවොකාර භවයෙහි එක රූපස්කන්ධයකගේ ගැනීමද, චතුවෝකාර භවයෙහි, (වෙදනා ආදී වූ) ස්කන්ධ හතරකගේ ගැනීම ද, පඤ්චවොකාර භවයෙහි පඤ්චස්කන්ධයාගේ ගැනීමද දතයුතුයැ. පාතුභාවො ඉපදීම, ආයතනානං යන මේ පදයෙන් ඒ ඒ භවයන්ගේ, උපදින්නා වූ ආයතනයන්ගේ වශයෙන් සංග්‍රහය දතයුතුය. පටිලාභො යනු සන්තතියෙහි පහළවීම, ඒ එසේමැයි. පහළ වන්නා වූම එම ආයතනයෝ ලැබුවා වූ නාමයෝ ඇත්තෝ වෙති. අයං වුච්චතාවුසො ජාති යන මේ පදයෙන් ව්‍යවහාර වශයෙන්ද, පරමාර්ථ වශයෙන් ද දෙසූ ජාතිය නිගමනය කෙරෙති. භව සමුදයා යන මෙහි ජාතියට ප්‍රත්‍ය වූ කර්මභවය සෙස්ස කී ක්‍රමයමැයි.

ජාති වර්ණනාව නිමි.

6. භව වාරය

භව වාරයෙහි කම්ම භවො යනු කම්ම භවයද උප්පත්ති භවයද, ඒ ද්විධ භවයන් අතුරෙහි කාම භවනම්, කාමභවයට පැමිණෙන්නා වූ කර්මය මැයි. ඒ එසේමය. කම්ම භවය උප්පත්ති භවයට කරුණු වන බැවින්, සුඛො බුද්ධානං උප්පාදො, දුක්ඛො පාපස්ස උච්චයො යනාදීහු මෙන් ඵල ව්‍යවහාරයෙන් භවය යයි කියන ලද උප්පත්ති භව නම්, ඒ ඒ කර්මය විසින් උපදවන ලද උපාදිණ්ණ ස්කන්ධ පඤ්චකයයි. එය වනාහි, එම භවයෙහි වේයයි ගෙන භවයයි කියන ලදී. මෙසේ සියලු අයුරින් මේ කර්මයද උප්පත්තියද යන දෙකම මෙහි කම්මභවයයි කියන ලදී. රූප-

අරූප භවයන්හි ද මෙම ක්‍රමයමැයි. උපාදාන සමුදයා මෙහි උපාදානය කුසල කම්මභවයට උපනිස්සය වශයෙන් ප්‍රත්‍ය වෙයි. අකුසල කර්ම භවයට උපනිස්සය වශයෙන්ද සහජාත වශයෙන්ද ප්‍රත්‍ය වෙයි. සියලුම උප්පත්ති භවයට උපනිශ්‍රය වශයෙන්ම ප්‍රත්‍ය වෙයි. සෙස්ස කී ක්‍රමයමැයි.

7. උපාදාන වාරය

උපාදාන වාරයෙහි කාමූපාදානං යනාදි තන්හි, මේ කරණකොට ගෙන වස්තු සංඛ්‍යාත කාමය දැඩිකොට ගනිත්, තෙමේ හෝ වස්තුකාමය, දැඩිකොට ගනීනුයි 'කමූපාදාන' නම් වේ. කාම වූයේත් හේය, උපාදාන වූයේත් හේය කාමූපදාන නම් වේ. උපාදානං යයි දැඩිකොට ගැනීම කියනු ලැබේ. ඒ එසේමැයි. මෙහි උපශබ්දය තෙම දෘඪාර්ථය, උපායාස උපකුට්ඨ යනාදියෙහි මෙනි. කාමූපදාන (කාමූපාදාන) යන මේ වචනය පඤ්චකාමගුණික රාගයට නමකි. මේ කියන ලද්දේ මෙහි සංක්ෂේපයයි. මෙය විස්තර වශයෙන් වනාහි **තත්‍ථ කතමං කාමූපාදානං, යො කාමෙසු කාමච්ඡන්දො** වදාළ ආකාරයෙන් දතයුතු දිට්ඨි වූවත් උපාදාන වූවත් ඕ තොමෝම නුයි, දිට්ඨූපාදාන නම් වේ. නැතහොත් දිට්ඨිය දැඩිකොට ගනියි හෝ මේ කරණකොටගෙන දිට්ඨිය දැඩිකොට ගනිත්නුයි. දිට්ඨූපදාන නම් වන්නීය. පළමු ගත් මිථ්‍යා දිට්ඨිය පසුව ගත් දෘෂ්ටි තොමෝ දැඩිකොට ගනී. එහෙයින් වදාළහ. **සස්සතො අත්තාච ලොකොච ඉදමෙව සච්චං මොඝමඤ්ඤං** යනුවෙන් සීලබ්බත උපාදාන, අත්තවාද උපාදානයන්ගෙන් තොර සියලු දෘෂ්ටිගතයනට නමකි. මේ මෙහි සංක්ෂේපයයි විස්තර වශයෙන් වනාහි මේ පදය, **තත්‍ථ කතමං** දිට්ඨූපාදානං? **නත්‍ථි දින්නං** යනුවෙන් වදාළ නයින්ම දතයුතුය. එසේම මේ කරණකොටගෙන සත්ත්වයෝ සීලබ්බතය දැඩිකොට ගනිත් තෙමේ හෝ ඒ මිථ්‍යා දර්ශනය දැඩිකොට ගනීනුයි, නොහොත් සීලබ්බත වූයේද, හේයැ. උපාදාන වූයේත් හේ නුයි සීලබ්බතුපාදාන නම් වේ. ගෝසීල ගෝව්‍රතාදීහුම මෙසේ ශුද්ධිය වේයයි අභිනිවේශය කරන්නහුට තුමූම උපාදානයෝ නම් වෙති. මේ එහි සංක්ෂේපයයි. විස්තර වශයෙන් වනාහි මෙය **තත්‍ථ කතමං සීලබ්බතුපාදානං ඉතො බහිද්ධා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි** යයි වදාළ ක්‍රමයෙන්ම දතයුතුය.

එපරිද්දෙන්, මේ කරණකොටගෙන කියත්නුයි 'වාද' නම් වේ. මේ කරණකොට දැඩිකොට ගනිත්නුයි උපාදාන නම් වේ. කුමක් කියත්ද? කුමක් දැඩිකොට ගනිත්ද යත්, ආත්මයයි දැඩිකොට ගනීනුයි ආත්මවාද

උපාදාන නම් වේ. ආත්මය යන වචන මාත්‍රයම හෝ මේ කරණකොටගෙන ආත්මය යයි දැඩිකොට ගනීනුයි ආත්මවාද උපාදාන නම්. මේ විසිවැදෑරුම් සක්කාය දිට්ඨියට නමකි. මේ මෙහි සංක්‍ෂෙපයයි. විස්තර වශයෙන් වනාහි මේ ආත්මවාද උපාදානය, තත්‍ථ කතමං අත්තවාදූපාදානං ඉධ අස්සුතවා පුථුජ්ජ නො අරියානං අදස්සාවී යයි වදාළ ක්‍රමයෙන්ම දතයුතුය. තණ්හා සමුදයා යන මෙහි තණ්හා තොමෝ කාමොපාදානයම උපනිශ්‍රය වශයෙන් හෝ අනන්තර-සමනන්තර-නත්‍ථි-විගත-ආසේවන වශයෙන් හෝ ප්‍රත්‍යවෙයි. සෙසු උපාදානයන්ට වනාහි සහජාත ආදි වශයෙන් ද ප්‍රත්‍යය වෙයි. සෙස්ස කී නයමැයි.

8. තණ්හා වාරය

තණ්හා වාරයෙහි රූප තණ්හා -පෙ- ධම්ම තණ්හා යනු චක්‍ඛු ආදි ද්වාරයන් සම්බන්ධව පැවැති තණ්හාවයි. සිටුපුත්‍ය, බමුණුපුත්‍ය, යන මේ ආදියෙහි පියා කෙරෙන් ආ නාමය මෙන් පියා වැනි වූ අරමුණ කෙරෙන් ආ නමකි. මෙහිදු රූපය අරමුණුකොට ඇති තණ්හා තොමෝ රූපයෙහි තෘෂ්ණාව වේනුයි රූප තණ්හා නම්. එම රූප තණ්හාව, කාමරාග භාවයෙන් රූපාරම්මණය ආස්වාදනය කරමින් පවත්නී කාමතණ්හා නම් වන්නීය. සස්සත දිට්ඨි, සහගත රාග බැවින් යුතුව රූපය නිත්‍යය, සදාකාලිකය, ශාස්වතයැයි මෙසේ ආස්වාදනය කරමින් පවත්නා වූ තෘෂ්ණාව භවතණ්හා නම් වේ. උච්ඡෙද දිට්ඨි සහගත රාග භාවයෙන් රූපය සිඳෙයි. නැසෙයි. පරලොවක් නොවන්නේ යයි මෙසේ ආස්වාදනය කරමින් පවත්නී විභව තණ්හාව යයි ත්‍රිවිධ වෙයි. රූප තණ්හා තොමෝ යම්සේ ද, ශබ්ද තණ්හා ආදිහුද එසේ වෙති. මේ තෘෂ්ණාවගේ අටලොස් ප්‍රභේදයෝ වෙති. ඒවා අධ්‍යාත්ම රූපාදියේ අටලොසක්ද, බාහිර රූපවල අටලොසක්දැයි සතිසක් ප්‍රභේදයෝ වෙති. මෙසේ අතීතයෙහි සතිසෙකැයි අනාගතයෙහි සතිසෙකැයි වර්තමානයෙහි සතිසෙකැයි එකසිය අටක් ප්‍රභේදයෝ වෙති.

නැතහොත්, **අජ්ඣත්තිකස්සුපාදාය අස්මීති සති ඉත්‍ථස්මීති හොති,** යන මේ ආදි වූ අධ්‍යාත්මික-රූපාදිය ඇසුරු කළාහු අටලොසෙක, **බාහිරස්සුපාදාය ඉමිනා අස්මීති සති ඉමිනා ඉත්‍ථස්මීති හොති** යනුවෙන් බාහිර රූපාදිය ඇසුරුකළ අටලොසකැයි සතිසක් මෙති. මේ නයින් අතීතයෝ සතිසෙකි. අනාගතයෝ සතිසෙක, වර්තමානයෝ සතිසෙකැයි මෙසේත්. එකසිය අටක් තෘෂ්ණා ප්‍රභේදයෝ මෙනි. යළි සංග්‍රහ කරනු

ලබන කල්හි රූපාදි ආරම්මණයන්හි සයක්ම තෘෂ්ණා කායයෝද තුනක්ම කාම තණ්හාදීහු වෙත්යයි මෙසේ

නිද්දෙසත්ථෙන නිද්දෙස විත්ථාරා විත්ථාරසසච
පුන සංගහතො තණ්හා විඤ්ඤාතබ්බා විභාවිනා

(නිර්දේශාර්ථයෙහි වූ තණ්හා ශබ්දයෙන්, නිර්දේශ විස්තර වශයෙන් ද, විස්තර වූවහුගේත් නැවත සංග්‍රහ වශයෙන් ද, නුවණැත්තහු විසින් තණ්හා තොමෝ දතයුත්තීයි)

වෙදනා සමුදයා, මෙහි වනාහි වෙදනා යනු විපාක වේදනාව අදහස් කරන ලදී. එය සදොර තණ්හාවට කෙසේනම් ප්‍රත්‍යවේද යත්, ආස්වාද කළ යුතු බැවිනි. සැබව, සැප වේදනාවෙහි ආස්වාදනය හේතු කොටගෙන සත්ත්වයෝ එම වේදනාවට මමත්වය කරන්නාහු වේදනාවෙහි තණ්හාව උපදවා සැපවේදනා රාගයෙන් ඇලුනාහු චක්ඛු - ද්වාරයෙහි ඉෂ්ට වූම රූපයක් ප්‍රාර්ථනා කෙරෙති. නැවත ලද්දාහු එය ආස්වාදනය කෙරෙති. සැප ආරම්මණ දායක වූ චිත්තකාර ආදීන්ට සත්කාර කෙරෙති. සෝත ද්වාර ආදියෙහිද එසේමය. ඉෂ්ට වූ ශබ්ද ආදීන් පතත්, ලද්දා වූ ඒ ශබ්දාදීන් ආස්වාදනය කරති. ආලමබන දායක වූ වීණා වාදකය, සුවඳකරුය, අරක්කැමිය, පෙහෙරුය විවිධ ශිල්ප දක්වන්නවුන් යනාදීන්ට සත්කාර කෙරෙති. කුමක් මෙන්ද යත් පුත් සෙනෙහසින් පුතුට මමත්වය කරන්නහු කිරීමටද යම්සේ සත්කාර කෙරෙත් ද සැප වූ ගිතෙල් කිරි ආදියම ඇයට පොවත් ද වළඳවත් ද, සෙස්ස කී නියායෙන්ම දතයුතුයැ.

## 9. වෙදනා වාරය

වෙදනාවාරයෙහි වෙදනාකායා, වේදනා සමූහයෝ චක්ඛු සම්ඵස්සජා වෙදනා -පෙ- මනො සම්ඵස්සජා වෙදනා යනුවෙන් වූ මෙය චක්ඛුසම්ඵස්සජා වෙදනා, අත්ථි කුසලා අත්ථි අකුසලා අත්ථි අව්‍යාකතා යනුවෙන් විභංගයෙහි ආ බැවින්, චක්ඛු ද්වාර ආදියෙහි පැවැති කුසල-අකුසල-අව්‍යාකත වේදනාවන්ට සාරිපුත්ත, මන්තානිපුත්ත යන මේ ආදි නාමයන්හි, මවු කෙරෙන් ආ නාමය මෙන් මාතෘ සමාන වූ වස්තුවක් කෙරෙන් ආ නාමයකි. මෙහි වචනාර්ථය වනාහි චක්ඛු සම්ඵස්ස හේතුවෙන් උපන් වේදනාව චක්ඛුසම්ඵස්සජා වෙදනා නම් වන්නීය. සියලු තන්හි මේ ක්‍රමයයි. මේ පළමුකොට දක්වන ලද්දේ සර්ව සංග්‍රාහිකා කථාය.

විපාක වශයෙන් චක්ෂුර් ද්වාරයෙහි චක්ෂුර් විඥානයෝ දෙදෙනය. මනෝධාතුහු දෙදෙනය. මනෝවිඥාන ධාතුහු තිදෙන යන මොවුන් හා සම්පයුත්ත වශයෙන් (චක්ඛුසම්ඵස්ස හේතුවෙන් උපන්) වේදනාව දතයුතුය. සෝත ද්වාරයේද මේ ක්‍රමයමයි. මනෝ ද්වාරයෙහි මනෝ විඥානධාන සම්ප්‍රයුක්ත වූ වේදනාව මැයි. ඵස්ස සමුදයා යන මෙහි පඤ්චද්වාරයෙහි සහජාත චක්ඛු සම්ඵස්සාදීන්ගේ සමුදය හේතුවෙන් පඤ්ච වත්ථුක වේදනාවන්ගේ සමුදය වෙයි. අවශේෂ වූවනට චක්ඛු සම්ඵස්සාදීහු උපනිශ්‍රයාදි වශයෙන් ප්‍රත්‍යය වෙති. මනෝද්වාරයෙහි තදාලම්බන වේදනාවන්ගේද අද්වාරික වූ පටිසන්ධි-භවාංග-ච්‍යුති-වේදනාවන්ගේද සහජාත වූ මනෝ සම්ඵස්ස සමුදය හේතුකොටගෙන පහළවීම වේයයි දතයුතුයි. සෙස්ස කී නයමැයි.

## 10. ඵස්ස වාරය

ඵස්සවාරයෙහි ඇසෙහි ස්පර්ශයයි. සියලු තන්හි මේ ක්‍රමයමැයි. චක්ඛු සම්ඵස්සො -පෙ- කාය සම්ඵස්සො මෙතෙක් කුසලාකුසල වූ පඤ්ච වස්තුක වූ ස්පර්ශයෝ දසදෙන වදාරණ ලද්දාහු වෙති. මනොසම්ඵස්සො යන මේ වචනයෙන් පසු දෙවිසි ලෞකික විපාකයන් හා ඒකෝත්පාද තාදි භාවයෙන් සම්පයුත්ත වූ ස්පර්ශයෝ වදාරණ ලද්දාහුය. නාමරූප සමුදයා යනු චක්ඛු ආයතන ආදී වූ සවැදෑරුම් ආයතනයන්ගේ හටගැනීම හේතුකොටගෙන මේ සවැදෑරුම් වූ ඵස්සයාගේ හටගැනීම වේයයි දතයුතුයි. සෙස්ස කී නය ඇත්තේම වෙයි.

## 11. සළායතන වාරය

සළායතන වාරයෙහි චක්ඛායතනං යනාදි පදයන්හි යමක් කිවයුතුද, ඒ සියල්ල විසුද්ධි මග්ගයේ ඛන්ධ නිද්දෙසයේ සහ ආයතන නිද්දෙසයේ කියන ලද ක්‍රමයමැයි. නාමරූප සමුදයා යන මෙහි යම් නාමයකුත් යම් රූපයකුත් එම ආයතනයන්ට ප්‍රත්‍ය වේද, ඒ නාම රූපයාගේ වශයෙන් විසුද්ධි මාර්ගයෙහි පටිච්ච සමුප්පාද නිද්දෙසයෙහි කී ක්‍රමයෙන් නාමරූපයන්ගේ හටගැනීමෙන් සළායතනයන්ගේ හටගැනීම දතයුතුය. සෙස්ස උක්ත නයම වෙයි.

## 12. නාමරූපවාරය

නාමරූපවාරයෙහි නැමීම ලක්ෂණකොට ඇත්තේ නාම නම් වේ. බිඳීම ලක්ෂණකොට ඇත්තේ රූප නම් වේ. විස්තර වාරයෙහි වෙදනා

යනු වෙදනා ස්කන්ධයයි. සඤ්ඤා යන සංඥා ස්කන්ධයයි. චෙතනා ඵසෙසා, මනසිකාරො යනු සංස්කාර ස්කන්ධයයි දතයුතුයැ. තව ද ඒකාන්තයෙන් සංඛාර ඛන්ධයෙහි සංග්‍රහ වූ ධර්මයෝ වෙති. එතකුදු වුවත් මොහු තිදෙන ඉතාම දුර්වල වූ චිත්තයන්හි පවා යම්හෙයකින් වෙත්ද එහෙයින් මොවුන්ගේම වශයෙන් මෙහි සංඛාර ඛන්ධ දක්වන ලදී. චත්තාරි මහාභූතානි යන මෙහි චත්තාරි යන ගණන පරිච්ඡේද කිරීමයි. මහාභූතානි යනු පඨවි-ආපෝ-තේජෝ-වා්යෝ යන මොහුය. යම් කරුණකින් වනාහි ඔවුහු මහාභූතයෝ යයි කියනු ලැබෙත් ද, මෙහි අන්‍ය වූ යම් විනිශ්චය නයකුත් ඒ සියල්ල විසුද්ධි මාර්ගයෙහි රූපක්ඛන්ධ නිද්දෙසයෙහි කියන ලද්දේය.

චතුන්නං ච මහාභූතානං උපාදාය යන මෙහි චතුන්නං යනු උපයෝග (කර්ම) අර්ථයෙහි සාමි වචනයි. සතර මහාභූතයන් යි කියන ලද වෙයි. උපාදාය යනු උපාදානය කොටගෙන යන අර්ථයි. ඇතැම් ආචාර්ය කෙනෙක් නිශ්‍රය කොට යයි ද, (අරුත් බෙණෙති) වත්තමානං යන මෙයද මෙහි පාඨ ශේෂයි. නොහොත් මෙය සමූහ අර්ථයෙහි සාමි වචනයි. එබැවින් සතර මහා භූතයන්ගේ සමූහය ගෙන හෙවත් ඇසුරුකොට පවත්නා වූ රූපයයි මෙහි අර්ථය දතයුතුය. මෙසේ සියලු තන්හිම පඨවි ආදි සතරමහා භූත කෙනෙකුන් වෙත් ද, සතරමහා භූතයන් නිසා පවත්නා වූ යම් චක්ඛු ආයතනාදි භේදයෙන් අභිධර්ම පෙළෙහි වදාළ තෙවිසිවැදෑරුම් රූපයකුත් වේද ඒ සියල්ල රූපයයි දතයුතුයැ. විඤ්ඤාණ සමුදයා යන මෙහි යම් විඤ්ඤාණයක් යම් නාමයකටද යම් රූපයකටද යම් නාමරූපයකටද ප්‍රත්‍ය වේනම් ඒ පටිසන්ධි විඤ්ඤාණයාගේ හටගැනීමෙන් නාම රූපයන්ගේ හටගැනීම දතයුතු. සෙස්ස කී නයමැයි.

## 13. විඤ්ඤාණ වාරය

විඤ්ඤාණ වාරයෙහි චක්ඛු විඤ්ඤාණං යනු ඇසෙහි විඤ්ඤාණය හෙවත් ඇස හේතුකොට හටගත් විඤ්ඤාණය තුයි චක්ඛු විඤ්ඤාණ නම් වේ. සොත-ඝාන-ජිව්හා-කාය විඤ්ඤාණයෝ ද මෙසේයි. අන්‍ය වූ මනො විඤ්ඤාණ නම් චිත්තයම විඤ්ඤාණ වූයේ තුයි මනෝ විඤ්ඤාණ නම් වේ. දෙපස් විඤ්ඤාණයන් තොරකොට ඇති තෙභූමක විපාක චිත්තයට මේ මනෝ විඤ්ඤාණ යනුම කී. සංඛාර සමුදයා යන මෙහි යම් සංඛාරයක් තෙම යම් විඤ්ඤාණයකට ප්‍රත්‍යය වේද, ඒ සංඛාරයාගේ වශයෙන් විසුද්ධි

මාර්ගයෙහි, කී අයුරින්ම සංඛාරයන්ගේ හටගැනීමෙන් විඤ්ඤාණයාගේ හටගැනීම දතයුතුය. සෙස්ස කී නයමැයි.

## 14. සංඛාර වාරය

සංඛාර වාරයෙහි සකස් කිරීම ලක්ෂණකොට ඇත්තේ සංඛාර නම් වේ. මෙම සංඛාරයන්ගේ විස්තර වාරයෙහි, කායසංඛාරෝ යනු කයින් පවත්වන ලද සංඛාරයයි. කායද්වාරයෙහි මද වශයෙන් පැවැති කාමාවචර කුසලයන් වශයෙන් අටදෙනෙකුටද අකුසලයන් වශයෙන් දොළසකටදැයි විසිවැදෑරුම් වූ කාය සඤ්චේතනාවන්ට මේ නමකි.

වචී සංඛාරෝ යනු වාග් ද්වාරයෙහි වාග් භේද වශයෙන් පවත්නා වූ විසිවැදෑරුම් වූ වාග් සඤ්චේතනාවන්ට මේ නමකි. චිත්ත සංඛාරෝ යනු සිතින් පැවැති සංඛාරයයි. කාය වාග් ද්වාරයන්හි මද පැවැත්මක් නොකොට රහසිගතව සිට සිතන්නහුට පැවැති ලෞකික කුසලාකුසල වශයෙන් වූ එකුන්තිස් මනෝ සඤ්චේතනාවන්ට මේ නමකි. අවිජ්ජා සමුදයා යන මෙහි කුසලයන්ට උපනිශ්‍රය වශයෙන්ද අකුසලයන්ට සහජාත වශයෙන් ද අවිද්‍යා තොමෝ ප්‍රත්‍ය වන්නී යයි දතයුත්තිය. සෙස්ස කී අයුරුමැයි.

## 15. අවිජ්ජාවාරය

අවිජ්ජා වාරයෙහි, දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛ සත්‍ය විෂයෙහි නොදැනීමයි. මෙය මෝහයට නමකි. සමුදයේ අඤ්ඤාණං යනාදි තන්හි මෙම ක්‍රමයමයි. ඔවුනතුරෙහි කරුණු සතරකින් දුක්ඛ සත්‍යයෙහි නොදැන්ම දතයුතුයි. ඇතුළත් වීම් වශයෙන් ද වස්තු වශයෙන් ද අරමුණු වශයෙන්ද වැසීම් වශයෙන්දැයි කියායි. ඒ එසේමැයි. එම දුක්ඛයෙහි නොදැනීම දුක්ඛ සත්‍ය පරියාපන්න බැවින් දුක්ඛ සත්‍යයෙහිම ඇතුළත් වේ. දුක්ඛ සත්‍යද ඊට නිශ්‍රය ප්‍රත්‍ය වශයෙන් වස්තු වෙයි. ආරම්මණ ප්‍රත්‍යභාවයෙන් අරමුණු වෙයි. දුක්ඛයෙහි එය පටිච්ඡාදනය කෙරෙයි. එය දුක්ඛයාගේ අවිරීත වූ ලක්ෂණ ප්‍රතිවේධය වැළකීම් වශයෙන් ඒ දුක්ඛයෙහි ඤාණයාගේ පැවැත්මද නොදීම් වශයෙන් ද වේ.

සමුදය සත්‍යයාගේ නොදැන්ම කරුණු තුනකින් දතයුතුය. වස්තු වශයෙන් ද, අරමුණු වශයෙන් ද, පටිච්ඡාදන වශයෙන්දැයි කියායි. නිරෝධ සත්‍යයෙහි ද, මාර්ග සත්‍යයෙහි ද නොදැනී පටිච්ඡාදන වශයෙන් එකම

කරුණකින් දතයුතුයැ. නිරෝධ මාර්ගයන්ගේ පටිච්ඡාදනයම නොදැනීම වෙයි. ඒ නිරෝධ මාර්ගයන්ගේ අවිපරීත වූ ලක්‍ෂණ ප්‍රතිවේධය වැළකීම වශයෙන් ද නිරෝධ මාර්ගයන්හි ඥානයාගේ පැවැත්ම නොදීම් වශයෙන් ද වෙයි. එම අඤ්ඤාණය එහි ඇතුළත් වූයේ නොවෙයි. එම සත්‍ය දෙකෙහි අපරියාපන්න බැවිනි. එම නොදැන්මම එම සත්‍ය දෙක වස්තු වූයේ නොවෙයි. සහජාත නොවූ බැවිනි. අරමුණු වූයේ නොවෙයි. එම සත්‍ය දෙක අරභයා නොපවත්නා බැවිනි. පශ්චිම වූ නිරෝධ-මාර්ග සත්‍ය දෙක ගම්භීර බැවින් දක්නට දුෂ්කර වෙයි. එහි අන්ධ වූ නොදැක්ම නො පවතී. පූර්ව වූ (දුක්ඛ-සමුදය) සත්‍ය දෙක, විරුද්ධාර්ථයෙන් ස්වභාව ලක්‍ෂණ තමා දැකීමට දුෂ්කර බැවින් ගම්භීර වෙයි. එහි විපර්යාස ග්‍රාහ වශයෙන් (නොදැනීම) පවතී.

තව ද දුක්ඛ යයි මෙතෙකින් සංග්‍රහ වශයෙන් ද, වස්තු වශයෙන් ද වස්තු වශයෙන් ද, ආරම්මණ වශයෙන් ද කෘත්‍ය වශයෙන්දැයි අවිජ්ජාව දක්වන ලද්දීය. දුක්ඛ සමුදයෙ යයි මෙතෙකින් වස්තු වශයෙන් ද ආරම්මණ වශයෙන් ද, කෘත්‍ය වශයෙන් ද (අවිජ්ජාව) දක්වන ලද්දීය. දුක්ඛ නිරොධෙ දුක්ඛ නිරොධ ගාමිනියා පටිපදාය යයි මෙතෙකින් කෘත්‍ය වශයෙන් (අවිජ්ජාව) දක්වන ලදී. අවිශේෂයෙන් වනාහි අඤ්ඤාණං යන මෙම වචනයෙන් ස්වභාව වශයෙන් (අවිජ්ජාව) දක්වන ලද්දීයයි දතයුත්තීය. ආසව සමුදයා යන මෙහි කාමාසව, භවාසවයෝ සහජාතාදීන්ගේ වශයෙන් අවිජ්ජාවට ප්‍රත්‍ය වෙයි. අවිජ්ජාසවය උපනිසසය වශයෙන් ප්‍රත්‍ය වෙයි. තව ද මෙහි පළමු උපන් අවිජ්ජා තොමෝ අවිජ්ජාසවයයි දතයුත්තියැ. ඕ තොමෝ පසුව පසුව උපන් අවිජ්ජාවට උපනිසය ප්‍රත්‍ය වෙයි. සෙස්ස කියන ලද ක්‍රමයමැයි.

ආසව වාරය

අවිජ්ජා සමුදයා යන මෙහි, අවිජ්ජා තොමෝ කාමාසව, භවාසවයන්ට සහජාතාදීන්ගේ වශයෙන් ප්‍රත්‍ය වෙයි. අවිජ්ජාසවයට උපනිස්සය වශයෙන් ප්‍රත්‍ය වෙයි. තව ද මෙහි පසුව උපන් අවිජ්ජා තොමෝ අවිජ්ජාව නම් වේ. පළමු උත්පත්ති අවිජ්ජාවමයි. ඕ තොමෝ පසුව උපන් අවිද්‍යාශ්‍රවයට උපනිශ්‍රය ප්‍රත්‍යය වෙයි. සෙස්ස කී නයමැයි. මේ ආසව වාරය තෙම පටිච්ච සමුප්පාදයෙහි ප්‍රධාන වූ අවිජ්ජාවක් වත්නීද ඒ අවිජ්ජාවගේද ප්‍රත්‍යය දැක්වීම් වශයෙන් වදාරණ ලද්දේය. මෙසේ වදාල මේ වාරය හේතුකොට සංසාරයාගේ නොදත හැකි අග්‍රය

ඇතිබැවි, පැහැදිලි වූවා වෙයි. කෙසේද යත්, ආසව සමුදයෙන්ම අවිජ්ජා සමුදය වෙයි. මෙසේ ආසවයෝ අවිජ්ජාවට ද අවිජ්ජාව ආසවයන්ට ද ප්‍රත්‍යය වේයයි දක්වා අවිද්‍යාවගේ පූර්වකෝටිය නොපැනෙයි. එම පූර්වකෝටිය නොපෙනෙන බව නිසා සංසාරයාගේ නොදතහැකි අග්‍ර ඇති බව සිද්ධවූවා වෙයි.

මෙසේ මෙම සූත්‍රයෙහි මේ සියල්ලම කම්මපථ-ආහාර-දුක්ඛ-ජරා මරණ-ජාති-භව-උපාදාන-තණ්හා-වෙදනා-ඵස්ස-සළායතන-නාමරූප-විඤ්ඤාණ-සංඛාර-අවිජ්ජා සහ ආසව යනුවෙන් සොළොස් වාරයක් වදාළහ. එක එක වාරය සංඛෙප, විත්ථාර යයි දෙපරිද්දකින් සිටි බැවින් දෙතිස් තැනක් වෙයි. මෙසේ මේ සූත්‍රයෙහි දෙතිස් තන්හි චතුරාර්ය සත්‍යය වදාරණ ලද්දාහුය.

මොවුන්ගේ විස්තර වශයෙන් වදාළ සොළොස් තන්හි රහත් බව වදාරණ ලදී. තෙරුන් වහන්සේගේ බුද්ධියෙන් දෙතිස් තන්හිම චතුරාර්ය සත්‍යය ද සතර මගද වදාරණ ලදහ. මෙසේ හෙයින් සියලුම පංච නිකායෙහි සංග්‍රහ කරන ලද චතුරාර්ය සත්‍යයන් දෙතිස් වරක් රහත් බවත් වදාරණ ලදද, මේ සම්මා දිට්ඨි සූත්‍ර හැර එබඳු සූත්‍රයක් නැත්තේය.

**ඉදමවොචායස්මා සාරිපුත්තො** යනු දෙතිසක් චතුසච්ච පරියායන්ගෙන් ද, දෙතිස් රහත්ඵල පරියායන්ගෙන් ද සූසැට කරුණකින් සරසා සැරියුත් තෙරණුවෝ මේ සම්මා දිට්ඨි සූත්‍රය වදාළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු සැරියුත් තෙරුන්ගේ භාෂිතය අනුමෝදන් වූවාහුය. මොනවට පිළිගත්තාහුය.

**සම්මා දිට්ඨි සූත්‍ර වර්ණනාව නිමි.**

# 1-1-10

එවං මෙසුතං යනු සතිපට්ඨාන සූත්‍රයයි.

කුරු ජනපදය

කුරුසු විහරති, කුරුනම් දනව් වැසි රාජ කුමාරයෝයි. ඔවුන්ගේ නිවාස වූ එක් ජනපදයක්ද රූඪී (අන්වර්ථ නොවූ ශබ්ද වශයෙන් කුරු යයි කියනු ලැබේ. එම කුරු ජනපදයෙහි යන අර්ථයි. අටුවා ඇදුරෝ වූකලී මෙසේ කීහු. මන්ධාතු රජුගේ කාලයෙහි පූර්ව විදේහ ආදි වූ තුන් දිවයින්හි මනුෂ්‍යයෝ-දඹදිව නම් බුදු-පසේබුදු-මහසවු-සක්විති ආදි වූ උතුම් පුරුෂයන්ට උත්පත්ති භූමි වූ උතුම් දිවයිනකි යිද ඉතා සිත්කළු යයි අසා සත්රුවන් පෙරටුකොට සතර දිවයින්හි පිළිවෙලින් හැසිරෙන්නා වූ මන්ධාතු සක්විති රජු සමග පැමිණියාහුය.

ඉක්බිති රජතුමා පරිණායක රත්නය විචාළේය. මිනිස්ලොවට වඩා ඉතා රමණිය තැනක් ඇත්දෝහෝයි කියා දේවයිනි කුමක් හෙයින් මෙසේ කියහුද, මොවුන්ගේම වාසස්ථානය වූ සිව්මහරජය, මීට වඩා රමණිය වූයේ නොවේදැයි රජතුමා සත්රුවන පෙරටුකොට එහි ගියහ. සතරවරම් රජදරුවෝ මන්ධාතු මහරජ තෙමේ ආයේයයි අසාම, හෙතෙම මහත් සෘද්ධි ඇති මහත් ආනුභාව ඇති රජෙක යුද්ධයෙන් පිටු දක්නට නොහැකි වන්නේ යයි සිය රජය පාවා දුන්හ.

හෙතෙම එම රජය ගෙන නැවතත් මේ ස්ථානයට වඩා රමණිය තැනක් ඇත්දැයි විචාළේය. එවිට ඔහුට තව්තිසා දෙව්ලොව මීට වඩා රමණිය බැව් කීවාහුය. දේවයන් වහන්ස, තව්තිසා භවන අතිශයින් සිත්කලු වෙයි. එහිදී සක්දෙව් රජහට සතරවරම් දෙවිවරු පිරිවර වූවාහුය. දොරටුපල් තන්හි සිටිති. ශක්‍ර දේවේන්‍ද්‍ර තෙම මහත් සෘද්ධි ඇත්තේ ද මහත් ආනුභාව ඇත්තේ ද වෙයි. ඔහුගේ උපභෝග ස්ථානයෝ මෙසේය. යොදුන් දහසක් උස වූ වෛජයන්ත නම් පහයෙක් වෙයි. පන්සියයක් යොදුන් උස්වූ සුධර්මා නම් දේවසභාවක් වූවාය. එකසිය පනස් යොදුන් උස වෛජයන්ත නම් රථයක් වෙයි. එබඳු වූම ඓරාවණ නම් ඇතෙක් වෙයි. කප්රුක් දහස් ගණනින් සැදුම් ලත් 'නන්‍දන' වනයද, 'චිත්‍රලතා' වනයද, 'ඵාරුසක' වනයද, 'මිශ්‍රකව' වනයද වෙයි. එසේම සියක් යොදුන් උස් වූ 'පාරිච්ඡත්තක කොවිදූර වෘක්ෂය වෙයි. ඒ පරසතු රුකයට

පණ්ඩුකම්බල නම් ශෛලමය අසුන වෙයි. එය මෘදුය. ඒ හේතුවෙන් එහි හිඳත්තා වූ සක්දෙවිඳුගේ කයේ අඩක් ඇතුළට පිවිසියේද වෙයි. එබඳු වූ සැටයොදුන් දිග, පනස් යොදුන් පළල පසළොස් යොදුන් උස බඳු වදමල් පැහැති පඬුඅඹුල් අසුනක් ද වේයයි අසා රජතුමා එහි යනු කැමැත්තේ සත්රුවනට පැන් වැඩීය. එවිට සත්රුවන සිවුරඟසෙනග සමග අහසට පැනනැග දෙව්ලොව මැදින් සත්රුවන බැස පරිනායක රත්නය පෙරටුකොට ඇති සිව්රඟ සෙනග සමග පොළොවෙහි පිහිටියේය. රජතුමා තනියම තව්තිසා භවනට ගියහ. සක්දෙව්රජ මන්ධාතු රජ ආයේයයි අසා ඔහුට පෙරගමන්කොට, මහරජ ඔබට ස්වාගතය රජය ඔබ සතුය. මහරජ අනුශාසනා කළ මැනවයි කියා නළුවන් සහිත රජය දෙකට බෙදා එක් භාගයක් රජුට දුනි. තව්තිසා භවනට පැමිණි ඇසිල්ලකින් රජුගේ මිනිස් බව පහව ගියේය. දෙව් බව පහළ විය. ශක්‍රයා සමග පඬුපුල් අස්නෙහි හුන්නාහු ඔහුගේ ඇසිපිය හෙලීම පමණකින්ම නානත්වය පෙනේ. ඒ නානත්වය නොසලකන්නා වූ දෙවියෝ ශක්‍රයාගේ ද, ඔහුගේ ද නානත්වයෙහි මුලාවෙති. හෙතෙම එම තව්තිසා භවනෙහි දෙව්සැප වළඳමින්, යම්තාක් සතිස් ශක්‍ර කෙනෙක් ඉපිද චුත වූවාහුද, එතෙක් කල් රජය කරවා පඤ්චකාමයෙන් තෘප්තියකට නොපැමිණියේ එයින් ගිලිහී සිය උයනෙහි වැටුනේ අවු සුළඟින් පහළ කය ඇත්තේ කලුරිය කළේය. තවද චක්‍රරත්නය පොළොවෙහි පිහිටි කල්හි පරිණායක රත්නය රන්පටෙක මන්ධාතු රජුගේ වහන් සඟල අන්දවා මේ මන්ධාතු රජුගේ රජය යයි රාජ්‍යයනුශාසනා කළේය. ඒ තුන් දිවයිනෙන් පැමිණි මනුෂ්‍යයෝද නැවත යන්ට නොහැක්කාහු පුත්රුවන කරා එළඹ දේවයිනි, අපි රජුගේ ආනුභාවයෙන් ආවාහු වෙමු. දැන් යන්නට නොහැක්කෝ වෙමු, අපට වාසයට සුදුසු තැනක් දෙනු මැනවයි යාඥා කළහ. හෙතෙම ඔවුනට එක එක ජනපද දුන්නේය. ඒ ජනපදයන් අතුරෙහි පූර්ව විදේහයෙන් පැමිණි මිනිසුන් විසූ පෙදෙස ඒ පළමු නමින්ම 'විදේහ' රටයයි නම් ලදහ. අපරගෝයානයෙන් පැමිණි මිනිසුන් විසූ පෙදෙස අපරන්ත ජනපදයයි නම් ලදහ. උතුරුකුරු දිවයිනෙන් පැමිණි මිනිසුන් විසූ පෙදෙස කුරු රට යයි නම් ලදහ. බොහෝ ගම් නියම්ගම් ආදිය ගෙන බහුවචනයෙන් ව්‍යවහාර කරනු ලැබේ. එහෙයින් කියන ලද කුරුසු විහරති යයි.

**කම්මාසස ධම්ම**

**කම්මාසස ධම්මං නාම කුරූනං නිගමො, කම්මාසස ධම්මං** යන මෙහි කිසිවෙක් ධ කාරය ද කාර වශයෙන් ගෙන අරුත් වර්ණනා

කෙරෙත්. කල්මාෂ තෙම මෙහිදී මෙහි දමනය කර ලදනුයි කම්මාසස දම්ම නම්. කම්මසො යනු කල්මාෂ වූ පය ඇති පෝරිසාද තෙම කියනු ලැබේ. ඔහුගේ පය කණුවකින් විදිතැන වණය වැඩෙන්නේ චිත්‍රදාර සදෘශව (දුඹුරුවන් දැව කොටයකට සමානව) යම්හෙයකින් වැඩීම වීද, එහෙයින් කල්මාෂ පාදයයි ප්‍රසිද්ධ විය. ඒ කල්මාෂ පාදද ඒ අවකාසයෙහි දමනය කරන ලද පෝරිසාද භාවයෙන් වළකන ලද්දේ කවරෙකු විසින්ද යත් මහසත්හු විසින් දමනය කරන ලදී. කවර ජාතකයෙක්හිද යත් සුතසෝම ජාතකයෙහි යයි කියති. මහාවිහාරවාසී තෙරහු ජයද්දිස ජාතකයෙහි යයි කියති. ජයද්දිස ජාතකයෙහි යනු සැබව ඒ ජයද්දිස කාලයෙහි මහසත්හු විසින් කල්මාෂ පාදතෙම දමනය කරන ලද්දේය. එහෙයින් වදාළහ.

**පුතෙතා යදා හොමි ජයද්දිසසස - පඤචාල රට්ඨාධිපතිසස අත්‍රජො**
**චත්‍වාන පාණං පිතරං අමොචයිං කම්මාස පාදමපිචහං පසාදයිං**

(යම්කලෙක පඤ්චාල දේශාධිපති වූ ජයද්දිස රජුට මම පුත්‍රයා වීමි. මගේ ප්‍රාණය පරිත්‍යාගකොට පියාණන් මරණයෙන් මිදවීමි. කල්මාෂ පාද නම් වූ පෝරිසාදයාද පැහැදවීමි)

කිසිවෙක් වනාහි ධ කාරයෙන්ම අර්ථ වර්ණනා කරති. කුරුරට වැසියන්ගේ කුරු නම් වූ ව්‍රත ධර්මය එහිදී කම්මාස නම් වීද, එබැවින් එම ස්ථානය කම්මාස නම් විය. එහි හටගත් ධර්මයද කම්මාස ධම්මයයි කියනු ලැබේ. එහි වැසියන් පදිංචි වූ නියම්ගමටද මේ නාමයම විය. භුම්ම (සත්තමී) වචනයෙන් කුමක් හෙයින් නොකියන ලද්දේ ද යත් විසීමට අවකාස නොවන හෙයිනි. බුදුරදුන්ට ඒ නියම්ගම විසීමට කිසි විහාරයක් නොවීය. එසේ වුවත් නියම්ගමින් ඉවත්ව ජලය ඇති එක්තරා රමණීය බිම්පෙදෙසක මහත්වූ වනලැහැබක් විය. ඒ වනලැහැබෙහි බුදුරදහු එම නියම්ගම ගොදුරු ගම්කොට විසූ සේක. එසේ හෙයින් මෙසේ මෙහි අරුත් දතයුතුයැ. කුරු ජනපදයෙහි කම්මාසසධම්ම නම් කුරුවාසීන්ගේ නියම්ගම යම් තැනෙක්හිද එසේ ගොදුරුගම්කොට භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි සේක.

එකායනො අයං භික්ඛවෙ මග්ගො යනුවෙන් කුමන හේතුවක් නිසා බුදුරදහු මෙම සූත්‍රය වදාළ සේක්ද? කුරුරට වැසියන්ගේ ගැඹුරු

දහම් අවබෝධයෙහි හැකියාවක් ඇති බැවිනි. කුරුරට වැසි භික්ෂු භික්ෂුණීහුද උපාසක උපාසිකාවෝ ද සුදුසු දේශගුණය, සුදුසු ප්‍රත්‍යය සම්පූර්ණ බැවින් ඒ රටෙහි වූ සැපවත් වූ ඍතු-ප්‍රත්‍යය සේවනය කිරීමෙන් නිතර නිරෝගී වූ සිරුරු ඇත්තාහු ද යෝගය සිත් ඇත්තාහු ද වෙති. ඔවුහු චිත්ත-ශරීර යහපත් බැවින් එයින් ලද ඥාන බල ඇත්තාහු, ගැඹුරු දහම් පිළිගැනීම සමර්ථයෝ වෙති. ඒ කරුණ නිසා බුදුරදහු ඔවුන්ගේ මෙම ගැඹුරු දහම් පිළිගැනීමේ සමර්ථ බව දන්නා සේක් එක්විසි තැනක රහත් බව දක්වා වූ කමටහන්හි පිහිටුවා මේ ගැඹුරු අරුත් ඇති සතිපට්ඨාන සූත්‍රය වදාළ සේක.

ඒ එසේමැයි. යම්සේ මිනිසෙක් රුවන් කරඬුවක් ලැබ එහි විවිධ පුෂ්පයන් බහාලන්නේද, කූඩා රන් මංජුසාවක් (පෙට්ටියක්) ලැබ සත්රුවන් බහාලන්නේ ද එපරිද්දෙන් භාග්‍යවත්හු කුරුරට වැසි පිරිස ලැබ ගැඹුරු වූ දේශනා දෙසූ සේක. එහෙයින්ම මෙහිදී අන්‍ය වූ ගැඹුරු අරුත් ඇති දික්සඟියෙහි මහානිදාන මහාසතිපට්ඨාන මැදුම් සඟියෙහි සාරෝපම, රුක්ඛූපම, රට්ඨපාල, මාගන්දිය, ආනඤ්ජසප්පාය යන අන්‍ය වූ සූත්‍රයන්ද දෙසූ සේක.

තවද එම ජනපදයෙහි සිවුපිරිසම සතිපට්ඨාන භාවනානුයෝගී වූවාහුම වෙසෙති. යටත් පිරිසෙන් දාස කම්කරු පිරිවර ජනයෝ ද සතිපට්ඨාන සම්බන්ධ වූම කථාවන් කරති. පැන්තොට නූල්කටින තැන ආදි තන්හිද නිරර්ථක කථා නො කරති. ඉදින් කිසි ස්ත්‍රියක් මෑණියෙනි, තෙපි කිනම් සතිපට්ඨාන භාවනාවක් මෙනෙහි කෙරෙහි දැයි විචාරණ ලද්දී කිසිවක් නැතැයි කියානම් ඇයට ගරහති. තිගේ ජීවිතයට නින්දා වේවා, ජීවත් වන්නියක වුවද තී මළතැනැත්තියක සමානයයි (පවසා) ඉක්බිති ඇයට යලිදු මෙසේ නොකරවයි අවවාදකොට එක්තරා සතිපට්ඨානයක් උගන්වති. යම් ස්ත්‍රියක් මම අසවල් සතිපට්ඨාන මෙනෙහි කරමි යයි කී කල්හි ඇයට සාධු, සාධු යයි සාධුකාර දී තිගේ ජීවිතය සොඳුරු වූවකි. තී නම් මිනිස් බවට පැමිණියා වෙයි. තී සඳහා බුදුවරයෝ උපදින්නාහු යයි මේ ආදි වචනවලින් ප්‍රශංසා කරති. තව ද මේ ජනපදයෙහි මිනිස් ජාති ඇත්තාහුට සතිපට්ඨාන මනසිකාරයෙහි යෙදුනාහු නොවෙති. ඔවුන් ඇසුරුකොට වාසය කරන්නා වූ තිරිසන් ගතයෝ පවා සතිපට්ඨාන මනසිකාරය මෙනෙහි කරති. තිරිසන් සතුන්ගේ සතිපට්ඨාන මෙනෙහි කිරීම පිළිබඳ මේ වස්තුවකි.

**සතිපට්ඨාන මෙනෙහි කළ ගිරා පෝතකයෙක්**

එක්තරා නළු පිරිසක් සුවපෝතකයෙකු ගෙන හික්මවමින් ඒ නළු සමූහය තෙම මෙහෙණි අසපුවක් ඇසුරු කර යනකල සුවපෝතකයා සිහිනොකොට ගියේය. සාමණේරීහු ඒ සුවපෝතකයා ගෙන පෝෂණය කළාහුය. ඔහුට බුද්ධරක්ඛිත යයි නමක්ද තැබූහ. දිනක් ඉදිරියෙහි සිටි සුවපෝතකයා දැක, මහාස්ථවිරී තොමෝ බුද්ධරක්ඛිතයයි (කථා කළාය) ආර්යාවනි, කිමදැයි (ඇසීය) තාගේ කිසියම් භාවනා මෙනෙහි කිරීමක් ඇත්ද, ආර්යාවනි නැත, ඇවත පැවිද්දන් සමීපයෙහි වසන්නවූ විසින් නම් හරණල ද (භාවනාවෙන් තොර) ආත්මභාවයක් ඇත්තෙක් වන්ට නොවටී. කිසියම් මෙනෙහි කිරීමක් කැමතිවිය යුත්තේය. තෙපි වනාහි අනිකක් නොහැකි වන්නෙහි, අට්ඨී, අට්ඨී යයි හැදෑරීම කරව, හෙතෙම තෙරණියගේ අවවාදයෙහි සිට අට්ඨී අට්ඨී යයි හදාරමින් වෙසෙයි. එක්දිනක් උදෑසනම තොරණෑ අග සිට ළහිරු රැස් තප්නා වූ ඒ සුවපෝතකයා එක් ලිහිණියෙක් තියමැදුරෙන් අල්වා ගති. හෙතෙම කී කී යයි ශබ්ද කළේය. සාමණේරීහු ඔහුගේ ශබ්දය අසා, ආර්යාවෙනි, බුද්ධරක්ඛිත ලිහිණියෙකු විසින් ගන්නා ලද්දේය. ඔහු මුදවන්නෙමු යයි ගල් ආදිය ගෙන ලුහුබැඳ මිදවූවාහුය. ගෙනවුත් ඉදිරියෙහි තබන ලද ඔහුට තෙරණිය මෙසේ කීවාය. බුද්ධරක්ඛිතය ලිහිණියා විසින් ගත්කල්හි කුමක් සිතුවෙහිද? අනිකක් නොසිතීමි. ඇට රැසක්ම ඇට රැසක් ගෙනයයි. කවර තැනෙක්හි නමුත් විසිර යන්නේය. ආර්යාවෙනි, මෙසේ අට්ඨී සංඥාවම සිතුවෙමියි, සාධු, සාධු බුද්ධරක්ඛිතය අනාගතයෙහි භවක්‍ෂය කිරීම පිණිස තට ප්‍රත්‍යය වන්නේ යයි, මෙසේ ඒ කුරු ජනපදයෙහි තිරිසන් ගණයෝ පවා සතිපට්ඨාන මෙනෙහි කිරීමෙහි යෙදුනාහුය. එහෙයින් බුදුරජාණන් වහන්සේ සතිපට්ඨාන වෘද්ධියම දන්නා සේක් මෙම සූත්‍රය වදාළහ. එහි එකායනො යනු එකම මාර්ගය යන අර්ථයි. මාර්ගයට වනාහි.

මග්ගො, පන්ථො පථො පජ්ජො, අඤ්ජසං වටුමායනං
නාවා උත්තර සේතු ච, කුල්ලො ච භිසි සංකමො

යයි බොහෝ නාමයෝ වෙති. ඒ මේ මාර්ගය මෙහි 'අයන' නාමයෙන් වදාරණ ලදී. එහෙයින්, එකායනො අයං භික්ඛවෙ මග්ගො යන මෙහි, මහණෙනි, මෙම මාර්ගය තෙම එකමාර්ගය වෙයි. මාර්ග දෙකක් වූයේ නොවෙයි. මෙසේ අර්ථ දතයුතුයි. නැතහොත් එකෙන අසිතබෙබා එකක්හු විසින් පිළිපැදිය යුත්තේ එහෙයින් එකායන නම් වේ. ගණයා හා එක්වීම

අතහැර (වස්තුකාම, ක්ලේශකාමයන් කෙරෙන් කයින් හා සිතින්) වෙන්වූවහු විසින් ප්‍රකර්ෂ විවේක ඇත්තහු විසින් අසිතබ්බො පිළිපැදිය යුත්තේ නුයි, මේ කරණකොටගෙන පිළිපැදිය යුත්තේනුයි අයන නම් වේ. සසරින් නික්ම නිවනට පැමිණෙයි යන අර්ථයි. **එකස්ස අයනො** එකක්හුගේ අයනය වේනුයි එකායන නම් වේ. **එකස්සා** ශ්‍රේෂ්ඨ වූවහුගේ භාග්‍යවත්හු සියලු සත්ත්වයන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වූවාහු වෙති. එහෙයින් භාග්‍යවත්හුගේ යයි කියන ලද වෙයි. යලිදු ඒ මගින් අන්‍යයෝ ද නිවනට යෙති. එසේ ඇතිකල්හි ද ඒ අයනය භාග්‍යවත්හුගේ මැයි භාග්‍යවතුන් වහන්සේ විසින් උපදවන ලද බැවිනි. එහෙයින් වදාළහ. **සො හි බ්‍රාහමණ, භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා** යන ආදිය නොහොත් **අයතීති අයනො,** යේනුයි අයන නම් වේ යයි, පවතී යන අර්ථයි. **එකස්මිං අයනො** එකෙක්හි වූ අයනය, එකායන නම් වේ. මේ ශාසනයෙහි පවතී. අන්‍ය ශාසනයෙක්හි නැතැයි කියන ලද වෙයි. වදාළේමැයි.

**ඉමස්මිං බො සුභද්ද, ධම්මවිනයෙ අරියො අට්ඨංගිකො මග්ගො උපලබ්භති** යයි යම් හෙයකින් මෙය දේශනා භේදයම වේද, එහෙයින් අර්ථය එකක් වෙයි. යලිදු **එකං අයති,** එකම නිවනට පැමිණෙයි යන කරුණෙන් එකායන නම් වේ. පූර්ව භාගයෙහි නානා මුඛ වශයෙන් භාවනාව පැවැත්තේ නමුදු අපර භාගයෙහි නිවනට ම පැමිණේ යයි කියන ලද්දේ වේ. සහම්පති බ්‍රහ්මතෙම මෙසේ කීහ.

**එකායනං ජාති ඛයන්ත දස්සී**
**මග්ගං පජානාති හිතානුකම්පී**
**එතෙන මග්ගෙන අතංසු පුබ්බෙ**
**තරිස්සන්ති යෙව තරන්ති ඔඝං**

(හිතානුකම්පී වූ තථාගතයන් වහන්සේ එකායන නම් වූ යම් මාර්ගයක් දැනගත් සේක් ද, මේ මාර්ගය කරණ කොටගෙන, පූර්වයෙහි වූ යම් ආර්ය කෙනෙක් වූවාහුද, ඔවුහු ඕඝය තරණය කළාහුය. අනාගතයෙහි යම් ආර්ය කෙනෙක් වන්නාහුද ඔවුහුද තරණය කරන්නාහුය. වර්තමානයේ ආර්යයෝ ද ඕඝය තරණය කරත්.)

කිසි ආචාර්ය කෙනෙක් **න පාරං දිගුණං යන්ති** යන ගාථා නයින් යම්හෙයකින් එක්වරක් නිවනට පැමිණේ ද, එහෙයින් එකායන යයි කියති. එය සුදුසු නොවේ. මේ අර්ථයට **සකිං අයනො** යන මේ

ව්‍යඤ්ජනයෙන් විය යුතුය. එක් අයනයක් ඇත්තේ ඉදින් එක් අයනයක් ඇත්තේ, ඒකගතිය, පැවැත්වූ මොහුට යයි මෙසේ අරුත් යොදා ඉදින් කියනු ලබන්නේ නම් (එකායනො යන) පදය යෙදෙන්නේය. එතකුදු වුවත් අර්ථය දෙපරිද්දෙන්ම නො යෙදෙයි. කුමක් හෙයින්ද යත් මේ සතිපට්ඨාන සූත්‍රයෙහි පූර්වභාග මාර්ගය තමා අදහස්කළ බැවිනි. එය එසේමය. කායාදී සිව් අරමුණෙහි පැවැති පූර්වභාග සතිපට්ඨාන මාර්ගය මෙහි අදහස් කරන ලද්දේය. ලෝකෝත්තර සතිපට්ඨාන මාර්ගය අදහස් නොකරන ලදී. හේද නොයෙක් වරම පැමිණෙයි. නොයෙක් අයනද වෙති. (පූර්වභාග)

**එකායන මාර්ගය පිළිබඳ සාකච්ඡා**

පූර්වයෙහි ද මේ පදය පිළිබඳව මහතෙරවරුන්ගේ ධර්ම සාකච්ඡා පහළ වූයේ ම ය. ත්‍රිපිටක චූලනාග තෙරණුවෝ පූර්වභාග සතිපට්ඨාන මාර්ගය යයි කීහ. උන්වහන්සේගේ ආචාර්ය වූ චූල සුමන තෙරණුවෝ මිශ්‍රක මාර්ගය යයි කීහ. ස්වාමීනි, පූර්වභාගයයි. ඇවැත්නි, මිශ්‍රක මාර්ගයයි. ආචාර්යයන් නැවත නැවත කියන කල්හි, ප්‍රතිභාහනය නොකොට ශිෂ්‍ය වූ චුල්ලනාග තෙරණුවෝ නිශ්ශබ්ද වූහ. ප්‍රශ්නය විනිශ්චය නොකොටම නැගිට ගියහ.

ආචාර්ය තෙරණුවෝ නහන කොටුවට යන්නාහු මවිසින් මිශ්‍ර මාර්ගයයි කියන ලදී. චුල්ලනාගයෝ පූර්වභාග මාර්ගයයි ගෙන ව්‍යවහාර කෙරෙති. මෙහි විනිශ්චය කවරදෝහෝයි සූත්‍රාන්තය මුලපටන් අර්ථ පරිවර්ථනය කරමින්, **යොහි කොචි භික්ඛවෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භවෙය්‍ය සත්ත වස්සානි,** යන මේ ස්ථානයෙහි අර්ථ සැලකුහ. ලෝකෝත්තර මාර්ගය ඉපිද සත්වසක් සිටින්නෙක් නම් නැති මා විසින් කියන ලද මිශ්‍රක මාර්ගය නොලැබෙයි. චුලනාගයන් දක්නා ලද පූර්වභාග මාර්ගයම ලැබේයයි දැන, අටවක් පොහෝ දිනය වූයෙන් ධර්මශ්‍රවණයට ඝෝෂා කළ කල්හි ගියහ.

පුරාණ කාලයෙහි තෙරවරු ධර්මශ්‍රවණයට ප්‍රිය කරන්නාහු වෙති. කාල ඝෝෂ ශබ්දය අසා මම පළමුකොටම යෙමි. මම පළමුකොටම යෙමියි එක් පහරින්ම රැස්වෙත්. එදවස චුල්ලනාග තෙරුන්ගේ දේශනා වාරය විය. එහෙයින් ධර්මාසනයෙහි හිඳ විජිනිපත ගෙන පූර්ව ගාථාව වදාළ කල්හි අසුන් පිටිපස සිටියා වූ තෙරුන්ට රහසිගතව හිඳ

කියන්නෙමියි, මෙබඳු සිතක් නොවීය. යම්හෙයකින් පුරාණ තෙරුන් වහන්සේලා දොස් පහළ නොකරන්නාහු වෙත් ද, තමාගේ රුචියම ඉක්ෂුභාරයක් මෙන් ඔසවාගෙන නොහැසිරෙත්ද කාරණය ගනිත් ද, අකාරණය හරිත් ද, එහෙයින් චූලල සුමම තෙරුන් වහන්සේ ඇවැත්නි, චූලලනාග යයි කීහ. හෙතෙම ආචාර්යයන්ගේ ශබ්දය මෙනැයි ධර්මදේශනාව තබා කිම වහන්ස යයි කීය.

ඇවැත්නි චූලලනාගය, මා කියන ලද මිශ්‍ර මාර්ගය, තෙම නො ලැබෙයි. තොප කී පූර්වභාග සතිපට්ඨාන මාර්ගයම ලැබේයයි කීහ.

චූලලනාග තෙරුන්නාන්සේ මෙසේ සිතූහ. අපගේ ආචාර්යවරයෝ සර්වපර්යාප්තිධර වූහ. තෙපිටකය බහුශ්‍රැතය, මෙබඳු වූ භික්ෂුවක් හටද මෙම ප්‍රශ්නය ප්‍රශ්නයක් විය. අනාගතයෙහි ඇතිවන්නා වූ මගේ සහෝදර පිරිස් මේ ප්‍රශ්නයෙහි ව්‍යාකූල වන්නාහුය. සූත්‍රයක් ගෙන මෙම ප්‍රශ්නය, නිශ්චල කරන්නෙමියි පටිසම්භිදා මාර්ගයෙන් නිදර්ශනයක් ගෙනහැර දක්වා පූර්වභාග සතිපට්ඨාන මාර්ගය එකායන මාර්ගය යයි කියනු ලැබේ.

**මග්ගානට්ඨංගිකො සෙට්ඨො, සච්චානං චතුරොපදා**
**විරාගො සෙට්ඨො ධම්මානං, දිපදානඤ්ච චක්ඛුමා**

**එසොව මග්ගො නත්ථඤ්ඤො - දස්සනස්ස විසුද්ධියා**
**එතංහි තුම්හෙ පටිපජ්ජථ, මාරසෙනං පමොහනං**
**එතම්හි තුම්හෙ පටිපන්නා දුක්ඛස්සන්තං කරිස්සථ**

(සියලු මාර්ගයන් අතුරෙන්, සම්මාදිට්ඨි ආදි අංග අටකින් යුත් අරිඅටඟ මඟ උතුම් වෙයි. සියලු සත්‍යයන් අතුරෙන් දුක්ඛං අරියසච්චං යනාදි ක්‍රමයෙන් දැක්වූ සතර පදයෙන් උතුම් වෙති. සියලු ධර්මයන් අතුරෙන් නිර්වාණ නම් වූ විරාග ධර්මය උතුම් වෙයි. දෙපා ඇත්තවුන් අතුරෙන් පසැස් ඇති තථාගතයන් වහන්සේ උතුම් වෙයි.

දර්ශන විසුද්ධිය පිණිස මේ උතුම් මගයයි දැක්වූ අටමගම වෙයි. අන්මගක් නොමැත්තේය. තෙපි මේ මග පිළිපදිවු මේ අටමග මාරයා මුලා කරන්නේය, තෙපි මේ මගට පිළිපදින්නාහු සියලු සසර දුක, කෙළවර කරන්නාහුය.)

මෙසේ සූත්‍රයක් ගෙනහැර තැබුවේය.
**මග්ගො** යනු කුමන අර්ථයෙන් මග්ග නම් වීද? නිවනට පැමිණෙන අර්ථයෙන්, නිවන් කැමතියන් විසින් සෙවිය යුතු අර්ථයෙන් මග්ග නම් වේ. **සත්තානං විසුද්ධියා** යනු රාගාදි මලයන්ගෙන් ද, අභිජ්ඣා විසම ලෝභාදි වූ උපක්ලේශයන්ගෙන් ද, කිලිටි වූ සිත් ඇති සත්ත්වයන්ගේ විසුද්ධිය පිණිස, එය එසේමැයි.

මෙම අරිඅටඟි මගින්ම මෙයින් කල්ප ලක්ෂයක් අධිකකොට ඇති සාරාසංඛ්‍යයයක්හුගේ මතුයෙහි එකම කල්පයක පහළ වූ, තණ්හංකර, මෙධංකර, සරණංකර, දීපංකර නම් වූ බුදුවරුන් ආදිකොට ශාක්‍ය මුනීන්ද්‍රයන් අවසන්කොට ඇති නොයෙක් බුදුවරයෝ ද, නොයෙක් සියගණන් පසේබුදුවරයෝ ද, ගණන්මග ඉක්ම සිටි ආර්ය ශ්‍රාවකයෝ ද යන මේ සත්ත්වයෝ සියලු චිත්ත මලයන් සෝධාහැර පරම විසුද්ධියට පැමිණියාහුය. රූප මලයාගේ වශයෙන් අපිරිසිදු බව පිරිසිදු බව යන දෙදෙනාගේ පැමිණවීමක්ම නැත්තේය.
එසේ එසේමැයි :-

**රූපෙන සංකිලෙට්ඨෙන සංකිලිස්සන්ති මානවා**
**රූපෙ සුද්ධෙ විසුජ්ඣන්ති, අනක්ඛාතං මහෙසිනා**

**චිත්තෙන සංකිලිට්ඨෙන, සංකිලිස්සන්ති මානවා**
**චිත්තෙ සුද්ධෙ විසුජ්ඣන්ති, ඉතිවුත්තං මහෙසිනා**

(රජස් ආදින් නිසා කිලිටි වූ රූපය හේතුකොටගෙන සත්ත්වයෝ කිලිටු වෙති. රූපය ශුද්ධ වූ කල්හි, විසුද්ධියට පැමිණෙත් යයි. තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරන ලදී. කිලිටි වූ සිත හේතුකොටගෙන සත්ත්වයෝ කිලිටි වෙති. සිත පිරිසිදු වූ කල්හි පිරිසිදු වෙති යයි තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලදී.)

වදාළේ මැයි, **චිත්ත සංකිලෙසා භික්ඛවෙ, සත්තා සංකිලිස්සන්ති, චිත්තවොදානා විසුජ්ඣන්ති** යනුවෙන් චිත්තයාගේ පිරිසිදු බව ද, මෙම සතිපට්ඨාන මාර්ගයෙන්ම වෙයි. එහෙයින් වදාළහ. **සත්තානං විසුද්ධියා** යනුවෙන්, **සොක පරිදෙවානං සමතික්කමාය** යනු ශෝකයාගේ ද පරිදේවයාගේ ද ඉක්මවීම පිණිස ප්‍රහාණය පිණිස යන අර්ථය. ඒ එසේමැයි,

මෙම සතර සතිපට්ඨාන නම් වූ මාර්ගයතෙම වඩන ලද්දේ සන්තති මහාමාත්‍යාදීන්ට මෙන් ශෝකයාගේ ඉක්මවීම පිණිස ද, පටාචාරාවගේ මෙන් පරිදේවයාගේ ඉක්මවීම පිණිස ද පවතී. එබැවින් වදාළහ. **සොකපරිදෙවානං සමතික්කමාය** යනුවෙන්, තව ද මෙහි කිවයුතු විශේෂතාවයක් ඇත.

සන්තති මහාමාත්‍ය තෙමේ,

**යං පුබ්බෙ තං විසොධෙහි, පච්ඡා තෙ මාහු කිඤ්චනං**
**මජ්ඣෙ චෙ නො ගහෙස්සසි, උපසන්තො චරිස්සසි**

(ඔබට පූර්ව ජන්මයෙහි අතීත සංඛාර නිසා යම් කෙලෙස් ධර්මයක් වීද, එය නොපැවැත්ම කිරීමෙන් පිරිසිදු කරව, අනාගත භවයෙහි අනාගත සංඛාර නිසා උපදනා වූ රාගාදි කිසි ධර්මයක් නොම වේවා, වර්තමාන භවයෙහි ඉදින් පටිච්ච සමුප්පන්න වූ රූපාදි ධර්මයන් නොගන්නෙහි නම් කෙලෙස් සංසිඳුනේ හැසිරෙන්නේ වෙහිය.)

මේ ගාථා ධර්මය අසා සිව්පිළිසිඹියා සමග රහත් බවට පැමිණියේය.

පටාචාරා තොමෝ :-

**න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා**
**අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතීසු තාණතා**

(මරහු විසින් මඩනා ලද සත්ත්වයා හට පිහිට පිණිස පුත්‍රයෝ නොවන්නාහුය. පියතුමාද සෙසු ඤාති මිත්‍රයෝ ද නොවෙත් නෑයන් කෙරෙහි පිහිට වියයුතු බවත් නැත්තේය.)

(පටාචාරාවෝ) මේ ගාථා ධර්මය අසා සෝවාන් වූවාය. යම් හෙයකින් වනාහි කාය - වෙදනා - චිත්ත - ධම්ම, අතුරෙන් කිසි ධර්මයක් ආමර්ෂණය නොකොට කරන භාවනාවක් නැත්තේය. එබැවින් ඕතොමෝ ද මේ මගින්ම සෝක පරිදේවයන් ඉක්මවූ බව දතයුත්තිය. **දුක්ඛ දොමනස්සානං අත්ථංගමාය**, යනුවෙන් කායික දුක්ඛයාගේ ද චෛතසික දොමනස්සයන්ගේ ද යන මොවුන් දෙදෙනාගේ දුරුකිරීම පිණිස නිරුද්ධ කිරීම පිණිස යන අර්ථයි. ඒ එසේමැයි, මේ මාර්ගය තෙමේ භාවනා වශයෙන් වඩන ලද්දේ තිස්ස ස්ථවිර ආදීන්ට මෙන් කයෙහි උපදනා දුක ද, ශක්‍රාදීන්ට මෙන් සිතෙහි උපදනා දොම්නස ද අතුරුදහන් කිරීම පිණිස පවතී. මේ එහි අරුත් දැක්වීම වෙයි.

**තිසස තෙරුන් වහන්සේ**

සැවැත් නුවර තිස්ස නම් කෙළෙඹි පුත්‍රයෙක් සතලිස් කෙලක් ධනය හැරදමා මිනිසුන්ගේ හැසිරීම් රහිත වනයෙහි වෙසෙයි. ඔහුගේ බාල සොහොයුරාගේ බිරිඳ යව් ඔහු ජීවිතයෙන් තොර කරවූ යයි පන්සියයක් සොරුන් යැවීය. ඒ සොරුහු ගොස් තෙරුන් වහන්සේ පිරිවරා සිටියාහුය. තෙරුන්වහන්සේ, උපාසකවරුනි කුමක් හෙයින් ආවාහුදැයි ඇසීය. තොප ජීවිතයෙන් තොර කරන්නෙමු යයි කියා ආම්භ යි, ඇපයක් ගෙන අද එකරැයක් මට ජීවිතය දෙවු. මහණ තොපට මෙහි කවරෙක් ඇප වන්නේද තෙරුන් වහන්සේ මහත් වූ ගලක් ගෙන දෙකලව ඇට බිඳ උපාසකවරුනි, ඇපය වටිදැයි කීහ. ඔවුහු එතැනින් නික්ම සක්මන් කෙළවර ගිනි දල්වා වැදහොත්තාහුය. වේදනාව විෂ්කම්භනය කොට ශීලය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ තෙරුන් වහන්සේගේ පිරිසිදු වූ ශීලය නිසා ප්‍රීතිය හා ප්‍රමෝදය උපන. ඉක්බිති අනුක්‍රමයෙන් විදර්ශනා වඩන්නේ තුන්යම් රැ මහණදම්කොට අරුණ නගින කල්හි රහත් බවට පැමිණියේ මෙම උදානය ප්‍රකාශ කළේය.

**උභොපාදානි භිඥිත්වා සඤ්ඤමිස්සාමි වො අහං,**
**අට්ටියාමි හරායාමී, සරාග මරණං අහං**
**එවාහං චින්තයිත්වාන, යථාභූතං විපස්සිසං**
**සම්පත්තෙ අරුණුග්ගම්හි අරහත්තං අපාපුණිං යයි**

(මම දෙපය බිඳ එක්රැයක් මා හරණට පොරොන්දු වීමි. මම රාග සහිත මරණය පිළිකුල් කරමි. මම මෙසේ සිතා අවිපරීතව අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කෙළෙමි. අරුණගගමනය පැමිණි කල්හි රහත් බවට පැමිණියෙමි.)

**භික්‍ෂූහු තිස්නමක්**

අන්‍ය වූ ද භික්‍ෂූහු තිස්නමක් භාග්‍යවතුන් සමීපයෙහි කමටහන් ගෙන ආරණ්‍ය සෙනසුනක වස් එළම ඇවැත්නි, තුන්යම් රැයෙහි මහණදම් කළ යුතුය. එකිනෙකා සමීපයට නොපැමිණිය යුතුයයි කියා (කතිකාකොට) වාසය කළාහුය. එක් ව්‍යාඝ්‍රයෙක් අවුත් මහණදම්කොට අලුයම් කාලයෙහි නින්දට බැසගන්නා වූ ඔවුන් අතුරෙන් එක එක භික්‍ෂුව ගෙන යයි. කිසිවෙක් මා ව්‍යාඝ්‍රයෙක් ගත්තේ යයි ශබ්දකුදු නොනික්ම විය. මෙසේ භික්‍ෂූන් පසළොස් දෙනෙකු කෑ කල්හි පොහෝ දිනයෙහි ඇවැත්නි,

සෙස්සෝ කොහිදැයි විචාරා පසුව ව්‍යාඝ්‍රයා ගත්කල්හි ව්‍යාඝ්‍රයා විසින් ගන්නා ලද්දෙමි යයි කිවයුතුයයි කියා වාසය කළාහුය.

ඉක්බිති, එක්තරා තරුණ භික්ෂුවක් ව්‍යාඝ්‍ර තෙම පළමු කී පරිද්දෙන්ම ගත්තේය. ඒ භික්ෂු තෙම ව්‍යාඝ්‍ර තෙමේ යයි කීය. භික්ෂූහු සරයටියද ගිණිහුල් ද ගෙන මුදන්නෙමුයි ලුහුබන්දාහුය. ව්‍යාඝ්‍රයා භික්ෂූන්ට යා නොහැකි මාර්ග ඇති, බුන් ඉවුරු ඇති තැනකට නැගී ඒ භික්ෂුව පා ඇඟිල්ලේ සිට කෑමට පටන් ගත්තේය. සෙසු භික්ෂූහු ද මෙවිට අප විසින් කළයුත්තක් නොමැති භික්ෂූන්ගේ විශේෂය මෙවන් අවස්ථාවේදී දක්නට ලැබේ යයි කීවාහුය. එම භික්ෂුව ව්‍යාඝ්‍ර මුඛයෙහි හුන්නේම එම වේදනාව යටපත්කොට විදර්ශනාව වඩන්නේ ගොප්මස දක්වා කෑකල්හි සෝවාන්ව, දණ දක්වා කෑ කල්හි සකෘදාගාමීව, නැබ දක්වා කෑකල්හි අනාගාමීව හෘදය රූපය නොකෑ කල්හිම සිව්පිළිසිඹියා සහිත රහත් බවට පැමිණ ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කළේය.

**සීලවා වත සම්පන්නො, පඤ්ඤවා සුසමාහිතො**
**මුහුත්තං පමාදමන්වාය ව්‍යග්ඝෙන ඔරුද්ධ මානසො**
**පඤ්ජරස්මිං ගහෙත්වාන සිලාය උපනීතකො**
**කාමං ඛාදතු මං ව්‍යග්ඝො භක්ඛො කායො අචෙතනො**
**පටිලද්ධෙ කම්මට්ඨානම්හි මරණංහෙහිති භද්දකං**

(සිල්වත් වූ ව්‍රතයෙන් සම්පූර්ණ වූ කම්මස්සකතා ඥාණයෙන් පැනවත් වූ සමාධියෙහි පිහිටුවන ලද සිත් ඇති, මොහොතක් පමණ කල් ප්‍රමාදයට පැමිණ සිටියා වූ මම ව්‍යාඝ්‍රයෙකු විසින් මඩනා ලද සිත් ඇත්තෙමි නියපඳුරෙහි ලාගෙන පර්වතයට පමුණුවනු ලද්දෙම් වෙමි. ව්‍යාඝ්‍රතෙම මා කැමති පරිදි කනු ලැබේවා. සිත් නැති මේ කය අනුන් විසින් කෑ යුත්තේය. ලැබූ කමටහන් ඇතිකල්හි මරණය සොඳුරු වන්නේය.)

**පීතිමල්ල තෙරුන් වහන්සේ :-**

අන්‍ය වූ පීතිමල්ල නම් වූ තෙරකෙනෙක්, ගිහිකල තුන්රජයෙක්හි (පටාකං ගහෙත්වා) කොඩි ගෙන තම්බපණ්ණි නම් දිවයිනට පැමිණ, රජු දැක, රජු විසින් කරන ලද අනුග්‍රහ ඇත්තේ, එක්දිනක්, කිලඤ්ජක නම් ආසනශාලා ද්වාරයෙන් යන්නේ, රූපං **භික්ඛවෙ න තුම්හාකං තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති** යනුවෙන්, න තුම්හාක

වර්ගය අසා මෙසේ සිතීය. 'රූපය තමාගේ නො වේ, වේදනාව තමාගේ නොවේ. හෙතම එයම අංකුසයක් කොට නික්ම මහවෙහෙරට ගොස් පැවිද්ද ඉල්ලා පැවිදි විය. උපසපන් වූයේ උභය මාතිකා පුහුණුකොට භික්ෂූන් තිස්නමක් ගෙන ගවරවාලීය අංගන නම් ස්ථානයට ගොස් මහණදම් කළේය. (පාදෙසු අවහතෙතසු) පා නට කල්හි, දෙදණින් සක්මන් කෙරෙයි. එක් මුව වැද්දෙක් රාත්‍රියෙහි එසේ සක්මන් කරන ඒ තෙරුන් මුවෙකැයි හඟිමින් පහලේය. අඩයටිය තෙරුන් සිරුර විනිවිද ගියේය. හෙතෙම එම සැත බැහැර කරවා පහර මුඛයන් තණවැටින් පුරවා ගල මතුවෙහි තමා හිඳුවා අවකාස ලබාගෙන විවසු වඩා සිව්පිළිසිඹියා සහිත රහත් බවට පැමිණ කෑරීම් ශබ්දයෙන් පැමිණි භික්ෂූන්ට රහත් බව ප්‍රකාශ කොට මෙම උදානය ප්‍රකට කළේය.

භාසිතං බුද්ධසෙට්ඨස්ස, සබ්බලොකග්ගවාදිනො
නතුම්හාකං ඉදංරූපං තං ජහෙය්‍යාථ භික්ඛවො
අනිච්චා වත සංඛාරා උප්පාදවය ධම්මිනො
උපජ්ජිත්වා නිරුජ්ඣනති තෙසංවූපසමො සුඛො

(මහණෙනි, මේ රූපස්කන්ධය තොපගේ නොවේ. ඒ රූපය හැරපියව්, සියලු ලොව අග්‍රවාදී වූ බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ විසින් වදාරණ ලදී.

සියලු සංඛාරයෝ ඒකාන්තයෙන් අනිත්‍යයහ. ඉපදීම හා විනාශය ස්වභාවකොට ඇත්තාහුය. ඉපිද නිරුද්ධ වෙති. ඒ සංඛාරයන්ගේ සංසිඳීම සැප වූයේය.)

අනතුරුව භික්ෂූහු උන්වහන්සේට මෙසේ කීවාහුය. ස්වාමීනි, ඉදින් සම්මා සම්බුදුරදුන් වැඩසිටියේ නම් මුහුද මතුයෙන් අත දිගුකොට ඔබගේ හිස පිරිමදින්නාහු යයි මෙසේ වනාහි මේ ඒකායන මාර්ගය වනාහි තිස්ස තෙරුන් ආදින්ට මෙන් දුක් නැසීම පිණිස පවත්නේය.

### සක්දෙව් රජ

සක්දෙව් රජ තමහට පහළ වූ පස්වැදෑරුම් පෙරනිමිති දැක මරණ භයින් තැතිගන්නා ලද්දේ හටගත් දොම්නස් ඇත්තේ, භාග්‍යවතුන් වහන්සේ සමීපයට එළඹ ප්‍රශ්නයක් විචාළේය. හෙතෙම උපෙක්ඛා ප්‍රශ්න විසඳීම අවසානයෙහි අසූදහසක් දේවතාවන් සමග සෝවාන් පෙළෙහි පිහිටියේය. ඔහුගේ උප්පත්ති නැවත ප්‍රකෘතිමත් වූවා විය.

සුබ්‍රහ්ම දෙවපුත්‍ර තෙම

සුබ්‍රහ්ම දිව්‍යපුත්‍ර තෙම දහසක් අප්සරාවන් සමඟ දිවසැප අනුභව කෙරේ. එයින් පන්සියයක් අප්සරාවෝ පරසතු රුකින් මල් නෙලන්නාහුම ඉන් සැව නිරයෙහි උපන්නාහුය. ඒ දෙව්පුත් තෙම කුමක් හෙයින් මොවුහු කල් යවත්දැයි විමසන්නේ ඔවුන් නිරයෙහි උපන් බව දැන තමන්ගේ ආයුෂ කෙතෙක්දෝ හෝයි බලන්නේ තමන්ගේ ආයු ගෙවීමද දැක එම නිරයෙහි උපදින බවද දැන බියපත්ව හටගත් දොම්නස් ඇතිව මගේ දොම්නස භාග්‍යවතුන් වහන්සේ දුරුකරන සේක. අනිකෙක් නොකෙරේයයි පන්සියයක් අප්සරාවන් ගෙන භාග්‍යවතුන් වහන්සේ සමීපයට එළඹ ප්‍රශ්නයක් විචාළේය.

නිච්චං උත්‍රසතමිදං චිත්තං නිච්චං උබ්බිග්ගමිදං මනො
අනුප්පන්නෙසු කිච්ඡෙසු අථො උප්පතිතෙසුච
සචෙ අත්‍ථි අනුත්‍රාසං තමෙම අක්ඛාහි පුච්ඡිතො

(නූපන් දුක් නිමිතිකොට, නැවත හටගත් දුක නිමිතිකොටද මගේ සිත නිරතුරු භයට පැමිණියේය. මේ මනස නිරතුරුව උද්වේගයට පැමිණියේය. ඉදින් තැති නොගැනීමක් ඇත්නම් එය මා විසින් විචාරණ ලද්දා වූ ඔබ වදාළ මැනව.)

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

නාඤ්ඤත්‍ර බොජ්ඣංගා තපසා නාඤ්ඤත්‍ර ඉන්ද්‍රිය සංවරා
නාඤ්ඤත්‍ර සබ්බනිස්සග්ගා සොත්‍ථිං පස්සාමි පාණිනං

(බෝධ්‍යාංග භාවනාව ද, තපෝ ගුණයද හැර සැපයක් නැත. ඉන්ද්‍රිය සංවරය හැර සුවයක් නැති, නිර්වාණය හැර සත්ත්වයන්ට සුවයක් නොදකිමි.)

දෙව් පුත්තෙම දේශනාවසානයෙහි පන්සියයක් අප්සරාවන් සමග සෝවාන් ඵලයෙහි පිහිටියේය. තම සැපත ස්ථාවරභාවයට පත්කරගෙන දෙව් ලොවටම ගියේය. මෙසේ මෙම මාර්ගය භාවිත කරන ලද්දේ ශක්‍ර ආදීන්ට මෙන් දොම්නස නැතිකිරීම පිණිස පවතී යයි දතයුතුය.

Scanned with CamScanner

ඤායසස අධිගමාය යනු 'ඤාය' යයි අරිඅටඟි මග කියනු ලැබේ. එම අටඟි මාර්ගයාගේ අධිගමය පිණිස, පැමිණීම පිණිසයයි කියන ලද වෙයි ඒ එසේමැයි. පූර්වභාගයෙහිම මේ ලෞකික සතිපට්ඨාන මාර්ගය වඩන ලද්දේ ලෝකෝත්තර මාර්ගයාගේ අධිගමය පිණිස පවතීයයි එහෙයින් කියන ලදි ඤායසස අධිගමාය කියා.

නිබ්බානසස සච්ඡිකිරියාය යනු තණ්හා නම් වූ මානයෙන් වෙන් වූ බැවින් නිබ්බාන යයි ලැබූ නාම ඇති අමෘතයාගේ සාක්‍ෂාත් කිරීම පිණිස තමා විසින් පසක් කිරීම පිණිසය කියන ලද්දේ වෙයි. එසේමැයි මෙම මාර්ගය භාවිතා කරන ලද්දේ පිළිවෙලින් නිවන් ප්‍රත්‍යක්‍ෂ කිරීම සිද්ධ වෙයි. එයින් වදාළහ නිබ්බානසස සච්ඡිකිරියාය කියා.

එහි කිසිසේත්, සත්ත්වයන්ගේ විසුද්ධිය යයි කී කල්හි ශෝකය ඉක්මවීම ආදිය අර්ථ වශයෙන් සිද්ධ වූවාහුම වෙත්ද, එසේ වුවත් ශාසන යුක්තියෙහි දක්‍ෂ වූවන් තබා අන්‍යයන්ට ප්‍රකට නොවෙති. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ පළමුකොට ජනයා ශාසන යුත්තියෙහි දක්‍ෂකොට පසුව දහම් නොදෙසන සේක්ද, ඒ ඒ සූත්‍රයෙන් ඒ ඒ අර්ථය හඟවන සේක්ද, එහෙයින් මේ සතිපට්ඨාන සූත්‍රයෙහි යම් යම් අර්ථයක් ඒකායන මාර්ගය සිද්ධ කෙරේද, ඒ ඒ අර්ථය ප්‍රකටකොට දක්වන සේක්, සොක පරිද්දවානං සමතික්කමාය යනාදිය වදාළහ.

නැතහොත් ඒකායන මාර්ගයෙන් සත්ත්වයන්ගේ යම් විසුද්ධියක් යම්හෙයකින් පවතීද එම විසුද්ධි තොමෝ සෝක-පරිදේවයන්ගේ ඉක්මවීම, දුක් දොම්නස් නැතිකිරීමෙන් වේද, දුක් දොම්නස් නැතිකිරීම ආර්ය අෂ්ටාංගික මාර්ගය අධිගමයෙන් වේද, එහෙයින් මෙම ක්‍රමයද දක්වන සේක් සත්තානං විසුද්ධියා යයි වදාරා මේ ඒකායන මාර්ගයේ සොක පරිද්දවානං සමමතික්කමාය යනාදිය වදාළහ.

**ඒකායන මාර්ගය**

තව ද මේ ඒකායන මාර්ගයාගේ ගුණ කීමකි. යම්සේ භාග්‍යවතුන් වහන්සේ, ධම්මං වො භික්ඛවෙ දෙසිසසාමි ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං, පරියොසාන කල්‍යාණං සත්‍ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහමචරියං පකාසෙසසාමි යදිදං ඡ ඡක්කානි යයි ඡ ඡක්ක දේශනාවෙහි අටපදයකින් ගුණය වදාළ සේක් ද යම්සේ අරියවංස

දේශනාවෙහි, චත්තාරො මෙ භික්ඛවෙ, අරියවංසා, අග්ගඤ්ඤා, රත්තඤ්ඤා වංසඤ්ඤා, පොරාණා අසංකිණ්ණා අසංකිණ්ණපුබ්බා න සංකීයන්ති, න සංකීයිස්සන්ති, අප්පතිකුට්ඨා සමණෙහි බ්‍රහ්මණෙහි විඤ්ඤූහි යයි, නව පදයකින් ගුණය වදාළ සේක් ද, කුමක් සඳහා ද යත්, භික්ෂූන්ගේ උත්සාහය ඉපදවීම පිණිසයැ. ඒ සැබව ගුණකථනය අසා භික්ෂූහු මේ මාර්ගය තෙම ළය තැවීම නම් වූ ශෝකයද, වචනයෙන් වැලපීම් නම් වූ පරිදේවය ද කායික වූ අමධුර දුකද, සිත ඇසුරු කළ අමධුර වූ දොම්නස ද යන මේ සතර උවදුරු දුරුකෙරේ.

විසුද්ධිය ද, අරිඅටඟි මග ද, නිවන ද යන මෙම විශේෂතා තුන එලවාලයි. හටගත් උත්සාහ ඇත්තාහු මෙම ධර්ම දේශනාව ඉගෙනගත යුතුය. පුහුණු කළ යුතුය. බැලිය යුතුයැ. වනපොත් කළයුතුය. මෙම මාර්ගයත් වැඩිය යුතුයයි සිතන්නහුද එයින් එම භික්ෂූන්ට උත්සාහය උපදවන පිණිස ගුණ වදාළ සේක. කම්බල වාණිජාදිහු කම්බලාදීන්ගේ ගුණකථනය මෙනි. ඒ එසේමැයි. යම්සේ පඬු පලස් වෙළෙන්දකු විසින් ලක්ෂයක් වටිනා පලස් ගනිවු යයි උද්ඝෝෂණය කළ කල්හිදු මිනිස්සු අසවල් පලස යයි පළමුකොට නොදනිත් ද, යම්හෙයකින් දුගඳ වූ රළුපහස් ඇති කේසකම්බල ව්‍යාල කම්බලාදීහුද කම්බලයයි ද කියනු ලැබෙත් ද, එහෙයිනි. එසේ වුවත් යම්විටෙක එම වෙළෙඳ විසින් ගන්ධාර දේශයෙහි උපදවන ලද, රත්පලස්, සියුම්යැ. බබලන්නේයැ. සුවපහස් ඇත්තේ යයි උද්ඝෝෂණය කරන ලද්දේ වේද, එවිට යමෙක් පොහොසත් වෙත්ද, ඔවුහු ගනිත්, යමෙක් නොපොහොසත් ද ඔහුත් දකිනු කැමැත්තාහු වෙත් ද, එපරිද්දෙන්ම එකායනො අයං භික්ඛවෙ, මග්ගො යයි වදාළ කල්හි ද, අසවල් මගයි. පළමුකොට ප්‍රකට නොවෙයි. යම් හෙයකින් නන්වැදෑරුම් නෛර්යාණික නොවූ මාර්ගයෝ ද මාර්ගයයි කියාම කියනු ලැබෙත් ද එහෙයිනි. සත්තානං විසුද්ධියා යනාදිය වදාළ කල්හි, මෙම ඒකායන මාර්ගය තෙම සියලු උවදුරු දුරු කරන්නේය. විශේෂ ගුණ තුන එලවයි. හටගත් උත්සාහ ඇත්තාහු මෙම දේශනාව ඉගෙනගත යුතුය. පුහුණු කළයුතුය. දැරිය යුතුය. වනපොත් කළයුතුය. මෙසේ මේ මාර්ගයත් වැඩිය යුතුකොට සිතන්නාහු යයි ගුණ වදාරණ සේක් සත්තානං විසුද්ධියා යනාදිය වදාළහ. ලක්ෂයක් අගනා පාණ්ඩුකම්බල වෙළෙඳගේ උපමාව යම්සේ ද, එසේ රක්තජාමෙබානද, සුවර්ණ උදකප්‍රාසාද මාණික්‍ය රත්න විසුද්ධ වූ මුතුමැණික් රත්න, රෝමකපවාළ ආදි වූ වෙළෙඳුන්ගේ උපමාද මෙහිලා දැක්විය යුත්තාහුය.

සතිපට්ඨාන

යදිදං යනු නිපාතයැ. යෙ ඉමෙ යම් මේ යනු මෙහි අර්ථයයි. චත්තාරො යනු ගණන පරිච්ඡේද කිරීමයි. (වෙන් කිරීමයි.) එයින් යට ද නැත. එයින් මතුවෙහිද නැතැයි සතිපට්ඨානයන්ගේ ගණන පිරිසිඳ දක්වති. සතිපට්ඨානා යනු සතිපට්ඨාන තුනකි. සති ගෝචරයද තුන්පරිද්දකින් පිලිපන් ශ්‍රාවකයන් කෙරෙහි සත්‍පුනො පටිසානුනය ශාස්තෲහුගේ අනුකූල බව, ගැටෙන බවද එය ඉක්මුනු බවද, සතියද එබඳුම වේ යයි කියායි. ඒ එසේමැයි. 'චතුනනං භිකඛවෙ සතිපට්ඨානං සමුදයඤ්ච අත්ථංගමඤ්ච දෙසිස්සාමි තං සුණාථ -පෙ- කොච භිකඛවෙ, කායසස සමුදයො ආහාර සමුදයා කායසස සමුදයො' යනාදි තන්හි සති ගෝචරය සතිපට්ඨාන යයි කියනු ලැබේ. කායො උපට්ඨානං, නො සති, සති උපට්ඨානඤ්චෙව සතිච යනාදි තන්හිද එබඳුමැයි. එහි අර්ථය නම් මේ ගෝචරයෙහි පිහිටානුයි පට්ඨාන නම් වේ. කවරක් පිහිටාද යත්? සිහියයි. සිහියේ පිහිටීම සතිපට්ඨාන නම් වේ. නැතහොත් ප්‍රධාන වූ පිහිටීම වේනුයි පට්ඨාන නම් වේ. සතියගේ පට්ඨානය සතිපට්ඨානං නම් වේ. හත්ථිට්ඨාන, අසසට්ඨාන ආදිය මෙනි.

තයො සතිපට්ඨානා යදරියො සෙවති, යදරියො සෙවමානො සත්ථා ගණමනුසාසිතුමරහති යන මෙහි තුන් පරිද්දකින් පිළිපන් ශ්‍රාවකයන් කෙරෙහි ශාස්තෲහුගේ පටිසානුනය ඉක්මුනු බව සතිපට්ඨාන යයි කියන ලදී. එම වචනයාගේ අර්ථය නම් පිහිටුවිය යුතු බැවින් පට්ඨාන නම්. පැවැත්විය යුතු බැවිනි. යන අර්ථයි. කුමකින් පැවැත්විය යුතු බැවින්ද යත්? සතියෙනි. සතියෙන් යුක්ත පැවැත්ම සතිපට්ඨාන නම් වේ. චත්තාරො සතිපට්ඨානා භාවිතා බහුලිකතා සත්ත බොජ්ඣංගෙ පරිපූරෙනති යනාදි තන්හි සතියම සතිපට්ඨාන යයි කියනු ලැබේ. එම වචනයාගේ අරුත නම් පිහිටානුයි පට්ඨාන නම්. එළඹ සිටි බැසගෙන, පැනගෙන පවතී යන අර්ථයි. සතියම සතිපට්ඨාන නම් වේ. නැතහොත් සිහිකිරීම් අරුතින් සතිනම් වේ. එළඹ සිටීම් අර්ථයෙන් පට්ඨාන නම් වේ. එබැවින් සති වූවාත් ඕ මැයි පට්ඨාන වූවාත් ඕ මැයි සතිපට්ඨාන නම්. මෙයම මෙහි අදහස් කරන ලදී.

ඉදින් සතියම සතිපට්ඨාන වීනම් කුමක් හෙයින් සතිපට්ඨානා යනුවෙන් බහුවචන වීද යත්? සති බොහෝ බැවිනි. සැබව, ආලම්බන භේදයෙන් සතීහු බොහෝ වෙති. එකල්හි මග්ගො යනුවෙන් කුමක්

හෙයින් එකවචන විද යත්, මාර්ග අර්ථයෙන් එකක් බැවිනි. සැබව, මේ සතර සතිහුම මාර්ග අර්ථයෙන් එකක් බවට යෙති. මෙසේ වදාරණ ලදී. මග්ගොති කෙනට්ඨෙන මග්ගො, නිබ්බානගමනට්ඨෙන නිබ්බානත්ථිකෙහි, මග්ගනීයට්ඨෙන ච යයි තව ද මේ සතිපට්ඨානයාගේ සතරදෙනම අපර භාගයෙහි කායාදි ආලම්බනයන්හි, කෘත්‍ය සිද්ධ කරමින් නිර්වාණය කරා පැමිණෙත් ද, මුලපටන්ම නිර්වාණාර්ථීන් විසින් සෙවීම කරනු ලැබෙත් ද, එහෙයින් සතරම එක මාර්ගයකැයි කියනු ලැබෙත්. මෙසේ ඇතිකල්හි වචනානුසන්ධියෙන් අනුසන්ධි සහිත වූම දේශනාතොමෝ වෙයි.

**මාරසෙනප්පමද්දනං වො භික්ඛවෙ, මග්ගං දෙසිස්සාමි තං සුණාථ, -පෙ- කතමාච භික්ඛවෙ, මාරසෙනප්පමද්දනො මග්ගො යදිදං සත්ත බොජ්ඣඞ්ගා යනාදියෙහි මෙනි. මාරසෙනප්පමද්දනො යනුද සත්තබොජ්ඣඞ්ගා යනුද යම්සේ අර්ථ වශයෙන් එකක් වූයේ ව්‍යඤ්ජනයම විවිධ වේද, එසේම එකායන මග්ගො යනුද, චත්තාරො සතිපට්ඨානා යනුද අර්ථ වශයෙන් එකකි. ව්‍යඤ්ජනයම විවිධ වෙයි. එහෙයින් මාර්ගාර්ථයෙන් එකක් බැවින් ඒකවචනය ආලම්බන භේදයෙන් සති බහුත්වයෙන් බහුවචන යයි දතයුතුයැ.**

### සතිපට්ඨාන හතරක්ම දේශනා කිරීම

කුමක් හෙයින් භාග්‍යවත්හු විසින් නොඅඩු වූ නොවැඩි වූ සතිපට්ඨාන හතරක්ම වදාරණ ලද්දාහුද? හික්මෙන ජනතාවට හිතවත් බැවිනි. සැබව, තණ්හා චරිත දිට්ඨි චරිත, සමථයානික, විපස්සනා යානිකයන් අතුරෙහි ද මන්ද තික්ඛ වශයෙන් දෙපරිද්දකින් පවත්නා වූ වෛනෙය්‍ය ජනයන් අතුරෙහි මන්දබුද්ධික තණ්හා චරිතයාට ඖළාරික වූ කායානුපස්සනා සතිපට්ඨානය විසුද්ධි මාර්ගය වේ.

තික්ඛ (තීක්ෂණ වූ) තෘෂ්ණා චරිතයාට සියුම් වූ වේදනානුපස්සනා සතිපට්ඨානය විසුද්ධි මාර්ගය වේ.

දෘෂ්ටි චරිතයා පිළිබඳ වූ ද මද නුවණ ඇත්තහුට ඉතා ප්‍රභේදයකට නොපැමිණි චිත්තානුපස්සනා සතිපට්ඨානය විසුද්ධි මාර්ගය වෙයි.

තියුණු නුවණ ඇත්තහුට ඉතා ප්‍රභේදයට පැමිණි ධම්මානුපස්සනා සතිපට්ඨානය විසුද්ධි මාර්ගය වෙයි.

සමථයානිකයා පිළිබඳ වූ, මඳබුද්ධිකයාට පහසුවෙන් අවබෝධ කළහැකි නිමිති ඇති පළමුවන සතිපට්ඨානය විසුද්ධිමාර්ගය වෙයි.

තියුණු නුවණ ඇත්තාට මහත් වූ අරමුණෙහි නොපිහිටන හෙයින් දෙවෙනි සතිපට්ඨානය විසුද්ධි මාර්ගය වෙයි.

විපස්සනායානික වූද, මඳප්‍රාඥයාට ඉතා ප්‍රභේදයට නොපැමිණි අරමුණු ඇති, තුන්වන සතිපට්ඨානය විසුද්ධිමාර්ගය වෙයි.

තියුණු නුවණ ඇත්තාට ඉතා ප්‍රභේදයට පැමිණි අරමුණු ඇති සතරවෙනි සතිපට්ඨානය විසුදධි මාර්ගය වෙයි.

එහෙයින් නොඅඩු වූ නොවැඩි වූ සතිපට්ඨාන හතරක්ම වදාරණ ලද්දාහුය. සුභ-සුඛ-නිච්ච-අත්තභාව යන් පිළිබඳ විපර්යාසයන්ගේ ප්‍රහාණය පිණිස හෝ (සතිපට්ඨාන හතරක් වදාරණ ලද්දාහුය) එසේමැයි, කය අශුභය. ඒ කයෙහිදු සත්ත්වයෝ සුභයයි පෙරලා ගැනීමෙන් විපර්යාසයට පැමිණියාහුය. ඔවුන්ට එහි අශුභභාවය දැක්වීමෙන් ඒ විපර්යාසයාගේ ප්‍රහාණය පිණිස පළමුවන සතිපට්ඨානය වදාරණ ලදී.

සුඛය නිත්‍ය ආත්මය යයි, ගත්තා වූද වේදනාවන් අතුරෙහි වේදනා තොමෝ දුක්ය. චිත්තය අනිත්‍යය. ධර්මයෝ අනාත්මයෝය. එම වේදනා ආදියෙහි ද සත්ත්වයෝ, සුඛ, නිත්‍ය, ආත්ම වශයෙන් ගැනීමෙන් විපර්යාසයට පැමිණියාහුය. ඔවුනට එහි දුක්ඛාදී භාවය දැක්වීමෙන් එම විපර්යාසයන්ගේ ප්‍රහාණය පිණිස සෙසු සතිපට්ඨාන තුන වදාරණ ලද්දාහු යයි මෙසේ ශුභ-සුඛ-නිත්‍ය-ආත්ම භාව විපර්යාසයන්ගේ ප්‍රහාණය පිණිස හෝ නොඅඩු වූ ද, නොවැඩි වූ ද සතිපට්ඨාන වදාරණ ලද්දාහු යයි දතයුතු. තවද හුදෙක් විපර්යාසයන්ගේ ප්‍රහාණය පිණිසම නො වෙයි. චතුර්විධ වූ ඕඝ-යෝග-ආසව-ග්‍රන්ථ-උපාදාන-අගති යන මොවුන්ගේ ප්‍රහාණය පිණිසද සතර වැදෑරුම් ආහාරයන්ගේ පිරිසිඳ දැනීම පිණිසද සතරක්ම වදාරණ ලද්දාහු යයි දතයුතු. මේ වනාහි ප්‍රකරණ ක්‍රමයයි.

අට්ඨකථාවෙහි වනාහි හැසිරීම් වශයෙන් ද එක්තැනක එක්රැස්වීම් වශයෙන් ද, එකක්ම වූ සතිපට්ඨානය අරමුණු වශයෙන් සතරක් වීයයි මෙතෙක් කියන ලදී. ඒ එසේමැයි. දොරටු සතරක් ඇති නගරයෙහි

පැදුම් දිගින් පැමිණෙන මිනිස්සු පැදුම්දිග උපදින්නා වූ බඩු ගෙන පැදුම් දොරින් යම්සේ නුවරට පිවිසෙත් ද, දකුණු දිගින් - පැළ දිගින් - උතුරු දිගින් - උතුරුදිග උපදින බඩුගෙන උතුරු දොරටුවෙන් නුවරට පිවිසෙත් ද, මේ කරුණින් මෙබඳු උපමා ඇත්තේ යයි දතයුතුය. එය එසේමැයි.

නිවන නගරයක් මෙනි. ආර්ය අෂ්ටාංගික වූ ලොව්තුරුමග මහත් වූ දොර මෙනි. කායාදීහු ප්‍රාචීන දිශාදීන් මෙනි. පැදුම් දිගින් පැමිණෙන මිනිස්සු පැදුම්දිග උපදින බඩුගෙන පැදුම් දොරටුවෙන් යම්සේ නුවරටම පිවිසෙත් ද එසේම කායානුපස්සනා ද්වාරයෙන් පැමිණෙන්නාහු තුදුස් ප්‍රකාරයකින් කායානුපස්සනා සතිපට්ඨානය භාවනාකොට කායානුපසසනා භාවනා බලයෙන් උපන්නා වූ ආර්ය මාර්ගයෙන් එකම නිවනට වදනාහුය. දකුණු දිගින් පැමිණෙන්නාහු දකුණුදිග උපදනා බඩුගෙන දකුණු දිගින්ම නුවරට වදිත් ද, එපරිද්දෙන් වේදනානුපසසනා ද්වාරයෙන් පැමිණෙන්නාහු නවප්‍රකාරයකින් වේදනානුපසසනා සතිපට්ඨාන භාවනාව වඩා එයින් උපන්නා වූ ආර්ය මාර්ගයෙන් නිවනටම වදනාහුය. පැලදිගින් එන්නහු පැලදිග උපදිනා බඩුගෙන පැලදොරින් යම්සේ නුවරට වදිත් ද, එපරිද්දෙන් චිත්තානුපසසනා භාවනා ද්වාරයෙන් පැමිණෙන්නාහු. සොලොස් ප්‍රකාරයකින් චිත්තානුපසසනා භාවනාව වඩා, චිත්තානු භාවනා බලයෙන් උපන් ආර්ය මාර්ගයෙන් හුදු නිවන් පුරයටම වදනාහුය. උතුරුදිගින් පැමිණෙන මිනිස්සු උතුරුදෙස උපදින බඩුගෙන උතුරු දොරින් යම්සේ නුවරට පිවිසෙත්ද එපරිද්දෙන්ම, ධම්මානුපසසනා දොරටුවෙන් පැමිණෙන හික්මෙන ජනයෝ පංචප්‍රකාර වූ ධම්මානුපසසනා සතිපට්ඨානය භාවනාකොට එයින් උපන් ආර්ය මාර්ගයෙන් නිර්වාණයටම වදනාහුය. මෙසේ හැසිරීම් වශයෙන් ද එක්තැනක රැස්වීම් වශයෙන් ද එකක්ව සතිපට්ඨානය අරමුණු වශයෙන් සතරක්ම කොට වදාරණ ලද්දාහු යයි දතයුතුය.

කතමෙ චත්තාරො යනු කථේතුකම්‍යතා පුච්ඡායි ඉධ මේ ශාසනයෙහි, භික්ඛවෙ යනු මෙය, ධම්ම පටිග්ගාහක පුග්ගල ආලපනයයි. භික්ඛු යනු පටිපත්ති සම්පාදනය කරන්නා වූ පුද්ගලයා දැක්වීමයි. අන්‍ය වූ ද දෙව් මිනිස්හු ද ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙත්මැයි. එතකුදු වුවත් ශ්‍රේෂ්ඨ බැවින් ද, ප්‍රතිපත්තිය හේතුකොටගෙන භික්ෂුභාවය දක්නා හෙයින් ද භික්ඛු යයි වදාළහ. ඒ එසේමැයි. භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනාව පිළිගන්නවුන් අතුරෙන් භික්ෂූහු ශ්‍රේෂ්ඨ වෙති. සර්වප්‍රකාරයෙන්ම

අනුශාසනාවට භාජනය වූ බැවිනි. එහෙයින් ශ්‍රේෂ්ඨ බැවින් භික්ඛු යයි වදාළහ. තවද ශ්‍රේෂ්ඨ වූ භික්ෂුව ගත්කල්හි, සෙසු දිව්‍ය මනුෂ්‍යයෝ ද ගන්නා ලද්දාහුම වෙති. රජුගේ ගමනාදියෙහි දී රජු ගැනීමෙන් සෙසු පිරිසද ගත්තා වෙයි. යමෙක් මෙම පිළිවෙතෙහි පිළිපදී ද, හෙතෙම භික්ෂු නම් වේයයි ප්‍රතිපත්තිය හේතුකොට භික්ෂුභාවය දක්නා හෙයින් ද 'භික්ඛු' යයි වදාළහ. පිළිවෙතෙහි යෙදුන තැනැත්තේ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ වේවා භික්ෂු යයි ගණන් ගැනීමට යේ මැයි එයින් වදාළහ.

**අලංකතො චෙපි සමං චරෙය්‍ය**
**සනෙතා දනෙතා නියතො බ්‍රහමචාරී**
**සබ්බසු භූතෙසු නිධාය දණ්ඩං**
**සො බ්‍රාහමණො සො සමණො ස භික්ඛු** යනුවෙන්

(වස්ත්‍ර ආභරණ ආදියෙන් සැරසුන, යම් පුද්ගලයෙක් කාය විෂමාදිය හැර සම තත්ත්වයෙහි පවතී ද, සංසිඳුනු කෙලෙස් ඇති බැවින් ශාන්තද, ඉන්ද්‍රිය දමනය ඇත්තේ ද, මාර්ග නියමයෙන් නියත වූයේ ද, බඹසර ඇත්තේ ද, සියලු සත්ත්වයන් කෙරෙහි බහා තැබූ කාය දණ්ඩාදිය ඇත්තේ ද, මෙබඳු පුද්ගල තෙම බ්‍රාහ්මණ යයි ද, ශ්‍රමණ යයි ද භික්ෂු යයි ද කිය යුතු වේ.)

**කාය**

**කායෙ** රූප කයෙහි, මෙහි රූපකය අංග-ප්‍රත්‍යාංගයන්ගේ ද, කේසා ආදී ධර්මයන්ගේද සමූහාර්ථයෙන් හස්තිකාය, රථකාය ආදිය මෙන් කායයයි අදහස් කරන ලදී. තව ද සමූහාර්ථයෙන් යම්සේ කාය වීද, එපරිද්දෙන්ම කුත්සිත වූ කේසාදීන්ගේ උත්පත්ති ප්‍රදේශය යන අර්ථයෙන් කාය නම් වේ. ආය නම් උත්පත්ති දේශයයි. එහි මේ වචනාර්ථයි. එහි උපදිත්නුයි ආය නම්. කවුරු උපදිත් ද යත්, කුත්සිත වූ කේශ ආදීහුය. එහෙයින් කුත්සිත වූ කේශාදීන්ගේ උත්පත්ති දේශය නුයි කාය නම් වේ. **කායානුපස්සී** කය අනුව බලනසුලු වූයේ නොහොත් කය අනුව බලමින්, කායෙ යයි වදාරා යළිත් කායානුපස්සී යයි දෙවෙනි කාය ග්‍රහණය අසම්මිශ්‍ර වශයෙන්, චතුධාතුවවත්ථානය, ඝන විනිර්භෝගය (ඝන වෙන්කොට දැක්වීම) දැක්වීම පිණිස කරන ලදැයි දතයුතුයැ. එම දෙවෙනි කාය ශබ්දයාගේ ගැනීමෙන් වේදනාව අනුව බලනසුලු වූයේ හෝ චිත්ත ධර්මයන් අනුව බලනසුලු වූයේ හෝ නොවේ. කය අනුව බලනසුලු වූයේම යයි කායසංඛ්‍යාත වූ වස්තුවෙහි කය අනුවම බලන ආකාරය

දැක්වීමෙන් අසම්මිශ්‍ර වශයෙන් වවත්ථානය දක්වන ලද්දේ වෙයි. එසේම කයෙහි අංග ප්‍රත්‍යංගයන්ගෙන් තොර වූ එක් ධර්මයක් අනුව බලනසුලු වූයේ නොවෙයි. කේශ-ලෝම ආදියෙන් තොර වූ ස්ත්‍රී පුරුෂයන් අනුව බලනසුලු වූයේ නොද වෙයි. යලි කෙසේ බලනසුලු වූයේද යත්,

තව ද, මෙහි කේශ-ලෝම ආදී වූ භූත උපාදාය සමූහයක් නම් වූ යම් ශරීරයක් වේද, එම ශරීරයෙහිද, භූත-උපාදාය-රූපයන්ගෙන් තොර වූ එක් ධර්මයක් අනුව බලන සුලුවූයේ නොවෙයි. වැලි කෙසේ බලනසුලු වූයේ ද යත්, රථයාගේ අවයව පිළිවෙලින් බලන්නකු මෙන් අඟපසඟ සමූහය පිළිවෙළින් බලනසුලු වූයේ නගරයක අවයව පිළිවෙලින් බලන්නකු මෙන් කේශ-ලෝම ආදි සමූහයන් පිළිවෙලින් බලන සුලු වූයේ, කෙසෙල් කඳක පතුරු වෙන් කරන්නෙකු මෙන්ද හිස් වූ අතෙහි මිට විදහා පෙන්වන්නෙකු මෙන් ද භූත-උපාදාය-රූප සමූහය පිළිවෙලින් බලනසුලු වූයේම වේයයි නානාප්‍රකාරයේ සමූහ වශයෙන්ම කාය සංඛ්‍යාත වස්තුවගේ දර්ශනයෙන් ඝන විනිර්භෝගය (සන්තතිය වෙන් කිරීම) දක්වන ලද්දේ වෙයි. මෙම සිරුරෙහි කියන ලද සමූහයෙන් වෙන් වූ කයක් හෝ ස්ත්‍රී ස්ත්‍රියක හෝ පුරුෂයෙක් හෝ අන්කිසි ධර්මයක් හෝ නොම දක්නා ලැබේ. යථෝක්ත ධර්ම සමූහයක් පමණක් වූ මේ කයෙහි සත්ත්වයෝ වරදවා ගැනීම කෙරෙති. එයින් කීහු පුරාණාචාර්යයෝ-

> යං පස්සති නතං දිට්ඨං යං දිට්ඨං තං න පස්සති
> අපස්සං බජ්ඣතෙ මූළ්හො බජ්ඣමානො නමුච්චති

(බාලතෙම ස්ත්‍රී පුරුෂ ආදි වශයෙන් යමක් දකීද එය කේශ-ලෝම ආදි හෝ අශුභාදි වශයෙන් නොදක්නා ලද වෙයි. ස්ත්‍රී පුරුෂ ආදි වශයෙන් යමක් දක්නා ලදද එය නුවණින් නො දකී. නුවණින් නොදක්නේ සංයෝජනය විසින් බඳනා ලද්දේ වෙයි. බඳිනු ලබන්නා වූ හෙතෙම සසර දුකින නො මිදෙයි.)

ඝන විනිබ්භොග දස්සනත්ථං යයි කියන ලද මෙහි ආදි ශබ්දයෙන් මෙම අර්ථය දතයුතුයි. මෙතෙම වනාහි තෙල ශරීරයෙහි, කය අනුව බලමින් වෙසෙයි. අන්‍ය ධර්මයන් අනුව බලනසුලු වූයේ නොවෙයි කියායි. කුමක් කියන ලද්දේ වේද යත්, ජලය නොවූම මිරිඟුවෙහි, මෘගයෝ යම්සේ ජලය යන සංඥා ඇතිව බලන්නාහු වෙත්ද, එපරිද්දෙන් අනිත්‍ය-දුක්ඛ-අනාත්ම-අශුභ වූම මේ කයෙහි නිත්‍ය-සුඛ-ආත්ම-ශුභ අනුව

බලනසුලු වූයේ නොවෙයි. නැවත, කුමක් අනුව බලනසුලු වූයේද යත් කය අනුව බලනසුලු වූයේ, අනිත්‍ය, දුක්ඛ-අනාත්ම-අශුභ ආකාර වූ (කේසාදි) සමූහයක් අනුව බලනසුලු වූයේම යයි කියන ලද්දේ වෙයි. නැතහොත් මත්තෙහි **ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතො -පෙ- සො සතොව අස්සසති** යනාදි නයින් ආශ්වාස, ප්‍රාශ්වාස ආදිකොට ඇති, සුණු වූ අස්ථිකාය අවසන්කොට ඇති යම් මේ කයක් වදාරණ ලද්දේද,

**ඉධෙකච්චො පඨවිකායං අනිච්චතො අනුපස්සති ආපොකායං තෙජොකායං වායො කායං කෙසකායං, ලොමකායං ඡවිකායං චම්මකායං වංසකායං රුහිරකායං නහාරුකායං අට්ඨිකායං අට්ඨිමිඤ්ජකායං** යනුවෙන් (පටිසම්භිදා මග්ගයෙහි) කාය ගුණ කියන ලද්දේ වෙයි. (පඨවිධාතු සමූහය, වායෝ ධාතු සමූහය, කේශ සමූහය, රෝම සමූහය, සිවි සමූහය, චර්ම සමූහය, මාංශ සමූහය, රුධිර සමූහය, නහර සමූහය, ඇට සමූහය, ඇටමිදුලු සමූහය, අනිත්‍ය වශයෙන් නැවත නැවත බලයි.) පටිසම්භිදා මග්ගයෙහි යම් නයකුත් වදාරණ ලද්දේ ද, ඒ සමූහය මෙම ශරීරයෙහිලා නැවත නැවත බලන හෙයින් කයෙහි පඨවි ධාතු සමූහය බලනසුලු වූයේ යයි මෙසේත් අර්ථය දතයුතුය. නොහොත් කයෙහි, මම ය කියා හෝ මගේය කියා හෝ මෙසේ ගතයුතු වූ කිසිදු ධර්මයක් නොදක්නා හෙයින් යලි කේශ, ලෝම ආදි වූ ඒ ඒ නානාවිධ වූ ධර්ම සමූහය නැවත නැවත බලන හෙයින් කයෙහි කේශාදි වූ ධර්ම සමූහය නම් වූ කය බලනසුලු වූයේ යයි මෙසේ අර්ථය දතයුතුය.

තව ද **ඉමස්මිං කායෙ අනිච්චතො අනුපස්සති** යනාදි අනුක්‍රමයෙන් පටිසම්භිදා මාර්ගයෙහි ආක්‍රමය ඇති සියලුම අනිත්‍ය ලක්ෂණාදිය ආකාර සමූහ නම් වූ කය නැවත නැවත බලනසුලු වූවේ වේයයි මෙසේ අර්ථ දතයුතු ඒ එසේමැයි. කයෙහි කායානුපස්සනා පටිපදාව පිළිපන් මේ මහණ (අනිත්‍ය ලක්ෂණාදි ආකාර සමූහයයි කියන ලද) මේ කය අනිච්චානු පස්සනා ආදී වූ සත්වැදෑරුම් අනුපස්සනාවන්ගේ වශයෙන් අනිත්‍ය වශයෙන් නැවත නැවත බලයි. නිත්‍ය වශයෙන් නොබලයි. දුක් වශයෙන් නැවත නැවත බලයි. සුඛ වශයෙන් නොබලයි. අනාත්ම වශයෙන් නැවත නැවත බලයි. ආත්ම වශයෙන් නොබලයි. (සංඛාරයන් කෙරෙහි) කළකිරෙයි. සතුටු නොවෙයි. නොඇලුනේ වෙයි. රැඳුනේ නොවෙයි. (නිරොධ) නිරුද්ධ කරයි. නොඋපදවයි. නැවත නොගන්නා පරිද්දෙන්) දුරුකරයි. ග්‍රහණය නොකරයි.

ඒ මහණ තෙම ඒ කය අනිත්‍ය වශයෙන් නැවත නැවත බලන්නේ නිත්‍ය යන සංඥාව දුරුකරයි. දුක් වශයෙන් බලන්නේ සුඛ සංඥාව දුරුකරයි. අනාත්ම වශයෙන් බලන්නේ ආත්ම සංඥාව දුරුකරයි. කළකිරීමට පැමිණෙන්නේ තණ්හාව දුරුකරයි. නොඇලීමට පැමිණෙන්නේ රාගය දුරුකරයි. නිරුද්ධ කරන්නේ සමුදය දුරුකරයි. පටිනිස්සජ්ජනය= (දුරුකිරීම) කරන්නේ ආදානය දුරුකෙරේයයි දතයුතුය.

විහරති වාසය කරයි, ආතාපී තුන්භවයෙහි කෙලෙස් තවානුයි ආතාප නම් වේ. මේ ආතාප යනු වීර්යයට නමකි. ආතාපය ඔහුට ඇත්තේනුයි ආතාපී නම් වේ. සම්පජානො සම්පජඤ්ඤ නම් වූ ඥානයෙන් යුක්තවූයේ, සතිමා කායපරිග්‍රාහිත වූ සිහියෙන් යුක්ත වූයේ, මෙතෙම වනාහි යම්හෙයකින් සිහියෙන් අරමුණු පිළිගෙන නුවණින් නැවත නැවත බලා ද, සති විරහිතයාට අනුපස්සනාවක් නම් නැත්තේය. එහෙයින් වදාළහ. සතිඤ්ච ඛ්වාහං භික්ඛවෙ, සබ්බත්ථිකං වදාමි එහෙයින් මෙහි, කායෙ කායානුපස්සී විහරති යයි මෙතෙක් වචනයන්ගෙන් කායානුපස්සනා සතිපට්ඨාන කර්මස්ථානය වදාරණ ලද්දේ වෙයි. ඉක්බිති යම්හෙයකින් වීර්ය නැත්තහුගේ, ඇතුළත හැකිලීම අනතුරුදායක වේද, සම්ප්‍රජනය නම් වූ නුවණරහිත වූයේ, උපාය යුක්තවීමේත් අනුපාය දුරුකිරීමෙන් මුලාවේද, මුලා සිහි ඇත්තේ උපාය නොහැරීමෙහි හා අනුපාය නොගැන්මෙහිත් අසමත් වේද, එයින් ඕහට එම කර්මස්ථානය සම්පාදනය නොවේද, එහෙයින් යම් ධර්ම කෙනෙකුන්ගේ බලයෙන් එම කර්මස්ථානය සම්පාදනය වේද, ඒ ධර්මයන් දැක්වීම පිණිස ආතාපි සම්පජානො සතිමා යන මෙය වදාරණ ලදැයි දතයුතුයි.

මෙසේ කායානුපස්සනා සතිපට්ඨානය ද, සම්ප්‍රයෝග අංග ද දක්වා දැන් ප්‍රහාණ අංග දක්වන්ට විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං යයි වදාරණ ලදී. එහි විනෙය්‍ය තදංග ප්‍රහාණයෙන් හෝ වික්ඛම්භන ප්‍රහාණයෙන් දුරුකොට ලොකෙ, ඒ කයෙහිම, කය වනාහි මෙහි රූපකය (ලුජ්ජන පලුජ්ජනට්ඨෙන) නැසෙන, විශේෂයෙන් නැසෙන අර්ථයෙන් ලෝකයයි අදහස් කරන ලදී. යම්හෙයකින් ඔහුගේ කයේ පමණක් අභිජ්ඣා දෝමනස්සයෝ ප්‍රහීණ නොවෙත් ද, වේදනා ආදියෙහිත් ප්‍රහීණ වන්නේ වේද, එහෙයින් පඤ්චපි උපාදානක්ඛන්ධා ලොකෙ (උපාදානක්ඛන්ධ පසම ලෝක වේ) ධර්මයන් ලෝකසංඛ්‍යාත බැවින් මෙසේ අර්ථෝද්ධරණ ක්‍රමයක් වදාරණ ලදී. තත්‍රකතමො, ලොකො, සෙවව කායො ලොකො

(මෙහි ලෝකය කවරේද?) කයම ලෝක නම් වේ.) යයි යමක් වදාළ සේක්ද, මේ මෙහි අර්ථයයි. තස්මිං ලොකෙ අභිජ්ඣා දොමනස්සං විනෙය්‍ය යයි මෙසේ සම්බන්ධ දතයුතුයැ. යම්හෙයකින් මෙහි, අභිජ්ඣාව ගැනීමෙන් කාමච්ඡන්දයත්, දෝමනස්සය ගැනීමෙන් ව්‍යාපාදයත් සංග්‍රහ වේද, එබැවින් නීවරණයන්ට ඇතුළත් වූ බලවත් ධර්මයන් දෙදෙනාගේ ප්‍රහාණය දැක්වීමෙන් නීවරණ ප්‍රහාණය වදාරණ ලද්දේ වේයයි දතයුතු.

විශේෂයෙන් මෙහි අභිජ්ඣාව දුරුකිරීමෙන් කාය සම්පත්ති මූලික වූ අනුරොධතා (අනුකූලතාව)යාගේ ද, ව්‍යාපාද නම් වූ නොසන්සුන් බව සංසිඳුවීමෙන්, කාය විපත්ති මූලික වූ, ප්‍රතිසයාගේ ද, නැවත අභිජ්ඣාව සංසිඳුවීමෙන් ශරීරයෙහි ඇල්මද, දොම්නස සංසිඳුවීමෙන් කාය භාවනාවෙහි නොඇල්ම ද, අභිජ්ඣාව සංසිඳුවීමෙන් කයෙහි අවිද්‍යමාන වූ ශුභ, සුඛ ආදියෙහි ප්‍රතික්ෂෙපයේ ද, දෝමනස්සය සංසිඳුවීමෙන් කයෙහි විද්‍යමාන වූ අසුභ, අසුඛ භවාදීන්ගේ අපනයනයාගේ ද, ප්‍රහාණය වදාරණ ලදී. එබැවින් යෝගාවචරයාගේ යෝගානුභාවයද, යෝගයෙහි සමර්ථ බවද, දක්වන ලදී. යම්හෙයකින් මේ යෝගාවචර අනුරෝධ විරෝධයන් කෙරෙන් විශේෂයෙන් මිදුනේ, අරති රති ඉවසන්නේ අභූත වූ (ශුභාදීන්ට ප්‍රතිපක්ෂ වූ) එහෙයින් භූත වූ (මේවා සම්බන්ධ) අපනයනය යන මෙයින් විරහිත වූයේත් වේද, මේ යෝගානු භාවනාව මැයි. තව ද මේ යෝගාවචර තෙම අනුරෝධ-විරෝධයන්ගෙන් වෙසෙසින් මිදුනේ අරති රති ඉවසන්නේ අභූත වූ ශුභාදිය නොබහාලන්නේ, භූත වූ අශුභාදියත් බැහැර නොකරන්නේ යෝගයේ සමර්ථ වූයේ වෙයි.

අනිකුදු ක්‍රමයක් කියනු ලැබේ. කායෙ කායානුපස්සී මෙහි අනුපස්සනාවෙන් කර්මස්ථානය කියන ලද්දේ වෙයි. විහරති යන මෙහි වදාළ විහරණයෙන් කමටහන වඩන්නහුගේ කාය පරිහරණය වදාරණ ලදී. ආතාපි යනාදියෙහි. ආතාප, ආතාප නම් වීර්යයෙන් සම්‍යක් ප්‍රධානය ද සතිසම්පජඤ්ඤයෙන් සබ්බත්ථක කම්මට්ඨානය ද, කම්මට්ඨාන පරිහරණයෙහි උපාය ද, නොහොත් සතියෙන් කායානුපස්සනා වශයෙන් ලබන ලද සමථය ද, සම්පජඤ්ඤයෙන් විපස්සිනාව ද, අභිජ්ඣා-දෝමනස්සයන්ගේ සංසිඳවීමෙන් භාවනා ඵලය ද වදාරණ ලදැයි දතයුතු.

විභංගයෙහි **අනුපස්සී** යනු එහි අනුපස්සනා තොමෝ කවරේද? යම් අනිත්‍ය ආදි ලක්ෂණයන්ගෙන් ධර්මයන් දැනගන්නා වූ ප්‍රඥාවක්,

විසෙසින් දන්නා බවක් -පෙ- සම්මාදිට්ඨියක් වේද, මෙය අනුපස්සනා යයි කියනු ලැබේ. යම්සේ මෙම අනුපස්සනාවෙන් යුක්ත වූයේ මොනවට යුක්ත වූයේ පැමිණියේ, මොනවට පැමිණියේ උත්පන්න වූයේ, සමෘද්ධ වූයේ සමන්විත වූයේ, වේද, එහෙයින් අනුපස්සී යයි කියනු ලැබේ.

විහරති යනු වැටෙයි. පවතී පාලනය කෙරෙයි. යැපෙයි, යාපනය කෙරෙයි, හැසිරෙයි. විහරණය කෙරෙයි. එහෙයින් විහරති යයි කියනු ලැබේ.

ආතාපී යනු එහි ආතප්පය කවරේද යත්, යම් චෛතසික වූ විරියාරම්භයක් -පෙ- සම්මා වායාමයක් වේද, මෙය ආතප්ප යයි කියනු ලැබේ. මෙම ආතප්පයෙන් යුක්ත වූයේ -පෙ- සමන්විත වූයේ වේද, එහෙයින් ආතාපී යයි කියනු ලැබේ.

සම්පජානො යනු එහි සම්පජඤ්ඤ නම් කවරේද? යම් (අනිත්‍යාදි ප්‍රකාරයෙන් දන්නා වූ) ප්‍රඥාවක් දන්නා බවක් -පෙ- සම්මා දිට්ඨියක් වේද මෙය සම්පජඤ්ඤයයි කියනු ලැබේ. මේ සම්පජඤ්ඤයෙන් යුක්ත වූයේ -පෙ- සමන්විත වූයේ වේද එහෙයින් සම්පජානො යයි කියනු ලැබේ.

සතිමා යනු එහි සති කවරීද? යම් සිහි කිරීමක් නැවත නැවත සිහිකිරීමක් -පෙ- සම්මා සතියක් වේද, මෝ තොමෝ සති යයි කියනු ලැබේ. මේ සතියෙන් යුක්ත වූයේ -පෙ- සමන්විත වූයේ වේද, එහෙයින් සතිමා යයි කියනු ලැබේ. විනෙය්‍ය, ලොකෙ අභිජ්ඣාදොමනස්සං යනු එහි ලෝකය කවරේද, මේ කයම ලෝක නම් වේ. පස්කඳම ලෝක නම්. මෙතෙමේ ලෝකයයි කියනු ලැබේ. එහි අභිජ්ඣාව කවරීද? යම් රාගයක් බලවත් රාගයක්, අනුනයක් - අනුරෝධයක් - තණ්හාවක් - නන්දිරාගයක් - චිත්තනයාගේ බලවත් ඇලීමක් වේද, මෝ තොමෝ අභිජ්ඣා නම් වන්නීය. එහි දෝමනස්ස නම් කවරේද? යම් චෛතසික වූ නොසැපයක් චෛතසික වූ දුකක් වේදනාවක් වේද, මේ දෝමනස්ස යයි කියනු ලැබේ.

මේ දෝමනස්සය ද, (පඤ්චස්කන්ධ නමැති ලෝකයෙහි) විනීත වූවාහු ප්‍රතිවිනීත වූවාහු සංසිඳුවනු ලද්දාහු, වෙසෙසින් සංසිඳුවනු ලද්දාහු නසන ලද්දාහු වෙසෙසින් නසන ලද්දාහු බැහැර කළාහු වෙසෙසින් බැහැර කළාහු, වියලන ලද්දාහු, වෙසෙසින් වියලන ලද්දාහු විගතාන්ත කළාහු වෙත්ද, එහෙයින් විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං යයි

කියනු ලැබේ. මෙසේ මෙම පදයන්ගේ අර්ථය දක්වන ලද්දේ ය. ඒ විභංගයෙහි දැක්වූ අර්ථය සමග මේ අර්ථකථා ක්‍රමය යම්සේ සැසඳේද, එපරිද්දෙන් දතයුතුය.

## පළමුකොට කායානුපස්සනා සතිපට්ඨානයාගේ අර්ථ වර්ණනා තොමෝ දක්වන ලදී.

දැන්, **වෙදනාසු චිත්තෙ - ධම්මෙසු ධම්මානුපස්සී විහරති -පෙ- විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං** යන මෙහි **වෙදනාසු වෙදනානුපස්සී** යනාදියෙහි වේදනාදී ශබ්දයන්ගේ නැවත කීමෙහි කායානුපස්සනාවෙහි කී ආකාරයෙන්ම දතයුතුය. **වෙදනාසු වෙදනානුපස්සී චිත්තෙ චිත්තානුපස්සී, ධම්මෙසු ධම්මානුපස්සී** යන මෙහි වනාහි වේදනා යනු ත්‍රිවිධ වේදනායැ. ඔවුහුද ලෞකික වූවාහුම වෙති. චිත්තය ද ලෞකිකය. ධර්මයෝත් එසේමය. ඔවුන්ගේ විස්තර විභාගය නිර්දේශ වාරයෙහි දී ප්‍රකට වන්නේය. හුදෙක් මෙහි වේදනා යම්සේ නැවත නැවත නුවණින් බැලිය යුත්තාහුද, එපරිද්දෙන් නැවත නැවත බලන්නේ **වෙදනානුපස්සී** යයි දතයුතුය. චිත්ත හා ධර්මයන්හිදු මේ ක්‍රමයමැයි, යලි කෙනෙක් වේදනා අනුදර්ශනය කළයුත්තාහුද යත්, පළමුකොට සැප වේදනාව දුක් වශයෙන් ද, දුක් වේදනාව (සල්ලතො) උලක් වශයෙන් ද, අදුක්ඛම සුඛ වේදනාව අනාත්ම වශයෙන් ද නැවත නැවත බැලිය යුතුය. වදාළේ මැනො.

**යො සුඛං දුක්ඛතො අද්ද, දුක්ඛමද්දක්ඛි සල්ලතො**
**අදුක්ඛ මසුඛං සන්තං අද්දක්ඛි නං අනිච්චතො**
**සවෙ සම්මද්දසො භික්ඛු උපසන්තො චරිස්සති** යනුවෙන්

(යමෙක් සැප වේදනාව, දුක් වශයෙන් නුවණින් දුටුයේ ද, දුක්ඛං දුක් වේදනාව උලක් සෙයින් දුටුයේ ද, සැප දුක් දෙකින් සංසිඳුන ස්වභාව ඇති බැවින් අතිශයින් ශාන්ත වූ නොදුක් නොසැප වූ ඒ මධ්‍යස්ථ වේදනාව අනිත්‍ය වශයෙන් ද දුටුවේද ඒකාන්තයේ, සම්‍යක් දර්ශන ඇති ඒ ක්ෂීණාශ්‍රව තෙම ක්ලේශ ව්‍යපසමයෙන් සංසිඳුනේ හැසිරෙන්නේය.)

නැවත මේ සියලු වේදනාවෝ දුක් යයි නැවත නැවත නුවණින් දැක්ක යුත්තාහුය. ඒ එසේමැයි. මෙසේ කියන ලදී, **යං කිඤ්චි වෙදයිතං සබ්බං තං දුක්ඛස්මින්ති වදාමි** (යම්කිසි අරමුණු රසවිඳීම් ලක්ෂණ වූ වේදනා සමූහයක් වේද, ඒ සියල්ල දුක් යයි කියමි) යයි නැවතත්

සැපවේදනාව දුක් වශයෙන් නැවත නැවත බැලිය යුත්තීය. වදාලේම වෙයි. සුඛා වේදනා ඨිතිසුඛා විපරිණාම දුක්ඛං (සැප වේදනාව ප්‍රවෘත්තියේදී සැප එලවන්නීය. විපරිණාමයෙහි දී දුක් වන්නීය) යයි සියල්ල විස්තර කළ යුතුය. නැවතත් අනිත්‍ය ආදි වූ සප්ත අනුපසසනාවන්ගෙන් නැවත, නැවත බැලිය යුතුයි. සෙස්ස නිර්දේශ වාරයෙහිම ප්‍රකට වන්නීය. චිත්ත, ධර්මයන් අතුරෙහිද පළමුකොට චිත්තය ආරමමණ අධිපති, සහජාත භූමි කමම විපාක කිරියා ආදි වූ නානාත්ව භේදයන්ගේ ද අනිත්‍ය ආදි වූ අනුපසසිනාවන්ගේ ද නිදෙදස වාරයෙහි ආ සරාග ආදි භේදයන්ගේ ද වශයෙන් නැවත නැවත බැලිය යුතුයි. ධර්මයෝ ස්වලක්ෂණ, සාමාන්‍ය ලක්ෂණයන්ගේ ද, ශූන්‍යතා ධර්මයාගේ ද අනිත්‍ය ආදී සප්තවිධ අනුපසසනාවන්ගේ ද නිදෙදස වාරයෙහි ආ ශාන්ත, අශාන්ත ආදී භේදයන්ගේ ද වශයෙන් නුවණින් නැවත නැවත බැලිය යුත්තාහුය. සෙස්ස කී නයමැයි. තව ද මෙහි යම් යෝගාවචරයෙකුගේ කාය නම් වූ ලෝකයෙහි අභිජ්ඣා, දෝමනසස, ඉපදී පහීන වූයේ නම් ඔහුගේ වෙදනා ආදී නම් වූ ලෝකයෙහි ද එම අභිජ්ඣා, දෝමනසස, පහීන වූයේම වෙයි. එසේව වූත් නානා පුද්ගලයන්ගේ වශයෙන් ද නානා චිත්තක්ෂණික සතිපට්ඨාන භාවනා වශයෙන් ද සියලු තන්හි වදාරණ ලද නොහොත් යම්හෙයකින් එක් තැනෙක්හි ප්‍රහීණ වූයේ සෙසු තන්හිද ප්‍රහීණ වූයේ වේද, එබැවින් ඔහුගේ එක්තැනෙක්හි ප්‍රහාණය දැක්වීම පිණිසද මෙසේ වදාරණ ලදැයි දතයුතුය.

## උදෙදශ වාර කථා නිමි

### නිදෙදස වාර කථා

දක්ෂ වූ කුලුපොතු තෙම මහත් වූ හුණ ගසක් ලැබ, සන කලාල සියුම් කලාල කරඬු පෙට්ටි ආදී උපකරණයන් කරනු කැමැත්තේ සරසට පලා එයින් එක එක හුණකඩක් ගෙන පලා ඒ ඒ උපකරණ යම්සේ කරන්නේ ද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ සතිපට්ඨාන දේශනාවෙන් සත්ත්වයන්ගේ අනේකප්‍රකාර විශේෂ අධිගමයට පැමිණවීම කරනු කැමැත්තාහු, **එකම සමමා සතිය, චත්තාරො සතිපට්ඨානා කතමෙ චත්තාරො ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපසසී** යනාදි නයින් අරමුණු වශයෙන් සතර පරිද්දෙකින් වෙන්කොට එහි එක එක සතිපට්ඨානය ගෙන විස්තර කරන **සේක් කථඤ්ච භික්ඛවෙ** යනාදි නයින් නිද්දේස වාරය දේශනා කිරීමට පටන්ගත් සේක.

එම නිද්දේස වාරයෙහි කථඤ්ච යනාදිය විස්තර කරනු පිණිස වූ ප්‍රචඡාය, විමසීමය. මේ වනාහි මෙහි කෙටි අරුතයි. මහණෙනි, කවර ප්‍රකාරයකින් මහණතෙම කයෙහි කය අනුව බලමින් වාසය කෙරේදැයි සියලු ප්‍රචඡාවන්හි විමසීන්හි මේ ක්‍රමයමැයි. ඉධ භික්ඛවෙ භික්ඛු මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම, යම්හෙයකින් මෙහි මේ ඉධ ශබ්දය තෙම සර්වප්‍රකාරයෙන් කායානුපසසනා නිපදවන්නා වූ පුද්ගලයා හට ඇසුරට ඇති ශාසනය දක්වන්නේ ද, අන් සසුනක එබඳු බව වලකන්නේ ද වෙයි. මෙය වදාළේය. ඉධෙව භික්ඛවෙ සමණො -පෙ- සුඤ්ඤාපරප්පවාදා සමණෙහි අඤ්ඤෙ එහෙයින් කියන ලදී. මෙම සසුනෙහි මහණතෙම යයි.

සෙනසුන් -

අරඤ්ඤගතො වා -පෙ- සුඤ්ඤාගාරගතො වා යන මෙයින් එම යෝගියා හට සතිපට්ඨාන භාවනාවට සුදුසු සෙනසුනක් ගැනීම දැක්වීමයි. යම්හෙයකින් මේ භික්ෂුවගේ බොහෝකලක් රූපාදි අරමුණෙහි විසුරුණ සිත කමටහන් මාර්ගයට බැසගැනීම නොකැමති වේද, කුළුගොනෙකු යෙදූ රියක් මෙන් නොමගටම දිවේද, එහෙයින් ගොපලුතෙම කුළුදෙනගේ සියලු කිරි බී වැඩුනු කුළුවස්සා දමනය කරනු කැමැතිව දෙනු කෙරෙන් වෙන්කොට එක්පසෙක මහත් කණුවක් සිටුවා එහි යම්සේ යොතකින් බඳින්නේ ද, එකල එම වසුතෙම ඔබ මොබ පලායන්ට නොහැකිව එම කනුව කරාම එළඹ යම්සේ හිඳින්නේ හෝ හෝ නේ හෝ වේ ද, එපරිද්දෙන්ම මේ මහණ විසින් ද බොහෝ කලක් රූප අරමුණු ආදිය නිසා උපදනා වූ ආශ්වාද නමැති රස පානයෙන් වැඩුනු නොදැමුනු සිත දමනය කරනු කැමැත්තාහු, රූපාරම්මණයෙන් වෙන්කොට ආරණ්‍යකට හෝ රුක්මුලකට හෝ, ශුන්‍යාගාරයකට හෝ ඇතුළත්ව සතිපට්ඨාන අරමුණු නමැති කණුවෙහි සිහිය නමැති යොතින් බැන්ද යුතුයැ. මෙසේ එම යෝගිහුගේ සිත ඔබ්නොබ සැලේ ද, පෙර හෝ අනාදිමත් සසරෙහි හෝ පුරුදු කළ අරමුණු නොලබන්නේ සිහි නමැති යොත බිඳ පලායන්ට අපොහොසත් වූයේ ඒ සතිපට්ඨාන අරමුණෙහි මැ එළඹ හිඳින්නේ ද හෝනේ ද වෙයි. එයින් කීහ පුරාණචාර්යවරයෝ :-

**යථා ථමෙහ නිබන්ධෙය්‍ය, වච්ඡං දම්මං නරො ඉධ,**
**බන්ධෙය්‍යෙවං සකං චිත්තං සතියාරම්මණෙ දළ්හං යි**

(මේ ලෝකයෙහි මිනිස්තෙම, දමනය කරනු කැමති වස්සා කණුවෙහි

යම්සේ බඳනේ ද, එපරිද්දෙන් මහණතෙම තමාගේ සිත, සිහියෙන් අරමුණෙහි ස්ථිරකොට බඳින්නේය.)

මෙසේ ඔහුට එම සෙනසුන භාවනාවට අනුරූප වූයේ වෙයි. එහෙයින් කියන ලදී. මේ ඔහුට සතිපට්ඨාන භාවනාවට අනුරූප වූ සෙනසුන් ගැනීම දැක්වීමයි.

තව ද යම්හෙයකින්, කායානුපස්සනාවේ හිස වැනි වූ සියලු බුදුවරයන්ගේ ද, පසේ බුදුවරයන්ගේ ද, බුද්ධශ්‍රාවකයන්ගේ ද, විශේෂ අධිගමයට හා ඉහාත්ම සැපවිහරණයට කරුණු වූ මේ ආනාපානසති කමටහන ස්ත්‍රී-පුරුෂ-හස්ති-අශ්ව ආදීන්ගේ ශබ්දයෙන් ආකුල වූ ග්‍රාමාන්ත සෙනසුන අතනොහැර සම්පාදනය කිරීම පහසු නොවේ. කුමක් හෙයින්ද, ශබ්දය වූ කලී ධ්‍යානයට (කණ්ටක) බාධාවකි. අගාමක වූ අරණ්‍යය මෙයට පහසුය. යෝගාවචර විසින් මෙම කමටහන ගෙන, ආනාපාන සතරවන ධ්‍යානය උපදවා එම ධ්‍යානයම පාදකකොට සංඛාර ධර්මය සම්මර්ශනය කොට අග්‍රඵලය වූ රහත්බවට පැමිණීමට පහසු වේද, එබැවින් එම යෝගියාට සුදුසු වූ සෙනසුන දක්වන්නා වූ බුදුරජාණන් වහන්සේ, අරඤ්ඤගතොවා යනාදිය වදාළහ. භාග්‍යවත්හු (යෝගීහුට) වාස්තු විද්‍යාචාර්යවරයෙකු වැන්නහ. ඒ වාස්තු විද්‍යාචාර්ය තෙම නුවරකට තිසි බිමක් දැක, මනාලෙස පරීක්ෂාකොට මෙහි නුවරක් ඉදිකළ මැනවැයි යම්සේ උපදේශ කෙරේද, පහසුවෙන් නුවර නගා නිමිකල්හි රාජකුලයෙන් මහත් සත්කාර ලබා ද, එපරිද්දෙන්ම යෝගාවචරයා හට සුදුසු වූ සෙනසුන පරීක්ෂාකොට මෙතැන්හි කමටහන් යෙදිය යුතුයයි උපදේශ කෙරෙති. අනතුරුව එහි කමටහන්හි යෙදෙන යෝගාවචරයන් විසින් අනුක්‍රමයෙන් රහත්බව ලැබූ කල්හි ඒකාන්තයෙන් භාග්‍යවත්හු සම්‍යග් සම්බුද්ධහයි මහත් වූ සත්කාර ලබන සේක. මෙම භික්ෂුව වනාහි දිවියකු වැනියයි කියනු ලැබේ. එසේය මහත් වූ දිවිරදෙක් වනයෙහි තෘණ අතරෙහි හෝ වනරොදක හෝ පර්වත ගහණයක හෝ සැඟවී හිඳ, වන-මී-ගෝණ-හූරු ආදී වූ මෘගයය, යම්සේ ගනීද, එසේම මෙම යෝගාවචර තෙම අරණ්‍යය ආදියෙහි කමටහන්හි යෙදෙන්නේ පිළිවෙලින් සතර මාර්ගයන්ද සතරඵලයන් ද ගනී. එහෙයින් කීහු පොරාණයෝ,

**යථාහි දීපිකොනාම නිලීයිත්වා ගණ්හති මිගෙ,**
**තථෙවායං බුද්ධපුත්තො යුත්තයොගො විපස්සකො**
**අරඤ්ඤං පවිසිත්වාන ගණ්හාති ඵල මුත්තමං** යනුවෙන්

(දිවි තෙම සැඟවී සිට මෘගයන් යම්සේ අල්ලා ගනිත්ද, එපරිද්දෙන් මේ බුද්ධපුත්‍ර තෙම, සමාධියෙන් යුක්ත වූයේ විදර්ශනාවෙන් යුක්ත වූයේ ආරණ්‍ය සෙනසුනකට පිවිස උත්තම වූ ශ්‍රමණඵලය ග්‍රහණය කෙරෙයි.)

එහෙයින් ඔහුට භාවනා උත්සහ නමැති ජවයට යෝග්‍ය භූමියක් වූ වන සෙනසුන දක්වන භාග්‍යවතුන් වහන්සේ අරඤ්ඤගතොවා යනාදිය වදාළ සේක. මෙයින් මත්තෙහි මේ ආනාපානසති පරිච්ඡේදයෙහි කිවයුතු යමක් වන්නේ ද එය විසුද්ධි මාර්ගයෙහි කියන ලද්දේමය.

ආනාපාන සති භාවනා

**දීඝං වා අස්ස සන්තො දීඝං අස්සසාමීති පජානාති -පෙ- පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති,**

යනුවෙන් මෙසේ වදාළ මේ අස්සාස - පස්සාසයන්ගේ වශයෙන් හික්මෙන්නා වූ ඔහුට අස්සාස - පස්සාස නිමිත්තෙහි සතර ධ්‍යානයෝ උපදිත්. හෙතෙම ධ්‍යානයෙන් නැගී සිට අස්සාස-පස්සාසයන් හෝ ඣාන අංගයන් හෝ පරිග්‍රහණ කරයි. ඔවුන් දෙදෙනා අතුරෙහි අස්සාස පස්සාස කම්මික තෙම අස්සාස පස්සාසයෝ කුමක් ඇසුරු කළාහුද, හදවත ඇසුරු කළාහුය. හදවත නම් කරජකායැයි (=මව්පියන් නිසා හටගත්) කරජ කායනම් සතරමහා භූතයන් හා උපාදාය රූපදැයි මෙසේ රූපය පරිග්‍රහණය කරයි. අනතුරුව එම අස්සාස-පස්සාස අරමුණෙහි ඵස්සපංචම ධර්මයන් (වෙදනා-සඤ්ඤා-සංඛාර-විඤ්ඤාණ) නාමයයි. මෙසේ නාමරූප මෙනෙහිකොට නාමරූපයන්ගේ ප්‍රත්‍ය සොයන්නේ අවිජ්ජා ආදි වූ පටිච්ච සමුප්පාදය දැක එම නාම-රූප, පටිච්ච සමුප්පාද, පටිච්ච සමුප්පන්න ධර්ම මාත්‍රයක්මැයි අන්‍ය වූ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැතැයි තරණය කළ සැක ඇත්තේ පච්චය සහිත නාමරූපයෙහි අනිත්‍ය ආදී ත්‍රිලක්ෂණයට නගා විදර්ශනා වඩන්නේ මගඵල පිළිවෙලින් රහත් බවට පැමිණෙයි. මේ එක් භික්‍ෂු කෙනෙකුගේ රහත්බව තෙක් නිවන්මගයි.

ඣානකම්මික තෙම මෙම ධ්‍යාන අංගයෝ කුමක් ඇසුරු කළාහුද? හදවත ඇසුරු කළාහුය. හදවත නම් කරජකායයි. ධ්‍යානංගයෝ නාමයෝය. කරජ කාය රූපයයි නාම-රූපය නිශ්චයකොට එම නාමරූපයාගේ ප්‍රත්‍යය සොයන්නේ අවිජ්ජා ආදී වූ ප්‍රත්‍යාකාරය දැක, මේ නාමය හා රූපය පටිච්ච සමුප්පාද-පටිච්ච සමුප්පන්න ධර්ම මාත්‍රයකැයි අන්‍ය වූ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැතැයි වෙසෙසින් දුරුකළ

සැක ඇත්තේ ප්‍රත්‍යය සහිත වූ නාමරූපයෙහි ත්‍රිලක්‍ෂණයට නගා විදර්ශනා වඩා අනුක්‍රමයෙන් රහත් බවට පැමිණෙයි. මේ එක භික්‍ෂුවකගේ රහත්බව තෙක් නිවන් මගයි.

**ඉති අජ්ඣත්තං** වා මෙසේ තමාගේ හෝ අස්සාස පස්සාස කයෙහි කායානුපස්සනා භාවනාව සිහිකරමින් වාසය කරන්නේය. **බහිද්ධා** වා අන්‍යයාගේ හෝ අස්සා පස්සාය කයෙහි, **අජ්ඣත්ත බහිද්ධා** වා කලෙක තමාගේ ද කලෙක මෙරමාගේ ද, අස්සාස පස්සාස කයෙහි, මේ පදයෙන් එම යෝගාවචරයාගේ ප්‍රගුණ වූ කමටහන හැර ඔබ මොබ හැසිරෙන කාලය කියන ලද්දේ වෙයි. එකම වර මේ දෙකම නො ලැබෙයි.

**සමුදය ධම්මානු පස්සීවා**, කඹුරාගේ භස්ත්‍රාවද කඹුරු සමෙහි නලයද ඒ පිණිස වූ උත්සාහයද, නිසා යම්සේ වාතය ඔබිනොබ හැසිරේ ද, එසේ භික්‍ෂුවගේ කරජ කායද, නාසාපුටය ද සිතද නිසා අස්සාස පස්සාසකාය ඔබිනොබ හැසිරෙයි. කායාදි ධර්මයෝ සමුදය නම්. ඒ ධර්මයන් බලන්නේ, **සමුදය ධම්මානුපස්සී වා කායස්මිං විහරති** යයි කියනු ලැබේ. **වයධම්මානුපස්සී** වා කඹුරු සම ඉවතලූ කල කඹුරුසමෙහි නලය බිඳුනු කල ඒ පිණිස වූ ව්‍යායාමයද නැතිකල්හි ඒ වාතය යම්සේ නො පවතීද, එසේම කයබුන් කල නැහැසිදුර නැසුන කල සිත නිරුද්ධ වූ කල යම්හෙයකින් අස්සාස පස්සාස කය නො පවතීද එහෙයින් කායාදීන්ගේ නිරෝධයෙන් අස්සාස පස්සාසයන්ගේ නිරෝධය වෙයි. මෙසේ බලන්නේ **වයධම්මානු පස්සී කායස්මිං විහරති** යයි කියනු ලැබේ. **සමුදය වය ධම්මානු පස්සී** කලෙක උපතද, කලෙක විපතද නැවත නැවත බලන්නේ, **අත්ථි කායොති** වා **පනස්ස** (අස්සාස-පස්සාස) කය නම් ඇත යයි ද, සත්ත්වයෙක් නැති, පුද්ගලයෙක් නැති ස්ත්‍රියක් නැති පුරුෂයෙක් නැති ආත්මයෙක් නැති ආත්මනීය නොවේ. මම නොවෙමි, මගේ නොවේ, කිසිවෙක් නොවේ, කිසිවෙකුගේ නොවේ යයි, මෙසේ මහණහට සිහිය එළඹ සිටියේ වෙයි.

**යාවදෙව** යන මේ පදය ප්‍රයෝජනය පරිච්ඡෙදයාගේ වෙන්කිරීම වෙයි. මේ කියන ලද වෙයි. ඕ යම් සිහියක් තොමෝ එළම සිටියා වේද, ඕ තොමෝ අනිකක් පිණිස නොවේ වැලි කුමක් පිණිසද යත්, **යාවදෙව ඤාණමත්තාය** ඔබිනොබ, මතුමත්තෙහි ඥාන ප්‍රමාණය පිණිස ද, සති ප්‍රමාණය පිණිසද වෙයි. **සතිසම්පජඤ්ඤයන්ගේ** වැඩීම පිණිසය යන

අර්ථයි. අනිස්සිතො ච විහරති තණ්හා ඇසුර, දිට්ඨි ඇසුර යන මොවුන්ගේ වශයෙන් ඇසුරක් නැත්තේම වාසය කරයි.

න ච කිඤ්චි ලොකෙ උපාදියති ලෝකයෙහි කිසියම් රූපයක් හෝ -පෙ- විඤ්ඤාණයක් හෝ මේ මගේ ආත්මය හෝ ආත්මයට අයත් දෙයක් හෝ යයි නොගනී. එවම්පි මතු අර්ථය සඳහා සමපිණ්ඩනාර්ථයෙහි 'පි' කාරයයි තවද මේ පදයෙන් භාග්‍යවතුන් වහන්සේ ආනාපාන පර්ව දේශනාව නිමවා දැක්වූ සේක. ඒ ආනාපාන පර්වයෙහි අස්සාස පස්සාස පරිග්‍රාහික (යෙදුන) සතිය දුක්ඛ සත්‍ය නම් වේ. එම සතිය උපදවන්නා වූ පූර්ව තණ්හා තොමෝ සමුදය සත්‍ය වේ. ඒ දෙදෙනාගේ නොපැවැත්ම නිරොධ සත්‍ය වේ. දුක දැනගන්නා වූ සමුදය දුරුකරන්නා වූ නිරෝධය අරමුණු කරන්නා වූ ආර්ය මාර්ගය තෙම මාර්ග සත්‍ය වේ. මෙසේ චතුරාර්ය සත්‍ය වශයෙන් උත්සාහකොට නිවනට පැමිණේ යයි අස්සාස පස්සාස භාවනාවෙහි යෙදුන එක් මහණෙක් හට රහත් බව තෙක් නිවන් වේ යනුයි.

ආනාපාන පබ්බය නිමි.

**ඉරියාපථ පබ්බය**

මෙසේ අස්සාස, පස්සාස වශයෙන් කායානුපස්සනාව විභාගකොට මේ වනවිට ඉරියාපථ වශයෙන් විභාග කිරීම පිණිස පුනච පරං යනාදිය වදාළහ. බලු, කැනහිල් ආදීහු යන්නාහු ඒකාන්තයෙන් අපි යමු යයි දනිති. එතකුදු වුවත් මෙම ඉරියාපථ දේශනාව මෙබඳු වූ දැනීමක් සඳහා නොවදාරණ ලදී. මෙබඳු දැනීම වූ කලී සත්ත්ව දෘෂ්ටිය නො හරියි. ආත්ම සංඥාව නො නසයි. එය, කර්මස්ථානය හෝ සතිපට්ඨාන භාවනාව නොවෙයි. නමුත් මේ භික්ෂුවගේ දැනීම වූ කලී සත්ත්ව දෘෂ්ටිය හැරදමයි. ආත්ම සංඥාව නසයි. කර්මස්ථානය හා සතිපට්ඨාන භාවනාවද වෙයි.

මෙම (ගමන) වනාහි, කවරෙක් යේ ද? කවරෙකුගේ ගමනක් ද, කුමන කාරණයකින් යේ දැයි මෙවන් දැනුමක් සඳහා වදාරණ ලදී. සිටීම් ආදියෙහිද මේ ක්‍රමයමැයි. එහි කවරෙක් යේද, යන මෙහි කිසි සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නො යෙයි. කවරෙකුගේ ගමනක්ද යන මෙහි කිසි සත්ත්වයෙකුගේ හෝ පුද්ගලයෙකු හෝ ගමනක් නො වෙයි. කුමන

කරුණකින් යේ ද යන මෙහි චිත්ත ක්‍රියා වායෝ ධාතුගේ පැතිරීමෙන් යෙයි. එහෙයින් මෙම මහණ මෙසේ දැනගනී.

'යන්නෙමියි සිතක් උපදී ද, ඒ සිත වායෝ ධාතුව විසින් උපදවනු ලබයි. වායෝධාතුව ගමන් කරන්නා වූ ආකාරය කාය විඥප්තිය විසින් උපදවනු ලබයි. චිත්තකිරිය වායෝ ධාතුහුගේ පැතිරීමෙන් සකල ශරීරයාගේ ඉදිරියට එලවීම ගමන යයි කියනු ලැබේ.

සිටීම යනුවෙන් සිතක් උපදී, එය වායෝ ධාතුව විසින් උපදවනු ලබයි. වායෝ ධාතුව විඥප්තිය විසින් උපදවනු ලබයි. චිත්ත-කිරිය-වායෝ ධාතුන්ගේ පැතිරීමේ හේතුවෙන් සකල ශරීරයාගේ කෙළවර පටන් ඔසවන ලද බව සිටීම යයි කියනු ලැබේ.

හිඳිමියි යනුවෙන් සිතක් උපදීද, එම සිත වායෝ ධාතුව විසින් උපදවනු ලබයි. වායො ධාතුව කාය විඥප්තිය විසින් උපදවනු ලබයි. චිත්ත-කිරිය-වායෝ ධාතුහුගේ පැතිරීමෙන් යට සිරුරේ හැකිළීම හා උඩ සිරුරේ ඔසවන ලද බව හිඳීම යයි කියනු ලැබේ.

නිදමියි යනුවෙන් සිතක් උපදීද, ඒ සිත ක්‍රියා වායෝ ධාතුව විසින් උපදවනු ලබයි. එම වායෝ ධාතුව කාය විඥප්තිය විසින් උපදවනු ලබයි. චිත්ත-කිරිය-වායෝ ධාතුන්ගේ පැතිරීම හේතුකොට ගෙන සකල ශරීරයාගේ සරසට දිගුකිරීම සයනය යයි කියනු ලැබේ.

මෙසේ දැනගන්නා වූ ඔහුට මෙබඳු සිතක් පහළ වෙයි. 'සත්ත්ව තෙම සිටියි යයි කියනු ලැබේ. කිසි සත්ත්වයෙක් යන්නේ හෝ සිටියේ හෝ නැති අනිකක් ඇති, ගැල යයි, ගැල සිටියි යයි යම්සේ කියනු ලැබේ ද, යන්නා වූ සිටින්නා වූ ගැලක් නම් නැත්තේ ද, එසේ වුවත් ගොනුන් සතර දෙනෙකු යෙදූ දක්ෂ වූ රියදුරෙකු පදවන කල්හි ගැල යයි ගැල සිටියි යයි, යම්කිසි ව්‍යවහාර මාත්‍රයක් වේද, එපරිද්දෙන්ම ගමන් නොකරන අරුතින් කය ගැලක් මෙනි, චිත්තජ වායෝ ධාතුව ගොනු මෙනි. සිත රියදුරා මෙනි. යෙමියි, සිටිමියි සිත උපන් කල්හි වායො ධාතුව කාය විඥප්තිය උපදවමින්, උපදී. වායෝ ධාතුහුගේ පැතිරීම හේතුකොට ගෙන, ගමනාදිය පවතිත් එහෙයින් සත්ත්වතෙම යෙයි සත්ත්ව තෙම සිටි මම යමි, මම සිටිමි යනු ව්‍යවහාර මාත්‍රයක්ම වේ.

එයින් කිහ.

නාවා මාලුතවෙගෙන, ජියාවෙගෙන තෙජනං
යථා යාති තථාකායො යාතිවාතාහතො අයං
යන්ත සුත්ත වසෙනෙව, චිත්ත සුත්ත වසෙනිදං
පයුත්තං කාය යන්තම්පි යාති, ඨාති නිසීදති
කොනාම එත්ථ සො සත්තො යො විනා හෙතු පච්චයෙ
අත්තනො ආනුභාවෙන තිට්ඨෙවා යදිවා වජෙ

(පවන වේගයෙන් නැව ද, දුනුදිය වේගයෙන් හීය ද, යම්සේ යේද, එපරිද්දෙන් වාතයෙන් පහලා වූ මේ කය යයි,

යොදන ලද මේ ශරීර නමැති යන්ත්‍රය යන්ත්‍ර සූත්‍රයාගේ වශයෙන් මෙන් චිත්ත සූත්‍රයාගේ වශයෙන් යෙයි. සිටී. හිඳී.

මේ ලෝකයෙහි, යම් සත්ත්වයෙක් තෙම හේතුප්‍රත්‍යයෝ හැර තමාගේ ආනුභාවයෙන්, සිටින්නේ හෝ යන්නේ හෝ වේද, ඒ සත්ත්ව තෙම කිනම් වේද, එබඳු සත්ත්වයෙක් නැත යන අර්ථයි.

එහෙයින් මෙසේ හේතුප්‍රත්‍යයන්ගේ වශයෙන් ම පවත්නා වූ ගමන ආදිය සලකන්නා වූ මේ යෝගාවචර තෙම **ගච්ඡන්තො වා ගච්ඡාමීති පජානාති, ඨි තො වා නිසින්නො වා සයානොවා සයානොමහීති පජානාති** යනුවෙන් යන්නේ හෝ යන්නෙමි දැනගනී. සිටියේ හෝ සිටියේ වෙමියි දැනගනී. හුන්නේ හෝ හුන්නේ වෙමියි දැනගනියි. නිදන්නේ හෝ නිදන්නේ වෙමියි දැනගනී යයි දතයුතුය. **යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති** යන මේ වචනය සර්වසංගාහික වචනයකි. මෙසේ කියන ලද වෙයි. යම් ආකාරයකින් හෝ ඔහුගේ කය සිටියේ වේද, ඒ ඒ ආකාරයෙන් එය දැන ගනී. ගමනාකාරයෙන් සිටියේ යන්නේ යයි දැනගනියි. සිටීම-හිඳීම-නිදීම යන ආකාරයන්ගෙන් සිටියේ, සිටින්නේ යයිද හිඳගත්තේ යයි ද) නිදන්නේ යයි ද දැනගනී. **ඉති අජ්ඣත්තං** මෙසේ තමාගේ හෝ සතර ඉරියව් පරිග්‍රහණයෙන් ඉරියාපථ කයෙහි, කායානුපස්සනා භාවනාවෙහි යෙදුනේ වාසය කරයි. **බහිද්ධා වා**, අනුන්ගේ හෝ සතර ඉරියව් පරිග්‍රහණයෙන්, **අජ්ඣත්ත බහිද්ධා වා** කලෙක තමාගේ ද, කලෙක අන්‍යයාගේ ද සතර ඉරියව් පරිග්‍රහණයෙන් කයෙහි කය අනුව බලමින් වාසය කෙරෙයි.

**සමුදය ධම්මානු පස්සී** යන ආදී තන්හි අවිජ්ජාව ඇතිකල්හි රූප

ඇතිවේයයි ආදි ක්‍රමයෙන් පස් ආකාරයකින් රූපස්කන්ධයාගේ ඇතිවීමද, නැතිවීමද, ගෙනහැර දැක්විය යුතුය. එය එසේමැයි. ඒ සඳහා මෙහි සමුදය ධම්මානුපස්සී යන ආදිය කියන ලද්දේය.

අත්‍ථි කායොති වා පනසස යන ආදිය කී නයමැයි, මෙහිදු සතර ඉරියව් පිළිගන්න. සිහිය දුකඛ සත්‍ය වේ. එම සිහිය උපදවන පූර්ව තණ්හාව සමුදය සත්‍ය වේ. එම දෙවැදෑරුම් සිහියේ නොපැවැත්ම නිරෝධ සත්‍ය නම් වේ. දුක දැනගන්නා වූ සමුදය දුරුකරන්නා වූ නිරෝධය අරමුණු කරන්නා වූ ආර්ය මාර්ගය මාර්ග සත්‍ය නම් වේ. මෙසේ චතුසසත්‍ය වශයෙන් උත්සාහකොට නිවනට පැමිණේ යයි මෙම සතර ඉරියාපථ පරිග්ගාහ වූ භික්ෂුවට රහත්බව තෙක් නිවන්දොර වේයයි දතයුතුයැ.

ඉරියාපථ පබ්බය නිමියේය.

## චතුසම්පජඤ්ඤ පබ්බ-වර්ණනාව

මෙසේ ඉරියාපථ වශයෙන් කායානුපස්සනාව විභාගකොට දක්වා දැන් චතු සම්පජඤ්ඤ වශයෙන් විභාග කරන්ට පුනචපරං යනාදිය වදාළහ. **අභිකන්තෙ, පටික්කන්තෙ** යන මෙහි, 'ගමන' අභිකන්ත යයි කියනු ලැබේ. නැවත්ම පටික්කන්ත යයි කියනු ලැබේ. ඒ දෙකම සතර ඉරියාපථවල ලැබේ. පළමුකොට ගමනෙහි ඉදිරියට කය අභිමුඛ කොට එලවන්නේ **අභික්කමති** නම් වේ. පෙරළා නවත්නේ **පටික්කමති** නම් වේ.

සිටීමෙහිද, සිටියේම කය ඉදිරියට නමන්නේ අභික්කමනය කෙරෙයි නම් වේ. පිටිපසට නමන්නේ පටික්කමනය කෙරෙයි. හිඳීමෙහි හුන්නේ ම ආසනයාගේ පූර්ව අවයවයට අභිමුඛව නික්මෙන්නේ අභික්කමනය කරන්නේ නම් වෙයි. පසු අවයවය පෙදෙසට ප්‍රතිමුඛව හැසිරෙන්නේ පටික්කමනය කරන්නේ නම් වේ. හිඳීමෙහි ද මේ ක්‍රමයමැයි.

**සම්පජානකාරී හොති** යනු නුවණින් යුතුව සියලු කටයුතු කරනසුලු වූයේ, නැතහොත් මනා නුවණින් යුතුව ඔහු විසින්ම කරණ සුලු වූයේ වෙයි. ඉදිරියට යාම ආදියෙහිදී හෙතෙම නුවණින් දැන කරන්නේමය. කිසි තැනෙක්හිදු සම්පජඤ්ඤය විරහිත වූයේ නොවෙයි.

**චතුර්විධ සම්පජඤ්ඤය**

එහි සාත්ථක සම්පජඤ්ඤාය, සප්පාය සම්පජඤ්ඤාය, ගොචර සම්පජඤ්ඤාය අසම්මොහ සම්පජඤ්ඤාය යයි සම්පජඤ්ඤාය චතුර්විධ වෙයි. එම චතුර්විධ සම්පජඤ්ඤයන් අතුරෙහි, ඉදිරියට යාමෙහි සිත උපන් කල්හි, චිත්තයාගේ වශයෙන්ම නොගොස් කම මෙහි ගමන හේතුවෙන් මට වැඩක් වේද? නැද්ද? යනුවෙන් අර්ථ, අනර්ථ විමසා අර්ථ පරිග්ගහණය සාත්ථක සම්පජඤ්ඤ නම් වේ. එහි අර්ථ නම්, චෛතිය දැකීම්, බෝධි දැකීම්, සංඝයා දැකීම්, අශුභ දැකීම් ආදී වශයෙන් ධර්ම වශයෙන් වැඩීමයි. යම්හෙයකින් චෛතිය දැකම බුදුරදුන් අරමුණුකොට උපදනා වූ ද සංඝ දර්ශනයෙන් සංඝයා අරමුණුකොට උපදනා වූ ද ප්‍රීතිය උපදවා එම ප්‍රීතියම ක්‍ෂය වශයෙන් මෙනෙහි කරන්නේ රහත් බවට පැමිණේ ද, තෙරුන් දැක ඔවුන්ගේ අවවාදයෙහි පිහිටා ද අශුභයක් දැක එම අශුභ අරමුණෙහි ප්‍රථම ධ්‍යානය උපදවා ද, ඒ ධ්‍යානයම ක්‍ෂය වශයෙන් මෙනෙහි කරන්නේ රහත්බව පැමිණේ ද, එහෙයින් මෙම චෛතිය ආදීන්ගේ දර්ශනය සාර්ථක වෙයි. (වැඩ සහිත වෙයි.) තව ද ආමිෂයාගේ වශයෙන් වැඩීමද අර්ථමැයි. එම ආමිෂය ඇසුරුකොට බ්‍රහ්චර්යාවට අනුග්‍රහ පිණිස පිළිපන් බැවින් යයි කිසිවෙක් (කෙච්) කියති. ඒ ගමනෙහි පහසු අපහසුකම් සලකා පහසුව සියලු ආකාරයෙන් ගැනීම **සප්පාය සම්පජඤ්ඤ** නම් වේ. ඒ කෙසේ ද යත්, චෛතිය දැකීම නිරවශේෂයෙන්ම සාර්ථකයැ. එසේවුවත්, චෛතියට මහත් පූජා කරන කල්හි, දස දොලොස් යොදුනක් අතර, පිරිස ඉඳින් රැස්වන්නී නම් ස්වකීය සම්පත්තියට සුදුසු පරිදි ස්ත්‍රීහු ද පුරුෂයෝ ද අබරණ ලා සැරසුනාහු, චිත්‍ර කර්මයක රූප මෙන් හැසිරෙති. එම පිරිස් අතුරෙහි ද ඒ මහණ හට ඉෂ්ට වූ අරමුණෙහි ලෝභයක් අනිෂ්ට වූ අරමුණෙහි කෝපයත් නොසමව බැලීමෙන් මෝහයත් උපදීනම් කාය සංසර්ග ආපත්තියට පැමිණේ නම්, ජීවිත බ්‍රහ්මචරියාවන්ට හෝ අනතුරු වේනම් මෙබඳුම චෛතියස්ථානය නොසැප වෙයි. කියන ලද ආකාර වූ අනතුරු නොමැති නම්, සැප වෙයි. සංඝ දර්ශනයද අරුත් සහිතය. එසේ වුවත් ඇතුල්ගම මිනිස්සු මහමඩු තනවා තුන්යම් රැය ධර්මශ්‍රවණය කරවන කල්හි, කලින් කී ආකාරයෙන් ම ජනයාගේ රැස්වීම ද අනතුරු නැති කල්හි සැප වෙයි. මහපිරිස් පිරිවැරූ තෙරුන්ගේ දර්ශනයෙහි ද මෙම නයයි. අශුභ දර්ශනය ද අරුත් සහිතය. එම අර්ථය දැක්වීම සඳහා කථා වස්තුවක් ද වේ.

**අශුභ දර්ශන වස්තුව :**

එක් තරුණ වහන්දෑ නමක්, හෙරණ පැවිද්දෙකු ගෙන දැහැටි දඬු

පිණිස ගියේය. සාමණේර නම මගින් ඉවත්ව ඉදිරියට යන්නේ අශුභ නිමිත්ත දැක, පළමුවන ධ්‍යානය උපදවා එම ධ්‍යානයට පාදකකොට සංස්කාර ධර්මයන් මෙනෙහි කරන්නේ තුන්ඵලයන් ප්‍රත්‍යක්‍ෂ කොට මතුමග පිණිස කමටහන් ගෙන සිටියේය.

තරුණ භික්‍ෂුතෙම ඔහු නොදැක සාමණේරයයි හඬ ගෑය. හෙතෙම මා පැවිදි වූ තැන් සිට භික්‍ෂුවක් සමග දෙවරෙක කථාවක් නම් නොකළ විරියැ. එහෙයින් අන්දවසක මතු විශේෂය (රහත්ඵලය) උපදවන්නෙමියි සිතා, කිම වහන්ස, යයි පිළිතුරු දින. නැවත එවයි කියන ලද්දේ, එක් නයින්ම අවුත්, ස්වාමීනි, පළමුකොට මේ මගින් ගොස්, මා සිටි පෙදෙසෙහි මොහොතක් පෙරදිගට අභිමුඛව සිට බැලුව මැනවැයි කීය. ඒ තරුණ භික්‍ෂූන් වහන්සේ එසේ කොට ඒ හෙරණුන්දැ පැමිණි විශේෂයටම පැමිණියහ. මෙසේ එකම අශුභය, දෙදෙනාටම වැඩ පිණිස විය. අනිකෙකුදු ඇත. මෙසේ සාර්ථක වූ මේ අශුභය පුරුෂයා හට මාගම අශුභය නොසැප වෙයි. මාගමටද පුරුෂ අශුභය නොසැප වෙයි. සභාග වූයේම සැප වෙයි. මෙසේ සත්ප්‍රාය පරිග්‍රහණය **සප්පාය සම්පජඤ්ඤ** නම් වේ. නැවත මෙසේ නොඅඩුකොට ගත් සමර්ථ සප්පාය ඇත්තහුගේ අටතිස් කමටහන් අතුරෙන් තමාගේ සිතට රුචි වූ කම්මට්ඨාන නම් වූ ගොචරයක් ඉගෙන භික්‍ෂාචාර ගෝචරයෙහි එම කම්මට්ඨාන ගෝචරයම ගෙනම යාම ගෝචර සම්පජඤ්ඤ නම් වේ.

එම ගෝචර සම්පජඤ්ඤය ප්‍රකට කිරීම පිණිස මේ වස්තුව චතුස්කය දතයුතුයැ.

හරණ පච්චාහරණ චතුක්කය :-

මේ ශාසනයෙහි එක් භික්‍ෂුවක්
කම්මට්ඨානය ගෙන යයි, පෙරලා නොගෙනෙයි.
කෙනෙක් නොගෙන යයි නැවත ගෙන එයි.
කෙනෙක් නොම ගෙනයයි පෙරලාත් නොගෙන එයි.
කෙනෙක් ගෙන යන්නේත් පෙරලා ගෙන එන්නේත් වෙයි.

මෙම මහණුන් සතරදෙනා අතුරෙහි යම් මහණ කෙනෙක් දහවල් සක්මනින් හා හිඳීමෙන් නීවරණ ධර්මයන් කෙරෙන් සිත පිරිසිදුකොට, එපරිද්දෙන් රාත්‍රී පෙරයම සිත පිරිසිදු කොට මැදියම සයනය කොට පසුයමද හිඳීමෙන් හා සක්මනින් කල්යවා උදෑසනම සැමලු බෝමලුවත්

කොට බෝරුකට දිය ඉස, විය යුතු, පරිභෝග කළයුතු පැන් එලවා තබා ආචාර්ය උපාධ්‍යාය වත් ආදි වූ සියලු කඳුවත් සමාදන්ව හැසිරේද, හෙතෙම සිරුර පිරියම්කොට සෙනස්නට පැමිණ දෙතුන් පලගෙක්හි සිරුර උණුසුම්කොට කමටහන්හි යෙදී පිඬුසිඟන වෙලාවෙහි නැගිට කම්මට්ඨානයෙන් යුතුවම පාසිවුරු ගෙන, සෙනසුනෙන් නික්ම කම්මට්ඨානයෙන් යුතුවම පාසිවුරුගෙන, සෙනසුනෙන් නික්ම කම්මට්ඨානය මෙනෙහි කරමින් සැමලුවට ගොස් ඉදින් මෙනෙහි කරන ලද්දේ බුද්ධානුස්සති කම්මට්ඨානය නම් එය නොහැරම සැමලුවට පිවිසෙයි. ඉදින් අන්‍ය කම්මට්ඨානයක් වීනම් හිස මුල සිට අතින් ගත් භාණ්ඩයක් මෙන් එම කම්මට්ඨානය තබා බුද්ධාරම්මණ ප්‍රීතිය උපදවාගෙන සැමලුවට නැගී ඉදින් මහත් වූ සැයක් වීනම් තුන්වරක් පැදකුණුකොට සතර තැනෙක්හි සිට වැන්ද යුතුය. කුඩා සැයක් වීනම් එසේම තුන්වරක් පැදකුණු කොට අටතැනෙක්හි සිට වැන්ද යුතුය. සැය වැඳ බෝමලුවට පැමිණියහු විසින් ද භාග්‍යවත් බුදුන් හමුවෙහි මෙන් පහත් පැවතුම් ඇති ආකාරය දක්වා බෝරදුන් වැන්ද යුත්තේය. මෙසේ චෛත්‍යයද බෝධියද වැඳ, තැන්පත් කළ තැනකට ගොස් තැන්පත් කළ භාණ්ඩයක් අතින් ගන්නෙකු මෙන් බහා තැබූ කම්මට්ඨානය ගෙන ගම සමීපයෙහි කම්මට්ඨානයෙන් යුතුවම සිවුරු පොරවා ගමට පිඬු පිණිස පිවිසෙයි. ඉක්බිති මිනිස්සු එම භික්ෂුව දැක අපගේ ආර්යයන් වහන්සේ වැඩියහයි පෙරගමන් කොට පාත්‍රය ගෙන ආසන ශාලාවෙහි හෝ ගෙහි හෝ වඩා හිඳුවා කැඳ පිළිගන්වා, යම්තාක් බත්කිස නිමවේද, ඒතාක් (සිට) පා සෝදා තෙල් ගල්වා අභිමුඛයෙහි හිඳ ප්‍රශ්න හෝ විචාරණ බණ අසනු කැමැත්තාහු හෝ වෙති. ඉදින් කථා නොකරවත් නම් ජනයාට සංග්‍රහ පිණිස ධර්ම කථාව නම් කළයුත්තීම යයි අට්ඨකථාචාර්යවරයෝ කියති. යම්හෙයකින් කර්මස්ථානයෙන් තොරවූ ධර්ම කථාවක් නම් නැද්ද, එහෙයින් කර්මස්ථාන ශීර්ෂයෙන්ම බණ කියා කර්මස්ථාන ශීර්ෂයෙන්ම ආහාර වළඳ අනුමෝදනාකොට නවතනු ලබන්නා වූ මිනිසුන් විසින් අනුගත වූයේම ගමින් නික්ම එහි එම මිනිසුන් නවතා මගට බසී.

ඉක්බිති කලින්ම නික්ම පිටගම්හි කළ බත්කිස ඇති හෙරණුන් හා තරුණ භික්ෂූන් ඔහු දැක පෙරගමන් කොට, ඔහුගේ පාසිවුරු ගනිත්. පෞරාණික භික්ෂූහු අපගේ උපාධ්‍යායයෝය, ආචාර්යයෝ යයි මුහුණ නොබලා වත් කෙරෙති. පැමිණි පිරිසෙන්ම එය කෙරෙති. ඒ සාමණේර තරුණ භික්ෂූහු ඔහු මෙසේ විචාරත්.

ස්වාමීනි, මේ මිනිස්සු නුඹවහන්සේගේ කිම මව්පසින් සම්බන්ධ ද, පියපසින් සම්බන්ධ ද, කුමක් දැක මෙසේ විචාරවුද, නුඹවහන්සේ කෙරෙහි මේ මිනිසුන්ගේ ආදර බුහුමන් දැක, විචාරමු. ඇවැත්නි, යමක් මව්පිය විසිනුදු දුෂ්කර ද, එය මේ මිනිස්සු අපට කෙරෙති. අපගේ පාසිවුරුද මොවුන් සතුමය. මොවුන්ගේ ආනුභාවයෙන් භය අවස්ථාවෙහි භයක් නොම දකිමු. ක්ෂුධා අවස්ථාවෙහි ක්ෂුධාවක් නොම දනිමු. අපට උපකාරි වූ මෙබඳු මිනිස්සු නම් නැතැයි ඔවුන්ගේ ගුණ කියමින් යයි. මේ මහණ තෙම කම්මට්ඨානය ගෙනයන්නේ පෙරලා නොගෙනේ යයි කියනු ලැබේ.

පළමුකොට කියනලද වත්පිළිවෙත් කරන්නා වූ යමෙකුගේ, කර්මජ තේජෝ ධාතුව දැල්වේ ද, උපාදාන රහිතය හැරදමා උපාදාන සහිතය ගනී ද, සිරුරෙන් සෝදිය ගලත් ද, කම්මට්ඨානය වීථියට නොනගී ද, හෙතෙම උදෑසනම පාසිවුරු ගෙන, වහා චෛතිය වැඳ, ගව සමූහයා නික්මෙන වේලාවෙහිම ගමට කැඳ සිගීම පිණිස පිවිස කැඳත් ලැබ, ආසන ශාලාවට ගෙනගොස් පානය කරයි. දෙතුන් වරක් ගිලි පමණින්ම ඔහුගේ කර්මජ තේජෝධාතුව උපාදින්නකය හැරදමා අනුපාදින්නකය ගනී. දිය කළ සියයකින් නෑ එකකු මෙන් තේජෝ ධාතු පරිදාහය නිවීමට පැමිණ, කම්මට්ඨාන ශීර්ෂයෙන්ම කැඳ වළඳ පය ද, මුව ද සෝදා ඇතුළු බත කමටහන්ම මෙනෙහිකොට සෙසු තැනෙක්හි පිඩුපිණිස හැසිර කම්මට්ඨාන ශීර්ෂයෙන්ම ආහාර වළඳ එතැන් පටන් පිළිවෙලින් වැටහෙන්නා වූ කම්මට්ඨානය ගෙනම එයි. මේ මහණතෙම කම්මට්ඨානය නොගෙන යයි. පෙරලා ගෙන ඒ යයි කියනු ලැබේ. මෙබඳු භික්ෂූහු කැඳ වළඳ විදර්ශනා වඩා රහත් බවට පැමිණියාහු නම් සංඛ්‍යාපථය ඉක්ම සිටියාහුය. සීහල ද්වීපයෙහිම ඒ ඒ ගම්වල ආසන ශාලාවෙහි යම් තැනෙක්හි කැඳ වළඳ රහත් බවට පැමිණි භික්ෂූහු නැද්ද, එබඳු ආසනයක් නැත්තේමය.

යම් මහණ කෙනෙක් ප්‍රමාදව හැසිරෙනසුලු වූයේ වේද, බහාතබන ලද වීර්ය ඇත්තේ, සියලු මත්බිඳ පංචවිධ චිත්ත විනිබද්ධ (=පංච නීවරණ) කෙලෙසුන්ගෙන් බඳනා ලද්දා වූ සිත් ඇතිව, වාසය කරන්නේ, කම්මට්ඨානයක් නම් ඇතැයි කියාත් හැඟීමක් නොකොට ගමට පිඬු පිණිස පිවිස නොසුදුසු වූ ගිහි සංසර්ගයෙන් සංසර්ග වූයේ, පිඬු පිණිස හැසිරද වළඳ ද හිස්වූයේ නික්මේද, මේ මහණතෙම කම්මට්ඨානය නොම ගෙන යන්නේත් පෙරලා නොගෙනෙන්නේත් වේයයි කියනු ලැබේ.

ගත පච්චගතික වත

යම් මහණ කෙනෙක් තෙම කම්මට්ඨානය ගෙන යන්නේත් පෙරලා ගෙන එන්නේත් වේද, එය ගතපච්චාගතික වත වශයෙන් දතයුතුයැ. එහෙයින් තමහට වැඩ කැමති කුලපුත්‍රයෝ, සසුනෙහි පැවිදිව, දසදෙනද, විසිදෙනද, පනස් දෙනද, සියක් දෙනද, එක්ව වසන්නාහු, කතිකාවතක් කොට වාසය කරති. 'ඇවැත්නි, තෙපි ණයෙන් පීඩිතව පැවිදි වූවහු නොවෙති. (රාජභයාදි) භයින් පීඩිතව පැවිදි වූවහු නොවෙති. ජීවත්විය නොහැකිව පැවිදි වූවාහු නොවෙති. එහෙත් දුකින් මිදෙනු කැමැතිව පැවිදි වූවාහු වෙති. එබැවින් ගමනේදී උපන් කෙලෙස් ගමනෙහිදීම - නිග්‍රහ කරව, (උපාදාන වශයෙන් නොගෙන බැහැර කරව) හිඳීමෙහි දී උපන් කෙලෙස් හිඳී මෙහිදීම නිග්‍රහ කරවු, සයනයේදී උපන් කෙලෙස් සයනයෙහිදීම නිග්‍රහ කරවු. ඔවුහු මෙසේ කතිකාවත් කොට පිඬුසිගීමට යන්නාහු අඩ ඉස්බක් ඉස්බක්, අඩ ගව්වක් ගවුවක් අතරත පාෂාණයෝ වෙත්නම් එම පාෂාණ සංඥාවෙන් කම්මට්ඨානය මෙනෙහි කරමින්ම යෙති. ඉදින් කිසිවෙකුට ගමනෙහි දී ක්ලේශයෝ උපදිත් නම් එහිදීම එම ක්ලේසයන්ට නිග්‍රහ කෙරෙයි. එසේ නොහැකි වන්නේ (නැවතී) සිටී. ඒ උපන් කෙලෙස් ඇති භික්‍ෂු තෙම පිටිපසින් සිටි භික්‍ෂුතෙම ඔබට උපන් විතර්කය දනී. ඔබට මෙබඳු විතර්කයක් ඉපදවීම සුදුසු නොවේයයි තමහට චෝදනාකොට විදසුන් වඩා එහිදීම ආර්යභූමියට බසී. එසේ නොහැකි වන්නේ හිඳගනී. එකල්හි ඔහුගේ පිටිපසින් එන තැනැත්තේ ද හිඳගනියි. එය පළමු කී ක්‍රමයමැයි. ආර්ය භූමියට බැසගන්ට අසමර්ථ වූයේද එම කෙලෙස් යටපත්කොට කම්මට්ඨානය මෙනෙහි කරමින්ම යයි. කර්මස්ථානයෙන් වෙන් වූ සිතින් යුක්තව පිය නොනගියි. ඉදින් එසවීනම් පෙරලා නැවතී පළමු සිටි පෙදෙසටම එයි.

ආළින්දකවාසී මහාඵුස්සදෙව ථෙර :-

ආළින්දකවාසී ඵුස්සදෙව තෙරුන් මෙනි. උන්වහන්සේ එකුන්විසි වසක් ගතපච්චාගතික වත පුරමින්ම විසූහ. මිනිස්සු අතරමග සාන්නා වූද වපුරන්නාහුද සස්‍ය මඩනාහුද වෙනත් කර්මාන්ත කරන්නාහුද, එසේ යන්නා වූ තෙරුන් දැක මෙම තෙරහු නැවත නැවත, නැවතී යෙති. කිමෙක්දෝ හෝ මංමුලා වූවාහුද නොහොත් කිසිවක් නැතිවූවාහු දැයි කථා කෙරෙති. උන්වහන්සේ එම කථාව නොසලකා කම්මට්ඨානයෙහි යෙදුන සිතින්ම මහණදම් කරමින් විසිවසක් ඇතුළත රහත්බවට පැමිණි සේක. රහත්බවට පැමිණි දවස්හිම උන්වහන්සේට සක්මන් කෙළවර

අරක්ගත් දේවතා තොමෝ ඇඟිලිවලින් පහන් දල්වා සිටියා. සතරවරම් මහරජහුද, ශක්‍රදේවේන්ද්‍ර තෙමේද, සහම්පති මහාබ්‍රහ්ම තෙමේ ද, උපස්ථානයට පැමිණියාහුය. එම ආලෝකයද වනවාසී මහාතිස්ස නම් තෙරහු දැක දෙවන දවස්හි එම තෙරුන් විචාළහ. රාත්‍රී භාගයෙහි ආයුෂ්මතුන් සමීපයෙහි ආලෝකයක් විය. එම ආලෝකය කිමෙක්ද, තෙරුන් කථාව වෙනස් කරමින් ආලෝකයක් නම් පහන් ආලෝකයක්ද මැණික් ආලෝකයක්ද වේයයි මේ ආදිය කීහ. ඉක්බිති නුඹවහන්සේ වසනු ලැබේ යයි තිබඳ විචාරණ ලද්දාහු එසේයයි ප්‍රතිඥාකොට දැන්වූහ.

### කාළවලලි මණ්ඩපවාසී මහානාග ථෙර

අතිකුදු කථා වස්තුවකි. කාළවල්ලි මණ්ඩපවාසී මහානාග තෙරුන් මෙති. එම තෙරුන් වහන්සේද ගතපච්චාගතික වත පුරන්නේ පළමුකොට බුදුරදුන්ගේ මහාපධානය (මහාවීර්යය)ට පුදන්නෙමියි සත්වසක් සිටීම හා සක්මනම අධිෂ්ටාන කළාහුය. නැවත සොලොස් වසක් ගතපච්චාතික වත පුරා රහත්බවට පැමිණියහ. උන්වහන්සේ කමටහන්හි යෙදුන සිතින්ම පය ඔසවන්නාහු කමටහනින් වෙන් වූ සිතින් නැගුකල්හි පෙරලා නවත්නාහු ගම් සමීපයට ගොස් ගවයෙක් දෝ පැවිද්දෙක් දෝයි සැක කළයුතු පෙදෙස්හි සිට සිවුර පොරවා කිසිල්ලේ එල්ලාගෙන තිබුණ කෙණ්ඩියෙන් පැන් ගෙන පාත්‍රය සෝදා ජලයෙන් මුඛය පුරවාගැනීම කෙරෙයි. කුමටද යත්, මට භික්ෂාව දෙන්ට හෝ වඳින්ට පැමිණි මිනිසුන්ට දිගාසිරි ලැබේවායි වචන මාත්‍රයකිනුදු කමටහනට වෙනසක් නොවේවා කියාය. ස්වාමීනි, අද කිනම් තිථිය දැයි දවස හෝ භික්ෂූන්ගේ සංඛ්‍යාව හෝ ප්‍රශ්නයක් හෝ විචාරණ ලද්දේ ජලය ගිල කියයි. ඉදින් දවස් ආදිය විචාරන්නාහු නොවෙත් නම් ගමින් නික්මෙන වේලාවෙහි ගම්දොර කාරා දමා යෙයි.

### ගලම්බතිත්ථ වෙහෙර පනසක් භික්ෂූහු

ගලබබ තිත්ථ විහාරයෙහි වස් එළඹි පනසක් භික්ෂූහු මෙති. ඒ භික්ෂූහු වනාහි ඇසල පොහෝ දවස්හි කතිකාවක් කළාහුය. රහත් බවට නොපැමිණ ඔවුනොවුන් කථා නොකරමු යයි ගමට පිඬු පිණිස යන්නේ (උදක ගණ්ඩූසං කත්වා) මුඛයෙහි වතුර පුරවාගෙන, පිවිසුනාහුය. දවස ආදිය විචාල කල්හි කලින් කී අයුරින්ම පිළිපැද්දාහුය. එගම්හි මිනිස්සු කාරා දැමීම දැක, අද එක් නමක් ආ සේක, අද දෙදෙනෙකුයි දැනගත්තාහුය. නැවත මෙසේ සිතුහ. කිමෙක් ද මේ භික්ෂූහු අප සමගම කථා නොකෙරෙත්ද? නැතහොත් ඔවුනොවුනුත් කථා නොකෙරෙත්දැයි,

ඉදින් ඔවුනොවුන් කථා නොකරෙත් නම් ඒකාන්තයෙන් හටගත් විවාද ඇත්තෝ වන්නාහුය. එවු ඒ භික්ෂූන් ඔවුනොවුන් කථාකරවන්නෙමු යයි සියල්ලෝ විහාරයට ගොස් පනසක් පමණ භික්ෂූන් අතුරෙන් භික්ෂූන් දෙදෙනෙක් එක්තැනක නොදුටුවහ. නැවත ඒ මිනිසුන් අතුරෙහි යම් නුවණැති පුරුෂයෙක් වී ද, හෙතෙම මෙසේ කීය. පින්වත්නි, කලහකරුවන් වසන ස්ථානයක් මෙබඳු නොවෙයි. සැමලූ බෝමලු මනාව හමදනා ලද්දාහුය. මුසුන් මනාව තබන ලදහ. පැන් පරිභෝග ජලය එළවා තබන ලදැයි ඔවුහු එයින්ම නැවතුනහ. ඒ භික්ෂූහු ඇතුළ තුන්වස්හිම රහත් බවට පැමිණ, මහාපවාරණයෙන් විසුද්ධ පවාරණය පැවරූහ.

මෙසේ කාළවල්ලි මණ්ඩපවාසී මහානාග තෙරුන් මෙන් ද, ගලම්බතිත්ථ විහාරයෙහි වස් එළඹි භික්ෂූන් මෙන් ද, කමටහන්හි යෙදුන සිතින්ම පියනගමින් ගම සමීපයට පැමිණ උදක ගණ්ඩූශය, පහකොට වීථි සලකා, යම් වීථියෙක සොරාසොඬුන් හා ධූර්තාදීහු හෝ කලහකරුවෝ හෝ නපුරු ඇත් අස් ආදීහු හෝ නැත්නම් එම වීථියට වැද එහිද පිඬු පිණිස හැසිරෙන්නේ ඉතා සීඝ්‍ර වූවෙක් මෙන් වේගයෙන් නොයේද, යම් හෙයකින් ජවන පිණ්ඩපාත ආදී ධූතාංග කිසිවක් නැත් ද එහෙයින් විෂම භූමි භාගයකට පැමිණ දිය පිරුණු ගඟුලක් මෙන් නිශ්චලව යේද? ගෙපිළිවෙලින් පිවිසියේද දෙනු කැමති බව හෝ නොදෙනු කැමති බව හෝ එයට සුදුසු කාලයක් ඉක්මවමින් භික්ෂාව ගෙන ඇතුල්ගම හෝ බිහිගම හෝ විහාරයටම හෝ අවුත් යම් යම් පහසු වූ, සුදුසු වූ අවකාශ ඇති තැනක හිඳ කමටහන් මෙනෙහි කරමින් ආහාරයෙහි පටික්කුල සඤ්ඤාව එලවා, අක්ඛබ්භඤ්ජන වණලෙපන පුත්තමංස යන මේ උපමාවන්ගේ වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරමින් අටඟකින් යුත් ආහාරය වළඳයි. එනම්, ක්‍රීඩා පිණිස නොවේ. මද වැඩීම පිණිස නොවේ. සැරසීම පිණිස නොවේ. අඩුතැන් පිරීම පිණිස නොවේ. වළඳ අවසනි වූයේ ද, දියකිස කොට මොහොතක් බත් විඩාව සංසිඳුවා පෙරබත යම්සේ නම් එසේ පසුබතද පෙරයම යම් සේනම් එපරිද්දෙන් පසුයමද, කමටහන මෙනෙහි කෙරේද, මේ මහණ තෙම කමටහන ගෙන යන්නේත් පෙරලා ගෙන එන්නේත් වේ යයි කියනු ලැබේ.

මෙම හරණ පච්චාහරණ නම් වූ ගත පච්චාගතික වත පුරණ තැනැත්තේ වනාහි උපනිශ්‍රය සම්පත්තියෙන් යුක්ත වූයේ වීනම් පළමු වයසෙහි රහත්බවට පැමිණෙයි. ඉදින් පළමු වයසෙහි රහත් බවට

නොපැමිණේ නම් මධ්‍යම වයසෙහිදී පැමිණෙයි. ඉදින් මධ්‍යම වයසේද නොපැමිණේ නම් පසුව මරණ සමයෙහි පැමිණෙයි. ඉදින් මරණ සමයෙහි රහත්බවට නොපැමිණේනම් ඊට පසුව දිව්‍යපුත්‍රයෙක්ව රහත් බවට පැමිණෙයි. ඉදින් දිව්‍යපුත්‍රයෙක් වී රහත්බවට නොපැමිණේ නම් බුදුකෙනෙක් නූපන් කල්හි මිනිස්ලොව උපන්නේ පසේබුදුබව ලබයි. ඉදින් පසේබුදුබවක් නොලබන්නේ නම්, අනතුරුව බුදුකෙනෙකුන් හමුවේද, දාරුචීරිය නම් බාහිය තෙරුන් මෙන් ඛිප්පාභිඤ්ඤා හෝ වෙයි. සැරියුත් තෙරුන් මෙන් මහාප්‍රාඥ හෝ වෙයි. මහමුගලන් තෙරුන් මෙන් මහා ඍද්ධි ඇත්තේ හෝ වෙයි. මහකසුප් තෙරුන් මෙන් ධූතවාදී හෝ වෙයි. අනුරුද්ධ තෙරුන් මෙන දිවැස් ඇත්තේ හෝ වෙයි. උපාලි තෙරුන් මෙන් විනයධර හෝ වෙයි. මන්තානි පුත්ත තෙරුන් මෙන්, ධම්ම කථික හෝ වෙයි. රේවත තෙරුන් මෙන් ආරණ්‍යක හෝ වෙයි. අනඳ තෙරුන් මෙන් බහුශ්‍රැත හෝ වෙයි. බුද්ධපුත්‍ර රහල් තෙරුන් මෙන් ශික්ෂාකාමී හෝ වෙයි. මෙසේ මෙම චතුස්ක අතුරෙන් යම් මේ මහණ කෙනෙක් කමටහන ගෙනයන්නේත් පෙරලා ගෙන එන්නේත් වේද ඔහුට ගෝචර සම්පජඤ්ඤ ශිඛාප්‍රාප්ත වූයේ වෙයි.

ඉදිරියට යාම ආදි තත්හි මුළානොවීම අසම්මොහ, සම්පජඤ්ඤ නම් වේ. එම අසම්මොහ සම්පජඤ්ඤය මෙසේ දතයුතුයැ. මේ ශාසනයෙහි මහණතෙම ඉදිරියට යන්නේ හෝ පෙරලා එන්නේ හෝ බාල පුහුදුන් තෙම, ඉදිරියට යාම් ආදියෙහි ආත්මය ඉදිරියට යයි. ආත්මය විසින් ඉදිරියට යාම නිපදවන ලදැයි කියා හෝ මම ඉදිරියට යමි. මවිසින් ඉදිරියට යාම නිපදවන ලදී කියා හෝ වෙසෙසින් මුළා වේද, එපරිද්දෙන් මුළා නොවන්නේ නම්, ඉදිරියට යමියි සිතක් උපන් කල්හි එම සිත සමගම (ගමන ආකාරය දක්වන) චිත්ත සමුට්ඨාන වායෝධාතුව, කාය විඥප්තිය උපදවමින් පහළවෙයි. මෙසේ චිත්ත-කිරිය-වායෝ ධාතුහුගේ පැතිරීම වශයෙන් මේ කාය නම් වූ ඇටසැකිල්ල අභිමුඛයට යයි. මෙසේ ඉදිරියට යන්නා වූ එම ඇටගොඩේ එක එක පියවරක් නැගීමේ දී පඨවි-ආපො යන ධාතු දෙදෙන මදවූවාහු දුබල වෙති. ඉතිරි ධාතු දෙදෙන අධික වූවාහු බලවත් වෙති. අතිහරණ, වීතිහරණ යන දෙතැන්හිද මෙබඳුමැයි. (අතිහරණ=පය ඉදිරියට ගෙනයාම. වීතිහරණ= ඔබ නොබ පය හැසිරවීම) වොසසජ්ජනයෙහි (පය පහත් කිරීම) තේජෝ වායෝ ධාතු මද වූවාහු දුබල වෙති. ඉතිරි ධාතුහු දෙදෙන බලවත් වූවාහු බලවත් වෙති. සන්නික්ඛෙපන සන්නිරුම්භණ දෙතන්හිද මෙසේ මැයි.

(සනනිකෙඛපන = පය පොලොවෙහි තැබීම) (සනනිරුමහණ = පොළොව හා පාදයාගේ ගැටීම) එහිද පා එසවීමෙහි පැවැති රූපාරූප ධර්මයෝ අතිහරණයට නොපැමිණෙත්. එසේම අතිහරණයෙහි පැවැති රූපාරූප ධර්මයෝ ව්තිහරණයට ද ව්තිහරණයෙහි පැවති (නාමරූප) වොසසජ්ජනයට ද වොසසජ්ජනයෙහි පැවැත්තහු සනනික්‍ෂෙපනයට ද සනනික්‍ෂෙපනයෙහි පැවැත්තහු සනනිරුමහනයටද නොපැමිණෙති. ඒ ඒ (පය නැගීම් ආදි) කාලයෙහිම පුරුක්, පුරුක් සන්ධි සන්ධි කොටස් කොටස් වී රත්වූ කබලෙක දැමූ තල මෙන් තට තට යයි ශබ්ද කෙරෙමින් බිඳීයෙත්. එහි කිනම් එතෙක් ඉදිරියට යේ ද, නැතහොත් කිනම් එකෙකුගේ ඉදිරියට යාමක්ද පරමාර්ථ වශයෙන් වනාහි ඒ ඒ කොටසෙහිම රූපය රූපය සමග ධාතුහුගේ ගමන ධාතුන්ගේ සිටීම, ධාතුන්ගේ හිඳීම ධාතුන්ගේ නිදීම වෙයි.

අඤ්ඤං උපපජ්ජතෙ චිතතං - අඤ්ඤං චිතතං නිරුජ්ඣති
අවිච් මනුසමබනෙධා, නදී සොතොව වතතතී යනුයි.

(අන්‍ය වූ සිතක් උපදී. අන්‍ය වූ සිතක් නැසෙයි. නිතර ගඟ දිය පහරක් මෙන් (රූපාරූප ධර්ම සමූහය) එක්ව බැඳුනේ පවතී.)

### අභික්කනෙත පටික්කනෙත සමපජානකාරි හොති යන පදයාගේ අර්ථය නිමි.

ආලොකිතෙ විලොකිතෙ යන මෙහි ආලොකිත නම් ඉදිරිය බැලීමය. විලොකිත නම් අනුදික් බැලීමය. අන්‍ය වූ ද, යට, උඩ, පිටිපස බැලීම් වශයෙන්, ඔලොකිත, උලෙලාකිත, පලොකිත නම් වූවාහු වෙති. ඒ ශබ්දයෝ මෙහි නොගන්නා ලදහ. එහෙත් සමාන රූප ස්වභාවය වශයෙන් (ආලොකිත, විලොකිත යන) මේ දෙකම ගන්නා ලදහ. නැතහොත් මේ වාරයෙන් ඒ සියල්ලම ගන්නා ලද්දාහු වෙති. මෙහි ඉදිරිය බලන්නෙමි සිතක් උපන් කල්හි චිත්තයාගේ වශයෙන්ම නොබලා අර්ථ විමසා ගැනීම සාත්ථක සමපජඤ්ඤ නම් වේ. මෙය ආයුෂ්මත් නන්‍දතෙරුන් කාය සාක්ෂි කොට දතයුතු. මෙය වදාරණ ලදමැයි. සචෙ භික්ඛවෙ නන්‍දසස පුරත්ථිමා දියා ආලොකෙතබ්බා හොති, සබ්බචෙතසො සමනනාහරිත්වා නන්‍දො පුරත්ථිමං දිසං ආලොකෙති එවං මෙ පුරත්ථිමං දිසං ආලොකයතො න අභිජ්ඣා දොමනසසා පාපකා අකුසලා ධම්මා

අන්වාසසවෙයුන්ති. ඉති වා තත්‍ථ සම්පජානො හොති සචෙ භික්ඛවෙ තථාගතස්ස පච්ඡිමා දිසා -පෙ- උත්තරා දිසා -පෙ- දක්ඛිණා දිසා උද්ධං අධො අනුදිසා ආලොකෙතබ්බා හොති, සබ්බ චෙතසො සමන්නා හරිත්වා තථාගතො අනුදිසං ආලොකෙති එවං මෙ අනුදිසං ආලොකයතො -පෙ- සම්පජානො හොති.

(මහණෙනි, ඉදින් තථාගත විසින් පෙරදිග බැලිය යුතුනම් සියලු සිතින් ආවර්ජනා කොට තථාගතෙම පෙරදිග බලයි. මෙසේ පෙරදිග බලන්නා වූ මගේ සිත අභිජ්ඣා-දොමනස්ස නම් වූ ලාමක අකුශල ධර්මයෝ අනුව නොඑන්නාහු යයි කියායි. මෙසේ හෝ එම පෙරදිග බැලීම නුවණින් දැන කරන්නේ වෙයි. මහණෙනි, තථාගත විසින් පැදුම්දිග -පෙ- උතුරුදිග - දකුණුදිග - උඩ - යට - අනුදිග බැලිය යුතුනම් සියලු සිතින් ආවර්ජනා කොට තථාගතෙම අනුදිග බලයි. මෙසේ අනුදිග බලන්නා වූ මගේ සිත -පෙ- නුවණින් දැන කරන්නේ වේයයි. තව ද මෙහිදු පෙර කියන ලද චෛත්‍ය දර්ශනයන්ගේ වශයෙන් සාත්‍ථක සප්පාය බව දතයුතුයැ.

කමටහනේ අත්නොහැරීමම ගෝචර සම්පජඤ්ඤ නම්. එහෙයින් ඛන්ධ-ධාතු-ආයතන කම්මට්ඨානිකයන් විසින් කම්මට්ඨානයෙන් යුතුවම ආලෝකන විලෝකනය කළයුතුය. ඉදිරිය බලන්නා වූ හෝ අනුදිග බලන්නා වූ අභ්‍යන්තරයෙහි ආත්මයක් නැත. එහෙත් ඉදිරි බලන්නෙමි සිතක් උපන් කල්හි ඒ සිත සමගම චිත්ත සමුට්ඨාන වායෝ ධාතුව කාය විඥප්තිය උපදවමින් පහල වෙයි. මෙසේ චිත්ත කිරිය වායෝ ධාතුහුගේ පැතිරීම් වශයෙන්ම යටි ඇසිපිය පහතට බසී. උඩු ඇසිපිය උඩට නැගෙයි. යන්ත්‍රයකින් විවෘත කරන්නා වූ කිසිවෙක් නම් නැති. අනතුරුව චක්ඛු විඤ්ඤාණය දස්සන කෘත්‍ය කරමින් උපදී යයි මෙපරිද්දෙන් මනාකොට දැනගැනීම වනාහි මෙහි අසම්මොහ සම්පජඤ්ඤ නම් වේ. තව ද මූලපරිඤ්ඤා ආගන්තුක-තාවකාලික භාවයන්ගේ වශයෙන් ද මෙහි අසම්මොහ සම්පජඤ්ඤය දතයුතුයැ.

පළමුකොට මූල පරිඤ්ඤා වශයෙන්,

**භවංගා වජ්ජනඤ්චෙව දස්සනං සම්පටිච්ඡනං**
**සන්තීරණං වොත්‍ථපනං ජවනං භවති සත්තමං**

(භවංග චිත්තය හා ආවජ්ජන චිත්තයද දස්සන චිත්තයද සම්පටිච්ඡන චිත්තය ද, සන්තීරණ චිත්තයද වොත්‍ථපන චිත්තය ද සත්වන ජවනයද පිළිවෙලින් වෙයි.)

මෙහි දැක්වූ චිත්ත වීථියෙහි උත්පත්ති භවයට අංග කෘත්‍යය සිදුකරමින් භවාංගය පවතී. එය සිඳ කිරියා මනෝධාතුව ආවජ්ජනා කෘත්‍යය සිදුකරමින් පවතී. එම ක්‍රියා මනෝධාතුව නිරුද්ධ වීමෙන්, චක්ඛු විඤ්ඤාණය දසසන කෘත්‍ය සිද්ධ කරමින් පවතී. ඒ චක්ඛු විඤ්ඤාණයාගේ නිරුද්ධ වීමෙන් විපාක මනෝධාතුව සම්පටිච්ඡන කෘත්‍ය කරමින් පවතී. ඒ විපාක මනෝධාතුවගේ නිරුද්ධ වීමෙන් විපාක මනෝ විඤ්ඤාණ ධාතුව, සන්තීරණ කෘත්‍ය සිදුකරමින් පවතී. විපාක මනෝ විඤ්ඤාණ ධාතුහුගේ නිරුද්ධ වීමෙන් ක්‍රියා මනො විඤ්ඤාණ ධාතුව වොට්ඨපන කෘත්‍යය සිදුකරමින් පවතී. ඒ ක්‍රියා මනෝ විඤ්ඤාණ ධාතුහුගේ නිරුද්ධ වීමෙන් සත්වරක් (එකුන්තිස් කාමාවචර ජවනයන් අතුරෙන්) ජවනයක් ඇතිවෙයි.

ඒ භවාංග ජවනාදීන් අතුරෙන් එක් චිත්තයෙක්හි ද මෝ ස්ත්‍රිය, මේ පුරුෂ යයි ඇලීම දූෂ්‍ය වීම මුලාවීම් වශයෙන් ආලෝකන විලෝකනයක් නොවෙයි. දෙවන ජවනයෙහිද -පෙ- සත්වන ජවනයෙහි ද (රාගාදි වශයෙන් ආලෝකනය විලෝකනය නොවෙයි) මේ දෙවන ආදී ජවනයන්හි යුද පිටියෙහි යෝධයන් උඩ යට වශයෙන් බිඳී වැටුන කල්හි මෙන් මෝ ස්ත්‍රියය. මේ පුරුෂයා යයි රාගාදි වශයෙන් ආලෝකනය විලෝකනය වෙයි. මෙ පළමුකොට මූල පරිඤ්ඤා වශයෙන් අසමෙමාහ සම්පජඤ්ඤය දතයුතුයි.

යලිදු චක්ඛුද්වාරයෙහි රූපයක් හමුවට පැමිණි කල්හි භවාංග චලනයෙන් මත්තෙහි ස්වකීය කෘත්‍යය නිපදවීම් වශයෙන් ආවජ්ජන ආදීන් ගෙයක් වැනි චක්ඛු ද්වාරයෙහි ආගන්තුක පුරුෂයෙක් වැනි වෙයි. අනිකෙකුගේ ගෙයින් කිසිවක් ඉල්ලා ගැනීමට පැමිණි ඒ ආගන්තුක පුරුෂයා විසින් ගෙහිමියන් ද නොබැන හුන් කල්හි අණ කිරීම යම්සේ අයුතු වේද, එපරිද්දෙන් ආවර්ජනාදීන්ට ගෙයක් වැනි වූ චක්ඛු ද්වාරයෙහි ආවර්ජනා ආදී චිත්තයනුදු නොඇලෙන කල්හි ද, දූෂ්‍ය නොවන කල්හිද මුලා නොවන කල්හිද ඇලීම දූෂ්‍ය වීම මුලාවීම අයුතු යයි මෙසේ ආගන්තුක භාව වශයෙන් අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුයැ.

ගෙයක් වැනි වූ චක්ඛුද්වාරයෙහි ආවර්ජනා ආදි චිත්තයනුදු නොඇලෙන කල්හිද දූෂ්‍ය නොවන කල්හිද මුලා නොවන කල්හිද ඇලීම දූෂ්‍යවීම මුලාවීම අයුතුයයි මෙසේ ආගන්තුක භාව වශයෙන් අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුයැ.

යලිදු ඛන්ධ, ආයතන, ධාතු, පච්චය, යන මොවුන් ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් මේ අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුයැ. මෙහි ඇස හා රූපය ද රූපස්කන්ධයයි, දර්ශනීය, විඥාන ස්කන්ධයයි, සංඥාව සංඥා ස්කන්ධයයි, ඵස්ස ආදීහු සංස්කාරස්කන්ධයයි. මෙසේ මේ පඤ්ච ස්කන්ධයන්ගේ එකතුවෙහි ආලෝකන විලෝකනය පෙනෙයි. එහි කවරෙක් ආලෝකනය කෙරේද, කවරෙක් විලෝකනය කෙරේ ද,

එසේම ඇස චක්ඛු ආයතනයැ රූපය රූපායතනය. දර්ශනය මනායතනය, වේදනාදීහු ද සම්පයුත්ත ධර්මයෝද ධර්මායතනයැ. මෙසේ මෙම සතර ආයතනයන්ගේ එක්වීම ඇතිකල්හි ආලෝකන විලෝකනය පෙනෙයි. එහි කවරෙක් ආලෝකනය කෙරේද? කවරෙක් විලෝකනය කෙරේද?

එසේම චක්ඛු, චක්ඛු ධාතුයැ. රූප, රූපධාතුයැ. දස්සන, චක්ඛු විඤ්ඤාණ ධාතුයැ. එම චක්ඛු විඤ්ඤාණය හා එක්ව යෙදුනා වූ වේදනා ආදි ධර්මයෝ ධම්ම ධාතුයැ. මෙසේ මේ සතර ධාතුන්ගේ සමවාය ඇති කල්හි ආලෝකන විලෝකනය පැනෙයි. එහි කවරෙක් ආලෝකනය කෙරේ ද කවරෙක් විලෝකනය කෙරේද?

එපරිද්දෙන් චක්ඛු නිස්සය පච්චය වෙයි. රූපය ආරම්මණ පච්චය වෙයි. ආවජ්ජනය අනන්තර සමනන්තර උපනිස්සය, නත්‍ථි-විගත-පච්චයෝ වෙති. ආලෝකය උපනිස්සය පච්චය වෙයි. වේදනාදීහු සහජාත පච්චයෝ වෙති. ඒ මෙ පච්චයයන්ගේ සමවාය ආලෝකන විලෝකනය දැනගනී. එහි කවරෙක් ආලෝකනය කෙරේ ද, කවරෙක් විලෝකනය කෙරේද? මෙසේ මෙහි ඛන්ධ-ආයතන-ධාතු-පච්චය ප්‍රත්‍යවේක්ෂා වශයෙන් අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුයැ.

**සම්මිඤ්ජිතෙ** පසාරිතෙ පබ්බයන්ගේ (සන්ධිවල) හැකිලීමෙහි සහ දිගු කිරීමෙහි එහි චිත්ත වශයෙන්ම හැකිලීම හා දිගුකිරීම නොකොට හස්ත පාදයන්ගේ හැකිලීම දිගුකිරීම හේතුවෙන් වන අර්ථානර්ථ සලකා අර්ථය ගැනීම සාත්‍ථක **සම්පජඤ්ඤ** නම් වේ. එහි හත්‍ථ පාදයන් බොහෝ වේලාවක් හකුළුවාම හෝ දිගුකොටම හෝ සිටියහුට මොහොතින් මොහොත වේදනා උපදිත්. සිත එකඟ බවක් නොලබයි. කමටහන පහව යයි. (ධ්‍යාන ආදි) විශේෂයක් නොලබයි. කලෙක හස්ත පාදයන්

හකුලුවන්නහුට කලෙක දිගුකරන්නහුට වූ කලී එම වේදනා ඇති නොවේ. සිත එකඟ වෙයි. කමටහන වැඩීමට යෙයි. විශේෂයකට පැමිණේ යයි මෙසේ අර්ථානර්ථ ගැනීම දතයුතුයැ. අර්ථයක් ඇති කල්හිදු සැප නොසැප බව සලකා සප්පාය පරිග්‍රහණං සප්පාය සම්පජඤ්ඤ නම් වේ. එහි මේ ක්‍රමයයි.

මහසෑ මළුවෙහි තරුණ භික්ෂූහු ධර්මය හදාරති. ඔවුන්ගේ පිටිපස හුන් තරුණ භික්ෂුණීහු ධර්මය අසති. ඔවුන් අතර එක් තරුණ භික්ෂුවක් අත දිගුකරන්නේ මෛහුණක හා කාය සංසර්ගයට පැමිණ ඒ කරුණින් හෙතෙම ගිහි විය. අනෙක් භික්ෂුවක් පය දිගු කරන්නේ ගින්නට දිගු කළේය. ඇටය දක්වා පය දැවුනේය. අනෙක් කෙනෙක් තුඹසකට පය දිගු කළේය. හෙතෙම සර්පයෙකු විසින් දෂ්ට කරනු ලැබුවේය. අනිකෙක් සිවුරු කුටියේ දණ්ඩකට පහළේය. ඔහු මිණි නම් වූ නයෙකු විසින් දෂ්ට කරනු ලැබුවේය. එහෙයින් මෙබඳු වූ අසප්පාය ස්ථානයෙහි දිගු නොකොට සප්පාය ස්ථානයෙහි දිගු කළයුතුයැ. මේ මෙහි සප්පාය සම්පජඤ්ඤ යයි.

### මහතෙර වස්තුව

ගෝචර සම්පජඤ්ඤය වූකලී මහතෙරුන්ගේ කථා වස්තුවෙන් දතයුතුය. මහතෙරුන් වහන්සේ වනාහි දිවා ස්ථානයේ හුන්නාහු අතවැසියන් සමග කථා කරමින් වහා අතහකුළුවා නැවත තිබූ තන්හි තබා සෙමින් හැකිලූහ. අතවැසියෝ උන්වහන්සේ විචාළහ. ස්වාමීනි, කුමක් හෙයින් වහා අත හකුලුවා නැවත තුබූ තන්හි තබා සෙමින් හැකිලූහුදැයි, ඇවැත්නි, මම යම්දිනක පටන් කමටහන් මෙනෙහි කරන්ට ආරම්භ කළෙම්ද, එතැන් පටන් මා විසින් කමටහන මුදා අත නොහැකිලූ විරූය. දැන් වූ කලී තොප සමග කථා කරන මවිසින් කමටහන මුදා හකුලුවන ලද හෙයින් නැවත තිබූ තන්හි තබා හැකිලීමි. මැනව ස්වාමීනි, භික්ෂුවක් විසින් නම් මෙබන්දකු විය යුතු යයි පැසසූහ. මෙසේ මෙහිද කමටහන නොහැරීම ගෝචර සම්පජඤ්ඤ යයි දතයුතුයැ.

අභ්‍යන්තරයෙහි හකුලුවන්නාහු හෝ දිගු කරන්නාහු හෝ කිසිදු ආත්මයක් නම් නැත. එසේ වුවත් කියන ලද ආකාරයෙන් චිත්තක්‍රියා වායෝ ධාතුහුගේ පැතිරීමෙන් නූල ඇදීමෙන් දාරු යන්ත්‍රයාගේ අත් පා නැලවීමක් මෙන් හැකිලීම හා දිගුකිරීම වේයයි දැනගැනීම මෙහි අසම්මෝහ සම්පජඤ්ඤ යයි දතයුතුයැ.

සංඝාටිපත්ත චීවරධාරණෙ යන මෙහි සඟල සිවුරු හැඳීම් පෙරවීම් වශයෙන් ද, පාත්‍රය ආහාර පිළිගැනීම ආදි වශයෙන් පරිභෝග කිරීම ධාරණ නම් වේ. පිළිවෙළින් ඒ සඟල සිවුර දැරීමෙහි, හැඳගෙන ද පොරවාගෙන හැසිරෙන්නහුගේ ආමිෂ ලාභයද, සීතසස පටිඝාතාය යනාදි ක්‍රමයෙන් බුදුරදුන් විසින් වදාළා වූම අර්ථය අර්ථ නම් වේ. ඒ අර්ථයාගේ වශයෙන් සාත්‍ථක සම්පජඤ්ඤය දතයුතුය.

උණුසුම කැමතිවන දුබලයාට සියුම් සිවුරු සප්පාය (යෝග්‍ය) වෙයි. සීතට භය වූවහුට ඝන වූ දෙපට සිවුර යෝග්‍ය වෙයි. විපරීත වූයේ නොසුදුසු වෙයි.

යම් කිසිවෙකුට දිරූ සිවුර යෝග්‍ය නොවූයේම වේද, අණ්ඩ ආදිය දැමීමෙහි ඔහුට ඒ සිවුර පලිබෝධ ඇතිකරන්නක් වේ. පට දුහුල් ආදී ප්‍රභේද ඇති ලෝභ කටයුතු සිවුර එසේම පලිබෝධ ඇතිකරවයි. ඒ එසේමැයි. එබඳු සිවුර වනයෙහි එකලාව වසන්නහුට පෙරවීම අනතුරු සහිතය. ජීවිතයට අනතුරු ඇති කරන්නක්ද වේ නිෂ්පර්යාය වශයෙන් වනාහි යම් සිවුරක් නිමිත්ත කර්ම ආදී මිථ්‍යාජීව වශයෙන් උපදනේද යම් සිවුරක් පරිහරණය කරන ඔහුට අකුශල ධර්මයෝ වැඩෙත් ද කුශල ධර්මයෝ පිරිහෙත් ද එබඳු සිවුර යෝග්‍ය නොවේ. විපරීත වූයේ යෝග්‍ය වෙයි. ඒ චීවරයාගේ වශයෙන් මෙහි සප්පාය සම්පජඤ්ඤය ද, කමටහන නොහැරීම් වශයෙන් ගෝචර සම්පජඤ්ඤයද දතයුතුය. අභ්‍යන්තර වශයෙන් සිවුර පොරවන්නා වූ කිසි ආත්මයෙක් නම් නැත. පළමු කී පරිද්දෙන්, චිත්ත-කිරිය-වායො ධාතුහුගේ පැතිරීම් වශයෙන්ම සිවුර පෙරවීම වෙයි. එහි චීවරයත් අචේතනිකය, කයත් අචේතනය, මවිසින් කය පොරවන ලදැයි සිවුර නොදනී. කයත් මම සිවුර විසින් පොරවන ලදැයි නොදනී. ධාතුහුම ධාතු සමූහයකින්, වසති. පට කඩකින් පෙතලි රුවක් වැසීම මෙනි.

එබැවින් මනා සිවුරක් ලැබ සොම්නසක් නොම කටයුතුයි. සොඳුරු නොවූ සිවුරක් ලබා දොම්නස් නොකටයුතු නා-තුඹස්-චෛත්‍ය-වෘක්ෂ ආදියෙහි කිසිවෙක් මල්-සුවඳ වස්ත්‍ර ආදියෙන් සත්කාර කෙරෙත් ද, කිසිවෙක් මල මූත්‍ර දඬු අවි පහර ආදියෙන් අසත්කාර කෙරෙත්ද, එයින් තුඹස්, වෘක්ෂ ආදීහු සොම්නසක් හෝ දොම්නසක් හෝ නොකරත් ද, එපරිද්දෙන් මනා සිවුරක් ලැබ සොම්නසක් නොකළ යුතුය. නොමනා

සිවුරක් ලැබ දොම්නසක් නොකළ යුතුය. මෙසේ පැවැති ප්‍රත්‍යවේක්ෂා වශයෙන් මෙහි අසම්මොහ සම්පජඤ්ඤය දතයුතුයැ.

පාත්‍ර පරිභෝගයෙහි ද පාත්‍රය වහාම නොගෙන මේ පාත්‍රය ගෙන පිඬු පිණිස හැසිරෙමින් භික්ෂාව ලබන්නෙමියි මෙසේ පාත්‍රය ගැනීම ප්‍රත්‍යයෙන් ලැබිය යුතු ප්‍රයෝජනයාගේ වශයෙන් සාත්ථක සම්පජඤ්ඤය දතයුතුය. කෘශ වූ ශරීර ඇත්තහුට බර පාත්‍රය සුදුසු නොවෙයි. යම් කිසිවෙකුට සතර පස් ගැටයකින් පහල පාත්‍රයක් වේද, එය සේදිය නොහැකිද, අයෝග්‍ය වූයේ වෙයි. මනාව නොසේදූ පාත්‍රය නොවටී. එම පාත්‍රය සෝදන්නා වූ ඕහට පලිබෝධ වෙයි. මණි වර්ණ පාත්‍රය ලෝභ කටයුතු වූයේ වෙයි. චීවරයෙහි කී නියායෙන්ම අයෝග්‍ය වේ. නැවත, නිමිත්ත කර්මාදි වශයෙන් ලත් පාත්‍රයක් වේද, යමක් සෙවුනාහට අකුශල ධර්මයෝ හාත්පසින් වැඩෙත් ද, කුසල ධර්මයෝ පිරිහෙත් ද, මේ පාත්‍රය විශේෂයෙන් අයෝග්‍ය වූයේම වෙයි. විපරීත වූයේ යෝග්‍ය වෙයි. එම පාත්‍රයාගේ වශයෙන් මෙහි සප්පාය සම්පජඤ්ඤය කමටහන නොහැරීම් වශයෙන් ගෝචර සම්පජඤ්ඤය දතයුතු.

අභ්‍යන්තරයෙහි පාත්‍රය ගත් කිසි ආත්මයක් නම් නැත. එසේ වුවත් උක්තප්‍රකාර වූ චිත්ත-කිරිය-වායො ධාතුහුගේ පැතිරීම් වශයෙන්ම පාත්‍රය ගැනීම නම් වෙයි. එහි පාත්‍රයටද සිතක් නැත්තේය. අත් ද, සිත් ද නැත්තෝ ය. පාත්‍රය තෙම මම හස්තයන් විසින් ගන්නා ලද වෙමියි නොදනී. අත් ද, පාත්‍රය අප විසින් ගන්නා ලදැයි නොම දනිත්. අඬුවකින් ගිනිපැහැ වූ පාත්‍රයක් ගැනීම මෙන් ධාතුහුම ධාතු සමූහයක් ගනිත් යයි මෙසේ පැවැති ප්‍රත්‍යවේක්ෂා වශයෙන් මෙහි අසම්මොහ සම්පජඤ්ඤය දතයුතුය.

තවද, යම්සේ සුන් අත්පා ඇති, වණ මුඛවලින් වැගිරෙන ලේ සැරව, පණුකැල ඇති නිලමැස්සන් විසින් අවට වටකර ගත් අනාථ ශාලාවක සිටි අනාථ මිනිසුන් දැක, දයාබහුල මිනිස්සු ඔවුනට වණවසන රෙදිකඩ හා කබල් ආදියෙන් බෙහෙතුත් එලවත් ද, ඒ දීමෙහිදී රෙදිකඩද කිසිවෙකුට සියුම් වූවාහු කිසිවෙකුට ඝන වූවාහු ලැබෙත්. බෙහෙත් කබල්ද කිසිවෙකුට මනා සටහන් ඇත්තාහු කිසිවෙකුට නොමනා සටහන් ඇත්තාහු ලැබෙත්. ඔවුහු එහි සොම්නස් ඇත්තාහු හෝ දොම්නස් ඇත්තාහු හෝ නොවෙත් ද,

යම්හෙයකින් වණවැසීමට පමණ වූම රෙදිකඩින් ද බෙහෙත් පිළිගැනීමම පමණ වූම කබලින් ද ඔවුන්ට ප්‍රයෝජන වේද එහෙයිනි. එපරිද්දෙන්ම යම් මහණකෙනෙක් වණවසන කඩක් මෙන් සිවුරද, බෙහෙත් කබලක් මෙන් පාත්‍රයද කබලෙහි බෙහෙත් මෙන් පාත්‍රයෙහි ලත් භික්‍ෂාවද සලකන්නේ වේද, මේ මහණ තෙම සඟල සිවුරු පරිභෝගයෙහි අසම්මොහ සම්පජඤ්ඤයෙන් උතතම සම්පජානකාරී වූයේ වනැයි දතයුතුයැ.

අසිතාදි පදයන්හි, අසිතෙ, පිණ්ඩපාත භෝජනයෙහි පීතෙ කැඳ ආදිය බීමෙහි, සායිතෙ මීපැණි ආදිය රසවිඳ ගැනීමෙහි, එහි නෙව දවයා යනාදි නයින් කියන ලද අටවැදෑරුම් අර්ථය අර්ථ නම් වේ. ඒ අර්ථයාගේ වශයෙන් ද සාත්‍ථක සම්පජඤ්ඤය දතයුතුය. නැවත, රූක්‍ෂ-ප්‍රණීත තිත්ත-මධුර ආදීන් අතුරෙහි යම් භෝජනයකින් යමෙකුට නොසුව වේද එම භෝජනය ඔහට අසත්ප්‍රාය වෙයි. නැවත නිමිත්ත කර්මාදි වශයෙන් ලැබූ යම් භෝජනයක් වේද, යම් භෝජනයකුත් වළඳන්නා වූ ඒ මහණ හට අකුසල ධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද, ඒ භෝජනය ඒකාන්තයෙන් අසත්ප්‍රායම වෙයි. විපරීත වූයේ සත්ප්‍රාය වෙයි. ඒ සත්ප්‍රාය භෝජනයාගේ වශයෙන් මෙහි සප්පාය සම්පජඤ්ඤයද කමටහන දුරු නොකිරීම වශයෙන් ම ගෝචර සම්පජඤ්ඤය දතයුතුයැ.

අභ්‍යන්තරයෙහි වළඳන්නා වූ කිසි ආත්මයෙක් නම් නැත. එහෙත් කලින් කියන ලද ආකාර චිත්ත-කිරිය-වායෝ ධාතුහුගේ පැතිරීමෙන්ම පාත්‍රය පිළිගැනීම සිදුවේ. චිත්ත-කිරිය-වායො ධාතුහුගේ පැතිරීමෙන්ම අත පාත්‍රයෙහි බහාලීම සිදුවෙයි. චිත්ත කිරිය වායෝ ධාතුහුගේ පැතිරීමෙන්ම පිඬු කිරීමද පිඬු නැගීමද මුඛයට පිවිසීමද වෙයි. කිසිවෙක් හනු ඇට යතුරු මුදුවකින් විවර නොකරයි. යන්ත්‍රයකින් විවර නොකරයි. චිත්ත කිරිය වායෝ ධාතුහුගේ පැතිරීමෙන්ම බත්පිඩ මුඛයෙහි තැබීමද උඩදත් මොහොල් කිස සිද්ධ කිරීමද යට දත් වංගෙඩියක කාර්ය සිද්ධ කිරීමද දිවෙන් අතින් කරන කාර්ය සිද්ධ කිරීමද වෙයි. මෙසේ ඒ බත්පිඩ දිව අග තුනී කෙළද, දිව මුල බොල් කෙළද, තවරයි. යට දත් නමැති වනෙහි ලා දිව නමැති අතින් පෙරලන ලද කෙළ නමැති දියෙන් තෙමන ලද, උඩ දත් නමැති මොහොලින් සුණු කරන ලද, එම බත්පිඩ කෙණෙස්සකින් හෝ හැන්දකින් හෝ ඇතුළත ප්‍රවේශ කරන්නා වූ කිසිවෙක් නොමැත. වායෝ ධාතුව හේතුකොට ගෙනම පිවිසෙයි. පිවිසි

පිඩ උදුනක් කොට ගිනිදල්වා පිසන්නා වූ කිසිවෙක් නම් නැත. තේජෝ ධාතුව විසින්ම පිසනු ලැබෙයි. පැසුණු පැසුණු පිඩ දණ්ඩකින් හෝ යටකින් හෝ බැහැර කරන්නා වූ කිසිවෙක් නම් නැත්තේය. වායෝ ධාතු තොමෝ ම බැහැර කරයි. මෙසේ වායෝ ධාතු තොමෝ ඉදිරියට ගෙන යන්නී ද සරසට ගෙන යන්නීද, පෙරලන්නී ද සුණු කරන්නීද වියලන්නීද බැහැර කරන්නීද වෙයි.

පඨවි ධාතු තොමෝ දරන්නී ද, පෙරලන්නී ද සුණු කරන්නීද, වියලන්නීද වෙයි. ආපෝ ධාතු තොමෝ තෙත් කරන්නීද, තෙත් බව රකින්නීද වෙයි. තේජෝ ධාතු තොමෝ ඇතුළට පිවිසි පිවිසි ආහාරය පැසවන්නීය. ආකාශ ධාතුව මාර්ගය වෙයි. විඤ්ඤාණ ධාතුව ඒ ඒ තැන්හි මනාකොට යෙදීමට පැමිණ පාලන කරන්නී යයි මෙසේ පැවැති ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් මෙහි අසම්මොහ සම්පජඤ්ඤය දතයුතුය.

නැවත ගමන වශයෙන් ද, සෙවීම් වශයෙන් ද, පරිභෝග වශයෙන් ද ඇසුරුකරන තැන් වශයෙන් ද නිධාන (පිහිටි තැන්) වශයෙන් ද, නොපැසුනු හෙයින් ද, පැසුනු බැවින් ද, ඵල වශයෙන් ද වැගිරෙන හෙයින්ද තැවරීම් වශයෙන් ද, මෙසේ දසවැදෑරුම් පිළිකුල් බැව් ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් ද මෙහි අසම්මොහ සම්පජඤ්ඤය දතයුතුය.

උච්චාර පස්සාව කම්මෙ මල ද, මුත්‍ර ද පහ කිරීමෙහි අවස්ථාව පැමිණි කල්හි මල මූත්‍ර පහ කිරීම නොකරන්නහුට මුලු සිරුරින් දහඩිය මිදෙත්. ඇස කැරකෙත්. සිත එකඟ නොවෙයි. අනිකුදු රෝග හටගනිත්. එය කරන්නහුට ඒ සියල්ල සිදු නොවේ යයි, යනු මෙහි අර්ථයයි. ඒ අර්ථයාගේ වශයෙන් සාත්ථක සම්පජඤ්ඤය දතයුතුය. නොසුදුසු තන්හි මල මූත්‍ර කරන්නහුට ඇවැත් සිදුවේ. අයස වැඩෙයි. ජීවිත අන්තරායද සිදුවේ. සුදුසු ස්ථානයෙහි කරන්නහුට ඒ සියල්ල සිදු නොවේ යයි යනු මේ මෙහි සප්පාය නම් වේ. කමටහන නොහැරීම් වශයෙන්ම ගෝචර සම්පජඤ්ඤය ද දතයුතුයැ.

සිරුර ඇතුළෙහි මල මුත්‍ර කෘත්‍යය සිදුකරන්නා වූ කිසි ආත්මයක් නම් නැති. එතෙකුදු වුවත් චිත්ත-කිරිය-වායෝ ධාතුහුගේ පැතිරීමෙන්ම මල මුත්‍ර කිරීම වෙයි. ගඩපොල පැසුනු කල්හි එය බිඳීයාමෙන් ලේ සැරව නොකමැති පරිද්දෙන් යම්සේ නික්මේ ද, තව ද ඉතා බර වූ දිය බඳුනෙන්

ජලය නොකැමති පරිද්දෙන් යම්සේ නික්මේද, එපරිද්දෙන් පක්වාසය මුත්‍ර වස්තිවල රැස් වූ මල මූත්‍ර වාත වේගයෙන් පෙලන ලද්දාහු නොකැමති පරිද්දෙන් නික්මෙති. මෙසේ නික්මෙන්නා වූ එම මල මූත්‍ර භික්ෂුවගේ ආත්මීය වූයේ නොවෙයි. අනිකෙකුගේ ද නොවෙයි. එය හුදෙක් සිරුරෙන් වැගුරුනේම වෙයි. කුමක් වෙත්ද යත්, දිය කොතලයකින් පැරණි දිය බැහැර කරන්නහුගේ එම දිය යම්සේ ආත්මීය නොවේද, අනිකෙකුගේ ද නොවේ ද, හුදෙක් පටිජග්ගහ මාත්‍රයක්ව වේද, මෙසේ පැවැති ප්‍රත්‍යවේක්ෂා වශයෙන් අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුයැ.

ගතාදී ශබ්දයන් අතුරෙහි ගතෙ ගමනෙහි, ඨිතෙ සිටීමෙහි, නිසින්නෙ හිඳීමෙහි, සුත්තෙ, සයනයෙහි, ජාගරිතෙ නිදි වැරීමෙහි, භාසිතෙ කථා කිරීමෙහි, තුණ්හීභාවෙ නොබිණීමෙහි, ගච්ඡන්තො වා ගච්ඡාමීති පජානාති, ඨිතො වා ඨිතොම්හීති පජානාති, සයානොවා සයානොම්හීති පජානාති යයි, මෙතැන්හි දිගු ඉරියාපථ වදාරණ ලද්දාහු වෙති. අභික්කන්තෙ පටික්කන්තෙ, ආලොකිතෙ විලොකිතෙ සම්මිඤ්ජිතෙ පසාරිතෙ, මෙහි මධ්‍යම ඉරියාපථයෝ වදාරණ ලදහු. ගතෙ, ඨිතෙ, නිසින්නෙ සුත්තෙ යයි මෙහි වනාහි කුඩා වූ කැඩී පොඩි වී ගිය ඉරියාපථයෝ වදාරණ ලද්දාහුය. එසේ හෙයින් මේ තුන් තන්හි කී නියායෙන් ද නුවණින් ද දැන කරන බව දතයුතුය.

**ත්‍රිපිටක මහාසීව තෙර :-**

ත්‍රිපිටක මහාසීව තෙරුන් වහන්සේ මෙසේ කීහ. 'යමෙක් බොහෝ වේලාවක් ගමන්කොට හෝ සක්මන් කොට හෝ පසුකාලයේ සිටියේ, මේ අයුරින් ප්‍රත්‍යවේක්ෂා කෙරේ ද, සක්මන කරන්නා වූ කාලයෙහි පැවැති රූපාරූප ධර්මයෝ, මෙහිම නිරුද්ධ වූහයි, මෙතෙම ගමනයෙහිදී නුවණින් දැන ඉරියව් පවත්වන සුළුවූයේ නම් වෙයි.

යමෙක් හැදෑරීම් හෝ කරන්නේ, ප්‍රශ්න හෝ විසඳන්නේ කමටහන හෝ මෙනෙහි කරන්නේ බොහෝ වේලාවක් සිට පසුව නිදාගත්තේ, මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරේ ද, සිටි කාලයෙහි පැවැති රූපාරූප ධර්මයෝ මෙහි නිරුද්ධ වූහයි මේ තෙම සිටීමෙහි සම්පජානකාරී නම් වේ.

යමෙක් තෙම, හැදෑරීම් ආදිය කිරීම් වශයෙන්ම බොහෝ වේලාවක් හිඳ පසුව හොත්තේ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරේ ද, හුන් කාලයෙහි

පැවැති රූපාරූප ධර්මයෝ මෙහිම නිරුද්ධ වූහයි මෙතෙම හිඳීමෙහි සමපජානකාරී නම් වේ.

යමෙක් වැදහොත්තේ පාඩම් කරමින් හෝ කමටහනක් මෙනෙහි කරමින් හෝ නින්දට බැස පසුව නැගිට මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කෙරේද, හෝනා කල්හි පැවැති රූපාරූප ධර්මයෝ මේ සයනයෙහිම නිරුද්ධ වූවාහුම යයි, මෙතෙම නින්දෙහි ද, නිදි දුරුකිරීමෙහි සමපජානකාරී නම් වෙයි. ඒ එසේමැයි. ක්‍රියාමය චිත්තයාගේ නොපැවැත්ම නින්ද නම් වේ. පැවැත්ම නිදි දුරුකිරීම නම් වේයයි ද, තව ද යමෙක් කථා කරමින් මේ ශබ්දය නම් තොල් ද දත් ද නිසා දිව ද තල්ල ද නිසා චිත්තයාගේ ඊට අනුරූප වූ ප්‍රයෝගය නිසා හටගනී යයි සිහි ඇත්තේ නුවණැත්තේ බෙණේ ද, යලිදු බොහෝ කාලයක් හැදෑරීම් හෝ කොට බණ හෝ කියා කර්මස්ථානය හෝ පිරිවහා ප්‍රශ්න හෝ විසඳ පසුකාලයේ නිශ්ශබ්ද වූයේ මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කෙරේද, කථා කරන කල්හි වූ රූපාරූප ධර්මයෝ මෙහිම නිරුද්ධ වූහයි මේ තෙමේ බිණීමෙහි සම්පජානකාරී වූයේ වෙයි. යමෙක් නොබැණ බොහෝ වේලාවක් ධර්මය හෝ කමටහන හෝ මෙනෙහි කොට පසුව මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කෙරේ ද, නොබැණ සිටි කාලයෙහි පැවැති නාමරූප ධර්මයෝ මෙහිම නිරුද්ධ වූහ. උපාදාන රූපයන්ගේ පැවැත්ම ඇති කල්හි කථා කරයි නම්, නැති කල්හි කථා නොකරයි නම් මෙය තුණ්හී භාව සමපජානකාරී නමැයි මේ මහාසීව තෙරුන් විසින් කියන ලද අසම්මොහ ධුරය සතිපට්ඨාන සූත්‍රයෙහි අදහස් කරන ලදී. සාමඤ්ඤඵල සූත්‍රයෙහි සියලු ම සිව්වැදෑරුම් සමපජඤ්ඤ ලැබෙයි. එහෙයින් විශේෂයෙන් මෙහි අසම්මොහ සමපජඤ්ඤයාගේ වශයෙන්ම සමපජානකාරී බව දතයුතුය.

සමපජානකාරී, සමපජානකාරී යන සියලු පදයන්හි, සති සමපයුතත වූම සමපජඤ්ඤයාගේ වශයෙන් අර්ථය දතයුතුයි. විභංග ප්‍රකරණයෙහි වනාහි සතො සමපජානො අභික්කමති, සතො සමපජානො පටික්කමති මෙසේ මේ පදයෝ විභාග කළාහුමය. දැන් අජ්ඣත්තං වා මෙසේ සතර සමපජඤ්ඤය පරිග්‍රහණයෙන් තමාගේ කයෙහි හෝ අන්‍යයාගේ හෝ කයෙහි කය අනුව බලමින්, වෙසෙයි. මෙහිද සමුදය ධම්මානුපස්සී යනාදියෙහි රූප ස්කන්ධයාගේම සමුදය ද, වය ද, එලවා දැක්විය යුතුයි. සෙස්ස කී පරිදිමැයි. මෙහි සතර සමපජඤ්ඤයට අයත් වූ සතිය දුක්ඛ සත්‍ය නම් වේ. ඒ සතිය උපදවන්නා වූ පළමු තණ්හාව සමුදය සත්‍ය නම්

වේ. දෙදෙනාගේම නොපැවැත්ම නිරෝධ සත්‍ය නම් වේ. කලින් කියන ලද ආර්ය මාර්ගය මාර්ග සත්‍ය නම් වේ. මෙසේ චතුසත්‍ය වශයෙන් උත්සාහකොට නිවනට පැමිණේ යයි මේ එක චතු සම්පජඤ්ඤ පරිග්‍රාහකයකු වශයෙන් නිවන තෙක් වූ නිවන් දොරටුවයි.

චතු සම්පජඤ්ඤ පබ්බය නිමි.

## පටිකකූල මනසිකාර පබ්බය

මෙසේ චතුසම්පජඤ්ඤ වශයෙන් කායානුපස්සනාව විභාගකොට දැන් පටිකකූල මනසිකාර වශයෙන් විභාග කරන්ට පුනචපරං ආදිය වදාළහ. එහි ඉමමෙව කායං යනාදියෙහි යමක් කිවයුතු වන්නේ ද ඒ සියල්ල සර්වප්‍රකාරයෙන්ම විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයෙහි කායගතාසති කම්මට්ඨානයේ දී කියන ලදී. උභතො මුඛා උඩ ද, යටදැයි මුඛ දෙකකින් යුක්ත වූ නානාවිහිතසස නානාවිධ වූ, මේ වූ කලී මෙහි උපමා සංසන්දනයයි, උඩ යට මුඛ දෙකක් ඇති මල්ලක් මෙන් වූ සතර මහා භූතයන්ගෙන් හටගත් කය ද, එහි මිශ්‍රකොට බහාලන ලද විවිධ ධාන්‍ය මෙන් කේසාදි දෙතිස් ආකාරයෝ ද, ඇස් ඇති පුරුෂයෙකු මෙන් යෝගාවචර තෙමේ ද, එම මල්ල මුදා විමසන්නා වූ ඒ පුරුෂයා හට, විවිධ ධාන්‍ය ප්‍රකට වූ කාලය මෙන් යෝගාවචර හට දෙතිස් කුණප කොට්ඨාස විවිධත්වයෙන් ප්‍රකට වූ ආකාරය දතයුතුය. ඉති අජ්ඣත්තං වා මෙසේ කේශාදීන්ගේ පරිග්‍රහණයෙන් තමාගේ කයෙහි හෝ අනිකෙකුගේ කයෙහි හෝ, කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ කයෙහි කය අනුව බලමින් වෙසෙයි. මෙයින් මත්තෙහි කී නයමැයි හුදෙක් මෙහි දෙතිස් කොට්ඨාශයන්ට අයත් සතිය දුක්ඛ සත්‍ය නම් වේ. මෙසේ යෝජනා කොට (සසරින් නික්මෙන) දොරටුව යයි දතයුතුයැ. සෙස්ස පූර්ව කී දැයට සමානමැයි.

පටිකකූල මනසිකාර පබ්බය නිමි.

## ධාතු මනසිකාර පබ්බය

මෙසේ පිළිකුල් බව මෙනෙහි කිරීම් වශයෙන් කායානුපස්සනාව විස්තරකොට දැන් ධාතු මනසිකාර වශයෙන් මෙනෙහි කරන්ට පුනචපරං

යනාදිය වදාළහ. මේ එහි උපමා සංසන්දනයක් සමග අර්ථ වර්ණනාවයි. කිසියම් ගවඝාතකයෙක් හෝ ඔහුගේ බත් වැටුපෙන් පෝෂණය කරන ලද අතවැසියෙක් හෝ ගවයෙකු මරා සතර දිගට විනිවිද ගියා වූ මහාමාර්ගයන්ගේ මධ්‍යස්ථාන නම් වූ සතරමං සන්ධියක කොටස් කොටස් කොට යම්සේ හුන්නේ වේද,

එපරිද්දෙන් මහණතෙම සතර ඉරියාපථයන් අතුරෙන් යම්කිසි ආකාරයකින් සිටි හෙයින් සිටිවතින් සිටියා වූ නැවත සිටි පරිදි සිටිහෙයින් පිහිටියා වූ ආකාරයෙන් පිහිටියා වූ කය, 'මේ ශරීරයෙහි පඨවි ධාතු ඇත. ආපෝ ධාතු ඇත, තේජෝ ධාතු ඇත, වායෝ ධාතු ඇතැයි මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි. කුමක් කියන ලද්දේ වේද යත්,

ගවයෙකු පෝෂණය කරන්නා වූ ද, මරණ තැනට ගෙනයන්නා වූද ගෙනගොස් එහි බැඳ තබන්නා වූද නසන ලද මළසිරුර දක්නා වූද ගෝඝාතකයා හට යම්තාක් ඒ ගවයා පලා කොටස් කොටස් වශයෙන් නොබෙදා ද, ඒතාක් ගවයෙක් යන සංඥාව අතුරුදහන් නොවේද, එතකුදු වුවත් බෙදා හුන්නහුට ගව සංඥාව අතුරුදහන් වේද, මාංස සංඥාව පවතීද, මම ගවයෙකු ගෙන යමි. මොවුහු ගවයා ගෙන යත් යයි ඔහට මෙබඳු සිතක් ඇති නොවේද, යලි කිමෙක්, මම මස් විකුණමි. මොවුහු මස් ගෙන යති යයි කියාම ඔහට සිතක් වේද, එපරිද්දෙන්ම පෙර බාල පෘථජ්ජන කාලයෙහි ගිහි වූත්, පැවිදි වූත් මේ මහණ හට ද මේ කය සිටිවනින් පිහිටි ආකාරයෙන් ඝන විනිර්භෝගය කොට යම්තාක් ප්‍රත්‍යවේක්ෂා නොකෙරේ ද, ඒ තාක් සත්ත්වයෙකු - පුද්ගලයෙකු යන සංඥාව අතුරුදහන් නොවෙයි.

ධාතු වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ ඔහුට සත්ත්ව සංඥාව අතුරුදහන් වෙයි. ධාතු වශයෙන්ම සිත පිහිටයි. එබැවින් මෙසේ වදාළහ. **ඉමමෙව කායං යථාඨීතං යථපණිහිතං ධාතුසො පච්චවෙක්ඛති අත්ථි ඉමස්මිං කායෙ පඨවි ධාතු ආපොධාතු, තෙජො ධාතු, වායො ධාතු, සෙය්‍යථා භික්ඛවෙ දක්ඛො ගොඝාතකො වා -පෙ- වායො ධාතු** යනුවෙන් මෙහි යෝගීතෙම ගෝඝාතකයා මෙනි. සත්ත්ව සංඥාව ගව සංඥාව මෙනි. සතර ඉරියාපථ සතරමං සන්ධිය මෙනි. ධාතු වශයෙන් මෙනෙහි කිරීම කොටස් වශයෙන් බෙදා හුන් බව මෙනැයි මේ මෙහි පෙළ වර්ණනාවයි. කමටහන වනාහි විසුද්ධි මාර්ගයේ විස්තර කරන ලද්දේය.

ඉති අජ්ඣත්තං වා මෙසේ චතු ධාතු පරිග්‍රහණයෙන් තමාගේ කයෙහි හෝ අනිකෙකුගේ කයෙහි හෝ කය අනුව බලමින් වෙසෙයි. මෙයින් මතුවෙහිද කී නයමැයි. මෙහි සතර ධාතු පරිග්‍රාහික සතිය දුක්ඛ සත්‍යය නම් වේ. මෙසේ සලකා නිවනට පැමිණෙන දොරටුව දතයුතුය. සෙස්ස, පළමු මෙනි.

ධාතු මනසිකාර පබ්බය නිමි.

සිවථිකා පබ්බය :

මෙසේ ධාතු මනසිකාර වශයෙන් කායානුපස්සනාව විභාගකොට දැන් නවසිවථිකා පබ්බය විස්තර කිරීමට පුනචපරං යන ආදිය කීහ. එහි සෙය්‍යථාපි පස්සෙය්‍ය යනුවෙන් යම්සේ දක්නේද, සරීරං යනු මෘත ශරීරයයි. සිවථිකාය ඡඩ්ඩිතං සොහොනෙහි දමන ලද, එක්දිනක් (ඉක්මුනේ) මළා වූ ඔහට නුයි එකාහං මතං යනු වේ. දෙදිනක් (ඉක්මුනේ) මළා වූ ඔහට නුයි ද්වීහමතං යනු වේ. තෙ දිනක් (ඉක්මුනේ) මළා වූ ඔහට නුයි තීහමතං යනුවෙන් වාතයෙන් පිරුණු කඹුරු සමක් මෙන් ජීවිතය නැත වීමෙන් පසු ක්‍රමයෙන් නැග්ගා වූ සූනත්වයෙන් (අඩු තැන් පිරවීමෙන්) ඉදිමී ගිය බැවින් උද්ධුමාත නම් වේ. උද්ධුමාතය මැ උද්ධුමාතක නම් වේ. නැතහොත් පිළිකුල් බැවින් කුත්සිත වූ උද්ධුමාතයනුයි උද්ධුමාතක නම් වේ. මිශ්‍ර වූ වර්ණ ඇත්තේ විනීල යයි කියනු ලැබේ. විනීලයම විනීලක නම් වේ. පිළිකුල් බැවින් කුත්සිත වූ විනීලයනුයි විනීලක නම් වේ. මස්පිඩු උස්ව නැගි තැන්හි, රක්තවර්ණ වූ සැරව පිරුණු තැන්හි ශ්වේත වර්ණ වූ බොහෝ සෙයින්ම නීල වර්ණ වූ නිල් වූ තැන්හි නිල් සළුවක් පොරවන ලද්දක්හු වැනි මළ සිරුරට මේ නමකි. බිඳුනු තැනකින් හෝ නව වණමුඛයන්ගෙන් හෝ වැහෙන්නා වූ පූයා ඇත්තේ විපුබ්බ නම්. විපුබ්බයම විපුබ්බක නම්. නැතහොත් පිළිකුල් බැවින් කුත්සිත වූ විපුබ්බයනු විපුබ්බක නම් වේ. හටගත් පූයා ඇත්තේ එබඳු ස්වභාවයට ගියේනුයි විපුබ්බක ජාත නම් වේ.

සො ඉමමෙව කායං යනුවෙන් ඒ මහණතෙම තමාගේ කය ඒ මළසිරුර සමග නුවණින් සමාන කෙරෙයි. එලවයි. කෙසේද යත්, මේ කය ද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවයට පැමිණෙන සුලුය. මෙබඳු ස්වභාවය නොඉක්ම සිටියේ යයි කියායි. මේ කියන ලද වෙයි.

ආයුෂය, තේජෝ ධාතු විඥානය යන මේ ධර්මයන් තිදෙනාගේ පැවැත්මේ හේතුවෙක් මේ කය සිටීම, ගමන් කිරීම් ආදිය ඉවසන්නේ වෙයි. යළි මොවුන්ගේ වෙන්වීමෙන් මේ කයද එවං ධමෙමා, මෙසේ කුණුවන ස්වභාවය ඇත්තේමයි. එවං භාවි, මෙපරිද්දෙන්ම උද්ධුමාතක ආදි භේද ඇත්තේ වන්නේය. එවං අනතීතො මෙපරිද්දෙන් උද්ධුමාතක ආදි භාවයන් නොඉක්මවන ලද්දේය. ඉති අජ්ඣත්තං වා මෙසේ උද්ධුමාතකාදි ග්‍රහණයෙන් තමාගේ කයෙහි හෝ අනිකෙකුගේ කයෙහි හෝ කය අනුව බලමින් වෙසෙයි. කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ කයෙහි කය අනුව බලමින් වෙසෙයි. ඛජ්ජමානං යනුවෙන් උදර ආදියෙහි සිටිමින් උදර මාංශයද, ඇස ගුල ආදිය ගලව ගලවා කනු ලබන්නා වූ, සමංස ලොහිතං සෙසු ඉතිරි මස් ලේ සහිත වූ නිමමංස ලොහිත මක්ඛිතතං මස් ක්‍ෂය වී ගිය කල්හිද, ලේ නොවියලෙයි. එහෙයින් වදාරණ ලදී. ලොහිත මක්ඛිතතං යයි අඤ්ඤෙන අන්‍ය දිශාවක, හත්‍ථට්ඨිකං යනු සූසැටක් භේද ඇති, වෙන වෙනම විසුරුණා වූ අත් ඇටද පා ඇටද, ආදියෙහි ද මෙම ක්‍රමයම වේ.

තොරොවසසිකානි දෙතුන් වසරක් ඉක්මුනා වූ එලිමහතේ තිබුණා වූ අව් වැසි සුළං වැදීමෙන් වසක් ඉක්මුනාහු කුණු වූවාහු වෙති. පොලෝ තුලට පැමිණියාහු වනාහි බොහෝ කලක් පවතිත්, චුණ්ණක ජාතානි, සුණු සුණුව විසුරුණාහු සියලු තැන්හි සො ඉම මෙව යනු කී පරිද්දෙන් ඛජ්ජමානං යනාදි පදයන්ගේ වශයෙන් යෝජනා කළ යුත්තීය.

ඉති අජ්ඣත්තං වා මෙසේ (කාකාදින් විසින්) කනු ලබන්නා වූ ශරීර ආදිය පරිග්‍රහණය කිරීමෙන් සුණු වූ ශරීරය තෙක් තමාගේ කයෙහි හෝ අනිකෙකුගේ කයෙහි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ කයෙහි කායානුදර්ශීව වෙසෙයි. නැවත මෙතැන්හි සිට නව සිවථිකා එක්කොට දැක්විය යුත්තාහුය. මේ එහි එක්තැන් කිරීමේ ක්‍රමයයි.

එකාහං මතං වා යනාදි නයින් වදාළ සියල්ලම එක් සිවථිකායෙකි. කාකෙහි වා ඛජ්ජමානං යනාදිය එකෙක. අට්ඨි සංඛලිකං සමංසලොහිතං නහාරු සම්බන්ධං යනු එකෙක. නිමමංස ලොහිත මක්ඛිතතං නහාරු සම්බන්ධං යනු එකෙක. අපගත මංසලොහිතං නහාරු සම්බන්ධං යනු එකෙක. අට්ඨිකානි අපගත සම්බන්ධානි යනු එකෙකි. අට්ඨිකානි සෙතාන

සබ්බචුණ්ණකජාතානි යනු එකෙකි. අට්ඨීකානි පූතීනි තෙරෝවස්සිකානි යනු එකෙකි. අට්ඨීකානි පූතීපන චුණ්ණක ජාතානි යනු එකෙකි. එවං ඛො භික්ඛවෙ යන මෙය නව සිවථිකය දක්වා කායානුපස්සිනා දේශනාව නිමවමින් වදාළ සේක. එහි නව සීවථික පරිග්ගාහික වූ සතිය දුක්ඛ සත්‍යය ඒ සතිය උපදවන්නවන් වූ පළමු තණ්හාව සමුදය සත්‍ය වේ. ඒ දෙදෙනාගේම නොපැවැත්ම නිරෝධ සත්‍යයැ. දුක දැනගත්තාවූ සමුදය දුරුකරන්නා වූ නිවන් අරමුණු කරන්නා වූ ආර්ය මාර්ගය තෙම මාර්ග සත්‍යයැ. මෙසේ චතු සච්ච වශයෙන් උත්සාහකොට නිවනට පැමිණේ යයි මේ නවසිවථික පරිග්ගාහක වූ භික්ෂූන්ගේ රහත් බව තෙක් නිවන්දොර වේ.

## සිවථිකා පබ්බය නිමි.

මෙතෙකින්, ආනාපාන පබ්බය, ඉරියාපථ පබ්බ, චතු සම්පජඤ්ඤ පබ්බය, පටික්කූල මනසිකාර පබ්බය, ධාතු මනසිකාර පබ්බය, නවසිවථිකා පබ්බය යයි තුදුස් පබ්බයක් ඇති කායානුපස්සනාව නිමවන ලද්දී වෙයි. එම තුදුස් පබ්බයන් අතුරෙහි, ආනාපාන පබ්බය පටික්කූල මනසිකාර පබ්බය යන දෙකම අප්පනා කමටහන්ය. සිවථිකායන් වනාහි ආදිනවානු පස්සනා වශයෙන් වදාළ බැවින් සෙසු දොලොසම උපචාර කර්මස්ථානයෝ යැ.

## කායානු පස්සනා සතිපට්ඨානය නිමි.

### වේදනානු පස්සනාව :

මෙසේ භාග්‍යවතුන් වහන්සේ තුදුස් ආකාරයකින් කායානුපස්සනා සතිපට්ඨානය වදාරා දැන් නව අයුරකින් වෙදනානුපස්සනාව දක්වන්නට කථඤ්ච භික්ඛවෙ, යනාදිය වදාළහ. එහි සුඛං වෙදනං යනු කායික වූ හෝ චෛතසික වූ හෝ සැප වේදනාව විඳින්නේ මම සැප වේදනාවක් විඳිමියි දැනගනී යන අර්ථය වෙයි. ඒ දැනීමෙහි ඒකාන්තයෙන් උඩුකුරුව හෝනා වූ ළදරුවෝ පවා කිරි පීම් ආදි කාලයෙහි සැපවිඳින්නාහු අපි සැපයක් විඳිමු යයි දැනගනිත්. එතකුදු වුවත් මේ යෝගාවචරයාගේ දැනුම එබඳු දැනීමක් සඳහා නොවදාරණ ලදී. ඒ ළදරුවන්ගේ දැනීම වැනි දැනුම සත්ත්ව දෘෂ්ටිය අත්නොහරී. සත්ත්වයෙක යන සංඥාව නො උගුලුවයි. කමටහනක් හෝ සතිපට්ඨාන භාවනාවක් හෝ නොවෙයි. මෙම භික්ෂූහුගේ දැනගැනීම වනාහි සති දෘෂ්ටිය දුරුකෙරයි. සත්ත්ව

සංඥාව ගලවා පියයි. කමටහන හා සතිපට්ඨානයද වෙයි. මෙය වනාහි කවරෙක් විඳී ද, කවරෙකුගේ විඳීමක් ද, කුමන කරුණකින් වූ වේදනාවක්දැයි. මෙසේ නුවණින් දැක විඳීම සඳහා වදාරණ ලදී. ඒ ප්‍රශ්න කිරීමෙහි කවරෙක් විඳීද? යනු කිසි සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නොවිඳියි. කවරෙකුගේ විඳීමෙක් ද? යනු කිසි සත්ත්වයෙකුගේ හෝ පුද්ගලයෙකුගේ හෝ විඳීමක් නොවේ. කවර කරුණකින් වූ වේදනාවක් ද යනු සත්‍වාරම්මණයෙන් වේදනා තොමෝ වන්නීය. මේ යෝගාවචර තෙම කුමක්හෙයින් මෙසේ දැනගනී ද යත් ඒ ඒ සුඛ ආදි වස්තුව අරමුණුකොට වේදනා තොමෝ ම විඳී. එම වේදනා ප්‍රවෘත්තිය ගෙන මම විඳිමියි ව්‍යවහාර මාත්‍රයක් වේයයි මෙසේ වස්තුව අරමුණුකොට වේදනා තොමෝ විඳීයයි සලකන්නා වූ මෙතෙම සැප වේදනාව විඳිමියි දැනගනීයයි දතයුතු යැ. සිතුල් පව්වෙහි එක්තරා තෙර කෙනෙක් මෙනි.

**සිතුල්පව් වැසි තෙරුන් වහන්සේ නමක්**

තෙරුන් වහන්සේ රෝගී කාලයෙහි බලවත් වේදනාවෙන් කෙඳිරිගාමින් ඔබිනොබ පෙරලෙති. උන්වහන්සේට එක්තරා තරුණ භික්ෂුවක් මෙසේ කීය. ස්වාමීනි, ඔබවහන්සේගේ කවර තැනක් රිදීම කෙරේදැයි ඇවැත්නි, වෙනම රිදෙන තැනක් නම් නැති. (කායනම් වූ වස්තුව) අරමුණුකොට වේදනා තොමෝ විඳී යයි (කීහ.) ස්වාමීනි, මෙසේ දන්නා කල පටන් ඉවසන්ට සුදුසු නේද? ඇවැත්නි, ඉවසමියි කීය. ස්වාමීනි ඉවසීම උතුම්ම වෙයි. තෙරණුවෝ ඉවසූහ. වාතය ළය දක්වා පැලීය. ඇඳෙහි අතුනු එකතු වූහ. තෙරණුවෝ තරුණ භික්ෂුවට ඇවැත්නි, මෙතෙක් ඉවසීම වටීදැයි දැක්වූහ. තරුණ භික්ෂුව තුෂ්ණිම්භූත විය. තෙරණුවෝ වීර්ය සමත්‍වය යොදා සිව්පිළිසිඹියා සමග රහත් බවට පැමිණ සමසීසව පිරිනිවී සේක.

සුඛ වේදනාව යම්සේ ද එපරිද්දෙන් දුක්ඛ වේදනාව -පෙ- නිරාමිස වූ අදුක්ඛමසුඛ වේදනාව විඳින්නේ නිරාමිස වූ අදුක්ඛ මසුඛ වේදනාව විඳිමි යයි දැනගනී.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ රූප කමටහන වදාරා අරූප කමටහන වදාරණ සේක්, වේදනා වශයෙන්ම වදාළහ. එම කමටහන, දෙවැදෑරුම් වෙයි. රූප කමටහන, අරූප කමටහන කියායි. මෙම කමටහන් දෙකම රූප පරිග්ගහ, අරූප පරිග්ගහ යයිද කියනු ලැබේ. මෙම ද්විධ කමටහන්

අතුරෙන් භාග්‍යවතුන් වහන්සේ රූප කමටහන වදාරණ සේක්, සංක්‍ෂෙප මනසිකාර වශයෙන් සවිස්තර මනසිකාර වශයෙන් හෝ චතුධාතු වවත්ථානය වදාරණ සේක. ඒ දෙකම විසුද්ධි මාර්ගයෙහි සර්වාකාරයෙන් දක්වන ලද්දේමය. අනතුරුව අරූප කර්මස්ථානය වදාරණ සේක් බොහෝ සෙයින් වේදනා වශයෙන් වදාරති. එය විස්තර කරනු ලැබේ.

අරූප කමටහනෙහි අභිනිවෙසය (=පිහිටුවීම) තෙ වැදෑරුම් වේ. ඵස්ස වශයෙන් වේදනා වශයෙන් සහ චිත්ත වශයෙන් කියායි. කෙසේද යත්,

ඇතැම් යෝගාවචරයෙකුට සැකෙවින් හෝ විස්තර වශයෙන් හෝ රූප කමටහන පරිග්ගහනය කළ කල්හි රූපාරම්මණයෙහි චිත්ත චෛතසිකයන්ගේ පළමු අභිනිපාතය (=ඉදිරියෙහි පතිතවීම) ඇතිකල්හි එම අරමුණ ස්පර්ශ කරමින් උපදින්නා වූ ස්පර්ශය ප්‍රකට වෙයි. කිසිවෙකුට ඒ අරමුණ විඳිමින් උපාදාන වූ වේදනාව ප්‍රකට වෙයි. ඇතැම් කෙනෙකුට ඒ අරමුණ පරිග්‍රහණය කොට දැනගනිමින් උපදින්නා වූ විඥානය ප්‍රකට වෙයි. ඔවුන් තිදෙනා අතුරෙහි යමෙකුට ස්පර්ශය ප්‍රකට වේද, හෙතෙමේද, 'හුදෙක් ස්පර්ශයම නොඋපදී' ඒ ස්පර්ශය සමග එම අරමුණම විඳිමින් වේදනාව උපදී. හැඳින ගනිමින් සංඥාවද, සිතමින් චේතනාවද, දැනගනිමින් විඥානයද උපදී යයි ඵස්ස පඤ්චම ධර්මයන්ම (=වෙදනා-සංඥා-චෙතනා-විඥාන) ධර්මයන්ම පරිග්‍රහණය කෙරෙයි. යමෙකුට විඥානය ප්‍රකටවේද හෙතෙමේත් හුදෙක් විඥානයම නූපදී. එම විඥානය සමගම එම අරමුණම ස්පර්ශ කරමින් ඵස්සය ද උපදී. අරමුණ රසය අනුභව කරමින් වේදනාව ද හැඳින ගනිමින් සංඥාවද සිතමින් චේතනාවද උපදී යයි ඵස්ස පංචමක ධර්මයන්ම පරිග්‍රහණය කෙරෙයි. හෙතෙම මේ ඵස්ස පංචමක ධර්මයෝ කුමක් ඇසුරු කළාහුදැයි විමසන්නේ හදවත ඇසුරු කළාහුයයි දැනගනී. වස්තුව නම් කරජකයයැ. මේ සඳහා කියන ලදී.

**ඉදඤ්ච පන මෙ විඤ්ඤාණං එත්ථසිතං එත්ථ පටිබද්ධං** යයි වදාරණ ලදද එහෙයිනි. ඒ කරජ කය අර්ථ වශයෙන් සතර මහාභූතයන් හා උපාදාය රූපයෝ ද වෙති. මෙපරිද්දෙන් මෙහි වස්තුව, රූපය යැ. ඵස්ස පංචමක ධර්මයෝ නාමයයි ද නාමරූප මාත්‍රයක්ම දකී. තව ද මෙහි රූපය - රූපස්කන්ධ නම් වේ. නාමය සතර අරූප ස්කන්ධයෝ යයි පඤ්ච ස්කන්ධයම වෙයි. එය එසේමැයි. නාමරූපයෙන් තොර වූ පඤ්ච

ස්කන්ධයෝ හෝ පඤ්ච ස්කන්ධයෝ හෝ පඤ්ච ස්කන්ධයෙන් තොර වූ නාමරූපයෙක් හෝ නැත.

හෙතෙම මෙම ස්කන්ධ පංචකය කුමක් හේතුකොට හටගත්තාහුදැයි පරීක්ෂා කරන්නේ අවිජ්ජා ආදිය හේතුකොට හටගත්තාහු යයි දකී. ඉක්බිති මේ නාම රූප කය ප්‍රත්‍ය හා ප්‍රත්‍යොත්පන්න ධර්මද වෙයි. අනෙක් සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැති ශුද්ධ වූ සංස්කාර රාශි මාත්‍රයක්ම යයි ප්‍රත්‍ය සහිත නාමරූපයන්ගේ වශයෙන් ත්‍රිලක්ෂණයටම නගා විදසුන් වඩා පිළිවෙලින් අනිත්‍යයැ. දුක්ඛයැ. අනාත්මයැ. සම්මර්ශනය කෙරෙමින් හැසිරෙයි. හෙතෙම ප්‍රතිවේධය අද අද වේයයි කැමති වෙමින් එබඳු වූ දිනයක ඍතු පහසුව හෝ පුද්ගල පහසුව හෝ භෝජන පහසුව හෝ ධර්මශ්‍රවණ පහසුව හෝ ලැබ එක් පලගක හුන්නේ විදසුන් නැණ මුදුන් පමුණුවා රහත්ඵලයෙහි පිහිටටයි. මෙසේ මෙම තිදෙනාගේම රහත්ඵලය තෙක් කමටහන කියන ලද්දේ වෙයි.

මෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ අරූප කමටහන වදාරණ සේක් වේදනා වශයෙන් වදාළහ. යම්හෙයකින් ඵසස වශයෙන් හෝ විඤ්ඤාණ වශයෙන් හෝ වදාරනු ලබන්නේ ප්‍රකට නොවේ ද, අන්ධකාරයක් මෙන් වැටහේ ද, වේදනා වශයෙන්ම ප්‍රකට වේද, කුමක් හෙයින්ද යත්? වේදනාවන්ගේ උත්පත්තියේ ප්‍රකට බැවිනි. එය එසේමැයි. සැප දුක් වේදනාවන්ගේ උත්පත්තිය ප්‍රකටයැ. යම්විටෙක සැප වේදනාවක් උපදීද, එකල්හි සියලු ශරීරය අලලමින් මඩමින් පැතිරෙමින් වගුරුවමින් සියක් වරක් සෝදන ලද ගිතෙලක් කවන කලක් මෙන් සියක් වරක් පැසූ තෙලක් ගල්වන කලක් මෙන් වතුර කල දහසකින් පරිදාහය නිවන කලක් මෙන් අහෝ සැපයැ. අහෝ සැපයැයි වචන පිටකරමින් උපදී. යම්විටක දුක්වේදනාවක් උපදීද, එකල්හි මුලු සිරුර අලලමින් මඩිමින් පැතිරවමින් වගුරුවමින් රත්කළ සීවැලක් ප්‍රවේශ කරන කලක් මෙන් ද්‍රව වූ තඹ ලෝහය ඉසිකලක් මෙන් වියලි තණ වනදෙටු රුක් ඇති වනයක දරගිනි හුල් මිටියක් දමන කලක් මෙන් අහෝ දුකැයි අහෝ දුකැයි විලාප නගමින්ම උපදී. මෙපරිද්දෙන්ම සැප වේදනාවන්ගේ ද ඉපදීම ප්‍රකාශ වෙයි.

එසේ වුවත් උපෙක්ඛා වේදනාව දුකසේ දැක්විය යුත්තීය. අඳුරුය. අප්‍රකටය. එය සැප දුක් දෙදෙනාගේ පහවීමෙහි සැප දුක් දෙකට ප්‍රතිපක්ෂ

වශයෙන් මධ්‍යස්ථ වූවා, දුක් නොවූ සැප නොවූ වේදනාවයි නය වශයෙන් ගන්නහුට ප්‍රකට වෙයි. කුමක් මෙන්ද යත්? පැතලි ගල්තලාවක් අතරට නැග පලාගිය මුවාගේ පා සටහන් අනුව යන්නා වූ මුවවැදි තෙම ගල්තලාවට මෙපිටද, එපිටත පියවර දැක මැද පියවර නොදැක්ක නමුත් මෙතැනින් ගලට නැග මෙතැනින් බැස්සේය. මැද ගල්පිට මේ පෙදෙසින් ගියේ වන්නේ යයි යම්සේ නය වශයෙන් දැනගන්නේ ද, එපරිද්දෙන්, නැගි තන්හි පා සටහන් මෙන් සැප වේදනාවගේ උත්පත්තිය ප්‍රකට වේ. බට තන්හි පා සටහන් මෙන් දුක් වේදනාවගේ උත්පත්ති ප්‍රකට වේ. මෙතැනින් නැගී මෙතැනින් බැස මැදින් මෙසේ ගියේ වනැයි නය වශයෙන් ගැනීම මෙන් සැප දුක් දෙදෙනාගේ පහව යාමෙහි සැප දුක් දෙකට ප්‍රතිපක්ෂ වශයෙන් මධ්‍යස්ථ ආකාර වූයේ උපේක්ෂා වේදනාව යයි නය වශයෙන් ගන්නාහුට ප්‍රකට වෙයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පළමුකොට රූප කමටහන වදාරා පසුව අරූප කමටහන වේදනා වශයෙන් විනිවර්තනය කොට (පෙරලා) දැක්වූ සේක. නමුත් මේ සතිපට්ඨාන සූත්‍රයෙහි මෙසේ නොදැක්වූහ. චූලතණ්හා සංඛය, සූත්‍රය, මහාතණ්හා සංඛය සූත්‍රය, චූලවෙදලල සූත්‍රය, මහාවෙදලල සූත්‍රය, රට්ඨපාල සූත්‍රය, මාගන්දිය සූත්‍රය, ධාතුවිභංග සූත්‍රය, අනෙඤ්ජ සපපාය සූත්‍රය දීඝනිකායේ මහානිදාන සූත්‍රය, සක්කපඤ්හ සූත්‍රය, මහාසතිපට්ඨාන සූත්‍රය, සංයුත්ත නිකායේ චූලනිදාන සූත්‍රය, රුක්ඛූපම සූත්‍රය, පරිවීමංසන සූත්‍රය සියලු වේදනා සංයුත්තයෙහි (සූත්‍ර) යන මේ තන්හි පළමුකොට රූප කමටහන වදාරා අරූපප කමටහන වේදනා වශයෙන් විනිර්වර්තනය කොට දැක්වූ සේක. එම සූත්‍රයන්හි යම්සේද එපරිද්දෙන්ම මෙම සතිපට්ඨාන සූත්‍රයෙහිද පළමුකොට රූප කමටහන වදාරා අරූප කමටහන වේදනා වශයෙන් විනිවර්තනය (පෙරලා) දැක්වූහ.

එහි සුඛං වෙදනං ආදි තන්හි, මේ වූ කලී අනිකුදු පජානන පරියායකි. සුඛං වෙදනං වෙදියාමීති පජානාති යනුවෙන් උපන් මොහොතෙහි දුක්වේදනාවගේ අභාව හේතුවෙන් සැප වේදනාව විඳින්නේ, සැප වේදනාව විඳිමි දැනගනී. එබැවින් පළමු උපන් විරූ යම් දුක් වේදනාවක් වූ ද, ඒ දුක්වේදනාව දැන් නැති හෙයින් ද මේ සැපය ද මෙයින් පළමු නොවූ හෙයින් ද වේදනාව නම් අනිත්‍යයැ. අස්ථිර යැ. නැසෙන ස්වභාව ඇත්තේ යයි මෙසේ එය නුවණින් දැනගන්නේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ වදාරණ ලද්දේද වෙයි.

'ගිනි පුදන්නා, යම් වෙලාවක සැප වේදනාව විඳීද, එකල්හි දුක්

වේදනාව නොම විඳී. උපෙක්‍ෂා වේදනාව නොවිඳී. එකල්හි සැප වේදනාවම විඳී. ගිනිපුදන්නා යම්කලෙක දුක් වේදනාව -පෙ- උපෙක්‍ෂා වේදනාව විඳීද එකල්හි සැප වේදනාව නොම විඳී. දුක්වේදනාව නොම විඳී. එකල්හි උපේක්‍ෂා වේදනාවම විඳී. ගිනිපුදන්න, සැප වේදනාවද, අනිත්‍ය වේ. සංඛතය. පටිච්ච සමුප්පන්නය. ක්‍ෂයවන සුලුය. නැතිවෙන සුලුය. විරාග ධර්මයකි. නිරෝධ ධර්මයකි. ගිනි පුදන්න. මෙසේ දක්නා වූ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක තෙම සැප වේදනාවෙහිද කලකිරෙයි. දුක් වේදනාවෙහිද කලකිරෙයි. -පෙ- උපේක්‍ෂා වේදනාවෙහිද කලකිරෙයි. කලකිරුනේ නොඇලෙයි. නොඇලුනේ කෙලෙසුන් කෙරෙන් සිත මිදෙයි. සිත මිදුන කල්හි මිදුනේ යයි ප්‍රත්‍යවේක්‍ෂා ඥානය වෙයි. ජාතිය ගෙවී ගියේය. මග බඹසර වැස නිමවූයේය. චතුරාර්ය සත්‍ය විෂයෙහි සිවු මගින් කළයුතු වූ සොලස ආකාර කෘත්‍යය නිමවන ලදී. සොලොස් වැදෑරුම් කෘත්‍ය පිණිස හෝ කෙලෙසුන් ක්‍ෂය කිරීම පිණිස නැවත මාර්ග භාවනා කෘත්‍යයක් මට නැත යයි දැන ගනී.

**සාමිසං වා සුඛං** යනාදි තන්හි සාමිස සුඛ නම් පංචකාම ගුණ ආමිෂ ඇසුරුකළ සවැදෑරුම් ගෙහසිත (ලෞකික දෙය ඇසුරුකළ) සොම්නස් වේදනාවෝය. නිරාමිෂ සුඛය සවැදෑරුම් නෙක්ඛම්මය (කෙලෙසුන්ගෙන් නික්මීම) ඇසුරුකළ සොම්නස් වේදනාවෝය. සාමිස දුක්ඛයෝ නම් සවැදෑරුම් ගෙහසිත දොමනස්ස වේදනාවෝය. නිරාමිස දුක්ඛවේදනා නම් සවැදෑරුම් වූ නෙක්ඛම්මය ඇසුරුකළා වූ දොමනස්ස වේදනාවෝය. සාමිස අදුක්ඛ මසුඛ වෙදනා නම් සවැදෑරුම් වූ නෙක්ඛම්මය ඇසුරුකළා වූ උපේක්ඛා වේදනාවෝය. ඒ වේදනාවන්ගේ විභාගය, උපරි පණ්ණාසකයෙහි ආයේමය.

**ඉති අජ්ඣත්තං වා** මෙසේ සැපවේදනා ආදිය පිරිසිඳ දැනගැනීමෙන් තමාගේ වේදනාවන්හි හෝ අනිකෙකුගේ වේදනාවන්හි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනුන්ගේ හෝ වේදනාව අනුව බලන්නේ වෙසෙයි. **සමුදය ධම්මානු පස්සී වා** යන මෙහි අවිජ්ජා සමුදයා වෙදනා වෙදනා සමුදයා යනාදි වූ පස්ආකාරයකින් වේදනාවන්ගේ ඉපදීමද විනාශයද දක්නේ වේදනාවන්හි උත්පත්ති ස්වභාව වශයෙන් දක්නේ හෝ වෙසෙයි. වේදනාවගේ විනාශ ස්වභාව වශයෙන් දක්නේ හෝ වෙසෙයි. කලෙක වේදනාවන්හි උත්පත්ති වශයෙන් ද, කලෙක පහාන වශයෙන් බලමින් හෝ වාසය කරේ යයි දතයුතුයැ. මෙයින් මත්තෙහි කායානු පස්සනාවෙහි

කී නයමැයි. මෙහි වේදනාව පිරිසිඳ දැනගන්නා වූ සිහිය දුක්ඛ සත්‍යයයි. මෙසේ යෙදීම කොට වේදනා පරිග්‍රාහක භික්ෂුවගේ නිවන් අරමුණුකොට නික්ම යන දොරටුව දත යුතුය. සෙස්ස පළමු කියන ලද්දටම සමානය.

## වෙදනානු පස්සනාව නිමි.

### චිත්තානු පස්සනා

මෙසේ නම ආකාරයකින් වෙදනානුපස්සනා සතිපට්ඨානය වදාරා, දැන් සොලොස් අයුරකින් චිත්තානු පස්සනාව වදාරණු වස් කතඤ්ච භික්ඛවෙ යනාදිය වදාළහ. එහි සරාගං අටවැදෑරුම් ලෝභ සහගත වූ, වීතරාගං ලෞකික කුසල අව්‍යාකෘත, මේ චිත්තානු පස්සනා සතිපට්ඨානය වනාහි යම්හෙයකින් ධර්ම සම්මර්ශනය වේද, ධර්ම සමොධානය නොවේ ද, එහෙයින් මෙහි එක් පදයෙක්හිදු ලෝකෝත්තර චිත්තය නොලැබෙයි. (ලෝභ මූල 8 හැර) සෙසු අකුසල චිත්තයෝ සතරදෙන පූර්ව පදයද නොම භජනය නොකරති. පශ්චිම පදය ද භාජනය නොකෙරෙත්. (මේ ගණයට වැටෙන්නේ කාමාවචර අකුසල් සිත් 4 සහ කාමාවචර කුසල-විපාක ක්‍රියා සිත්ය.

සමොහං විචිකිච්ඡා සහගත වූ ද, උද්ධච්ච සහගත වූ ද දෙවැදෑරුම් මෝහයයි. මෙහි වනාහි යම් හෙයකින් සියලු අකුසලයන්හි, උපදීද, එහෙයින් සියලු අකුසලයෝ ද, මෙහිලා ගැනීම වටිත්. දුකෙහිම ද්වාදස අකුසල චිත්තයෝ ගන්නා ලද්දාහු ද එහෙයිනි. (විචිකිච්ඡාව සහ උද්ධච්චය මෙයට අයත් වේ. විචිකිච්ඡාව සැකයයි. උද්ධච්චය සිතෙහි කැලඹුන ස්වභාවයයි.)

**වීතමොහං ලෞකික කුසල අව්‍යාකෘත (සිත්)**

**සංඛිත්තං** ථීන මිද්ධයට වැටුන මෙය වනාහි හැකුළුනා වූ සිතකි. (අරමුණු මෙනෙහි කිරීමට නොකැමති හැකිළී සිටින සිතයි.) **වික්ඛිත්තං** උද්ධච්ච සහගත වූ, මෙය විසුරුණු සිතට නමකි. (අරමුණු කෙරෙහි විසිර පවත්නා වූ සිත) **මහග්ගතං**, රූපාවචර අරූපාවචර වූ (සිත්) **අමහග්ගතං**, කාමාවචර වූ සිත්, **සඋත්තරං**, කාමාවචර වූ (උත්තර වූ ශ්‍රේෂ්ඨ ගණයේ සිත්වලට අඩු තත්ත්වයේ සිත් එනම් කාමාවචර සිත්) **අනුත්තරං**, රූපාවචර හා අරූපාවචර වූ, එහිද සඋත්තර චිත්තය රූපාවචරය, අනුත්තර චිත්තය අරූපාවචරම වේ. **සමාහිතං**, යමෙකුට අර්පණා සමාධිය හෝ උපචාර සමාධිය ඇත්තේ, (අර්පණා සමාධියෙන් හෝ උපචාර සමාධියෙන් එකඟ නොවූ සිත) **අසමාහිතං** අර්පණා-උපචාර, සමාධි රහිත වූ (සිත) **විමුත්තං**

තදංග හෝ විෂකම්භන ප්‍රහාණ්‍ය මගින් මිදුන සිත. අවිමුත්තං තදංග, විෂ්කම්භන උභය විමුත්තියෙන් නොමිදුනු, සමුච්ඡේද, පටිප්පස්සද්ධි නිස්සරණ විමුක්තීන්ට චිත්තු පස්සනාවෙන් අවකාශයක් නැත.

**ඉති අජ්ඣත්තං වා** යනුවෙන් සරාගාදී චිත්තයන් පිරිසිඳ ගැනීමෙන් යම් යම් ඇසිල්ලක් යම් යම් සිතක් පවතී ද, ඒ ඒ සිත සලකමින් තමාගේ සිතෙහි හෝ අනිකෙකුගේ සිතෙහි හෝ චිත්තානුපස්සීව වෙසෙයි. **සමුදය ධම්මානු පස්සී** යන මෙහි අවිජ්ජා සමුදයා විඤ්ඤාණ සමුදයො යනුවෙන් මෙසේ පස් පස් ආකාරයෙන් විඤ්ඤාණයාගේ සමුදයද ව්‍යයද එලවා දැක්විය යුතුයි. මෙයින් මත්තෙහිදු කී නයමැයි. හුදෙක් මෙහි චිත්ත පරිග්ගාහික සතිය දුක්ඛ සත්‍යයැ. මෙසේ යෙදීම කොට චිත්ත පරිග්ගාහක භික්ෂුවගේ රහත්ඵලය තෙක් නිවන්දොර දතයුතු. සෙස්ස පළමු කියන ලද්දට සමානමැයි.

**චිත්තානු පස්සනාව නිමි.**

**ධම්මානුපස්සනා**

මෙසේ සොලොස් ආකාරයකින් චිත්තානු පස්සනා සතිපට්ඨානය වදාරා දැන් පස් අයුරකින් ධම්මානු පස්සනාව දේශනා කරනු පිණිස **කථඤ්ච භික්ඛවෙ** යනාදිය වදාළහ. යලිදු භාග්‍යවතුන් වහන්සේ විසින් කායානුපස්සනාවෙහි ශුද්ධ රූප පරිග්‍රහය වදාරණ ලද්දේය. වෙදනානු පස්සනා චිත්තානු පස්සනාවන් හි ශුද්ධ අරූප පරිග්‍රහය වදාරණ ලදී. දැන් රූපාරූප මිශ්‍ර පරිග්‍රහය වදාරණු පිණිස **කථඤ්ච භික්ඛවෙ**, යනාදිය වදාළහ. නැතහොත් කායානුපස්සනාවෙහි රූපස්කන්ධ පරිග්‍රහය වදාරණ ලදී. වෙදනානුපස්සනාවෙහි විඥාන ස්කන්ධ පරිග්‍රහයට වදාරණ ලදී. දැන් සංඥා ස්කන්ධ සංස්කාර ස්කන්ධයන්ගේ පරිග්‍රහයද වදාරනු පිණිස **කථඤ්ච භික්ඛවෙ** යනාදිය වදාළහ. එහි **සන්තං** සත්තයෙන් සිත්හි, හැසිරීම් වශයෙන් විද්‍යමාන වූ **අසන්තං** සිත්හි හැසිරීම් වශයෙන් හෝ ප්‍රහීණ වූ බැවින් හෝ අවිද්‍යමාන වූ **යථාච** යම් කරුණකින් කාමච්ඡන්දයාගේ ඉපදීම වේද, **තඤ්ච පජානාති**, ඒ කරුණද දැනගනී. මේ ආකාරයෙන් සියලු පදයන්ගේ අරුත් දතයුතුයැ. ඒ නීවරණයන් අතුරෙහි ශුභ නිමිත්තෙහි අයෝනිසෝ මනසිකාරය හේතුකොටගෙන කාම ඡන්දයාගේ ඉපදීම සිදුවෙයි. ශුභ නිමිත්ත නම් ශුභයද, ශුභ නිමිත්ත ශුභාරම්මණයද ශුභ නිමිත්ත නම් වේ. අයොනිසො මනසිකාරය නම්, අනුපාය මනසිකාරය, උත්පථ මනසිකාරය,

(කුසල් දහම් පැවැත්මට මග නොවූ මෙනෙහි කිරීම) අනිත්‍යයෙහි නිත්‍යයයි ද දුකෙහි සැපයයි ද අනාත්මයෙහි ආත්මයයි ද අශුභයෙහි ශුභයයි ද මෙනෙහි කිරීමයි. ඒ නුනුවණින් මෙනෙහි කිරීම ඒ ශුභාරම්මණයෙහි බහුලව ජීවත් වන්නහුට කාමච්ඡන්දය උපදී. එබැවින් වදාළහ භාග්‍යවත් බුදුරදහු, **අත්ථි භික්ඛවෙ, සුභ නිමිත්තං තත්ථ අයොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස උප්පාදාය උප්පන්නස්ස වා) කාමච්ඡන්දස්ස භිය්‍යො භාවාය වෙපුල්ලාය** යනුයි.

නැවත අශුභ නිමිත්තෙහි නුවණින් මෙනෙහි කිරීම හේතුකොට ගෙන කාමච්ඡන්දයාගේ ප්‍රහාණය වෙයි. අශුභ නිමිත්ත නම් අශුභය ද, අශුභ ආරම්මණයද වේ. යෝනිසො මනසිකාරය නම් උපාය මනසිකාරයයි පථ මනසිකාරයයි. අනිත්‍යයෙහි අනිත්‍ය යයිද, දුකෙහි දුකයයිද අනාත්මයෙහි අනාත්ම යයි ද, අශුභයෙහි අශුභ යයි ද මෙනෙහි කිරීමයි. අනාත්ම යයි ද, අශුභයෙහි අශුභ යයි ද මෙනෙහි කිරීමයි. ඒ යොනිසො මනසිකාරය එම අශුභ අරමුණෙහි බහුලකොට පවත්වන්නහුට කාමච්ඡන්දය ප්‍රහීණ වෙයි. එයින් වදාළහ. භාග්‍යවත් බුදුරදහුද,

**අත්ථි භික්ඛවෙ අසුභ නිමිත්තං තත්ථ යොනිසො මනසිකාර බහුලො අයමාහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා කමච්ඡන්දස්ස පහානාය** යයි තව ද ධර්මයෝ සයදෙනෙක් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය පිණිස පවතිත්. අශුභාරම්මණය ඉගෙනීම, අශුභ භාවනාවෙහි යෙදීමය, සවැදෑරුම් ඉඳුරන්හි වැසූ දොර ඇති බවය. භෝජනයෙහි පමණ දන්නා බවය. කල්‍යාණ මිත්‍රයන් ඇති බවය. සත්ප්‍රාය කථා, යන මොහුයි. එසේම දශවැදෑරුම් අශුභ නිමිත්ත ඉගෙන ගන්නහුට ද, ඉන්ද්‍රියයන්හි වසන ලද චක්ඛු ආදි සදොර ඇත්තහුට ද, සතර පස් පිඩකඩ අවකාශ ඇතිකල්හි පැන් බී යැපෙන සුලු බැවින් භෝජනයෙහි පමණ දන්නහුට ද (කාමච්ඡන්දය ප්‍රහීණ වෙයි.) එසේ හෙයින් මෙසේ වදාරණ ලදි.

**චත්තාරො පඤ්ච ආලොපෙ, අභුත්වා උදකං පිවෙ**
**අලං ඵාසු විහාරාය පහිතත්තස්ස භික්ඛුනො** යනුයි.

**(සතර පස් ආලෝපයක් නොවළඳ පැන් පානය කරන්නේ නම්, නිවනට මෙහෙයවන ලද සිත් ඇති භික්ෂුවගේ පහසු විහරණය පිණිස ප්‍රමාණවත් වෙයි.)**

අශුභ කම්මික තිස්ස තෙරුන් වැනි වූ අශුභ භාවනාවෙහි ඇලුනු කල්‍යාණ මිත්‍රයන් සේවනය කරන්නා හට කාමච්ඡන්දය ප්‍රහීණ වෙයි. හිඳීම් සිටීම් ආදියෙහි දශ අශුභ නිශ්‍රිත වූ සැපවත් කථාවෙන් ද ප්‍රහීණ වෙයි. එහෙයින් මෙය කියන ලදී. 'ධර්මයෝ සයදෙනෙක් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය පිණිස පවතිත් යයි මේ ධර්ම සදෙන හේතුකොට ගෙන රහත් මගින් ප්‍රහීණ වූ කාමච්ඡන්දයාගේ මත්තෙහි නො ඉපදීම වේයයි දැනගනී.

නැවත පටිඝ නිමිත්තෙහි නුනුවණින් මෙනෙහි කිරීම හේතුකොට ගනෙ ව්‍යාපාදයාගේ හටගැනීම වෙයි. එහි ප්‍රතිඝය ප්‍රතිඝ නිමිත්ත, ප්‍රතිඝාරම්මණය ප්‍රතිඝ නිමිත්ත, අයෝනිසො මනසිකාරය යන මේ සියලු තන්හිම සමාන ලක්‍ෂණ ඇත්තේය. ඒ අයෝනිසො මනසිකාරයෙහි පටිඝ නිමිත්තෙහි බහුල වශයෙන් පවත්නහුට ව්‍යාපාදය උපදී. එහෙයින් වදාළහ. **අත්‍ථි භික්ඛවෙ, පටිඝ නිමිත්තං තත්‍ථ අයොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා බ්‍යාපාදස්ස උප්පාදාය උප්පන්නස්ස වා බ්‍යාපදස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය** යනුයි.

**මෙත්තා චෙතො විමුත්තිය,** නුවණින් මෙනෙහි කරන්නහුගේ ඒ ව්‍යාපාදය ප්‍රහීණ වෙයි. එහි මෙත්තං යයි කී කල්හි අර්පණා සමාධියද උපචාර සමාධියද වටී. චෙතො විමුත්තිය නම් අර්පණා සමාධියමයි. යොනිසො මනසිකාරයෙහි කී ලක්‍ෂණ ඇත්තේමැයි. ඒ යෝනිසෝ මනසිකාරය ඒ මෙත්තා චෙතො විමුත්තිය බහුල වශයෙන් පවත්වන්නහුගේ ව්‍යාපාදය ප්‍රහීණ වෙයි. එබැවින් වදාළහ, **අත්‍ථි භික්ඛවෙ, මෙත්තා චෙතො විමුත්ති තත්‍ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස, වා බ්‍යාපාදස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා බ්‍යාපාදස්ස පහානාය** යනුවෙන්,

තව ද ධර්මයෝ සයදෙනෙක් ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස පවතිත්. මෛත්‍රී නිමිත්ත ඉගෙනීම, මෛත්‍රී භාවනාවෙහි නැවත නැවත යෙදීමය. කර්මය ස්වකීය කොට ඇති බව මෙනෙහි කිරීමය. නුවණින් විමසීම බහුලකොට ඇති බවය. කලණ මිතුරන් ඇති බවය. සත්ප්‍රාය කථාවය යන මොහුයි.

එය එසේමයි, ඔදිස්සක ඵරණය (සීමා සම්භේදය කොට) මෙත් පැතිරවීම, අනොදිස්සක ඵරණය (එක් දිසාවක මෙත් පැතිරවීම) යන මොවුන් අතුරෙන් එකක්හුගේ වශයෙන් මෙත් පතුරවන්නහුට, තෙපි

මොහුට කිපියේ කුමක් කරන්ටද, කිම ඔහුගේ ශීලාදී ගුණයන් නසන්ටද පොහොසත් වන්නෙහි ද, තෙපි තමාගේ කර්මයෙන් අවුත් තමාගේ කර්මයෙන්ම පරලොව යන්නේ නොවේද, අනුන්ට කිපීම නම්, ගිනිසිලු රහිත අඟුරු, රත් වූ යකඩ තැටියක අශුචි රැගෙන අනිකෙකුට ගසනු කැමති බව වැනි වෙයි. මෙතෙම තුඹට කිපියේ කුමක් කරන්නේ ද, කිම ඔබේ සීලාදී ගුණයන් නසන්ට පොහොසත් වන්නේ ද, මේ තෙම තමාගේ කර්මයෙන් අවුත්, තමාගේ කර්මයන් ම පරලොව යන්නේය. නොපිළිගත් පඬුරක් මෙන් ද උඩුසුළඟට දැමූ ධූලි මිටක් මෙන් ද මේ ක්‍රෝධය මොහුගේම මුදුනෙහි වැටෙන්නේ යයි මෙසේ තමාගේ ද, අනුන්ගේ ද කර්මය ස්වකීය කොට ඇති බව නුවණින් සලකන්නහුට ද දෙදෙනාගේම කර්මය ස්වකීය බව ප්‍රත්‍යවේක්‍ෂා කොට නුවණින් විමසීමෙහි යෙදුනහුට අසසගුතත තෙරුන් වැනි මෛත්‍රී භාවනාවෙහි ඇලුණු කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්නහුට ද ව්‍යාපාදය ප්‍රහීණ වෙයි. ධර්මයෝ සය දෙනෙක් ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස පවතිත් යයි. එහෙයින් කියන ලදී. මේ ධර්මයෝ සයදෙන හේතුකොටගෙන ප්‍රහීණ වූ ව්‍යාපාදය, අනාගාමි මාර්ගයෙන් මත්තෙහි නොඉපදීම වේයයි දැනගනී.

අරති ආදියෙහි අයොනිසො මනසිකාරයෙන් ථිනමිද්ධයාගේ ඉපදීම සිදුවෙයි. අරතිය නම් උකටලී බවයි. තන්‍දි නම් නාම කායයාගේ අලස බවයි. විජම්භිකා නම් ශරීරයාගේ නැවත නැවත කම්පාවන බවයි. භත්ත සමමද නම් භක්තමූර්ඡාව භකත පරිදාහයයි. චෙතසොලීනතත නම් චිත්තයාගේ හැකුළුනු ආකාරයයි. මෙම අරති ආදියෙහි අයොනිසො මනසිකාරය බහුල වූවහුට ථිනමිද්ධය උපදී. එහෙයින් වදාළහ. **අත්‍ථි භික්ඛවෙ, අරති, තන්‍දි විජම්භිකා භතත සමමදො චෙතසො ච ලීනතතං තත්‍ථ අයොනිසො මනසිකාර බහුලීකාරො අනුප්පනනසස වා ථිනමිද්ධසස උප්පාදාය උප්පනනසස වා ථිනමිද්ධසස භියොභාවාය වෙපුල්ලාය** යනුවෙන්.

ආරම්භ ධාතු ආදියෙහි යොනිසො මනසිකාරයෙන් එම ථීන මිද්ධයාගේ ප්‍රහාණය වෙයි. ආරම්භධාතු නම් ප්‍රථමයෙන් ආරම්භ කරන ලද වීර්යයයි. 'නික්කම ධාතු' නම් කුසීත භාවයෙන් නික්මුනු බැවින් ඊට වඩා බලවත් වීර්ය යයි පරක්කම ධාතු නමී. මතු මත්තෙහි විශේෂත්වයට පැමිණෙන හෙයින් (අධික වූ ඉතා අධික වූ විරුද්ධ ධර්මයන් නැසීමට සමර්ථ හෙයින් දක්‍ෂභාවයන්ට පැමිණෙන හෙයින්) නික්කම ධාතුවට වඩා ඉතා බලවත් වීර්යයයි. මෙම තෙවැදෑරුම් වීර්යයෙහි යෝනිසො

මනසිකාරය බහුල වශයෙන් පවත්නහුට ථිනමිද්ධය ප්‍රහීණ වෙයි. එයින් වදාළහ. අත්‍ථි භික්‍ඛවෙ, ආරම්භ ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, තත්‍ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා ථීන මිද්ධස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා ථීනමිද්ධස්ස පහානාය යනුවෙන් තව ද ධර්මයෝ සයදෙනෙක් ථිනමිද්ධයාගේ ප්‍රහාණය පිණිස පවතිත්ය. අධික භෝජනයෙහි නිමිති ගැනීම, (මෙතෙක් වැළඳූ කල්හි ථීන මිද්ධයට කරුණු නොවේයයි භෝජනයෙහි පමණ දන්නා බව) ඉරියව් පෙරලීම, ආලෝක සඤ්ඤාව මෙනෙහි කිරීම, එළිමහන් ස්ථානවල සිටීම, කලණ මිතුරන් සේවනය කිරීම, සුදුසු කථාවෙහි යුක්ත වීම, යන මොහුයි.

ආහර හත්‍ථක (බොහොම අනුභව කිරීමෙන් නැගිටිය නොහී අත දෙව (යනුවෙන් කියන, තත්‍රවට්ටක, වළඳ නැගී සිටි නොහී) එහිම පෙරලෙන, අලංසාටක, වැළඳීමෙන් අතිමහත් කුස ඇති බැවින්) නැගී සිටීමටද වස්ත්‍ර හැඳගෙන සිටීමට ද නොහැකි කාකමාසක, කපුටන් විසින් ස්පර්ශ කළ හැකි සේ) මුඛද්වාරය තෙක් අනුභව කරන, භුත්තවම්ක (වළඳ මුඛයෙහි දැරිය නොහැකිව එහිම වමනය කරන මොවුන්ගේ වශයෙන් ආහාර අනුභව කොට, රාත්‍රිස්ථාන දිවාස්ථානවල සිටිමින් මහණදම් කරන්නහුට ථිනමිද්ධය මහ ඇතෙකු මෙන් (සියල්ල) මැඩගෙන පැමිණෙයි. එතෙකුදු වුවත් සතර පස් පිඩකට අවකාශ තබා පැන් බී යැපෙන සුලු වූ මහණ හට එම ථීන මිද්ධය නොවේ. මෙසේ අධික භෝජනයෙහි නිමිති ගන්නහුට ද ථීන මිද්ධය ප්‍රහීණ වෙයි. යම් ඉරියව්වකින් සිටියහුටද ථීන මිද්ධය ඇතිවේනම් ඉන් අන් ඉරියව්වකට පෙරලීම, කරන්නහුටද, රාත්‍රියෙහි සඳඑළිය, පහන් එළිය, පන්දම් එළිය හා දවල් හිරුඑළිය මෙනෙහි කරන්නහුටද, අවකාශයන්හි සිටින්නහුට ද, මහාකාශ්‍යප තෙරුන් වැනි ප්‍රහීණ කළ ථිනමිද්ධය ප්‍රහීණ කළ කලණ මිතුරන් ඇසුරු කරන්නහුටද, ථීන මිද්ධය ප්‍රහීණ වෙයි. සිටීම්, හිඳීම් ආදියෙහි ධුතාංගයන් ඇසුරුකළ සැපවත් කථාවෙන්ද ථීන මිද්ධය ප්‍රහීණ වෙයි. එබැවින් කියන ලදී :- 'ධර්මයෝ සයදෙනෙක් ථිනමිද්ධයාගේ ප්‍රහීණය පිණිස පවතිත්, යයි මේ ධර්මයන් හයදෙන හේතුකොටගෙන ප්‍රහීණ වූ ථිනමිද්ධය රහත් මගින් මත්තෙහි නොඉපදීම වේයයි, දැනගනී.

චිත්තයාගේ උපසමනය නොවීමද, අයොනිසො මනසිකාරය හේතුකොට ගෙනද, උද්ධච්ච කුක්කුච්චයාගේ ඉදීම වෙයි. උපසමනය නොවීම නම්, නොසන්සුන් ආකාරයයි. මෙම උපසමනය නොවීම අර්ථ වශයෙන් උද්ධච්ච කුක්කුච්චය මැයි. ඒ උපසමනය නොවීමෙහි අයොනිසො

මනසිකාරය බහුල වශයෙන් පවත්නහුට උද්ධච්ච කුක්කුච්චය උපදී. එහෙයින් වදාළහ.

අත්ථි භික්ඛවෙ, චෙතසො අවූපසමො තත්‍ථ අයොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා උද්ධච්ච කුක්කුච්චස්ස උප්පාදාය උප්පන්නස්ස වා උද්ධච්ච කුක්කුච්චස්ස භීය්‍යො භාවාය වෙපුල්ලාය යනුවෙන් නැවත සමාධි නම් වූ චිත්තයාගේ සංසිඳීමෙහි යොනිසෝ මනසිකාරය හේතුකොටගෙන ඒ උද්ධච්ච කුක්කුච්චයාගේ ප්‍රහාණය වෙයි. එසේ හෙයින් වදාළහ. අත්ථි භික්ඛවෙ, චෙතසො වූපසමො තත්‍ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා උද්ධච්ච කුක්කුච්චස්ස අනුප්පාදාය, උප්පන්නස්ස වා උද්ධච්ච කුක්කුච්චස්ස පහානාය යනුවෙන්,

යලිදු ධර්මයෝ සයදෙනෙක් උද්ධච්ච කුක්කුච්චයාගේ ප්‍රහාණය පිණිස පවතිත්, බහුස්සුත බව විමසා බැලීම විනයෙහි ප්‍රගුණ බව වැඩිහිටියන් ඇසුරු කිරීම, කලණමිතුරන් ඇති බව, සුදුසු කථා ඇති බව යන මොහුයි. එසේම බහුස්සුත බැවින් එක් නිකායක් හෝ නිකාය දෙකක් හෝ නිකාය තුනක් හෝ නිකාය හතරක් හෝ නිකාය පසම හෝ පෙළ වශයෙන් අටුවා වශයෙන් ඉගෙන ගන්නහුගේ උද්ධච්ච කුක්කුච්චය ප්‍රහීණ වෙයි. කැප නොකැප දෙය පිළිබඳ විමසීම් බහුල කොට ඇත්තහුගේ ද විනය පැනවීම්වල ප්‍රගුණ කළ වසීතාවය ඇත්තහුගේ ද වෘද්ධ වූ මහලු තෙරුන් වෙත එළඹෙන්නහුගේ ද, උපාලි මහතෙරුන් වැනි කලණ මිතුරන් ඇසුරු කරන්නහුගේ ද, උද්ධච්ච කුක්කුච්චය ප්‍රහීණ වෙයි. හිඳීම්, සිටීම් ආදියෙහි කැප නොකැප දෙය ඇසුරුකොට පවත්නා සත්ප්‍රාය කථාවෙනුදු ප්‍රහීණ වෙයි. එහෙයින් කියන ලදී. ධර්මයෝ සයදෙනෙක් උද්ධච්ච කුක්කුච්චයාගේ ප්‍රහාණය පිණිස පවතිත් යයි. මේ ධර්මයන් සයදෙනා හේතුකොටගෙන ප්‍රහීණ වූ උද්ධච්ච කුක්කුච්චය අතුරෙන් උද්ධච්චයාගේ රහත් මඟින් ද, කුක්කුච්චයාගේ අනාගාමි මාර්ගයෙන් ද, මත්තෙහි ඉපදීම නොවේ යයි දැනගනී.

විචිකිච්ඡාවට කරුණු වූ ධර්මයන්හි අයෝනිසො මනසිකාර හේතුවෙන් විචිකිච්ඡාවේ හටගැනීම සිදුවේ. විචිකිච්ඡාවට කරුණු වූ ධර්මයෝ නම්, නැවත නැවත සැකකිරීමට කරුණු බැවින් (ඒ ධර්මයෝද) විචිකිච්ඡාව මැයි. එම විචිකිච්ඡාවෙහි අයොනිසෝ මනසිකාරය බහුල

වශයෙන් විචිකිච්ඡාව උපදී. එයින් වදාළහ. අත්‍ථි භික්‍ඛවෙ, විචිකිච්ඡා, ඨානියා ධම්මා, තත්‍ථ අයොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය උප්පාදාය, උප්පන්නාය වා විචිකිච්ඡාය භියොභාවාය වෙපුල්ලාය යනුයි. කුසලාදි ධර්මයන්හි යොනිසො මනසිකාරයෙන් යුක්තවීම හේතුවෙන් විචිකිච්ඡාවගේ ප්‍රහාණය වෙයි. එබැවින් වදාළහ. අත්‍ථි භික්‍ඛවෙ, කුසලා කුසලාධම්මා සාවජ්ජානවජ්ජා ධම්මා සෙවිතබ්බා සෙවිතබ්බා ධම්මා, හීනප්පණීතා ධම්මා කණ්හ සුක්ක සප්පටි භාගාධම්මා තත්‍ථ යොනිසො මනසිකාර බහලීකාරො, අයමාහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය අනුප්පාදාය උප්පන්නාය වා විචිකිච්ඡාය පහානාය යනුයි. යලිදු ධර්මයෝ සයදෙනෙක්, විචිකිච්ඡාවගේ ප්‍රහාණය පිණිස පවතිත්, බහුසසුත බව විමසා බැලීම විනයෙහි ප්‍රගුණ බව, සිතෙහි ස්ථිර සැදැහැති බව, කලණ මිතුරන් ඇති බව, සුදුසුකථා ඇති බව යන මොහුය. එසේම බහුස්සුත බැවින්ද, එක් නිකායක් හෝ -පෙ- නිකාය පසම හෝ පෙළ වශයෙන් ද අටුවා වශයෙන් ද ඉගෙන ගත්තහුගේ විචිකිච්ඡාව ප්‍රහීණ වෙයි. තුණුරුවන් ගැන විමසීම් බහුලකොට ඇත්තහුගේද, විනයෙහි පුරුදු කළ වශී බව ඇත්තහුගේද තුණුරුවන් කෙරෙහි විශ්වාසය නම් වූ අධිමෝක්‍ෂය බහුල වූවහුගේ ද, ශ්‍රද්ධාදි මුක්ත වූ වක්කලී තෙරුන් වැනි කලණ මිතුරන් ඇසුරු කරන්නහුගේද, විචිකිච්ඡාව ප්‍රහීණ වෙයි. හිඳීම, සිටීම් ආදි අවස්ථාවන්හිදි තුණුරුවන් ගුණ ඇසුරු කළ සුදුසු කථාවන්ගෙන් ද විචිකිච්ඡාව ප්‍රහීණ වෙයි. එසේ හෙයින් කියන ලදී ධර්මයෝ සයදෙනෙක් විචිකිච්ඡාවගේ ප්‍රහාණය පිණිස පවතිත් යයි මේ ධර්මය් සයදෙන හේතුකොටගෙන ප්‍රහීණ වූ විචිකිච්ඡාවගේ සෝවාන් මගින් මත්තෙහි නොඉපදීම වේයයි දැනගනී.

ඉති අජ්ඣත්තං වා යනුවෙන් මෙසේ පඤ්ච නීවරණ පරිග්ගහනයෙන් තමන්ගේ පඤ්චනීවරණ ධර්මයන්හි හෝ අනිකෙකුගේ පංච නීවරණ ධර්මයන්හි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ නීවරණ ධර්මයන්හි හෝ ධම්මානු පසසීව වෙසෙයි. මෙහි උත්පත්ති විනාශ දෙක වනාහි ශුභ නිමිත්ත අශුභ නිමිත්ත ආදියෙහි අයෝනිසො මනසිකාර යොනිසො මනසිකාරයන්ගේ වශයෙන් පඤ්ච නීවරණයන්හිදී කියන ලද්දම දැක්විය යුත්තාහුය. මින් මත්තෙහි කී නයමැයි. හුදෙක් මෙහි නීවරණයන් පිරිසිඳ දන්නා වූ සිහිය දුක්ඛ සත්‍ය නම් වේ. මෙසේ යෙදීම් කොට නීවරණ පරිග්ගාහක භික්ෂුවගේ නිවන්මග දතයුතුයැ. සෙස්ස එබඳුමැයි.

**නීවරණ පබ්බය නිමි.**

### ඛන්ධ පබ්බය

මේ ආකාරයෙන් පඤ්ච නීවරණයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව විභාගකොට දක්වා දැන් පඤ්චක්ඛන්ධයන්ගේ වශයෙන් විභාග කරනු පිණිස 'පුනච පරං' යනාදිය වදාළහ. පඤ්චසුපාදානක්ඛන්ධෙසු යනුවෙන් උපාදානයාගේ ඛන්ධයෝ උපාදානක්ඛන්ධ නම් වෙති. උපාදානයට ප්‍රත්‍ය වූ ධර්ම ගොඩ, ධර්ම රාශිය යන අර්ථයි. මෙය මෙහි සැකෙවිනි. ඛන්ධයන්ගේ විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයෙහි කියන ලද්දීය. ඉති රූපං මේ රූපය වේ. මෙතෙක් රූපය වේ. මෙයින් මත්තෙහි රූපයක් නැතැයි, ස්වභාව වශයෙන් රූපය දැනගනී. වේදනා ආදියෙහි ද මේ ක්‍රමයමැයි. මෙය මෙහි සැකෙවිනි. විස්තර වශයෙන් රූපාදීහු විසුද්ධි මාර්ගයෙහි ඛන්ධ කථාවෙහිම කියන ලද්දාහුය. ඉතිරූපස්ස සමුදයො මෙසේ අවිද්‍යා සමුදයාදීන්ගේ වශයෙන් පස් ආකාරයකින් රූපයාගේ සමුදය වෙයි. ඉති රූපස්ස අත්ථංගමො යනුවෙන් මෙසේ අවිද්‍යා නිරෝධාදීන්ගේ වශයෙන් පස් ආකාරයකින් රූපයාගේ අත්ථංගමය වෙයි. වේදනාදියෙහිදු මෙම ක්‍රමයමයි. මේ මෙහි කෙටි විස්තරයයි. විස්තර වනාහි විසුද්ධි මාර්ගයෙහි උදයව්‍යය ඥාන කථාවෙහි, කියන ලද්දේය. ඉති අජ්ඣත්තං වා මෙසේ පඤ්චක්ඛන්ධ පරිග්ගහයෙන් තමාගේ ඛන්ධ ධර්මයන්හි හෝ අනිකෙකුගේ ඛන්ධ ධර්මයන්හි හෝ කලෙක තමාගේ හෝ කලෙක මෙරමාගේ හෝ ඛන්ධ ධර්මයන්හි ධම්මානුපස්සීව වාසය කරයි. මේ පඤ්චක්ඛන්ධයාගේ සමුද-වය වනාහි අවිජ්ජා සමුදයා රූප සමුදයො යනාදී වූ පඤ්චක්ඛන්ධයන්හි කියන ලද පනස් ලක්ෂණයන්ගේ වශයෙන් දැක්විය යුත්තාහුය. මෙයින් මත්තෙහිදු කී නයමැයි. හුදෙක් මෙම ඛන්ධයන් පිරිසිඳ දැනගන්නා වූ 'සතිය' දුක්ඛ සත්‍යයයි. මෙසේ යෝජනාකොට ඛන්ධ පරිග්ගාහක භික්ෂුවගේ නිවන්මග දතයුතුයැ. සෙස්ස එබඳුමැයි.

**ඛන්ධ පබ්බය නිමි.**

### ආයතන පබ්බය

මෙසේ පඤ්චඛන්ධයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව විභාගකොට දැන් ආයතන වශයෙන් විභාග කරනු පිණිස පුනච පරං යනාදිය වදාළහ. එහි ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු යනුවෙන් චක්ඛු - සොත - ඝාන - ජිව්හා - කාය - මන යන අජ්ඣත්තික ආයතන සයෙහි ද රූප- සද්ද - ගන්ධ - රස යන බාහිර ආයතන සයෙහි ද චක්ඛුඤ්ච පජානාති යනු

චක්ඛුප්පසාද රූපය වෙනස් නොවූ ස්වකීය ස්වභාව ලක්‍ෂණ වශයෙන් දැනගනී. රූපෙච පජානාති යනුවෙන්, බාහිර වූ චතුසමුට්ඨාන රූපයන් ද, අවිපරීත වූ තමාගේ ස්වභාව ලක්‍ෂණ වශයෙන් දැනගනී. යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සංයොජනං යනුවෙන් ඇස හා රූපයන් ද යන මේ දෙක නිසා කාමරාග සංයෝජනය ද, පටිඝ - මාන - දිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බතපරාමාස - භවරාග - ඉස්සා - මච්ඡරිය - අවිජ්ජා යන සංයෝජනයෝ දැයි දසවිධ සංයෝජනයෝ උපදිති. ඒවා අවිපරීත වූ ස්වකීය ස්වභාව ලක්‍ෂණයෙන් දැනගනී. මේ දස සංයෝජනය කෙසේ උපදීද යත්, පිළිවෙලින් කියනු ලැබේ. ඇස් දොරට පැමිණි ඉටු අරමුණ කාම අස්සාස වශයෙන් විඳින්නහුට සතුටු වන්නහුට කාමරාග සංයෝජනය උපදී. අනිටු අරමුණෙහි කිපෙන්නහුට පටිඝ සංයෝජනය උපදී. මා තබා අන් කවරෙක් මෙම අරමුණ නුවණින් සලකන්ට සමර්ථ වූයේ ඇත්දැයි සිතන්නහුට මාන සංයෝජනය උපදී. මෙපරිද්දෙන් රූප අරමුණ නිත්‍ය, ස්ථිර වශයෙන් සලකන්නහුට දිට්ඨි සංයෝජනය උපදී. මෙපරිද්දෙන් රූපාරම්මණය සත්ත්වයෙක් දෝ හෝ සත්ත්වයාගේ දෝ හෝයි සැප උපදවන්නහුට විචිකිච්ඡා සංයෝජනය උපදී. සම්පත්ති භවයෙහි අපට ඒකාන්තයෙන් මෙම රූපාරම්මණය සුලභ වූයේ වනැයි භවය ප්‍රාර්ථනා කරන්නහුට භවරාග සංයෝජනය උපදී. මත්තෙහි දු රූපාරම්මණයක් ශීලව්‍රත සමාදන්ව ලැබිය හැක්කේ යයි ශීලව්‍රත සමාදන් වන්නහුට සීලබ්බත පරාමාස සංයෝජනය උපදී. මෙම රූප අරමුණ අන්‍යයෝ නොලබන්නාහු නම් ඉතා යෙහෙකැයි ඊර්ෂ්‍යා කරන්නහුට ඉස්සා නම් සංයෝජනය උපදී. තමා ලත් රූපාරම්මණය අනිකෙකුට ලැබීම ගැන මසුරුකම් මච්ඡරිය සංයෝජනය උපදී. සියල්ලන් සමග සහජාත වූ අඥානයාගේ වශයෙන් අවිජ්ජා සංයෝජනය උපදී. යථාච අනුප්පන්නස්ස යම් කරුණකින් අසමුදාචාර (නොහැසිරීම්) වශයෙන් නූපන්නා වූ ඒ දසවිධ වූ සංයෝජනයාගේ ඉපදීම වෙයි. එම කරුණද දනී. යථාච උප්පන්නස්ස, ප්‍රහීණ නොවූ කරුණින් සමුදාචාර (හැසිරීම්) වශයෙන් හෝ උපන්නා වූ ඒ දසවිධ වූම සංයෝජනයාගේ යම් කරුණකින් ප්‍රහාණය වේද, එයද දැනගනී. යථාච පහීනස්ස, තදංග වික්ඛම්භණ ප්‍රහාණයන්ගේ වශයෙන් ප්‍රහීණ වූ ද, ඒ දසවිධ සංයෝජනයාගේ යම් කරුණකින් මත්තෙහි නො ඉපදීම වේද, එම කරුණත් දැන ගනී. කවර කරුණකින් ඒ දශ සංයෝජනයාගේ මත්තෙහි නො ඉපදීම වේද යත්, පළමුකොට දිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස ඉස්සා මච්ඡරිය ප්‍රභේද වූ පංචවිධ සංයෝජනයාගේ සෝවාන් මගින් මත්තෙහි නොඉපදීම වෙයි. කාමරාග

පටිඝ සංයෝජන දෙදෙනාගේ ඕලාරික බව (තද ගතිය) සකෘදාගාමි මගින් (ප්‍රහීණ වෙයි) අණු සහගත වූ (මුල් සහිත) එම සංයෝජන දෙදෙන අනාගාමී මාර්ගයෙන් (ප්‍රහීණ වෙයි) මාන, භවරාග, අවිජ්ජා සංයෝජන තුන රහත් මගින් මත්තෙහි නොඉපදීම වෙයි.

සොතඤ්ච පජානාති සදෙද ච යනාදියෙහි ද මේ ක්‍රමය මැයි. තවද මේ ආයතන කථාව විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයෙහි ආයතන නිදෙදසයෙහි කී නියායෙන්ම දත යුත්තේය. ඉති අජ්ඣත්තං වා මේ අයුරින් අජ්ඣත්තික ආයතන පරිග්ගහණයෙන් තමාගේ ආයතන ධර්මයන්හි හෝ බාහිර ආයතන පරිග්ගහණයෙන් අනිකෙකුගේ ආයතන ධර්මයන්හි හෝ කලෙක තමාගේ හෝ කලෙක අනුන්ගේ හෝ ආයතන ධර්මයන්හි ධර්මානුදර්ශීව වාසය කෙරෙයි. මෙහි සමුදය වය දෙක වනාහි අවිජ්ජා සමුදයා චක්ඛු සමුදයො, රූපායතනයන්ගේ රූපක්ඛන්ධයෙහි ද අරූප ආයතනයන් අතුරෙහි, මනායතනයාගේ විඤ්ඤාණක්ඛන්ධයෙහිද ධම්මායතනයාගේ සෙසු ස්කන්ධයන්හිද කී නයින් දතයුත්තාහුය. ලෝකෝත්තර ධර්මයෝ නොගත යුත්තාහුය. මෙයින් මත්තෙහිදු කී නයමැයි. හුදෙක් මෙහි ආයතන පරිග්ගාහික සතිය දුක්ඛ සත්‍යයයි මෙසේ යෝජනාකොට ආයතන පරිග්ගාහක භික්ෂුවගේ නිවන්මගට පැමිණෙන දොරටුව දතයුතුය. සෙස්සද එබඳුමැයි.

**ආයතන පබ්බ නිමි.**

**බොජ්ඣංග පබ්බ**

මෙසේ සවැදෑරුම් අධ්‍යාත්මික බාහිර ආයතනයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව විස්තරකොට දැන් බොජ්ඣංගයන්ගේ වශයෙන් විභාග කරනු පිණිස පුනචපරං යනාදිය වදාළහ. එහි බොජ්ඣංගෙසු යනු සත්‍ය අවබෝධ කරන සත්ත්වයාගේ අංග වූ, සනතං ප්‍රතිලාභ වශයෙන් විද්‍යමාන වූ, සතිසම්බොජ්ඣංගං සති නම් වූ බොජ්ඣංගය මෙහි ආරබ්ධ විදර්ශකගේ පටන් යෝගාවචර තෙම මොනවට අවබෝධ කෙරේද, එහෙයින් සම්බොධි නම් වේ. නැතහොත් එම යෝගාවචර තෙම 'සතිය' ආදිකොට ඇති යම් සත් ධර්මයක්හුගේ එකතුවක් හේතුකොට ගෙන අවබෝධ කෙරේ ද, කෙලෙස් නිද්‍රාවෙන් නැගී සිටී ද, නැතහොත් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේද, කෙලෙස් නින්දෙන් නැගී සිටී ද, නොහොත් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේද,

ඒ ධර්මයන්ගේ එකතුව සම්බොධි නම් වේ. ඒ සම්බොධිහුගේ හෝ ඒ සම්බොධියගේ අංගනුයි සම්බොජ්ඣංග නම් වේ. එයින් කීහ. **සති සංඛාතං බොජ්ඣංගං** යයි සෙසු බොජ්ඣංගවලද මේ ක්‍රමයෙන්ම වචනාර්ථ දතයුතුය. **අසනතං** යනු නොලැබීම් වශයෙන් අවිද්‍යමාන වූ යථා ච **අනුපපනනසස** යනාදියෙහි වනාහි පළමුකොට සති සම්බොජ්ඣංගයාගේ :-

**අත්‍ථි භිකඛවෙ, සති සම්බොජ්ඣංගට්ඨානීයා ධම්මා තත්‍ථ යොනිසො මනසිකාරො බහුලීකරො අයමාහාරො අනුපපනනසස වා සති සම්බොජ්ඣංගසස උපපාදාය, උපපනනසස වා සති සම්බොජ්ඣංගසස භියොය භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවතතති** යනුවෙන් සති සම්බොජ්ඣංගයට කරුණු වූ ධර්ම වෙති. යෝනිසෝ මනසිකාරය කී ලක්‍ෂණ ඇත්තේමය. ඒ යෝනිසෝ මනසිකාරය එම සතියෙහි බහුලව පවත්නහුට සති සම්බොජ්ඣංගය උපදී. ධර්මයෝ සතරදෙනෙක් සතිසම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිස පවතිත්, සති සමපජඤ්ඤය මුළා සිහි ඇති පුගුලන් වර්ජනය කිරීම, එළඹ සිටි සිහියෙන් යුතු පුද්ගලයන් ඇසුරු කිරීම, එළඹ සිටි සිහි ඇති පුද්ගලයන් වෙත නැමුනු බව යන මොහුයි. එය එසේමැයි, අභිකකනතාදි සත් තන්හි සාර්ථක ආදි සමපජඤ්ඤයාගේ වශයෙන් ද, බත් සඟවා තැබූ කවුඩෙකු මෙන් මුළා වූ සිහි ඇති පුද්ගලයන් දුරු කිරීමෙන් ද **තිසස දතත** අභය තෙරවරුන් වැනි වූ එළඹ සිටි සිහි ඇති පුද්ගලයන් සේවනය කිරීමෙන් ද, හිඳීම, සිටීම් ආදියෙහි සිහිය ඉපදවීම පිණිස නැමුනු අවනත වූ අභිමුඛ සිත් ඇති බැවින් ද, සති සම්බොජ්ඣංගය උපදී. මෙසේ සතර කරුණින් උපන් සති සම්බොජ්ඣංගය වනාහි රහත් මගින් භාවනා සම්පූර්ණ වේයයි දැනගනී.

**ධම්මවිචය සම්බොජ්ඣංගය**

ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ වනාහි **අත්‍ථි භිකඛවෙ, කුසලා කුසලා ධම්මා -පෙ- කණ්හ සුකක සපපටිභාගා ධම්මා තත්‍ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුපපනනසස වා ධම්ම විචය සම්බොජ්ඣංගසස උපපාදාය, උපපනනසස වා ධම්මවිචය සම්බොජ්ඣංගසස භියොයා භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවතතනති** යයි මෙපරිද්දෙන් ඉපදීම වෙයි. තව ද ධර්මයෝ සත්දෙනෙක් ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිස පවතිත්, පරිපුච්ඡකතා (හාත්පසින් විමසා බැලීම) බාහිර අභ්‍යන්තර වස්තූන්ගේ පිරිසිදු බව, ඉන්ද්‍රිය සම මතත පටිපාදනා (ඉන්ද්‍රියයන්ගේ සමබව පිළියෙල කිරීම) මෝඩ පුද්ගලයන්

දුරුකිරීම ප්‍රඥාවත් පුද්ගලයන් ඇසුරු කිරීම, ගම්භීර ඤාණචරිය පච්ච වෙක්ඛනා, (=ගැඹුරු වූ, නුවණැත්තන් විසින් අවබෝධ කළයුතු ධර්මයන් ප්‍රත්‍යවේක්ෂා කිරීම) තදධිමුත්තතා (එය නැඹුරු වූ සිත් ඇති බව) යන මොහුයි.

වත්ථුවිසද කිරියා

වත්ථු විසද කිරියා යනු අභ්‍යන්තර බාහිර වස්තූන්ගේ පිරිසිදු බව ඇති කිරීමයි. යම්හෙයකින් යම්විටක ඔහුගේ කෙස් ලොම් නිය ඉතා දික් වෙත් ද, ශරීරයෙහි හෝ උස්සන්න වූ දෝෂ ඇත්තේ ඩහදිය මල වැකුනේත් වේද එකල්හි අධ්‍යාත්මක වස්තු අවිසද වූයේ අපිරිසිදු වූයේ වෙයි. යම්විටක සිවුරු දිරූයේ කිලිටි වූයේ දුගඳ වූයේ වෙද, සෙනස්න හෝ එසේ වූයේ වේද එකල්හි බාහිර වස්තු අවිසද වූයේ අපිරිසිදු වූයේ වෙයි. එහෙයින් කෙස් ආදිය කැපීමෙන් ද ඌර්ධව විරේචන අධො විරේචන ආදියෙන් ශරීරයාගේ සැහැල්ලු බව කිරීමෙන් ද අඟ ඉලීමෙන් හා නෑමෙන්ද ආධ්‍යාත්මික වස්තු පිරිසිදු කළ යුතුය. මැසීම් සේදීම් රැදීම් පිරිබඩ කිරීම් (අළුත්වැඩියා කිරීම්) ආදියෙන් බාහිර වස්තු පිරිසිදු කළ යුතුය. මෙම අධ්‍යාත්මික බාහිර වස්තූන්ගේ පිරිසිදුභාවය නැති වූ කල්හි චිත්ත චෛතසිකයන් පිළිබඳ ඤාණයද අපිරිසිදු වූයේ වෙයි. එසේමැයි. අපිරිසිදු වූ පහන්වැටි තෙල් නිසා උපන් පහන් සිලුවෙහි ආලෝකය මෙනි. නැවත පිරිසිදු වූ අධ්‍යාත්මික බාහිර වස්තුවෙහි චිත්ත චෛතසිකයන් උපන් කල්හි ඤාණයත් පිරිසිදු වෙයි. පිරිසිදු වූ පහන්වැටි තෙල් නිසා උපන් පහන් සිලුවෙහි ආලෝකය මෙනි. එහෙයින් කියන ලදී. වස්තුවිසද කිරියාව ධම්මවිචය බොජ්ඣංගයාගේ ඉපදීම පිණිස පවතී යයි.

ඉන්ද්‍රිය සමත්තවය

ඉන්ද්‍රිය සමත්ත පටිපාදනා නම්, සද්ධා ආදි ඉන්ද්‍රියයන්ගේ සමබව ඇතිකර ගැනීමයි. ඉදින් මෙම යෝගාවචරයාට වනාහි යම් හෙයකින් සද්ධා ඉන්ද්‍රිය බලවත් වේද, අනිත් ඉන්ද්‍රියයෝ හීන වෙත් ද, එබැවින් විරිය ඉන්ද්‍රිය පග්ගහ කෘත්‍ය ද. (උත්සාහය) සති ඉන්ද්‍රිය උපට්ඨාන කෘත්‍යයද සමාධි ඉන්ද්‍රිය අවික්ෂෙප කෘත්‍යය ප්‍රඥා ඉන්ද්‍රිය දස්සන කෘත්‍යයද කරන්ට නොහැකි වෙයි. එබැවින් ඒ ශ්‍රද්ධෙන්ද්‍රිය ධර්මස්වභාවය ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් හෝ යම් ආකාරයකින් මෙනෙහි කරන්නහුට බලවත් වූයේනම්, එපරිද්දෙන් මෙනෙහි නොකිරීමෙන් හෝ ගෙවා දැමිය යුතුය. මෙම කරුණෙහිලා වක්කලී තෙරුන්ගේ වස්තුව නිදර්ශන වෙයි. යම්හෙයකින්

විරිය ඉන්‍ද්‍රිය බලවත් වීනම් එකල්හි ශ්‍රද්ධා ඉන්‍ද්‍රිය අධිමෝක්ෂ කෘත්‍යය කරන්ට අපොහොසත් වෙයි. අනිකුත් ඉන්‍ද්‍රියයෝ ද අනිකුත් කෘත්‍ය භේදය කරන්ට නොපොහොසත් වෙයි. එහෙයින් එම විරිය ඉන්‍ද්‍රියද ඔහු විසින් ශ්‍රද්ධා ආදිය වැඩීමෙන් ගෙවිය යුතුය. මෙපරිද්දෙන් සෙස්සෙහිදු එක් ඉන්‍ද්‍රියයක්හුගේ බලවත් බව ඇතිකල්හි සෙසු ඉන්‍ද්‍රියයන්ගේ ස්වකීය කෘත්‍යයන්හි අසමත් බව දතයුතුය.

තව ද විශේෂ වශයෙන් මෙහි ශ්‍රද්ධා ප්‍රඥාවන්ගේ ද සමාධි විරියයන්ගේ ද, සමත්‍වය පසසත්. යම් කරුණකින් බලවත් ශ්‍රද්ධාව ඇති, මද නුවණ ඇත්තේ, නොදැන පැහැදුනේ වේ ද, අවස්තුවෙහි පහදී ද, බලවත් ප්‍රඥා ඇති මද වූ ශ්‍රද්ධා ඇත්තේ කෛරාටික පක්‍ෂය සෙවුනේ වේද, බෙහෙතින් උපන් රෝගයක් මෙන් පිළියම් නොකළ හැක්කේ වෙයි. චිත්තොද්පාද මාත්‍රයකින්ම කුසල් වේයයි අති ධාවනය කොට දානාදි කුසල් නොකරන්නේ නිරයෙහි උපදී.

ශ්‍රද්ධා ප්‍රඥා දෙදෙනාගේ සම තත්ත්වයෙන් වස්තුවෙහිම පහදී ද නැවත බලවත් සමාධි ඇති මද වූ වීර්ය සමාධිය, එය කුසීත බවට පක්‍ෂ බැවින් කුසීත බව මැඩ පවත්වාද, බලවත් වීර්ය ඇති මද වූ සමාධිය වීර්යය එය උද්ධච්චයට පක්‍ෂ බැවින් උද්ධච්ච මැඩපවත්වයි සමාධි වනාහි වීර්ය සමග යෙදුනේ කුසීත බවට වැටීම නො ලබයි. වීර්ය සමාධිය සමග යෙදුනේ උද්ධච්චයෙහි වැටීම නො ලබයි. එබැවින් ඒ දෙකම සමව තබාගත යුතුය. දෙදෙනාගේ සමතාවයෙන් අප්පනාවට පැමිණේ. යළිදු සමාධිය (සමථ) කම්මිකයාට බලවත් වූ ශ්‍රද්ධාව සුදුසුය. මෙසේ අදහන්නේ මෙසේ (ශ්‍රද්ධාව මදක් බලවත්ව) ඇතිකල්හි, අදහන්නේ, ඇතුළත්ව අදහන්නේ අපර්ණාවට පැමිණෙන්නේය.

සමාධි, ප්‍රඥා දෙදෙනා අතුරෙහි සමථ කර්මස්ථාපිතයා හට ඒකග්‍රතා තොමෝ බලවත් වූවා වටී. යම්හෙයකින් මෙසේ ඇතිකල්හි හෙතෙම අර්පණාවට පැමිණේ ද එහෙයිනි. විපසසනා කමමටඨානිකයාට ප්‍රඥා තොමෝ බලවත් වූවා වටී. යම් හෙයකින් මෙසේ ඇතිකල්හි හෙතෙම ලක්‍ෂණ ප්‍රතිවේධයට පැමිණේ ද, එහෙයිනි. අනික් කරුණකුදු ඇත. සමාධි-ප්‍රඥා දෙදෙනාගේ සමබැවින් ද, අර්පණා තොමෝ වන්නී මයි. එසේ වුවත් සියලු තන්හි සති ය බලවත් වූවා වටී.

සති තොමෝ සිත රකින්නීය. (කුමකින්ද යත්) උද්ධච්ච පක්‍ෂයෙහි වූ ශ්‍රද්ධා වීර්ය ප්‍රඥාවන්ගේ වශයෙන් උද්ධච්ච පක්‍ෂයෙහි වැටීමෙන් ද, කුසීත (කම්මැලි පක්‍ෂයෙහි වූ සමාධිය හේතුකොට ගෙන කුසීත පක්‍ෂයෙහි වැටීමෙන්ද යනුයි.) එබැවින් එම සතිය වූ කලී සියලු ව්‍යඤ්ජනයන්හි ලුණු හා තෙල් සෙයින් ද, සියලු රාජ කෘත්‍යයන්හි සර්ව කාර්මික අමාත්‍යවරයා මෙන් හැම තන්හි කැමැති විය යුත්තීය. එබැවින් කියන ලදී. සති තොමෝ සබ්බත්‍ථික (සියලු අර්ථ සිද්ධිය කරන්නී යයි) භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද, කරුණු කවරේද යත්, 'යම් හෙයකින් සිත සිහිය පිළිසරණ කොට ඇත්තේ ද, සිහිතොමෝ ආරක්‍ෂාව වැටහීම් කොට ඇත්තී ද, සිහියෙන් තොරව චිත්තයාගේ පග්ගහ නිග්ගහ දෙක නොවේ ද, එහෙයිනි.

දුප්පඤ්ඤ පුග්ගල පරිවජ්ජනා නම් නුවණ නැති පුද්ගල දුරින් දුරු කිරීමයි. පඤ්ඤවන්ත පුග්ගල සේවනා නම් සම පනස් ලක්‍ෂණයකින් පිරිසිඳ දක්නා ලද උදයව්‍යය ප්‍රඥාවෙන් යුත් පුද්ගලයන් සේවනය කිරීමයි. ගම්භිරඤාණ චරිය පච්චවෙක්ඛනා නම්, ගැඹුරු වූ ස්කන්ධාදී ධර්මයන්හි පැවැති ගැඹුරු ප්‍රඥාවගේ ප්‍රභේදයන් ප්‍රත්‍යවේක්‍ෂා කිරීමයි. තදධිමුත්තතා නම්, හිඳීම් සිටීම් ආදියෙහි ධම්මවිචය බොජ්ඣංගය ඉපදවීම පිණිස නැමුනු අවනත වූ නැඹුරු වූ සිත් ඇති බවයි. මෙසේ උපන්නා වූ ධම්මවිචය සම්බොජ්ඣංගයාගේ රහත් මගින් වැඩීමෙන් සම්පූර්ණ වීම් වේයයි දැන ගනී.

විරිය සම්බොජ්ඣංගය

විරිය සම්බොජ්ඣංගයාගේ අත්‍ථි භික්ඛවෙ, ආරම්භධාතු නික්කමධාතු පරක්කම ධාතු තත්‍ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්සවා විරිය සම්බොජ්ඣංගස්ස උප්පාදාය උප්පන්නස්ස වා විරිය සම්බොජ්ඣංගස්ස භියෙ‍්‍යාභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති යනුවෙන් ඉපදීම වෙයි.

තව ද එකොළොස් ධර්ම කෙනෙක් විරිය සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිස පවතිත්, අපාය භය ප්‍රත්‍යවේක්‍ෂා කරන බව, අනුසස් දන්නා සුලු බව, ගමන්මග ප්‍රත්‍යවේක්‍ෂා කරන බවය, පිණ්ඩපාතයට ප්‍රතිපූජා කරන බවය. දායාද මහත්වය ප්‍රත්‍යවේක්‍ෂා කරන බවය. ශාස්තෲහුගේ මහත්වය ප්‍රත්‍යවේක්‍ෂා කරන බවය. ජාති මහත්වය

ප්‍රත්‍යවේක්‍ෂා කරන බවය. සබ්‍රහ්මචාරීන්ගේ මහත්‍වය ප්‍රත්‍යවේක්‍ෂා කරන බවය. කුසීත පුද්ගලයන් දුරුකරන ලද බවය. ආරබ්ධ වීර්‍ය ඇති පුද්ගලයන් ඇසුරු කරන බවය. තදධිමුත්ත බවය, යන මොහුයි.

එහි නිරයන්හි පංචවිධ බන්ධන කම්කටොලු පටන් නිරයෙහි මහදුක් විඳින කාලයෙහි ද, තිරිසන් යෝනියෙහි, දැල් - කරක් කෙටින් ආදියෙන් නගා ගත් කල්හි ද, නැවත කෙවිටි කටු ආදි පහරින් පෙලන ලද්දහුගේ ගැල් ඉසිලීම් ආදි කාලයෙහි ද ප්‍රේත ලෝකවල නොයෙක් අවුරුදු දහස් ගණන් ද එක් බුද්ධාන්තරයක් ද, සා පිපාසා ආදියෙන් පීඩිත වූ කාලයෙහි ද, කාලකඤ්ජක අසුර යෝනියෙහි සැටරියන් අසූරියන් පමණ වූ ඇට සම් පමණක්ම ඇති අත් බැවින් අව්සුළං ආදියෙන් දුක් අනුභව කරන කල්හිදු වීර්‍ය සම්බොජ්ඣංගය උපදවන්ට නොහැක. මහණ ඔබට මෙයම කල් වේයයි මෙසේ අපාය භය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නහුට ද විරිය සම්බොජ්ඣංගය උපදී.

කුසීත පුද්ගලයෙකුට නව ලොව්තුරු දහම් ලබන්නට නොහැක්කාහුය. ආරබ්ධ වීර්‍ය ඇත්තෙකු විසින්ම ලැබිය හැක්කේය. මෙය වීර්‍යයෙහි අනුසස් යයි මෙසේ ආනිශංස දක්නහුට ද උපදී. ඔබ විසින් බුදු-පසේබුදු මහසව්වන් ගිය මග යා යුතුය. එය කුසීත වූවන් විසින් යා නොහැක්කේ යයි මෙසේ යා යුතු මග ප්‍රත්‍යවේක්‍ෂා කරන්නහුට උපදී.

යමෙක් තුමූ පිණ්ඩපාතයෙන් උපස්ථාන කෙරෙත්ද, මේ මිනිස්සු ඔබේ නෑයෝ නොවෙති. දැසි කම්කරුවෝ නොවෙති. ඔබ නිසා ජීවත් වන්නෙමැයි ඔබට ප්‍රණීත වූ පිණ්ඩපාත ආදිය නොදෙති. යළි කුමක් හෙයින් දෙත්ද යත්, තමන්ගේ සත්කාරයන්ගේ මහත්ඵල බව පතා දෙති. ශාස්තෲන් වහන්සේ විසින් ද, මෙතෙම මෙම පිණ්ඩපාතය වළඳා සිරුර දැඩි කිරීමෙහි යෙදුනේ සුවසේ වාසය කරන්නේ යයි මෙසේ දක්නහු විසින් ඔබට ප්‍රත්‍ය අනුදැන වදාළේ නොවේය. එසේනම් කුමක් පිණිසද යත්, මෙතෙම මෙම ප්‍රත්‍යය වළඳමින් මහණ දහම් කොට සසරින් මිදෙන්නේ යයි ඔබට ප්‍රත්‍යය අනුදන්නා ලද්දාහුය. දැන් ඒ තෙපි කුසීතව වාසය කරමින් ඒ පිණ්ඩපාතයට අපචායනය නොකරන්නෙහිය. පටන් ගත් වීර්‍ය ඇත්තහුගේම පිණ්ඩපාතයට අපචායනය වේයයි මෙසේ

පිණ්ඩපාතය ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට මෙම බොජ්ඣංගය උපදී. මහාමිත්ත තෙරුන්ට මෙනි.

මහාමිත්ත තෙරුන් වහන්සේ

තෙරුන් වහන්සේ වූ කලී කසසක නම් ලෙනෙහි වාසය කෙරෙති. උන්වහන්සේගේ ගොදුරු ගමෙහි ද එක්තරා උපාසිකාවක් තෙරුන්ව පුතෙකු මෙන් පෝෂණය කෙරෙති. එක් දිනක් ඕතොමෝ වනයට යන්නී දුවණියට මෙසේ කීවාය. දරුව, අසවල් තැන පරණ සහල්ය. අසවල් තැන කිරිය. අසවල් තැන ගිතෙල්ය. අසවල් තැන පැණිය. තොපගේ සොහොයුරු වූ මිත්ත තෙරුන් ගෙට වැඩි කල්හි, බත් පිස කිරි ගිතෙල් මී සිකුරු සමග දෙව. නුඹත් අනුභව කරන්න. මම ඊයේ පිසූ සිහිල් බත් කැඳත් සමග වළඳමි. මෑණියනි, දවල්ට කුමක් වළඳන්නෙහිද? දරුව, පළාකොල දමා සුනුසහලින් ඇඹුල් කැඳක් පිස තබන්න.

තෙරුන් වහන්සේ සිවුරු පොරවා පාත්‍රය පසුම්බියෙන් මුදා ගන්නේ එම ශබ්දය දිව කනින් අසා තමන් වහන්සේටම මෙසේ අවවාද කළහ.

උපාසිකා තොමෝ සිහිල් බත් සමග කැඳ වැළඳුවාය. දවල් ද සුනසහලින් පිසූ ඇඹුල් කොළ කැඳක් වළඳන්නීය. එසේ වුවත් ඔබ සඳහා පරණ සහල් ආදිය කියන්නීය. එහෙත් ඔබ නිසා ඕ තොමෝ කෙතක් හෝ වත්තක් හෝ බතක් හෝ වත්තක් හෝ නොම කැමති වන්නීය. නමුත් ත්‍රිවිධ සම්පත්ම ප්‍රාර්ථනා කරමින්ම දෙන්නීය. තොප එම උපාසිකාවට එම සම්පත් දෙන්ට හැකි වන්නෙහි ද, නොහැකි වන්නෙහි ද, එසේනම් මෙම පිණ්ඩපාතය, රාග සහිත වූ ද්වේෂ සහිත වූ මෝහ සහිත වූ ඔබ විසින් ගන්ට සුදුසු නොවේ. පාත්‍රය පසුම්බියෙහි ලා සිවුරෙහි ගණ්ඨිය මුදා නැවතී කසසක නම් ලෙනට ගොස් පාත්‍රය ඇඳ යට ද, සිවුර චීවර වංසයෙහි ද තබා, රහත් ඵලයට නොපැමිණ නොයන්නෙමි වීර්යයෙන් අධිෂ්ඨාන කොට හුන්හ. දිගුකලක් නොපමාව වාසය කළ ඒ මහණ විදසුන් වඩා පෙරබත්හිම විදසුන් වඩා රහත්ඵලයට පැමිණ පිපෙන පියුමක් මෙන් මහරහත් වූයේ සිනා පහල කරමින් නික්මුණාහු ලෙන්දොර රුකෙහි අධිපතිව වෙසෙන දේවතා තොමෝ

නමොතෙ පුරියාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම
යස්ස තෙ ආසවා ඛීණා දක්ඛිණෙය්‍යොසි මාරිස

යනුවෙන්

(නිදුකාණෙනි, යම්බඳු වූ නුඹවහන්සේගේ සියලු ආශ්‍රවයෝ ප්‍රහීණ වූවාහුද දක්ෂිණාවට සුදුසු වූ පුරුෂ ශ්‍රේෂ්ඨය. නුඹවහන්සේට නමස්කාර වේවා. පුරුෂෝත්තමය, නුඹවහන්සේට නමස්කාර වේවා.)

ප්‍රීති වාක්‍ය ප්‍රකාශකොට, පිඬු පිණිස හැසිරෙන නුඹවහන්සේ වැනි රහතුන්ට භික්ෂාව දී එම මැහැලි ස්ත්‍රිය දුකින් මිදෙන්නාහු යයි කීය. තෙරුන් වහන්සේ නැගිට දොර හැර කාලය බලන්නාහු උදෑසන යයි දැන පා-සිවුරු ගෙන ගමට පිවිසියේය. ඒ දැරි තොමෝද බත් සපයා, දැන් මාගේ සොහොයුරා එන්නාහුය. මග බලමින් හුන්නී ඕ තොමෝ තෙරුන් ගෙදොරට පැමිණි කල්හි පාත්‍රය ගෙන ගිතෙල් සකුරු යෙදූ කිරිබත් පිණ්ඩපාතය පාත්‍රය පුරවා අත තැබුවාය. තෙරුන් වහන්සේ සුවපත් වේවා යනුවෙන් අනුමෝදන් කොට නික්ම ගියහ. ඕ තොමෝත් උන්වහන්සේ දෙස බලමින් සිටියා, එකල්හි තෙරුන් වහන්සේගේ අතිශයින් පිරිසිදු වූ ඡවිවර්ණය විය. ඉන්ද්‍රියයෝ වෙසෙසින්ම ප්‍රසන්න වූවාහුය. මුහුණ බැඳුමින් මිදුන පැසුණු තල් ඵලයක් මෙන් අතිශයින් බැබලිනි.

මහා උපාසිකා තොමෝ වනයෙන් පැමිණ, කිම දරුව තොප බෑයාණෝ ආවාහුදැයි විචාළහ. ඕ තොමෝ ද ඒ සියලු පුවත් දැන්වීය. උපාසිකා තොමෝ අද මාගේ පුත්‍රයාගේ පැවිදි කිස මුදුන් පැමිණිය වනැයි දැන දරුව, තිගේ බෑයා සසුන්හි උකටලී නොවී සිත් අලවා වෙසේ යයි කීය.

ශාස්තෲන් වහන්සේගේ දායාද නම් යම් ඒ සප්තවිධ ආර්ය ධනයක් වේද, එය මහත් වේ මය. එය කුසීත වූවහු විසින් ගන්නට නොහැක්කේ මය. යම්සේ නොමග ගිය පුතෙකු මව්පියෝ මෙතෙම අපගේ පුත්‍රයෙක් නොවේ යයි බැහැර කෙරෙත් ද, හෙතෙම මව්පියන්ගේ ඇවෑමෙන් මව්පියන් සතු දායාදය නො ලබති. එසේම කුසීත තැනැත්තේ ආර්ය ධන නමැති දායාදය නො ලබයි. පටන් ගත් වීර්ය ඇත්තේම ලබයි යයි දායාදයාගේ මහත්තත්වය ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ද (විරිය බොජ්ඣංගය) උපදී.

ඔබගේ ශාස්තෲන් වහන්සේ (ශීලාදී ගුණයන්ගෙන්) මහත් වූවාහුමැයි. යම් හෙයකින් තොප ශාස්තෲන් වහන්සේ මව්කුස පිළිසිඳ ගන්නා කල්හිද, මහාභිනිෂ්ක්‍රමණයෙහිද, බුදුවීමෙහිද, දම්සක් පැවැතුම් සූත්‍රය දේශනා

කිරීමෙහි ද, යමාමහ පෙළහර පෑමෙහි ද, දේවාරෝහණයෙහි ද, ආයු සංස්කාර අත්හැරීමෙහිද, මහා පරිනිර්වාණ කාලයෙහි ද, දසසහශ්‍රී ලෝකධාතු කම්පා විය. මෙබඳු වූ ශාස්තෲවරයෙකුගේ ශාසනයෙහි පැවිදිව තා විසින් කුසීතයකු වන්ට සුදුසුදැයි, මෙසේ ශාස්තෲන් වහන්සේගේ මහත්වය ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට (විරිය සම්බොජ්ඣංගය) උපදී.

ජාතියෙන් ද ඔබ දැන් ලාමක ජාති ඇත්තේ නොවේ. නොබිඳුනු මහාසම්මත පරපුරෙන් සපැමිණි ඔක්කාක රාජවංසයෙහි උපන්නෙහිය. සුදොවුන් මහරජතුමාගේ ද මහාමායා දේවියගේ ද මුණුබුරු වූ රාහුල භද්‍රයන්ගේ කණිටු වූවෙහිය. මෙවන් ජින පුත්‍රයෙකු වූ තා විසින් කුසීත වාසය කිරීම නො සුදුසුයයි ජාති මහත්වය ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ද (විරිය සම්බොජ්ඣංගය) උපදී.

සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ ද අසූමහා ශ්‍රාවකයන් වහන්සේ ද වීර්යයෙන්ම ලොව්තුරු දහම් මගට පැමිණියාහුමය. ඔබ ද එම සබ්‍රම්සරුන් වහන්සේගේ මගට පැමිණෙන්නෙහි ද, නැද්දැයි මෙසේ සබ්‍රම්සරුන්ගේ මහත්වය ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට (විරිය සම්බොජ්ඣංගය) උපදී.

කුස පුරවාගෙන සිටි පිඹුරෙකු වැනි වූ දුරුකළ කායික චේතසික වීර්ය ඇති, කුසීත පුද්ගලයන් දුරු කරන්නහුට ද, පටන් ගන්නා ලද වීර්ය ඇති නිවනට මෙහෙයූ සිත් ඇති, පුද්ගලයන් ඇසුරු කරන්නා හටද හිඳීම් සිටීම් ආදියෙහි වීර්ය ඉපදවීම පිණිස නිම්න-පොණ-පබ්භාර-(නැමුණු) සිත් ඇත්තහුට (විරිය බොජ්ඣංගය) උපදී. මෙසේ උපන්නා වූ විරිය බොජ්ඣංගයාගේ රහත් මගින් වැඩීමෙන් සම්පූර්ණ වීම වේයයි දැනගනී.

**පීති සම්බොජ්ඣංගය**

**පීති සම්බොජ්ඣංගයාගේ අත්ථි භික්ඛවෙ, පීති සම්බොජ්ඣංගට්ඨානියා ධම්මා තත්ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා පීති සම්බොජ්ඣංගස්ස උප්පාදාය උප්පන්නස්ස වා පීති සම්බොජ්ඣංගස්ස භියේ‍යා භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති** යයි මෙසේ ඉපදීම වෙයි.

එහි පීතියම පීති සම්බොජ්ඣංගාතිය ධම්ම නම් වේ. ඒ ප්‍රීතිය උපදවන්නා වූ මනසිකාරය තෙම යෝනිසෝ මනසිකාර නම් වේ. යළිඳු

එකලොස් ධර්ම කෙනෙක් පීති සම්බොජ්ඣංගය ඉපදීම පිණිස පවත්නාහුය. බුද්ධ - ධම්ම - සංඝ - සීල - චාග - දේවතා යන අනුස්සති වඩන බවය, රෞද්‍ර පුද්ගලයන් දුරුකරන බවය. මෘදු පුද්ගලයන් ඇසුරුකරන බවය. ප්‍රසාදනීය සූත්‍රාන්තයන් ප්‍රත්‍යවේක්ෂා කරන බවමය. තද්ධිමුත්ත බවය යන මොහුයි.

බුදුගුණ මෙනෙහි කරන්නහුට උපචාර සමාධිය තෙක් මුළු සිරුරෙහි පැතිරෙමින් පීති සම්බොජ්ඣංගය උපදී. ධම්ම - සංඝ ගුණයන් සිහි කරන්නහුටද, දිගුකලක් නොකඩකොට රක්නා ලද සිව්පිරිසිදු සිල් ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ද, දස සීල - පංච සීල ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ ගෘහස්ථයාට ද, දුර්භික්ෂ භයාදියෙහි බ්‍රහ්මචාරීන්ට ප්‍රණීත භෝජන දී මෙබඳු දානයක් නම් දුනිම්හයි ත්‍යාගය ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ද, එබඳු වූ දුර්භික්ෂ කාලයෙහි සිල්වත්නට දුන් දානය ප්‍රත්‍යවේක්ෂා කරන ගෘහස්ථයාටද, යම් ආකාර ගුණයන්ගෙන් යුක්තව දෙව් ලොව උපන්නහු එබඳු ගුණයන් තමා කෙරෙහි ඇති බව ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ද සමවතින් යටපත් කළ කෙලෙසුන් සැට වසකුදු සැත්තෑ වසකුදු සමුදා චාරයට නොපැමිණෙත් යයි ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ද, චෛතිය දර්ශන බෝධි දර්ශන ථේර දර්ශනයෙහි නොසකස් වූ ක්‍රියාවන්ගෙන් හැඟ වූ රළුබැව් ඇති, රත්නත්‍රයෙහි ප්‍රසාද නමැති සෙනහසක් නොමැති බැවින් කොටළුවාගේ පිටේ රජස් වැනිවූ රළු පුද්ගලයන් දුරුකරන්නහුටද, බුද්ධාදීන් කෙරෙහි පැහැදීම් බහුලකොට ඇති, මොලොක් සිත් ඇති මෘදු පුද්ගලයන් සේවනය කරන්නහුටද, තුණුරුවන් ගුණ ප්‍රකාශක වූ ප්‍රසාද එළවන සූත්‍රයන් ප්‍රත්‍යවේක්ෂා කරන්නහුටද, හිඳීම් සිටීම් ආදියෙහි ප්‍රීති උපදවන පිණිස නැමුනු (පොණ - පබ්භාර) සිත් ඇත්තහුටද උපදී. මෙසේ උපන්නා වූ ද ඒ පීති සම්බොජ්ඣංගයාගේ රහත් මගින් වැඩීමෙන් පරිපූර්ණ වේයයි දැනගනී.

### පස්සද්ධි සම්බොජ්ඣංගය

පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ අත්ථි භික්ඛවෙ, කාය පස්සද්ධි, චිත්ත පස්සද්ධි, තත්‍ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා පස්සද්ධි සම්බොජ්ඣංගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා පස්සද්ධි සම්බොජ්ඣංගස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති, යනුවෙන් මෙසේ පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ ඇතිවීම සිදුවේ. තව ද ධර්මයෝ සත්දෙනෙක් පස්සද්ධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිස

පවත්නාහුය, ප්‍රණීත වූ භෝජන සේවනය කරන බව, ඍතු සුඛය සේවනය කරන බවය. ඉරියා පථ සුඛය සේවනය කරන බවය, මධ්‍යස්ථ වූ ප්‍රයෝග ඇති බව, කෝප සහිත (දාහ සහිත) පුද්ගලයන් වර්ජනය කිරීම, සන්සිඳුන කය ඇති පුද්ගලයන් සේවනය කරන බවය. ඒ පසසද්ධි බොජ්ඣංගයට නැමුණු බවය යන මොහුයි.

ප්‍රණීත සිනිඳු සැප බොජුන් අනුභව කරන්නහුටද, සීත, උෂ්ණ ඍතුන්හි සිටීම් ආදි ඉරියව්වලද සැප වූ ඍතුවත් ඉරියව්වත් සේවනය කරන්නහුට පස්සද්ධිය උපදී. යමෙක් වනාහි මහාපුරුෂ ස්වභාව ඇත්තේ සියලු ඍතු ඉරියාපථයන් ඉවසන්නේ වේද, ඔහු සඳහා මෙය නොකියන ලදී. යමෙකුට සභාග විෂභාග බව ඇත්තේ ද, විෂභාග ඍතු ඉරියාපථයන් දුරුකොට සභාග ඍතු ඉරියාපථයන් සෙවුනා වූ ඕහටම පස්සද්ධිය උපදී. තමාගේද කර්මය ස්වකීයකොට ඇති බව මෙනෙහි කිරීම, මධ්‍යස්ථ ප්‍රයෝග යයි කියනු ලැබේ. මේ මධ්‍යස්ථ ප්‍රයෝගයෙන් පස්සද්ධිය උපදී. යමෙක් ගල් දඬු ආදියෙන් අනුන් වෙහෙසට පත්කරමින් හැසිරේ ද, මෙබඳු වූ දරථ සහිත වූ කය ඇති පුද්ගලයා දුරුකරන්නහුට ද, සංයත වූ අත පය ඇති සංසිඳුනු කය ඇති පුද්ගලයා සේවනය කරන්නහුට ද, හිඳීම් සිටීම් ආදියෙහි පසසද්ධිය ඉපදවීම පිණිස නැමුනා වූ අවනත වූ අභිමුඛ වූ සිත් ඇත්තහුට ද පසසද්ධිය උපදී. මෙපරිද්දෙන් උපන්නා වූ ද ඒ පසසද්ධි බොජ්ඣංගයාගේද රහත් මගින් වැඩීමේ සම්පූර්ණ වීම වේයයි දැන ගනී.

**සමාධි සම්බොජ්ඣංගය**

**සමාධි සම්බොජ්ඣංගයාගේ අත්ථි භික්ඛවෙ, සමථ නිමිත්තං අබ්‍යග්ග නිමිත්තං තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා සමාධි සම්බොජ්ඣංගස්ස වා උප්පාදාය උප්පන්නස්ස වා සමාධි සම්බොජ්ඣංගස්ස භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති යනුවෙන් මෙසේ සමාධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම වේ. එහි සමථයම සමථ නිමිත්ත වේ. නැවත අවික්ඛෙප (චංචල නොවීම අර්ථයෙන් අබ්‍යග්ග නිමිත්ත නම් වේ.) යලිදු එකළොස් ධර්ම කෙනෙක් සමාධි සම්බොජ්ඣංගයාගේ ඉපදීම පිණිස පවත්නාහුය. වත්ථුවිසද කිරියතාව, ඉන්ද්‍රිය සමත්ත පටිපාදනතාව, නිමිත්ත කුසලතාව, සුදුසු කාලයේ සිත දැඩිකොට ගන්නා බව, සුදුසු කාලයෙහි සිතට නිග්‍රහ කරන බව, සුදුසු කාලයෙහි සිත සතුටු කරන බවය, සුදුසු කාලයෙහි මධ්‍යස්ථවන**

බවය, සමාධි රහිත වූ පුද්ගලයන් දුරුකරන බවය. සමාධිගත සිත් ඇති පුද්ගලයන් සේවනය කරන බවය. ධ්‍යාන විමෝක්ෂයන් ප්‍රත්‍යවේක්ෂා කරන බවය. තද්ධිමුත්ත බවද යන මොවුහුයැ. එහි වත්‍ථුවිසදකිරියතාවයද, ඉන්‍ද්‍රිය සමත්‍ත පටිපාදනතාවද කී නයින් දතයුත්තාහුයි.

නිමිත්ත කුසලතාව නම් කසිණ නිමිත්ත පිළිබඳව උගගහන කුසලතාවයයි. සුදුසු කල්හි සිත දැඩිකොට ගැනීම නම්, යම්කලෙක ඉතා ලිහිල් වූ වීර්ය ඇති බැවි ආදිය නිසා හකුලන සිතක් වේද, එසමයෙහි ධම්මවිචය-විරිය-පීති බොජ්ඣංගයන්ගේ ඉපදවීමෙන් ඒ සිත දැඩිකොට ගැනීමයි. සුදුසු කල්හි සිතට නිග්‍රහ කිරීම නම්, යම්කලෙක අතිශයින් ආරද්ධ වීර්ය ඇතිවීම නිසා විසුරුනා වූ සිතක් වේද, එසමයෙහි පසසද්ධි-සමාධි-උපෙකඛා බොජ්ඣංගයන්ගේ ඉපදවීමෙන් ඒ සිතට නිග්‍රහ කිරීමයි. සුදුසු කාලයෙහි (සිත) සතුටු කරන බවනම් යම් කලෙක සිත ප්‍රඥා ප්‍රයෝගය මද බැවින් හෝ, උපසම සුවය අධිගමය නොකිරීමෙන් හෝ ආස්වාද රහිත වේද, එසමයෙහි අෂ්ටවිධ වූ සංවේග වත්‍ථු ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් සංවේගයට පමුණුවයි.

සංවෙග වසතු

අෂ්ට සංවේග වස්තු නම් ජාති-ජරා-ව්‍යාධි-මරණ යන සතරය, පස්වැනි වූ අපා දුකය, අතීත වට්ටමූලක දුක, අනාගත වට්ටමූලක දුකය, වර්තමානයෙහි ආහාර සෙවීම් මුල්කොට ඇති දුකය යන මොවුහු වෙති. තුණුරුවන් ගුණ මෙනෙහි කිරීමෙන් ද ප්‍රසාදය උපදවයි. මෙය සුදුසු කාලයෙහි පහදවන බවයයි කියනු ලැබේ. සුදුසු කාලයෙහි මධ්‍යස්ථ වන බවනම් යම් කලෙක්හි මනා පිළිවෙතට පැමිණ නොහැකුලුනු නො විසුරුණු ආශ්වාද සහිත අරමුණෙහි සමව පැවැති සමථ වීථියට බැසගත් සිත වේද, එකල්හි ඔහුට ප්‍රග්‍රහ-නිග්‍රහ-සම්ප්‍රහර්ෂණයන්හි, උත්සාහයට නොපැමිණෙයි. අසුන් සමව පැවැති කල්හි රියදුරා මෙනි. මෙයට සුදුසු කාලයෙහි මධ්‍යස්ථ වීම යයි කියනු ලැබේ.

සමාධි රහිත පුද්ගලයන් දුරුකිරීම නම්, උපචාර සමාධියට හෝ අර්පණා සමාධියට නොපැමිණි විසුරුණු සිත් ඇති පුද්ගලයන් දුරුකිරීමයි. සමාහිත පුද්ගලයන් සේවනය කිරීම යනු, උපචාර සමාධියෙන් හෝ අර්පණා සමාධියෙන් එකඟ වූ සිත් ඇති පුද්ගලයන් සේවනය භජනය පර්යුපාසනයයි. තද්ධිමුත්තතා නම්, හිඳීම් සිටීම ආදියෙහි සමාධිය ඉපදවීම පිණිසම නැමුනු බැසගත් අභිමුඛ වූ සිත් ඇති බවයි. මෙසේ පිළිපදින්නහුට

මේ සමාධි බොජ්ඣංගය උපදී. මෙපරිද්දෙන් උපන් මෙම බොජ්ඣංගයාගේ රහත් මගින් වැඩීමෙන් පරිපූර්ණත්වයට පැමිණේ යයි දැනගනී.

උපෙක්ඛා සම්බොජ්ඣංගය

උපෙක්ඛා සම්බොජ්ඣංගයාගේ අත්ථි භික්ඛවෙ උපෙක්ඛා සම්බොජ්ඣංගට්ඨානියා ධම්මා තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්සවා උපෙක්ඛා සම්බොජ්ඣංගස්ස උප්පාදාය උප්පන්නස්ස උපෙක්ඛා සම්බොජ්ඣංගස්ස භියෝභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති යයි මෙසේ උප්පාදය සිදුවේ.

එහි උපෙක්ඛාවම උපෙක්ඛා සම්බොජ්ඣංග ඨානිය ධම්ම නම් වේ. තව ද ධර්මයෝ පස්දෙනෙක් උපෙක්ඛා බොජ්ඣංගයාගේ ඉපදීම පිණිස පවත්නාහුය. සත්ව මධ්‍යස්ථතාවය, සංස්කාර මධ්‍යස්ථතාවය, සත්ත්ව සංස්කාරයන් මමත්වයෙන් සලකන පුද්ගලයන් දුරුකරන බවය, තදධිමුත්ත භාවය යන මොහුයි.

ඒ පස්වැදෑරුම් ධර්මයන් අතුරෙහි දෙඅයුරකින් සත්ත්වයන් පිළිබඳ මධ්‍යස්ථ බව උපදවයි. 'තොප තමාගේ කර්මයෙන් අවුත් තමාගේම කර්මයෙන් යන්නේය. මේ තැනැත්තේ ද තමන්ගේ කර්මයෝ තමන්ගේ කර්මයෙන්ම යන්නේය. තෙපි කවරෙකුට මමත්වය කෙරේදැයි, මෙසේ කර්මය ස්වකීය කොට ඇති බව ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් ද, පරමාර්ථ වශයෙන් සත්ත්වයෙක් ම නැති. ඒ තෙපි කවරෙකුට මමත්වය කෙරේදැයි මෙසේ නිස්සත්ත බව ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන්දැයි දෙපරිද්දකින් සංස්කාරයන්ගේ මධ්‍යස්ථ බව උපදවයි.

මේ සිවුර පිළිවෙලින් වර්ණයාගේ වෙනස්වීම්වලටද, දිරීමට ද, පැමිණ පාපිස්නා කඩක්වැ සැරයටි කොනින් ඉවතට දැමිය යුතු වන්නේය. ඉදින් එම සිවුරට හිමියෙක් වන්නේ නම් මෙපරිද්දෙන් එය විනාශවන්ට නොදෙන්නේ යයි මෙසේ මෙසේ ස්වාමියකු නැති බව ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් ද, මෙය කල් නොපවතින්නකි. තාවකාලික වූවකි. මෙසේ තාවකාලික බව ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් ද, නැවත චීවරයෙහි යම්සේ ද, එපරිද්දෙන් පාත්‍ර ආදියෙහිද යෙදිය යුත්තාහුය. සත්ත සංඛාර කෙරෙහි මමත්වය කරන පුද්ගලයන් දුරුකරන බවය යන මෙහි යම් පුද්ගලයෙක් ගිහිවූයේ තමාගේ දූ පුතුන් ආදි හෝ පැවිදි වූයේ තමාගේ අතවැසි සමාන උපාධ්‍යායාදින් හෝ මමත්වය කෙරේද, සියතින්ම ඔවුන්ගේ

හිසකෙස් කැපීම් සිවුරු මැසීම් සිවුරු සේදීම් පඩු ගැසීම් පාත්‍රා විසීම් ආදිය කෙරේද, මොහොතක් නොදැක්ක කල්හි අසවල් සාමණේර කොහිද, අසවල් තරුණ භික්ෂු කොහිදැයි තැතිගත් මුවෙකු මෙන් ඔබ මොබ බලාද, අන් කෙනෙකු විසින් හිසකෙස් කැපීම් ආදියක් සඳහා මොහොතක් අසවලා එවනු මැනවයි යාඥා කරන්නේත් අපිදු ඔහු ලවා තම කටයුත්තක් නොකරවවු. තෙපි ඔහුගෙන් විඩා කරන්නහුය යි නොම දෙයි. මෙතෙම සත්ත්වයා පිළිබඳව මමත්‍වය කරන පුද්ගලයා නම් වේ.

යමෙක් සිවුර පාත්‍ර තැටි සැරයටි ආදියට මමත්‍වය කෙරේ ද, අනිකෙකුට අතින් පරාමර්ශනය කිරීම ද නොදෙයි. තාවකාලිකව ඉල්වන ලද්දේ අපිද මෙය මමායනය කරන්නමෝ පරිභෝග නොකරමු. කිම තොපට දෙම්දැයි කියති. මෙතෙම සංඛාර මමායනය කරන්නේ නම් වෙයි. යමෙක් ඒ දෙවත්හිම මධ්‍යස්ථ වූයේ උදාසීන වූයේ වේද, මේ තෙම සත්ත සංඛාර මධ්‍යස්ථ පුද්ගලයා නම් වේ. මෙසේ මේ උපෙක්ඛා බොජ්ඣංගය තෙම මෙබඳු වූ සත්තසංඛාර මමායනය කරන පුද්ගලයන් දුරින් දුරු කරන්නහුට ද සත්ත සංඛාර මධ්‍යස්ථව පුද්ගලයන් සේවනය කරන්නහුට ද හිඳීම් සිටීම් ආදියෙහි එය ඉපදවීම පිණිස නිම්න, ප්‍රවණ-අභිමුඛ වූ සිත් ඇත්තහුට ද (උපෙක්ඛා බොජ්ඣංගය) උපදී. මෙසේ උපෙක්ඛා බොජ්ඣංගයාගේ රහත් මගින්, වැඩීමෙන් සම්පූර්ණ වීම වේයයි දැනගනී.

ඉති අජ්ඣත්තං වා මෙසේ තමන්ගේ බොජ්ඣංගයන් හෝ මෙරමාගේ බොජ්ඣංගයන් හෝ පිරිසිඳගෙන කලෙක තමාගේ හෝ කලෙක අනුන්ගේ හෝ බොජ්ඣංගයන් පිරිසිඳ ගෙන, බොජ්ඣංග ධර්මයන්හි ධම්මානු පස්සීව වාසය කෙරෙයි. මෙහි සමුදය, වය බොජ්ඣංගයන්ගේ ඉපදීම නිරුද්ධවීම වශයෙන් දතයුත්තාහුය. මෙයින් මත්තෙහිදු කී නියාය මැයි. හුදෙක් මෙහි බොජ්ඣංග පරිග්ගාහික සතිය දුක්ඛ සත්‍ය යයි මෙසේ යෝජනාකොට බොජ්ඣංග පරිග්ගාහක භික්ෂුවගේ නිර්වාණ ද්වාරය දතයුතු සෙස්ස ද එබඳු වේයයි (දතයුතු)

බොජ්ඣංග පබ්බ නිමි.

**චතුසච්ච පබ්බ**

මෙසේ සම්බොජ්ඣංගයන්ගේ වශයෙන් ධම්මානුපස්සනා සතිපට්ඨානය විභාගකොට දැන් චතුසත්‍යයන්ගේ වශයෙන් විභාග කරනු

පිණිස පුනව පරං යනාදිය වදාළ සේක. එහි ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති යනුවෙන් මෙහි තණ්හාව හැර ත්‍රෛභූමක ධර්මයන් දුකයයි යථා ස්වභාව වශයෙන් දැනගනී. නැවත දුක්ඛයාගේ මව වූ උපදවන්නී වූ පූර්ව තෘෂ්ණාව මේ දුක්ඛ සමුදය යයි ද ඒ දුක්ඛ සමුදය දෙදෙනාගේ නොපැවැත්ම වූ නිර්වාණය මේ දුක්ඛ නිරෝධය යයි ද, දුක පිසිද දැන ගන්නා වූ සමුදය දුරු කරන්නා වූ නිරෝධය පසක් කරන්නා වූ ආර්ය මාර්ගය, මේ දුක්ඛ නිරෝධ ගාමිනි පටිපදාව යයි ද යථා ස්වභාව වශයෙන් දැනගනී යන අර්ථයි. අවශේෂ වූ ආර්ය සත්‍ය කථාව විසුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලද්දේමය.

ඉති අජ්ඣත්තං වා යනුවෙන් මෙසේ තමාගේ චතුසසත්‍යයන් හෝ පරිග්‍රහණය කොට අනිකෙකුගේ හෝ කලෙක තමාගේ හෝ කලෙක අනිකෙකුගේ හෝ චතුරාර්ය සත්‍යයන් පරිග්‍රහණය කොට ආර්ය සත්‍ය ධර්මයන්හි ධම්මානුපස්සීව වාසය කරයි. මේ සත්‍ය වර්ණනාවේ සමුදය-වය වනාහි චතුසසත්‍යයන්ගේ අවිපරීත ස්වභාවයෙන් උත්පත්ති නිවෘත්ති වශයෙන් දතයුත්තාහුය. මෙයින් මත්තෙහි කී ක්‍රමයමයි. හුදෙක් මෙහි චතුසච්ච පිරිසිඳ දන්නා වූ සතිය දුක්ඛ සත්‍යයයි මෙසේ යෝජනාකොට සච්ච පරිගගාහක භික්ෂුවගේ නිර්වාණය අරමුණුකොට සංසාර වට්ටයෙන් නික්ම යන ද්වාරය යයි දතයුතු. සෙස්ස එබඳුමැයි.

චතුසච්ච පබ්බ නිමි.

මෙතෙකින්, ආනාපානං, චතුඉරියාපථං, චතු සම්පජඤ්ඤං, ද්වත්තිංසාකාරං, චතුධාතු වවත්ථානං, නවසිවථිකා, වේදනානු පස්සනා, චිත්තානු පස්සනා, නීවරණ පරිග්ගහ, ඛන්ධ පරිග්ගහ, ආයතන පරිග්ගහ, බොජ්ඣංග පරිග්ගහ, සච්ච පරිග්ගහ යයි එක්විසි කර්මස්ථාන කෙනෙක් වදාරණ ලද්දාහුමය.

එම කම්මට්ඨානයන් අතුරෙහි ආනාපාන සතිය ද්වත්තිංසාකාරය නවසිවථිකා යන එකලොස් අර්පණා කර්මස්ථානයෝ වෙති. දීඝභාණක මහාසීව ස්ථවිරයන් වහන්සේ නවසීවථිකයෝ ආදීනවානු පස්සනා වශයෙන් වදාරණ ලද්දාහු යයි කීහ. එහෙයින් උන්වහන්සේගේ මතයෙහි අර්පණා කර්මස්ථානයෝ දෙදෙනෙක්ම වෙති. සෙස්සෝ උපචාර කර්මස්ථානයෝය.

තව ද මේ සියලු කම්මට්ඨානයන්හි කිම අභිවෙසය (ප්‍රවේශය) උපදී ද නො උපදී ද යත්, නූපදනේ නොවෙයි. ඉරියාපථ, සම්පජඤ්ඤ, නීවරණ, බොජ්ඣංග කම්මට්ඨානයන්හි යම් හෙයකින් අභිනිවේශය නූපදීද සෙසු කම්මට්ඨානයන්හි උපදීද එහෙයින් මහාසීව තෙරණුවෝ මෙසේ කීවාහුය. මේ ඉරියාපථයෙහි අභිනිවේශය වෙයි. යම් හෙයකින් මේ යෝගාවචර තෙම සතර ඉරියාපථයෝ මට ඇත්දෝ හෝ නොහොත් නැද්ද, මට චතු සම්පජඤ්ඤයෝ ඇත්ද, නැත්ද, මට පංච නීවරණයෝ ඇත්ද, නැත්ද, මට සත්ත බොජ්ඣංගයෝ ඇද්ද, නැද්ද යනුවෙන් මෙසේ පරිග්‍රහ කෙරේ ද, එහෙයින් සියලු තන්හි අභිනිවෙසය වේයයි (දතයුතු.)

යොහි කොචි භික්ඛවෙ යම්කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් හෝ එවං භවෙය්‍ය ආදියෙහි පටන් කියන ලද භාවනා අනුක්‍රමයෙන් වඩන්නේද, පාටිකංඛං කැමති විය යුතුයි. අවශ්‍යයෙන් වන සුලුය යන අර්ථයි. අඤ්ඤා රහත්ඵලය සති වා උපාදිසෙසෙ, උපාදානයන්ගේ ඉතුරුවක් ඇතිකල්හි, උපාදානයක් ප්‍රහීණ නොවූ කල්හි අනාගාමිතා. අනාගාමී බව මෙසේ සත් වසක් හුගේ වශයෙන් ශාසනයාගේ නෛර්යාණික බව දක්වා, නැවත එයිනුදු ඉතා මද වූ කලෙක නෛර්යාණික බව වන්නේ යයි, දක්වන්නාහු තිට්ඨන්තු භික්ඛවෙ යනාදිය වදාළහ. මෙම සියලුම කාල විශේෂය මධ්‍යම වෛනෙය්‍ය පුද්ගලයාගේ වශයෙන් වදාරණ ලදී. තියුණු නුවණ ඇති පුද්ගලයා සඳහා උදෑසන අනුශාසනා කරන ලද්දේ සවස් කාලයෙහි අධිගමයට පැමිණෙන්නේ යයි කියන ලදී. මෙපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, මගේ ශාසනය මෙසේ නෛර්යාණික යයි දක්වා එක්විසි තැන්හිම රහත්ඵලය කුළු ගැන්වීමෙන් දේශනා කළ දේශනාව නිමවා වදාරන සේක්, එකායනො අයං භික්ඛවෙ, මග්ගො -පෙ- ඉති යන්තං වුත්තං ඉද මෙතං පටිච්ච වුත්තං යනුවෙන් වදාළ සේක. සෙස්ස ප්‍රකට වූ අර්ථ ඇත්තේම වෙයි.

සතිපට්ඨාන සුත්ත වර්ණනාව නිමි.

මැදුම් සඟි අටුවාවේ මූල පරියාය වග්ග නම් වූ
ප්‍රථම වර්ගය නිමි.